

# අභිධම්මත්ථ විකාසිනී

## අභිධම්මාවතාර ටීකා

# ABHIDHAMMATTHAVIKĀSINĪ

COMMENTARY ON THE

## ABHIDHAMMĀVATĀRA

BY

Ven. SUMANGALA MAHĀSĀMI

EDITED BY

Aggamahāpandita

A. P. BUDDHADATTA NAYAKA THERA
of Aggarama, Ambalangoda.

PUBLISHER

S. H. CHANDRATILAKA
Ambalangoda.

PRINTED AT

THE ANULA PRESS
98, Deans Road, Maradana.

1961

# පෙරවදන.

**අභිධම්මත්ථවිකාසිනිටීකාව** වනාහි පළමුවෙන්ම ලියූ අභිධර්මසංග්‍රහයවූ **අභිධම්මාවතාරයට** ලියූ වර්ණනාවකි. **අභි-ධම්මත්ථවිභාවිනී** නමැති අභිධර්මාර්ථසංග්‍රහයේ ටීකාවද මේ කර්තෘවරයාවිසින්ම සම්පාදිත වූවකි. මෙය විභාවිනීටීකාව මෙන් දෙගුණයක් පමණ විශාලය. තවද විභාවිනීටීකාවෙහි ඇතැම් තැන්වලදී වැඩිවිස්තර අභිධම්මත්ථවිකාසිනියෙන් බලාගත යුතුයයි කියා තිබේ. එයින් පෙනෙන්නේ විභාවිනීටීකාව ලියන්ට පෙර විකාසිනීටීකාව ලියූ බවයි.

මාවිසින් පළමුවරට අභිධම්මාවතාරය ශුද්ධකොට රෝමන් අකුරෙන් ලියා එංගලන්තයේ මුද්‍රණය කරවනලද්දේ 1915 වේදීය. ඉන්පසු එය සිංහලඅකුරෙන් 1954 දී මුද්‍රණය කරවනලදී. 1915 වේ සිටම මේපොතේ ටීකාව පළකරවීමට මාතුළ ආශාවක් පැවැත්තේය. එබැවින් බටපොලේ සුභද්‍රාරාමයෙන් ලබාගත් පුස්කොළපොතකින් මාවිසින්ම එය පිටපත්කරනලදී. 1953 දී සවෙනි සංගායනාවේ පොත්ශුද්ධිය සඳහා බුරුමරටට යනවිට මම ඒපොත බුරුමපොත් හා සසඳ බලා ශුද්ධකරන අටියෙන් එහි ගෙන ගියෙමි. රැන්ගුන් නුවරට පැමිණ දෙතුන්දිනකට පසු විනයපිටකය ශුද්ධකිරීම සඳහා මට මණ්ඩලේනුවරට යන්ට සිදුවිය. එහිදී ඒ ශුද්ධිය කෙරුණේ **ඌ විසුද්ධ**මහතෙරුන්ට* අයත් **විජ්ජාලංකාර** විහාරයේදීය. ඒ විහාරය පිහිටියේ මන්ඩලේ අතිප්‍රකට විහාර-යක් වූ **අභයාරාමයට** යාබදවය.

මා එහි වසනවිට අභයාරාමයේ ඉගැන්වීම කරන ස්ථවිර නමක් නොයෙක් සැකතැන් විචාරීම සඳහා මාවෙත පැමිණියේය. එක්දිනක් අභිධම්මාවතාරටීකාවේ අශුද්ධතැනක් ගැන විචාරීම සඳහා ඒ ටීකාව රැගෙන ආවේය. ඒ ටීකාව එහි මුද්‍රිතව තිබෙන-බව මම දැනගත්තේ එදිනය. එයින් මහත් සතුටට පත්වූ මම සිංහලපිටපතක් මා ගෙනැවිත් තිබෙන බැවින් එය ශුද්ධකිරීම සඳහා මෙයින් පිටපතක් සපයාදෙනලෙස ඒ ස්ථවිරතුමාට කීවෙමි. ඒ පොත් ඒ කාලයේදී සාප්පුවලින් ලබාගතනොහැකි වූ නිසා ඒ තෙරනම පරණපොතක් සොයාගෙනැවිත් මට පූජා කෙළේය.

---

* දැන් අග්ගමහාපණ්ඩිතඋපාධිය ලැබ සිටියි. සවෙනි සංගායනාවේ සංඝපක්ෂයේ ලේකම් ධුරය දැරුවේ මේ ස්ථවිරතුමාය.

මාසයකින් පමණ රුන්ගුමට හැරී ආ මම එහි **කොකසින්** පෙදෙසේ "සාසනායිත්සා" විහාරයෙහි නැවතී ත්‍රිපිටක පොත් ශුද්ධකරන අතරම අවකාශ ඇති අවස්ථාවලදී මෙයත් ශුද්ධකෙළෙමි. මුද්‍රිත බුරුම පොතේ ද බොහෝ දූෂිතස්ථාන ඇති වූ බැවින් ඒවාද ඒ පොතේ ලකුණු කෙළෙමි.

## **කර්තෘ - කාල - නියමය.**

මේ පොතේ කර්තෘවරයා ලක්දිව අතිප්‍රකට ශාරීපුත්‍රසංඝරාජයන්ගේ ශිෂ්‍යවූ **සුමංගලමහාසාමි** තුමාය. එතුමා තන්දිපිරිවෙනේ අධිපති විය. මහාපරාක්‍රමබාහුකාලයේදී මෙතුමා නවක භික්ෂුනමක්ව සිටින්ට ඇත. විනයවිනිච්ඡයටීකාව ආදි ග්‍රන්ථරාශියක් කළ **වාචිස්සරමහාසාමි** ජීවත්වූයේත් මේකාලයේදීය. එක් කාලයකදීම මහාසාමිවරුන් කිපනමක් සිටිබව පෙනෙන හෙයින් මහාසාමි පදවිය සංඝරාජපදවියට පහත් එකක්බව කියහැක,

දෙවැනි පැරකුම්බාරජුගේ කාලයේදීත් **සුමංගල** නමැති ප්‍රකට ස්ථවිරනමක් විසූබවත් එතුමා පූජාවලීග්‍රන්ථය කළ මයුරපාදපරිවෙණාධිපති ස්ථවිරතුමාගේ පැවිදිසොහොයුරෙකුබවත් **පූජාවලියේ** 34 වෙනි පරිච්ඡේදයෙහි වූ "එකල උභයකුලපරිශුද්ධව පැවති අවිනෂ්ටවූ මහාපාණ්ඩිවංශඇති, වාගිරිපර්වතයෙහි එමරජුගේ ආරාධනාවෙන් සිව්පසදෑනය ලදින් වාසය කළාවූ **මානෙක්පාමුල සුමංගල** මහාස්ථවිරයන්ගේ සහෝදරවූ ඔවුන්ගෙන්ම කිසියම් දහම්නයක් දැනගත්තාවූ මයුරපාදපරිවෙණාධිපති බුද්ධපුත්‍රස්ථවිරයන්විසින්" යනාදි වාක්‍යයෙන් පෙනේ. ප්‍රථමසුමංගල මහතෙරනම පොලොන්නරුවෙහි විසීය. පසුව කියවෙන තෙරනම වාගිරිගල විසීය. දෙවෙනි තෙරනමට මහාසාමිපදවියක් නැත. එතුමා මහානේත්‍රප්‍රාසාදමූලගණයෙහි ප්‍රධානයා විය.

මහාසාමි සුමංගලස්ථවිරතුමා විභාවිනීටීකාව ලිවීමට ගතකළේ විසිහතරදිනකි. ඒතරම් ඉක්මනට එය කළ හැකිවූයේ ස්වකීයාචාර්යවරයා ලියූ අභිධර්මාර්ථසංග්‍රහසන්නය පාළියට නැගූ නිසාය. එසේ කළ නිසා සුමංගලමහාසාමිතුමා උසස්උගතෙක් නොවේය යන අදහසක් මා තරුණකාලයේදී අසන්ට ලැබුණි. නමුත් මේ විභාවිනීටීකාව කියවා බලන විට එතුමාට පට්ඨානය ඇතුළු හැම අභිධර්මපොත්වලම විශාරද දැනීමක් තිබුණ බව වැටහේ. එබැවින් ඒ අදහස අත්හැරදැමිය යුත්තකි.

මේ පොත ශුද්ධකිරීම ඉතා අපහසු කාර්යයක් විය. මුද්‍රණයේදී ශෝධ්‍යපත්‍ර බැලීම ඊටත් වඩා අපහසු වැඩක් විය. නුපුරුදු ගැඹුරු වචන ඇති පාළිපොතක් නිසා අකුරු අමුණන්නන් විසින්

නොයෙක් විට වරදවා අමුණන ලදී. එබැවින් එක් ශෝධ්‍යපත්‍රයක් තෙවරක් කියවන්ට සිදුවිය. එසේ කියවා බලාත් අසුනොවූ ඇතැම් තැන් ඇතිබව මෙහි මූලපිටේ ආරම්භගාථාවල වචනයක් වැරදී තිබීමෙන් පෙනේ. එය නම් **ආරභිස්සං** යි කියයුතු තැන **ආරාභිස්සං** යි වැටීතිබීමයි. තවත් මෙවැනි තැන් ඇතිවිය හැක. නමුත් ඒවායින් අර්ථාවබෝධයට හානියක් නොවෙනවා ඇත.

මෙහි නොයෙක් තැන **අභයගිරිවාසීන්ගේ** මත දක්වා තිබේ. ඔවුන්ගේ වෙනස් මත දැනගැනීමට එය මහත් උපකාරයකි. ආනන්දතෙරනම මෙසේ කිය, ධර්මපාලාචාර්යතුමා, ජෝතිපාලාචාර්යතුමා මෙසේ කීහයි දක්වෙන තැන් ද බොහෝය. **ආනන්දාචාර්ය** නමින් දක්වෙන්නේ මූලටීකාව කළ මහතෙරනමයි. **ධර්මපාලාචාර්යවරයා** අටුවාකීපයක ද විශුද්ධිමාර්ගටීකාවේ ද කර්තෘවරයායි. **ජෝතිපාලාචාර්යවරයාගේ** නාමය කීපතැනක පෙනෙතත් එතුමන් කළ අභිධර්මසංග්‍රහග්‍රන්ථයක් ගැන දැනගන්ට නොලැබේ. නාමරූපපරිච්ඡේදාදිය කළ **අනුරුද්ධාචාර්යයන්ගේ** නාමයත් මෙහි පෙනේ. තිපිටකචූලනාගත්ථේර, මොරවැව වැසි මහාදත්තස්ථවිර යන දෙනමගේ නම් කීප තැනකම දක්නාලැබේ. තිපිටකමහාධම්මරක්ඛිතතෙරුන්ගේ මත ද සවල්පවශයෙන් දක්වේ.

227 වෙනි පිටේ **රේවත** නමැති ආචාර්යවරයාගේ මතයක් දක්වා තිබේ. මේ නාමය අන්තැනක අපවිසින් නො දක්නා ලදී. එනම් ඇති ප්‍රකට ආභිධර්මික තෙරනමක් විසූබව මෙයින් තේරුම්ගත හැක. එතුමා අභිධම්මාවතාරය ලියන්ට පෙර සිටියෙකි, "එකෙ ආචරියාති රෙවතාචරියං, තස්ස සිස්සානුසිස්සෙ ච සන්ධාය ආහ" (= ඇතැම් ආචාර්යවරයෝ යයි (අභිධම්මාවතාරයෙහි) කියනලද්දේ රේවතාචාර්යයන් හා එතුමාගේ ශිෂ්‍යානුශිෂ්‍යයන් සඳහාය) යි මේ ටීකාවෙහි කියවේ. එබැවින් රේවතාචාර්යතුමා බුද්ධදත්තාචාර්යයන්ට පෙරදී සිටියෙකැයි ඔප්පුවේ. බුද්ධදත්තාචාර්යයන් බුද්ධඝොෂාචාර්යයන්ට සමකාලිකයයි කියන බැවින් බුද්ධඝෝෂාචාර්යතුමාගේ ආචාර්යවරයා වීයයි කියන රේවතතෙරනම මෙයින් කියවේදැයි විමසිය යුතු.

**උපනන්ද** නමැති ආචාර්යවරයකුගේ පොතකින් චරිත විස්තර දක්වන ගාථා 24 ක් මෙහි උපුටා දක්වා තිබේ ග්‍රන්ථකාරයකු වශයෙන් මේ නම මින් පෙර අපට අසන්ට දකින්ට නොලැබුණි, ඒ තෙරුන් කළ පොතක් ගැනද නොදනිමු.

හෘදයවස්තුව සම්බන්ධයෙන් බී. සී. වාගීශ්වර පණ්ඩිතුමාගේ මතයක් ළඟදී "අභිධම්මපරීක්ෂණය" නමැති පොතෙන් හෙළි කරන ලදී. එය ගැන මාගේ "ථෙරවාද බෞද්ධදර්ශනයේ" නවවෙනි පරිච්ඡේදයෙහි කරුණු කියන ලදී. වාගීශ්වරපණ්ඩිතුමා පූජ්‍යාචාර්යයන්ට දෙස් කීනමුත් ඒ ආචාර්යවරයන් මේ කියන කරුණු දැන සිටි බව මේ පොතේ 16 වෙනි පරිච්ඡේදයේ චේතොපරියඤාණය විස්තර කරන තැනින් පෙනේ. එහි "හදයංති න හදයවත්ථුං, අථ ඛො හදයමංසපෙසිං" (=හදය නම් හෘදයවස්තුව නොවේ, හෘදය මාංශපිණ්ඩයයි) යනාදි විස්තරයක් තිබේ. එබැවින් පූජ්‍යාචාර්යවරයෝ වාගීශ්වරපණ්ඩිතුමා කියන කාරණය නොදැන සිටියාහයි දෝෂාරෝපණය කිරීමට ඉඩක් නැත.

මේ කරුණු සලකා බලනවිට මේ පොත ඉතා වැදගත් එකක්බව වැටහේ. මේවැනි දුර්ලභ පොත් ශුද්ධකිරීමට හෝ පළකිරීමට තවමත් අප අතර උද්‍යොගයක් නැත්තාසේ පෙනේ. මෙහින් පොත් සියයක්වත් විකිණේදැයි සැකයක් ඇතත් ධම්ශාස්ත්‍රසංග්‍රහයම සලකා අපවිසින් මේ උත්සාහය ගන්නාලදී. ඇතැම් අදූරදර්ශි තොරතුරු නොදත් පුද්ගලයන්ට මෙය පෙනෙන්නේ මුදල්සැපයීමක් ලෙසය. දරුවන් ඇති මවුවරුන්ම දරුප්‍රසූතයේ අපහසුව දන්නාසේ මෙවැනි වැඩක් යන්තම්න්වත් කළ පුද්ගලයෝම මෙවැනි කටයුත්තක වෙහෙස දනිති. එබැවින් එක්පැත්තක් පමණක් බලන්ට පුරුදුව සිටින සිදුරු සොයන පුද්ගලයන්ගේ පැහැදීමෙන් හෝ අප්‍රසාදයෙන් අපට කම්නැත. අපේ ශක්තිපමණින් තවත් ශාස්ත්‍රසංග්‍රහ කළහැකිනම් එය කරන්නෙමු.

මෙහිදී මෙය පිටපත්කරගැනීම සඳහා පුස්කොළපොත දුන් බටපොලේ සුභද්‍රාරාමාධිපති ව වැඩසිටි ශ්‍රීධම්මපාල කල්‍යාණිවංසතිකායේ අනුනායක මහාස්ථවිරතුමන්ට ද බුරුම පොත සපයාදුන් මන්ඩලේ නුවර අභයාරාමමහාවිහාරයේ මහාස්ථවිරතුමාට ද මාගේ ස්තුතිය හිමිවේ. මෙහි M අකුරෙන් මන්ඩලේ නුවරදී ලැබුණු බුරුම පොත ද B අකුරෙන් බටපොලේ පුස්කොළ පොත ද අදහස් කරනු ලැබේ.

පොල්වත්තේ බුද්ධදත්තස්ථවිර.

22. 5. 61
අග්‍රාරාමය,
අම්බලම්ගොඩ.

# PREFACE

The present volume is the commentary on the Abhidhammāvatāra of Buddhadatta, which is the earliest compendium of the Abhidhamma. The only country where this commentary appeared in print was Burma.

When I visited Burma for the fourth time in 1953 for editing the Canonical Texts for the sixth Buddhist Council I carried with me a MS of this transcribed from an ola MS obtained from the Subhadrārāma, Batapola, through the kindness of the Ven. Dhammapāla, Anunāyaka Thera of the Kalyānivamsa Sect, as I had hopes of finding some Burmese MSS to collate with.

After arriving at Rangoon I spent a few days there before I flew to Mandalay to join there the most learned Elders who edited the Vinaya Pitaka at the Vijjālankāra Monastary, belonging to the Ven. Elder Aggamahāpandita U. Visuddha. Here I resided for nearly a month together with a Siamese Elder who had come from Thailand for the same purpose.

Adjoining the Vijjālankāra monastery is the famous monastery of Abhayārama. A tutor Elder of this monastery often came to me to discuss difficult points of Pali Grammar and literature. One day he filled me with delight when he brought to me a printed copy of the Abhidhammatthavikāsini to get some clarifications. As I was not aware of the fact of publication of this commentary before this event, I explained to him that I had brought a Sinhalese MS of this to collate with Burmese MSS and requested him to obtain one for me. The Elder had doubts whether he would be able to comply with my request, as the book was out of print. But a few days later, to my great delight, the Ven. Elder brought an old copy of it and presented it to me.

On my return to Rangoon, during the few hours of leisure that I had while attending to the editing of the Pitaka Texts

I collated the Burmese book with my MS. While I was attending to this I noted many mistakes in the printed one too, and marked them in Burmese characters on the margins of it.

In 1954 I returned home with my own MS and the ṭīkā printed in Burmese. In that year I edited the text of the Abhidhammāvatāra and caused to publish it in Sinhale characters. I had to visit Burma again twice in 1956 and once at the end of 1958, at the request of Buddhasāsana Council of Burma and the Home Ministry of Ceylon to perform the duties of the 6th Buddhist Council.

## THE AUTHOR AND HIS DATE.

The author of this volume was the Ven. Sumangala Mahāsāmi, the Head of the Nandiparivena which would have been in Polonnaruva or in its neighbourhood. He was a pupil of the Prelate Sāriputta who was a subcommentator and the adviser to King Parākramabāhu, the great. (1163 - 1196 A. D.) He was the author not only of this ṭīkā but also of the well - known and widely used commentary on the Abhidhammatthasangaha, named Abhidhammatthavibhāvini. In the Vibhāvini the author often refers to this Vikāsini and says that the reader must learn details from the latter.

This ṭīkā often quotes the different views of the rival sect of Abhayagiri and of the Theravanin Elders Ānanda, Dhammapāla, Jotipāla, Anuruddha. Revata and Upananda, who were authors of some Commentaries and treatises. Of these the Elder Ānanda was the author of the Mūlaṭīkā of Abhidhamma. Elder Dhammapāla was the commentator on several texts of Khuddhanikāya, on the Netti and Visuddhimagga, and the author of the Saccasankhepa. Anuruddha was the author of the Abhidhammatthasangha, Nāmarūpariccheda etc. No works of Jotipāla and Revata are known to us. But by the statements given here it proves that they had composed some treatises on the Abhidhamma. I have never heard the name of Upananda as an author of any

treatise. But in the 14th chapter of this book our author quotes 24 stanzas from a treatise of the Elder Upananda. So it seems that his treatise was lost long ago. These facts clearly indicate the great value of this volume.

With the letter M in footnotes Burmese book printed in Mandalay is ment; and with B the ola MS obtained from the Subhaddràráma, Batapola.

My thanks are due to late Ven. B. Dhammapàla, Anunàyaka Thera; the Burmese Elder of the Abhayáràma, whose donation helped me much to edit this book and whose name I do not remember now, Mandalay, Burma, and lastly to the Anula-printers who took much pains to compose long, obscure Pali passages, and to Mr. Chandaratilaka for publishing this volume.

**A. P. Buddhadatta**

1. 6. 1961
AGGARAMA
AMBALANGODA

# අනුක්කමණිකා


| | | | | පිට |
|---|---|---|---|---|
| 1. | පඨම | පරිච්ඡෙදවණ්ණනා | (චිත්තවිභාග) | 1 – 106 |
| 2. | දුතිය ,, | ,, | (චෙතසික විභාග) | 107 |
| 3. | තතිය ,, | ,, | ,, | 142 |
| 4. | චතුත්ථ ,, | ,, | (එකවිධාදිනිද්දෙස) | 150 |
| 5. | පඤ්චම ,, | ,, | (චිත්තුප්පත්තිනිද්දෙස) | 158 |
| 6. | ඡට්ඨ ,, | ,, | (ආරම්මණවිභාග) | 166 |
| 7. | සත්තම ,, | ,, | (විපාකචිත්තප්පවත්ති) | 185 |
| 8. | අට්ඨම ,, | ,, | (පකිණ්ණක නිද්දෙස) | 210 |
| 9. | නවම ,, | ,, | (පුඤ්ඤවිපාකපච්චය) | 231 |
| 10. | දසම ,, | ,, | (රූපවිභාග) | 245 |
| 11. | එකාදසම ,, | ,, | (නිබ්බානනිද්දෙස) | 309 |
| 12. | ද්වාදසම ,, | ,, | (පඤ්ඤත්ති) | 317 |
| 13. | තෙරසම ,, | ,, | (කාරකපටිවෙධ) | 321 |
| 14. | චුද්දසම ,, | ,, | (රූපාවචර සමාධි) | 326 |
| 15. | පඤ්චදසම ,, | ,, | (අරූපාවචරසමාධි) | 361 |
| 16. | සොළසම ,, | ,, | (අභිඤ්ඤානිද්දෙස) | 369 |
| 17. | සත්තරසම ,, | ,, | (අභිඤ්ඤාරම්මණ) | 383 |
| 18. | අට්ඨාරසම ,, | ,, | (දිට්ඨිවිසුද්ධි නිද්දෙස | 391 |
| 19. | එකූනවීසතිම | ,, | (කඞ්ඛාවිතරණවිසුද්ධි) | 405 |
| 20. | වීසතිම ,, | ,, | (මග්ගාමග්ගඤාණ) | 416 |
| 21. | එකවීසතිම ,, | ,, | (පටිපදාඤාණදස්සන) | 427 |
| 22. | බාවීසතිම ,, | ,, | (ඤාණදස්සන) | 432 |
| 23. | තෙවීසතිම ,, | ,, | (කිලෙසප්පහාණ) | 437 |
| 24. | චතුවීසතිම ,, | ,, | (පච්චයනිද්දෙස) | 445 |
| | සඤ්ඤානාමසූචි | | | xv |
| | සංවණ්ණිතපදානි | | | 457 |

# සඤ්ඤානාමසූචි


අට්ඨකථාචරියා 324
අනුරුද්ධාචරිය 234
අභයගිරිවාසිනො 46, 128, 136, 169, 352, 364, 387.
අභිධම්මට්ඨකථා 196
අභිධම්මමාතිකා 388
අභිධම්මාවතාර 1, 13
අම්බපාලිගණිකා 296
ආචරියා 271-5
ආනන්දාචරියො 153, 207, 216, 237, 254, 278, 298, 301, 302 - 4 - 6, 388
උපනන්දථෙර 330
කථාවත්ථුප්පකරණ 298, 300
කණ්හදාස 455
කුන්තිපුත්තථෙරා 296
ගොදත්තථෙර 434
ඡවිකාරසුත්ත 103
ජෙතවනවිහාර, 456
ජොතිපාලථෙර, 89, 216, 256, 297, 299, 302 - 5, 397.
ටීකාකාරො 197
තලාකගාමමූලවාසි 259
තිපිටකචූලනාග 80, 92, 186, 190, 204
තිපිටකචූලාභය 80
තිස්සමහාබ්‍රහ්මා 99
දාඨානාගථෙර 259
ධම්මපාලාචරිය. 41, 199, 207, 260, 299, 305, 344, 386, 450
ධම්මසඞ්ගණී 59
නන්දිපරිවෙණ 456
නාමරූපසමාස 146
පටිසම්භිදාමග්ග 59
පරමත්ථවිනිච්ඡය 196
පුලත්ථිනගර, 456
පරක්කමභුජ 456
පොක්ඛරසාති 296
පොරාණා 131, 168, 236, 242 - 4,2 63, 296, 306, 314, 319, 398, 403
බුද්ධදත්ත 1.
බුද්ධමිත්ත 221
මජ්ඣිමට්ඨකථා 196
මජ්ඣිමභාණකා 386
මහාඅට්ඨකථා 277 - 8
මහාදත්තථෙර, 80, 186, 204
මහාධම්මරක්ඛිත 204
මහානිදානසුත්ත 419
මහාපදානසුත්ත 419
මහාසංඝිකා 46
මහාසීවථෙර, 190
මාගධීභාසා 306

මොරවාපිවාසී 80, 92, 186, 204

යමකප්පකරණ 301
යමකට්ඨකථා 302
රාහුලථෙර, 333
රාහුලොවාද 333
රෙවතාචරිය 227
වජිරථෙර, 324
විසුද්ධිමග්ග 260, 416
විසුද්ධිමග්ග සීහළ සංවණ්ණනා 259
සච්චසංඛෙප 238
සංයුත්තට්ඨකථා 388
සංයුත්තභාණකා 385
සාරිපුත්ත 1, 456
සාරිපුත්තථෙර, 310
සුමතිභික්ඛු 455
සුමංගලථෙර, 456
සූරම්බට්ඨ 313

# අභිධම්මත්ථවිකාසිනී

## අභිධම්මාවතාරටීකා

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

1. විසුද්ධකරුණාඤාණං බුද්ධං, සම්බුද්ධපූජිතං
ධම්මං, සද්ධම්මසම්භූතං වන්දෙ සංඝං නිරඞ්ගණං.

2. සාරිපුත්තං මහාථෙරං පරියත්තිවිසාරදං
නමාමි සන්තවුත්තිං මෙ ගුරුං ගාරවභාජනං.

3 වන්දනෙන මයා එවං යා ලද්ධා පුඤ්ඤසම්පදා
හෙත්වා[1] තස්සානුභාවෙන අන්තරායෙ අසෙසතො.

4. මහාවිහාරවාසීනං ථෙරානං ථිරසීලිනං
වංසාලංකාරභූතෙන භූතානුග්ගහකාරිනා

5. ථෙරෙන බුද්ධදත්තෙන රචිතං යං මනොරමං.
පිටකෙ අභිධම්මස්මිං ඔතාරූපායභාවතො

6. අභිධම්මාවතාරො ති ලද්ධනාමෙන විස්සුතං
නානානිපුණ - ගම්භීර--නයං පකරණුත්තමං

7. අත්ථසංවණ්ණනං තස්ස ආරාභිස්සං යථාබලං
පාමොජ්ජ - ජනනත්ථාය ආභිධම්මිකභික්ඛුනං.

පරම - නිපුණ - විචිත්තනයසමන්නාගතං සකසමය - සමයන්තරගහනවිගාහණසමත්ථං සුවිමල-විපුල-පඤ්ඤාවෙය්‍යත්තිය ජනකං[2] පකරණමිදමාරභන්තො'යමාචරියො පඨමං තාව රතනත්තයපණාමකරණෙන අන්තරායනිවාරණඤ්චෙව පඤ්ඤා-පාටවත්තං[3] ච පත්ථෙති. රතනත්තයපණාමො හි අත්ථතො පණාමකිරියාභිනිප්ඵාදිකා කුසලචෙතනා. සා ච වන්දනෙය්‍ය-වන්ද-කානං ඛෙත්තජ්ඣාසයසම්පදාදීහි[4] දිට්ඨධම්මවෙදනීයභූතා යථා ලද්ධසම්පත්තිනිමිත්තකස්ස කම්මස්ස අනුබලප්පදානවසෙන තංනිබ්බත්තිත - විපාකසන්තතියා අන්තරායකරානි උපපීළක - උප ච්ඡෙදකකම්මානි පටිබාහෙත්වා තන්නිදානානං යථාධිප්පෙතසිද්ධි-විබන්ධකානං රොගාදිඅන්තරායානං අප්පවත්තිං සාධෙති. රාගාදි

---

1. M. හිත්වා. 2. M. ජනනං. 3. M. පඤ්ඤාපාටවං. 4. M. සම්පදාහි;

මලවික්ඛාලනෙන ච චිත්තස්ස සන්තානං පරිසොධෙත්වා තන්නි-ස්සයාය[1] පඤ්ඤාය යථාධිප්පෙතසිද්ධිසම්පාදකං විසදභාවමාවහති. කිඤ්ච, ආචිණ්ණමෙතං පණ්ඩිතානං යදිදං ගන්ථසමාරම්භෙ රතනත්තයපණාමකරණං; තස්මා සප්පුරිසාචාරානුරක්ඛනත්ථං ච ආදිම්හි රතනත්තයවන්දනා ආරද්ධාති එවමාදිනා අඤ්ඤානි පි බහූනි පයොජනානි නිද්ධාරෙතබ්බානි තානි පන තත්ථ තත්ථ බහුධා විත්ථාරිතානීති තං පපඤ්චපරිස්සමං ඨපෙත්වා යථානුප්පත්ත-මෙව තාව වණ්ණයිස්සාම.

එත්ථ ච රතනත්තයපණාමං කාතුකාමො තථාගතමූලකත්තා සෙසරතනානං පඨමං තාව තථාගතස්ස ථොමනාපුබ්බඞ්ගමං පණාමමාරභන්තො ආහ: **අනන්තකාරුණාපඤ්ඤං** ති ආදි. ථොමනාපුබ්බඞ්ගමෙන හි පණාමෙන සත්ථු ගුණාතිසයයොගො, තතො තස්ස අනුත්තරවන්දනීයභාවො තෙන ච අත්තනො වන්දනාය ඛෙත්තගතභාවො[2] ඛෙත්තගතාය ච වන්දනාය යථාධිප්පෙතනිප්ඵත්තියා හෙතුභාවො ච දස්සිතො හොති.

තත්ථ **වන්දිත්වා**ති පුබ්බකාලක්‍රියානිද්දෙසො. තස්ස පන ඔසානගාථාය **පවක්ඛාමී**ති ඉමිනා අපරකාලක්‍රියාවචනෙන සම්බන්ධො. බුද්ධං ති වන්දනාක්‍රියාය කම්මනිද්දෙසො. **අනන්ත-කාරුණාපඤ්ඤං** ති ආදිකං පන තබ්බිසෙසනං. තත්ථ කිරතීති **කාරුණා**; පරදුක්ඛං වික්ඛිපති, අපනෙතීති අත්ථො. කිරීයති දුක්ඛිතෙසු පසාරීයතීති වා **කාරුණා**. අථ වා කරොතීති[3] **කාරුණා**; පරදුක්ඛෙ සති සාධූනං කම්පනං හදයඛෙදං ජනෙතීති අත්ථො. පජානාතීති පඤ්ඤා; යථාසභාවං පකාරෙහි පටිවිජ්ඣතීති අත්ථො. කාරුණා ච පඤ්ඤා ච **කාරුණාපඤ්ඤා**. නත්ථි එතාසං අන්තොති අනන්තා. අනන්තා කාරුණාපඤ්ඤා එතස්සාති අනන්තකාරුණාපඤ්ඤො; තං **අනන්තකාරුණාපඤ්ඤං**

එත්ථ ච උප්පාදවයන්තවසෙන චෙව සන්තතිපරියොසානවසෙන ච සති පි භගවතො කාරුණාපඤ්ඤානං පරියන්තභාවෙ අනන්තාරම්මණෙසු පවත්තනතො අනන්තාති වෙදිතබ්බා. සම්මාසම්බුද්ධස්ස හි සබ්බසත්තානං දුක්ඛාපනයනාකාරප්පවත්තා අනඤ්ඤසාධාරණා මහාකාරුණා කිඤ්චි සත්තං අවජ්ජෙත්වා සබ්බෙසු[5] නිරවසෙසං පවත්තති. තථා සබ්බධම්මසභාවාවබොධන-සමත්ථා සබ්බඤ්ඤුතඤ්ඤාණසඞ්ඛාතා පඤ්ඤාපි සකලඤෙය්‍යධම්මෙසු අනවසෙසතො පවත්තති තස්මා අනන්තාරම්මණප්පවත්ත කාරුණා

1. M. තන්නිස්සිතාය. 2. B. මෙත්තගතභාවො. 3. කිණාතීති (සාරත්ථදීපනී.) 4. B. හදයච්ඡෙදං. 5. M. සබ්බෙසු සත්තෙසු.

ඤාණවන්තතාය **අනන්තකරුණාපඤ්ඤො** භගවා. කරුණා-ඤාණග්ගහණෙන චෙත්ථ භගවතො සබ්බලොකියලොකුත්තරගුණසම්පත්ති දස්සිතා හොති. තථා හි කරුණාග්ගහණෙන ලොකියෙසු මහග්ගතභාවප්පත්තාසාධාරණගුණදීපනතො සකලලොකිය-ගුණසම්පත්ති දස්සිතා. පඤ්ඤාග්ගහණෙන සබ්බඤ්ඤුතඤ්ඤාණපදට්ඨාන - මග්ගඤාණදීපනතො සබ්බලොකුත්තරගුණසම්පත්ති දස්සිතා. අපි ච: සබ්බබුද්ධගුණානං කරුණා ආදි, පඤ්ඤා පරියො-සානං. මහාකරුණාය චොදිතමානසො හි භගවා සංසාරපඞ්කතො සත්තානං සමුද්ධරණත්ථාය කතාභිනීහාරො අනුපුබ්බෙන පාරමියො පූරෙත්වා අනුත්තරසම්මාසම්බොධියා අධිගමෙන සකලබුද්ධගුණෙ පටිලභි. ඉති සබ්බබුද්ධගුණානං තන්නිදානභාවතො කරුණා සකලබුද්ධගුණානං ආදි. සබ්බඤ්ඤුතඤ්ඤාණපදට්ඨානස්ස පන මග්ග-ඤාණස්ස පටිලාභතො[1] උත්තරිං කරණීයාභාවතො පඤ්ඤා පරියොසානං. ආදිපරියොසානදස්සනෙන ච සකලබුද්ධගුණා නයතො දස්සිතා හොන්ති. නයග්ගාහො එව හි සබ්බබුද්ධගුණානං දස්සනූපායො ඉතරථා තාදිසස්ස සබ්බඤ්ඤුබුද්ධස්ස පි වචනපථාතීතං තථාගතගුණං අනුපදං වණ්ණෙන්තො කො නාම පරියොසානමාපජ්ජිතුං[2] සක්කුණෙය්‍යාති?

එවං කරුණා - පඤ්ඤාමුඛෙන සංඛෙපතො සකලබුද්ධගුණෙහි භගවන්තං ථොමෙත්වා පි පුන අත්තනො බුද්ධගුණසංකිත්තනෙ අතිත්තභාවෙන චෙව පරෙසං ච පසාදබාහුල්ලජනනත්ථං තදන්තොගධෙපි විසුද්ධගුණෙ[3] පධානභාවෙන නීහරිත්වා දස්සෙන්තො ආහ: **තථාගතමනුත්තරං** ති ආදිං. තත්ථ **තථාගතන්ති** තථා ආගතතාදීහි අට්ඨහි කාරණෙහි **තථාගතං**. වුත්තං හෙතං: "අට්ඨහි කාරණෙහි භගවා තථාගතො: තථා ආගතොති **තථාගතො**. තථා ගතොති **තථාගතො**; තථලක්ඛණං ආගතොති **තථාගතො**; තථධම්මෙ යාථාවතො අභිසම්බුද්ධොති **තථාගතො**; තථා දස්සිතාය **තථාගතො**; තථාවාදිතාය **තථාගතො**; තථාකාරිතාය **තථාගතො**; අභිභවනට්ඨෙන **තථාගතො**"ති.

තත්ථ කථං භගවා "තථා ආගතො"ති තථාගතො.? යථා සබ්බලොකහිතාය උස්සුක්කමාපන්නා පුරිමකා සම්මාසම්බුද්ධා ආගතා; කිං වුත්තං හොති? මනුස්සත්තාදි - අට්ඨඞ්ගසමන්නාගතෙන යෙන අභිනීහාරෙන තෙ භගවන්තො ආගතා; තෙනෙව අභිනීහාරෙන අයම්පි භගවා ආගතො. යථා වා භගවන්තො සමතිංසපාරමියො පූරෙත්වා පඤ්චමහාපරිච්චාගාදීනි සම්පාදෙත්වා

1. M. පටිලභනතො. 2. M. මාහරිතුං. 3. M. [illegible]

ආගතා, යථා ච තෙ සත්තතිංස බොධිපක්ඛියධම්මෙ භාවෙත්වා, බ්‍රූහෙත්වා ආගතා, තථා අයම්පි භගවා ආගතො; එවං තාව "තථා ආගතො"ති තථාගතො.

කථං "තථා ගතො" ති තථාගතො? යථා සම්පති ජාතා භගවන්තො සත්තපදවීතිහාරෙන ගතා, යථා වා තෙ සමථවිපස්සනාමග්ගෙහි තං තං අකුසලපක්ඛං විධමෙත්වා ගතා, තථා අයම්පි භගවා ගතොති එවං "තථා ගතො"ති තථාගතො.

කථං "තථලක්ඛණං ආගතො"ති තථාගතො? යස්මා තෙසං තෙසං ධම්මානං සභාව - සරස - ලක්ඛණං තථං අවිතථං, තං වෙස ලක්ඛණං[1] ආගතො යාථාවතො අධිගතො, තස්මා "තථලක්ඛණං ආගතො"ති තථාගතො. ගමනත්ථානං බුජ්ඣනත්ථසම්භවතො. තථා හි වදන්ති: යෙ ගතිඅත්ථා තෙ බුජ්ඣනත්ථා,[2] යෙ බුජ්ඣනත්ථා තෙ ගතිඅත්ථා" ති.

කථං "තථධම්මෙ අභිසම්බුද්ධො"ති තථාගතො? යස්මා "ඉදං දුක්ඛන්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං"ති අදිවචනතො "අවිජ්ජාය සංඛාරානං පච්චයට්ඨො, සංඛාරානං අවිජ්ජාපච්චයසම්භූතසමුදාගතට්ඨො තථො අවිතථො අනඤ්ඤථො" ති ආදිවචනතො ච තථධම්මසංඛාතෙ සච්චපටිච්චසමුප්පාදෙ යාථාවතො ආගතො අභිසම්බුද්ධො, තස්මා තථධම්මෙ අභිසම්බුද්ධොති තථාගතො.

කථං "තථදස්සිතාය" තථාගතො? යස්මා අපරිමාණාසු ලොකධාතුසු අපරිමාණානං සත්තානං ඡද්වාරගහිතආරම්මණං[3] අවිපරිතමෙව පස්සති ජානාති, ඤත්වා ච පනෙවං කතමං තං රූපං රූපායතනං? යං චතුන්නං මහාභූතානං උපාදාය"ති ආදිනා තථමෙව අවිපරීතං විභජති දසෙසති, තස්මා තථං ආගච්ඡති පස්සති ආජානාති, තං වා ආගමයති දසෙසතීති තථාගතොති එවං තථදස්සිතාය තථාගතො.

කථං "තථවාදිතාය" තථාගතො? යස්මා එස අභිසම්බොධිතො යාව පරිනිබ්බානං රාගමද්දදිනිම්මථනවසෙන එකසදිසමෙව ධම්මං තථං අවිතථං භාසති, තස්මා තථං ගදති; තථො අවිපරීතො ගදෙ[5] වචනමෙතස්සාති වා දකාරස්ස තකාරං කත්වා තථාගතොති වුච්චති. එවං තථාවාදිතාය සත්ථා තථාගතො.

---

1. M. තථලක්ඛණං. 2. බුද්ධ්‍යත්ථාති භවිතබ්බං. 3. M. ගහිතෙන ආරම්මණෙ. 4. M. ජානාති. 5. M. ආගදෙ.

කථං “තථාකාරිතාය” සත්ථා තථාගතො? භගවා හි යථා වාදී තථාකාරීති වචනතො අත්තනො වාචාය අනුරූපමෙව කරොති; තස්මා යථා වාචා තථා කායොපි ගතො පවත්තො ඉමස්සාති තථාගතොති එවං “තථාකාරිතාය” තථාගතො.

කථං ‘අභිභවනට්ඨෙන තථාගතො? යස්මා පනෙස අනුපමාය සකලලොකිය - ලොකුත්තර - ගුණසම්පදාය සමන්නාගතත්තා සදෙවකං ලොකං අභිභුය්‍ය පවත්තති, තස්මා අභිභවනට්ඨෙන තථාගතොති වුච්චති. තත්‍රෙවං පදසිද්ධි වෙදිතබ්බා: අගදො විය අගදො, දෙසනාවිලාසො චෙව පුඤ්ඤුස්සයො ච; තෙන හෙස මහානුභාවො භිසක්කො විය දිබ්බාගදෙන සප්පෙ[1] සබ්බපරප්පවාදිනො සදෙවකං ච ලොකං අභිභවති; ඉති සබ්බලොකාභිභවනෙ තථො අවිපරීතො යථාවුත්තො අගදො එතස්සාති දකාරස්ස තකාරං කත්වා තථාගතොති වුච්චතීති අයමෙත්ථ සංඛෙපො; විත්ථාරො පන දීඝාගමසංවණ්ණනාදිතො[2] ගහෙතබ්බො. ආහ චෙත්ථ:

1. “යථෙව ලොකම්හි විපස්සිආදයො
සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා,
තථා අයං සක්‍යමුනී පි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමා.

2. පහාය කාමාදිමලෙ යථා ගතා
සමාධිඤාණෙහි විපස්සිආදයො
මහෙසිනො සක්‍යමුනී ජුතින්ධරො
තථා ගතො, තෙන තථාගතො මතො.

3. තථඤ්ච ධාතායතනාදිලක්ඛණං
සභාව - සාමඤ්ඤ - විභාගභෙදතො
සයම්භුඤාණෙන ජිනොයමාගතො
තථාගතො වුච්චති සක්‍යපුඞ්ගවො.

4. තථානි සච්චානි සමන්තචක්ඛුනා
තථා ඉදප්පච්චයතා ච සබ්බසො
අනඤ්ඤනෙය්‍යා නයතො[3] විභාවිතා
යථාවතො, තෙන ජිනො තථාගතො.

5. අනන්තභෙදාසුපි ලොකධාතුසු
ජිනස්ස රූපායතනාදිගොචරෙ
විචිත්තභෙදෙ තථමෙව දස්සනං,
තථාගතො තෙන සමන්තලොචනො

---

1 M. සබ්බෙ 2. M. වණ්ණනාදිසු. 3. M. අනඤ්ඤනෙය්‍යන යතො

6. යතො ච ධම්මං තථමෙව භාසති,
කරොති වාචායනුලොමමත්තනො,
ගුණෙහි ලොකං අභිභුය්‍ය ඉරියති
තථාගතො තෙනපි ලොකනායකො"ති.

කෙනචි ගුණෙන අත්තනො විසිට්ඨස්ස කස්සචි අභාවතො නත්ථි එතස්ස උත්තමොති **අනුත්තමො**. භගවතො හි අවීචිතො පට්ඨාය යාව භවග්ගං තිරියං අපරිමාණාසු ලොකධාතූසු න කොචි කෙනචි ගුණෙන සමසමොපි අත්ථි. කුතො පන උත්තරිතරො යථාහ:

"රූපෙ සීලෙ සමාධිම්හි පඤ්ඤාය ච අසාදිසො
විමුත්තියා අසමසමො ධම්මචක්කප්පවත්තනෙ"ති

**වන්දිත්වා**ති තීහි වන්දනාහි තන්නින්නතාදිවසෙන නමිස්සිත්වා. කාය - වචී - මනොද්වාරවසෙන හි තිස්සො වන්දනා. "යථාහ තිස්සො ඉමා භික්ඛවෙ වන්දනා කායෙන වන්දති, වචසා වන්දති, මනසා වන්දතී"ති තත්ථ බුද්ධාදිගුණාරම්මණා කාමාවචර - කුසලකිරියාන - මඤ්ඤතරචෙතනා කායවිඤ්ඤත්තිං සමුට්ඨාපෙත්වා කායද්වාරප්ප- වත්තිවසෙන උප්පන්නා කායවන්දනාති වුච්චති. සා සෙව වචීවිඤ්ඤත්තිං සමුට්ඨාපෙත්වා වචීද්වාරප්පවත්තිවසෙන උප්පන්නා වචීවන්දනාති, උභයවිඤ්ඤත්තියො පන අසමුට්ඨාපෙත්වා කෙවලං මනොද්වාරප්පවත්තිවසෙන උප්පන්නා මනොවන්දනාති.

**සිරසා**ති උත්තමඞ්ගෙන කරණභූතෙන.

අබුජ්ඣි, බොධෙතාති වා[1] **බුද්ධො**. අයං හි චතුසච්චධම්මෙ සයම්පි බුජ්ඣති, පරෙපි බොධෙති; තස්මා බුජ්ඣන - බොධනට්ඨෙන බුද්ධොති වුච්චති. යථාහ: "බුජ්ඣිතා සච්චානීති බුද්ධො; බොධෙතා පජායාති බුද්ධොති - අථ වා බුද්ධසද්දස්ස ජාගරණ - විකසනත්ථෙසුපි පවත්තනතො: අබුජ්ඣි සවාසනසම්මොහනිද්දාය අච්චන්තං විගතො, බුද්ධියා විකසිතවාති බුද්ධො, භගවා හි චතුසච්චාවදස්සන විබන්ධිකාය ආවිජ්ජාසංඛාතනිද්දාය අරියමග්ගඤ්ඤාණෙන සහ වාසනාය සමුච්ඡින්නත්තා තතො අච්චන්තං විගතො, පරමරුචිර - සිරිසොභග්ගසමාගමෙන විකසිතමිව පදුමං අපරිමිතගුණ ගණාලංකත - සබ්බඤ්ඤුතඤ්ඤාණසමාගමෙන විකසිතො විකාස- මනුප්පත්තො; තස්මා ජාගරණවිකසනත්ථවසෙනපි බුද්ධොති වුච්චති.

එත්තාවතා ච දවිභාකාරෙහි භගවතො ථොමනා කතා හොති අත්තහිතසම්පත්තිතො පරහිතපටිපත්තිතො ච තාසු

1. M. බොධෙති වා.

අත්තහිතසම්පත්ති අනාවරණඤාණාධිගමො සවාසනාසකල සංකිලෙසානමච්චන්තප්පහානං අනුපාදිසෙසනිබ්බාණාධිගමො ච. පරහිතපටිපත්ති පන ආසයප්පයොගවසෙන දුවිධං පරහිත-සමීහනං, තත්ථ ධම්මදෙසනාය අභාජනෙසු දෙවදත්තාදීසු විරොධිසත්තෙසුපි නිච්චං හිතජ්ඣාසයතා, අපරිපාකගතින්ද්‍රියානං ඉන්ද්‍රියපරිපාකකාලාගමනං ච "ආසයො" නාම. තදඤ්ඤසත්තානං පන ලාභසක්කාරාදි - නිරපෙක්ඛචිත්තස්ස යානත්තයමුඛෙන සබ්බදුක්ඛනිය්‍යානිකධම්මදෙසනා "පයොගො" නාම. දුවිධාසු පනෙතාසු පරහිතපටිපත්තිසු තිවිධාසු ච අත්තහිතසම්පත්තිසු අනන්තකරුණාවචනෙන, තථා ආගතත්ථෙන ච තථාගතසද්දෙන ආසයවසෙන පරහිතපටිපත්ති දස්සිතා. බොධනත්ථෙන වා බුද්ධසද්දෙන තථා දස්සනත්ථෙන ච තථාගතසද්දෙන පයොගවසෙන. අනන්තපඤ්ඤාවචනෙන ඤාණගතිදීපකෙන තථාගතපදෙන, බුජ්ඣන - ජාගරණ - විකසනත්ථෙන ච බුද්ධසද්දෙන තිවිධාපි අත්තහිතසම්පත්ති, අනුත්තමවචනෙන ච අත්තහිත - පරහිත සම්පත්ති පකාසිතාති වෙදිතබ්බා.

අපි ච, හෙතු - ඵල - සත්තූපකාරසම්පදාවසෙන තීහාකාරෙහිපි භගවතො ථොමනා පවත්තාතීති තංවසෙනපෙත්ථ ථොමනා දට්ඨබ්බා. තත්ථ "හෙතුසම්පදා" නාම මහාකරුණාසමායොගො, බොධි-සම්භාරසම්භරණං ච; තම්මූලකත්තා සකලබුද්ධගුණානං. "ඵලසම්පදා" පන චතුබ්බිධා: ඤාණසම්පදා. පහානසම්පදා, අනුභාවසම්පදා, රූපකායසම්පදා චාති. තාසු සබ්බඤ්ඤුතඤ්ඤාණපදට්ඨානං මග්ග-ඤාණං, මග්ගඤාණපදට්ඨානං සබ්බඤ්ඤුතඤ්ඤාණං,[1] තම්මූලකානි දසබලාදිඤාණානි "ඤාණසම්පදා". අග්ගමග්ගභාවනාය සබ්බ-කිලෙසානං සහ වාසනාහි අනුප්පත්තිධම්මතාපාදනං පහානසම්පදා. අවිනෙතය්‍යාපරිමිතානං සබ්බලොකහිතානං නිප්ඵාදනෙ සදෙවක-ලොකාභිභවනෙ ච ආධිපච්චං "ආනුභාවසම්පදා" සකලලොක නයනාභිසෙකභූතා පන ලක්ඛණානුබ්‍යඤ්ජනපතිමණ්ඩිතා අත්තභාවසම්පත්ති "රූපකායසම්පදා" නාම. සත්තූපකාරො පි හෙඨා වුත්ත - පරහිතපටිපත්තිවසෙන වෙදිතබ්බො.

ඉමාසු පන අනන්තකරුණාවචනෙන, තථා ආගතත්ථෙන ච තථාගතසද්දෙන "හෙතුසම්පදා" දස්සිතා. ඵලසම්පදාසු ඤාණ-සම්පදා චෙව පහානසම්පදා ච අනන්තපඤ්ඤාවචනෙන අභිසමය-පරිදීපකෙන තථාගතපදෙන බුජ්ඣන-ජාගරණ-විකසනත්ථෙන ච බුද්ධසද්දෙන ඤාණසම්පදා දස්සිතා. "ආනුභාවසම්පදා"පි අභිනව-

1. විභාවිනී ටීකායං නත්ථි

තඬෙන තථාගතසද්දෙන, අනුත්තමවචනෙන ච විභාවිතා. "රූපකායසම්පදා" පන රූපග්ගප්පත්ති-දීපකෙන අනුත්තමපදෙන දස්සිතානි දට්ඨබ්බං.

එවං බුද්ධරතනස්ස ථොමනාපුබ්බඞ්ගමං පණාමං කත්වා ඉදානි සෙසරතනානම්පි පණාමාරහත්තා ආහ: **ධම්මං සාධුගණම්පි චාති.** භගවතො ථොමනෙනෙව ස්වාක්ඛාතතාදයො ධම්මගුණා සුප්පටිපන්නතාදයො සංඝගුණා ච දස්සිතා හොන්ති, තප්පභවස්ස අනඤ්ඤථාභාවතො න තෙසං විසුං ථොමනා කතා. අධිගතමග්ගෙ, සච්ඡිකතනිරොධෙ, යථානුසිට්ඨං පටිපජ්ජමානෙ ච අපායදුක්ඛෙසු චෙව වට්ටදුක්ඛෙසු ච අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො. සො චතුන්නං ආරියමග්ගානං, චතුන්නං ච සාමඤ්ඤඵලානං, නිබ්බානස්ස පරියත්තිධම්මස්ස ච වසෙන දසවිධො. වුත්තං හෙතං ඡත්තවිමානෙ:

"රාගවිරාගමනෙජමසොකං
ධම්මමසංඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිමං සරණත්ථමුපෙහී ති

එත්ථ හි කාමරාගාදිභෙදො සබ්බොපි රාගො විරජ්ජති එතෙනාති **රාගවිරාගො** ති මග්ගො කථිතො. එජාසංඛාතාය තණ්හාය, අන්තොනිජ්ඣානලක්ඛණස්ස ච සොකස්ස තදුප්පත්තියං සබ්බසො පරික්ඛීණත්තා **අනෙජමසොකං** ති ඵලං කථිතං. කෙනචි පච්චයෙන අසංඛතත්තා **ධම්මමසංඛතං** ති නිබ්බානං වුත්තං. අවිරොධදීපනතො පන අත්ථබ්‍යඤ්ජනසම්පන්නතාය, පකට්ඨගුණවිභාවනතො සුට්ඨු විභජිතත්තා ච **අප්පටිකූලං** ති ආදිනා සබ්බොපි පරියත්තිධම්මො කථිතොති.

තත්ථ අරියමග්ග-නිබ්බානානි නිප්පරියායෙනෙව අපායාදිතො ධාරණතො ධම්මො; ඵලපරියත්තියො පන පරියායෙන. තථා හි ධාරණං නාම අපායාදිනිබ්බත්තක - කිලෙසවිධංසනං, තං අරියමග්ගස්ස කිලෙසසමුච්ඡෙදකතාය, නිබ්බානස්ස ච ආලම්බන-භාවෙන තස්ස තදත්ථසිද්ධියා එකන්තකාරණතායාති උභින්නම්පි නිප්පරියායතො ලබ්භති ඉතරෙසු පන අරියඵලස්ස මග්ගෙන සමුච්ඡින්නකිලෙසානං පටිප්පස්සද්ධිකිච්චතාය මග්ගානුකූලප්පවත්තිතො, පරියත්තිධම්මස්ස තදධිගමහෙතුතායාති උභින්නම්පි පරියායතොව ලබ්භති.

අත්තහිත - පරහිතං සාධෙන්තීති සාධූ; තෙසං ගණො[1] **සාධුගණො**. සාධූ වා'සං ගණො ති වා **සාධුගණො**. සාධූනො වා සම්මාසම්බුද්ධස්ස ආයත්තො ගණො, තස්ස ඔරසපුත්තභාවතොති **සාධුගණො**. සො පන චතුන්නං අරියමග්ගසමඞ්ගීනං චතුන්නං ච සාමඤ්ඤඵලසමඞ්ගීනං වසෙන අට්ඨවිධො අරියසංඝො; තං **සාධුගණං**.

**පි** ච ති නිපාතසමුදායො, එකො වා නිපාතො. තිණ්ණං රතනානං වන්දනක්‍රියාය සම්පිණ්ඩනත්ථො. කෙචි ගණොති ඉධ පකරණතො ච අරියපුග්ගලගණොව ලබ්භතීති සාධූ ති භාවනපුංසකවසෙන **වන්දිත්වා** ති ඉමිනා සහ යොජෙන්ති. තද පන භයලොභාදිවිරහෙන සක්කච්චං සාදරං ති අත්ථො.

එවං පකරණාරම්භෙ යථාධිප්පෙතං රතනත්තයපණාමං කත්වා ඉදානි යත්ථ පාටවත්ථාය ඉදං පකරණං ආරභීයති පට්ඨපීයති, තං සද්ධිං දෙසක - දෙසනාපටිග්ගාහක - සම්පත්තීහි විභාවෙත්වා දස්සෙන්තො ආහ: **පණ්ඩුකම්බලනාමාසා** ති ආදි. තත්ථ **දෙවරාජස්ස පණ්ඩුකම්බලනාමාය සිලාය විමලෙ සීතලෙ තලෙ නිසින්නො අතුලවික්කමො දෙවදෙවෙහි පූජිතො දෙවදෙවො දෙවපුරක්ඛතො දෙවානං දෙවලොකස්මිං යං ධම්මං දෙසෙසී** ති සම්බන්ධො. අයම්පනෙත්ථ අත්ථො:- පණ්ඩුකම්බලසරික්ඛවණ්ණතාය පණ්ඩුකම්බලං ති නාමං සමඤ්ඤා එතිස්සාති පණ්ඩුකම්බලනාමා. සා හි සක්කස්ස තාදිසස්ස පුඤ්ඤානුභාවෙන නිබ්බත්තා - පණ්ඩුකම්බල - ජයසුමනපුප්ඵසමානෙන වණ්ණෙන සබ්බකාලං විරොචති. පමාණතො පන සට්ඨියොජනායාමා පඤ්ඤාසයොජනවිත්ථාරා පණ්ණරසයොජනුබ්බෙධා ච හොති. **සිලායාති** අවයවසම්බන්ධෙ සාමිවචනං.

තුලාය සම්මිතො තුලො; න තුලො අතුලො; අතුලො වික්කමො බලං එතස්සාති **අතුලවික්කමො**[2]. සම්මාසම්බුද්ධස්ස හි පරම්පාරමිතානුභාවසංසිද්ධෙන හත්ථිගණනාය කොටිසහස්සහත්ථීනං පුරිසගණනාය දසකොටිසහස්සපුරිසානං බලෙහි සමප්පමාණෙන කායබලෙන, අප්පමාණෙන ච ඤාණබලෙන න කස්සචි දෙවමනුස්සබ්‍රහ්මාදිසු **අඤ්ඤතරස්ස බලං තුලනාය** උපනෙතබ්බං අත්ථි. අථවා අනඤ්ඤසාධාරණත්තා අතුලො පරක්කමසංඛාතො, අපරිමාණගුණවිසෙසාවහෙන අනඤ්ඤසාධාරණෙන සම්මප්පධානෙන සමන්නාගතත්තා වා අතුලො සම්මප්පධානසංඛාතො වික්කමො ඉමස්සාති අතුලවික්කමො අතුල්‍යවික්කමො ති ච

1 M. ගණො සමුදයො. 2. M. අතුල්‍යවික්කමො.

වත්තබ්බෙ ගාථාබන්ධවසෙන යකාරලොපං කත්වා **අතුලවික්කමො** ති වුත්තං අථවා සම්මිතත්ථෙ අකාරපච්චයස්ස පි සම්භවතො අතුලො වික්කමො අස්සාති **අතුලවික්කමො** ති වුත්තං.

දිබ්බන්තී ති **දෙවා**. පඤ්චකාමගුණෙහි කීළන්ති, තෙසු වා විහරන්ති, විජයසමත්ථතායොගෙන බාහිරබ්භන්තරිකෙ පච්චත්ථිකෙ විජෙතුං ඉච්ඡන්ති, ඉස්සරියධනාදි-සක්කාරදානගහනං[1] තං තං අත්ථානුසාසනං ච කරොන්තා වොහරන්ති පුඤ්ඤඤාණානුභාවප්පවත්තාය ජුතියා ජොතන්ති, යථාධිප්පෙතං ච විසයං අප්පටිඝාතෙන ගච්ඡන්ති, යථිච්ඡිතනිප්ඵාදනෙ ච සක්කොන්තී ති අත්ථො. අථ වා දෙවනීයා, තං තං ව්‍යසනනිත්ථරණත්ථිකෙහි සරණං පරායණං ති ගමනීයා අභිත්ථවනීයා, සොභාවිසෙසයොගෙන කමනීයාති වා **දෙවා**. තෙ තිවිධා: සම්මුතිදෙවා උප්පත්තිදෙවා විසුද්ධිදෙවා ති. තත්ථ සම්මුතිදෙවා නාම මහාසම්මතාදයො ඛත්තියා. උප්පත්තිදෙවා නාම චාතුම්මහාරාජිකෙ උපාදාය තදුත්තරි දෙවා. විසුද්ධිදෙවා නාම ඛීණාසවා. ඉධ පන උප්පත්තිදෙවා දට්ඨබ්බා. නො ච ඛො තෙපි අවිසෙසෙන. ඨපෙත්වා පන යාමාදිකෙ චතුම්මහාරාජික-තාවතිංසවාසිනොව අධිප්පෙතා. තෙසං චතූහි සංගහවත්ථූහි රඤ්ජනතො රාජා ඉස්සරොති **දෙවරාජා** තස්ස **දෙවරාජස්ස,** සක්කස්ස දෙවරඤ්ඤො ති අධිප්පායො. න හි අඤ්ඤෙසං දෙවලොකෙසු නිසින්නො භගවා අභිධම්මපිටකං දෙසෙසී ති.[2]

යං ති අනියමිතනිද්දෙසො. තස්ස පන තන්ති ඉමිනා නියමනං වෙදිතබ්බං. යථාවුත්තානං තිණ්ණම්පි දෙවානං උත්තමො දෙවො, තෙහි සබ්බෙහි අධිකතරං කීළනාදි - යොගතොති **දෙවදෙවො,** භගවා. සො හි නිරතිසයාය අභිඤ්ඤාකීළාය, උත්තමෙහි දිබ්බ - බ්‍රහ්ම - අරියවිහාරෙහි, සපරසන්තානසිද්ධාය පඤ්චවිධ මාරවිජසිච්ඡානිප්ඵත්තියා[3] විත්තිස්සරිය[4] - සත්තධනාදි - සම්මාපටිපත්ති - අවෙච්චප්පසාද - සක්කාරදානගහණසංඛාතෙන යථාපරාධ - යථානුලොම - යථාධම්මානුසාසනසංඛාතෙන ච වොහාරාතිසයෙන, පරමාය පඤ්ඤාය ච සරීරප්පභාසංඛාතාය ජුතියා, අනුපමාය ඤාණසරීරගතියා, මාරවිජය-සබ්බඤ්ඤුතඤ්ඤාණ-පරහිතනිප්ඵාදනෙසු අප්පටිහතාය සත්තියා ච සමන්නාගතත්තා, සදෙවකෙන වා ලොකෙන සරණං ති ගමනීයතො අභිත්ථවනීයතො භත්තිවසෙන කමනීයතො ච සබ්බෙ තෙ දෙවෙ තෙහි තෙහි ගුණෙහි අභිභුය්‍ය ඨිතොති, සබ්බදෙවෙහි පූජනීයතරො

1. B. දහනාගහනං 2. M දෙසෙසිති 3. M. නිබ්බත්තියා
4 M. විත්තිස්සරිය

දෙවොති වා විසුද්ධිදෙවභාවසංඛාතස්ස වා සබ්බඤ්ඤුගුණාලංකාරස්ස අධිගතත්තා අඤ්ඤෙසං ච දෙවානං අතිසයෙන දෙවොති **දෙවදෙවො**.

**දෙවානං** ති තදා ධම්මපටිග්ගාහකානං දසසහස්සචක්කවාළවාසීනං මාතුදෙවපුත්තපමුඛානං උප්පත්තිදෙවානං. විසුද්ධිදෙවානමෙත්ථ ගහණං ති වදන්ති. තෙ පන උප්පත්තිදෙවෙස්වෙව සංගහිතා, මනුස්සඅරහන්තානං තත්ථ අභාවතො. **දෙවදෙවෙහී** ති විසුද්ධිදෙවෙහි. විසුද්ධිදෙවා හි වුත්තනයෙන ඉතරදෙවෙහි සාතිසයං කීළනාදියොගතො ඉධ දෙවදෙවානි අධිප්පෙතා, තෙහි. **පූජිතො** ති පූජෙතබ්බො, පූජෙතුං අරහොති අත්ථො. එතෙන විසුද්ධිදෙවෙසුපි හි භගවතො අග්ගපුග්ගලත්තං දීපෙති

**දෙසෙසී** ති මධුරකරවීකසද්දසදිසං බ්‍රහ්මස්සරං නිච්ඡාරෙන්තො පකාසෙසි. **දෙවලොකස්මිං** ති දෙවලොකෙ.

සභාවසාමඤ්ඤලක්ඛණං ධාරෙතී ති **ධම්මො.** කුසලාදිභෙදො අභිධම්මො ඉධ පන තප්පකාසක - අභිධම්මපිටකං ධම්මන්ති වුත්තං. තථා හි වක්ඛති **පිටකුත්තමෙ ති.**

**දෙවපුරක්ඛතො** ති දසසහස්ස - චක්කවාළවාසිදිබ්බ-බ්‍රහ්මෙහි පුරක්ඛතො, පරිවාරිතොති අත්ථො. නනු ච **දෙවානං** ති වචනෙනෙව දෙවපුරක්ඛතභාවො සිද්ධොති කිං දෙවපුරක්ඛතො ති වචනෙන? නායං දොසො. භගවා හි කදාචි චූලපන්ථකථෙරාදීනං විය පරම්මුඛෙ පි නිසීදිත්වා ඔභාසං විස්සජ්ජෙත්වා අත්තානං සම්මුඛෙ නිසින්නානං විය දෙසෙන්තො ධම්මං දෙසෙති. කදාචි පාරායණික-බ්‍රාහ්මණාදීනං විය සම්මුඛෙ පි නිසීදිත්වා අඤ්ඤෙහි පරිවුතො අඤ්ඤෙසම්පි ධම්මං දෙසෙති. ඉධ පන න තථා, දෙවෙහි යෙව පරිවුතො දෙවානං යෙව දෙසෙසී ති දස්සනත්ථං **දෙවපුරක්ඛතො** ති පි වත්තබ්බමෙවාති

එවමෙතස්මිං පකරණෙ ගාරවජනනත්ථං තෙන සම්පාදෙතබ්බ - පාටවවිසයමභිධම්මපිටකං දෙසකාදිසම්පත්තීහි සහ විභාවෙත්වා ඉදානි යථාධිප්පෙත-පකරණාරම්භ-පයොජනාභිධෙය්‍ය-සොතුජනසමුස්සාහන - කරණප්පකාරානි ච විභාවෙතුං **තස්සාහං** ති ආදි වුත්තං. **තස්ස පාටවත්ථාය** ති ඉමිනා පකරණාරම්භප්පයොජනං වුත්තං. **අභිධම්මාවතාරං** ති ඉමිනා අභිධානාභිධෙය්‍යානි. **මධුරං** ති ආදීහි පකරණං විසෙසෙති. **සමාසෙන** ති ච ඉමිනා සොතුජනසමුස්සාහන - කරණප්පකාරානි දට්ඨබ්බානි.[1]

1. M. පකාරානින් දට්ඨබ්බං.

**අහං** ති කත්තුභූතං අත්තානං නිද්දිසති. සො[1] හි පරො න හොති, නියකජ්ඣත්ත සංඛාතො අත්තා අහං ති වුච්චතීති. පටුනො භාවො **පාටවං**. තං යෙව අත්ථො පයොජනමෙතෙනාති පාටවත්ථො; තදත්ථාය තං සන්ධාය, විවිධනයගණනසමත්ථස්ස සුතමය ඤාණස්ස උප්පාදනත්ථං ති වුත්තං හොති. සංසාරෙ භයං ඉක්ඛන්ති, භින්දන්ති වා පාපකෙ අකුසලෙ ධම්මෙති **භික්ඛූ**, තෙසං. පිටකං ච තං උත්තමං චාති පිටකුත්තමං; තස්මිං **පිටකුත්තමෙ**, අභිධම්මපිටකෙති අධිප්පායො. තං හි පරියත්ති-භාජනත්ථතො පිටකං, තීසු පිටකෙසු විසිට්ඨභාවතො උත්තමං චාති පිටකුත්තමං. තත්ථ "පරියත්තිභාජනත්ථතො"ති පරියත්ති-අත්ථෙන චෙව භාජනත්ථෙන ච. තථා හි "මා පිටකසම්පදානෙනා"ති ආදීසු පරියත්ති පිටකන්ති වුච්චති. "අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය"ති ආදීසු කිඤ්චි භාජනම්පි. තස්මා ඉදම්පි පරියාපුණිතබ්බට්ඨෙන පරියත්ති, අභිධම්මත්ථානං පන ධාරණට්ඨෙන භාජනං චාති පරියත්ති - භාජනත්ථතො පිටකං ති වුච්චති. තෙනෙවා'හු:

"පිටකං පිටකත්ථවිදූ පරියත්ති - භාජනත්ථතො ආහු,
තෙන සමොධානෙත්වා තයොපි විනයාදයො ඤෙය්‍යා"ති.

විසිට්ඨභාවො පනෙතස්ස ලොකවොහාරම්තික්කම්ම යථාසභාව වසෙන දෙසනතො විසිට්ඨධම්මක්ඛන්ධවිභාවනතො ච වෙදිතබ්බො. එත්ථ හි සත්තො, පුග්ගලො, භික්ඛූති ආදිකං ලොකවොහාර-ම්තික්කම්ම ඛන්ධා, ධාතු, ආයතනං ති ආදිනා යථාධම්මවසෙනෙව බහුලං[2] දෙසනා පවත්තා; න ඉතරෙසු විය යථාවුත්තවොහාරවසෙන. යතො ඉදං යථාධම්මසාසනං ති වුච්චති. සබ්බසංඛතධම්මවිසිට්ඨා චෙත්ථ පඤ්චක්ඛන්ධා විසෙසතො විභාවිතො, තස්මා තිණ්ණං පිටකානං බුද්ධවචනභාවෙපි යථාසභාවානතික්කමිතදෙසනාදිතො ඉදමෙව තීසු පිටකෙසු විසිට්ඨං ති යුත්තං.

අපි ච ධම්මාතිරෙක-ධම්මවිසෙසභාවතො චස්ස විසිට්ඨභාවො වෙදිතබ්බො. අභිධම්මෙ හි නිප්පදෙසතො ඛන්ධායතනාදි-ධම්මානං විභත්තත්තා, ඉතරද්වයතො අතිරෙකතරා විසිට්ඨා ච පාළි හොති. තස්මා අතිරෙකස්ස විසිට්ඨස්ස ච පාළිධම්මස්ස වසෙන ඉදමෙව තීසු පිටකෙසු උත්තමං ති වත්තුං වට්ටති. යථාවුත්ත-විසිට්ඨභාවයොගතො යෙවෙතං අභිධම්මපිටකං ති වුච්චති, අභි-සද්දස්ස විසිට්ඨභාවජොතකතො. අපි ච වුඩ්ඪිමන්තාදිධම්මානං එත්ථ වුත්තත්තා පෙතං අභිධම්මං. යථාහු පොරාණා:

1. M. යො. 2. M. බහුලා.

“යං එත්ථ වුඩ්ඪිමන්තා – සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා
වුත්තාධිකා ච ධම්මා, – අභිධම්මො තෙන අක්ඛාතො”ති.

තථා හෙත්ථ “රූපූපපත්තියා මග්ගං භාවෙති, මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරතී”ති ආදිනා වුඩ්ඪිමන්තාපි ධම්මා වුත්තා. “රූපාරම්මණං වා සද්දාරම්මණං වා” ති ආදිනා නයෙන ආරම්මණාදීහි ලක්ඛිතබ්බත්තා සලක්ඛණාපි, “සෙඛා ධම්මා, අසෙඛා ධම්මා, ලොකුත්තරා ධම්මා” ති ආදිනා[1] පූජිතා පූජාරහාපි, “ඵස්සො හොති වෙදනා හොතී”ති ආදිනා නයෙන සභාවපරිච්ඡින්නත්තා පරිච්ඡින්නාපි, “මහග්ගතා ධම්මා, අප්පමාණා ධම්මා, අනුත්තරා ධම්මා”ති ආදිනා නයෙන අධිකා විසිට්ඨාපි ධම්මා වුත්තා, තස්මා අභිසද්දස්ස වුඩ්ඪිආදිඅත්ථෙසුපි පවත්තනතො වුඩ්ඪිමන්තා එත්ථාති ආදිනා නිබ්බචනෙන[2] ඉදම්පිටකමභිධම්මන්ති වුච්චති

අභිධම්මං අවතරන්ති[3] එතෙනාති **අභිධම්මාවතාරො**; ඉදං පකරණං. ඉමිනා පනස්ස අත්ථානුගතමභිධානං දස්සෙති. තුසද්දො පදපූරණත්ථො[4] ආචරියෙන හි ගාථාපදපූරණත්ථං යෙභුය්‍යෙන තත්ථ තත්ථ නිපාතා වුච්චන්ති. යත්ථ පන තෙසං පයොජනවිසෙසො දිස්සති තත්ථෙව තමත්ථං වක්ඛාම.

**මධුරං** ති නිප්පරියායතො මධුරසද්දො’යං ජිව්හාවිඤ්ඤෙය්‍ය රසවිසෙසෙ වත්තති; ඉධ පන ඉට්ඨභාවසාමඤ්ඤෙන අත්ථබ්‍යඤ්ජන සම්පත්ති පි මධුරසද්දෙන වුත්තා. භවති හි තංසදිසස්ස තංසද්දෙනාභිධානං, යථා අග්ගි මාණවො ති. තෙන පන මධුරෙන යොගතො ඉදම්පි මධුරං, යථා නීලගුණයොගතො නීලමුප්පලන්ති. නිපුණ – ගම්භීරතාය[5] බ්‍යඤ්ජනසම්පත්තියා චෙව අත්ථසම්පත්තියා ච අභිධම්මත්ථවිසයං මතිං වඩ්ඪෙතී ති **මතිවඩ්ඪනං**. අථවා බ්‍යඤ්ජනසම්පත්තියා මධුරං ති වුත්තං, අත්ථසම්පත්තියා මතිවඩ්ඪනං ති.

**තාලං** ති කුඤ්චිකං; කුඤ්චිකාසදිසං ති අත්ථො. මුය්හන්ති තෙනාති මොහො; අවිජ්ජායෙතං අධිවචනං. මොහො යෙව අභිධම්මමහාපුරං පවිසන්තානං පවෙසනනිවාරකත්තා කවාට–භූතොති **මොහකවාටං**, තස්ස. විඝාටෙති, විඝටීයති අනෙනාති වා **විඝාටනං**. නනු ච අවිජ්ජාකවාටං පඤ්ඤාය උග්ඝාටීයති; සා හි තස්ස උජුවිපච්චනීකභූතාති? සච්චං. ඉදම්පි තස්සා කාරණ–භාවෙන මොහකවාටවිඝාටනකරං ති වුත්තං. කාරණම්පි හි කරණවසෙන වුච්චති, යථා “චොරෙහි ගාමො දඩ්ඪො” “තිණෙහි භත්තං සිද්ධං”ති.

1. M. ආදිනා නයෙන 2. B. නිබ්බත්තවචනෙන. 3. M. ඔතරන්ති.
4. M පදපූරණෙ. 5. M නිපුණගම්භීරාය.

**සුදුත්තරං** ති ධම්මත්ථ-දෙසනා-පටිවෙධසංඛාත-චතුගම්භීරභාවපටිසංයුත්තත්තාය මන්දබුද්ධීහි[1] තරිතුං අසක්කුණෙය්‍යත්තා අතිදුත්තරං; තෙනෙව චෙදං මහොදධිසමානත්තා **මහොදධින්ති** වුත්තං. මහණ්ණවොපි හි චතුරාසීතියොජනසහස්සගම්භීරො, න සක්කා අඤ්ඤත්‍ර සිනෙරුපබ්බතරාජතො කත්ථචි පතිට්ඨං ලද්ධුං; එවමෙවම්පි චතුගම්භීරතාපටිසංයුත්තත්තා, අඤ්ඤත්‍ර තථාගතා න කත්ථචි පතිට්ඨං ලද්ධුං සක්කාති **තරණත්ථානං** ති අත්ථගහණවසෙන උත්තරිතුකාමානං. එත්ථ ච **තරංවා** ති අධිකාරවසෙන වත්තබ්බං; වක්ඛමානං වා ආනෙත්වා සම්බන්ධිතබ්බං. **තරණත්ථානං** ති පරතීරං සම්පාපුණනත්ථං උත්තරන්තානං. **තරං වා** ති උළුම්පං විය; තංසමානං ති අත්ථො.

**මකරා** නාම මච්ඡජාතිකා; තෙසං ආකරො නිවාසභූමී ති **මකරාකරො,** තං. අභිධම්මෙ නියුත්තා **ආභිධම්මිකා,** තෙසං හත්ථසාරං වියාති **හත්ථසාරං.** යථා හි මනුස්සානං බහූසු සත්තරතනාදිසු විජ්ජමානෙසු පි ආපදාසු සුඛපරිභොගත්ථං හත්ථෙ කයිරමානං සාරරතනාදිකං හත්ථසාරං ති වුච්චති, එවමිදම්පි සතිපි මහන්තෙ අභිධම්මපිටකෙ තස්ස සබ්බසො විත්ථිණ්ණතාය පරිහරිතුං න සක්කුණෙය්‍යත්තා තදත්ථසාර-සම්පිණ්ඩනවසෙන කයිරමානං ආභිධම්මිකභික්ඛූනං සුඛපරිහරණත්ථාය සම්පජ්ජතීති හත්ථසාරසදිසත්තා හත්ථසාරං ති වුත්තං.

**පවක්ඛාමී**ති පකාරෙන කථෙස්සාමි. අනාගතවචනමෙතං, වත්තමානසමීපත්තා වා අනාගතෙ වත්තමානූපචාරත්තා[2] වත්තමානවචනං, පටිඤ්ඤාතනන්තරමෙව වක්ඛාමීති.[3] අත්ථවසෙන පකාරෙන කථෙන්තොපි සද්දවසෙන සංඛිපිත්වා කථෙස්සාමීති දස්සෙන්තො ආහ **සමාසෙනාති**. සමසනං සංඛිපනං සමාසො, තෙන **සමාසෙන,** න ව්‍යාසවසෙනාති වුත්තං හොති.

එත්තාවතා ච පයොජනාභිධානාභිධෙය්‍ය - සොතුජන-සමුස්සාහන - කරණප්පකාරාති දස්සෙත්වා ඉදානි යස්මා සොතුජනසමුස්සාහනං නාම තෙසං සක්කච්චසවණෙ නියුඤ්ජනත්ථං,[4] තස්මා තෙ තත්ථ නියොජෙන්තො ආහ: **තං සුණාථ සමාහිතාති**. සක්කච්චං සවණපටිබද්ධා හි සම්මාපටිපත්ති. තත්ථ **තං** ති තං මයා වක්ඛමානං අභිධම්මාවතාරං. **සුණාථා** ති නිසාමයථ **සමාහිතා** සම්මා ආහිතා, අවහිතා, අවික්ඛිත්තචිත්තාති අත්ථො.

---

1. B. මහානාවාදීහි 2. M. -වාරතො. 3. M. එක්ඛතීති.
4. M. නියුඤ්ජනං.

එවං තාව රතනත්තයපණාමාදිකං දස්සෙත්වා ඉදානි සත්ථාරබ්භප්පකරණස්ස අත්ථසරීරභූතං අභිධම්මං සංඛෙපතො උද්දිසන්තො ආහ: **චිත්තං චෙතසිකං** ති ආදි. තත්ථ චිත්තසද්දස්ස තාව වචනත්ථං සයමෙව අනන්තරං විභාවෙස්සති. **චෙතසිකං** ති ආදීසු පන අවිප්පයොගීභාවෙන චෙතසි නියුත්තා, තත්ථ වා භවා තදායත්තවුත්තිතායාති වා චෙතසිකං. වෙදනාදි-ඛන්ධත්තයස්සෙතං අධිවචනං.

රුප්පති රුපීයතීති වා **රූපං**, සීතුණ්හාදීහි විකාරමාපජ්ජති ආපාදීයතීති අත්ථො. චතුන්නං මහාභූතානං චතුවීසති-උපාදාරූපානං ච වසෙන අට්ඨවීසතිවිධස්ස රූපක්ඛන්ධස්සෙතං අධිවචනං.

භවා භවං විනනතො සංසිබ්බනතො වානං වුච්චති තණ්හා. න විජ්ජති සා එත්ථ, තතො වා නික්ඛන්තං එතන්ති **නිබ්බානං**, අමතං අසංඛතං වත්ථු. **ඉති** සද්දො නිදස්සනෙ.

නත්ථි එතස්ස උත්තරිතරොති **නිරුත්තරො**. අථ වා චතුවෙසාරජ්ජවිසාරදත්තා[1] නත්ථි එතස්ස උත්තරං පච්චනීක-වචනං ති **නිරුත්තරො**. ඤාණප්පහාන-අන්තරාය-නිය්‍යානිකෙසු හි සදෙවකෙ ලොකෙ න කොචි සත්ථු සහධම්මිකං උත්තරවචනං කථෙතුං සමත්ථො අත්ථීති. තත්‍ර භගවා උත්‍රාසාභාවතො විසාරදො ච හොති. වුත්තං හෙතං භගවතා: "සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධා ති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතී ති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි. ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණා ති තත්‍ර වත මං =පෙ= විහරාමි. යෙ වා[2] පන තෙ අන්තරායිකා ධම්මා වුත්තා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති තත්‍ර වත මං =පෙ= විහරාමි. යස්ස ඛො පන තෙ අත්ථාය ධම්මො දෙසිතො, සො න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති තත්‍ර වත මං =පෙ= විහරාමී" ති.

චත්තාරි අරියසච්චානි පකාසෙතීති **චතුසච්චප්පකාසනො**. දුක්ඛ-සමුදය-නිරොධ-මග්ගවසෙන හි චත්තාරි අරියසච්චානි. තථාහි "චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි, කතමානි චත්තාරි?

1. M. -විහාරත්තා. 2. M. යෙ ච ඛො.

දුක්ඛං භික්ඛවෙ අරියසච්චං, දුක්ඛසමුදයො අරියසච්චං, දුක්ඛ-නිරොධො අරියසච්චං, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං'' ති. තත්ථ තෙභූමකා ධම්මා අනෙකූපද්දවාධිට්ඨානතාය, ධුව-සුභාදිවිරහෙන, කුච්ඡිතට්ඨෙන ච දුක්ඛං නාම. කම්මාදි අවිසෙසපච්චයසමවායෙ[1] දුක්ඛුප්පත්තිකාරණභාවෙන තණ්හා සමුදයො නාම, සමෙච්ච උදෙති දුක්ඛං ඉමස්මාති කත්වා. දුක්ඛස්ස අනුප්පාද-නිරොධපච්චයත්තා දුක්ඛනිරොධො නිබ්බානං. තං පන දුක්ඛනිරොධං ආලම්බණකරණවසෙන ගමනතො පාපුණනතො තදධිගමාය පටිපදාභාවතො චාති දුක්ඛනිරොධ-ගාමිනී පටිපදාති ලොකුත්තරමග්ගො වුච්චති. සබ්බො පන තෙසං තච්ඡාවිපරීතභූතභාවතො වෙදිතබ්බො. වුත්තං හි: ''ඉදං දුක්ඛන්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං'' ති විත්ථාරො. එත්ථ පන චතුන්නං අරියඵලානං අරියමග්ගසම්ප-යුත්තානං සච්චවිනිස්සටභාවෙ පි ඉධ මග්ගනිබ්බානප්පකාසනතො වචනෙනෙව තප්පකාසනත්ථම්පි වුත්තං හොති; අනාසවභාවෙන එකලක්ඛණත්තා තංහෙතුකවිසයභාවතො චාති දට්ඨබ්බං.

එත්ථ ච **නිරුත්තරො චතුසච්චප්පකාසනො** ති ඉමෙහි භගවතො චිත්තාදි - චතුබ්බිධධම්මදෙසනානුකූලගුණවිසෙසං දස්සෙතීති අතථාවිධස්ස තං-දෙසනාසාමත්ථියායොගතො. අථවා නිරුත්තරවචනෙන[2] චතුබ්බිධධම්මස්ස අනඤ්ඤථත්තං දීපෙති. **චතුසච්චප්පකාසනො** ති පන ඉමිනා යෙ තෙ ධම්මා භගවතා විනෙය්‍යපරිපාචනත්ථං දෙසිතා න තෙ ඉධ අධිප්පෙතා, යෙ පන පරිච්චෙති තෙහි අභිසමෙතබ්බවසෙන දුක්ඛාදයො චතුබ්බිධා ධම්මා වුත්තා, තෙ යෙව උද්දිසිතබ්බත්තෙන අධිප්පෙතාති දස්සෙති.

එවං සංඛෙපෙන චත්තාරො ධම්මෙ උද්දිසිත්වා ඉදානි උද්දෙසො නාම නිද්දෙසත්ථාය හොතීති යථාඋද්දිට්ඨධම්මෙ නිද්දිසිතුං **තත්ථ චිත්තං** ති ආදි ආරද්ධං. තත්ථාති තෙසු චිත්තාදිධම්මෙසු. **විසය විජානනං චිත්තං** ති යං විසයසංඛාතස්ස ආරම්මණස්ස විජානනං උපලද්ධි, තං චිත්තන්ති අත්ථො. ඉමිනා පන චිත්තස්ස ආරම්මණපටිබද්ධ වුත්තිතං අනිච්චතං ආකාරකතං ච දීපෙති. විසයවිජානනන්ති හි ආරම්මණෙන චිත්තං උපලක්ඛෙන්තො තස්ස තදායත්තවුත්තිතං, තං දීපෙන්තෙන ච තදභිමුඛකාලෙ යෙව උප්පත්තිදීපනතො අනිච්ච-භාවඤ්ච දීපෙති. භාවනිද්දෙසෙන පන විජානනමත්තදීපනතො අකාරකභාවං; යථාපච්චයං හි පවත්තිමත්තමෙවෙතං යදිදං

1. M කම්මාදිවිසෙසපච්චය. 2. M. නිරුත්තරොති වචනෙන.

සභාවධම්මො නාමාති. එවඤ්ච කත්වා සබ්බෙසම්පි චිත්තචෙතසික-ධම්මානං භාවසාධනමෙව නිප්පරියායතො ලබ්භති. යම්පන "චින්තෙතීති චිත්තං, තෙන චිත්තං විචරතීති විචාරො"ති ආදිනා කත්තුකරණවසෙන නිබ්බචනං වුච්චති, තං පරියායකථනන්ති වෙදිතබ්බං. සකසකකිච්චෙසු හි ධම්මානං අත්තප්පධානතාසමා-රොපණෙන කත්තුභාවො, තදනුකූලභාවෙන තංසම්පයුත්තෙ ධම්මසමූහෙ කත්තුභාවසමාරොපණෙන (පටිපාදෙතබ්බධම්මස්ස) කරණත්තඤ්ච පරියායතො ලබ්භතීති. තථා නිද්දිසනං[1] පන ධම්මසභාවතො අඤ්ඤස්ස කත්තාදිනො අභාවපරිදීපනත්ථන්ති වෙදිතබ්බං.

**විසයවිජානනං** ති එතෙන චිත්තස්ස ආරම්මණූපලද්ධි-ලක්ඛණතා වුත්තා. ඉදානිස්ස රසාදීනි වුච්චන්ති: පුබ්බඞ්ගමරසං හි චිත්තං; සන්ධානපච්චුපට්ඨානං; නාමරූපපදට්ඨානං. ද්වාරප්පත්තානං[2] හි තදාරම්මණවිභාවනට්ඨෙන[3] චිත්තං පුබ්බඞ්ගමං පුරෙචාරිකං. තථා හි චක්ඛුද්වාරෙන දට්ඨබ්බරූපාරම්මණං චින්තෙන්තෙව ජානාති =පෙ= මනොද්වාරෙන විඤ්ඤාතබ්බං ධම්මාරම්මණං චින්තෙන්තෙව ජානාති. යථා හි නගරගුත්තිකො සිංඝාටකෙ නිසීදිත්වා "අයං නෙවාසිකො, අයං ආගන්තුකො"ති ආගතාගතං ජනං උපධාරෙති, එවං සම්පදමිදං දට්ඨබ්බං. තස්මා ද්වාරං පත්වා තදාරම්මණවිභාවනට්ඨෙන පුරෙචාරිකං ති "පුබ්බඞ්ගමරසං." පච්ඡිමං පච්ඡිමං උප්පජ්ජමානානං පුරිමං පුරිමං නිරන්තරං කත්වා සන්දහමානමෙව උපට්ඨාතීති ගහණභාවං ගච්ඡතීති "සන්ධානපච්චුපට්ඨානං." පඤ්චවොකාරෙ පනස්ස නියමතො නාමරූපං, චතුවොකාරභවෙ නාමමෙව පදට්ඨානන්ති "නාමරූපපදට්ඨානං" ච හොති.

නානත්තලක්ඛණාදීනි පන[4] උපරි වක්ඛමානනයෙන වෙදි-තබ්බානි. වක්ඛති හි රූපපරිච්ඡෙදෙ:

"සාමඤ්ඤං වා සභාවො වා ධම්මානං ලක්ඛණං මතං;
කිච්චං වා තස්ස සම්පත්ති රසොති පරිදීපිතො;
ඵලං වා පච්චුපට්ඨානං, උපට්ඨානනයො පි වා
ආසන්නකාරණං යන්තු තං පදට්ඨානසඤ්ඤිතං"ති.

යත්ථ යත්ථ පන ලක්ඛණාදීනි වුච්චන්ති තත්ථ තත්ථ ඉමිනාව නයෙන තෙසං නානත්තං වෙදිතබ්බං. වචනත්ථවිජානනෙන විදිතචිත්තසමඤ්ඤස්ස[5] උත්තරි චිත්තවිභාගො වුච්චමානො සොභෙය්‍යාති වචනත්ථවිජානනමෙව තාව ආදිම්හි යුත්තතරන්ති තං තාව කථෙතුකම්‍යතාය පුච්ඡති **"තස්ස පන කො වචනත්ථො"**ති.

1. M. නිදස්සනං. 2. M. ද්වාරං පත්වා. 3. M. තදාරම්මණං.
4. M. නානත්තං පන ලක්ඛණාදිකං. 5. B. චිත්තාපි චිත්තං-.

පඤ්චවිධා හි පුච්ඡා: අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡෙදනා පුච්ඡා, අනුමතිපුච්ඡා, කථෙතුකම්‍යතා පුච්ඡාති. තත්ථ යං අඤ්ඤාතං අදිට්ඨං තස්ස ඤාණාය දස්සනාය පඤ්හකරණං "අදිට්ඨජොතනා පුච්ඡා" නාම. යං පන ඤාතං දිට්ඨං, අඤ්ඤෙහි පණ්ඩිතෙහි සංසන්දනත්ථාය පඤ්හකරණං "දිට්ඨසංසන්දනා පුච්ඡා" නාම. පකතියා පන සංසයපක්ඛන්තස්ස[1] අත්තනො සංසයසමුග්ඝාතත්ථං පඤ්හකරණං "විමතිච්ඡෙදනා පුච්ඡා" නාම. "තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යදනිච්චං තං දුක්ඛං වා සුඛං වා"ති ආදිනා අනුමතිගහණත්ථං පඤ්හකරණං "අනුමතිපුච්ඡා" නාම. "චත්තාරොමෙ භික්ඛවෙ සතිපට්ඨානා. කතමෙ චත්තාරො"ති ආදි පන තංතංධම්මානං දෙසනාධිප්පායෙන පඤ්හකරණං "කථෙතුකම්‍යතා පුච්ඡා" නාම තාසු පුරිමා තිස්සො ආචරියානං න සම්භවන්ති. න හි තෙ ගන්ථකරණත්ථාය ආරභිත්වා ඉදානි අදිට්ඨං ජොතෙන්ති, දිට්ඨං වා සංසන්දෙන්ති, සංසයං වා පක්ඛන්දන්ති. තබ්බිසොධනපුබ්බකමෙව ගන්ථකරණෙ අභිනිවෙසතො. ඉතරා පන ද්වෙ සම්භවන්ති. තාසු අයං කථෙතුකම්‍යතා පුච්ඡා. අපි ච චොදනං සමුට්ඨපෙන්තා ආචරියා අඤ්ඤචොදකං[2] පරිකප්පෙත්වා තස්ස වචනවසෙන සමුට්ඨාපෙන්තී ති, තංවසෙනෙත්ථ අදිට්ඨජොතන – විමතිච්ඡෙදන – පුච්ඡාපි ලබ්භන්තෙවාති දට්ඨබ්බං.

**තස්සාති** තස්ස චිත්තසද්දස්ස චිත්තෙන හි අධිකතෙ[3] තස්ස වාචකො සද්දොපි සාහචරියතො අධිකතො[4] නිද්දිට්ඨොව[5] හොතීති තස්ස ඉධ තංසද්දෙන පරිග්ගහො. කෙචි පන තස්ස චිත්තස්සාති අත්ථං වදන්ති. තං "**තස්ස ඛො වචනත්ථො**"ති ඉමිනා න සමෙති. න හි "චිත්තස්ස ඛො වචනත්ථො"ති පුච්ඡා සම්භවතීති. ඉදානි යථාපුච්ඡිතමත්ථං විස්සජ්ජෙතුං "වුච්චතෙ"ති තාව පටිඤ්ඤං කත්වා **සබ්බසංගාහකවසෙන** ති ආදිනා විස්සජ්ජනමාරද්ධං.

තත්ථ **සබ්බසංගාහකවසෙන** ති හෙට්ඨිමන්තතො චක්ඛුවිඤ්ඤාණාදයො උපාදාය සබ්බෙසං ආරම්මණවිජානනසභාවතො තෙසං සබ්බෙසමෙව සංගාහකවසෙන. න පන චක්ඛුමාන-නිබ්බචනෙසු විය යථාලාභවසෙනා ති අත්ථො. **චිනොතීති** විජානාති. චින්තෙන්ති තෙන ගොචරන්ති වා චිත්තං. සම්පයුත්තධම්මානං කත්තුතාසමාරොපණෙන හි'ස්ස කරණභාවො යථාලාභාවසෙනපි දස්සෙතුං "**අත්තසන්තානං චිනොති**" ති ආදි වුත්තං. සබ්බසාධාරණත්තා හි චිත්තසද්දස්ස යත්ථ යත්ථ යථා යථා අත්ථො

1. B. M පක්ඛන්දස්ස 2. M. අඤ්ඤං චොදකං (අසන්තචොදකං?)
3. M. අධිගතෙ. 4. M. අධිගතොව. 5. මරම්මපොත්ථකෙ නත්ථි.

උපලබ්භති තත්ථ තත්ථ තථා තථා ගහෙතබ්බො. යස්ස පන චිත්තස්ස යථාවුත්ත - අත්ථවිසෙසො න ලබ්භති, තං රුළ්හිවසෙන චිත්තං ති වෙදිතබ්බං, යථා කිලඤ්ජාදීහි කතම්පි තාලපණ්ණෙහි කතසරික්ඛතාය තාලවණ්ටන්ති පවුච්චතීති.[6]

**අත්තසන්තානං** ති සකසන්තානං. ජවනසන්තානං ති අත්ථො. අත්තසද්දස්ස හි පරපච්චනීකවචනත්තා අත්තනො සන්තානොති සදිසවසෙන උප්පජ්ජමානො ජවනසන්තානො වුච්චති. තං රාසීකරොතීති අයමත්ථො. සාසෙවනකානං ජවනචිත්තානං වසෙන දට්ඨබ්බො. තානි හි ජවනවසෙන[7] උප්පජ්ජන්තො[7] පුරෙජාතානි පච්ඡාජාතානං ආසෙවනපච්චයො[8] හුත්වා අත්තනො ජවනසන්තානස්ස පගුණබලවභාවකරණෙන චිනන්ති නාම. වා - සද්දො අසබ්බසංගාහකත්ථවිකප්පනෙ පි - සද්දො, කිරියාසම්පිණ්ඩනත්ථො. අථවා සබ්බසංගාහකවසෙනාති ඉමස්ස ඉධාපි සම්බන්ධො හොතීති ඉදම්පි සංගහෙතබ්බ - සංගාහකවසෙන[9] වුත්තන්ති ගය්හමානෙ අත්තසන්තානං ති විඤ්ඤාණවචනස්ස අත්තසද්දස්ස සකත්ථවුත්තිසෙව වා වසෙන[10] චිත්තසන්තානං ති අත්ථො. අනන්තරාදිපච්චයවසෙන හි චිත්තසන්තානස්ස අබ්බොච්ඡින්නප්පවත්තිකාරණතො සබ්බමෙව චිත්තජාතං චිත්තසන්තානං චිනොති නාම ඉමස්මිං පනත්ථෙ වා-සද්දො කිරියාවිකප්පනත්ථො, පි - සද්දො චිත්තන්ති ඉමස්ස ආකඩ්ඪනත්ථොති දට්ඨබ්බං. පුරිමපක්ඛෙ පන චිත්තං ති අධිකාරතො ගහෙතබ්බං.

විචිත්තං කරොති, විචිත්තචිත්තස්ස වා කරණං කාරකං[11]ති විචිත්තකරණං; තතො **විචිත්තකරණා** විචිත්තචිත්තකම්මාදීනං කරණතොති අත්ථො. ලොකස්මිං හි යං කිඤ්චි චිත්තකම්මාදිභෙදං විචිත්තං සිප්පජාතං, සබ්බං තං චිත්තෙනෙව චින්තෙත්වා කරීයති. තෙනාහ භගවා: "දිට්ඨං වො භික්ඛවෙ චරණං නාම චිත්තං? එවම්භන්තෙ. තම්පි ඛො භික්ඛවෙ චරණං චිත්තං චිත්තෙනෙව චින්තිතං"ති. සචායමත්ථො සවිඤ්ඤත්තිකානං ඛත්තිං සචිත්තාන මුපලබ්භති, සාසවකුසලාකුසලං වා විචිත්තගති ආදිකරණතො විචිත්තකරණට්ඨෙන චිත්තං. නනු ච විචිත්තගති ආදයො කම්මවසෙන නිප්ඵජ්ජන්ති? යථාහ: "කම්මනානාකරණං පටිච්ච සත්තානං ගතියා නානාකරණං පඤ්ඤායති: අපද - දිපද- චතුප්පද බහුප්පද රූපිනො අරූපිනො සඤ්ඤිනො අසඤ්ඤිනො නෙවසඤ්ඤිනාසඤ්ඤිනො. කම්මනානාකරණං පටිච්ච සත්තානං

6. M. තාලපණ්ණන්ති වුච්චතීති 7 M. මරම්මපොත්ථකෙ නත්ථි. 8. M. පච්චයා. 9. M සබ්බසංගාහකවසෙන. 10. M. සකත්ථ-වුත්තිතායෙව තංවසෙන. 11. මරම්මපොත්ථකෙ නත්ථි.

උප්පත්තියා නානාකරණං පඤ්ඤායති, උච්චනීචතා, හීනපණීතතා,
සුගත - දුග්ගතතා. කම්මනානාකරණං පටිච්ච සත්තානං අත්ත
භාවෙ නානාකරණං පඤ්ඤායති සුවණ්ණ - දුබ්බණ්ණතා,
සුජාත - දුජ්ජාතතා, සුසණ්ඨිත - දුස්සණ්ඨිතතා. කම්මනානාකරණං
පටිච්ච සත්තානං ලොකධම්මෙ නානාකරණං පඤ්ඤායති ලාභා
ලාභෙ, යසායසෙ, නින්දාපසංසාය, සුඛදුක්ඛෙ"ති. තස්මා කම්ම
භෙදනිබ්බත්තා ගතිආදීනං විචිත්තතා. කම්මන්ති ච චෙතසික
ධම්මභූතා චෙතනා - අභිජ්ඣාදයො ච වුච්චන්ති, න චිත්තන්ති කථං
චිත්තස්ස විචිත්තගතිආදිකරණං ති? වුච්චතෙ: කම්මස්සපි චිත්ත
සන්නිස්සිතත්තා තන්නිප්ඵාදිතම්පි චිත්තෙනෙව කතං හොති; යථා
රාජයොධෙන පරාජිතො සත්තු රඤ්ඤා ජිතොති වුච්චති.

විචිත්තං කරණමස්සාති වා විචිත්තකරණං, තතො එකට්ඨා
නිකවජ්ජිතං හි විචිත්තං පච්චෙකං පටිසඞ්ඛාදිවිචිත්තක්‍රියා
වත්තනතාය සබ්බමෙව වා චිත්තං ආවජ්ජනාදි - අඤ්ඤමඤ්ඤවි
සදිසක්‍රියවත්තනතාය විචිත්තකරණයුත්තන්ති සබ්බවිකප්පෙසු පි
"රූපභවො රූපං"ති ආදිසු විය උත්තරපදලොපො. වුත්තන
යෙන (?) විචිත්තපරියායෙන ච චිත්තසද්දෙන විග්ගහො
වි - සද්දලොපො වා දට්ඨබ්බො. අථවා **විචිත්තකරණා** ති ඉදං
චිත්තවිචිත්තභාවස්ස ඤාපක-හෙතුනිදස්සනං. තෙන යස්මා
තස්ස තස්ස විචිත්තස්ස නිප්ඵාදකං සයම්පි තථෙව විචිත්තං ති
විඤ්ඤාතබ්බන්ති එවං කරණවිචිත්තතාය විචිත්තතා චිත්තන්ති
අත්ථො.

ඨපෙත්වා කරණවිචිත්තතාය විචිත්තභාවං අත්තනො එව ජාති-
භූමි - සම්පයොගාදිවසෙන විචිත්තතාය විචිත්තං ති දස්සෙන්තො
ආහ: **අත්තනො චිත්තතාය වා** ති තත්ථ යස්මා අඤ්ඤදෙව
කුසලං, අඤ්ඤං අව්‍යාකතං, අඤ්ඤං කාමාවචරං, අඤ්ඤං රූපාවචරා
දිභෙදං, අඤ්ඤං සරාගං, අඤ්ඤං වීතරාගං, අඤ්ඤං සදොසං, අඤ්ඤං
වීතදොසං, අඤ්ඤං සමොහං, අඤ්ඤං වීතමොහං, අඤ්ඤං රූපා
රම්මණං, අඤ්ඤං සද්දාදිආරම්මණං, රූපාරම්මණෙසු ච අඤ්ඤං
නීලාරම්මණං, අඤ්ඤං පීතාදිආරම්මණං, එවං සද්දාරම්මණාදීසුපි
යථාසම්භවං, සබ්බෙසු ච තෙසු අඤ්ඤං හීනං, අඤ්ඤං මජ්ඣිමං,
අඤ්ඤං පණීතං, හීනාදීසු ච අඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං, අඤ්ඤං
චිත්තාධිපතෙය්‍යං, අඤ්ඤං විරියාධිපතෙය්‍යං, අඤ්ඤං වීමංසාධි
පතෙය්‍යන්ති එවමාදිනා ජාති - භූමි - සම්පයුත්ත - ආරම්මණ - හීන
මජ්ඣිම - පණීතතා - අධිපති - ආදීනං වසෙන විචිත්තමනෙකප්ප-
කාරකං, තස්මා ඉමාය අත්තවිචිත්තතාය වා චිත්තන්ති වුච්චතී ති.

කාමඤ්චෙත්ථ එකමෙව චිත්තං එවං විචිත්තං න හොති, විචිත්තානං පන අන්තොගධත්තා එතෙසු යං කිඤ්චි එකම්පි විචිත්තත්තා චිත්තන්ති වත්තුං වට්ටති; සමුදායවොහාරෙන අවයවස්සාපි වොහාරියමානත්තා. යථා පබ්බත - නදී - සමුද්දාදීනං එකදෙසාපි දිස්වා පබ්බතාදයො දිට්ඨාති. යථා ච එකෙකචිත්තසම්පයුත්තා පි වෙදනාදයො රාසට්ඨෙන ඛන්ධවොහාරෙන වෙදනාක්ඛන්ධොති ආදිනා වුච්චන්ති. අපිචෙත්ථ විපාකවිඤ්ඤාණං කම්මකිලෙසෙහි චිතං ති චිත්තං. තං හි කිලෙසසහායෙන කම්මුනා ඵලභාවෙන නිබ්බත්තිතං, තෙහි චිතං නාම හොති. හොතු තාවිදං ලොකියවිපාකං සන්ධාය, ලොකුත්තරං පන පච්චා කථන්ති? වුච්චතෙ: "කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ ලොකුත්තරං මග්ගං[1] භාවෙති[1] =පෙ= තස්මිං සමයෙ අවිජ්ජාපච්චයා සංඛාරා"ති ආදිනා අරියමග්ගචෙතනාය පි අවිජ්ජූපනිස්සයභාවස්ස පකාසිතත්තා ලොකුත්තරකුසලස්සාපි අනුසයා උපනිස්සයා හොන්තීති, තංනිබ්බත්තිතස්ස විපාකස්ස කම්මකිලෙසසඤ්චිතතා-පරියායො ලබ්භතීති.

චිතං තායතීති වා චිත්තං. කම්මාදිසඤ්චිතොපි හි අත්තභාවො විඤ්ඤාණූපරමෙ මතොති වුච්චති. යථාහ:

"ආයු උස්මා ච විඤ්ඤාණං යදා කායං ජහන්ති'මං
අපවිද්ධො තදා සෙති, නිරත්ථං ව කලිඞ්ගරං"ති.

සො පනායං චිත්තසද්දො කිඤ්චාපි අඤ්ඤත්ථෙසු දිස්සති: තථා හෙස "චිත්තො ගහපතී"ති (ආදිසු) පඤ්ඤත්තියං ආගතො. "සබ්බො ලොකො පරචිත්තෙන අචිත්තො"ති ආදිසු විඤ්ඤාණෙ. "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි එවං විචිත්තං යථයිදං චිත්තං"ති ආදිසු විචිත්තෙන නානප්පකාරෙ. "චරණං නාම චිත්තං"ති ආදිසු චිත්තකම්මකෙ. ඉධ පන චතුබ්බිධධම්ම[2] නිද්දෙසතො පකරණවසෙන යථාවුත්තවචනත්ථයුත්තො විඤ්ඤාණවචනෙනෙව දට්ඨබ්බො ති ඉමමත්ථං දස්සෙන්තො ආහ **පඤ්ඤත්තියම්පී** ති ආදිං.

පඤ්ඤපීයති එතායාති පඤ්ඤත්ති. තස්සං නාම පඤ්ඤත්තියන්ති අත්ථො. චිත්තොති හි එකස්ස ගහපතිනො නාම කම්මං පි - සද්දො වක්ඛමාන - සම්පිණ්ඩනත්ථො. **විඤ්ඤාණෙ** ති සවිපාකාවිපාකභෙදෙ චිත්තෙ. තං හි විජානනට්ඨෙන විඤ්ඤාණං ති වුච්චති. යථාහ: "විජානාතීති ඛො භික්ඛවෙ විඤ්ඤාණං; තස්මා

1. M. කුසලං චිත්තං උප්පන්නං හොති. 2. B. M. -ධම්මෙ.

විඤ්ඤාණන්ති වුච්චතී"ති. **චිත්තසම්මුති** ති චිත්තවොහාරො. **දට්ඨබ්බා** ති විඤ්ඤාතබ්බා. **ඉධා** ති ඉමස්මිං චතුබ්බිධ-ධම්මනිද්දෙසට්ඨානෙ. **විඤ්ඤූනා** ති විජානතා, ආභිධම්මිකෙනාති අත්ථො.

විභාගවන්තානං ධම්මානං සභාවවිභාවනං විභාගෙන විනා න හොතීති, තං තස්ස විභාගං දස්සෙතුං **සාරම්මණකො** ති ආදි ආරද්ධං. තත්ථ[1] ආලම්බන්ති තං නිස්සාය පවත්තන්තී ති ආරම්මණං, පච්චයො ගොචරො ච. තථා හි: "ලභති මාරො ආරම්මණං ලභති මාරො ඔතාරං"ති ආදිසු පච්චයො ආරම්මණන්ති වුච්චති. "නිමිත්තං අස්සාසපස්සාසා ආරම්මණ[2]මෙකචිත්තස්සා"ති ආදිසු ගොචරො. ඉධ පන උභයම්පි වට්ටති, සබ්බසොව චිත්තස්ස පච්චයගොචරත්තා.[3] සහ ආරම්මණෙන වත්තති තදවිනාභාවතොති සාරම්මණං, භාවප්පධානනිද්දෙසවසෙන වෙත්ථ සාරම්මණභාවො සාරම්මණසද්දෙන වුත්තො. යථා "ඉදම්පි බුද්ධෙ රතනං පණීතං" "චක්ඛු සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා"ති ආදිසු රතන-අත්තනත්තනියාදිභාවො රතනාදිසද්දෙහීති. තතො සාරම්මණ-භාවතොති අත්ථො. එවමඤ්ඤත්ථාපි යථානුරූපං දට්ඨබ්බං. **එකවිධං** ති එකප්පකාරං එකකොට්ඨාසන්ති අත්ථො.

**සවිපාකාවිපාකතො** ති විපාකුප්පාදනසභාවස්ස විජ්ජමානාවිජ්ජමානභාවතො. විපාකසද්දො හි ද්වීසු අත්ථෙසු වත්තති: කත්ථචි විපක්කභාවමාපන්නෙසු අරූපධම්මෙසු; කත්ථචි විපාකුප්පාදනසභාවෙ. තථා හෙස "විපාකධම්මා"ති ආදිසු විපක්කභාවමාපන්නෙසු අරූපධම්මෙසු පවත්තති. "විපාකධම්මධම්මා"ති ආදිසු විපාකුප්පාදනසභාවෙ. ඉධ පන සභාවෙ[4] දට්ඨබ්බො. ඉතරථා හි අභිඤ්ඤාකුසලාදීනං සවිපාකපදෙ අසංගහිතභාවාපත්ති සියා. තථා හි යදි විපක්කභාවමාපන්නා එව ධම්මා ඉධ ගහිතා සියුං, තෙ යස්ස සන්ති තං සවිපාකං, ඉතරමවිපාකන්ති අභිඤ්ඤාකුසලස්ස චෙව කදාචි අවිපාකස්ස දිට්ඨධම්මවෙදනියාදිකම්මස්ස, භාවනාය පහාතබ්බ-අකුසලස්ස[5] ච විපාකුප්පත්තියා අභාවතො අවිපාකපදසංගහො සියා එවමසති[6] **අවිපාකමව්‍යාකත**න්ති වක්ඛමානත්තා තෙසං අව්‍යාකතභාවො ආපජ්ජති. න චෙතමිට්ඨං කුසලාකුසලනිද්දෙසෙ'යෙව තෙසං නිද්දෙසතො. විපාකුප්පාදනසභාවෙ පන ගහිතෙ තංසභාවො නාම අනුපච්ඡින්න අවිජ්ජා-මාන-තණ්හානුසයස්මිං සන්තානෙ සබ්‍යාපාරප්පවත්ති එවාති තස්සා තෙසුපි අත්ථිතාය අසතිපි විපාකුප්පාදනෙ සවිපාකපද-

1. M. තත්ථ අත්තනා. 2. M. අනාරම්මණ. 3. M සප්පච්චය-. 4. M. විපාකුප්පාදනසභාවො 5. M. පහාතබ්බදි-. 6. M. එවං ච සති

සංගහො සිද්ධොති න කොචි ඉධවිසෙසො ආපජ්ජති. යෙන පන කාරණෙන අභිඤ්ඤාකුසලාදිකවිපාකං, යො චෙත්ථ වත්තබ්බො විනිච්ඡයො, තං සබ්බං තස්ස තස්ස ආගතට්ඨානෙ යෙව දස්සයිස්සාම.

කතමං පනෙත්ථ සවිපාකං, කතමං අවිපාකං ති චොදනං සන්ධායා'හ: **තත්ථ සවිපාකං** ති ආදිං. **අව්‍යාකතං** ති විපාකක්‍රියාවසෙන දුවිධමව්‍යාකතං තෙසු විපාකචිත්තං තාව ආදාසගතමුඛනිමිත්තං[3] විය නිරුස්සාහන්තා විපාකුප්පාදනෙ අසමත්ථං. ක්‍රියාචිත්තෙසු ච යදෙතං ඛීණාසවසන්තානෙයෙව නියමිතමට්ඨාරසවිධං විඤ්ඤාණං, තං උච්ඡින්නභවමූලාය සන්තතියං පවත්තත්ති සමුච්ඡින්නමූලාය ලතාය පුප්ඵං විය ඵලදායී න හොති. ආවජ්ජනද්වයම්පන අනුපච්ඡින්නභවමූලෙපි සන්තානෙ පවත්තමානං අනාසෙවනභාවෙන දුබ්බලත්තා මොඝපුප්ඵං විය බීජභාවෙ අසමත්ථං[4] අඵලමෙව[4] ඉති සබ්බමෙතං අව්‍යාකතං විපාකාරහතාභාවතො අවිපාකංති වුත්තං: **අවිපාකමව්‍යාකතං** ති. "ජායන්ති එත්ථ විසදිසාපි[5] සදිසාකාරාති ජාති; සමානාකාරො. කුසලාකුසලාව්‍යාකතානං ජාති **කුසලාකුසලාව්‍යාකතජාති.** තස්ස භෙදතො **තිවිධං** කුසලාකුසලමව්‍යාකතන්ති.

වචනත්ථපුච්ඡාය පයොජනං වුත්තමෙව. **කුච්ඡිතානං** ති ආදි විස්සජ්ජනං. තත්ථ **කුච්ඡිතානං** ති නින්දිතානං. අසුචි විය නාගරිකෙහි විඤ්ඤූහි ගරහිතබ්බානං පාපධම්මානං ති අත්ථො. **සලනතො** ති හිංසනතො අපනයනතො වා. කුසලා හි යථානුරූපං තදඞ්ගාදිවසෙන අකුසලධම්මෙ පජහන්තං තෙ හිංසති අපනයති ති වා වුච්චති. අථ වා **සලනතො** සංවරණතො පිදහනතොති අත්ථො. කුසලධම්මවසෙන හි අකුසලුප්පත්තිනිවාරණෙන අප්පවත්තිධම්මතාපාදනෙන ච මනච්ඡට්ඨෙසු ද්වාරෙසු අප්පවත්තියා සංවුතා පිහිතා හොන්ති. **කුසානං** ති රාගාදිඅසුචිසම්පයොගෙන නානාවිධදුක්ඛහෙතුතාය ච කුච්ඡිතෙන ආකාරෙන අප්පහීනභාවෙන සන්තානෙ සයන්ති පවත්තන්තී ති **කුසා**, පාපධම්මා. අථවා, කුච්ඡිතානං පාණාතිපාතාදීනං සාවජ්ජධම්මානං සාණතො තෙජනතො **කුසා**, දොසලොභාදයො. දොසාදීනං හි වසෙන චෙතනාය තික්ඛභාවප්පත්තියා පාණාතිපාතාදීනං මහාසාවජ්ජතා ති. තෙසං **ලවනෙන** ඡින්දනෙන, යථානුරූපං පජහනෙනාති අත්ථො

---

3. M. ආදාසතලෙ-. 4. M. අසමත්ථඵලමෙව. 5. M. අසදිසාපි.

**කුසෙනා** ති කුච්ඡිතානං සානතො තනුකරණතො ඔසානකරණතො වා කුසො ති ලද්ධනාමෙන ඤාණෙන. **ලාතබ්බත්තා** ති ආදාතබ්බත්තා; සහජාත-උපනිස්සයභාවෙන සන්තානෙ පවත්තෙතබ්බත්තා. ඤාණං හි තිහෙතුකකුසලං සහජාතභාවෙන චෙව උපනිස්සයභාවෙන ච, දුහෙතුකකුසලං උපනිස්සයභාවෙනෙව සන්තානෙ පවත්තෙති. එවඤ්ච කත්වා "කොසල්ලසම්භූතට්ඨො කුසලට්ඨො"ති සබ්බකුසලානං සාධාරණවසෙන අත්ථො වුච්චති. අථවා **කුසෙනා** ති ජාතිසද්දතාය එකවචනනිද්දෙසො. කුසෙහීති පන අත්ථො. පුඤ්ඤක්‍රියවසෙන හි පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි යථාවුත්තනයෙන කුසා ති වුච්චන්ති; තෙහි ලාතබ්බත්තා වුත්තනයෙන පවත්තෙතබ්බත්තා. අපි චෙ'ත්ථ:

කුසො විය ලුණාතී ති, කුසා විය ලුණන්ති වා,
කුසලං කුං සලෙතීති, ලුණාති කුසමිච්චපි.

තත්ථ යථා කුසො ගහිතො උභයභාගගතං හත්ථපදෙසං ලුණාති, එවමිදම්පි උප්පන්නානුප්පන්නවසෙන උභයභාගගතං කිලෙසපක්ඛං ලුණාති ඡින්දති සෙය්‍යථාපි "අනුප්පන්නානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති, උප්පන්නානං =පෙ= පහානායා"ති ආගතං සම්මප්පධානං, තස්මා කුසො විය ලුණාතී ති කුසලං. කුසා විය ලුණන්තී ති එත්ථ කු-ඉති භූමි වුච්චති, ධම්මානං අධිට්ඨානභාවෙන. තංසදිසතාය ඉධ රූපාරූපප්පබන්ධො[1] වුත්තො. අත්තනො නිස්සයභූතස්ස එතරහි ආයතිං ච අනුදහනතො විනාසනතො කුං සායන්තී ති **කුසා**; රාගාදයො. තෙ විය අත්තනො නිස්සයං ලුණාති ඡින්දතී ති **කුසලං**. පයොගසම්පාදකා[2] හි කුසලා ධම්මා අච්චන්තමෙව රූපාරූපධම්මෙ අප්පවත්තිකරණෙන සමුච්ඡින්දන්ති අනුපාදිසෙස-නිබ්බානධාතුපාපනතොති. වුත්තනයෙන පන කු-ඉති ලද්ධනාමස්ස රූපාරූපප්පබන්ධස්ස සලනතො අපනයනතො "කුං සලෙතීති කුසලං. "කුසං ලුණාතී"ති පන කුච්ඡිතා එත්ථ සයන්ති ති කුසො, කායො; තං ලුණාති යථාවුත්තනයෙනෙවාති **කුසලං**.

ඉදානි කුසලසද්දස්ස අත්ථුද්ධාරදස්සනත්ථමාහ: **ඡෙකෙ කුසලසද්දොයං** ති ආදිං. තත්ථ "කුසලො ත්වං රථස්ස අංගපච්චඞ්ගානං" "කුසලා නච්චගීතස්ස සික්ඛිතා චාතුරිත්ථියො"ති ආදිසු ඡෙකෙ දිට්ඨො, පවීණත්ථෙ'ති[3] අත්ථො. "කච්චි නු භොතො කුසලං, කච්චි භොතො අනාමයං" ති ආදිසු **ආරොග්‍යෙ**. "කතමො පන

1. M. රූපාරූපක්ඛන්ධා. 2. M. පයොගසම්පාදිතා 3. M. ඡෙකපරියායො පවීණත්ථොති.

භන්තෙ කායසමාචාරො කුසලො? යො ඛො මහාරාජ අනවජ්ජො කායසමාචාරො." "පුන ච පරං භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති කුසලෙසු ධම්මෙසූ"ති ආදීසු **අනවජ්ජෙ**. "කුසලානං ධම්මානං සමාදානහෙතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪති" "කුසලස්ස ධම්මස්ස කතත්තා උපචිතත්තා"ති ආදීසු **ඉට්ඨවිපාකෙ**. **අනවජ්ජාදිකෙ**ති අනවජ්ජ - ඉට්ඨවිපාකෙ. "අනවජ්ජාදිකෙ"ති ච අත්ථතො වක්ඛමානලක්ඛණස්ස අනුරූපත්තා වුත්තං. න පන අරොග්‍යත්ථස්ස අසම්භවතො. කිලෙසරොගස්ස හි අභාවතො කුසලං අරොගං හොති. වජ්ජා රාගාදයො; තෙ යස්ස න සන්ති, තං අනවජ්ජං. ඉට්ඨො විපාකො චතුක්ඛන්ධසංඛාතො යස්ස තං **ඉට්ඨවිපාකං**. ඉට්ඨවිපාකතා චස්ස තංසභාවවන්තතාය දට්ඨබ්බං, න තස්ස අවස්සං ඉට්ඨවිපාකසම්භවතො යෙව. ලක්ඛියති අනෙනාති **ලක්ඛණං** අනවජ්ජං ච තං ඉට්ඨවිපාකං චාති අනවජ්ජඉට්ඨවිපාකං; තං ලක්ඛණමස්සාති **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං**.

නනු ච කුසලමෙව අනවජ්ජඉට්ඨවිපාකං වුත්තන්තියාමෙත පන අනවජ්ජ - ඉට්ඨවිපාකතො අඤ්ඤං කුසලං සියා. න හි සයමෙව අත්තනො ලක්ඛණං ති සක්කා වත්තුන්ති. නායං දොසො: පරිඤ්ඤාතාපරිඤ්ඤාත - වචනත්ථභාවභෙදෙන[1] එකස්සාපි ලක්ඛි - තබ්බ - ලක්ඛණභාවපරිකප්පනතො. අනවජ්ජඉට්ඨවිපාකං ති හි පරිඤ්ඤාතවචනත්ථං; කුසලං ති අපරිඤ්ඤාතවචනත්ථං; එවං ච යෙන සභාවෙන පරිඤ්ඤාතවචනත්ථස්ස සද්දස්ස අත්ථො හොති, යෙන ච අපරිඤ්ඤාතවචනත්ථස්ස, තෙසං පරිඤ්ඤාතාපරිඤ්ඤාතවචනත්ථස භාවනං භෙදෙන තංසම්බන්ධිස්ස කුසලස්ස එකස්සපි භෙදො පරිකප්පීයති, යථා "පුරෙ භවං පටු ආසි, පටුතරො එතරහී"ති ගුණභෙදෙන වත්ථුභෙදො[2] පරිකප්පීයති. තස්මා පරිඤ්ඤාතව- චනත්ථභාවෙන ලක්ඛණං, අපරිඤ්ඤාතවචනත්ථභාවෙන ලක්ඛිතබ්බං ති එවං පරිකප්පිතභෙදෙ පරිගය්හමානෙ න කොචි දොසො ආපජ්ජති. අථවා ලක්ඛීයතී ති ලක්ඛණං. අනවජ්ජඉට්ඨවිපාකං ච තං ලක්ඛණං චාති අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං. යං අනවජ්ජ- ඉට්ඨවිපාකං හුත්වා ලක්ඛීයති, තං කුසලං ති අත්ථො. අථ වා: අනවජ්ජසද්දෙන අනවජ්ජසභාවො වුත්තො. ඉට්ඨවිපාකසද්දෙන ඉට්ඨවිපාකසභාවො තස්මා අනවජ්ජො ච ඉට්ඨවිපාකො ච අනවජ්ජ- ඉට්ඨවිපාකං. තං ලක්ඛණමෙතස්සාති කරණත්ථෙ කම්මත්ථෙ ච ලක්ඛණසද්දෙන අනවජ්ජඉට්ඨවිපාක ලක්ඛණං ති අනවජ්ජඉට්ඨවිපාක සභාවවන්තං, අනවජ්ජ ඉට්ඨවිපාක භාවෙන ලක්ඛිතබ්බං වාති අත්ථො.

1. M. - භාවභෙදෙ. 2. M. වත්ථුභෙදෙන ච.

කිම්පනෙත්ථ කාරණං පදද්වයපරිග්ගහෙ? නනු එකෙනෙව පදෙන අධිප්පෙතත්ථසිද්ධි සියා. කිඤ්චාපි හි නිරවජ්ජලක්ඛණං ති[1] වුත්තෙ "පුන ච පරං භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති කුසලෙසු ධම්මෙසූ"ති ආදීසු විය වජ්ජරහිතත්තා අව්‍යාකතස්සාපි පසඞ්ගො සියාති ඉට්ඨවිපාකපදං වත්තබ්බමෙව. ඉට්ඨවිපාකලක්ඛණන්ති පන වුත්තෙ ඉතරං න වත්තබ්බඤ්ච, අව්‍යාකතස්ස විපාකාරහතාභාවෙන ඉට්ඨවිපාකතාපසඞ්ගාභාවතො[2] සච්චමෙතං. අනවජ්ජපදෙන පන කුසලස්ස පවත්තිසුඛතං, ඉට්ඨවිපාකපදෙන ච විපාකසුඛතං දස්සෙතුං පදද්වයං වුත්තං. අනවජ්ජපදං හි අත්තනො පවත්තිසභාවවසෙන ලක්ඛණවචනං; ඉතරං කාලන්තරෙ විපාකුප්පාදනසමත්ථතාවසෙනාති. අථවා කුසලස්ස අත්තවිසුද්ධිං[3] දස්සෙතුං පුරිමපදං වුත්තං, පරිසුද්ධවිපාකතං දස්සෙතුං පච්ඡිමං. පුරිමං වා කුසලස්ස අකුසලභාවතො නිවත්තනං, පච්ඡිමං අව්‍යාකතභාවතොති අලමතිප්පපඤ්චෙන.

එත්ථ ච "අනවජ්ජ =පෙ= ලක්ඛණ"න්ති වචනෙන කුසලස්ස සාමඤ්ඤලක්ඛණං වුත්තං. අනවජ්ජඉට්ඨවිපාකසභාවස්ස කුසලජාතියා සාධාරණත්තා අකුසලාදීනමසාධාරණභාවෙන සභාව-ලක්ඛණං වාති දට්ඨබ්බං. **අකුසලවිද්ධංසනරසං** ති යථානුරූපං අකුසලස්ස පජහනකිච්චං. කුසලං හි පරිත්ත - මහග්ගත - ලොකුත්තර - භෙදභින්නං යථාක්කමං තදඞ්ග - වික්ඛම්භන - සමුච්ඡෙදප්පහානවසෙන අකුසලපක්ඛං පජහති. අථ තදඞ්ගා-දිප්පහානානං කිං නානාකරණන්ති? වුච්චතෙ: දානාදිපුඤ්ඤකිරිය-වත්ථුගතෙන තෙන තෙන කුසලඞ්ගෙන තස්ස මච්ඡෙරාදි - අකුසලඞ්ගස්ස පහානං "තදඞ්ගප්පහානං". තං දීපාලොකෙන අන්ධකාරවිධමනං විය දට්ඨබ්බං. කාමාවචරකුසලානං යෙභුය්‍යෙන[4] පරිත්තානුභාවතාය තෙහි අත්තනො ඨිතික්ඛණෙ විද්ධංසිතාන-මකුසලානං තදුපගමෙ සති පුන ආගමම[5] වොත්ථරණතො තෙසං තෙසං නීවරණධම්මානං වික්ඛම්භනසඞ්ඛාතපවත්තිනිවාරණවසෙන පහානං වික්ඛම්භනප්පහානං; තං ඝටප්පහාරෙන ජලතලෙ සෙවාලවියූහනං විය. යථාහි බලවතා ඝටප්පහාරෙන දූරීකතං සෙවාලං තස්මිං අපනීතෙපි තංපහාරවෙගෙන සහසා න ඔත්ථරති. එවමෙව උපචාරප්පණාභෙදෙන ඣානෙන වික්ඛම්භිතා කාමච්ඡන්දාදයො තදප්පවත්තිකාලෙපි තස්ස බලෙන සහසා න ඔක්කමන්තී-ති. අනුප්පත්තිධම්මතාපාදනසඞ්ඛාතං සමුච්ඡෙදවසෙන[6] පහානං

1. M. අනවජ්ජලක්ඛණං ති. 2. M. පසඞ්ගභාවතො. 3. M. අත්ථවිසුද්ධිං. 4. මරම්මපොත්ථකෙ න දිස්සති. 5. M. ආගමෙන. 6. M. සම්මා උච්ඡෙද විසෙන.

සමුච්ඡෙදප්පහානං. තම්පන අසනිසම්පාතෙන රුක්ඛාදීනං සමූලවිද්ධංසනං විය දට්ඨබ්බං. න හි අරියමග්ගෙන සමුච්ඡින්නා කිලෙසා අනුසයමත්තකෙනාපි සන්තානෙ පවත්තන්ති. යථා පන එකවාරප්පවත්තෙනාපි ඉන්දග්ගිනා සහ මූලෙහි විද්ධංසිතා රුක්ඛාදයො න පුන විරූහන්ති, එවමෙව එකචිත්තක්ඛණිකෙන පි තෙන අත්තනො උප්පාදමත්තෙනෙව අනුසයමත්තට්ඨායිනොපි කිලෙසා සබ්බෙන සබ්බං විද්ධංසිතා යෙව හොන්ති.

වොදානං විසුද්ධි; සංකිලෙසමලවිමුත්තීති අත්ථො. තථා හුත්වා පච්චුපට්ඨානමස්සාති **වොදානපච්චුපට්ඨානං**. පරිසුද්ධාකාරෙන යොගිනො ඤාණස්ස උපට්ඨාතීති වුත්තං හොති. එවං කුසලස්ස වජ්ජරහිතභාව - ඉට්ඨවිපාකභාවෙහි ලක්ඛණං, කිච්චඋපට්ඨානා-කාරවසෙන ච රස - පච්චුපට්ඨානානි වත්වා වජ්ජපටිපක්ඛතා-වසෙන[1] ලක්ඛණං, සම්පත්තිඵලවසෙන ච රසාදිකං දස්සෙතුං **වජ්ජපටිපක්ඛත්තා** ති ආදි වුත්තං. තත්ථ වජ්ජානං පටිපක්ඛභාවො වජ්ජපටිපක්ඛත්තං, තතො. එතෙන **අනවජ්ජලක්ඛණං** ති එත්ථ අ - කාරො පටිපක්ඛත්ථොති දස්සෙති. තෙන පනස්ස අබ්‍යාකතතො නිවත්තනං කතං, ඉතරථා හි නාස්ස වජ්ජං විජ්ජතො අඤ්ඤං වා අනවජ්ජන්ති අබ්‍යාකතස්සාපි තංලක්ඛණතාපසංගො සියා. **වජ්ජපටිපක්ඛත්තා** ති පන වුත්තෙන යස්මා කුසලාකුසලානමෙව පහායක - පහාතබ්බභාවෙන ආලොක - අන්ධකාරානං විය අඤ්ඤ මඤ්ඤං උජුවිපච්චනීකභාවො, තස්මා කුසලමෙව වජ්ජපටිපක්ඛත්තා **අනවජ්ජලක්ඛණං,** න අඤ්ඤං ති අයමත්ථො සිද්ධො හොති.

**වොදානභාවරසං** ති වොදානභාවසම්පත්තිකං. කිලෙස මලෙහි අසංකිලිට්ඨභාවෙන සම්පජ්ජනකං ති අත්ථො. පච්චු-පට්ඨාපීයති උපනීයති කාරණෙන, අත්තනො වා කාරණං ප පටිච්ච තප්පටිබද්ධභාවෙන පටිමුඛං වා උපට්ඨාතී ති **පච්චුපට්ඨානං.** ඉට්ඨො විපාකො පච්චුපට්ඨානමස්සා ති **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං**. අසති යොනිසොමනසිකාරෙ කුසලස්ස අනුප්පජ්ජනතො, සති ච තස්මිං උප්පජ්ජනතො තස්ස සො ආසන්නකාරණං ති ආහ: **යොනිසො මනසිකාරපදට්ඨානං** ති. තත්ථ යොනිසො පථෙන උපායෙන මනසිකාරො යොනිසොමනසිකාරො, අත්ථතො පන සානුසය සන්තානවතො ජනනං ද්වාරානමාපාථගතෙස්වාරම්මණෙසු පතිරූප දෙසවාසාදිසම්පත්තියා කුසලධම්මානං පච්චයභාවෙන භවඞ්ගං ආවට්ටෙත්වා උප්පන්නආවජ්ජනං යොනිසොමනසිකාරො නාම. වුත්තපටිපක්ඛවසෙන අයොනිසොමනසිකාරොපි දට්ඨබ්බො.

---

1. M. වජ්ජපටිපක්ඛභාවවසෙන.

යම්පන නිරනුසයසන්තානසම්බන්ධිස්ස ක්‍රියාචිත්තානං පච්චයභාවෙන
උප්පන්නං, තං ඨපෙත්වා නිරවජ්ජධම්මං සාවජ්ජධම්මස්ස කස්සචි
පච්චයභාවානුපගමනතො යොනිසොමනසිකාරපක්ඛං වා භජෙය්‍ය,
ඛීණාසවසන්තානගතත්තා යොනිසොඅයොනිසොභාවමනපෙක්ඛිත්වා
ආපාථගතාරම්මණෙසු උප්පත්තිමත්තං විනා න කස්සචි කුසලා-
කුසලභාවස්ස පච්චයො හොතීති තදුභයවසෙන න වත්තබ්බත්තා
අව්‍යාකතමනසිකාරොති වා සඞ්ඛං ගවෙජය්‍යාති.

**සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණමකුසලං** ති එත්ථාපි වජ්ජා
රාගාදයො, තෙ යස්ස සන්ති තං සාවජ්ජං. අනිට්ඨො විපාකො
යස්ස තං අනිට්ඨවිපාකං ති වුත්තනයානුසාරෙන පටිපක්ඛයො-
ජනා දට්ඨබ්බා. රසාදිතො පනෙතං අනත්ථජනනරසං;
සංකිලෙසපච්චුපට්ඨානං, අථවා ගාරය්හභාවතො සාවජ්ජලක්ඛණ-
මෙව සංකිලෙසභාවස්ස[1] රසං;[1] අනිට්ඨවිපාකපච්චුපට්ඨානං;
අයොනිසොමනසිකාරපදට්ඨානං. වචනත්ථතො පන න කුසලං ති
අකුසලං; කුසලපටිපක්ඛං ති අත්ථො. පටිපක්ඛත්ථො හි අයමකාරො;
න පන අඤ්ඤත්ථො, නාපි අභාවෙ. ඉතරථා හි තිකං න සියා;
දුකං චතුක්කං වා ආපජ්ජෙය්‍ය. තථා හි යදි කුසලතො
අඤ්ඤමකුසලං සියා, තදා අව්‍යාකතස්සාපි තතො අඤ්ඤ-
භාවෙන අකුසලසද්දසංගහොති "කුසලාකුසල – ජාතිභෙදතො
දුවිධං" ති දුකං වත්තබ්බං. යදි ච කුසලාභාවො අකුසලං,
තෙන කාචි ජාති ගය්හතීති කුසලාබ්‍යාකතජාතිභෙදතො
දුකමෙව වත්තබ්බං. අථ සියා: අභාවොපි විසුං ගහෙතබ්බොති.
එවං සති තස්ස ජාතියා අභාවතො ජාතිසද්දෙන සහ සම්බන්ධො
න සියා විජ්ජමානස්ස හි ජාති නාම හොති යථෙව කුසලස්ස
අභාවො එවං අව්‍යාකතස්සාපි අභාවො අත්ථීති අනව්‍යාකතජාතිපි
වත්තබ්බාති චතුක්කං ආපජ්ජෙය්‍ය. නචෙතමිට්ඨං. කුසලාදිවසෙන
තිවිධජාතියා එව ඉච්ඡිතත්තා, පාළියං ච "කුසලා ධම්මා,
අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා" ති තිකවසෙන වුත්තත්තා.
කුසලපටිපක්ඛන්ති පන වුච්චමානෙ මිත්තපටිපක්ඛ – අමිත්තො
විය ලොභපටිපක්ඛො අලොභො විය ච යං ධම්මජාතං කුසලස්ස
උජුවිපච්චනිකභූතං තං අකුසලං ති තස්ස වසෙන තිකං උප්පන්නං
හොති. උජුවිපච්චනිකතා චස්ස සාවජ්ජානිට්ඨවිපාකතා තෙන
පහාතබ්බභාවතො ච වෙදිතබ්බා; න පන කුසලවිනාසනතො.
න හි අකුසලෙන කුසලං පහීයති. මහාබලත්තා පන කුසලමෙව
තං පජහති කුසලං හි මහාබලං; අකුසලං දුබ්බලං. තෙනෙවා'හ:

1. M. සංකිලෙසභාවරසං.

"අබලා නං බලීයන්ති; මද්දන්තෙ නං පරිස්සයා" ති. තස්මා කුසලමෙව යථාවුත්තනයෙනෙව අකුසලස්ස පහායකං, නාකුසලං ඉතරස්සාති වෙදිතබ්බං.

**තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං** ති යං ධම්මජාතං කුසලං විය න අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං, න අකුසලං විය සාවජ්ජානිට්ඨ-විපාකලක්ඛණං, අථ ඛො අවිපාකත්තා තදුභයවිපරීතලක්ඛණං, තං අබ්‍යාකතං ති අත්ථො. නනු ච "තදුභයවිපරීතලක්ඛණං" ති වුත්තෙ සුඛදුක්ඛවෙදනානං විපරීතා උපෙක්ඛා වෙදනා විය ඉට්ඨානිට්ඨවිපාකානං විපරීතො අඤ්ඤො කොචි විපාකො යස්ස අත්ථි තං අව්‍යාකතං ති ආපජ්ජතීති? නාපජ්ජති තථා අසම්භවතො. යථා හි ආලොකන්ධකාරානං විපරීතො අඤ්ඤො කොචි නත්ථි, එවමිට්ඨානිට්ඨවිපාකානං විපරීතො න කොචි විපාකො අත්ථීති. අථවා තං-සද්දො ඉධ ඉට්ඨානිට්ඨවිපාකනිරපෙක්ඛං කුසලාකුසලමත්තමෙව පරාමසතීති[1] කුසලාකුසලානං සවිපාකත්තා **තදුභය-විපරීතලක්ඛණං** කුසලාකුසලවිපරීතලක්ඛණං; අවිපාකලක්ඛණං ති අත්ථො. අලමෙත්ථ අනුයොගෙන. කුසලාකුසලභාවෙන න ව්‍යාකතං ති අව්‍යාකතං. කුසලාකුසලං හි වත්වා අව්‍යාකතස්ස වුත්තත්තා කුසලාකුසලභාවෙනෙව අවුත්තතා[2] විඤ්ඤායති; න පකාරන්තරෙන. තත්ථ අවචනං ච තස්ස තදුභයවිපරීතලක්ඛණත්තා යෙව, න පන අවත්තබ්බතාමත්තෙනාති දට්ඨබ්බං. අථවා වි-සද්දො විරොධිවචනො, ආ-සද්දො අභිමුඛභාවප්පකාසකො; තස්මා පච්චයෙහි අඤ්ඤමඤ්ඤවිරොධාභිමුඛං කතං ලක්ඛණවිරොධතො පහායක-පහාතබ්බභාවතො වාති ව්‍යාකතං කුසලාකුසලං; තතො අඤ්ඤමබ්‍යාකතං තං හි ලක්ඛණතො අඤ්ඤමඤ්ඤං කුසලාකුසලං විය න තස්ස විරුද්ධං; න හි අවිපාකතා අනිට්ඨවිපාකතා විය ඉට්ඨවිපාකතාය ඉට්ඨවිපාකතා විය ච අනිට්ඨවිපාකතාය ඉට්ඨානිට්ඨවිපාකතාහි විරුජ්ඣති; න චාපි අව්‍යාකතං කුසලාකුසලෙසු කිඤ්චි පජහති, න ච කෙනචි පහාතබ්බංති, **තදුභයවිපරීතලක්ඛණමව්‍යාකතං** ති විඤ්ඤායමානෙ 'අහොසි කම්මං නාහොසි. කම්මවිපාකො නත්ථි කම්මවිපාකො න භවිස්සති කම්මවිපාකොති" ඉමිනා තිකෙන සංගහිතස්ස ගති - උපධි - කාල - පයොගවිපත්තිහි අවිපාකස්ස දිට්ඨධම්මවෙදනීයාදි - කම්මස්ස, භාවනාය පහාතබ්බ - අකුසලස්ස, අභිඤ්ඤාකුසලස්සච විපාකුප්පාදනාභාවතො සියා නු ඛො අව්‍යාකතභාවොති කදාචි කොචි චින්තෙය්‍යාති, තං නිවාරණත්ථමාහ: **අවිපාකාරහං වාති**. විපාකං නාරහති තත්ථ සාමත්ථියාභාවතොති

1. M පච්චාමසතීති. 2. M. අවුත්තත්තා.

අබ්‍යාකතඤ්හං. ඉදං වුත්තං හොති: දිට්ඨධම්මවෙදනීයාදයො තාව පච්චයවෙකල්ලාදීහි කාරණෙහි අවිපාකා. සබ්බෙ පන තෙ තබ්බිදූරා අසත්තු තඤ්ච විපාකදානසමත්ථතාය[1] විපාකාරහා යෙව. සම්පන[2] තත්ථ. අයං ඛො යෙන කෙනචි ආකාරෙන විපාකදානෙ අසමත්ථතා එව විපාකාරහං න හොති, තං අව්‍යාකතං නාමාති.

ඉදානි එවං තිකවසෙන නිද්දිට්ඨෙසු කුසලාදීසු පඨමං තාව කුසලචිත්තං විභජන්තො **තත්ථ කුසලචිත්ත**න්ති ආදිනා තස්ස ගණනපරිච්ඡෙදං දස්සෙති. **එකවීසතිවිධ**න්ති අට්ඨ කාමාවචරානි, පඤ්ච රූපාවචරානි, චත්තාරි අරූපාවචරානි, චත්තාරි ලොකුත්තරානීති එවං සංඛෙපතො එකවීසතිවිධං. **භූමිතො චතුබ්බිධං** ති කාම-රූපාරූප-ලොකුත්තරභූමිසංඛාතානං චතුන්නං භූමීනං වසෙන තත්ථ පවත්තමාන-චිත්තම්පි චතුබ්බිධං හොති. තත්ථ භවන්ති එත්ථාති භූමි, ඨානං, අවත්ථා වා. අවත්ථාපි හි අවත්ථාවන්තානං පවත්තිඨානං විය ගය්හති. එවං හි තෙසං සුඛගහණං හොති. අවත්ථාති චෙත්ථ ධම්මානං කාමතණ්හාදීහි පරිච්ඡින්නාපරිච්ඡින්නභාවො. තත්ථ පුරිමා තිස්සො භූමියො උපායවසෙන වෙදිතබ්බා; ඉතරා අවත්ථාවසෙනෙව. න හි ලොකුත්තරධම්මානං කාමභවාදිතො අඤ්ඤං ඨානමුපලබ්භතීති. අඤ්ඤත්ථ පවත්තමානස්සාපි වක්ඛමානනයෙන කාමභූමිපරියාපන්නත්තා වුත්තං **භූමිතො එකවිධං ති**.

**සවත්ථුකාවත්ථුකතො** ති චක්ඛාදීනි පඤ්ච හදයං චාති ඡ වත්ථූනි. කුසලස්ස පන චක්ඛාදිනිස්සිතත්තාභාවතො හදයවත්ථු ඉධ වත්ථූති අධිප්පෙතං. තෙන සහිතං එකන්තෙන තන්නිස්සිත-තප්පවත්තිතොති **සවත්ථුකං**; කාමරූපධාතුද්වයං වත්තමාන විඤ්ඤාණං. තත්ථ හි අරූපස්ස රූපපටිබද්ධා[3] පවත්ති. අරූපධාතු සම්පන රූපාභවතො වත්ථුවිරහිතමෙව පවත්තතීති තත්ථ පවත්තමානමවත්ථුකං.

**හීනමජ්ඣිමපණීතභෙදතො තිවිධං** ති එත්ථ පච්චයතො බලතො ච මජ්ඣිම-පණීතෙහි හීනං, තෙසං වා ගුණෙහි පරිහීනන්ති **හීනං**. අත්තනො පච්චයෙහි පධානභාවං නීතන්ති පණීතං. උභින්නං වෙමජ්ඣෙ භවං මජ්ඣිමං. තත්ථ හීනෙන ඡන්දෙන චිත්තෙන විරියෙන වීමංසාය වා පවත්තිතං හීනං. මජ්ඣිමෙහි ඡන්දාදීහි පවත්තිතං මජ්ඣිමං; පණීතෙහි පණීතං. ඡන්දාදීනම්පන හීනාදිභාවො අධිමුත්තිවසෙන දට්ඨබ්බො. හීනාධිමුත්ති

1. M. විපාකදානෙ සමත්ථතාය. 2. M. තං පන න තථා. 3. M. රූපාපටිබද්ධ

වසෙන හි තෙසං හීනතා, පණීතාධිමුත්තිවසෙන පණීතතා, තදුභයවෙමජ්ඣවසෙන මජ්ඣිමතා. යසකාමතාය හි[4] කතකුසලං හීනං. පුඤ්ඤඵලකාමතාය මජ්ඣිමං. පුඤ්ඤං නාමෙතං සාධූහි කත්තබ්බමෙවාති එවං අරියභාවං නිස්සාය කතං පණීතං. “අහමස්මි දානපති; ඉමෙ පනඤ්ඤෙ දානදාසාදයො”ති ආදිනා අත්තුක්කංසන - පරවම්භනාහි උපක්කිලිට්ඨං කත්වා පවත්තිතං වා හීනං. තථා අනුපක්කිලිට්ඨං මජ්ඣිමං. මග්ගඵලපදට්ඨානං පණීතං. භවභොගසම්පත්තිනිමිත්තං වා කතං හීනං. සාවක - පච්චෙකබොධිපාරමිතාවසෙන අත්තනො විමොක්ඛත්ථාය කතං මජ්ඣිමං. සම්මාසම්බොධිපාරමිතාවසෙන පන සබ්බෙසං විමොක්ඛත්ථාය කතං පණීතන්ති.

**සොමනස්ස =පෙ= භෙදතො** ති භෙදසද්දො පච්චෙකං සම්බන්ධිතබ්බො: සොමනස්සුපෙක්ඛාභෙදතො, ඤාණභෙදතො, පයොගභෙදතොති. තත්ථ “පයොගභෙදතො”ති සංඛාරභෙදතොති අත්ථො. නනු ච සොමනස්සුපෙක්ඛාභෙදොව යුත්තො තෙසං භින්නසභාවත්තා; ඤාණප්පයොගභෙදො පන කථන්ති? වුච්චතෙ:[5] ඤාණප්පයොගකතො භෙදො ඤාණප්පයොගභෙදො, තෙසං භාවාභාවමුපාදාය පවත්තත්තා. ඉදානි තමෙව සොමනස්සුපෙක්ඛාදි භෙදං විභාගෙන දස්සෙතුං **සෙය්‍යථීදං**ති පුච්ඡිත්වා **සොමනස්සසහගතං** ති ආදිනා විස්සජ්ජෙති. තත්ථ **සෙය්‍යථීදං** ති තං කතමං, තං කථන්ති අත්ථො.

සොභනං මනො, සොභනං වා මනො එතස්සාති සුමනො. තස්ස භාවො සොමනස්සං. මානසිකසුඛවෙදනායෙතං අධිවචනං; සොමනස්සෙන උප්පාදතො යාව නිරොධා සහගතං පවත්තං සංසට්ඨං සම්පයුත්තන්ති අත්ථො. අථ වා සොමනස්සෙන සහ එකුප්පාදාදිභාවං ගතන්ති **සොමනස්සසහගතං**. ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති ඤාණං. තෙන සමං එකුප්පාදාදීහි පකාරෙහි යුත්තන්ති **ඤාණසම්පයුත්තං**. නාස්ස සංඛාරො අත්ථීති අසංඛාරං; අසංඛාරමෙව **අසංඛාරිකං**. සහ සංඛාරෙන පවත්තමානං සසංඛාරං; තදෙව **සසංඛාරිකං** සංඛාරොති චෙත්ථ අත්තනො පරස්ස වා පුබ්බයොගො. සංඛරොති තික්ඛභාවසංඛාතෙන මණ්ඩනවිසෙසෙන සජ්ජෙති සංඛරීයති වා සජ්ජීයති චිත්තං එතෙනාති කත්වා.

තත්ථ දානාදිපුඤ්ඤකරණකාලෙ මච්ඡෙරමලථිනමිද්ධාදීහි උපක්කිලෙසෙහි සංසීදමානෙ චිත්තෙ උපක්කිලෙසවූපසමනවසෙන, චිත්තස්ස ච උස්සාහජනනවසෙන තීසු ද්වාරෙසු පවත්තො

4. M. වා 5. B. වුසතෙ

සම්මාවායාමො "අත්තනො පයොගො" නාම කුසලකරණෙ නිරුස්සාහස්ස පන "අහො සප්පුරිස කුසලකරණං නාම පණ්ඩිතෙහි ආසෙවිතමග්ගො, තත්ථ තයාපි පටිපජ්ජිතුං වට්ටති, තස්මා දානං දෙහි, සීලං රක්ඛාහි: තං තෙ අත්ථාය හිතාය සුඛාය භවිස්සතී" ති ආදිනා කුසලකරණත්ථාය උස්සාහජනනවසෙන පරෙසං කායවචීද්වාරෙසු පවත්තා ආණත්ති පරප්පයොගො නාම. තෙසු පන පුරිමො පුබ්බභාගප්පවත්ත-චිත්තසන්තානෙ, පච්ඡිමො පරෙසං චිත්තසන්තානෙ යෙව සම්භවතීති තංනිබ්බත්තිතො චිත්තස්ස තික්ඛභාවසංඛාතො විසෙසො ඉධ උපචාරතො සංඛාරොති වෙදිතබ්බො. තෙනාහු ආචරියා:

"පුබ්බපයොගසම්භූතො විසෙසො චිත්තසම්භවී
සංඛාරො ඉති සංඛාරසභාවඤ්ඤූහි කිත්තිතො" ති*

අථ වා සසංඛාරිකමසංඛාරිකං ති ච එතං කෙවලං සංඛාරස්ස භාවාභාවමත්තාපෙක්ඛාය වුත්තං. න තස්ස සහප්පවත්තිසබ්භාවාභාවතොති, භින්නසන්තානප්පවත්තිනොපි සංඛාරස්ස ඉදම්පච්චයතාය තංවසෙන නිබ්බත්තං චිත්තං සංඛාරො අස්ස අත්ථීති සසංඛාරිකං, සහසද්දස්ස විජ්ජමානත්ථපරිදීපනතො සලොමකො සපක්ඛකොති ආදීසු විය. තබ්බිපරීතං පන තදභාවතො යථාවුත්තනයෙනෙව අසංඛාරිකං. අථ වා සංඛරණං, සංඛරීයති වා එතෙන ආගන්තුක සම්භූතෙන චිත්තං සංසීදනසභාවාපනයනවසෙන සජ්ජීයති[1] සංඛරොති වා තං යථාවුත්තවසෙනෙවා ති සංඛාරොති උජුකමෙව පුබ්බපයොග - ජනිතො තික්ඛභාවො වුච්චති. තදභාවතො අසං ඛාරිකං, සභාවතික්ඛං ති අත්ථො තංසහගතතාය සසංඛාරිකං. අථ වා මජ්ජරමලාදීහි සංඛරීයතීති සංඛාරො. චිත්තස්ස සංසීදනසභාවො. සො යස්ස නත්ථි, තං අසංඛාරිකං; ඉතරං සසංඛාරිකං. පණීත උතුභොජනාදිකො වා බලපච්චයො සංඛාරො, සංඛරොති චිත්තං තික්ඛභාවෙන, සංඛරීයති වා තං එතෙනාති කත්වා. අකාරස්ස වුඩ්ඪත්ථවුත්තිතාය වුඩ්ඪිප්පත්තො සංඛාරො අස්සාති අසංඛාරිකං; බලවප්පච්චයවන්තං ති අත්ථො වුඩ්ඪිපරිදීපකෙන පන අකාරෙන අවිසෙසිතත්තා සසංඛාරිකං සප්පච්චයං දුබ්බලපච්චයං ති අධිප්පායො.

ඤාණෙන විප්පයුත්තං විරහිතං ති ඤාණවිප්පයුත්තං. උපෙක්ඛතීති උපෙක්ඛා. වෙදියමානා පි හි ආරම්මණං අජ්ඣුපෙක්ඛතී මජ්ඣත්තාකාරසණ්ඨිතියාති අත්ථො. අථ වා ඉට්ඨෙ අනිට්ඨෙ ච

* "සංඛාරො, තං වණ්ණෙත්වා හොතාසංඛාරිකාදිනා." (විභාවිනීටීකා).
1. B. සජ්ජයති.

ආරම්මණෙ පක්ඛපාතභාවෙන උප්පත්තිතො යුත්තිතො ඉක්ඛති අනුභවතීති උපෙක්ඛා. අථ වා උපෙතා සුඛදුක්ඛානං අවිරුද්ධා ඉක්ඛා අනුභවනං ති උපෙක්ඛා. අවිරුද්ධත්තා යෙව හෙසා තෙසං අනන්තරම්පි පවත්තති. සුඛදුක්ඛවෙදනා පන විරුද්ධසභාවත්තා අඤ්ඤමඤ්ඤං අනන්තරං පවත්තන්ති. තෙනෙව හි පට්ඨානෙ සොමනස්සස්ස අනන්තරං දොමනස්සස්ස, දොමනස්සස්ස අනන්තරං සොමනස්සස්ස උප්පත්ති පටිසිද්ධා. අයඤ්ච අත්ථො ලොභසහගතාදි - චිත්තසම්පයුත්ත - වෙදනාය පි ලබ්භති. පුරිමා පන ද්වෙ න තථා. න හි ලොභසහගතාදීනං මජ්ඣත්තාකාරෙන අජ්ඣුපෙක්ඛනං උප්පත්තිතො ඉක්ඛණං වා අත්ථි. **උපෙක්ඛාසහගතං** ති සබ්බං හෙට්ඨා වුත්තනයමෙව.

නනු ච අඤ්ඤෙපි ඵස්සාදයො සම්පයුත්තධම්මා අත්ථි සොමනස්සාදීනං වසෙනෙව පන අට්ඨවිධතා කස්මා ගහිතා? භෙදකරභාවතො. ඵස්සාදීනං හි සබ්බචිත්තසාධාරණත්තා, සද්ධාදීනං ච සබ්බකුසලසාධාරණත්තා න තෙහි චිත්තස්ස විභාගො. සොමනස්සාදයො පන කත්ථචි චිත්තෙ හොන්ති, කත්ථචි න හොන්තීති පාකටො ච තෙහි චිත්තස්ස විභාගොති. කස්මා පනෙතෙ කත්ථචි චිත්තෙ හොන්ති, කත්ථචි න හොන්තීති? කාරණස්ස සන්නිහිතාසන්නිහිතභාවතො. කිම්පන තෙසං කාරණංති? වුච්චතෙ: තස්ස[1] සොමනස්සසහගතභාවො තාව ආරම්මණවසෙන හොති. ඉට්ඨාරම්මණස්මිං හි සොමනස්සසහගතං චිත්තමුප්පජ්ජති. නනු ච ඉට්ඨාරම්මණං ලොභස්ස වත්ථු රජනීයත්තාති කථං තත්ථ කුසලං උප්පජ්ජති? න ඉදමෙකන්තිකං, ඉට්ඨෙපි ආරම්මණෙ නියමිතාදිවසෙන කුසලස්ස උප්පජ්ජනතො. යස්ස හි "කුසලමෙව මයා කත්තබ්බං"ති කුසලකරණෙ යෙව චිත්තං නියමිතං හොති, අකුසලප්පවත්තිතො ච නිවත්තෙත්වා කුසලකරණෙ යෙව පරිනාමිතං, අභිණ්හකරණෙන ච කුසලං සමුදාචිණ්ණං, පතිරූපදෙසවාස - සද්ධම්මසවණ - සප්පුරිසූපනිස්සය - පුබ්බෙකත - පුඤ්ඤතාසංඛාත - චතුබ්බිධූපනිස්සයවසෙන යොනිසො ච ආභොගො පවත්තති, තස්ස ඉට්ඨෙපි ආරම්මණෙ අලොභසම්පයුත්තමෙව චිත්තමුප්පජ්ජති, න ලොභසම්පයුත්තං. හොති චෙත්ථ:

නියාම - පරිණාමෙහි සමුදාචිණ්ණතාය ච
ඤාණපුබ්බඞ්ගමාභොගා ඉට්ඨෙපි කුසලං සියාති.

අපි ච, සද්ධාබහුලතාදීහි ච කාරණෙහි චිත්තස්ස සොමනස්ස-සහගතතා වෙදිතබ්බා අස්සද්ධානං හි මිච්ඡාදිට්ඨීනං ච එකන්ත-

1. M තත්ථ

මිට්ඨාරම්මණභූතං තථාගතරූපම්පි දිස්වා සොමනස්සං නුප්පජ්ජති. යෙ ච කුසලප්පවත්තියං ආනිසංසං න පස්සන්ති, තෙසං පරෙහි උස්සාහිතානං කුසලං කරොන්තානම්පි සොමනස්සං න උප්පජ්ජති. තස්මා සද්ධාබහුලතා, විසුද්ධිදිට්ඨිතා, ආනිසංසදස්සාවිතාති ඉමෙහිපි කාරණෙහි චිත්තස්ස සොමනස්සසහගතතා හොති. අපි ච: යෙ තෙ එකාදස ධම්මා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, සෙය්‍යථිදං: බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, ලූඛපුග්ගලපරිවජ්ජනං, සිනිද්ධපුග්ගලසෙවනා, පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛණා, තදධිමුත්තතාති, ඉමෙහි පි කාරණෙහි චිත්තස්ස සොමනස්සසහගතභාවො වෙදිතබ්බො. බුද්ධාදිගුණෙ අනුස්සරන්තස්ස හි යාව උපචාරුප්පාදා සකලසරීරං ඵරමානා පීති උප්පජ්ජති. තථා දීඝරත්තං අඛණ්ඩතාදිවසෙන අත්තනා රක්ඛිතං චතුපාරිසුද්ධිසීලං පච්චවෙක්ඛන්තස්ස, ගිහිනො දසසීලං පඤ්චසීලං පච්චවෙක්ඛන්තස්ස, දුබ්භික්ඛභයාදිසු පණීතභොජනං සබ්‍රහ්මචාරීනං දත්වා "එවන්නාම අදාසිං" ති අත්තනො චාගං පච්චවෙක්ඛන්තස්ස, ගිහිනොපි තථාරූපෙ කාලෙ සීලවන්තානං දින්නදානං පච්චවෙක්ඛන්තස්ස, යෙහි ගුණෙහි සමන්නාගතා දෙවා දෙවත්තං ගතා, තථාරූපානං ගුණානං අත්තනි අත්ථිතං පච්චවෙක්ඛන්තස්ස, සමථවිපස්සනාහි වික්ඛම්භිතකිලෙසෙ සට්ඨිම්පි සත්තතිම්පි වස්සානි අසමුදාචරන්තෙ දිස්වා "අහො මය්හං කිලෙසා න සමුදාචරන්තී"ති චින්තෙන්තස්ස, චෙතියදස්සන - බොධිදස්සන - ථෙරදස්සනෙසු[1] අසක්කච්චකිරියාය සංසූචිත - ලූඛභාවෙ[2] බුද්ධාදිසු පසාද-සිනෙහා-භාවෙ[3] ගද්‍රභපිට්ඨෙ රජසදිසෙ ලූඛපුග්ගලෙ පරිවජ්ජෙන්තස්ස, බුද්ධාදිසු පසාදබහුලෙ මුදුචිත්තෙ සිනිද්ධපුග්ගලෙ සෙවන්තස්ස, රතනත්තයගුණදීපකෙ පසාදනීයසුත්තන්තෙ පච්චවෙක්ඛන්තස්ස ඨානනිසජ්ජාදීසු පීතිඋප්පාදනත්ථං තන්නින්නතාදිවසෙන පවත්තෙන්තස්ස යෙභුය්‍යෙන පීති උප්පජ්ජති, පීතියා ච සොමනස්සෙන සහ අවිනාභාවතො තදුප්පත්තියං තස්සපි උප්පත්ති නියතාති එවං පීතිකාරණානිපි සොමනස්සකාරණානීති වෙදිතබ්බානි.[4] කිඤ්ච, අගම්භීරපකතිතා, සොමනස්සපටිසන්ධිකතාති ඉමෙහිපි ද්වීහි කාරණෙහි සොමනස්සසහගතතා හොති. යො හි අගම්භීරපකතිකො හොති, අප්පමත්තකෙපි පරිතොසකාරණෙ[5] තුස්සති, යො ච සොමනස්සපටිසන්ධිකත්තා[6] අප්පසන්නෙසු පි ආරම්මණෙසු.

---

1. බොධිදස්සනං මරම්මපොත්ථකෙ නත්ථි. 2. M. සමුචිතලූඛභාවෙන 3. M. සිනෙහාභාවෙන. 4. M. දට්ඨබ්බානි. 5. M. හිතොපකරණෙ. 6. M. පටිසන්ධිකො.

අප්පටිකූලදස්සාවී, තස්ස[1] යෙභුය්‍යෙන සොමනස්සසහගතං චිත්තං උප්පජ්ජති. යථාවුත්තානං පන සොමනස්සහෙතූන මභාවෙන මජ්ඣත්තාරම්මණතාය ච උපෙක්ඛාසහගතතා වෙදිතබ්බා.

ඤාණසම්පයුත්තතා පන කම්මතො, උපපත්තිතො, ඉන්ද්‍රියපරිපාකතො. කිලෙසදූරීභාවතොති ඉමෙහි කාරණෙහි හොති. යො හි පරෙසං හිතජ්ඣාසයෙන ධම්මං දෙසෙති, හීනුක්කට්ඨානි ච තළකාර - මුද්දා - ගණනාදීනි සිප්පායතනානි, වඩ්ඪකී - කසි - වණිජ්ජාදීනි වා කම්මායතනානි, විසහරණදීනිවා විජ්ජායතනානීති එවං නිරවජ්ජ - සිප්පායතනාදීනි සික්ඛාපෙති, සයං වා සික්ඛති, ධම්මකථිකස්ස සක්කාරං කත්වා ධම්මං කථාපෙති, "ආයතිං වා පඤ්ඤවා භවිස්සාමී"ති පත්ථනං ඨපෙත්වා නානප්පකාරං පුඤ්ඤකම්මං කරොති, තස්සෙවං නානප්පකාරං පඤ්ඤාසංවත්තනියකම්මං සම්පාදෙන්තස්ස තං කම්මං උපනිස්සාය උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. තථා අබ්‍යාපජ්ඣෙ ලොකෙ උප්පන්නස්ස උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං හොති, වුත්තං හෙතං: "තස්ස තත්ථ සුඛිනො ධම්මපදානි පිලවන්ති; දන්ධො භික්ඛවෙ සතුප්පාදො, අථ සො සත්තො ඛිප්පමෙව විසෙසභාගී හොතී"ති. තථා පඤ්ඤාදසකං සම්පත්තස්ස ඉන්ද්‍රියපරිපාකං නිස්සාය උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං හොති. යෙන පන සමථ - විපස්සනාභාවනාහි කිලෙසා වික්ඛම්භිතා, තස්ස තං කිලෙසදූරීභාවං නිස්සාය උප්පජ්ජමානං චිත්තං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. යථාහ:

"යොගා වෙ ජායතී භූරි - අයොගා භූරිසඞ්ඛයො"ති

අපි ච සත්ත ධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, සෙය්‍යථිදං? පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියා, ඉන්ද්‍රියසමත්තපටිපාදනං, දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනං, පඤ්ඤවන්තපුග්ගලසෙවනා ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා, තදධිමුත්තතාති; ඉමෙහි පි කාරණෙහි ඤාණසම්පයුත්තභාවො හොති. තථා හි යො පඤ්ඤවන්තෙ උපසංකම්ම ඛන්ධ - ධාතු - ආයතන - ඉන්ද්‍රිය - බල - බොජ්ඣඞ්ග - මග්ගඞ්ග - ඣානඞ්ග - සමථවිපස්සනාදීනං පරිපුච්ඡනබහුලො හොති, තස්ස තංවසෙන උප්පන්නං සුතමයඤාණං ආදිං කත්වා උප්පජ්ජමානං චිත්තං ඤාණසහගතං හොති. යෙන පන නඛ - කෙස - චීවර - සෙනාසනාදීනි අජ්ඣත්තික - බාහිරවත්ථූනි පුබ්බෙ අවිසදානි ඡෙදන - මලාපහරණාදිනා විසදානි කතානි, තස්සෙවං විසදවත්ථුකස්ස උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු අතිවිසදං ඤාණං හොති, පරිසුද්ධානි දීප - කපල්ලාදීනි නිස්සාය

3. M. තෙසං

උප්පන්නාදිපසිද්ධාය ඔභාසො විය. යස්ස ච සද්ධින්ද්‍රියාදීසු අඤ්ඤතරං බලවං හොති ඉතරානි මන්දානි, තතො තානි සක - සකකිච්චං කාතුං න සක්කොන්ති. තස්මා සො තස්ස බොජ්ඣඞ්ගවිභඞ්ගෙ ආගතනයෙන තෙන තෙන ආකාරෙන සමත්තං පටිපාදෙති; තස්සින්ද්‍රියානං සමත්තං පටිපාදෙන්තස්ස විපස්සනාඤාණාදීනං වසෙන චිත්තං ඤාණසහගතං හොති. යො පන දුප්පඤ්ඤපුග්ගලෙ පරිවජ්ජෙති. පඤ්ඤවන්ත - පුග්ගලෙ වා පයිරුපාසති, ඛන්ධාදීසු ඔගාළ්හං භගවතො ගම්භීර - ඤාණචරියං වා පච්චවෙක්ඛති, ඨාන - නිසජ්ජාදීසු තදධි-මුත්තචිත්තො වා විහරති, ඉමෙසම්පි උප්පජ්ජමානං කුසලං[1] ඤාණසම්පයුත්තං හොති. අපි ච, බුද්ධාදිගුණානුස්සරණෙන පි චිත්තං ඤාණසහගතං හොති, යථාහ: "යස්මිං මහානාම, සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති, නෙව තස්මිං සමයෙ රාගාදිපරියුට්ඨිතං චිත්තං හොති, න දොස =පෙ= මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. උජුගතචිත්තො ඛො මහානාම, අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති; සුඛිනො චිත්තං සමාධියති; සමාහිතො යථාභූතං පජානාතී"ති ආදි. එවං බුද්ධානුස්සතිආදයො රාගමලවිසොධනෙන ඤාණුප්පත්තිහෙතුකා යෙවාති දට්ඨබ්බං. කිඤ්ච: තිහෙතුකපටිසන්ධිතා පි ඤාණුප්පත්තිකාරණං; පටිසන්ධි පඤ්ඤා හි ආදිතො පට්ඨාය භවඞ්ගසන්තතිවසෙන බහුලං පවත්තමානා සන්තානපරිභාවනෙන ඤාණුප්පත්තියා සවිසෙසං උපනිස්සයො හොති. අසංඛාරිකත්තම්පන සප්පාය - උතු - භොජන - ආවාසාදිපච්චයෙහි. හොන්ති චෙ'ත්ථ:

1. ඉට්ඨාරම්මණතා සද්ධා - බාහුල්ලං දිට්ඨි සුද්ධි ච
එලදස්සාවිතා චෙව පීතිබොජ්ඣඞ්ගහෙතුයො.

2. එකාදස තථා ධම්මා අගම්භීරසභාවතා
සොමනස්සයුතා සන්ධි ඉච්චෙතෙ සුඛහෙතුයො.

3. ආභවො සුඛහෙතූනං මජ්ඣත්තාරම්මණම්පි ච
උපෙක්ඛුප්පත්තිහෙතූති එවං ඤෙය්‍යං විභාවිනා.

4. කම්මූපපත්තිතො චෙව තථා ඉන්ද්‍රියපාකතො
කිලෙසූපසමා ධම්ම - විචයස්ස ච හෙතුහි

5. සත්තධම්මෙහි බුද්ධාදි - ගුණානුස්සරණෙන ච.
සප්පඤ්ඤසන්ධිතො චෙව චිත්තං ඤාණයුතං සියා.

---

1. B. උප්පජ්ජමානානං කුසලානං. 2. M. පීතිමනස්ස.

6. උතුභොජන - ආවාස - සප්පායාදීහි හෙතුහි
අසංඛාරිකභාවො පි විඤ්ඤාතබ්බො විභාවිතාති.

එවං වෙදනා - ඤාණප්පයොගභෙදතො අට්ඨවිධං කාමාවචර චිත්තං නිද්දිසිත්වා ඉදානි තානි නිගමෙන්තො ආහ: **ඉදං අට්ඨවිධම්පි කාමාවචරකුසලචිත්තං නාමාති.**

යෙන පනත්ථෙන ඉදං කාමාවචරන්ති වුච්චති, තං දානි දස්සෙතුං (12) **උද්දානතො** ති ආදි ආරද්ධං. තත්ථ **උද්දානතොති** උද්දෙසතො, සංඛෙපතොති අත්ථො. කිඤ්චාපි අවසිට්ඨකිලෙසාදයො විය කිලෙසකාමොපි අස්සාදෙතබ්බතාය වත්ථුකාමෙ සංගහිතො, ඤාණං විය ඤෙය්‍යෙති සංඛෙපතො එකො යෙව කාමො සියා. තථාපි කිලෙසකාමො වත්ථුකාමභාවං ගච්ඡන්තො කමනීයට්ඨෙන ගච්ඡති, න කාමනවසෙන. කාමනවසෙන පන කිලෙසකාමො ච හොති, න පන වත්ථුකාමොති ආහ: **කිලෙස-වත්ථුවසා දුවෙ** ති, කො පනෙත්ථ වත්ථුකාමො, . කො කිලෙසකාමොති චොදනං මනසි නිධාය "ඡන්දො කාමො, රාගො කමො, ඡන්දරාගො කාමො; සංකප්පො කාමො, රාගො කාමො, සංකප්පරාගො කාමො"ති එවං නිද්දෙසපාළියං ආගතා කාමතණ්හාව ඉධ කිලෙසකාමො. වත්ථුකාමොති ච "මනාපිකා රූපා =පෙ= මනාපිකා ඵොට්ඨබ්බා =පෙ= සබ්බෙපි කාමාවචරා ධම්මා කමනීයට්ඨෙන කාමා. සබ්බෙපි රූපාවචරා =පෙ= සබ්බෙපි අරූපාවචරා =පෙ= කාමාති තත්ථෙව නිද්දිට්ඨා සවිඤ්ඤාණාවිඤ්ඤාණප්පභෙදා තෙභූමකධම්මාති දස්සෙන්තො ආහ: **කිලෙසො ඡන්දරාගොව, වත්ථු තෙභූමවට්ටකං** ති. **ඡන්දරාගො වා** ති අවධාරණෙන කිලෙසභාවෙන නිරූළ්හෙසු ලොභදොසමොහාදිසු දසසු දොස-මොහාදයො නව කිලෙසෙ පටික්ඛිපති. කාමරූපාරූපතණ්හාය වත්ථු, පතිට්ඨානං, කාරණභූතං ති වා වත්ථු.

කථම්පන කිලෙසකාමො නාම, කථං ච වත්ථුකාමො ති ආහ (13) **කිලෙසකාමො** ති ආදි. **කාමෙතී** ති වත්ථුකාමං පත්ථෙති. **කාමියති** ති කිලෙසකාමෙන පත්ථියති. ඉති - සද්දො තස්මාති ඉමස්ස අත්ථෙ(?) වා - සද්දො එවකාරත්ථෙ; තෙන යස්මා කිලෙස-කාමො කාමෙතී ති කාමො, වත්ථුකාමො කාමීයතී ති කාමො, තස්මා එව කිලෙසකාමො වත්ථුකාමො චාති **දුවිධොපි එස කාමො කාරකද්වයෙ** කත්තරි කම්මනි ච **සිජ්ඣති**. කත්තුභාවං කම්මභාවංපි පච්චනුභොතීති අත්ථො. අථ වා **දුවිධො** ති ද්වින්නං කාමානං වාචකතො දුවිධො **කාමොති** අයං සද්දො **කාරකද්වයෙ සිජ්ඣති**, යථාවුත්ත - කාරකයුගලෙ නිප්ඵජ්ජති.

(12) ඉමෙ ගාථඞ්කා.

කත්තරි කම්මනි ච කාමොති පදසම්භවො හොතීති අත්ථො. වො – කාරො පන නිපාතමත්තං, "එවං වො කාලාමා"ති ආදීසු විය. අථවා වොකාරකණ්ඩයෙති ඛන්ධකණ්ඩයෙති අත්ථො. කිලෙස කාමො හි සංඛාරසභාවත්තා සංඛාරක්ඛන්ධෙ වත්ථුකාමො ච චක්ඛ මාතනයෙන පඤ්චකාමගුණභූතො රූපසභාවත්තා රූපක්ඛන්ධෙති එවං දුවිධො පෙස කාමො ඛන්ධයෙ සිජ්ඣති, නිප්ඵජ්ජති, අනෙන්තාභාවං ගච්ඡතී ති.

සම්පජ්ජන්තීති[1] **සම්පත්තියො**, තාසං වසෙන, විසයවිසයී භාවෙන අඤ්ඤමඤ්ඤං සමොසරණවසෙන[2] සම්පාපුණනවසෙනාති. අත්ථො. ඉමිනා පන ඉදං දීපෙති: යත්ථ දුවිධොපි කාමො විසය-විසයී භාවෙන සහිතො පවත්තති, සො යෙව එකාදසවිධො පදෙසො කාමාවචරසඤ්ඤිතො; යත්ථ පන රූපාරූපධාතුයං කෙවලං වත්ථුකාමොව පවත්තති, න සො පදෙසො කමාවචරො නාමාති. නනු ච දුවිධො පි සහිතො රූපාරූපධාතුසු පවත්තති රූපා–රූපධම්මානං වත්ථුකාමත්තා, තදාරම්මණභූතානඤ්ච රූපාරූප–තණ්හානං තංයොගෙන කිලෙසකාමභාවසිද්ධිතොති? නයිදමෙවං: ඔරම්භාගියභූතස්ස බහලකිලෙසස්සෙව කාමරාගස්ස ඉධ කිලසකාම භාවෙන අධිප්පෙතත්තා. **උද්ධනතො දූමව කාමා**ති සබ්බෙ කාමෙ උද්දිසිත්වාපිහි **පදෙසො චතුරපායානං**[3]ති ආදිනා විසයනියමනෙන **දුවිධොපි අයං** ති එත්ථ කාමෙකදෙසභූතො නීවරණාවත්ථාය සිතො[4] කාමරාගො ච කිලෙසකාමභාවෙන, තබ්බත්ථුකා යෙව ච ධම්මා වත්ථුකාමභාවෙන ගහිතා; න රූපාරූපතණ්හා තබ්බත්ථුකා ධම්මා චාති ඤාපීයති. එවඤ්ච කත්වා උපරි චක්ඛමානා සසත්ථා චවරූපමා උපපන්නා හොති. යථාවුත්තානමෙව කාමානං ඉධ අධිප්පෙතත්තා රූපාරූපධාතුසු විමාන – කප්පරුක්ඛ – වත්ථා ලංකාර – පරිත්තකුසලාදිභෙදෙසු කාමාවචරධම්මෙසු පවත්තො ඡන්දරාගො කිලෙසකාමො නාම න හොති; න ච තබ්බත්ථුභූතං විමානකප්පරුක්ඛාදි – පරිත්තධම්මජාතං වත්ථුකාමො නාමාති සිද්ධං. තෙනෙවාහ:

"කාමො වා කාමසඤ්ඤා වා බ්‍රහ්මලොකෙ න විජ්ජතී"ති.

**කාමාවචරසත්තසන්තානගත – තණ්හාය** විසයභාවෙ සති පන තංයොගෙන රූපාරූපධාතුසු පි පවත්තමානො පරිත්තධම්මො වත්ථුකාමො යෙවාති වෙදිතබ්බං. අථවා නිද්දෙසෙ ආගතනයෙන නිරවසෙසො කිලෙසකාමො කාමතණ්හා – භව

1. B. සම්පත්තානි (පාඨභෙදවසෙන) 2. B. සමාසාදනවසෙන.
3. M චතුපායානං. 4. M කපිතො.

තණ්හා - විභවතණ්හා - නිරොධතණ්හාභෙදෙ ඉධ පවත්තති; වත්ථුකාමෙසු පි අප්පකං රූපාරූපාවචරවිපාකමත්තං ඨපෙත්වා සබ්බො[1] යෙව ඉධ පවත්තන්තීති[2] අනවසෙසපවත්තිං සන්ධාය **කාමොයං දුවිධොපි චා** ති වුත්තං. කිඤ්චාපි එවං වුත්තං; තෙසු පන බහලකිලෙසකාමභූතො බහලකාමරාගො තබ්බත්ථුකා ච පඤ්චකාමගුණාව ඉධ ගහිතාති දස්සනත්ථං (14) **සමාපතන්තිනං ධම්මානා** ති වුත්තං. සම්පජ්ජනවසෙනසම්භිජ්ජන වසෙනාති අත්ථො. **අවචරන්තී ති** පවත්තන්ති. ඉති - සද්දො හෙතුම්හි; යස්මා දුවිධොපි අයං **කාමො** අවචරති, තස්මා (16) **කාමො එත්ථ අවචරතී ති කාමාවචරසඤ්ඤිතො** ති අත්ථො.

සග්ගමොක්ඛහෙතුභූතා පුඤ්ඤසම්මතා අයා යෙභුය්‍යෙන අපෙතාති අපායා. නිරයාදිවසෙන චත්තාරො අපායා **චතුරපායා**; **ඡන්නං** ති චාතුම්මහාරාජික - තාවතිංස - යාම - තුසිත - නිම්මාණරතී - පරනිම්මිතවසවත්තිසංඛාතානං ඡන්නං දෙවලොකානං. මෙරුපාදවාසිනො පන අසුරා තාවතිංසෙසු යෙව සංගය්හන්තී ති න තෙහි සද්ධිං සත්තන්නංති වුත්තං. මනසො උස්සන්නත්තා මනුස්සා; සති - සූරභාව - බ්‍රහ්මචරියයොග්‍යතාදිගුණවසෙන උපචිතමානසතාය, උක්කට්ඨගුණචිත්තතායාති අත්ථො. තෙ පන නිප්පරියායතො ජම්බුදීපවාසිනො වෙදිතබ්බා. යථාහ "තීහි භික්ඛවෙ ඨානෙහි ජම්බුදීපිකා මනුස්සා උත්තරකුරුකෙ මනුස්සෙ අධිගණ්හන්ති, අථ ච දෙව තාවතිංසෙ. කතමෙහි තීහි? සූරා, සතිමන්තො, ඉධ බ්‍රහ්මචරියවාසො" ති. තෙහි පන සමානරූපාදිතාය සද්ධිං පරිත්තදීපවාසීහි ඉතරමහාදීපවාසිනොපි මනුස්සා ඉච්චෙව පඤ්ඤායිංසු. ලොකියා පන මනුනො අපච්චභාවෙන මනුස්සාති වදන්ති.

**එකාදසවිධො** චතුරපායෙසු තිරච්ඡාන - පෙත්තිවිසයානං විසුං පරිච්ඡින්නස්ස ඔකාසස්ස අභාවෙපි යත්ථ තෙ අරඤ්ඤසමුද්ද - පබ්බතපාදාදිකෙ නිබද්ධවාසං වසන්ති, තාදිසස්ස ඨානස්ස ගහිතත්තා එකාදසවිධො. තත්‍ර චෙත්ථ අඤ්ඤෙසම්පි ධම්මානං පවත්තිසම්භවතො[3] කාමස්සෙව අවචරණවසෙන කථං නාමලාභොති ආහ: **අස්සාභි-ලක්ඛිතත්තා**ති ආදිං. තත්ථ **අස්සාති** ඉමස්ස දුවිධස්ස කාමස්ස, **අභිලක්ඛිතත්තා** ති තස්මිං එකාදසවිධෙ පදෙසෙ පාකටත්තා. අථවා **අස්සාති** කරණත්ථෙ සාමිවචනං. තස්මා අනෙන දුවිධෙන කාමෙන එකාදසවිධස්ස පදෙසස්ස අභිලක්ඛිතත්තා, පඤ්ඤත්තත්තාති අත්ථො. අථ වා උපයොගත්ථෙ සාමිවචනවසෙන අස්ස එකාදසවිධස්ස පදෙසස්ස තෙන දුවිධෙන අභිලක්ඛිතත්තාති අත්ථො.

1. M සබ්බො. 2. M. පවත්තන්තීති. 3. M. B. සම්භාවතො.

සහ සත්ථෙහීති **සසත්ථා.** යත්ථ තෙ අවචරන්ති, සො **සසත්ථාවචරො,** පදෙසො. සො විය. යථා හි යස්මිං පදෙසෙ සසත්ථා පුරිසා අවචරන්ති, සො විජ්ජමානෙසුපි අඤ්ඤෙසු දිපද-චතුප්පදාදිසු අවචරන්තෙසු තෙසං තත්ථ පාකටත්තා තෙහි වා අභිලක්ඛිතත්තා සසත්ථාවචරොත්වෙව පඤ්ඤායති; එවං විජ්ජමානෙසුපි අඤ්ඤෙසු රූපාවචරාදිසු අවචරන්තෙසු අභිලක්ඛණවසෙන අයං පදෙසො කාමාවචරොත්වෙව සඤ්ඤිතොති. එස නයො රූපාරූපාවචරෙසු.

තනු ච චිත්තං කාමාවචරන්ති වුත්තං; යථාවුත්තනයෙන පන දෙසස්ස ගහිතත්තා කථං තත්ථ අවචරන්තං කාමාවචරං නාමාති ආහ: (17) **සොයං** ති ආදි. සො අයං කාමාවචරො **කාමොති සඤ්ඤිතොති** සම්බන්ධො. **රූපභවො රූපං** ති යථා රූපභවො රූපං; අවුත්තොපි හි යථාසද්දො එවංසද්දසන්නිධානතො[1] ලබ්භති. යථා "රූපුපපත්තියා මග්ගං භාවෙති" ති. එත්ථ රූපභවූපපත්තියාති වත්තබ්බෙ රූපභවො රූපන්ති සඤ්ඤිතොති අයමෙත්ථ අත්ථො. කථමෙතස්ස එවංසඤ්ඤිතොති ආහ: **උත්තරස්ස පදස්සා** ති ආදි. අථ වා යථා උත්තරස්ස පදස්ස ලොපං කත්වා උදීරිතො එස රූපභවො රූපං ති සඤ්ඤිතො; එවං සොයං කාමාවචරො කාමොති සඤ්ඤිතොති[2] සම්බන්ධො.

(18) **තස්මිං කාමෙ** ති තස්මිං උත්තරපදලොපවසෙන කාමසඤ්ඤිතෙ පදෙසෙ. **ඉදං** ති ඉදං අට්ඨවිධං **චිත්තං.** අධිකාරවසෙන පන තස්ස ගහණෙපි සබ්බෙසමෙව පරිත්තචිත්තානමයමත්ථො ලබ්භති, සබ්බෙසම්පි කාමෙ අවචරණතො. **සදා** ති සබ්බකාලං, යෙභුය්‍යෙනාති[3] අධිප්පායො. ඉමිනා ඉදං දස්සෙති;[4] යථා සංගාමෙ යෙභුය්‍යෙන අවචරණතො[5] සංගාමාවචරොති ලද්ධනාමො හත්ථී අඤ්ඤත්ථ අවචරන්තොපි බහුලප්පවත්තිවසෙන සංගාමාවචරොත්වෙව පඤ්ඤායති. එවමිදං අඤ්ඤත්ථාපි අවචරන්තං කාමලොකෙ බාහුල්ලවුත්තිතො කාමාවචරමිච්චෙව වුත්තන්ති. තෙන පන තනු චෙතං රූපාරූපභවෙසුපි අවචරණතො රූපාවචරාදිනාමම්පි ලභෙය්‍යාති ඉමං චොදනං පරිහරති. හොති චෙත්ථ:

"කාමෙවචරතීතෙතං කාමාවචරසඤ්ඤිතං[6]
සෙසෙ අවචරන්තම්පි සංගාමාවචරො යථා" ති.

ඉති - සද්දො හෙතුම්හි; ච - සද්දො වත්තබ්බන්තරසමුච්චයෙ. තෙන යස්මා උත්තරපදලොපෙන කාමාවචරො කාමොති

1. M සද්දසන්නිධානතො. 2. මරම්මපොත්ථකෙ නත්ථි 3. M බාහුල්ලෙනාති. 4. M. දීපෙති. 5. M. අවචරන්තො 6. B. සඤ්ඤිතො.

සඞ්ඛාතො, යස්මා ච තස්මිං කාමෙ ඉදං චිත්තං සදා අවචරති, තස්මා කාමාවචරන්තෙව කථිතං. න පන කාමාවචරාවචරං, නාපි රූපාරූපාවචරං ති චාති අධිප්පායො. **කාමඝාතිනාති** දෙසනාඤාණෙන විනෙය්‍යසන්තානගතස්ස කිලෙසකාමස්ස ඝාතනසීලෙන සම්මාසම්බුද්ධෙන.

(19) **පටිසන්ධිං =පෙ= අවචාරයතීති වා** ති අථ වා යස්මා යත්ථ කත්ථචි උප්පන්නම්පි කාමභවෙ යෙව පටිසන්ධිං අවචාරයති, තස්මා ඉදං කාමෙ අවචාරයතීති කාමාවචරං ති කථිතං; වා – සද්දස්ස රස්සත්තං කත්වාති අත්ථො. එවං උත්තරපදලොප-වසෙන පදසම්භවං දස්සෙත්වා ඉදානි විනාපි උත්තරපදලොපං කාමාවචරසද්දස්ස සම්භවං දස්සෙතුං **පරියාපන්නං ති තත්‍ර වා** ති වුත්තං. **තත්‍ර** තස්මිං කාමභවෙ. **පරියාපන්නං** ති අන්තොගධං. අයමෙත්ථ අධිප්පායො: "කතමෙ ධම්මා කාමාවචරා? හෙට්ඨිමන්තතො අවීචිනිරයං පරියන්තං කත්වා, උපරිමන්තතො පරනිම්මිතවසවත්තී දෙවෙ අන්තොකරිත්වා යං එත්ථන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධ – ධාතු – ආයතනා, රූපං වෙදනා සඤ්ඤා සංඛාරා විඤ්ඤාණං. ඉමෙ ධම්මා කාමාවචරා" ති වුත්තත්තා යථා මනුස්සිත්ථියා කුච්ඡිස්මිං නිබ්බත්තොපි තිරච්ඡාන-ගතිකො තිරච්ඡානයොනියමෙව පරියාපන්නත්තා තිරච්ඡානො-ත්වෙව වුච්චති, එවමිදං රූපාරූපභවෙසු උප්පන්නම්පි කාමභව-පරියාපන්නත්තා කාමාවචරන්තෙව කථිතං ති. තප්පරියාපන්නතා-චස්ස අවීචි - පනිනිම්මිත – පරිච්ඡින්නොකාස - නිස්සාය කාම තණ්හාය විසයභාවතොති වෙදිතබ්බා. තථා හි වුත්තං ආචරිය-ධම්මපාලත්ථෙරෙන: "නික්ඛෙපකණ්ඩෙපි එත්ථාවචරාති වචනං අවීචි - පරනිම්මිත – පරිච්ඡින්නොකාසාය කාමතණ්හාය විසයභාවං සන්ධාය වුත්තං" ති.

පදසම්භවො පනෙත්ථ එවං දට්ඨබ්බො:[1] කාමතණ්හා කාමො, සො එත්ථ ආරම්මණකරණවසෙන අවචරතීති කාමාවචරං ති. නනු චෙත්ථ "කතමා කාමතණ්හා? යා කාමාවචරධම්මාරම්මණ-තණ්හා. කතමෙ කාමාවචරධම්මා? යෙ කාමතණ්හාවිසයා" ති එවං ඉතරීතරනිස්සයතාදොසො ආපජ්ජතීති? නාපජ්ජති. අවීචි ආදි එකාදසොකාසනිස්සාය කඤ්චි තණ්හං කාමතණ්හාභාවෙන ගහෙත්වා තංසභාවාය තණ්හාය විසයභාවෙන කාමාවචරධම්මානං උපලක්ඛෙතබ්බභාවතො. අථවා කිලෙසවත්ථුවසෙන දුවිධොපි කාමො යථාරහං සහජාතවසෙන එත්ථ අවචරතීති කාමාවචරං. ආරම්මණකරණවසෙන වා දුවිධෙ පි කාමෙ එතං අවචරතීති

1. M. වෙදිතබ්බො.

කාමාවචරං. යථා වා[1] මඤ්චනිස්සිතකෙසු උක්කුට්ඨිං කරොන්තෙසු නිස්සය – නිස්සිතානං අභෙදස්ස බුද්ධියා ගහිතත්තා නිස්සිතෙසු[2] නිස්සයූපචාරවසෙන "මඤ්චා උක්කුට්ඨිං කරොන්තී"ති වුච්චති; එවමෙතම්පි කාමාවචරභවෙ පවත්තනවසෙන තන්නිස්සිතත්තා නිස්සයවොහාරෙන කාමාවචරන්ති වුච්චතීති. හොති චෙත්ථ:

"කාමොවචරතීත'ත්ථ, කාමෙ'වචරතීති වා,
ඨානූපචාරතො වාපි තං කාමාවචරං භවෙති.

පුජ්ජඵලනිබ්බත්තනතො, අත්තසන්තානං පුනනතො ච පුඤ්ඤානි, කත්තබ්බතාය ක්‍රියා, තෙසං තෙසං ආනිසංසානං වත්ථුත්තා[3] වත්ථූනි චාති පුඤ්ඤක්‍රියවත්ථූනි. ගණනතො දස පරිමාණත්තා දස ච තානි පුඤ්ඤක්‍රියාවත්ථූනි චාති **දසපුඤ්ඤ-ක්‍රියාවත්ථූනි,** තෙසං. **වසෙනා** ති දසපුඤ්ඤක්‍රියාවත්ථුභාවෙන,[4] තම්මයං හුත්වාති අත්ථො. **එව** කාරෙන පන රූපාරූපලොකුත්තරං විය න කෙවලං භාවනාවසෙනෙවාති දස්සෙති. අථ වා දස පුඤ්ඤක්‍රියාවත්ථුවසෙනෙව පවත්තති, න පරෙහි පරිකප්පිත පරපසංසාදිපුඤ්ඤක්‍රියාවත්ථුවසෙනාති, එවසද්දෙන අවධාරණං, යතො වක්ඛති: **"සබ්බානුස්සතිපුඤ්ඤං ච"** ති ආදි. කානි පන තානි දසපුඤ්ඤක්‍රියාවත්ථූනි යෙසං වසෙන ඉදං අට්ඨවිධං චිත්තං පවත්තතීති වුත්තං ති ඉමං අනුයොගං සන්ධාය තානි සරූපතො දස්සෙතුං (21) **දානං සීලං** ති ආදි වුත්තං.

තත්ථ දීයති එතෙනාති **දානං,** පරිච්චාගචෙතනා. ඉධ පන චිත්තාධිකාරවසෙන තංසම්පයුත්තං චිත්තං[5] ගහෙතබ්බං. තථා සීලාදීසු පි. සීලති ති **සීලං,** කායවචීකම්මාදීනි සමාදහතීති අත්ථො. සුසීල්‍යවසෙන හි කායකම්මාදීනි අවිප්පකිණ්ණානි සම්පති ආයතිං ච හිතසුඛාවහානි සම්මා ඨපිතානි සමාහිතානි හොන්ති. සීලයති උපධාරයතීති වා **සීලං;** උපධාරණං පනෙත්ථ කුසලානං අධිට්ඨානභාවො. භාවෙති කුසලධම්මෙ ආසෙවති, වඩ්ඪෙති එතායාති **භාවනා.** අත්තනො සන්තානෙ නිප්ඵන්නා පත්ති දීයති එතෙනාති **පත්තිදානං** තංතංකිච්චකරණෙ ව්‍යාවටස්ස භාවො **වෙය්‍යාවච්චං.** දෙසෙති එතායාති **දෙසනා.** පත්තිං අනුමොදති එතෙනාති **පත්තානුමොදනා.** පුබ්බපද-ලොපෙන **අනුමොදනා** ති වුත්තං. දිට්ඨියා උජුභාවො **දිට්ඨිජ්ජුකම්මං,** සම්මාදිට්ඨියා **උජුකරණං** ති අත්ථො. අත්තනො පරස්ස වා හිතජ්ඣාසයවසෙන සම්මා සුණන්ති එතායාති **සංසුති.** පූජාවසෙන

1. M. අථ වා. 2. M. නිස්සිතකෙසු. 3. M. වත්ථුතාය. 4. M වත්ථු-වසෙන. 5. මරම්මපොත්ථකෙ නත්ථි.

අපචායති සාමීචිං කරොති එතෙනාති **අපචායො**. පුඤ්ඤකිරිය වත්ථූනං පභෙදෙ **පුඤ්ඤක්‍රියවත්ථුප්පභෙදෙ**, මජ්ඣපදලොපවසෙන පුඤ්ඤවත්ථුප්පභෙදෙති වුත්තං, යථා ආජඤ්ඤයුත්තො රථො ආජඤ්ඤරථොති. අයමෙත්ථ පදවිචාරො.

අයම්පන විනිච්ඡයො: තත්ථ සෙඛපුථුජ්ජනානං පරං උද්දිස්ස පූජානුග්ගහකාමතාය අත්තනො විජ්ජමාන-වත්ථුපරිච්චජනවසෙන පවත්තා චෙතනා දානමයං පුඤ්ඤකිරියවත්ථු නාම. ඛීණාසවානම්පි තථා පවත්තා දානමෙව; සා පන පුඤ්ඤක්‍රියා නාම න හොතීති න ඉධ අධිප්පෙතා. පුජ්ජඵලනිබ්බත්තනතො හි අත්තසන්තානං පුණනතො ච පුඤ්ඤං; න ච ඛීණාසවසන්තානෙ පවත්තා ඵලනිබ්බත්තිකා හොති, න ච තං පුණාති විසුද්ධසන්තානප්පවත්තත්තාති. එවං සෙසෙසුපි.

යා පන නිච්චසීල-උපොසථසීලාදිවසෙන පඤ්චසීලං අට්ඨසීලං දසසීලං සමාදියන්තස්ස, අසමාදියන්තස්ස පි කුලචාරිත්තවසෙන සම්පත්තතාය දුච්චරිතාදීහි විරමන්තස්ස උපසම්පදමාලකෙ සංවරං සමාදියන්තස්ස, පාතිමොක්ඛං පරිපූරෙන්තස්ස, ආපාථගතවිසයෙසු චක්ඛාදිඉන්ද්‍රියානි ථකෙන්තස්ස, චීවරාදිකෙ පච්චයෙ පච්චවෙක්ඛන්තස්ස, කුහනාදිවත්ථුතො ආජීවං පරිසොධෙන්තස්ස ච පවත්තචෙතනා, අයං සීලමයං පුඤ්ඤකිරියවත්ථු නාම. එත්ථාහ: "දානං නාමෙතං මය්හං කුලවංසො චාරිත්තන්ති එවං චාරිත්තසීලෙ ඨත්වා දෙන්තස්ස පවත්තා චෙතනා දානමයං පුඤ්ඤකිරියවත්ථු? උදහු සීලමයන්ති? සීලමයමෙව, චාරිත්තසීලභාවතො. දෙය්‍යධම්ම-පරිච්චාගවසෙන පවත්තාපි හෙ'සා පුබ්බාභිසංඛාරස්ස අපරභාගෙ චෙතනාය ච තථා පවත්තත්තා සීලමයමෙව පුඤ්ඤකිරියවත්ථු, න දානමයං. පූජානුග්ගහකාමතාය හි දින්නං දානමයං ති.

"චක්ඛුං අනිච්චං" ති ආදිනා පන චක්ඛාදිකෙ තිලක්ඛණං ආරොපෙත්වා සම්මසන්තස්ස පවත්තා ගොත්‍රභූ - වොදන පරියොසානා විපස්සනා - චෙතනා, කසිණාදීසු ආරම්මණෙසු අප්පණං අප්පත්තා ගොත්‍රභූපරියොසානා පරිකම්මචෙතනා වා ති අයං භාවනාමයපුඤ්ඤකිරියවත්ථු නාම. අප්පණාප්පත්තාපි භාවනායෙව; සා පන න කාමාවචරාති ඉධ න ගහිතා නිරවජ්ජ - විජ්ජායතන - කම්මායතන - සිප්පායතනානං සික්ඛනචෙතනා භාවනාමයෙ යෙව සංගහං ගච්ඡන්තීති ආචරියා. යා චෙත්ථ දෙය්‍යධම්මං ඛයතො වයතො සම්මසිත්වා දදතො පවත්තා, සාපි පුබ්බෙ විය උභයභාගෙ චෙතනානං තථා පවත්තත්තා භාවනාමයපුඤ්ඤකිරියා යෙවාති දට්ඨබ්බං.[1]

1. M. වෙදිතබ්බං.

දානාදිකං යං කිඤ්චි සුචරිතකම්මං කත්වා "අසුකස්ස නාම පත්ති හොතු, සබ්බසත්තානං හොතූ" ති එවං අත්තනා කතස්ස පරෙහි සාධාරණභාවං පච්චාසිංසනවසෙන පවත්තා පත්තිදානමය පුඤ්ඤක්‍රියවත්ථු නාම. කිම්පනෙවං පත්තිං දදතො පුඤ්ඤක්ඛයො හොතීති? න හොති. යථා පන එකං දීපං ජාලෙත්වා තතො දීපසහස්සං ජාලෙන්තස්ස පඨමදීපො ඛීණොති න වත්තබ්බො, පුරිමාලොකෙන පන සද්ධිං පච්ඡිමාලොකස්ස එකීභාවෙ අතිමහා ව හොති, එවමෙවං පත්තිං දදතො පරිහානි නාම න හොති, වඩ්ඪි යෙව පන හොතීති දට්ඨබ්බා. කථම්පනෙසා දින්නා නාම හොති ති? "ඉදං මෙ පුඤ්ඤකම්මං සබ්බසත්තානං, අසුකස්ස වා පරිණමතු" ති එවං පුබ්බභාගෙ පච්ඡාපි වා වචීභෙදං කරොන්තෙන මනසා එව වා චින්තෙන්තෙන දින්නං නාම හොති. කෙචි පන "යම්මයා කතසුචරිතං තස්ස ඵලං දම්මී"ති වුත්තෙපි පත්තිදින්නාව හොතීති වදන්ති. කුසලකම්මාධිකාරත්තා පන පරෙහි ච කම්මස්සෙව අනුමොදිතබ්බත්තා කම්මමෙව දාතබ්බං; අනුමොදන්තෙනාපි කම්මමෙව අනුමොදිතබ්බන්ති ඉදමෙත්ථ ආචරියානං සන්නිට්ඨානං.

චීවරාදිසු පච්චාසාරහිතස්ස[1] අසංකිලිට්ඨෙන අජ්ඣාසයෙන සමණබ්‍රාහ්මණානං වත්තපටිවත්තකරණවසෙන ගිලානුපට්ඨානවසෙන ච පවත්තා වෙය්‍යාවච්චමයපුඤ්ඤකිරියවත්ථු නාම. ආමිසකිඤ්චික්ඛාදිනිරපෙක්ඛචිත්තස්ස අත්තනො පගුණධම්මං විමුත්තායතනසීසෙ ඨත්වා දෙසෙන්තස්ස, තථෙව නිරවජ්ජවිජ්ජායතනාදිකං උපදිසන්තස්ස ච පවත්තා දෙසනාමයපුඤ්ඤකිරියවත්ථු නාම.

පරෙහි කතං යං කිඤ්චි සුචරිතකම්මං දින්නමදින්නම්පි වා ඉස්සාමච්ඡෙරමලං පහාය "සාධු සාධූ" ති අනුමොදන්තස්ස පවත්තා අනුමොදනපුඤ්ඤකිරියවත්ථු නාම.

"අත්ථි දින්නං" ති ආදිනා කම්මස්සකතඤ්ඤාණවසෙන දිට්ඨිං උජුං කරොන්තස්ස පවත්තා දිට්ඨිජ්ජුකම්මපුඤ්ඤකිරියවත්ථු නාම. යදි එවං ඤාණවිප්පයුත්තචිත්තස්ස දිට්ඨිජ්ජුකම්මපුඤ්ඤකිරියතා න ලබ්භතීති? නො න ලබ්භති. පුරිමපච්ඡිමචෙතනානම්පි තං තං පුඤ්ඤක්‍රියාසෙව සංගණ්හනතො. තථා හි වක්ඛති:

"පුරිමා මුඤ්චනා චෙව පරා තිස්සො පි චෙතනා
හොන්ති දානමයං පුඤ්ඤං එවං සෙසෙපි දීපයෙ" ති

1. B. පඝාසාරහිතස්ස.

තස්මා කිඤ්චාපි උජුකරණවේලායං ඤාණසම්පයුත්තමෙව චිත්තං හොති; පුරිම-පච්ඡාභාගෙ පන ඤාණවිප්පයුත්තම්පි හොතීති තස්සාපි දිට්ඨුජුකම්මපුඤ්ඤකිරියභාවො උපපජ්ජති. අපරෙ පනාහු: විඤ්ඤාණ-පඤ්ඤාවසෙන දස්සනං දිට්ඨි. චිත්තං පඤ්ඤා ච, දිට්ඨියා උජුභාවො දිට්ඨුජුතා. කිං තං? කුසලං විඤ්ඤාණං, කම්මස්සකතාඤාණාදි ච සම්මාදස්සනං; තත්ථ කුසලවිඤ්ඤාණෙන ඤාණුප්පාදෙපි අත්තනො සුචරිතානුස්සරණ-පරගුණපසංසා-සරණාගමනානං සඞ්ගහො, කම්මස්සකතාඤාණෙන කම්මපථසම්මාදිට්ඨියාති. දානාදිසම්පයුත්තම්පන ඤාණං දානාදිස්වෙව අන්තොගධන්ති වෙදිතබ්බං. එවං ඉමං ධම්මං සුත්වා තත්ථ වුත්තනයෙන පටිපජ්ජන්තො ලොකියලොකුත්තරගුණවිසෙසං අධිගමිස්සාමි, බහුස්සුතො වා හුත්වා පරෙ ධම්මදෙසනාය අනුග්ගණ්හිස්සාමීති එවං අත්තනො පරෙසං ච විමුත්තායතනසීසෙන සද්ධම්මං සුණන්තස්ස පවත්තා සවණමයපුඤ්ඤකිරියවත්ථු නාම. නිරවජ්ජ විජ්ජායතනාදි-සවණචෙතනාපි එත්ථෙව සඞ්ගය්හති.

පූජාරහෙ ගරුට්ඨානීයෙ මහල්ලකෙ ච දිස්වා ආසනා උට්ඨහන්තස්ස පත්තචීවරපටිග්ගහණ-මග්ගසම්පදාන-අභිවාදන-අඤ්ජලිකම්මකරණ-ආසනපුප්ඵගන්ධාදීහි අභිහාරං කරොන්තස්ස ච පවත්තා බහුමානචෙතනා අපචිතිසහගත-පුඤ්ඤකිරියවත්ථු නාම. වෙය්‍යාවච්චාපචායනානං හි අයං විසෙසො: වයසා ගුණෙන ච ජෙට්ඨානං ගිලානානං ච තංතංකිච්චකරණං වෙය්‍යාවච්චං; සාමීචිකිරියා අපචායනං ති.

එවං අට්ඨකථායං ආගතනයෙන දසපුඤ්ඤකිරියවත්ථූනි දස්සෙත්වා ඉදානි සුත්තෙ ආගතනයෙන දානං සීලං භාවනා ති තීණි යෙව දස්සෙතුං, තෙසු ඉතරෙසම්පි සඞ්ගහං දීපෙන්තො ආහ (22) **ගච්ඡන්ති සඞ්ගහං**ති ආදි. තත්ථ **පත්තිදානානුමොදනා දානෙ සඞ්ගහං ගච්ඡන්ති,** තංසභාවත්තා. දානම්පි හි ඉස්සාමච්ඡෙරානං පටිපක්ඛං; එතෙපි තංසමානපටිපක්ඛතාය දානෙන සහ එකලක්ඛණත්තා එතෙ දානමයපුඤ්ඤකිරියවත්ථුම්හි සඞ්ගහං ගච්ඡන්ති. **වෙය්‍යාවච්චාපචායනා සීලමයෙ පුඤ්ඤෙ** සඞ්ගහං ගච්ඡන්ති, චාරිත්තසීලසභාවත්තා. **දෙසනා-සවණ-දිට්ඨිඋජුකා** පන කුසලධම්මාසෙවනතො භාවනාමයෙ සඞ්ගහං ගච්ඡන්ති. කෙචි පන දෙසෙන්තො සුණන්තො ච දෙසනානුසාරෙන ඤාණං පෙසෙත්වා ලක්ඛණං පටිවිජ්ඣ දෙසෙතිච සුණාතිච, තානි දෙසනාසවණානි පටිවෙධමෙව ආහරන්තීති දෙසනා සවණං භාවනාමයෙ සඞ්ගහං ගච්ඡන්තීති වදන්ති. ධම්මදානභාවතො දෙසනා දානමයෙ සඞ්ගහං ගච්ඡතීති පි සක්කා වත්තුං; තථා

දිට්ඨුජ්ජුකම්මං සබ්බත්ථාපි සබ්බෙසං නියමනලක්ඛණත්තා'ති. දානාදීසු හි යං කිඤ්චි "අත්ථි දින්නං"ති ආදිනයප්පවත්තාය සම්මාදිට්ඨියා විසොධිතං මහප්ඵලං මහානිසංසන්ති. එවං ච කත්වා දීඝනිකායට්ඨකථායං "දිට්ඨුජ්ජුකම්මං පන සබ්බෙසං නියමනලක්ඛණං" ති වුත්තං. **මහාසංඝිකා** පන **අභයගිරිවාසිනො** ච දිට්ඨුජ්ජුකම්මං විසුං පුඤ්ඤකිරියභාවෙන න ගණ්හන්ති. තථා හි තෙ "දානං සීලං භාවනා සංසුති දෙසනානුස්සතිමොදං වෙය්‍යාවච්චං පූජා සරණං පත්ති පසංසා වා"ති අත්තනා කතපුඤ්ඤානුස්සරණං, බුද්ධාදිසරණගමනං, පරගුණප්පසංසා'ති ඉමානි තීණි පක්ඛිපිත්වා දිට්ඨුජ්ජුකම්මං අග්ගහෙත්වා දසපුඤ්ඤකිරියවත්ථූනි පඤ්ඤපෙන්ති.

(23) **පුන තීණෙවා** ති පඨමං දසාපි සමානා පුන සංඛෙපතො තීණෙව **සමෙන්ති.** ඉදානි පරෙහි නිද්දිසියමානානං පුඤ්ඤානුස්සරණාදීනං අත්තනා නිද්දිට්ඨෙස්වෙව සමොධානං දස්සෙතුං (24) **සබ්බානුස්සතිපුඤ්ඤං චා** ති ආදි වුත්තං. තත්ථ සබ්බසෙව අත්තනා කතසුචරිතස්ස අනුස්සරණං සබ්බානුස්සතිපුඤ්ඤං නාම. පසංසා'ති පරෙහි කතාය පුඤ්ඤකිරියාය සම්මාපටිපත්තියා'ව විප්පසන්නචිත්තෙන පසංසනං, සන්තුස්සනං'ති අත්ථො. **සරණත්තයං** ති එත්ථ සරන්ති හිංසන්තීති සරණානි; බුද්ධාදීනි තීණි රතනානි. තානි හි සරණගතානං තෙනෙව සරණගමනෙන භයං සන්තාසං දුග්ගතිපරිකිලෙසං හිංසන්ති විනාසෙන්ති. තයො අවයවා අස්සා'ති **තයං**; තීහි අවයවෙහි යුත්ත – සමුදායස්සෙතං අධිවචනං. සරණානං තයං **සරණත්තයං**; තීණි සරණානීති වුත්තං හොති. න හි අවයවවිනිමුත්තො සමුදායො නාම කොචි අත්ථි. ඉධ පන සරණත්තයග්ගහණෙන උපචාරතො, උත්තර පදලොපතො වා සරණගමනං අධිප්පෙතං; න හි සරණත්තයං පුඤ්ඤකිරියවත්ථු නාම හොති. අත්ථතො පනෙතං "සම්මාසම්බුද්ධො වත සො භගවා; ස්වාක්ඛාතො ධම්මො, සුපටිපන්නො සංඝො"ති ආදිනා බුද්ධාදීසු පසාදපටිලාභවසෙන පවත්තචෙතනා. **දිට්ඨුජ්ජුකම්මස්මිං සංගහං යන්ති** ති තංවසෙනෙව තෙසං ඉජ්ඣනතො. න හි විපරීතදිට්ඨිකස්ස ඉමානි තීණි සම්භවන්ති; තස්මා තෙ එකන්තෙන දිට්ඨුජ්ජුකම්මපුඤ්ඤකිරියවත්ථුස්මිං සංගහං ගච්ඡන්ති, න විසුං පුඤ්ඤකිරියභාවෙන ගහෙතබ්බා'ති අධිප්පායො. තෙනාහ: **නත්ථි සංසයො** ති. දිට්ඨුජ්ජුකම්මස්ස භාවනාමයසංගහෙපි සංඛෙපනයෙනෙව භාවනාමයෙ සංගය්හන්ති, විත්ථාරනයෙන පන කත්ථ නු ඛො'ති සංසයො සියා'ති ඉමෙසං භාවනාමයසංගහො න වුත්තො. දිට්ඨුජ්ජුකම්මස්ස වා සබ්බෙසං මහප්ඵලභාවනියාමකත්තෙන මූලභූතත්තා තස්ස පධානභාවං දස්සෙතුං විසුං තත්ථ

සංගය්හන්තීති වුත්තං. අපරෙ පන[1] "ගණ්හනතො මුඤ්චතී"ති වචනතො සරණගමනස්ස සීලසමාදානෙ විය ගහණං සම්භවතී ති සීලමයෙ සංගය්හතී ති වදන්ති. සරණගමනං පණිපාතභාවතො අපචිතිසංගහෙන ගය්හතී ති කෙචි.

ඉදානි යථාවුත්තපුඤ්ඤකිරියවත්ථූනං පුරිමපච්ඡිමභාගවසෙන පවත්තමානාපි චෙතනා තත්ථ තත්ථෙව සංගහං ගච්ඡන්තීති දස්සෙතුං(25) **පුරිමා මුඤ්චනා** ති ආදි වුත්තං. තත්ථ **පුරිමා** ති දානත්ථාය දෙය්‍යධම්මං ධම්මෙන සමෙන උප්පාදෙන්තස්ස, උප්පන්නං පරිච්චජිස්සාමීති චින්තෙන්තස්ස, දක්ඛිණෙය්‍ය පරියෙසන්තස්ස, දානවත්ථුතො යාව පටිග්ගාහකස්ස හත්ථෙ විස්සජ්ජනං පරිණාමනං තාව පවත්තා පුබ්බභාගචෙතනා. පටිග්ගාහකස්ස පන හත්ථෙ විස්සජ්ජනචෙතනා පරිනාමණචෙතනාවා මුඤ්චනචෙතනා නාම. සා යෙව නිග්ගහීතලොපෙන මුච්චනාති වුත්තා. මුඤ්චනාති යෙව වා පාඨො. **පරා** ති අත්තනා විස්සට්ඨවත්ථුම්හි ආලයං අකත්වා "සාධු, සුට්ඨු, අග්ගදානං මෙ දින්නං"ති සොමනස්සචිත්තෙන පච්චවෙක්ඛන්තස්ස උප්පන්නා අපරභාගචෙතනා **තිස්සොපි චෙතනා** ති අයං ච පුරිමා චෙතනා අයං ච මුඤ්චනචෙතනා අයං ච අපරචෙතනාති තිස්සො චෙතනා එකතො හුත්වා **දානමයං පුඤ්ඤං හොති,** දානමයපුඤ්ඤක්‍රියවත්ථු නාම හොතී ති අත්ථො. **පුඤ්ඤං** ති පදං අපෙක්ඛිත්වා **හොතී** ති එකවචනනිද්දෙසො. ඉදානි යථාවුත්තමත්ථං සෙසෙසු පි අතිදිසන්තො[2] ආහ: **එවං සෙසෙසු දීපයෙ** ති. සෙසෙසුපි සීලාදීසු පුඤ්ඤකිරියවත්ථූසු එවං යථාවුත්තනයෙන සීලං රක්ඛිස්සාමී ති චින්තෙන්තස්ස පබ්බජිස්සාමී ති විහාරං ගච්ඡන්තස්ස පවත්තා පුරිමචෙතනා; සීලං සමාදියන්තස්ස, පබ්බජන්තස්ස, සීලං පූරෙන්තස්ස උප්පන්නා මජ්ඣිම-චෙතනා, "පූරිතං මෙ"ති පච්චවෙක්ඛන්තස්ස උප්පන්නා අපරචෙතනාති එවං තිස්සො පි චෙතනා එකතො හුත්වා සීලමයං පුඤ්ඤකිරියවත්ථු නාමාති ආදිනා දීපයෙ, පකාසයෙති අත්ථො. නනු ච අත්තනා කතපුඤ්ඤානුස්සරණචෙතනා දිට්ඨුජ්ජුකම්මෙ සංගහිතා අයං ච අපරභාගචෙතනා සා යෙවාති කථමස්සා තත්ථ සංගහොති? නායං දොසො, විසයභෙදෙන උභින්නම්පි විසෙසසම්භවතො. පුඤ්ඤානුස්සරණං හි අත්තනා කතපුඤ්ඤවිසයමෙව; අයම්පන තබ්බත්ථුවිසයාති පාකටොව ද්වින්නං විසෙසොති.

එත්තාවතා ච යං වුත්තං "දසපුඤ්ඤක්‍රියාවත්ථුවසෙනෙව පවත්තන්ති"ති තත්ථ දසපුඤ්ඤක්‍රියාවත්ථූනි සරූපතො සංගහතො ච

1. M පන සංගණ්හනතො. 2. B. නිද්දිසන්තො.

නිද්දිසිත්වා ඉදානි තථාපවත්තමානස්ස පාටෙක්කං පවත්තාකාර විසෙසං දස්සෙතුං (3) **ඉදානී** ති ආදි ආරද්ධං. තත්ථ **අයං** ති වක්ඛමානනිදස්සනං. දාතබ්බො ධම්මො **දෙය්‍ය - ධම්මො,** අන්නාදි දසවිධවත්ථු. වුත්තං හි.

"අන්නං පානං වත්ථං යානං මාලා ගන්ධා විලෙපනං
සෙය්‍යාවසථ - පදීපෙය්‍යං දානවත්ථු ඉමෙ දසා"ති[1].

පටිග්ගාහකො ආදි යෙසං දෙසකාලමිත්තපරිවාරකාදීනං[2] තෙ **පටිග්ගාහකාදයො.** දෙය්‍යධම්මස්ස පටිග්ගාහකාදීනං ච සම්පත්ති, සම්පන්නතා **දෙය්‍යධම්මපටිග්ගාහකාදිසම්පත්ති.** තත්ථ දෙය්‍යධම්මස්ස පණීතමනාපභාවො, ධම්මෙන උප්පන්නතා ච දෙය්‍යධම්මසම්පත්ති. පටිග්ගාහකානං අග්ගදක්ඛිණෙය්‍යභාවො පටිග්ගාහකසම්පත්ති. දුල්ලභඅන්නපානාදිකො දෙසො දෙස-සම්පත්ති. තාදිසො ච කාලො කාලසම්පත්ති. දුල්ලභ අන්නපානාදිකෙ දෙසෙ කාලෙ වා දින්නං අජ්ඣාසයස්ස බලවතාය මහප්ඵලං, සොමනස්සහෙතුකඤ්ච හොති; තස්මා තෙ දානස්ස සම්පත්තිවසෙන වුත්තා. මිත්තසම්පත්ති පන කල්‍යාණමිත්තභාවො; කල්‍යාණමිත්තං හි නිස්සාය දානාදිසු චිත්තං ඔදග්ගප්පත්තං හොති. පරිවාරකසම්පත්ති පන ආණත්තියාපි තං තං කිච්චසම්පාදනෙ අප්පමත්තස්ස පරිවාරක-ජනස්ස පටිලාභො. **අඤ්ඤං වා සොමනස්සහෙතුං** ති සද්ධාබහුලතා විසුද්ධදිට්ඨිතාදිභෙදං අඤ්ඤං සොමනස්සකාරණං වා. **ආගම්මා** ති උපගම්ම, පටිච්චා ති අත්ථො. **හට්ඨපහට්ඨො** ති සොමනස්සවසෙන හට්ඨො චෙව පහට්ඨො ච; උභයෙනාපි අධිගතසොමනස්සං වුත්තං. **අත්ථි දින්නංති ආදිනයප්පවත්තං** ති "අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා[3] සච්ඡිකත්වා[4] උපසම්පජ්ජ විහරන්තී" ති[2] එවං පවත්ත - දසවිධ - සම්මාදිට්ඨිවත්ථුවසෙන චෙව ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගට්ඨානීයාදීනං වසෙන ච පවත්තං. ආදිසද්දෙන හි න කෙවලං නවන්නං යෙව සම්මාදිට්ඨිවත්ථූනං ගහණං; අථ ඛො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගට්ඨානීයානම්පි සංගහො. සම්මා ඤායෙන පවත්තා දිට්ඨි, පසත්ථා වා දිට්ඨීති **සම්මාදිට්ඨි.** **තං** පුරක්ඛත්වා ති පුබ්බඞ්ගමං කත්වා. තඤ්ච ඛො සහජාතපුබ්බඞ්ගමවසෙන,

1. M දසාවිමෙති. 2. M. දෙසකාලමිත්තාදීනං. 3. B. M. අභිඤ්ඤාය.
4 මරම්මපොත්ථකෙ නත්ථි.

"මනොපුබ්බඞ්ගමා ධම්මා" ති ආදීසු විය සම්පයොගස්ස අධිප්පෙතත්තා. **අනුස්සාහිතො** ති ලොභ-මච්ඡරියාදිවසෙන පුඤ්ඤකිරියාය සංකොචං අනාපජ්ජනතො අත්තනා, පරෙන වා කෙනචි අනුස්සාහිතො හුත්වා. සරසතො[1] ති පුඤ්ඤප්පවත්තිදස්සනමිදං, **පරෙහි** ති පන පාකටුස්සාහදස්සනත්ථං[2] වුත්තං. (4) **පඨමං** ති දෙසනාක්කමෙන ඉධ නිද්දිට්ඨක්කමෙන වා පඨමං. **මහාකුසලචිත්තං** ති සොමනස්සසහගතතාදි-අංගපාරිපූරියා මහන්තං කුසලචිත්තං; අථවා පච්ඡිමභවික-බොධිසත්තානං පටිසන්ධිආකඩ්ඪනතො මහන්තං පූජිතං කුසලචිත්තං ති මහාකුසලචිත්තං. සබ්බෙසම්පි හි සබ්බඤ්ඤුබොධිසත්තානං පටිසන්ධි මෙත්තාපුබ්බඞ්ගමස්ස තිහෙතුක-සොමනස්සමය-අසංඛාරිකචිත්තස්ස විපාකොති වුත්තං.

එත්ථ ච **දෙය්‍යධම්ම** =පෙ= **හට්ඨපහට්ඨො** ති එත්තාවතා ඉමස්ස සොමනස්සසහගතභාවමාහ. **සම්මාදිට්ඨිං පුරක්ඛත්වා** ති ඤාණසම්පයුත්තභාවං. **අනුස්සාහිතො**ති පන ඉමිනා අසංඛාරිකභාවං ති දට්ඨබ්බං. **වුත්තනයෙනෙවා**ති දෙය්‍යධම්ම-පටිග්ගාහකාදිසම්පත්තිං අඤ්ඤං වා සොමනස්සකාරණං ආගම්මාති එවං වුත්තනයෙන. **උස්සාහිතො**ති දෙය්‍යධම්මෙ සාපෙක්ඛතාදිතාය, සීලසම්පදාදීසු අනධිමුත්තතාදීහි ච පුඤ්ඤකිරියාය සංකොචාපජ්ජනතො අත්තනා, පරෙන වා කෙනචි උස්සාහිතො. **පරෙහී**ති පන වුත්තනයමෙව. **කරොති** දානාදීනි පුඤ්ඤානීති සම්බන්ධො. **තාදිසා**ති සොමනස්සසහගතතාදිනා තංසදිසතාය වුත්තං. හොති හි තංසදිසෙපි තබ්බොහාරො යථා ච "සා යෙව තිත්තිරී තානි යෙව ඔසධානී"ති. එත්ථ පන **උස්සාහිතො** ති ඉමිනා සසංඛාරිකතං දස්සෙති; සෙසං වුත්තනයමෙව.

**ඉමස්මිං පනත්ථෙ** ති ඉමස්මිං සසංඛාරිකසද්දාභිධෙය්‍යෙ උස්සාහිතබ්බචිත්තසංඛාතෙ අත්ථෙ, තංවිසයෙති අත්ථො. **පුබ්බප්පයොගස්සා**ති පුඤ්ඤකිරියාය සංකොචියමානෙ[3] තතො විවෙචෙත්වා සමුස්සාහනවසෙන පවත්තස්ස චිත්තප්පයොගස්ස. පුබ්බඞ්ගමත්තං[4] පනෙත්ථ තථාපවත්ත-පුබ්බාභිසංඛාරවසෙන සො පයොගො හොතීති කත්වා වුත්තං, තස්ස පුබ්බකාලිකතායාති වුත්තො වායමත්ථො.

**පටිපත්තිදස්සනෙනා**ති භික්ඛූ දිස්වා දෙය්‍යධම්මපරිච්චජනාදි-පටිපත්තිදස්සනෙන. බලන්ති අණන්තීති බාලා. අස්සසිත-පස්සසිතමත්තෙනෙව ජීවන්ති, න පඤ්ඤාජීවිතෙනාති අධිප්පායො.

---

I. M. සභාවතො 2. M. පරපාකටුස්සාහදස්සනවසෙන. 3. M. සංකොචෙ ජායමානෙ. 4 M. පුබ්බඞ්ගණං

බාලාව **බාලකා.** තෙ පන ඉධ "අත්ථි දින්නං" ති ආදිනයප්පවත්තාය සම්මාදිට්ඨියා අභාවෙන අසඤ්ජාතබුද්ධිනො දාරකා. පාකටවසෙන චෙත්ථ බාලකගහණං; සහසා කරණාදිකාලෙ පන ඉතරෙසම්පි ඤාණවිප්පයුත්තචිත්තං[1] හොතීති. සොමනස්සං ජාතං එතෙසන්ති **සොමනස්සජාතා,** ජාතසොමනස්සාති අත්ථො. සහසාති සීඝසීඝං, දාතුකාමතාය උප්පන්නසමකාලමෙව. **එත්ථ** ච **පටිපත්තිදස්සනෙනා** ති ඉමිනා පරෙසං පයොගාභාවමාහ; **ජාතපරිචයා** ති අත්තනො පයොගාභාවං. උභයෙනාපි ඉමස්ස අසංඛාරිකභාවං දීපෙති. **බාලකා, සහසා** ති ච ඉමෙහි ඤාණ-විප්පයුත්තභාවමාහ. **භික්ඛූ දිස්වා සොමනස්සජාතා**ති සොමනස්ස-සහගතභාවං. අථ වා **පටිපත්තිදස්සනෙන ජාතපරිචයා** ති ඉමිනා අසංඛාරිකභාවස්ස, **බාලකා භික්ඛූ දිස්වා සොමනස්ස-ජාතා**ති ඉමෙහි **ඤාණ**විප්පයුත්ත – සොමනස්සසහගතභාවස්ස ච දීපිතත්තා **සහසා ති** වචනෙන යථාවුත්තමෙව ඤාණවිප්පයුත්ත – අසංඛාරිකභාවං පකාසෙති. එවං සති පටිලොමතො සොමනස්ස සහගතාභාවො දස්සිතො හොති. අනුලොමතො පන **දස්සනෙන**[2] **සොමනස්සජාතා** ති ඉමිනා සොමනස්සසහගතභාවං **සහසා** ගහණෙන ඤාණවිප්පයුත්තාසංඛාරිකභාවං දීපෙති. **පටිපත්ති** =පෙ= **දිස්වා** ති එත්තාවතා පන සොමනස්සසහගතාදිභාවස්ස කාරණං වුත්තං ති.

**තෙ**ති තෙ ඤාතකා; තෙ බාලකා වා ති අත්ථො. **සොමනස්ස හෙතූනං අභාවං ආගම්මා**ති ඉදං නිදස්සනමත්තං දට්ඨබ්බං. මජ්ඣත්තාරම්මණං, තථාරූපෙ චෙතොභිසංඛාරාදයොපි හි උපෙක්ඛාසහගතතාය කාරණමෙවාති. චිත්තස්ස සොමනස්සාභාවෙ පුග්ගලස්සාපි සොමනස්සරහිතතා හොති. **චතූසු විපාකෙසු සොමනස්සරහිතා හොන්තී**ති පුග්ගලාධිට්ඨානං කත්වා වුත්තං. සොමනස්සරහිතා හොන්ති පුඤ්ඤං කරොන්තාති අධිප්පායො. **එවං** ති ආදි නිගමනං.

ඉමෙසු පන අට්ඨසු විඤ්ඤාණෙසු සොමනස්සසහගතතො උපෙක්ඛාසහගතං බලවතරං; ඤාණවිප්පයුත්තතො ඤාණසම්ප-යුත්තං; සසංඛාරිකතොපි අසංඛාරිකං සදිසං බලවතරං, විසදිසම්පන වෙදනා – ඤාණයොගවසෙන බලවං දුබ්බලඤ්ච හොති. සොමනස්සසහගත – තිහෙතුක – සසංඛාරිකතො හි උපෙක්ඛා සහගත – තිහෙතුක – සසංඛාරිකං බලවතරං. උපෙක්ඛාසහගත දුහෙතුක – අසංඛාරිකතො සොමනස්සසහගත – තිහෙතුක

1. M. ඤාණවිප්පයුත්තං. 2. මරම්මපොත්ථකෙ නත්ථි.

සසංඛාරිකං බලවතරං. ඉති චතුත්ථචිත්තතො තතියචිත්තං බලවතරං; තතො අට්ඨමචිත්තං; තතො සත්තමචිත්තං; තතො දුතියචිත්තං; තතො පඨමචිත්තං; තතො ඡට්ඨමචිත්තං; තතො පඤ්චමචිත්තන්ති එවමිමෙසං බලවබලවතරභාවො වෙදිතබ්බො.

එවං පාළියං ආගතනයෙන වෙදනා-ඤාණප්පයොගභෙදතො අට්ඨවිධතං නිද්දිසිත්වා ඉදානි අට්ඨකථායං ආගත-පුඤ්ඤක්‍රියාදීනං වසෙන පි පභෙදං දස්සෙතුං **දසපුඤ්ඤක්‍රියාදිනා**න්ති ආදි වුත්තං. ආදිසද්දෙන ඡන්නං ආරම්මණානං, චතුන්නං අධිපතීනං, තිණ්ණං කම්මානං, හීනාදිභෙදස්ස ච සංගහො දට්ඨබ්බො. තෙනෙවාහ:

"කමෙන පුඤ්ඤවත්ථූහි ගොචරාධිපතීහි ච
කම්ම-හීනාදිතො චාපි ගණෙය්‍ය නයකොවිදො"ති.

ඉදානි තථා පවත්තමානස්ස තස්ස යො යො තෙසං තෙසං වසෙන ලබ්භමානො ගණනපරිච්ඡෙදො, තං සබ්බං[1] සම්පිණ්ඩෙත්වා දස්සෙතුං **සත්තරසසහස්සානී**ති ආදි වුත්තං. තත්‍රෙවං ගණනානයො වෙදිතබ්බො:[2] ඉමානි තාව අට්ඨවිඤ්ඤාණානි දසන්නං පුඤ්ඤකිරියවත්ථූනං වසෙන පවත්තනතො පච්චෙකං දස දසාති කත්වා අසීතිචිත්තානි හොන්ති. තානි ඡසු ආරම්මණෙසු පවත්තනතො ඡගුණිතානි සාසීතිකානි චත්තාරි සතානි හොන්ති. තානි චතුන්නං අධිපතීනං සමායොගවසෙන චතුගුණිතානි සහස්සං වීසාධිකානි නවසතානි ච හොන්ති. තානි කාය-වචී-මනොසංඛාතානං තිණ්ණං කම්මානං වසෙන තිගුණිතානි සසට්ඨිසත්තසතාධිකානි පඤ්චසහස්සානි හොන්ති. තානි හීන-මජ්ඣිම-පණීත-භෙදතො තිගුණිතානි සාසීතික-ද්විසතාධිකානි සත්තරසසහස්සානි හොන්ති. නනු ච ඤාණවිප්පයුත්තචිත්තානං වීමංසාධිපතිසමායොගාභාවතො[4] අධිපතිවසෙන සහස්සං සාසීතිකානි ඡසතානි හොන්ති; තානි කම්මාදීනං වසෙන සම්පිණ්ඩිතානි වීසංසතාධික-පණ්ණරසසහස්සානි භවන්තීති? සච්චමෙතං; සොතපතිතවසෙන පන තං අනාදියිත්වා අධිපතිගණනා ගහිතාති න තස්ස වසෙන ගණනහානි කතාති වෙදිතබ්බං.

නනු ච "සවිපාකං කුසලං"ති වුත්තං; තම්පන කථං කුහිං කිං ඵලතීති චොදනං සන්ධායාහ **තම්පනෙතං**ති ආදිං. යස්මා තිහෙතුකං කුසලං තිහෙතුකං දුහෙතුකං වා පටිසන්ධිං දෙති, නාහෙතුකං, යදා ච තිහෙතුකං පටිසන්ධිං ජනෙති, තදා පවත්තෙ සොළසවිපාකානි අභිනිප්ඵාදෙති. යදා ද්විහෙතුකං, තදා ද්වාදස.

1. මරම්මපොත්ථකෙ නත්ථි. 2. M. ගණනා වෙදිතබ්බා. 3. M. සහයොගවසෙන. 4. M. සහයොගාභාවතො.

දුහෙතුකම්පන දුහෙතුකම්හෙතුකඤ්ච පටිසන්ධිං ජනෙති, න තිහෙතුකං; යදා ච දුහෙතුකං ජනෙති, තදා පවත්තියං ද්වාදස; යදා අහෙතුකං, තදා අට්ඨ. යෙ පන ආගමනතො විපාකස්ස සංඛාරභෙදං ඉච්ඡන්ති. තෙසං මතෙන තිහෙතුකං ද්වාදස, දස වා විපච්චති; දුහෙතුකං දස, අට්ඨ වා. තස්මා වුත්තං **යථානුරූපං**ති. නානාවිධසම්පත්තිවිධානභාවතො සොභනා, ගන්තබ්බතො ගති චාති **සුගති**. **කාමාවචරා** සුගති කාමාවචරසුගති. තස්සං **කාමාවචරසුගතියං**. **භවභොගසම්පත්තිං** ති එත්ථ භවතීති **භවො**. උපපත්තිභවසංඛාතානං විපාකක්ඛන්ධ - කටත්තාරූපානං එතං ගහණං. භුඤ්ජිතබ්බතො **භොගා** පවත්තියං පටිලභිතබ්බා සම්පත්ති. භවොති වා පටිසන්ධි. භොගොති තස්ස[1] විපාක-කටත්තාරූපෙහි සහ පවත්තියං පටිලභිතබ්බා සම්පත්ති භවො ච භොගො චාති භවභොගා. තෙ යෙව සම්පන්නභාවතො සම්පත්ති තෙසං තෙසං වා සම්පත්ති භවභොගසම්පත්ති තං **අභිනිප්ඵාදෙති** ජනකවසෙන ච උපනිස්සයවසෙන ච සාධෙතීති අත්ථො. එත්ථ ච භව - භොගසම්පත්තීනං නිරවසෙසතො ලබ්භමානට්ඨානං සන්ධාය **කාමාවචරසුගතියං** ති වුත්තං. සහෙතුකවිපාකවජ්ජං පන පවත්තිවිපාක - කටත්තාරූපසභාවං භවසම්පත්තිං, එකච්චං භොගසම්පත්තිං ච, භොගසම්පදමෙව වා අවිසෙසෙන සුගතියං දුග්ගතියම්පි අභිනිප්ඵාදෙති යෙව. නාගසුපණ්ණාදීනම්පි හි යං දෙවසම්පත්තිසදිසං මනුඤ්ඤං භොගජාතං තබ්බිසයානි ච විපාක-චිත්තානි, සුවණ්ණතා - සුස්සරතාදි ච තං සබ්බං කාමාවචර-කුසලස්සෙව ඵලං. න හි අකුසලස්ස ඉට්ඨඵලමත්ථි, වුත්තං හෙතං: “අට්ඨානමෙතං අනවකාසො යං අකුසලස්ස කම්මස්ස ඉට්ඨො කන්තො විපාකො සංවිජ්ජතී”ති.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර සංවණ්ණනාය කාමාවචරකුසලවණ්ණනා නිට්ඨිතා.**

---

ඉදානි යස්මා කාමාවචරකුසලානන්තරං උද්දිට්ඨස්ස රූපාවචර-කුසලස්ස නිද්දෙසාවකාසො අනුප්පත්තො, තස්මා තං දස්සෙතුං (4.) **ඉතරෙසු පනාති** ආදි ආරද්ධං. තත්ථ **ඉතරෙසූ** ති යථා වුත්ත-කාමාවචරකුසලතො ඉතරෙසු රූපාවචරාදිකුසලෙසූ ති[2] අත්ථො. **සවත්ථුකතො එකවිධං** එකන්තෙන වත්ථුසන්නිස්සිතත්තා. න හි අරූපධාතුයං රූපාවචරධම්මා ලබ්භන්ති, රූපවිරාගභාවනාය නිබ්බත්තානං තත්ථ රූපාවචරජ්ඣානසමාපත්තියා අභාවතො. **හීන-මජ්ඣිම-පණීතභෙදතො** ති එත්ථ පුබ්බෙ විය අධිපතීනං

1. M. සෙස 2 M. රූපාවචරාදිසූති.

හීනාදිභාවෙහි ඣානස්ස හීනාදිභාවො'ති යොජෙතබ්බො. අථ වා පටිලද්ධමත්තං අනාසෙවිතං හීනං, පරිදුබ්බලභාවතො; නාති-සුභාවිතං අපරිපුණ්ණවසීභාවං මජ්ඣිමං; අතිවිය සුභාවිතම්පන සබ්බසො පරිපුණ්ණවසීභාවං පණීතං. තථා උළාරපුඤ්ඤඵල-කාමතාවසෙන පවත්තිතං හීනං; ලොකියාභිඤ්ඤත්ථාය පවත්තිතං මජ්ඣිමං; විවෙකකාමතාය අරියභාවෙ ඨිතෙන පවත්තිතං පණීතං. අත්තහිතාය වා පවත්තිතං හීනං; කෙවලං අලොභජ්ඣාසයෙන පවත්තිතං මජ්ඣිමං; පරහිතාය පවත්තිතං පණීතං. වට්ටජ්ඣාසයෙන වා පවත්තිතං හීනං; විවෙකජ්ඣාසයෙන පවත්තිතං මජ්ඣිමං; විවට්ටජ්ඣාසයෙන ලොකුත්තරපාදකත්ථං පවත්තිතං පණීතං. **පටිපදාදිභෙදතො** ති දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤාදීනං පටිපදාභිඤ්ඤානං භෙදෙන. පටිපදාවචනෙන වා තදවිනාභාවතො අභිඤ්ඤාපි ලබ්භති. තථා හෙත්ථ පටිපදාචතුක්කන්ති වොහරන්ති ති ආදිසද්දෙන අධිපතිආදීනං සංගහො දට්ඨබ්බො. තස්මා **පටිපදාදිභෙදතො** ති, පටිපදාභෙදතො අධිපතිභෙදතො ආරම්මණභෙදතො, හානභාගියාදිභෙදතොති අත්ථො. තත්ථ පටිපදා-භෙදතො තාව: දුක්ඛා - පටිපදං දන්ධාභිඤ්ඤං. දුක්ඛා - පටිපදං ඛිප්පාභිඤ්ඤං; සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං, සුඛා-පටිපදං ඛිප්පා-භිඤ්ඤන්ති එවං චතුබ්බිධං. තත්ථ දුක්ඛා පටිපදා අස්සාති දුක්ඛාපටිපදං. දන්ධා අභිඤ්ඤා අස්සාති දන්ධාභිඤ්ඤං. එස නයො දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤන්ති ආදිසු තත්ථ අප්පහීන-නීවරණස්ස අවික්ඛම්භිත - ඣානනිකන්තිකස්ස ච ඤාණකිච්චස්ස අපරිබ්‍යත්ත-තාය(?) පරිනිට්ඨිත-සකලපුබ්බකිච්චස්ස "පථවී පථවී"ති වා "ආපො ආපො"ති වා එවං පවත්ත - පඨමසමන්නාහාරතො පට්ඨාය යාව තස්ස තස්ස ඣානස්ස උපචාරුප්පත්තියා නීවරණප්පහානං නිකන්තිවික්ඛම්භනඤ්ච හොති, තාව පවත්තා පුබ්බභාගභාවනා පටිපදා නාම, පටිපජ්ජති ඣානං එතායාති කත්වා. පහීන-නීවරණස්ස පන වික්ඛම්භිත-ඣානනිකන්තිකස්ස ච ඤාණකිච්චස්ස පරිබ්‍යත්ත-භාවතො උපචාරජ්ඣානං ආදිං කත්වා යාව අප්පනාය උප්පත්ති තාව පවත්තා පඤ්ඤා පුබ්බභාගපඤ්ඤාය විසිට්ඨභාවතො අභිඤ්ඤා නාම. තස්මා යො ආදිතො කිලෙස - ඣානනිකන්තී ච වික්ඛම්භෙන්තො දුක්ඛෙන සසංඛාරෙන සප්පයොගෙන කිලමන්තො වික්ඛම්භෙති, වික්ඛම්භිත - කිලෙසජ්ඣානනිකන්තී ච අප්පනාපරි-වාසං වසන්තො චිරෙන අඞ්ගපාතුභාවං පාපුණාති, තස්ස දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ච ඣානං හොති. යො පන සසංඛාරෙන කිලෙසාදිකෙ වික්ඛම්භෙත්වා න චිරෙන අංගපාතුභාවං පාපුණාති, තස්ස දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං ච. යො කිලෙසාදිකෙ වික්ඛම්භෙන්තො සුඛෙන අකිලමන්තො වික්ඛම්භෙති, අප්පනා-

පරිවෙසෙ පන චිරායති, තස්ස සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං. යො පන සුඛෙනෙව කිලෙසාදිකෙ වික්ඛම්භෙත්වා සීඝමෙව අප්පනං පාපුණාති, තස්ස සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤන්ති වෙදිතබ්බං. සො පනායං පටිපදාභිඤ්ඤානං භෙදො කිලෙසින්ද්‍රියාදි - ආකාරවසෙන වෙදිතබ්බො. යස්ස හි රාගාදයො කිලෙසා තිබ්බා හොන්ති, සද්ධාපඤ්චමකානි ච ඉන්ද්‍රියානි මුදූනි, සො වා සමථවිපස්සනාසු අකතාධිකාරො, තස්ස පවත්තජ්ඣානං දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ච හොති. තස්ස හි කිලෙසසමුදාචාරතිබ්බතාය නීවරණවික්ඛම්භනස්ස කිච්ඡෙන කසිරෙන සම්පජ්ජනතො පටිපදා දුක්ඛා අසුඛා යෙව සද්ධාදීනං ඉන්ද්‍රියානං මුදුතාය අභිඤ්ඤාපි දන්ධා මන්දා අසීඝප්පවත්තිනී හොති. භවන්තරෙ වා සමථෙ අකතාධිකාරතා පටිපදා දුක්ඛා; විපස්සනාය අකතාධිකාරතා අභිඤ්ඤා පි දන්ධා. යො පන වුත්තවිපරීතො හොති, තස්ස කිලෙසානං අතිබ්බසමුදාචාරතාය ඉන්ද්‍රියානඤ්ච තික්ඛතා, සමථවිපස්සනාසු වා කතාධිකාරතාය යථාක්කමං සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ච හොති. භවන්තරෙ කතපරිචයස්ස හි යථා පගුණං කත්වා විස්සට්ඨගන්ථො අප්පමත්තකෙන පයොගෙන සුප්පවත්තී වාචුග්ගතො ච හොති, එවං භාවනා අප්පකසිරෙනෙව ඉජ්ඣතීති ස්වායං. අකතො[2] කතො[2] ච අධිකාරො සමථනිස්සිතො පටිපදාය වුත්තො, සමාධිපධානත්තා පටිපදාය; විපස්සනානිස්සිතො අභිඤ්ඤාය, ඤාණප්පධානත්තා අප්පනායාති දට්ඨබ්බං. යො පන තිබ්බකිලෙසො තික්ඛින්ද්‍රියො විපස්සනායමෙව වා කතාධිකාරො හොති, තස්ස වුත්තනයෙන දුක්ඛා පටිපදා ඛිප්පා පන අභිඤ්ඤා හොති. තබ්බිපරීතස්ස සුඛා පටිපදා දන්ධාභිඤ්ඤාති. තස්මා කිලෙසානං තිබ්බමන්දභාවතො ඉන්ද්‍රියානං තික්ඛමුදුභාවතො පුබ්බපරිචයස්ස ච සම්භවාසම්භවවසෙනාති එවං කිලෙසින්ද්‍රියාධිකාරවසෙන ඉමාසං භෙදො වෙදිතබ්බො.

අපි ච යානි පරතො අසප්පාය - සප්පායානි[3] පලිබොධුපච්ඡෙදාදීනි පුබ්බකිච්චානි අප්පනාකොසල්ලානි ච ආගමිස්සන්ති, තෙසු යො උපචාරාධිගමතො පුබ්බෙ පච්ඡාච අසප්පායසෙවී හොති, තස්ස දුක්ඛා පටිපදා දන්ධා ච අභිඤ්ඤා හොති. උභයත්ථ සප්පායසෙවිනො සුඛා පටිපදා ඛිප්පා ච අභිඤ්ඤා. යො පන තතො පුබ්බභාගෙ අසප්පායං සෙවිත්වා අපරභාගෙ සප්පායසෙවී හොති, තස්ස දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා; තබ්බිපරීතස්ස සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා ච වෙදිතබ්බා. තථා පලිබොධුපච්ඡෙදාදි - පුබ්බකිච්චං අසම්පාදෙත්වා භාවනමනුයුඤ්ජන්තස්ස සපරිපන්ථතාය[4] දුක්ඛා පටි

2. M. අකතාකතො. 3 M. සප්පායාසප්පායානි. 4. M සපරිබන්ධතාය

පදා, [illegible] අප්පරිපන්ථතාය සුඛා; අප්පඤ්ඤාකොසල්ලාති අසම්පාදෙන්තස්ස ඤාණස්ස අවිසදතාය දන්ධාභිඤ්ඤා හොති; සම්පාදෙන්තස්ස විපරියතො ඛිප්පාභිඤ්ඤාති. කිඤ්ච, තණ්හාවිජ්ජාභිභවනවසෙන ච එතෙසං භෙදො වෙදිතබ්බො. තණ්හාභිභූතස්ස හි දුක්ඛා පටිපදා හොති; තස්සා සමාධිස්ස උජුපටිපක්ඛත්තා සමථපටිපදාය පරිපන්ථකරභාවතො, අනභිභූතස්ස තදභාවතො සුඛා. අවිජ්ජාභිභූතස්ස ච තස්ස පඤ්ඤාය උජුපටිපක්ඛභාවතො දන්ධාභිඤ්ඤා; ඉතරස්ස ඛිප්පාභිඤ්ඤාති සො පනායං පටිපදාභෙදො කෙවලං සමථභාවනාවසෙන පටිලද්ධඣානස්ස; මග්ගාධිගමවසෙන පටිලද්ධස්ස පන නත්ථි දුක්ඛාපටිපදාදිභෙදො. කෙචි පන මග්ගවසෙනෙව තස්ස පටිපදාදිභෙදං වණ්ණෙන්ති. මග්ගස්ස හි දුක්ඛාපටිපදාදිභාවෙ තස්මිං දුක්ඛාපටිපදාදිකන්ති. අධිපතිභෙදාදීසු පන ඡන්දාධිපතෙය්‍යං චිත්තාධිපතෙය්‍යං විරියාධිපතෙය්‍යං වීමංසාධිපතෙය්‍යන්ති එවං අධිපතිභෙදතො; පරිත්තං පරිත්තාරම්මණං, පරිත්තං අප්පමාණාරම්මණං, අප්පමාණං පරිත්තාරම්මණං, අප්පමාණං අප්පමාණාරම්මණන්ති එවං ආරම්මණභෙදතො; හානභාගියං ඨිතිභාගියං විසෙසභාගියං නිබ්බෙධභාගියන්ති එවං හානභාගියාදිභෙදතො ච චතුබ්බිධතා වෙදිතබ්බා. තත්ථ "ඡන්දවතො වෙ ඣානං නිබ්බත්තිස්සති මය්හම්පි නිබ්බත්තිස්සතී"ති එවං ඡන්දං ධුරං කත්වා උප්පන්නං ඡන්දාධිපතෙය්‍යං. එස නයො චිත්තාධිපතෙය්‍යාදීසු. අප්පගුණම්පන උපරි ඣානස්ස පච්චයො භවිතුං අසක්කොන්තං පරිත්තං. සුප්ප-සරාවමත්තෙසු අවඩ්ඪිතාරම්මණෙසු නිබ්බත්තං පරිත්තාරම්මණං. වුත්තපටිපක්ඛතො පන යථාක්කමං අප්පමාණාරම්මණාදීති වෙදිතබ්බානි. හානභාගියාදිවිසෙසං සයමෙව වක්ඛති.

**ඣානඞ්ගයොගභෙදතො** ති කත්ථචි පඤ්ච ඣානඞ්ගානි; කත්ථචි චත්තාරි; කත්ථචි තීණි; කත්ථචි ද්වෙ. කත්ථචි අපරානි ද්වෙති එවං ඣානඞ්ගානං සම්පයොගභෙදතො, නනු චෙත්ථ කාමාවචරකුසලෙ විය සඞ්ඛාරභෙදො කස්මා න ගහිතොති? ඉදම්පි හි කෙවලසමථානුයොගවසෙන පටිලද්ධං සසඞ්ඛාරං; මග්ගාධිගමවසෙන පටිලද්ධමසඞ්ඛාරං; තස්මා ඣානඞ්ගසඞ්ඛාරයොගභෙදතො දසවිධන්තිපි වත්තබ්බන්ති? නයිදමෙවං; මග්ගාධිගමවසෙන ඤත්තිතො පටිලද්ධස්සාපි අපරභාගෙ පරිකම්මවසෙනෙව උප්පජ්ජනතො. තස්මා සබ්බස්සපි ඣානස්ස පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරෙන විනා කෙවලං අධිකාරවසෙන අනුප්පජ්ජනතො අසඞ්ඛාරිකන්ති පි වත්තුං න සක්කා අධිකාරෙන ච විනා කෙවලං පරිකම්මාභිසඞ්ඛාරෙනෙව අනුප්පජ්ජනතො සසඞ්ඛාරිකන්ති පි වත්තුං න

සක්කාති ඣානඞ්ගයොගභෙදතො පඤ්චවිධතාව ඉධ වුත්තාති. කාමච්ඡන්දො ව්‍යාපාදො ථිනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡාති ඉමානි පඤ්චනීවරණානි විප්පහීනානි එතස්සාති **කාමච්ඡන්ද - ව්‍යාපාද = පෙ = විප්පහීනං** "අග්‍යාහිතො" ති එත්ථ ආහිතසද්දස්ස විය විප්පහීනසද්දස්සත්ථ පරවචනං දට්ඨබ්බං කාමච්ඡන්දාදීහි වා විප්පහීනං විසංයුත්තං තෙසං පහායකභාවෙනාති **කාමච්ඡන්දාදි = පෙ = විප්පහීනං** තත්ථ කාමෙතීති කාමො, ඡන්දනට්ඨෙන ඡන්දො වාති කාමච්ඡන්දො; බහලකාමරාගස්සෙතං අධිවචනං ව්‍යාපාදාදීනම්පෙත්ථං වක්ඛති. යස්මා කාමච්ඡන්දාදිසු අප්පහීනෙසු ඣානං නුප්පජ්ජති, තස්මා තානස්ස පහාණඞ්ගානීති වෙදිතබ්බානි. තත්‍ර අඤ්ඤෙපි අකුසලා ධම්මා ඉමිනා ඣානෙන පහීයන්ති, අථ කස්මා පඤ්චෙව පහානඞ්ගවසෙන වුත්තානීති? විසෙසෙන ඣානන්තරායකරත්තා. කාමච්ඡන්දවසෙන හි නානාවිසයපලොභිතං චිත්තං න එකත්තාරම්මණෙ සමාධියති; කාමච්ඡන්දාභිභූතං වා නානාවිසයසමූපබ්‍රූල්හාය කාමධාතුයා පහාණපටිපදං[1] න පටිපජ්ජති; ව්‍යාපාදෙනව ආරම්මණෙ පටිහඤ්ඤමානං න සමාහිතං පවත්තති; ථිනමිද්ධාභිභූතං අකම්මඤ්ඤං හොති; උද්ධච්චකුක්කුච්චපරෙතං අවූපසන්තමෙව හුත්වා පරිබ්භමති; විචිකිච්ඡාඋපහතං ඣානාධිගමපටිපදං න රූහති "සම්මාසම්බුද්ධො නු ඛො? න නු ඛො? පඃවී පඃවීති ආදිනා පවත්ත මනසිකාරෙන ඣානං සියා නු ඛො? න නු ඛොති ආදිනා විචිකිච්ඡන්තස්ස ඣානාධිගමපටිපදාය අසිජ්ඣනතො. යතො වක්ඛති:

"භාගී අස්සමහං අද්ධා ඉමාය පටිපත්තියා
පවිවෙකසුඛස්සාති කත්වා උස්සාහමුත්තමං"ති.

තස්මා සමාධිආදීනං උජුවිපච්චනීකභාවෙන විසෙසෙන ඣානාධිගමස්ස අන්තරායකරණතො එතානෙව පහාණඞ්ගානීති වුත්තානි. හොති චෙත්ථ:

පච්චනීකා යතො පඤ්ච සමාධාදීනමෙත්ථ හි
ඣානන්තරායකා, තස්මා පහාණඞ්ගෙ නියාමිතා ති.

එවං පහාණඞ්ගවසෙන ඣානං දස්සෙත්වා ඉදානි සම්පයොගංගවසෙන දස්සෙතුං **විතක්ක** =පෙ= **සම්පයුත්තං** ති වුත්තං. තත්ථ විතක්කාදයො වචනත්ථ - ලක්ඛණාදිවසෙන උපරි ආගමිස්සන්ති. යස්මා පන ඉමෙසු උප්පන්නෙසු ඣානං උප්පන්නං නාම හොති, තෙන'ස්ස ඉමානි සම්පයොගඞ්ගානීති වෙදි-

1. M. පහානාය පටිපදං

තබ්බාති. තස්මා න එතෙහි සමන්නාගතං අඤ්ඤදෙව ඣානං නාම අත්ථීති ගහෙතබ්බං. යථා පන නානානෙමිආදි-අංගසමුදයෙ[1] රථාදිවොහාරො හොති, එවං ඣානඞ්ගසමුදයෙ ඣානවොහාරො. වුත්තම්පි හෙතං විභඞ්ගෙ: "ඣානං ති විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතා"ති. කස්මා පන අඤ්ඤෙසු පි ඵස්සාදිසු සම්පයුත්තධම්මෙසු විජ්ජමානෙසු ඉමෙ යෙව පඤ්ච ඣානඞ්ගවසෙන වුත්තානීති? වුච්චතෙ: උපනිජ්ඣානකිච්චවන්තතාය, කාමච්ඡන්දාදීනං උජුපටිපක්ඛභාවතො ච. විතක්කො හි ආරම්මණෙ චිත්තං අභිනිරොපෙති, විචාරො අනුබන්ධති,[2] එවං ඣානාධිගමස්ස විසෙසපච්චයභූතෙහි තෙහි අවික්ඛෙපාය සම්පාදිතපයොගස්ස[3] චෙතසො පයොගසම්පත්තිසමුට්ඨානා පීති පීණනං සුඛං ච උපබ්‍රූහනං කරොති; අථ නං සසම්පයුත්තධම්මං එතෙහි අභිනිරොපනානුබන්ධන - පීණන - උපබ්‍රූහනෙහි අනුග්ගහිතා එකග්ගතා සමාධානකිච්චෙන අත්තානං අනුවත්තාපෙන්තී එකත්තාරම්මණෙ සමං සම්මා ච ආධියති,[4] ඉන්ද්‍රියසමතාවසෙන සමං පටිපක්ඛධම්මානං දූරීභාවෙන ලීනුද්ධච්චාභාවෙන සම්මා ච ඨපෙති ති එවමෙතෙසමෙව උපනිජ්ඣානකිච්චං ආවෙණිකං. කාමච්ඡන්දාදි - පටිපක්ඛභාවම්පන[5] සයමෙව වක්ඛති. එවං උපනිජ්ඣානකිච්චවන්තතාය බලවභාවතො ච කාමච්ඡන්දාදීනං උජුපටිපක්ඛභාවතො ච ඉමෙ යෙව පඤ්ච ඣානඞ්ගවසෙන වවත්ථිතානී ති. යථා'හු:

"උපනිජ්ඣානකිච්චත්තා කාමාදිපටිපක්ඛතො
සන්තෙස්වපි ච අඤ්ඤෙසු පඤ්චෙව ඣානසඤ්ඤිතා"ති.

දෙසනාක්කමතො, මහග්ගතධම්මෙසු පඨමං අධිගන්තබ්බතො ච **පඨමං**; පඨමං සමාපජ්ජිතබ්බං ති පි පඨමන්ති වදන්ති. තම්පන න එකන්තලක්ඛණං, ඣානානං[6] පටිලොමාදිවසෙන සමාපජ්ජනෙ අසම්භවතො පුරිම - පච්ඡිමචිත්තෙසු උප්පජ්ජමානස්සපි අප්පණාක්ඛණෙ අනුප්පජ්ජනතො විතක්කො විප්පහීනො එතස්ස, තතො වා එතං විප්පහීනං ති **විතක්කවිප්පහීනං**. භාවනාය හි පරිහීණත්තා විතක්කො ඣානක්ඛණෙ නුප්පජ්ජති, අසංකිලිට්ඨසභාවත්තා පන උපචාරභාවතාය ච තං පහාතුං අසමත්ථභාවතො පුරිමභාගෙ පච්ඡාභාගෙ ච අපච්චනීක - චිත්තප්පවත්තිතො උප්පජ්ජති යෙවාති. නනු ච "අසංකිලිට්ඨ - සභාවත්තා"ති වුත්තං; අථ කථං ඣානෙන එස පහීයති? න හි කුසලෙහි අසංකිලිට්ඨධම්මස්ස පජහනං[7] අත්ථි; රාගාදීනං

1. M. මරම්මපොත්ථකෙ නානාති නත්ථි. 2. M. අනුමජ්ජති (විභාවිනීටීකා) අනුප්පබන්ධති. 3. M. සමාදහිතප්පයොගස්ස. 4. B. අප්පීයති 5. M. භාවෙන පන. 6. M. ඣාන. 7. M. පහානං

සංකිලිට්ඨානං පාපධම්මානමෙව තස්ස උජුපටිපක්ඛභාවතො ති? වුච්චතෙ: අසංකිලිට්ඨසභාවස්සාපි එතස්ස ඔළාරිකතාය දුබ්බල භාවතො ඣානක්ඛණෙ අනුප්පත්තිසභාවාපාදනත්ථං තත්ථ නිකන්තිවික්ඛම්භනවසෙන දුතියජ්ඣානභාවනා හොතීති තස්සා බලෙන තං ඣානක්ඛණෙ අනුප්පජ්ජන්තං නිකන්තිවික්ඛම්භන වසෙන වා වික්ඛම්භිතං පහීනං නාම හොති. යදි එවං උපචාරෙනපි නිකන්ති වික්ඛම්භියතීති තත්ථාපි’ස්ස පහානං සියා යථා පඨමජ්ඣානස්ස උපචාරෙ නීවරණානං ති?[1] න ඉදමෙවං. නීවරණප්පහානස්ස විය විතක්කාරම්මණික-නිකන්තිවික්ඛම්භනස්ස උපචාරෙන සාතිසයං අනිප්ඵජ්ජනතො. සාතිසයං හි තත්ථ නිකන්තිප්පහානං අප්පණාය එව හොති. තස්මා යදවොචුම්හ ‘‘උපචාරභාවනාය තං පහාතුං අසමත්ථභාවතො’’ති තං සුට්ඨු උපපරික්ඛිත්වා වුත්තන්ති දට්ඨබ්බං. **විචාරවිප්පහීනං** ති ආදිසු පි වුත්තනයානුසාරෙන අත්ථො දට්ඨබ්බො.

දුතියජ්ඣානෙ යෙව පහීනස්ස විතක්කස්ස ඉධ අප්පවත්ති මත්තදස්සනත්ථං **විතක්ක – විචාරවිප්පහීනං** ති විතක්කගහණං කතං. එවං **විතක්ක – විචාර – පීතිවිප්පහීනං** ති ආදිසුපි. (5) **යථාසම්භවං** ති පථවීකසිණාදිසු යං යං ආරම්මණං යස්ස යස්ස සම්භවති තදනතික්කමනතො. **කසිණාණාපාණෙසු** හි පඤ්ච ව ඣානානි පවත්තන්ති; අසුභ – කායගතාසතිසු පඨමජ්ඣානං; අනුපෙක්ඛ – බ්‍රහ්මවිහාරෙසු[2] පඤ්චමජ්ඣානවජ්ජානි; උපෙක්ඛා–බ්‍රහ්මවිහාරෙ පඤ්චමජ්ඣානං ති. **පථවීකසිණාදිසූති** එත්ථ ආදිග්ගහණෙන න කෙවලං ආපොකසිණාදීනං යෙව, අථ ඛො අසුභාදීනම්පි අප්පණාවහකම්මට්ඨානානං සංගහො දට්ඨබ්බොති. එත්ථ ච විමොක්ඛාභිභායතන – ඣානානි[3] පවත්තාකාරමත්තතො භින්නානි, ආරම්මණතො පන කසිණායතනානෙව හොන්තීති කසිණායතනජ්ඣානෙහෙව තානි සංගහිතානි. **යථාසම්භවං** = පෙ= **අනෙකවිධං** ති වා වචනෙන රූපාවචරජ්ඣානෙ සබ්බාපි ලබ්භමානකභෙදෙ සංගහිතොති අභිභායතනවිමොක්ඛජ්ඣානානි විසුං න වුත්තානි, තානි පන සරූපතො එවං වෙදිතබ්බානි:-

තත්ථ[4] විමොක්ඛොති පටිලද්ධජ්ඣානස්ස ඣානං සමාපජ්ජිතුකාමතාවසප්පවත්ත – ජවනවීථිසමනන්තරමෙව පිතු අංකෙ විස්සට්ඨ – අඞ්ගපච්චඞ්ගස්ස විය දාරකස්ස ආරම්මණෙ නිරාසඞ්කමෙව හුත්වා පඨමකප්පණා විය ච ලහුං අවුට්ඨහිත්වා අනන්තමසො වතු–

1. M. නිවරණානීති 2. M. අනුපෙක්ඛා බ්‍රහ්මවිහාරො 3 M. අභිභායතන විමොක්ඛඣානානි. 4. අයං විමොක්ඛවිත්ථාරො මරම්මපොත්ථකෙ අභිභායතනවිත්ථාරතො පච්ඡා ආගතො.

පසද්ධවිත්තකඛණතො අනොසක්කිත්වා අරම්මණෙ අභිරතිවසෙන පවත්තස්ස වසීභාවප්පත්තස්ස ඣානස්සෙතමධිවචනං. තං හි කසිණායතනවසෙන අභිභායතනවසෙන වා උප්පන්නංපච්චනීක-ධම්මෙහි සුට්ඨු විමුත්තත්තා ආරම්මණෙ අධිමුත්තත්තාය ච විමොක්ඛොති වුච්චති. වුත්තම්පි චෙතං අට්ඨකථායං: "කෙනට්ඨෙන විමොක්ඛා වෙදිතබ්බාති? අධිමුච්චනට්ඨෙන. කොයං අධිමුච්චනට්ඨො නාම? පච්චනීකධම්මෙහි සුට්ඨු විමුච්චනට්ඨො, ආරම්මණෙ ච අභිරතිවසෙන සුට්ඨු අධිමුච්චනට්ඨොති" යදි වසීභාවප්පත්තමෙව විමොක්ඛො කථමස්ස ආරම්මණචතුක්කෙ පරිත්තතා පාළියං වුත්තා; අවසිප්පත්තඤ්හි ඣානං පරිත්තන්ති වුච්චතීති? නායං දොසො පරිපුණ්ණවසීභාවප්පත්තං සන්ධාය අපරිපුණ්ණවසී-භාවප්පත්තස්ස පරිත්තභාවෙන තත්ථ අධිප්පෙතත්තා. තස්මා වසීභාවප්පත්තමෙව ඣානං විමොක්ඛො නාම න ඉතරං; ඉතරම්පන යදි කසිණායතනවසෙන උප්පන්නං කසිණායතනං, අථ අභිභායතනවසෙන අභිභායතනමෙවාති. කෙචි පන පඨමකප්පනාතො පච්ඡිමපච්ඡිමාය පටිපක්ඛතො සුට්ඨු විමුත්තත්තා කසිණායතනවසෙන ච අභිභායතනවසෙන ච උප්පන්නං පඨම-කප්පනං ඨපෙත්වා සෙසං විමොක්ඛො යෙවාති වදන්ති. තං පනෙතං ගණනතො තිවිධං හොති. යථාහ: "රූපී රූපානි පස්සති, අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, සුභන්තෙවාධිමුත්තො විහරතීති." තත්ථ **රූපී**ති අජ්ඣත්තං කෙසාදීසු උප්පාදිතං රූපජ්ඣානං රූපං; තදස්ස අත්ථීති රූපී. **රූපානි පස්සතීති** බහිද්ධාපි කසිණාදිරූපානි ඣානචක්ඛුනා පස්සති. ඉමිනා අජ්ඣත්ත - බහිද්ධාවත්ථුකෙසු කසිණෙසු ඣාන-පටිලාභො දස්සිතො. **අජ්ඣත්තං අරූපසඤ්ඤීති** අජ්ඣත්තං න රූපසඤ්ඤී, අත්තනො කෙසාදීසු අනුප්පාදිතරූපා-වචරජ්ඣානොති අත්ථො ඉමිනා බහිද්ධා පරිකම්මං කත්වා බහිද්ධාව පටිලද්ධජ්ඣානතා කථිතා. **සුභන්ති** ඉමිනා සුවිසුද්ධෙසු නීලාදීසු වණ්ණකසිණෙසු ඣානානි දස්සිතානි. තත්ථ කිඤ්චාපි අන්තොඅප්පනායං සුභන්ති ආභොගො නත්ථි. යො පන සුවිසුද්ධං සුභං කසිණං ආරම්මණං කත්වා විහරති, සො යස්මා සුභන්ති අධිමුච්චනවසෙන පඨමජ්ඣානං උපසම්පජ්ජිත්වා විහරති, තථා දුතියජ්ඣානාදීනි, තස්මා එවං දෙසනා කතාති.

**පටිසම්භිදාමග්ගෙ** පන "ඉධ භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරතී"ති ආදිනා බ්‍රහ්මවිහාරවසෙන සුභවිමොක්ඛො වුත්තො. **ධම්මසඞ්ගණියං** පන බ්‍රහ්මවිහාරානං විසුං යෙව ආගතත්තා තං නයං පටික්ඛිපිත්වා සුනීලකාදිවසෙන

සුභවිමොක්ඛො අට්ඨකථායං අනුඤ්ඤාතොති ඉධාපි තත්ථ-වුත්තනයෙනෙව වවත්ථානං කතන්ති; එවං තාව විමොක්ඛජ්ඣානං වෙදිතබ්බං.

**අභිභායතන**ම්පන ඤාණුත්තරස්ස යොගාවචරස්ස පඨවී-කසිණාදිආරම්මණං අභිභවිත්වා “කිමෙත්ථ[1] අප්පණානිබ්බත්තනෙ භාරො”ති පටිපන්නස්ස නිමිත්තුප්පත්තිතො උද්ධං දුතියතතියවීථියං චතුත්ථපඤ්චමවීථියං වා පටිලද්ධජ්ඣානං වුච්චති[2]. තං හි ආරම්මණං අභිභවතීති **අභිභූ.** යොගිනො සුඛවිසෙසානං අධිට්ඨානතාය, සමානායතන - ධම්මායතනපරියාපන්නතාය වා ආයතනන්ති **අභිභායතනං.** අභිභවිතබ්බං වා අභිභූ, ආලම්බණං; තං ආයතන-මස්සාති **අභිභායතනං.** අථ වා ආලම්බණාභිභවනතො ඤෙව අභිභූ, පරිකම්මං ඤාණං වා; තං ආයතනං කාරණමස්සාති **අභිභායතනං.** පරිකම්මං හි ඤාණං වා ආලම්බණං අභිභවිත්වා පවත්තමානං උපචාරුප්පත්තිතො පඤ්චම - වීථිමනතික්කමිත්වා අප්පණං නිබ්බත්තෙන්ති. පඤ්චමවීථිතො පරං නිබ්බත්තනම්පන අභිනවිතු-කාමතාය නිබ්බත්තිතම්පි අභිභායතනං නාම න හොති. සාමඤ්ඤ-ගතියා පන කසිණායතනමෙව හොති. ඉමමෙව හි සීඝතරුප්පත්තිං සන්ධාය අට්ඨකථායං “තානි රූපානි අභිභවිත්වා සමාපජ්ජති, සහ-නිමිත්තුප්පාදෙනෙවෙත්ථ අප්පණං නිබ්බත්තෙතී”ති වුත්තං. නනු ච අට්ඨකථායං යථාරුතවසෙනෙව අත්ථො කස්මා න ගය්හති? “සහ නිමිත්තුප්පාදෙනෙවා”ති හි වුත්තත්තා නිමිත්තප්පත්තියා සහුප්පන්නං ඣානමභිභායතනන්ති විඤ්ඤායතීති? නයිදමෙවං. නිමිත්තුප්පාදෙන සහ අප්පණාය අසම්භවතො. නිමිත්තුප්පාදොති හි ඉධ පටිභාගනිමිත්තස්ස උප්පත්ති, තදාරම්මණස්ස වා උපචාරජ්ඣා-නස්ස. තත්ථ[3] න තාව[3] පටිභාගනිමිත්තුප්පත්තියා සහ අප්පණාය නිබ්බත්ති, උපචාරජ්ඣානෙ අසති තස්සා අසම්භවතො නාපි උපචාරජ්ඣානෙන සහ එකවීථියං නිබ්බත්තනං, තස්සා උපචාර-භාවනාපබන්ධසෙවිතබ්බභාවෙන තදා අසම්භවතො. තස්මා තානි චිරායතප්පවත්තිදස්සනත්ථං සමීපමහි සමීපකාරියූපචාරෙන අට්ඨකථා-යං තථා වුත්තන්ති දට්ඨබ්බං. යදි නිමිත්තුප්පත්තිතො නාතිචිරප්ප-වත්තමභිභායතනං, කථං තස්ස දන්ධාභිඤ්ඤා ඛිප්පාභිඤ්ඤා භෙදෙ පාළියා වුත්තොනාති? වුච්චතෙ: චතුත්ථ - පඤ්චමජවනවීථියං උප්පන්නං චිරකාලනිබ්බත්තිතාය දන්ධාභිඤ්ඤං; දුතියතතියවීථියං උප්පන්නං තබ්බිපරීතලක්ඛණතාය ඛිප්පාභිඤ්ඤන්ති.

කෙචි පන අභිභායතනං නාම වසිතාප්පත්තමෙව, නෙතරන්ති වදන්ති. තං තෙසං මතිමත්තං. වසිතාප්පත්තියා නිමිත්තුප්පත්තිතො දූරතරභාවෙන. “සහ නිමිත්තුප්පාදෙනෙවෙත්ථ අප්පණං

1. M. ක මෙ'ත්ථ. 2. M. අභිභායතනං නාම. 3. M. කිං තාව.

නිබ්බත්තෙන්තී"ති අට්ඨකථාවචනෙන සහ විරුජ්ඣනතො. අපි ච, වසිතාප්පත්තජ්ඣානම්පි අභිභවනකාරණනිරපෙක්ඛං වසිතාබලෙනෙව සක්කච්චං සමාපජ්ජිතුං සක්කාති න තං අභිභායතනං නාම හොති තස්මා අප්පත්තවසීභාවා පඨමුප්පන්නා යෙව අප්පනා අභිභායතනන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං. යදි එවං, කථං "අප්පමාණං පරිත්තාරම්මණං අප්පමාණං අප්පමාණාරම්මණං"ති අභිභායතනදෙසනායං වුත්තං? වුත්තවසිතාප්පත්තං හි ඣානං අප්පමාණන්ති වුච්චති; ඉදඤ්ච උප්පන්නමත්තත්තා පරිත්තමෙවාති? නායං දොසො. පඨමං අභිභායතනවසෙන පටිලද්ධං ඣානං පච්ඡා වසිතාප්පත්තම්පි අභිභායතනනාමමෙව ලභතීති. වසිතාප්පත්තමභිභායතනං අප්පමාණං, ඉතරං පරිත්තං. අථ වා වසිතාප්පත්තමප්පමාණන්ති උක්කංසගතිපරිග්ගහවසෙන වුච්චති; තං පන යං බලවතරං තං අප්පමාණන්ති ඉමස්ස අත්ථස්ස උපලක්ඛණං කත්වා වදන්ති. බලවභාවනිබන්ධනං අප්පමාණත්තං; බලවභාවො ච පඨමඅප්පනාවාරතො පච්ඡිම – පච්ඡිම – අප්පනාවාරානං බලවතාය අවසිප්පත්තෙපි[1] ඣානෙ සම්භවතීති බලවන්තං අප්පමාණං, ඉතරං පරිත්තන්ති එවං අවසිප්පත්තෙපි ඣානෙ අප්පමාණාදිභාවො වෙදිතබ්බො. අථවා අප්පමාණාය බලවභාවො නාම උපචාරස්ස බලවතාය සති හොති. උපචාරං ච තං බලවං යං සහසා අප්පනං උප්පාදෙතුං සක්කුණෙය්‍ය. තස්මා ඛිප්පාභිඤ්ඤතං චිත්තං අභිභායතනජ්ඣානානං උපචාරවීථියා අනන්තරං දුතියවීථියං උප්පන්නං උපචාරජ්ඣානස්ස බලවතාය සයම්පි බලවන්තන්ති[2] අප්පමාණං නාම හොති දුතියවීථිං අතික්කමිත්වා තතියවීථියං උප්පන්නං තදිතරසභාවතාය පරිත්තං, තථා දන්ධාභිඤ්ඤතං චතුත්ථවීථියං උප්පන්නං අප්පමාණං, පඤ්චමවීථියං උප්පන්නං පරිත්තන්ති අථවා යත්ථ කත්ථචි අප්පනාවීථියං පඨමං උප්පජ්ජන්තං අප්පනාතො චතුත්ථං උප්පජ්ජමානාය බලවභාවොති තංවසෙන පෙ'ත්ථ පරිත්ත-අප්පමාණතා වෙදිතබ්බා. තං පනෙතං ගණනතො අට්ඨවිධං හොති යථාහ අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි; තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ – දුබ්බණ්ණානි =පෙ= අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි =පෙ= අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ – දුබ්බණ්ණානි; තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති, =පෙ= නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති, =පෙ= පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි =පෙ=

1. M. අවසිතාප්පත්තෙපි. 2. M. බලවතරන්ති.

ලොහිතානි ලොහිතවණ්ණානි ලොහිතනිදස්සනානි ලොහිතනිභාසානි =පෙ= ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි; තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති”ති.

තත්‍ථ “අජ්ඣත්තං අරූපසඤ්ඤී”ති අලාභිතාය අනත්‍ථිකතාය වා අජ්ඣත්තිකෙසු කෙසාදීසු පරිකම්ම - අප්පණාසඤ්ඤාවිරහිතො. “බහිද්ධා රූපානි පස්සතී”ති බහිද්ධා අට්ඨසු කසිණෙසු චතූසු භූතකසිණෙසු එව වා කතපරිකම්මතාය පරිකම්මවසෙන චෙව අප්පණාවසෙන ච තානි බහිද්ධා අට්ඨ චත්තාරි වා කසිණරූපානි පස්සති. “පරිත්තානී”ති අමහන්තානි “අභිභුය්‍යා”ති යථා මහග්ඝසො සම්පන්නගහණිකො පුරිසො කටච්ඡුමත්තං භත්තං ලභිත්‍වා “කිං එත්‍ථ භුඤ්ජිතබ්බං අත්‍ථී”ති සංකඩ්ඪිත්‍වා සබ්බං එකකබළමෙව කරොති, එවමෙවං ඤාණුත්තරිකො පුග්ගලො විසදඤාණො “කිං එත්‍ථ පරිත්තකෙ ආරම්මණෙ සමාපජ්ජිතබ්බං අත්‍ථි? නායං මම භාරො”ති තානි රූපානි පරිකම්මෙන ඤාණෙන වා අභිභවිත්‍වා සමාපජ්ජති හෙට්ඨා වුත්තනයෙන ඛිප්පං[1] අප්පණං නිබ්බත්තෙතීති. “ජානාමි පස්සාමී”ති ඉමිනා’ස්ස පුබ්බාභොගො කථිතො. තදාගමනතො ච අන්තොසමාපත්තියං චිත්තාභිසංඛාරො. ඉතරථා අනෙන ආභොගමත්තෙන කථිතෙ තෙන සාධිතබ්බං ඣානං අවුත්තං හොති. අභිභායතනදෙසනා චායං ඣානවිසයානි. ආගමට්ඨකථාසු පන “සමාධිතො වුට්ඨිතස්ස පුබ්බභාගභාවනාවසෙන ඣානක්ඛණෙ පවත්තාභිභවනාකාරං ගහෙත්‍වා පවත්තමාභොගං සන්ධාය ඉමිනාස්ස ආභොගො කථිතො. සො ච ඛො සමාපත්තිතො වුට්ඨිතස්ස, න අන්තොසමාපත්තියං” ති වුත්තං. දුතියෙ “සුවණ්ණදුබ්බණ්ණානී”ති පරිසුද්ධාපරිසුද්ධවණ්ණානි; පරිසුද්ධානි හි නීලාදීනි සුවණ්ණානි, අපරිසුද්ධානි දුබ්බණ්ණානී ති ඉධ අධිප්පෙතානි. තතියෙ “අප්පමාණානී”ති වුඩ්ඪප්පමාණානි විපුලානි, ඛලමණ්ඩලාදීනි. වඩ්ඪනවසෙන පනෙත්‍ථ අප්පමාණතා න ගහිතා, කසිණවඩ්ඪනස්ස ඉධ අසම්භවතො. කසිණස්ස හි ද්වෙව වඩ්ඪනාභූමියො උපචාරභූමි අප්පණාභූමි වා. තත්‍ථ න තාව ඉධ උපචාරභූමියං වඩ්ඪනං සම්භවති, නිමිත්තුප්පත්තියා සමකාලං විය උප්පජ්ජමානෙ ඣානෙ කුතො තස්ස ඔකාසොති. නාපි අප්පණාභූමියං වඩ්ඪිතස්ස පච්චුප්පන්න - ඣානාරම්මණතා න යුජ්ජති. තස්මා සභාවමහන්තානෙව ආලම්බණානි ඉධ අප්පමාණානීති අධිප්පෙතානි. කෙචි පන වඩ්ඪිතවසෙනෙව අප්පමාණානීති ගහෙත්‍වා පඨමං අභිභවනිච්ඡාය අභාවෙන වඩ්ඪෙත්‍වා පච්ඡා අභිභවනිච්ඡාය සති අභිභවනාකාරෙන පවත්තෙන තස්මිං අප්පණං නිබ්බත්තෙතීති අප්පණං පටිලභිත්‍වා වඩ්ඪිතනිමිත්තෙසු ඉදං අභිභායතනං වුත්තං ති වදන්ති.

1. M. සීඝං.

චතුත්ථෙ "අභිභුය්‍යා"ති අභිභවිත්වා. යථා නාම සම්පන්නගහණිකො මහග්ඝසො පුරිසො එකං භත්තවඩ්ඪිතකං ලභිත්වා "අඤ්ඤෙපි හොතු[1] කිං එස මය්හං කරිස්සතී"ති න තං මහන්තතො පස්සති. එවමෙව ඤාණුත්තරො විසදඤාණො පුග්ගලො "කිං එත්ථ සමාපජ්ජිතබ්බං? න ඉදං අප්පමාණං ති මය්හං චිත්තෙකග්ගකරණෙ භාරො"ති තානි[2] අභිභවිත්වා සමාපජ්ජති, වුත්තනයෙනෙව අප්පනං නිබ්බත්තෙතීති. පඤ්චමෙ "නීලානි =පෙ= නීලනිභාසානී"ති එතානි පරියායනාමානි. තත්ථ "නීලානී ති සබ්බසංගාහකවසෙන වුත්තං. එත්තකෙ යෙව පන වුත්තෙ තංයොගතො තබ්බොහාරෙන ගුණයුත්තෙනාපි පසංගො සියාති තං නිවාරණත්ථං "නීලවණ්ණානී"ති වණ්ණවසෙන වුත්තං. එවම්පිහි බහුබ්බීහිවසෙන ගුණිනොපි සංගහො හොතීති නීලනිදස්සනානී"ති නිදස්සනවසෙන වුත්තං. නිදස්සිතබ්බං හි නිදස්සනං; චක්ඛුනා දට්ඨබ්බසරූපං[3]. තතො සෙතාදිනිවාරණත්ථං නීලසද්දෙන සහ සමාසො කතොති. අපඤ්ඤායමානවිවරානි අසම්භින්නවණ්ණානි එකනීලානෙව හුත්වා දිස්සමානානී ති වුත්තං හොති. "නීලනිභාසානී"ති ඉදම්පන ඔභාසවසෙන වුත්තං. නීලොභාසානී ති නීලපභායුත්තානී ති අත්ථො. එතෙන තෙසං සුවිසුද්ධතං දස්සෙති. පීතානී ති ආදි-සුපි ඉමිනා නයෙන අත්ථො වෙදිතබ්බො. අට්ඨසුපි චෙතෙසු පුරිමං අභිභවනාකාරෙන වණ්ණාභොගරහිතානි අට්ඨපි කසිණානි පරිත්තානි ආරම්මණං කත්වා උප්පන්නං සන්ධාය වුත්තං. තතියං (තථා) තථා අප්පමාණානි. දුතිය – චතුත්ථානි තානි යෙව ද්වෙ වණ්ණාභොගසහිතානි ආරබ්භ උප්පන්නං; න පන වණ්ණකසිණ-වසෙන උප්පන්නං, තස්ස විසුං වක්ඛමානත්තා. පඤ්චමාදීනි පන තෙසු කතාධිකාරෙ සන්ධාය විසුද්ධවණ්ණවසෙනෙව දෙසිතානි. න හි තෙසං අභිභවනස්ස පරිත්තතා අප්පමාණතා වා කාරණං. අථ ඛො සුවිසුද්ධනීලාදිභාවො, තත්ථ හි තෙ කතාධිකාරාති.

නනු ච ආගමට්ඨකථාසු සුවණ්ණානි වා හොන්තු දුබ්බණ්ණානි වා පරිත්ත – අප්පමාණවසෙනෙව ඉමානි අභිභායතනානි දෙසිතානීති වුත්තං ති? සච්චමෙතං. තං පන ආගමෙ අභිභායතනානං අඤ්ඤථා ආගතත්තා. තත්ථ හි "අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ – දුබ්බණ්ණානි, අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති එවං චත්තාරි යෙව අභිභායතනානි දස්සිතානි[4]. තස්මා තදට්ඨකථාසු වණ්ණාභොගෙ

1. M අඤ්ඤෙපි හොතු, අඤ්ඤෙපි හොතු. 2. M. මරම්මපොත්ථකෙ නත්ථි.
3. M. දට්ඨබ්බං රූපං. 4. M. ආගතානි.

විජ්ජමානෙපි අවිජ්ජමානෙපි පරිත්ත - අප්පමාණතාවසෙනෙව ඉමෙසං දෙසිතභාවො වුත්තො. පරිත්තඅප්පමාණතා හි ඉමෙසු චතූසු අභිභවනස්ස කාරණං වණ්ණාභොගෙ විජ්ජමානෙපි අවිජ්ජමානෙපීති. නනු ච සබ්බත්ථ “සුවණ්ණ - දුබ්බණ්ණානී”ති වචනතො වණ්ණාභොගසහිතානි යෙව තත්ථ ගහිතානීති? තං න. වණ්ණාභොගරහිතානි සහිතානි ච සබ්බානි පරිත්තානි එකතො කත්වා “පරිත්තානි සුවණ්ණ - දුබ්බණ්ණානී”ති වුත්තානි, තථා “අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී”ති. යදි එවං කථං විසිට්ඨානං වණ්ණාභොගරහිතානං සහිතානං ච එකජ්ඣං මනසිකාරො? න එකජ්ඣං; විසුං යෙව තෙසං මනසිකාරො. යදි[1] විසුං, කථමෙකත්තන්ති? පරිත්තභාවසාමඤ්ඤතො. යදි එවං සුවණ්ණදුබ්බණ්ණගහණමතිරිච්චතීති,,?[2] නාතිරිච්චති, පරියායදෙසනාභාවතො. අත්ථි හි එස පරියායො යදිදං වණ්ණාභොගජනිතං[3] විසෙසං අගහෙත්වා පරිත්තසාමඤ්ඤෙන එකත්තං නෙත්වා “පරිත්තානි අභිභුය්‍යා”ති වත්වා පුන තදන්තොගධමෙව පභෙදං විනෙය්‍යවසෙන දස්සෙතුං තානි කදාචි වණ්ණවසෙන ආවජ්ජිතානි හොන්ති. “සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍යා”ති වත්තබ්බතාය වණ්ණාභොග-රහිතානි සහිතානි ච විසුං මනසිකත්වා උභයත්ථාපි වණ්ණාභොග-රහිත - පරිත්තාභිභවනෙ තංසහිතපරිත්තාභිභවනෙ ච පරිත්තා-භිභවනස්ස සාමඤ්ඤං ගහෙත්වා එකත්තං කතන්ති. අභිධම්මෙ පන නිප්පරියායදෙසනත්තා වණ්ණාභොගරහිතානි සහිතානි ච විසුං වුත්තානි. අත්ථි හි උභයත්ථ අභිභවනවිසෙසොති. හොතු තාව, එවං සුත්තාභිධම්මපාඨවිසෙසතො අට්ඨකථාය පාඨභෙදෙ පන[4] කො අධිප්පායොති? වුච්චතෙ: සුත්තන්තෙ හි පඨමවිමොක්ඛං ද්වෙධා භින්දිත්වා පඨම - දුතියඅභිභායතනානි වුත්තානි. [පරියාය-දෙසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායො විජ්ජතීති අජ්ඣත්තං රූපසඤ්ඤී”ති අභිභායතනද්වයං වුත්තං[5] ] තතිය-චතුත්ථ අභිභායතනෙසු දුතියවිමොක්ඛො, වණ්ණාභිභායතනෙසු - තතිය-විමොක්ඛො ච අභිභවනප්පවත්තිතො සංගහිතො. [සුත්තන්තෙ හි පරියායදෙසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායො විජ්ජතීති “අජ්ඣත්තං රූපසඤ්ඤී”ති පඨමවිමොක්ඛං පරිත්ත-අප්පමාණව සෙන ද්වෙධා භින්දිත්වා පඨම-දුතියඅභිභායතනානි වුත්තානි. තථා දුතියවිමොක්ඛං ද්වෙධා භින්දිත්වා තතිය-චතුත්ථානි. තතියං චතුධා භින්දිත්වා පඤ්චමාදීනීති. අභිධම්මෙ][6] පන නිප්පරියාය-දෙසනත්තා විමොක්ඛාභිභායතනානි අසංකරතො දස්සෙතුං විමො

1. M. යදි එවං. 2. M. මතිරිච්චති අවසිට්ඨානි. 3. M. ජනිතාජනිතං. 4. M. අපි ච ඛො පන සුත්තාභිධම්මපාඨභෙදෙන. 5. B. එතෙ පාඨා සීහළ පොත්ථකෙ නසන්ති. 6. එත්ත පාඨා මරම්ම පොත්ථකෙ නසන්ති.

විමොක්ඛෙ වජ්ජෙත්වා අභිභායතනානි කථිතානි. සබ්බානි විමොක්ඛකිච්චානි විමොක්ඛදෙසනායං වුත්තානි. තදෙතං "අජ්ඣත්තං අරූපසඤ්ඤී?"ති සුත්තෙ ආගතස්ස අභිභායතනද්වයස්ස අභිධම්මෙ අවචනතො, "රූපී රූපානි පස්සතී"ති ආදීනං ච සබ්බ-විමොක්ඛකිච්චසාධාරණවචනභාවතො වවත්ථානං කතන්ති විඤ්ඤායති. අවස්සං චෙතං එවං සම්පටිච්ඡිතබ්බං. න සම්පටිච්ඡන්තෙහි වා සුත්තාභිධම්ම-පාඨභෙදෙ අඤ්ඤං කාරණං වත්තබ්බං අථ කිමෙත්ථ වත්තබ්බං? නනු අට්ඨකථායමෙව කස්මා පන යථා සුත්ත-න්තෙ "අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානී"ති ආදි වුත්තං; එවං අවත්වා ඉධ චතූසුපි අභිභායතනෙසු අජ්ඣත්තං අරූපසඤ්ඤිතාව වුත්තාති වත්වා අජ්ඣත්තරූපානං අනභිභවනීයතොති කාරණං වුත්තන්ති? න තං තස්ස කාරණවචනං. අථ ඛො කත්ථචි "අජ්ඣත්තං රූපානි පස්සතී" ති අවත්වා සබ්බත්ථ යං වුත්තං "බහිද්ධා රූපානි පස්සතී"ති, තස්ස කාරණවචනං. තෙනෙව හි තං[2]සමත්ථෙ[3] බහිද්ධාරූපානි යෙව අභිභවි-තබ්බානීති තත්ථෙව වුත්තං. අනභිභවනීයතා ච අජ්ඣත්තරූපා-නං බහිද්ධාරූපානි විය අවිභූතත්තා.[3] න හි දිට්ඨි විභූතමන්තරෙන ඤාණුත්තරානං ආරම්මණාභිභවනං සම්භවතී ති.

නනු ච අට්ඨකථායං පාඨද්වයවිසෙසස්ස දෙසනාවිලාසො කාරණභාවෙන වුත්තොති? සච්චං, වුත්තො. සොපි යථාවුත්ත වවත්ථානවසෙනෙව වෙදිතබ්බො. දෙසනාවිලාසො හි නාම විනෙය්‍යජ්ඣාසයානුරූපං විජ්ජමානස්ස පරියායස්ස විභාවනං; න යස්ස කස්සචීති. එවං තාව අභිභායතනං වෙදිතබ්බං.

(5). **යථානුරූපං** ති හීනාදිඅනුරූපං පඨමජ්ඣානං හි හීනං කප්පස්ස තතියභාගායුකෙ බ්‍රහ්මපාරිසජ්ජෙ උප්පත්තිං නිප්ඵාදෙති. මජ්ඣිමං උපඩ්ඪකප්පායුකෙ බ්‍රහ්මපුරොහිතෙ; පණීතං එකකප්පායුකෙ මහාබ්‍රහ්මෙ. තථා දුතියජ්ඣානං තතියජ්ඣානං ච හීනං ද්විකප්පායුකෙ පරිත්තාභෙ, මජ්ඣිමං චතුකප්පායුකෙ අප්පමාණාභෙ, පණීතං අට්ඨකප්පායුකෙ ආභස්සරෙ, චතුත්ථජ්ඣානං හීනං සොළසකප්පායුකෙ පරිත්තසුභෙ, මජ්ඣිමං ද්වත්තිංසකප්පායුකෙ අප්පමාණසුභෙ, පණීතං චතුසට්ඨිකප්පායුකෙ සුභකිණ්ණෙ. පඤ්චමජ්ඣානම්පන තිවිධම්පි පඤ්චකප්පසතායුකෙ වෙහප්ඵලෙ උප්පත්තිං නිප්ඵාදෙති. තදෙව තිත්ථියෙහි සඤ්ඤාවිරාගවසෙන භාවිතං පඤ්චකප්පසතායුකෙ යෙව අසඤ්ඤසත්තෙ, අනාගාමීහි පන පුථුජ්ජනාදිකාලෙ පට්ඨාපි භාවිතං සද්ධාදිඉන්ද්‍රියාධිමත්තතා-නුක්කමෙන යථාක්කමං සහස්ස – ද්විසහස්ස – චතුසහස්ස – අට්ඨ

2. M. තත්ථ වා ඉධ වා.    2. B. අභිභූතත්තා.

සහස්ස - සොළසසහස්සායුකෙසු අවිහ - අතප්ප - සුදස්ස - සුදස්සී - අකනිට්ඨනාමකෙසු පඤ්චසු සුද්ධාවාසෙසු උප්පත්තිං නිප්ඵාදෙතීති එවමෙතං යථානුරූපං සොළසරූපාවචර - බ්‍රහ්මලොකූපපත්ති - නිප්ඵාදකත්තා ආහ: "යථානුරූපං රූපාවචරූපපත්ති-නිප්ඵාදකං හොතී"ති. යස්මා පන එත්ථ ච දුතියජ්ඣානභූමිං උපාදාය සබ්බත්ථ පරිපුණ්ණස්ස මහාකප්පස්ස වසෙන පරිච්ඡෙදො දට්ඨබ්බො, පඨමජ්ඣානභූමියම්පන අසංඛෙය්‍යකප්පවසෙන; න හි තත්ථ ඉතරවසෙන පරිච්ඡෙදො සම්භවති, එකකප්පෙපි තස්ස අවිනාසාභාවෙන පරිපුණ්ණකප්පෙ[2] අසම්භවතො[2] යස්මා පන රූපභවෙපි පවත්තියං ලභිතබ්බා උපභොගසම්පත්ති කාමාවචර කුසලස්සෙව ඵලං, තස්මා ඉධ භවභොගසම්පත්තිං නිප්ඵාදෙතීති අවත්වා උප්පත්තිනිප්ඵාදනමෙව වුත්තන්ති දට්ඨබ්බං.[3]

## රූපාවචරකුසලවණ්ණනා නිට්ඨිතා.

ඉදානි අරූපාවචරකුසලස්ස අවසරො[4] අනුප්පත්තොති තත්‍රෙකදෙස - දස්සනත්ථමාහ:[5] **ඉතරෙසු පනා**ති ආදි ආකාස කසිණ වජ්ජිතස්ස යස්ස කස්සචි කසිණස්ස උග්ඝාටිතතො නිබ්බත්ත-මාකාසං **කසිණුග්ඝාටිමාකාසං. තත්ථ පවත්තවිඤ්ඤාණ**න්ති ආකාසානඤ්චායතනමාහ. තං හි දුතියාරූපස්ස ආරම්මණං හොති **සබ්බසො** ති සබ්බාකාරෙන; රූපනිමිත්තං දණ්ඩාදාන-සම්භවදස්සනාදිනා සබ්බෙසු රූපධම්මෙසු පථවීකසිණාදිරූප-නිමිත්තෙසු තදාරම්මණජ්ඣානෙසු ච සබ්බෙසු[6] දොසදස්සනා-කාරෙන, තෙසු එව වා රූපධම්මාදිසු[7] නිකන්තිප්පහාණ - අසමාපජ්ජිතුකාමතාදිනා ආකාරෙනා ති අත්ථො. අථ වා **සබ්බසො** ති සබ්බාසං කුසලාදිවසෙන[8] අනවසෙසානං ති අත්ථො. **රූපසඤ්ඤාන**ං ති සඤ්ඤාසීසෙන වුත්තරූපාවචරජ්ඣානානං චෙව තදාරම්මණානං ච. රූපාවචරජ්ඣානම්පි හි රූපන්ති වුච්චති උත්තරපදලොපෙන; "රූපූපපත්තියා මග්ගං භාවෙති[9]," "රූපී රූපානි පස්සතී" ති ආදිසු විය. තදාරම්මණම්පි කසිණරූපං පුරිමපදලොපෙන; දෙවදත්තො[10] දත්තො ති, "බහිද්ධා රූපානි පස්සතී"ති ආදිසු විය. තස්මා ඉධ රූපෙ රූපජ්ඣානෙ තං සහගතසඤ්ඤා රූපසඤ්ඤාති ගහිතා. සඤ්ඤාසීසෙන වුත්තරූපා-වචරජ්ඣානසෙසතං[11] අධිවචනං. රූපනාති සඤ්ඤා අස්සාති රූප

2. M මහාකප්පස්ස චතුත්ථභාගෙ යෙව තස්ස සම්භවතො, 3 අයං පාඨො මරම්මපොත්ථකෙ අඤ්ඤඨානෙ සන්දිස්සති 4. M. නිද්දෙසාවකාසො 5. M තන්නිද්දෙසත්ථමාහ. 6. මරම්මපොත්ථකෙ නත්ථි. 7. M රූපනිමිත්තෙසු. 8 B කිලෙසාදිභෙදෙ. 9. අයං පාඨො මරම්මපොත්ථකෙ නත්ථි. 10 M. දෙවෙවත: 11. M. ඣානානමෙතං.

සඤ්ඤං. රූපනාමවිතානං ති අත්ථො. තං ගහිතෙන පඨවීකසිණාදි භෙදස්ස තදාරම්මණස්ස චෙතං අධිවචනං ති[1] දට්ඨබ්බං. රූපසඤ්ඤානං ති හි සරූපෙකසෙසවසෙන නිද්දෙසො කතො.

**සමතික්කමා** ති විරාගා නිරොධා ච. කිං වුත්තං හොති? එතාසං කුසල-විපාක-ක්‍රියාවසෙන පඤ්චදසන්නං ඣාන-සංඛාතානං රූපසඤ්ඤානං, එතෙසඤ්ච පඨවීකසිණාදිවසෙන නවන්නං ආරම්මණසංඛාතානං. රූපසඤ්ඤානං අනවසෙසානං, සබ්බාකාරෙන ච, තෙසු එව වා නිකන්තිප්පහාණ-අසම්පජ්ජිතුකාමිතාදිනා ආකාරෙන විරාගා නිරොධා ච ජිගුච්ඡනතො චෙව, තප්පටිබද්ධ ඡන්දරාග-වික්ඛම්භනතො ච නිබ්බත්තං **ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං** අරූපාවචරකුසලචිත්තං. න හි සක්කා සබ්බසො අනතික්කන්ත-රූපසඤ්ඤෙන තං නිබ්බත්තෙතුං ති.

න කෙවලං එතාසං යෙව සමතික්කමතො ඉදං නිබ්බත්තං, අථ ඛො පටිඝසඤ්ඤාදීනං අත්ථඞ්ගමාදිතොපීති ආහ: **පටිඝ-සඤ්ඤානං** ති ආදිං. තත්ථ චක්ඛාදීනං ච වත්ථූනං රූපාදීනං ච ආරම්මණානං පටිඝාතෙන, අඤ්ඤමඤ්ඤසමොධාන-සංඛාතෙන පටිඝට්ටනෙන උප්පන්නා-සඤ්ඤා පටිඝසඤ්ඤා. රූපසඤ්ඤාදි-පඤ්ච සඤ්ඤානමෙතමධිවචනං.[2] යථාහ: තත්ථ කතමා පටිඝසඤ්ඤා? රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා. ඉමා වුච්චන්ති පටිඝසඤ්ඤායො" ති. තාසං කුසලාකුසලවිපාකභූතානං **අත්ථඞ්ගමා** පහානා අසමුප්පාද අප්පවත්තිකරණතාති වුත්තං හොති. නනු ච එතා රූපාවචරජ්ඣානසමාපන්නස්සාපි න සන්ති, න හි පඨමජ්ඣානාදිං සමාපන්නකාලෙ පඤ්චද්වාරවසෙන චිත්තං පවත්තතීති? සච්චමෙතං. යථා පන "සුඛස්ස ච පහාණා, දුක්ඛස්ස ච පහාණා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරතී" ති එත්ථ පසංසාවසෙන අඤ්ඤත්ථ පහීනානම්පි සුඛදුක්ඛානං චතුත්ථජ්ඣානෙ; "සක්කායදිට්ඨි-විචිකිච්ඡානං පහානා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිමග්ගං උපසම්පජ්ජ විහරතී" ති එත්ථ පඨමමග්ගෙ යෙව පහීනානං සක්කායදිට්ඨාදීනං දුතියමග්ගෙ ච වචනං, එවමෙවං ඉමස්මිං ඣානෙ පටිපජ්ජනකානං උස්සාහජනනත්ථං ඉමස්ස ඣානස්ස පසංසාවසෙන එතාසං එත්ථ වචනං ති වෙදිතබ්බං. අථ වා කිඤ්චාපි තා රූපාවචරසමාපන්නස්සාපි න සන්ති, න පන පහීනත්තා න සන්ති, කිඤ්චරහි පච්චයාභාවෙන. න හි රූපාවචරභාවනා රූපවිරාගාය සංවත්තති, රූපායත්තාව තාසං පවත්ති.

1. M. තාමංති. 2. M. විපඤ්චවිඤ්ඤාණාන.

ආරුප්පභාවනා පන රූපවිරාගාය සංවත්තති; තස්මා තා එත්ථ පහිතා ති වත්තුං වට්ටති.[1] තථා හි එතාසං ඉතො පුබ්බෙ අප්පහීනත්තා යෙව "පඨමජ්ඣානං සමාපන්නස්ස සද්දො කණ්ටකො"ති වුත්තො භගවතා. ඉධ ච පහීනත්තා එව අරූපසමාපත්තීනං ආනෙඤ්ජාභිසංඛාරවචනාදීහි "යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා"ති ආදිනා ච ආනෙඤ්ජතා සන්තවිමොක්ඛතා ච වුත්තා.

**නානත්තසඤ්ඤානං** ති නානත්තගොචරෙ පවත්තානං නානත්තානං වා සඤ්ඤානං, වුත්තාවසෙසානං චතුචත්තාළීසකාමාවචරසඤ්ඤානං ති අත්ථො. එතා එව හි "තත්ථ කතමා නානත්තසඤ්ඤා? අසමාපන්නස්ස මනොධාතුසමඞ්ගිස්ස වා මනොවිඤ්ඤාණධාතුසමඞ්ගිස්ස වා (සහ) යා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, ඉමා වුච්චන්ති නානත්තසඤ්ඤායො"ති එවං **විභඞ්ගෙ** විභජිත්වා වුත්තා. තා පන යස්මා රූප - සද්දාදිභෙදෙ නානත්තෙ නානාසභාවෙ ආරම්මණෙ පවත්තන්ති, යස්මා ච අට්ඨකාමාවචරකුසලසඤ්ඤා, ද්වාදස අකුසලසඤ්ඤා, එකාදස කාමාවචර-කුසලවිපාකසඤ්ඤා, ද්වෙ අකුසලවිපාකසඤ්ඤා, එකාදස කාමාවචරක්‍රියාසඤ්ඤාති එවං චතුචත්තාළීසප්පභෙදා, නානාසභාවා, අඤ්ඤමඤ්ඤං අසදිසා, තස්මා නානත්තසඤ්ඤාති වුච්චන්ති. **අමනසි-කාරා** ති සබ්බසො අනාවජ්ජනා අසමන්නාහාරා අපච්චවෙක්ඛනහෙතු, ජවනපටිපාදකෙන වා භවඞ්ගචිත්තස්ස අනෙනා අකරණා ඨපෙත්වා කසිණුග්ඝාටිමාකාසං නානාරම්මණෙ චිත්තස්ස අසඤ්චාරණතොති[2] වුත්තං හොති. ඉමිනා හි නානත්තසඤ්ඤාමනසිකාරහෙතුනං රූපධම්මානං සමතික්කමොපි වුත්තො. රූපජ්ඣානෙ පන තදභාවතො "නානත්තසඤ්ඤානං අමනසිකාරා" ති න වුත්තං.

අථ සමතික්කමිතාදීනං කිං නානාකරණන්ති? වුච්චතෙ: යස්මා රූපසඤ්ඤා පටිඝසඤ්ඤා ච ඉමිනා ඣානෙන නිබ්බත්තිත භවෙපි න විජ්ජන්ති, ආරුප්පසඤ්ඤාය අභාවෙ[3] චුතිතො උද්ධං උප්පත්තාරභානං රූපසඤ්ඤා - පටිඝසඤ්ඤානං යාව අත්තනො විපාකුප්පත්ති, තාව අනුප්පත්තිධම්මතං ආපාදියමානත්තා, පගෙව පන ඉමං ඣානං සමාපන්නකාලෙ; තස්මා සමතික්කමා අත්ථ-ගමාති උභයථාපි තාසං අභාවො යෙව දස්සිතො. නානත්තසඤ්ඤාසු පන යා තස්මිං භවෙ න උප්පජ්ජන්ති, එකන්තං රූපනිස්සිතත්තා, තා අනොකාසතාය න උප්පජ්ජන්ති, න අරූප

1. B. චතුත්ථං වදති. 2. M. අසංචරණතොති. 3. M. භාවනාය අභාවෙ.

භාවනාය නිවාරිතත්තා. අනිවාරිතත්තා ච කාචි උප්පජ්ජන්ති. තස්මා තාසං අමනසිකාරො අනාවජ්ජනං අපච්චවෙක්ඛනං, ජවනපටිපාදකෙන වා භවඞ්ගමනස්ස අනන්තරා අකරණං අප්පවෙසනං වුත්තං. තත්‍ර පවත්තමානානම්පි හි ඣානං සමාපන්නස්ස තාසං අමනසිකාරො යෙව. ඉතරථා ඣානසමාපත්තියා අභාවතො. ඉති සංඛෙපතො **රූපසඤ්ඤානං සමතික්කමා** ති ඉමිනා සබ්බරූපාවචරධම්මානං පහානං වුත්තං. **පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා** ති සබ්බෙසං කාමාවචරචිත්තචෙතසිකානං ධම්මානං[3] පහානං අමනසිකාරො ච වුත්තො. තීහිපි පනෙතෙහි සමාධිස්ස පරිභාවො කථිතොති.

**ආකාසානඤ්චායතන - සඤ්ඤාසහගතං** ති එත්ථ පන නාස්ස අන්තොති අනන්තං; අනන්තං ආකාසං ආකාසානන්තං. කසිණුග්ඝාටිමාකාසං. අනන්තතා පනස්ස උප්පාදවයන්තාභාවතො අනන්තමනසිකාරවසෙන වා වෙදිතබ්බා. න හි එතස්ස උප්පාදන්තො වයන්තො වා පඤ්ඤායති, අසභාවධම්මත්තා. සභාවධම්මො හි අහුත්වා සම්භවතො හුත්වා ච විනස්සනතො උදයබ්බයන්තපරිච්ඡින්නො, නෙතරො. න ච පනෙතං මනසිකරොන්තො යොගාවචරො තස්ස පරිච්ඡෙදසංඛාතමන්තං ගණ්හාති අථඛො රූපවිවෙකමත්තස්ස ගහණෙන අනන්තඵරණාකාරෙනෙව මනසිකාරං පවත්තෙති. තස්මා උප්පාදවයන්තවිරහතො, අනන්තතො[1] මනසිකාරවසෙන වා එතමනන්තන්ති වෙදිතබ්බං. අනන්තාකාසං ති ච වත්තබ්බෙ අනන්තසද්දස්ස පරනිපාතවසෙන ආකාසානන්තන්ති වුච්චති. ආකාසානන්තමෙව ආකාසානඤ්චං, සංයොගපරස්ස තකාරස්ස චකාරං කත්වා. තදෙව ආයතනං සම්පයුත්තධම්මස්ස ඣානස්ස ආරම්මණභාවතො අධිට්ඨානට්ඨෙන, දෙවානං දෙවායතනං වියාති **ආකාසානඤ්චායතනං.** තස්මිං අප්පනාප්පත්තා සඤ්ඤා ආකාසානඤ්චායතනසඤ්ඤා. තාය සහගතං විඤ්ඤාණං ආකාසානඤ්චායතනසහගතං, අථ වා ආකාසානඤ්චං ආයතනමස්සා සසම්පයුත්තධම්මාය සඤ්ඤායාති ආකාසානඤ්චායතනා; සා යෙව සඤ්ඤා; තාය ච ඣානං සහගතං ති ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං.

**විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාසහගතං** ති යදෙතං පඨමාරුප්පවිඤ්ඤාණං තං සභාවධම්මත්තා උප්පාදාදිඅන්තවන්තම්පි ආරම්මණකරණවසෙන අනන්තාකාසෙ ඵරණතො, අන්තානං ආරබ්භ අනන්තස්ස අගහණවසෙන පවත්තමනසිකාරතො වා අනන්තං විඤ්ඤාණං ති විඤ්ඤාණානන්තං. විඤ්ඤාණානන්තං ති වත්තබ්බෙ

3. මරම්ම පොත්ථකෙ නත්ථි. 1. මරම්මපොත්ථකෙ නත්ථි.

විඤ්ඤාණඤ්චසද්දෙ තදත්ථෙ නිපාතො,[2] ආකාර - නකාරලොපානි වා කත්වා විඤ්ඤාණඤ්චමිච්චෙව වුත්තං, එවඤ්ච කත්වා වක්ඛති:

“විඤ්ඤාණානන්තමිච්චෙවං වත්තබ්බං පනිදං සියා” ති

ආරුප්පවිඤ්ඤාණෙන අඤ්චිතබ්බං ආරම්මණකරණවසෙන පාපුණිතබ්බං ති විඤ්ඤාණඤ්චං. සෙසං පුරිමසදිසමෙව.

**ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං** ති නාස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස කිඤ්චනං ති අකිඤ්චනං; අන්තමසො භඞ්ගමත්තම්පි අවසිට්ඨං නත්ථීති වුත්තං හොති. සති හි භඞ්ගමත්තෙපි තස්ස සකිඤ්චනතා සියා. අකිඤ්චනස්ස භාවො ආකිඤ්චඤ්ඤං ආකාසානඤ්චායතන - විඤ්ඤාණාභාවස්සෙතං අධිවචනං. සෙසං වුත්තනයමෙව. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං** ති හෙට්ඨිමජ්ඣානෙසු විය ඔළාරිකාය සඤ්ඤාය අභාවතො නෙවස්ස සඤ්ඤා අත්ථීති **නෙවසඤ්ඤං.** සුඛුමාය ච සඤ්ඤාය අත්ථිතාය නාස්ස සඤ්ඤා නත්ථීති **නාසඤ්ඤං.** නෙවසඤ්ඤං ච තං නාසඤ්ඤං චාති නෙවසඤ්ඤානාසඤ්ඤං; චතුත්ථාරුප්පජ්ඣානං. යදි එවං නෙවසඤ්ඤ-නාසඤ්ඤං ති වත්තබ්බං. සච්චමෙතං. වචනසොභනත්ථං පනදීඝං කත්වා වුත්තං. අථ වා නෙවස්ස සඤ්ඤා නාසඤ්ඤාති එකජ්ඣං බහුබ්බීහිසමාසවසෙන නෙවසඤ්ඤානාසඤ්ඤං ති වුත්තං. නෙවසඤ්ඤානාසඤ්ඤං ච තං ආයතනං ච මනායතන - ධම්මායතනපරියාපන්නත්තාති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං තෙන සම්පයුත්තසඤ්ඤාය සහගතං නෙවසඤ්ඤානාසඤ්ඤායතන - සඤ්ඤාසහගතං. අථ වා සඤ්ඤා යෙව පටුසඤ්ඤාකිච්චකරණෙ අසමත්ථතාය නෙවසඤ්ඤා, උණ්හොදකෙ තෙජොධාතු විය සංඛාරාවසෙස - සුඛුමභාවප්පත්තියා නාසඤ්ඤාති නෙවසඤ්ඤානාසඤ්ඤා. සෙස ධම්මානං නිස්සයපච්චයතාය අධිට්ඨානට්ඨෙන, ධම්මායතනපරියාපන්නතාය එව වා ආයතනඤ්චාති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනභූතාය සඤ්ඤාය සහගතං ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං.

**යථානුරූපං අරූපුපපත්තිනිප්ඵාදකා** ති පඨමාරුප්පභූමියා පඨමං, දුතියාරුප්පභූමියං දුතියං ති ආදිනා අත්තනො අනුරූපවසෙන චතූසු අරූපභූමීසු උප්පත්තිසාධකං. තාසු පන පඨමා වීසතිකප්පසහස්සායුකා හොති; දුතියා චත්තාළීසසහස්සකප්පායුකා තතියා සට්ඨිසහස්සකප්පායුකා, චතුත්ථා පන චතුරාසීතිසහස්සකප්පායුකාති වෙදිතබ්බා

**අරූපාවචරකුසලවණ්ණනා නිට්ඨිතා.**

---

2. M නිරුළ්හො.

එවං තිවිධම්පි ලොකියකුසලං නිද්දිසිත්වා ඉදානි ලොකුත්තරං නිද්දිසන්තො ආහ: **ඉතරම්පනාති** ආදි. ලුජ්ජනපලුජ්ජනට්ඨෙන ලොකො සො තිවිධො: සංඛාරලොකො, සත්තලොකො, භාජනලොකොති. තතො ඉදං උත්තරතීති ලොකුත්තරං, චත්තාරොපි හි මග්ගා උපාදානක්ඛන්ධසංඛාත - සංඛාරලොකතො උත්තරන්ති, අනාසවභාවෙන; සත්තලොකෙසු ච සොතාපත්තිමග්ගො අනරියලොකතො උත්තරති; සකදාගාමිමග්ගො සොතාපන්නලොකතො, අනාගාමිමග්ගො සකදාගාමිලොකතො, අරහත්තමග්ගො අනාගාමිලොකතො උත්තරති. භාජනලොකෙසු පන පඨමමග්ගො අපායලොකතො උත්තරති, සකදාගාමිමග්ගො කාමලොකෙකදෙසතො, අනාගාමිමග්ගො සකලකාමලොකතො, අරහත්තමග්ගො රූපාරූපලොකතො උත්තරති ඉති චතුබ්බිධම්පි මග්ගචිත්තං තිවිධ-ලොකතො උත්තරතීති ලොකුත්තරං. කුච්ඡිතානං සලනාදිතො පන කුසලං; චින්තනාදිතො චිත්තං චාති **ලොකුත්තරකුසලචිත්තං.** ඵලං පන ලොකතො උත්තිණ්ණත්තා ලොකුත්තරං. උභයම්පි වා සහ නිබ්බානෙන උපාදානක්ඛන්ධසංඛාත-ලොකතො උත්තරං විසිට්ඨතරං ති ලොකුත්තරං, යථාහ: "යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා =පෙ= විරාගො තෙසං අග්ගමක්ඛායතී"ති ආදි.

**නියතානියතවත්ථුකතො** ති සොතාපත්තිමග්ගස්ස පරතොඝොසපච්චයෙන විනා නුප්පජ්ජනතො අරූපභවෙ සම්භවො නත්ථීති තං නියතවත්ථුකං. ඉතරම්පන සත්තවිධම්පි පරතොඝොසං විනාපි විපස්සනාබලෙනෙව නිප්ඵජ්ජනතො තත්ථාපි සම්භවතීති අනියතවත්ථුකං.

**තිහි විමොක්ඛමුඛෙහි පත්තබ්බතො තිවිධං** ති ලොකුත්තරවිමොක්ඛානං ද්වාරභාවතො විමොක්ඛමුඛසංඛාතාහි සුඤ්ඤතානුපස්සනාදීහි වුට්ඨානගාමිනීවිපස්සනාහි පත්තබ්බතො ඉදං ලොකුත්තරකුසලං තිවිධං, සුඤ්ඤතං, අනිමිත්තං, අප්පණිහිතං ති කතමෙ පන ලොකුත්තරවිමොක්ඛාති? නව ලොකුත්තරධම්මා. යථාහ: "චත්තාරො ච මග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි නිබ්බානඤ්ච, අයං අනාසවො විමොක්ඛො"ති. ඉමානි හි සංකිලෙසධම්මෙහි සුට්ඨු විමුත්තත්තා විමොක්ඛා නාම. තානි පන පච්චෙකං සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛොති තිවිධානි. යථාහ: "තයො මෙ භික්ඛවෙ විමොක්ඛා: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො"ති. ඉධ පන කුසලාධිකාරත්තා චතුමග්ගසංඛාතා යෙව ලොකුත්තරධම්මා අධිප්පෙතා. සුඤ්ඤතාදිනාමලාභො ච

තෙසං ආගමනතො, සගුණතො, ආරම්මණතො ච වෙදිතබ්බා: තථාහි ආගච්ඡති මග්ගො ඵලං ච එතෙනාති ආගමනං. තං හි දුවිධං: මග්ගාගමනං ඵලාගමනං චාති. තෙසු වුට්ඨානගාමිනී-විපස්සනා මග්ගාගමනං; අරියමග්ගො ඵලාගමනං තත්ථ මග්ගස්ස ආගතට්ඨානෙ මග්ගාගමනං ගහෙතබ්බං; ඵලස්ස ආගතට්ඨානෙ ඵලාගමනං, ඉධ පන මග්ගස්ස ආගතත්තා මග්ගාගමනං ගහිතං ති,. තතො "ආගමනතො." "සගුණතො" ති සභාවතො. "ආරම්මණතො" ති ආරම්මණධම්මතො. යො හි සබ්බසංඛාරානං අනත්තලක්ඛණපටිවෙධවසප්පවත්තාය අනත්තානුපස්සනාය වසෙන මග්ගං පටිලභති, තස්ස සා අනුපස්සනා අසුඤ්ඤත්තකරානං අත්තාභිනිවෙසපච්චයානං දිට්ඨිකට්ඨකිලෙසානං වික්ඛම්භිතභාවෙන තෙභූමකධම්මානං අත්තසුඤ්ඤතාය යථාවතො ගහණතො සුඤ්ඤතානුපස්සනා නාම හොති. තාය පන පටිලද්ධමග්ගො සුඤ්ඤතාය ආගතත්තා සුඤ්ඤතො නාම. තෙනාහ: "අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතාවිමොක්ඛෙන විමුච්චතී"ති. යොපි සබ්බසංඛාරානං අනිච්චලක්ඛණපටිවෙධවසප්පවත්තාය අනිච්චානුපස්සනාය වසෙන[1] මග්ගං පටිලභති, තස්ස සා අනුපස්සනා නිච්චනිමිත්තාදිගාහකරානං කිලෙසානං වික්ඛම්භිතත්තා ධුවභාවොපට්ඨානසංඛාත - නිච්චනිමිත්තාදිතො අගහණතො අනිමිත්තානුපස්සනා නාම. තාය පන ලද්ධමග්ගො අනිමිත්තතාය[2] ආගතත්තා අනිමිත්තො නාම. තෙනාහ: "අනිමිත්තතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛෙන විමුච්චතී"ති. යො පන සබ්බසංඛාරානං දුක්ඛලක්ඛණපටිවෙධවසප්පවත්තාය දුක්ඛානුපස්සනාය වසෙන මග්ගං පටිලභති, තස්ස සා අනුපස්සනා තණ්හාපණිධානස්ස වික්ඛම්භනෙන පණිධිවිරහිතත්තා අප්පණිහිතානුපස්සනා නාම. තාය පන ලද්ධමග්ගො අප්පණිහිතාය ආගතත්තා අප්පණිහිතො නාම. තෙනාහ: "දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛෙන විමුච්චතීති. අයං තාවස්ස ආගමනවසෙන නාමලාභො.

අත්තනා[3] පන රාගාදීහි සුඤ්ඤත්තා[4] නිච්චනිමිත්තාදිවිරහිතත්තා තණ්හාපණිධිආදීනම්භාවතො[5] ච "සගුණතො" රාගාදිසුඤ්ඤස්සෙව නිච්චනිමිත්තාදිවිරහිතස්ස පණිධිවිප්පමුත්තස්ස ච නිබ්බානස්ස ආරම්මණකරණතො "ආරම්මණතො" ච සුඤ්ඤතාදි විමොක්ඛා නාම හොතීති එවමස්ස සගුණාරම්මණෙහි නාමලාභො දට්ඨබ්බො. සො ච ඛො සුත්තන්තපරියායෙන; නො අභිධම්මපරියායෙන. සුත්තන්තකථා හි පරියායදෙසනා, ඉතරා නිප්පරියාය-

1. මරම්මපොත්ථකෙ නත්ථි. 2. M අනිමිත්තාය, 3 M අත්තනො 4 M සුඤ්ඤතත්තා 5 M තණ්හාපණිධිඅභාවතො

දෙසනා. තස්මා සගුණාරම්මණතො නාමස්ස සබ්බසාධාරණභාවෙන වවත්ථානකරත්තා පරියායභාවතො සුත්තන්තපරියායෙනෙව නාමලාභො. ආගමනතො පන අභිධම්මපරියායෙන පි වවත්ථානකරභාවෙන නිප්පරියායත්තා තෙනෙව හි ආචරියෙන “තීහි විමොක්ඛමුඛෙහි පත්තබ්බතො තිවිධං”ති විමොක්ඛමුඛමෙව ධුරං කත්වා වුත්තං, න සුඤ්ඤතාදිනාමතො තිවිධං ති. අනිමිත්තනාමං පනෙත්ථ ආගමනතො පි සුත්තන්තපරියායෙන පි ලබ්භති. අභිධම්මෙ පන මග්ගං පති අනිමිත්තනාමස්ස අනුද්ධටත්තා. අනුද්ධටත්තං පන න අනුද්ධරිතබ්බතාමත්තෙන, අථ ඛො නිප්පරියායතො තස්ස මග්ගෙ අලබ්භනතො. කිඤ්චාපි හි අයං විපස්සනා නිච්චනිමිත්තං උග්ඝාටෙන්තී පවත්තති, සංඛාරනිමිත්තස්ස පන අනිස්සජනතො න නිප්පරියායතො අනිමිත්තනාමං ලභති. යං පනෙතං සුත්තෙන:

“අනිමිත්තං ච භාවෙහි; මානානුසයමුජ්ජහ;
තතො මානාභිසමයා උපසන්තො චරිස්සසී’ති

මග්ගස්ස අනිමිත්තභාවවචනං තම්පි යථාවුත්තපරියායවසෙන ලබ්භමානං ගහෙත්වා වුත්තං. අභිධම්මෙ පන යා සයම්පි නිප්පරියායතො අනිමිත්තනාමං න ලභති සා කථං මග්ගස්ස තං නාමං දදෙය්‍යාති මග්ගස්ස අනිමිත්තනාමං න උද්ධටං. යදි එවං සුඤ්ඤතානාමම්පි ඉදං සමානං; අනත්තානුපස්සනාපි කිඤ්චාපි පුග්ගලසුඤ්ඤතං ගණ්හාති, ධම්මසුඤ්ඤතං පන න ගණ්හාතීති සයං නිප්පරියායෙන සුඤ්ඤතානුපස්සනා නාම න හොතීති සුඤ්ඤතානාමම්පි මග්ගස්ස න දදෙය්‍ය; අථ පුග්ගලසුඤ්ඤතාගහණමත්තෙන සයං සුඤ්ඤතානුපස්සනා හුත්වා මග්ගස්ස තං දදෙය්‍ය; අනිච්චානුපස්සනාපි සංඛාරනිමිත්තස්ස ගහණෙපි නිච්චනිමිත්තාදිඋග්ඝාටනතො. සයං අනිමිත්තානුපස්සනා හුත්වා මග්ගස්ස අනිමිත්ත නාමං දදෙය්‍යාති. න ඉදමෙවං; නිච්චාදිනිමිත්තුග්ඝාටනෙන අනිමිත්තභාවස්ස නිප්පරියායෙන අමග්ගෙ අලබ්භනතො නිච්චාදි-නිමිත්තුග්ඝාටනම්පි[1] පරියායතොව[2] නනු ඉදම්පි සබ්බත්ථ සමානං, සුඤ්ඤත - අප්පණිහිතභාවොපි හි නිප්පරියායෙන අමග්ගෙ න ලබ්භති, පුග්ගලසුඤ්ඤතාගහණස්ස පණිධිසොසනස්ස ච උජුකං මග්ගෙනෙව නිප්ඵජ්ජනතො. තස්මා සුඤ්ඤතානුපස්සනාපි අප්පණිහිතානුපස්සනාපි පරියායෙනෙව තං තං නාමං ලභන්තීති මග්ගස්ස නිප්පරියායතො නාමං න දෙන්තීති. න; තතො ලද්ධඅරියමග්ගස්ස නිප්පරියායතො සම්පයුත්ත - ධම්මවසෙනෙව සුඤ්ඤත - අප්පණිහිතනාමසම්භවතො කථං? ඨපෙත්වා බුද්ධුප්පාදං සරභඞ්ගසත්ථාරාදි

1. M. නිමිත්තුග්ඝාටනස්සපි 2 M පරියායභාවතො

කාලෙපි දුබ්බිජානිසභාවෙන සුඛුමස්ස අනත්තලක්ඛණස්ස පඤ්ඤාය එව ගොචරභාවතො අනත්තානුපස්සනාය අනුපස්සතො[1] මග්ගක්ඛණෙ පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. යථාහ: "අනත්තතො මනසි කරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොතී"ති; තං ච පන සයං අත්තාභිනිවෙසසමුග්ඝාටනතො අරියමග්ගපරියාපන්නත්තා ච නිප්පරියායතො ච සුඤ්ඤතානාමං ලභති. දුක්ඛානුපස්සනාය සමාධිවිපච්චනිකස්ස පණිධිසංඛාතරාගස්ස සොසනතො තස්සා වසෙන අනුපස්සන්තස්ස මග්ගක්ඛණෙ සමාධින්ද්‍රියං අධිමත්තං හොති, යථාහ: "දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොතී"ති. තං ච පන සයං පණිධිසොසනතො අරියමග්ගපරියාපන්නත්තා ච නිප්පරියායතොව අප්පණිහිතනාමං ලභති. සබ්බසංඛාරානම්පන අනිච්චභාවං ආගමෙතො[2] සුත්වා පච්ඡා සයං - පච්චක්ඛතො පස්සතො "අනිච්චමෙව වත සො භගවා අනිච්චන්ති ආහා"ති භගවති සද්ධාබාහුල්ලපටිලාභතො අනිච්චානුපස්සනාය මනසිකරොතො මග්ගක්ඛණෙ සද්ධින්ද්‍රියං අධිමත්තං හොති. යථාහ: "අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොතී"ති. තං පන සයං සංඛාරනිමිත්තතො වුට්ඨහන්තම්පි අරියමග්ගපරියාපන්නං න හොතීති නිප්පරියායතො අනිමිත්තනාමං ලභති. තස්මා යථා කායකම්මාධිකං[3] චිත්තං කායකම්මං ති වුච්චති, එවං සුඤ්ඤතාසංඛාත - පඤ්ඤින්ද්‍රියාධිමත්තො මග්ගො සුඤ්ඤතනාමං ලභති; අප්පණිහිතසංඛාත - සමාධින්ද්‍රියාධිමත්තො අප්පණිහිතනාමං: සද්ධින්ද්‍රියාධිමත්තො පන සයං අනිමිත්තනාමාලාභතො සයම්පි තං න ලභති.

යදි සම්පයුත්තධම්මවසෙන සුඤ්ඤතාදිනාමලාභො, අථ කථං "ආගමනතො"ති වුත්තං? සච්චං; ආගමනතො අධිමත්තස්ස පන ඉන්ද්‍රියස්ස වසෙන ලද්ධනාමම්පි ආගමනතොව ලද්ධං හොති. අථ වා අභිධම්මපරියායෙන පි සුඤ්ඤභාවො නාම පුග්ගලසුඤ්ඤතා යෙවාති පුග්ගලසුඤ්ඤතාගාහිකාය අනත්තානුපස්සනාය සුඤ්ඤතනාමං නිප්පරියායතොව ලබ්භති. පණිධි නාම රාගාදිකා එවාති රාගාදි-සොසිකාය දුක්ඛානුපස්සනාය අප්පණිහිතනාමම්පි නිප්පරියායතොව ලබ්භති. නිමිත්තං ති පන ඨපෙත්වා සුත්තන්තපරියායං අභිධම්මපරියායෙන සංඛාරවිනිමුත්තං[5] න[6] හොතීති සංඛාරනිමිත්තගාහිකාය අනිච්චානුපස්සනාය අනිමිත්තනාමං නිප්පරියායතො න ලබ්භති, තස්මා නිප්පරියායතො සුඤ්ඤතඅප්පණිහිතනාමකානං අනත්තදුක්ඛානුපස්සනානං වසෙන පටිලද්ධමග්ගො ආගමනතො සුඤ්ඤතාප්පණිහිතනාමං ලභති. අනිමිත්තනාමම්පන

1 M අනුපස්සනතො, 2 M ආගමනතො, 3 B කායසමාඨිතං
4 B කායසම්ඵංති 5. M. සංඛාරනිමිත්තං. 6 මරම්මපොත්ථකෙ නත්ථි.

පරියායතොව ලභති යෙන වුත්තං "අනිමිත්තනාමං පනෙත්ථ ආගමනතො පි සුත්තන්තපරියායෙනෙව ලබ්භති, අභිධම්මෙ පන මග්ගම්පති අනිමිත්තනාමස්ස අනුද්ධටත්තා" ති.

ඉති ඉමෙසං තිණ්ණං විමොක්ඛානං පවෙසද්වාරභාවතො සුඤ්ඤතානුපස්සනාදිනාමිකා අනත්තානුපස්සනාදිකා තිස්සො අනුක්කමෙන බලවභාවප්පත්තා වුට්ඨානගාමිනීවිපස්සනාභූතා තීණි විමොක්ඛමුඛානීති වෙදිතබ්බානි. වුත්තං හෙතං: "තීණි ඛො පනිමානි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්ති, සබ්බසංඛාරෙ[1] පරිච්ඡෙද – පරිවටුමතො සමනුපස්සනතාය, අනිමිත්තාය ච ධාතුයා චිත්තපක්ඛන්දනතාය, සබ්බසංඛාරෙසු මනො සමුත්තෙජනතාය අප්පණිහිතාය ච ධාතුයා චිත්තපක්ඛන්දනතාය, සබ්බධම්මෙ[2] පරතො සමනුපස්සනතාය, සුඤ්ඤතාය ච ධාතුයා චිත්තපක්ඛන්දනතාය, ඉමානි තීණි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්තී" ති. එත්ථ හි **පරිච්ඡෙදපරිවටුමතො** ති උදයබ්බයවසෙන පරිච්ඡෙදතො චෙව පරිවටුමතො ච. අනිච්චානුපස්සනා හි උදයතො පුබ්බෙ සංඛාරා නත්ථීති පරිච්ඡින්දිත්වා තෙසං ගතිං සමන්නෙසමානා වයතො පරං න ගච්ඡන්ති, එත්ථෙව අන්තරධායන්තී ති පරිවටුමතො පරියන්තතො සමනුපස්සති. **සමනුපස්සනතායා** ති සම්මදෙව අනු අනු පස්සනතාය, **සංවත්තන්තී** ති සම්බන්ධො. **මනොසමුත්තෙජනතායා** ති චිත්තසංවෙජනතාය. දුක්ඛානුපස්සනාය හි සංඛාරෙසු චිත්තං සංවිජ්ජති. **පරතො සමනුපස්සනතායා** ති "නාහං, න මම" ති එවං අනත්තතො සමනුපස්සනතාය. ඉති ඉමානි තීණි පදානි අනිච්චානුපස්සනාදීනං තිණ්ණං වසෙන වුත්තානීති වෙදිතබ්බානි. තෙනෙව ච තදනන්තරෙ පඤ්හවිස්සජ්ජනෙ "අනිච්චතො මනසිකරොතො ඛයතො සංඛාරා උපට්ඨහන්ති, දුක්ඛතො මනසිකරොතො භයතො සංඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො සංඛාරා උපට්ඨහන්තී" ති වුත්තං. අපි චෙත්ථ අභිධම්මාවතාරස්ස භාසමානත්තා අභිධම්මපරියායෙනෙව විමොක්ඛෙ[3] විමොක්ඛමුඛානි ච වවත්ථපෙතුං යුත්තන්ති. සච්චං, අනිච්චානුපස්සනාය පි පන මග්ගවුට්ඨානං හොතී ති පකාසනත්ථං සුත්තන්තපරියායෙන පි එවං[4] වවත්ථානං කතං. තථා වුට්ඨිතො පන මග්ගො අභිධම්ම පරියායෙන සුඤ්ඤතපටිපදයමෙව සංගය්හතීති දට්ඨබ්බං.

**චතුමග්ගයොගභෙදතො** ති සොතාපත්තිආදීහි චතූහි අරියමග්ගෙහි සම්පයොගප්පභෙදතො අරියමග්ගානං පන සම්මාදිට්ඨාදි

1. M සබ්බසංඛාරෙසු 2. M. සබ්බධම්මෙසු 3. මරම්මපොත්ථකෙ නත්ථි,
4. M. එකං

අට්ඨඞ්ගසභාවත්තා තෙසං ච සබ්බලොකුත්තරෙ අප්පිතාය අංගවසෙන[1] අභෙදෙ පි ඉන්ද්‍රියානං අපාටව – පාටව – පාටවතර – පාටවතමභාවෙන සච්ඡිකිරියාවිසෙසතො කිලෙසානං පහානභෙදෙ හොතීති තංවසෙන චතුබ්බිධතා දට්ඨබ්බා. තෙනෙතමාහ: **සක්කායදිට්ඨි – විචිකිච්ඡා**ති ආදිං. සති විජ්ජමානෙ පඤ්චක්ඛන්ධසංඛාතෙ කායෙ දිට්ඨි සක්කායදිට්ඨි. සයං වා තත්ථ සති දිට්ඨි සක්කායදිට්ඨි. පඤ්චසු ඛන්ධෙසු[2] අත්තත්තනියාභිනිවෙසවසෙන පවත්තාය මිච්ඡාදිට්ඨියා එතං අධිවචනං. සා පන එකස්මිං ඛන්ධෙ චතුධා අභිනිවිසන්තානං[3] වසෙන වීසතිවිධා හොති. තථා හි කොචි රූපං අත්තතො සමනුපස්සති: යං රූපං සො අත්තා, යො අත්තා තං රූපං, යථා දීපස්ස වණ්ණො යෙව අච්චි, අච්චි යෙව වණ්ණොති. රූපවන්තං වා අත්තානං සමනුපස්සති: ඡායාවන්තං විය රුක්ඛං. අත්තනි වා රූපං: පුප්ඵෙ විය ගන්ධං. රූපස්මිං වා අත්තානං, සමුග්ගෙ විය මණිං. එවං වෙදනාදීසුපි "වෙදනං අත්තතො සමනුපස්සතී" ති ආදිනා යොජෙතබ්බං. තත්ථ යො පඤ්චවිධො අව්‍යතිරිත්තඅත්තාභිනිවෙසො සා උච්ඡෙදදිට්ඨි, යො පන පණ්ණරසවිධො ව්‍යතිරිත්තඅත්තාභිනිවෙසො සා සස්සතදිට්ඨීති වෙදිතබ්බා.

සභාවං විචිනන්තො තාය කිච්ඡති කිලමතීති විචිකිච්ඡා. විකිච්ඡිතුං දුක්කරතාය වා විගතා තිකිච්ඡා ඤාණපතිකාරො ඉමිස්සාති විචිකිච්ඡා. සා පන "සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ, සඞ්ඝෙ, සික්ඛාය, පුබ්බන්තෙ, අපරන්තෙ, පුබ්බන්තාපරන්තෙ, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡතී" ති එවං බුද්ධාදීසු කඞ්ඛාවසෙන අට්ඨවත්ථුකා. "අහොසිං නු ඛො අහං අතීතමද්ධානං, න නු ඛො අහොසිං, කින්නු ඛො අහොසිං, කථන්නු ඛො අහොසිං, කිං හුත්වා කිං අහොසිං නු ඛොහං අතීතමද්ධානං? භවිස්සාමි නු ඛොහං අනාගතමද්ධානං, න නු ඛො භවිස්සාමි, කින්නු ඛො භවිස්සාමි, කථන්නු ඛො භවිස්සාමි, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො හං අනාගතමද්ධානං? එතරහි වා පන පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථංකථී හොති: අහං නු ඛොස්මි? න නු ඛොස්මි? කථං නු ඛොස්මි? අයං[4] නු ඛො සත්තො කුතො ආගතො? සො කුහිංගාමී භවිස්සතී" ති එවං පුබ්බන්තාදයො ආරබ්භ පවත්තිවසෙන සොළසවත්ථුකා ච නිද්දිට්ඨා. තත්ථ සත්ථරි කඞ්ඛන්තො තස්ස රූපකාය – ධම්මකායානං විජ්ජමානතං අවිජ්ජමානතං ච කඞ්ඛති. ධම්මෙ කඞ්ඛන්තො තස්ස ස්වාක්ඛාත – දුරක්ඛාතභාවෙ කඞ්ඛති. සඞ්ඝෙ කඞ්ඛන්තො තස්ස සුප්පටිපන්න –

---

1. M භංගවසෙන. 2. M ධම්මෙසු. 3. M. අභිනිවෙසන. 4 M අහං-

විප්පටිපන්නතාදිභාවෙ කංඛති. සික්ඛාය කංඛන්තො තස්සා සුපඤ්ඤත්ත – දුපඤ්ඤත්තභාවං කංඛති පුබ්බන්තෙ කංඛන්තො සස්සතාකාරං අධිච්චසමුප්පත්තිආකාරං ච නිස්සාය අතීතෙ අත්තනො විජ්ජමානතං අවිජ්ජමානතං ච කංඛති. අපරන්තෙ කංඛන්තො සස්සතාකාරං උච්ඡෙදාකාරං ච නිස්සාය අනාගතෙ අත්තනො උප්පත්තිං අනුප්පත්තිං ච කංඛති. පුබ්බන්තාපරන්තෙ කංඛන්තො පච්චුප්පන්නෙ අත්තනො අත්ථිභාවං නත්ථිභාවං ච කංඛති. පච්චුප්පන්නො හි අද්ධා පුබ්බභාග-පරභාග-කොට්ඨාස වන්තතාය පුබ්බන්තාපරන්තො ති වුච්චති.

යුත්තං පන තං ආරබ්භ කංඛාජනනන්ති? යුත්තං අයුත්තන්ති කා එත්ථ චින්තා? උම්මත්තකො විය හි බාලපුථුජ්ජනො, තස්මා සො යං කිඤ්චි කංඛති යෙව. තෙනෙව සොළසවත්ථුකවිචිකිච්ඡානිද්දෙසෙ "එතරහි වා පන" ති ආදි වුත්තං. ආචරියා පන පුබ්බන්තො අපරන්තො ති අතීතානාගතෙ එකජ්ඣං ගහෙත්වා තදුභයං ආරබ්භ කංඛන්තො "පුබ්බන්තාපරන්තෙ කංඛති" ති වදන්ති.

ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කංඛන්තො පන අවිජ්ජාදීනං පච්චයානං සංඛාරාදීනං ච පච්චයුප්පන්නානං හෙතු – හෙතුසමුප්පන්නභාවස්ස සම්භවාසම්භවං[2] කංඛතීති එවං තාව අට්ඨවත්ථුකාය කංඛාය පවත්ති වෙදිතබ්බා. සොළසවත්ථුකාය[3] පන "අහොසිං නු ඛො =පෙ= න නු ඛො අහොසිං" ති කංඛන්තො වුත්තනයෙනෙව අතීතෙ අත්තනො විජ්ජමානතාවිජ්ජමානතං කංඛති. "කින්නු ඛො අහොසිං"ති ජාති-ලිංගුප්පත්තියො නිස්සාය "ඛත්තියො නු ඛො අහොසිං, බ්‍රාහ්මණාදිසු, ගහට්ඨාදිසු, දෙවාදිසු අඤ්ඤතරො නු ඛොති. "කථන්නු ඛො"ති සණ්ඨානාකාරං නිස්සාය "දීඝො නු ඛො අහොසිං, රස්ස – ඔදාත – කාළාදීනං වා අඤ්ඤතරො"ති කංඛති. ඉස්සරනිම්මාණාදිං නිස්සාය "කෙන නු ඛො පකාරෙන අහොසිං"ති නිබ්බත්තනාකාරතො කංඛතීති ච වදන්ති. "කිං හුත්වා කිං අහොසිං"ති ජාතිආදීනි නිස්සාය "ඛත්තියො නු ඛො හුත්වා බ්‍රාහ්මණො අහොසිං =පෙ= දෙවො හුත්වා නු ඛො මනුස්සො අහොසිං" ති අත්තනො අපරාපරප්පවත්තිං කංඛති. "භවිස්සාමි නු ඛො, න නු ඛො" ති හෙට්ඨා වුත්තනයෙනෙව අනාගතෙ අත්තනො විජ්ජමානාවිජ්ජමානතං කංඛති. "කින්නු ඛො භවිස්සාමී"ති ආදි වුත්තනයමෙව. "අහන්නු ඛොස්මි, න නු ඛොස්මි"ති ඉදානි අත්තනො අත්ථිභාවං නත්ථිභාවං ච කංඛති. තත්ථ කාරණං වුත්තමෙව. "කිං නු ඛො ස්මි"ති ඛත්තියාදිකොව සමානො අත්තනො ඛත්තියාදිභාවං කංඛති. එස නයො සෙසෙ

2 M සබ්භාවාසබ්භාවං 3 M සොළසවත්ථුකා

සුපි. "කථං නු ඛොස්මී"ති අබ්භන්තරෙ ජීවො නාම අත්ථීති ගහෙත්වා තස්ස දීඝාදිභාවං කංඛති. පච්චුප්පන්නං පන අත්තනො සරීරසණ්ඨානං අජානන්තො නාම නත්ථි. "කුතො ආගතො, කුහිං ගාමී භවිස්සතී"ති අත්තභාවස්ස ආගත - ගන්තබ්බට්ඨානානි[1] කංඛතීති වෙදිතබ්බං.

සීලං ච වතං ච **සීලබ්බතං.** තත්ථ ගොසීලාදි අසුද්ධිමග්ගො· සමාදානවසෙන සීලං, අවීතික්කමවසෙන වතං. උභයථාපි වා සීලං; තපොකම්මභාවෙන ගහිතත්තා වතං. ගවාදිපකතිභාවතො අත්තනො වා ගවාදිභාවාධිට්ඨානං සීලං. ගච්ඡන්තො හදති[2], තිට්ඨන්තො ඔමුත්තෙතීති[3] ආදිනා ගවකිරියාකරණං[4] වතං. තං-තං - අකිච්චසම්මතතො[5] වා නිවත්ති සීලං; තං සමාදානවතො වෙස - භොජනකිච්ච - ආචරණාදිවිසෙසපටිපත්ති වතං. සභාවං අතික්කම්ම පරතො ආමසනං ගහණන්ති **පරාමාසො.** සීලබ්බතස්ස පරාමාසො **සීලබ්බතපරාමාසො.** ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි, වතෙන සුද්ධි, සීලබ්බතෙන සුද්ධීති එවං අසුද්ධිමග්ගෙ සුද්ධිමග්ගොති පවත්තස්ස මිච්ඡාභිනිවෙසස්සෙතං අධිවචනං.

සක්කායදිට්ඨි ච විචිකිච්ඡා ච සීලබ්බතපරාමාසො චාති සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාසා. තෙ යෙව වට්ටස්මිං කම්මවිපාකෙසු ච සත්තෙ සංයොජෙන්තීති **සංයොජනානි.** තෙසං දිට්ඨිවිසුද්ධිආදීහි තදඞ්ගවසෙන පහීනානං අනුප්පත්තිධම්මතාපාදනෙන අච්චන්තසමුච්ඡෙදප්පහානං කරොතීති **සක්කායදිට්ඨි =පෙ= පහානකරං.** නිබ්බානං පති සවණතො සන්දනතො සොතො වුච්චති අරියො අට්ඨඞ්ගිකමග්ගො. තස්ස ආදිතො පජ්ජනං **සොතාපත්ති.** නිබ්බානං මග්ගති, නිබ්බානත්ථිකෙහි වා මග්ගීයති කිලෙසෙ මාරෙන්තො ගච්ඡතීති වා **මග්ගො.** සොතාපත්ති එව මග්ගො සොතාපත්තිමග්ගො. අථ වා සොතං ආදිතො පජ්ජි අධිගච්ඡීති **සොතාපන්නො.** පඨමො අරියපුග්ගලො; තස්ස මග්ගො **සොතාපත්තිමග්ගො.** සම්මාදිට්ඨිආදීනි අට්ඨඞ්ගානි. තෙන සම්පයුත්තං චිත්තං **සොතාපත්තිමග්ගචිත්තං.**

රජ්ජති අභිසජ්ජතීති **රාගො;** සො ඉධ පඤ්චකාමවිසයා, කාමභවවිසයා වා තණ්හා. දුස්සතීති **දොසො;** දසවිධ-ආඝාතවත්ථු පදට්ඨානො ව්‍යාපාදො. මුය්හතීති **මොහො;** දුක්ඛාදිසු අඤ්ඤාණං. එතෙසං කිලෙසානං තනුත්තං තනුභාවං කරොතීති **රාග =පෙ= තනුත්තකරං.** තත්ථ ද්වීහි කාරණෙහි තනුත්තං:

---

1 M ආගතගතට්ඨානානි 2. M. භක්ඛති 3. M. මුත්තෙතීති
4. M. ගවාදි— 5. M. අකිච්චසම්මතතො

අභිණ්හානුප්පත්තිතො, පරියුට්ඨානමන්දතාය[1] චාති සකදාගාමිස්ස හි වට්ටානුසාරී - මහාජනස්ස විය කිලෙසා අභිණ්හං න උප්පජ්ජන්ති, කදාචි විරළාකාරා හුත්වා උප්පජ්ජන්ති; උප්පජ්ජන්තාපි මද්දන්තා ඡාදෙන්තා අන්ධකාරං කරොන්තා නුප්පජ්ජන්ති, ද්වීහි පන මග්ගෙහි පහීනත්තා මන්දමන්දා තනුකා උප්පජ්ජන්ති. කෙචි පන සකදාගාමිස්ස කිලෙසා චිරෙන උප්පජ්ජන්තාපි බහලාව උප්පජ්ජන්ති, තථා හි'ස්ස පුත්තධීතරො දිස්සන්තීති ච වදන්ති. තං අකාරණං. වත්ථුපටිසෙවනෙන විනාපි ගබ්භග්ගහණසම්භවතො[1] තස්මා වුත්තනයෙනෙව ද්වීහි කාරණෙහි තෙසං තනුභාවො වෙදිතබ්බො

කස්මා පනෙත්ථ මොහස්ස තනුභාවො වුත්තො? නනු ච තතියමග්ගවජ්ඣානමෙව ඉමිනා තනුත්තකරණං වත්තබ්බං. ඉතරථා හෙට්ඨා තීහිපි මග්ගෙහි උපරි මග්ගවජ්ඣකිලෙසානං බහලබහලා වත්ථාය පහීයමානත්තා ඉධ සබ්බස්සෙව උද්ධම්භාගියසංයොජනානං තනුභාවො වත්තබ්බො. තෙනෙව ච පාළියම්පි 'කාමරාග - ව්‍යාපාදානං තනුභාවා[2] දුතියාය භූමියා පත්තියා''ති වුත්තන්ති? සච්චමෙතං. සුත්තෙ පන උපරිමග්ගවජ්ඣානං තනුභාවපරියායං ගහෙත්වා ''රාග-දොස-මොහානං තනුත්තා සකදාගාමී හොතී''ති හෙතුත්තයතනුභාවස්ස ආගතත්තා ඉධාපි තදනුලොමෙන වුත්තං, ''කාමරාග ව්‍යාපාදාන''මිච්චෙව වා පාඨො. තථා හි එතෙව උපරි දුතියමග්ගඤාණනිද්දෙසෙ

''ව්‍යාපාදකාමරාගානං තනුභාවං තු සාධයං[3]''ති

වුත්තං. පටිසන්ධිවසෙන සකිදෙව ඉමං මනුස්සලොකං ආගච්ඡතීති සකදාගාමී තස්ස මග්ගො සකදාගාමිමග්ගො කිඤ්චාපි හි මග්ගට්ඨස්ස පටිසන්ධිවසෙන ආගමනාසම්භවතො ඵලට්ඨො එව සකදාගාමී නාම හොති. තස්ස පන ආගමනභූතො මග්ගො මග්ගනන්තරාවච්ඡෙදත්තං තදායත්තභාවූපනයෙන සකදාගාමිමග්ගොති වුච්චති එවමනාගාමිමග්ගොපීති. තංසම්පයුත්තං චිත්තං සකදාගාමිමග්ගචිත්තං.

පඤ්චසු කාමගුණෙසු කාමභවෙ ච රාගො **කාමරාගො.** ව්‍යාපජ්ජති තෙන චිත්තන්ති **ව්‍යාපාදො.** පටිසන්ධිවසෙන ඉමං කාමධාතුං න ආගච්ඡතීති **අනාගාමී.** රූපභවෙ ඡන්දරාගො **රූපරාගො** අරූපභවෙ ඡන්දරාගො **අරූපරාගො.** මානො ඉධ අරහත්තාධිගමම්පටිච්ච උන්නතිමත්තං. උද්ධච්චම්පි ''කොමෙ භාරො කිලෙසසමුච්ඡෙදනෙ''ති එවමාකාරප්පවත්තං චිත්තස්ස අවූපසමමත්තං. අවිජ්ජාපි අසුභෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො.

1 M -සබ්භාවතො 2 M තනුභාවාය 3 M සාධකං

ආරකත්තා කිලෙසෙහි මිච්ඡාපටිපන්නෙහි ච, රාගාදිඅරීනං, සංසාරචක්කස්ස අරානං ච හතත්තා, පච්චයාදීනං අරහත්තා, රහොපි පාපාකරණෙන පාපකරණෙ රහස්ස අභාවා, රහිතබ්බතො ජහිතබ්බතො රහාති ලද්ධනාමානං වා පාපධම්මානං අභාවතො සාධූහි අරහිතබ්බතො අපරිච්චජිතබ්බතො, රහසංඛාතස්ස වා ගමනස්ස සංසාරෙ අභාවතො **අරහා**. අට්ඨමො අරියපුග්ගලො. තස්ස භාවො අරහත්තං, අග්ගඵලස්සෙතං අධිවචනං, තං හි අරහාති අභිධානස්ස බුද්ධියා ච පවත්තිනිබන්ධනත්තා අරහතො භාවොති කත්වා **අරහත්තං**ති වුච්චති. තස්ස ආගමනභූතො මග්ගො අරහත්තමග්ගො. තං සම්පයුත්තං චිත්තං **අරහත්තමග්ගචිත්තං**.

**ඣානඞ්ගයොගභෙදතො** ති රූපාවචරවිසයෙහි පඤ්චහි ඣානඞ්ගෙහි සම්පයොගභෙදතො. කථමෙතස්ස සො[2] භෙදොති? එත්ථ තාව අට්ඨකථාවාදෙ, තයො ච ථෙරවාදාති චත්තාරො වාදා හොන්ති: තත්ථ හි අට්ඨකථායං තාව "සංඛාරුපෙක්ඛාභාවං පත්වා වුට්ඨානගාමිනී විපස්සනා මග්ගස්ස ඣානඞ්ගං[3] නියමෙතී"ති වුත්තං. **තිපිටකචූළනාගත්ථෙරො** පන මග්ගාසන්නවිපස්සනාය පදට්ඨානභූතං පාදකජ්ඣානං නියමෙතීති ආහ. **මොරවාපිවාසී මහාදත්තත්ථෙරො** විපස්සනාය ආරම්මණභූතා ඛන්ධා නියමෙන්ති, යං හි ඣානං සම්මසිත්වා වුට්ඨාති තංසදිසොව හොතීති ආහ. තිපිටකචූළාභයත්ථෙරො පන පුග්ගලජ්ඣාසයො නියමෙති; "අහො වත පඤ්චඞ්ගිකං චතුරඞ්ගිකං වා මග්ගං පාපුණෙය්‍යං"ති හි ආදිනා යථා යථා'ස්ස අජ්ඣාසයො හොති, තථා තථා මග්ගො හොතීති ආහ. යස්මා පන අට්ඨකථාවාදෙ පමාණං, තයො ච ථෙරා පණ්ඩිතා ව්‍යත්තා, චත්තාරොපි වාදා අඤ්ඤමඤ්ඤං අප්පටිබාහනවසෙන එවං වෙදිතබ්බා: කථං? කාමාවචරධම්මෙ තාව සම්මසිත්වා සුක්ඛවිපස්සකස්ස උප්පන්නමග්ගොපි සමාපත්තිලාභිනො ඣානං පාදකං අකත්වා උප්පාදිතමග්ගොපි විපස්සනානියමෙන පඨමජ්ඣානිකාව හොන්ති. සචෙ පන කඤ්චි ඣානං පාදකං කත්වා උප්පාදිතො හොති, තස්ස වසෙන අඞ්ගපරිණාමො හොතීති තං තංඣානසදිසො හොති. යස්මා පනෙත්ථ කාමාවචරක්ඛන්ධෙ ආරබ්භ පවත්තා විපස්සනා කාමාවචරධම්මෙසු ච මහග්ගතධම්මෙසු විය භාවනාවිසෙසතො ඣානඞ්ගවිසෙසො නත්ථි, තස්මා විපස්සනාය ආරම්මණභූතක්ඛන්ධා නියමෙන්තීති එවමෙතෙන දුතියථෙරවාදෙ ඉමං වාදං න පවිසති. ඣානධම්මෙ සම්මසිත්වා උප්පාදිතමග්ගො සචෙපි පාදකජ්ඣානං නත්ථි, සම්මසිතජ්ඣානනියාමෙන තංතංඣානිකො හොති. සචෙ පඨමජ්ඣානතො වුට්ඨාය දුතියාදිඣානෙ

2 මරම්මපොත්ථකෙ නත්ථි  3 B කරුණංගං.

සම්මසිත්වා උප්පාදිතො, පුග්ගලජ්ඣාසයනියාමෙන විසුං අඤ්ඤතරජ්ඣානසදිසො හොති. සචෙ පන පුග්ගලස්ස තථාවිධො අජ්ඣාසයො නත්ථි, තදා කථන්ති? එත්ථ තාව කෙචි නානාවජ්ජනවීථිය මෙව නිවත්තමාන - පාදකජ්ඣානතො එකාවජ්ජනවීථියං ගොත්‍රභුභාවමප්පත්වා නිවත්තමානාය විපස්සනාය ආරම්මණභූතා ඛන්ධා යෙව බලවන්තො, තස්මා සම්මසිතක්ඛන්ධනියාමෙන තංසදිසො මග්ගො හොතීති වදන්ති එවඤ්ච සති පාදකජ්ඣානනියාමෙන හොතීති එවං පවත්තො පඨමත්ථෙරවාදෙ පාදකජ්ඣානතො වුට්ඨාය කාමාවචරක්ඛන්ධෙ සම්මසිත්වා උප්පාදිතමග්ගමෙව සන්ධාය තිට්ඨති. අපරෙ පන "පාදකජ්ඣානං මග්ගස්ස මූලකාරණවසෙන පච්චයො හොති, ආසන්නකාරණවසෙන පි; සම්මසිතක්ඛන්ධා පන මූලකාරණවසෙනෙව පච්චයා හොන්ති; තස්මා සම්මසිතක්ඛන්ධතො පාදකජ්ඣානමෙව බලවතරන්ති පාදකජ්ඣානසදිසොව මග්ගො හොතීති වදන්ති. එවං සන්තෙ පන සම්මසිතක්ඛන්ධනියමෙනාති එවං පවත්තො දුතියත්ථෙරවාදෙ සමාපත්තිපාදකං අකත්වා කෙවලං ඣානධම්මෙ යෙව සම්මසිත්වා උප්පාදිතමග්ගමෙව සන්ධාය තිට්ඨති. යස්මා පන හෙට්ඨිම - හෙට්ඨිමජ්ඣානතො උපරූපරි ඣානං බලප්පත්තං හොති, තස්මා හෙට්ඨිම-හෙට්ඨිමජ්ඣානතො වුට්ඨාය උපරූපරි ඣානධම්මෙ විපස්සතො උප්පන්නමග්ගො පාදකජ්ඣානං අනපෙක්ඛිත්වා සම්මසිතජ්ඣානවසෙන තංතංඣානිකො හොති. උපරූපරි ඣානතො පන වුට්ඨාය හෙට්ඨිම-හෙට්ඨිමජ්ඣානධම්මෙ සම්මසිත්වා උප්පාදිතමග්ගො සම්මසිතජ්ඣානං අනපෙක්ඛිත්වා පාදකජ්ඣානසදිසො හොතීති ඉදමෙත්ථ සාරතරං. එවං හි සති ද්වින්නම්පි ථෙරානං වාදා නිප්පදෙසවිසයා සමබලා හොන්ති.

තතියත්ථෙරවාදෙ චෙත්ථ පාදකජ්ඣානං සම්මසිතජ්ඣානං ඨපෙත්වා අජ්ඣාසයමත්තෙනෙව න ඉජ්ඣතීති. තීසුපි වාදෙසු ඨපෙත්වා සෙසඣානඞ්ගපරිණාමං වෙදනාපරිණාමො විපස්සනානියාමෙනෙව හොතීති. තයොපි ථෙරවාදා විපස්සනානියමෙන විනා න හොන්තීති දට්ඨබ්බං. නනු ච වෙදනාපි ඣානඞ්ගමෙව, තස්මා තායපි පාදකජ්ඣානනියමෙනෙව භවිතබ්බන්ති? තං න. වෙදනායපි පාදකජ්ඣානනියාමෙන පරිණාමෙ සති විපස්සනානියාමං අනපෙක්ඛිත්වා පාදකජ්ඣානනියමෙනෙව මග්ගක්ඛණෙ සෙසඣානඞ්ගානං[1] පරිණාමට්ඨානෙ යෙව වෙදනායපි පරිණාමො භවෙය්‍ය, තථා පන අහුත්වා එකාවජ්ජනවීථියා ආදිතොව පරිණාමිතතො මග්ගුට්ඨානවීථියා ආසන්නතරප්පවත්තාය විපස්සනාය වසෙන වෙදනානියමො හොති. අථවා පාදකජ්ඣාන - සම්මසිතජ්ඣානානං

1. M. ඣානඞ්ගානි.

සම්භවෙ තෙසු අනුප්පන්නා වෙදනා විපස්සනාය න හොන්තීති පාදකජ්ඣාන-සම්මසිතජ්ඣානනියාමෙන පරිණතානිපි[1] න සක්කාවත්තුං. එත්ථ සියා: යත්ථ තාව පාදකජ්ඣානං අත්ථි, තත්ථ තං නියාමෙති; යත්ථ පන තික-චතුක්කපාදකජ්ඣානං නත්ථි, තස්මිං අරූපභවෙ කිං නියාමෙතීති? තත්ථ පි පාදකජ්ඣානමෙව නියාමෙති: යො හි භික්ඛු අට්ඨසමාපත්තිලාභී පඨමජ්ඣානං පාදකං කත්වාසොතාපත්තිමග්ගඵලානි නිබ්බත්තෙත්වා අපරිහීනජ්ඣානො කාලං කත්වා අරූපභවෙ නිබ්බත්තො පඨමජ්ඣානිකාය සොතාපත්තිඵලසමාපත්තියා වුට්ඨාය විපස්සනං පට්ඨපෙත්වා උපරි තීණි මග්ගඵලානි නිබ්බත්තෙති, තස්ස තානි පඨමජ්ඣානිකානි යෙව හොන්ති. දුතියජ්ඣානිකාදිසුපි එසෙව නයො. ආරුප්පෙ හිලොකුත්තර තික-චතුක්කජ්ඣානං උප්පජ්ජතීති එවමෙත්ථ එකෙකස්ස ලොකුත්තරකුසලස්ස ඣානඞ්ගයොගභෙදො වෙදිතබ්බො.

**5. මග්ගානුරූපඵලප්පවත්තියා චත්තාරො අරියපුග්ගලෙ අභිනිප්ඵාදෙතී** ති තෙභූමකකුසලං විය පටිසන්ධිප්පවත්තීසු අවිපච්චමානම්පි අත්තනො අත්තනො අනුරූපස්ස ඵලස්ස නිප්ඵාදනෙන තංතංඵලප්පත්තෙන සොතාපන්නො සකදාගාමී අනාගාමී අරහාතිසාමඤ්ඤතො චත්තාරො අරියපුග්ගලෙ අභිනිප්ඵාදෙති. විසෙසතොපන සත්තක්ඛත්තුපරමාදිවසෙන[2] අනෙකෙපි සොතාපන්නාදයොඅභිනිප්ඵාදෙති. එවං චතුභූමකකුසලචිත්තං සරූපතො නිද්දිසිත්වා ඉදානි තං නිගමෙන්තො ආහ: "**කාමෙ අට්ඨෙවා**"ති ආදි

තත්ථ (6.) **කාමෙ**ති කාමභවෙ. එවං **රූපෙ**ති ආදිසු. **කුසලාකුසලාපගතෙනා** ති කුසලාකුසලකම්මතො අපගතෙන අග්ගමග්ගස්ස හි උප්පන්නකාලතො පට්ඨාය අරහතො සබ්බානි කුසලාකුසලකම්මානි ජහිතානි නාම හොන්ති, පච්චයවෙකල්ලෙන පටිසන්ධිදානෙ අසමත්ථභාවතො; යතො ච අරියමග්ගඤාණං කම්මක්ඛයකරං ති වුච්චති. අථ වා අහෙතු-අප්පච්චයා විසුජ්ඣනස්ස අභාවතොකිලෙසසමුච්ඡෙදකෙන ච මග්ගකුසලෙන අකුසලෙහි අපගතෙන. **කුසලෙ කුසලෙනා**ති කුච්ඡිතානං සලනාදී හි කුසලසංඛාතාය පටිපත්තියා දෙසනුප්පාදනාදිසු ඡෙකෙන **මුනිනා** ති උභයලොකං මුනනෙන[3] අග්ගඤාණෙන සබ්බඤ්ඤුතඤාණෙන වා සමන්නාගතත්තා මුනිනා. තෙනාහ: "යො මුනාති උභො ලොකෙ, මුනි තෙන පවුච්චතී"ති **වසිනා** ති ඡළභිඤ්ඤතාය පරමෙන චිත්තවසීභාවෙනසමන්නාගතත්තා, ඣානාදිසු පඤ්චවිධවසීභාවතො ච වසීභූතෙන.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාරසංවණ්ණනාය චතුභූමකකුසලවණ්ණනා නිට්ඨිතා.**

---

1 M. පරිණමතීතිපි 2. M. - පරමතාදිකෙ 3. M. මුනනකෙන

එත්තාවතා ච යං "කුසලාකුසලාබ්‍යාකත - ජාතිභෙදතො තිවිධං" ති එත්ථ වුත්තකුසලං සරූපතො නිද්දිසිත්වා ඉදානි තදනන්තරුද්දිට්ඨං අකුසලං නිද්දිසන්තො ආහ: **අකුසලම්පනා** ති ආදි. "භූමිතො එකවිධං"ති වුත්තම්පත්ථං නියමෙත්වා දස්සෙන්තො ආහ: **කාමාවචරමෙවා** ති. නිකායන්තරිකා පන රූපාවචරම්පි අකුසලං ඉච්ඡන්තී ති තෙසං මතනිසෙධනං කතං. මහග්ගත භූමියං උප්පජ්ජන්තම්පි හෙතං තත්ථ රූපධාතුයං පවත්තිවිපාකං දෙන්තම්පි එකන්තෙන කාමාවචරමෙවාති. කුතො පනෙස නියමො කි? කාමතණ්හාවිසයභාවතො. කාමතණ්හාවිසයතා හි කාමාවචරභාවස්ස කාරණං. රූපාරූපතණ්හාවිසයතා රූපාරූප භාවස්ස. එකංසෙන චෙතං එවං සම්පටිච්ඡිතබ්බං, ඉතරථා ව්‍යාපිතලක්ඛණං න සියා. යදි හි ආලම්බිතබ්බධම්මවසෙන භූමි වවත්ථානං කරෙය්‍ය එවං සති අනාරම්මණානං සංගහො න සියා. අථ විපාකදානවසෙන, එවම්පි අවිපාකානං සංගහො න සියා. තස්මා ආලම්බක - ධම්මවසෙනෙව පරියාපන්නානං සා කාතබ්බා. අපරියාපන්නා[1] පන ලොකතො උත්තිණ්ණතාය ලොකුත්තරා; උත්තරිතරාභාවතො අනුත්තරා ච වෙදිතබ්බාති.

දොමනස්සස්ස අනීවරණාවත්ථාය අභාවෙන තංසහගත- චිත්තුප්පාදෙ කාමභූමියං යෙව පවත්තතීති සො නියතවත්ථුකො. ඉතරෙ අරූපභූමියම්පි පවත්තනතො අනියතවත්ථුකාති ආහ: **නියතානියත - වත්ථුවසෙන** =පෙ= **දුවිධං** ති. විචිකිච්ඡුද්ධච්ච සහගතානං මොහහෙතුකත්තා ඉතරෙසම්පි ලොභ - මොහ - දොස - මොහවසෙන විහෙතුකත්තා ආහ: **එකහෙතුකා දුහෙතුකතො** ති. ආදිතො එකාදසන්නං අකුසලචිත්තානං පටිසන්ධිජනනතො උද්ධච්චසහගතස්ස තදභාවතො ආහ: **පටිසන්ධිජනකාජනක- තො** ති. උද්ධච්චසහගතං හි පවත්තිවිපාකං දෙන්තම්පි පටිසන්ධිං නාකඩ්ඪති. යතො වක්ඛති:

"එකාදසවිධානං තු හිත්වා උද්ධච්චමානසං
එකාදසවිධා චෙව භවන්ති පටිසන්ධියො"ති.

යෙන පන කාරණෙන තං පටිසන්ධිං නාකඩ්ඪති, තං සද්ධිං විනිච්ඡයකථාහි[2] ඉමිස්සා ගාථාය වණ්ණනාප්පදෙසෙ යෙව වක්ඛාම. **තීහි වෙදනාහීති** සුඛ - දුක්ඛොපෙක්ඛාසංඛාතාහි තීහි වෙදනාහි. යථා හ: "තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො? සුඛා දුක්ඛා අදුක්ඛමසුඛා" ති. යම්පන කත්ථචි සුත්තෙන "ද්වෙ මා භික්ඛවෙ වෙදනා සුඛා දුක්ඛා"ති වචනං, තං කුසලපක්ඛිකං

1 M අපරියාපන්නානං 2 M පටිසන්ධිවිනිච්ඡයකථාහි

උපෙක්ඛං සුඛෙ, අකුසලපක්ඛිකං ච දුක්ඛෙ පක්ඛිපිත්වා පරියායෙන වුත්තං ති දට්ඨබ්බං. සුප්පතිට්ඨිතභාවකරත්තා[1] මූලමිවා ති මූලං. ලොභො මූලං එතස්සා ති ලොභමූලං. කිඤ්චාපි හි මොහොපි ලොභමූලෙසු අත්ථි, සො පන සබ්බාකුසල - සාධාරණත්තා වවත්ථානකරො න හොතීති අසාධාරණධම්මවසෙන ලොභමූලන්තෙව වුත්තං; යථා භෙරිසද්දො, යවඞ්කුරොති. තථා දොසමූලං ති එත්ථාපි. මූලන්තරවිරහතො මොහො එව මූලං ඉමස්ස, නාඤ්ඤං ති **මොහමූලං**. මිච්ඡාවසෙන දස්සනං දිට්ඨි. දිට්ඨියෙව දිට්ඨිගතං, යථා ආකාසගතං ථාමගතං ති. අථ වා විපරියෙසගාහිකාය දිට්ඨියා ගතමෙව, න එත්ථ ගන්තබ්බවත්ථු තථාසභාවං ති දිට්ඨිගතං. දිට්ඨිසු වා අන්තොගතං ති දිට්ඨිගතං. තෙන සම්පකාරෙහි යුත්තං ති **දිට්ඨිගතසම්පයුත්තං**.

**යඥ හි** ති ආදි ලොභමූලචිත්තානං පවත්ති - ආකාරදස්සනං. **මිච්ඡාදිට්ඨිං** ති උච්ඡෙදදිට්ඨිආදිං මිච්ඡාදිට්ඨිං. තාය හි විපල්ලත්ථචිත්තා "එතාවතෙතා ච[2] විසයො යාව ඉන්ද්‍රියගොචරො" ති පරලොකං පටික්ඛිපිත්වා "නත්ථි කාමෙසු ආදීනවො"ති ගණ්හන්ති. ආදිසද්දෙන:

"එස පන්ථො විතතො දෙවයානෙ
යෙන යන්ති පුත්තවන්තො විසොකතං
පස්සන්ති නං පසවො පක්ඛිනො ච
තෙන (තෙ)[3] මාතරි පි මිථුනං චරන්ති"ති

ආදිනා නයෙන පුත්තමුඛදස්සනං සග්ගමොක්ඛමග්ගො ති එවමාදිකං මිච්ඡාදිට්ඨිං සංගණ්හාති. **කාමෙ වා** ති එත්ථ වාසද්දො අනියමත්ථො; තෙන "තෙන බ්‍රාහ්මණානං සුවණ්ණහරණමෙව අදින්නාදානෙ සාවජ්ජං, ඉතරං අනවජ්ජං. ගුරූනං, ගුන්නං, අත්තනො ජීවිතස්ස, විවාහස්ස ච අත්ථාය මුසාවාදෙ අනවජ්ජො, ඉතරො සාවජ්ජො. ගුරුආදීනං අත්ථාය පෙසුඤ්ඤහරණං[4] අනවජ්ජං; ඉතරං සාවජ්ජං. භාරතයුද්ධ - සීතාහරණාදිකථා පාපවූපසමාය හොති"ති එවමාදිකෙ මිච්ඡාගාහෙ සංගණ්හාති. **දිට්ඨමංගලාදීනී** ති දිට්ඨ - සුත - මුත - මඞ්ගලානි. **සාරතො පච්චෙති** ති වඩ්ඪියා පුබ්බනිමිත්තභාවෙන අගහෙත්වා ඉදමෙව වඩ්ඪිකාරණං ති එවං සාරවසෙන ගණ්හාති. **සභාවතික්ඛෙනෙවා** ති ලොභස්ස මිච්ඡාභිනිවෙසස්ස වා වසෙන සරසෙනෙව තිඛිණෙන, කුරූරෙන. **මන්දෙනා** ති දන්ධෙන අතිඛිණෙන. තාදිසම්පන අත්තනො පරස්ස වා සමුස්සාහනෙන පවත්තතීති ආහ: **සමුස්සා**

1 M -කාරණත්තා, 2 M තාවෙකොධ 3 මරම්මපොත්ථකෙ නත්ථි
4 M පෙසුඤ්ඤකරණං,

**හිතෙනා** ති. **පරභණ්ඩං වා**[1] **හරති** ති වාසද්දෙන තථා පවත්තනක - මුසාවාදාදීනම්පි සංගහො වෙදිතබ්බො. **කාමානං වා** ති අනුභුය්‍යමානානං කාමගුණානං. වාසද්දෙන පරසන්තකස්ස අයථාධිප්පෙතතාය යං ලද්ධං තං ගහෙතබ්බන්ති ගහණාදිකං සංගණ්හාති.

සම්පයුත්තධම්මවසෙන භෙදභාවතො **දොසමූලං අසංඛාරික - සසංඛාරිකා - භෙදතො දුවිධං**. යදි එවං කස්මා දොමනස්ස සහගතං පටිඝසම්පයුත්තං ති වුත්තං? අසාධාරණධම්මෙහි තස්ස චිත්තස්ස උපලක්ඛණත්ථං. පාණස්ස අතීව අතික්කමිත්වා වා පාතනං **පාණාතිපාතො.** ආදිසද්දෙන අදින්නාදාන - මුසාවාද - පෙසුඤ්ඤ - ඵරුස - සම්ඵප්පලාප - ව්‍යාපාදෙ සංගණ්හාති. දස- අකුසලකම්මපථෙසු හි කාමමිච්ඡාචාර - අභිජ්ඣා - මිච්ඡාදිට්ඨි සංඛාතා තයොව කම්මපථා ඉමිනා න සිජ්ඣන්ති. සභාවතික්ඛං හුත්වා පවත්තමානං චිත්තං අසංඛාරමෙව හොති; ඉතරං සසංඛාරන්ති අධිප්පායෙනාහ: **තික්ඛමන්දප්පවත්තිකාලෙ** ති. මන්දං පන හුත්වා පවත්තමානං එකංසෙන සසංඛාරමෙවාති න සක්කා විඤ්ඤාතුං, සසංඛාරෙන සම්පයොගෙන පවත්තිතං මන්දමෙව හොති ති කත්වා තථා වුත්තන්ති දට්ඨබ්බං.

(**7.**) මොහමූලං චිත්තං මූලන්තරවිරහතො අතිමූළ්හං, විචිකිච්ඡුද්ධච්චසම්පයොගතො චඤ්චලං චාති උපෙක්ඛාසහගත මෙව හොති. න තස්ස කදාචිපි සභාවතික්ඛතා අත්ථි. ආරම්මණෙ හි සංසප්පනවසෙන වික්ඛිපනවසෙන ච පවත්තමානස්ස චිත්තද්වයස්ස කිං තාදිසෙ කිච්චෙ සභාවතික්ඛතාය උස්සාහෙතබ්බතාය වා භවිතබ්බං. තස්මා න තත්ථ සංඛාරභෙදො අත්ථි. තනු ච උද්ධච්චං සබ්බාකුසලසාධාරණං, කස්මා පන එතමෙව තෙන විසෙසෙත්වා වුත්තං **උද්ධච්චසහගතං** ති? විසෙසතො බලවභාවතො. ඉදං හි එතස්මිං චිත්තෙ බලවං. තස්මා සම්පයුත්තධම්මෙසු පධානං හුත්වා පවත්තති ති ඉදමෙව තෙන විසෙසෙතබ්බං. තෙනෙව හි පාළියං සෙසාකුසලෙසු උද්ධච්චං යෙවාපනකවසෙන ආගතං, ඉධ පන සරූපතො යෙව නිද්දිට්ඨං එවං අසාධාරණ - පධාන ධම්මවසෙන මොහමූලං විචිකිච්ඡාසම්පයුත්තං උද්ධච්චසම්ප- යුත්තං ති දුවිධං වුත්තන්ති දට්ඨබ්බං. **අසන්නිට්ඨානං** සංසයො, **වික්ඛෙපො** අවූපසමො භන්තතා ති අත්ථො තත්ථ විචිකිච්ඡාසහගතස්ස අසන්නිට්ඨානකාලෙ, උද්ධච්චසහගතස්ස වික්ඛෙපකාලෙ ච පවත්ති වෙදිතබ්බා. **යථානුරූපං** ති පටිසන්ධි ජනකාජනකස්ස කම්මපථභාව - පත්තාපත්තස්ස ච අනුරූපතො.

---

1 පරස්ස භණ්ඩං (මූලපොත්ථකෙ)

අථ වා **යථානුරූපං** ති යො යස්ස හෙතු, තදනුරූපතො. යෙභුය්‍යෙන ලොභමූලකෙන කම්මෙන[1] ඛුප්පිපාසානිරන්තරෙ පෙතවිසයෙ උප්පජ්ජන්ති. දොසමූලකෙන දොසො විය චණ්ඩ-ජාතතාය (?) තංසරික්ඛකෙ නිරයෙ. මොහමූලකෙන නිච්ච-සම්මූළ්හාය තිරච්ඡානයොනියං. තස්මා ලොභාදිහෙතු-අනුරූපතො තත්ථ තත්ථ අපායෙ උප්පත්තිං නිප්ඵාදෙති ති ආහ: **යථානුරූපං අපායෙසු උප්පත්තියා** ති. අකුසලවිපාකානං දුක්ඛප්පධානතාය තෙසු [අදුක්ඛමසුඛම්පි දුක්ඛමෙවාති කත්වා[2] **දුක්ඛවිසෙසස්සාති** ආහ.

(**13.**) **අපායෙන** අලාමකෙන වා, **පාපාපාපපහීනෙන පාපා පාපෙසු** මානසෙසු යං පාපමානසං වුත්තං, පාපාපාපෙසු පුග්ගලෙසු **අපායෙන,** පාපාපාපපහීනෙන යං **පාපමානසං වුත්තං** ති වා සම්බන්ධො. අථ වා **පාපාපාපපහීනෙන** පාපාපාපෙසු මානසෙසු පාපෙන පාපවසෙන යං පාපමානසං වුත්තන්ති යොජනා. අයම්පනෙත්ථ අධිප්පායො: අසම්මාසම්බුද්ධෙන තාව ධම්මසභාවස්ස දුබ්බිජානියත්තා කුසලම්පි අකුසලතො අකුසලම්පි කුසලතො වුච්චෙය්‍ය. භගවතො පන සහවාසනාහි විද්ධංසිතාකුසලස්ස කම්මක්ඛයකරඤාණෙන පච්චයවෙකල්ලතො විද්ධංසිත-කුසලාකුසලකම්මස්ස[3] සම්බුද්ධභාවතො එකන්තෙනෙව අකුසලදෙසනා අකුසලධම්මවසෙනෙවාති.

### අකුසලවණ්ණනා නිට්ඨිතා.

අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකංති විපාකං. විපක්කභාවමාපන්නානං නාමරූපධම්මානමෙතමධිවචනං. යථාහි ලොකෙ සාලිබීජාදීනං ඵලානි තංසදිසානි නිබ්බත්තානි විපක්කානි නාම හොන්ති, විපාකනිරුත්තිං ච ලභන්ති, න මූලඞ්කුර-පත්ත-දණ්ඩ-නාළාදීනි, එවං කුසලාකුසලානං ඵලානි අරූපධම්මභාවෙන සාරම්මණභාවෙන ච තංසදිසානි විපක්කභාවමාපන්නානීති විපාකනිරුත්තිං ලභන්ති. න පන කම්මාභිනිබ්බත්තාපි රූපධම්මා, කම්මවිසදිසත්තා විපාකමෙව චිත්තං **විපාකචිත්තං.** කරණමත්තං කිරියා, ඵලදානාසම්භවතො. යෙන පන කාරණෙන තස්ස ඵලදානං න සම්භවති, තං හෙට්ඨා වුත්තමෙව. කිරියා එව චිත්තං **ක්‍රියාචිත්තං.** විපාකස්ස කාමාවචරාදිභාවො කුසලෙ වුත්තනයෙන යථාසම්භවං වෙදිතබ්බො. ආලොභාදි-සම්පයුත්තහෙතූහි සහ වත්තනතො **සහෙතුකං.** තදභාවතො **අහෙතුකං.** නිබ්බත්තක හෙතුවසෙන සිජ්ඣමානම්පි හෙතුං සම්පයුත්තහෙතුවසෙනෙව

1. මරම්මපොත්ථකෙ න ති.
2 අයං පාඨො M පොත්ථකෙ නත්ථි.
3. M කුසලකම්මස්ස

සහෙතුකම්හෙතුකං ති වුච්චති. ඉතරථා වවත්ථානාභාවතො. **සකකුසලං වියාති** අත්තනො ජනකකාමාවචරකුසලං විය. ජනක-ජනිතබ්බසම්බන්ධවසෙන හි තං තං කුසලං තස්ස තස්ස විපාකස්ස සකං නාමං දෙති.[1] සකකුසලං වියාති වුත්තත්තා පවත්තාකාර-ආරම්මණාදිතො ච'ස්ස තංසදිසතා ආපජ්ජතීති තං නිවාරණත්ථමාහ **යථා පනා** ති ආදිං. **ඡසු ආරම්මණෙසූති** පරිත්තාදි-අතීතාදි-අජ්ඣත්තාදිභෙදෙසු ඡසු රූපාදිආරම්මණෙසු. භවන්තරපටිසන්ධානතො **පටිසන්ධි.** අවිච්ඡෙදප්පවත්තිහෙතුභාවෙන භවස්ස අංගන්ති **භවඞ්ගං.** නිබ්බත්තනභවතො[2] චුතිහෙතුතාය **චුති. පරිත්තධම්මපරියාපන්නෙසූ ති** කාමාවචරධම්මපරියාපන්නෙසු. කාමාවචරධම්මා හි කිලෙසවික්ඛම්භනාදිසු අසමත්ථභාවෙන පරිත්තානුභාවතාය, ඔළාරිකාහි වා කාමතණ්හාදීහි පරිතො ගහිතත්තා පරිත්තාති වුච්චන්ති. විපාකස්ස පකප්පෙත්වා ආරම්මණගහණාභාවතො කම්මානුරූපමෙවස්ස පවත්තීති පරිත්තකම්මවිපාකො පරිත්තාරම්මණෙ යෙව පවත්තිතුමරහති, න මහග්ගත-අප්පමාණාරම්මණෙසූති වුත්තං **පරිත්තධම්මපරියාපන්නෙසූති.** යදි එවං මහග්ගතකම්මවිපාකොපි මහග්ගතාරම්මණෙ යෙව ආපජ්ජතීති? නාපජ්ජති. සඤ්ඤාවසාරම්මණස්ස සමාධිප්පධානස්ස කම්මස්ස අප්පණාප්පත්තස්ස තාදිසෙනෙව විපාකෙන භවිතබ්බත්තා. වණ්ණ-ලක්ඛණාදිකං හි අගහෙත්වා ලොකසඤ්ඤානුරොධෙනෙව ගහිතෙ පථවාදිකෙ පරිකම්මසඤ්ඤාය සමුප්පාදිතං පටිභාගනිමිත්ත-සංඛාතාරම්මණං සඤ්ඤාජනිතං හොති තස්මා තදාරම්මණස්ස සමාධිප්පධානස්ස අප්පණාප්පත්තකම්මස්ස විපාකෙන සමාධිප්ප-ධානතාය[3] අප්පණාප්පත්තිහි විය සඤ්ඤාජනිතාරම්මණාය නිබ්බිසෙසෙනෙව භවිතබ්බං. පරිත්තවිපාකො පන මහග්ගතාප්පමාණ-පඤ්ඤත්තාරම්මණ-කම්මනිබ්බත්තොපි[4] [වසන්තසිරිසමුග්ගතෙ උය්‍යානෙ වසිත්වා පි රසතණ්හාවසෙන ආමකසුසානාභිමුඛසිගාලස්ස විය මහග්ගත-අප්පමාණධම්මෙ ආරබ්භ පවත්තිත්වාපි කාමතණ්හා-වසෙන පරිත්තධම්මනින්නස්සෙව කම්මුනො විපාකතො කම්මානු-රූපතො පරිත්තධම්මමෙව ආරබ්භ පවත්තති. අපි ච, යථා සාමිකායත්තතාය දාසියා පුත්තෙන මාතරා ඉච්ඡිතවිච්ඡිතං කාතුං න සක්කොති, අථ ඛො සාමිකෙනෙව ඉච්ඡිතවිච්ඡිතං කරොති, එවං කාමතණ්හායත්තස්ස පරිත්තකම්මස්ස විපාකොපි කම්මුනා ගහිතා-රම්මණං අගහෙත්වා කාමතණ්හාය ගහිතමෙව ගණ්හාතීති පරිත්ත-ධම්මමෙව ආරබ්භ පවත්තති, න මහග්ගතං අප්පමාණං වා. තෙනෙව ච **පට්ඨානෙ** "මහග්ගතාරම්මණො ධම්මො පරිත්තාරම්ම-

1. M හොති 2 M නිබ්බත්තිතභවන්තා පරිගඤ්ඤතාය. 3 M සමාධිප්පධාන. M නිබ්බත්තොපි හොති, සො පරතො ආගමිස්සති.

ණස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො. අප්පමාණාරම්මණො ධම්මො පරිත්තාරම්මණස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො''ති, **ධම්මසඞ්ගණියං** ච ''සබ්බො කාමාවචරස්ස විපාකො කිරියාමනොධාතු, කිරියාහෙතුක - මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා, ඉමෙ ධම්මා පරිත්තාරම්මණා''ති කාමාවචරවිපාකස්ස එකන්තපරිත්තාරම්මණතා වුත්තා වුත්තසභාවවිරහිතස්ස කම්මුනො විපාකත්තා පරිත්තමෙව ආරම්මණං කරොති, න මග්ගතාරම්මණං පඤ්ඤත්තිං වා. තෙනා'හ භගවා: ''සබ්බො කාමාවචරස්ස විපාකො ක්‍රියාමනොධාතු ක්‍රියාහෙතුකමනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා, ඉමෙ ධම්මා පරිත්තාරම්මණා'' ති.

**සම්පයුත්තධම්මානං** ති පාළියං සරූපතො ආගතසම්පයුත්තධම්මානං. තෙසං වසෙන කුසලතො විපාකස්ස විසෙසාභාවො, යෙවාපනකධම්මවසෙන පන විසෙසො[1] හොති; සො පරතො ආගමිස්සති. **මුඛනිමිත්තං විය** ති මුඛං පටිච්ච උප්පන්නනිමිත්තං විය යථා හි තං නිරීහං[2] අපරං මුඛනිමිත්තං උප්පාදෙතුං, අඤ්ඤං වා කිඤ්චි අත්තනො බලෙන කාතුං න සක්කොති, එවමෙතම්පි විකුබ්බනාදිසු න උස්සහති; තෙනාහ **නිරුස්සාහං** ති. උස්සාහොති චෙත්ථ අනුපච්ඡින්නාවිජ්ජාමානානුසයස්මිං සන්තානෙ විපාකුප්පාදනසමත්ථතාසඞ්ඛාතො ආසෙවනපච්චයභාවසඞ්ඛාතො විඤ්ඤත්තිජනකතාසඞ්ඛාතො ච ව්‍යාපාරො; සො විපාකෙ නත්ථි, කම්මවෙගුක්ඛිත්තත්තා පතිතං විය හුත්වා පවත්තමානස්ස තස්ස එකන්තෙන දුබ්බලභාවතොති තං නිරුස්සාහං

**විපච්චනට්ඨානං** ති විපච්චනවසෙන පවත්තනට්ඨානං. පටිසන්ධි - භවඞ්ග - චුති - තදාරම්මණවසෙන චතුකිච්චානං එතෙසං පවත්තිඔකාසොති අත්ථො. තත්ථ චුති - භවඞ්ගානමන්තරාලං පටිසන්ධිකිච්චානං ඨානං. පටිසන්ධි - ආවජ්ජනානං, ජවනාවජ්ජනානං, වොත්ථපනාවජ්ජනානං ච අන්තරාලං භවඞ්ගකිච්චානං ඨානං. තදාරම්මණපටිසන්ධීනං ජවනපටිසන්ධීනං භවඞ්ගපටිසන්ධීනං වා අන්තරාලං චුතිකිච්චට්ඨානං. ජවන - භවඞ්ගානමන්තරාලං තදාරම්මණකිච්චට්ඨානං ති දට්ඨබ්බං. යස්මා පනෙතං ඨානං ධම්මානං තංතංකිච්චවසෙන පාකටං හොති, තස්මා ඨානං වෙදිතබ්බං ති ඨානං උද්ධරිත්වා පාකටකිච්චවසෙනෙව තං පකාසෙතුං **ඉමිනා** හි ති ආදි වුත්තං. අථ වා කිච්චමපි කිච්චවන්තානං පවත්තිට්ඨානභාවෙන ගය්හතීති ඨානනාමි පි කිච්චමෙව උද්ධටං ති තං සරූපතො දස්සෙතුං **ඉමානි** හි ති ආදි වුත්තං. අණ්ඩජ -

1 වසන්තඊරියමුග්ගතාදි වාක්‍යප්පදෙසො යාව ඉමං ඨානං මරම්මපොත්ථකෙ න දිස්සති 2. B නිමිත්තං

ජලාබුජයොනිසම්භවානං මනුස්සානං විනිපාතිකාසුරානං ච අහෙතුකපටිසන්ධියා පි සම්භවතො ආහ (32.) **දුහෙතුකා - තිහෙතුනං** ති. පටිසන්ධිවිඤ්ඤාණසම්පයුත්තා ද්වෙ අලොභාදයො හෙතූ යෙසං, තෙ දුහෙතුකා. එස නයො තිහෙතුකෙසුපි. තත්ථ දුහෙතුකානං ඤාණවිප්පයුත්තානි චත්තාරි, තිහෙතුකානං ඤාණසම්පයුත්තානි චත්තාරි පටිසන්ධියො හොන්ති; තථා භවඞ්ග-චුතියොපි. යෙන යෙන හි චිත්තෙන පටිසන්ධි හොති, තං තදෙව භවංගචුතිවසෙන පි පවත්තති. තදාරම්මණං පන අවිසෙසෙන දට්ඨබ්බං, දුහෙතුකානම්පි තිහෙතුකතදාරම්මණස්ස ඉච්ඡිතත්තා.

නනු චෙතං අසම්පෙක්ඛිතාභිධානං, ආචරියෙනෙව ඉමස්ස පටිසිද්ධත්තා. තථා හි වක්ඛති:

"අහෙතුපටිසන්ධිස්ස න තදාරම්මණං භවෙ
දුහෙතුකං, තිහෙතුං වා දුහෙතුපටිසන්ධිතො" ති?

නයිදමසම්පෙක්ඛිතාභිධානං. පටිසන්ධිජනක-කම්මනිබ්බත්තං[1] සන්ධාය තත්ථ පටිසිද්ධත්තා. යෙන හි කම්මෙන යා පටිසන්ධි ආදින්නා, න තං තතො අධිකතරං තදාරම්මණං පවත්තෙන අභිනිප්ඵාදෙති. යම්පන අඤ්ඤම්පි කිඤ්චි කම්මං තදා ලද්ධාවකාසං සියා, න තං තත්ථ තතො අධිකතරම්පි විපාකං න නිබ්බත්තෙතීති නත්ථි. "සහෙතුකං භවඞ්ගං අහෙතුකස්ස භවඞ්ගස්ස අනන්තර-පච්චයො" ති හි පට්ඨානවචනෙන අහෙතුකස්සාපි නානාකම්මෙන සුගතියං සහෙතුකතදාරම්මණමනුඤ්ඤාතං. තෙනාහු ආචරියා:

"හොති අඤ්ඤෙන කම්මෙන සහෙතු පි අහෙතුනං" ති. යථා ච අහෙතුකස්ස සහෙතුකං; එවං දුහෙතුකස්ස තිහෙතුකම්පි ඉච්ඡන්ති. **ආචරියජොතිපාලත්ථෙරා** පන: සහෙතුකං ති අවිසෙසෙන වුත්තත්තා අහෙතුකානම්පි තිහෙතුක - තදාරම්මණං ඉච්ඡති. වුත්තං හි තෙහි "සහෙතුකං ති අවිසෙසාපදෙසෙන[2] දුහෙතුකං තිහෙතුකං ච ගහෙතබ්බං. තථා හි අට්ඨකථායං අහෙතුකස්සා පි තිහෙතුකතදාලම්බනමභිහිතං; යං චරහි අත්ථසමාසෙ අහෙතුකානං තිහෙතුකඵලානි දෙතී ති වුත්තං. තං කථං? සො එව පුච්ඡිතබ්බො, යො තස්ස කත්තා" ති. අපරෙ පන මූලසන්ධියා ජළත්තා තස්ස තිහෙතුකතදාලම්බනං ලබ්භති යෙවාති වදන්ති.

(33) **තතො ති** පටිසන්ධිතො පරං දුතියචිත්තතො පට්ඨාය; සති අන්තරා වීථිචිත්තුප්පාදෙ තදවසානෙ උප්පජ්ජමානස්ස, යාවතායුකං

1 M පටිසන්ධිජනකකම්මං. 2. M. අවිසෙසාපදෙසෙන

අනිවත්තනතො වුත්තං **යාවතායුකා**ති. **බලවාරම්මණෙ**ති අති මහන්ත-විභූතාරම්මණෙ. පඤ්චද්වාරෙ හි අතිමහන්තාරම්මණෙ, මනොද්වාරෙ විභූතාරම්මණෙ තදාරම්මණමුප්පජ්ජති, න අඤ්ඤදා. එකාරම්මණප්පවත්තියා පටිසන්ධාදීනං තිණ්ණම්පි එකත්තා දස්සනත්ථං උද්දෙසෙ තදාරම්මණස්ස අවසානකරණං; ඉධ පන පවත්තික්කමවසෙන චුතියා අවසානකරණන්ති දට්ඨබ්බං.

(35.) **කම්මද්වාර**න්ති කායවචීකම්මද්වාරං;[1] තස්ස[1] ජනක වසෙන පවත්තන්ති වුත්තං හොති. තත්ථ කායොති කායවිඤ්ඤත්ති. කම්මන්ති තංසමුට්ඨාපිකා චෙතනා කායෙන කතං කම්මං කායකම්මං. කිඤ්චාපි හි කායො කම්මස්ස චතුවීසතිපච්චයෙසු න කෙනචි පච්චයෙන පච්චයො හොති; තථාපි තංසමුට්ඨානස්ස තස්සම්භාවෙනෙව? කායකම්මාදිවොහාරොති තං තෙන කතන්ති වුච්චති. කායකම්මස්ස පවත්තිට්ඨානභූතං ද්වාරං කායකම්මද්වාරං. යදි එවං කම්මද්වාරවවත්ථානං න සියා, කායද්වාරෙන හි සිද්ධං කම්මං කායකම්මන්ති වුච්චති, "ද්වාරෙ චරන්ති කම්මානී"ති වචනතො වචීද්වාරෙපි සිජ්ඣතීති ද්වාරෙන කම්මවවත්ථානං න සියා. තථා වචීකම්මං කායද්වාරෙ පි සිජ්ඣතීති කම්මෙන ද්වාරවවත්ථානම්පි න සියාති? තං න තබ්බහුලවුත්තියා චෙව යෙභුය්‍යවුත්තියා[3] ච වවත්ථිතත්තා. කායකම්මං හි කායද්වාරෙ යෙව බහුලං පවත්තති, අප්පං වචීද්වාරෙ. තස්මා කායද්වාරෙ බහුලං පවත්තනතො එතස්ස කායකම්මභාවො සිද්ධොව, වනචරකාදීනං වනචර කාදිභාවො විය. තථා කායකම්මමෙව යෙභුය්‍යෙන එත්ථෙව පවත්තිතො අස්ස කායකම්මද්වාරභාවො සිද්ධො, බ්‍රාහ්මණගාමාදීනං බ්‍රාහ්මණගාමාදිභාවො වියාති තෙන කම්මද්වාරවවත්ථානෙ කොචි විබන්ධොති. වචීකම්මද්වාරෙපි එස පබන්ධො යථාසම්භවං දට්ඨබ්බො. මනොකම්මද්වාරං පන සයං මනො යෙව සමානං අත්තනා සහගත චෙතනාභිජ්ඣාදි – කම්මානං පවත්තිද්වාරභාවෙන මනොද්වාරසංඛං ලභතීති න තං චිත්තස්ස උප්පත්තිද්වාරවසෙන ගය්හති. න හි සයං අත්තනොව පවත්තති. යදි පන චිත්තසම්පයුත්ත-කම්මද්වාර භාවෙන අධිප්පෙතා, තදා තෙසං කම්මද්වාරභාවො මනස්මිං උප චාරියතීති සම්පයුත්තධම්මානං චිත්තාධිපතිභාවො චිතෙන වියාති චිත්තං මනොකම්මද්වාරන්ති වුච්චති. සභාවතො පන කම්මද්වාරං නාම සම්පයුත්තධම්මා යෙවාති චිත්තං තතො පවත්තනතො මනො කම්මද්වාරවසෙන පවත්තති. අනන්තරපච්චයභූතස්ස පන මනො-කම්මද්වාරභාවෙ වත්තබ්බමෙව නත්ථි. ඉධ පන (36) **අවිඤ්ඤත්ති ජනකා**ති වචනෙන කායවචීකම්මද්වාරවසෙනෙව අප්පවත්තියා

1. M. කම්මද්වාරස්ස, 2. M. තස්ස සබ්භාවෙනෙව. 3. M. යෙභුය්‍යෙන වුත්තියා.

සාධිතත්තා මනොකම්මද්වාරං න ගහිතමෙව. න හි **අවිඤ්ඤත්ති ජනකත්තා** ති කාරණං මනොකම්මද්වාරවසෙන පි අප්පවත්තිං සාධෙති අථ වා **අවිපාකසභාවතො**ති වචනතො[1] මනොකම්මද්වාරවසෙන පි අප්පවත්ති සාධිතා හොති **කම්මද්වාරං** ති එත්ථ කම්මග්ගහණෙන නානාක්ඛණික-කම්මස්සපි අධිප්පෙතත්තා තස්සාපි ගහණං දට්ඨබ්බං. ඉති ඉමෙසු කායවචීකම්මද්වාරසඞ්ඛාතෙසු වීසු ද්වාරෙසු මනොකම්මද්වාරෙන සහ තීසු එව වා යථා කුසලං පවත්තති, න එවං විපාකො යථා ච කුසලං කායවචීමනොකම්මස්ස අයූහනවසෙන දානාදිපුඤ්ඤකිරියවත්ථුවසෙන ච පවත්තති, එවමයං; අයම්පන නෙව කායවචීකම්මද්වාරෙසු පවත්තති, විඤ්ඤත්තිසමුට්ඨාපකත්තාභාවතො. න කම්මවසෙන, මනොකම්මද්වාරවසෙනාපි වා පවත්තති, විපාකුප්පාදනසභාවාභාවතො. න පුඤ්ඤකිරියවසෙන පවත්තති දානාදිවසෙන අප්පවත්තනතොති දස්සෙතුං: **"කම්ම-ද්වාරං ච කම්මං ච =පෙ= පුඤ්ඤානි නො සමා"** ති වුත්තං.

(34) **එවං** ති දානාදිවසෙන පරිත්තාරම්මණත්තාති ආදි සම්පයුත්තවසෙන[2] විසෙසදස්සනං. යස්මා එතෙ පරිත්තාරම්මණා, කරුණාමුදිතා ච පඤ්ඤත්තාරම්මණා සත්තපඤ්ඤත්තියං පවත්තනතො, තස්මා ද්වින්නමාලම්බණානං එකචිත්තස්ස විසයභාවං නානුගමනතො න තෙසු කරුණාමුදිතා කදාචි පි ජායන්තීති අයමෙත්ථ පඨමගාථාය අධිප්පායො.

(37.) **දුතියගාථාය** පන හි-සද්දො, යස්මාති අත්ථො. ඉදං වුත්තං හොති: භගවතා හි සික්ඛාපදවිභඞ්ගෙ **"පඤ්චසික්ඛාපදා කුසලා"**ති එවං පාණාතිපාතා වෙරමණීආදීනං පඤ්චන්නං සික්ඛාපදානං කුසලභාවො වුත්තො. තෙ ච විරති-සභාවා එව: ආදිතො තිණ්ණං සික්ඛාපදානං පච්ඡිමස්ස ච සම්මාකම්මන්තෙ, ඉතරස්ස සම්මාවාචායං, පඤ්චන්නම්පි මිච්ඡාජීවහෙතුකපඤ්ච-දුච්චරිතතො විරමනවසෙන පවත්තානං සම්මාආජීවෙ ච අන්තොභාවතො. තස්මා තා එකන්තකුසලභූතා, න කදාචි අව්‍යාකතෙසු ලබ්භන්ති. ඉතරථා සඞ්ඛාසතිආදයො විය "සියා කුසලා, සියා අව්‍යාකතා"ති වුච්චෙය්‍යුංති. යදි එවං ලොකුත්තරඵලෙසු අට්ඨ සත්ත වා මග්ගඞ්ගා න ලබ්භන්තීති? නො න ලබ්භන්ති, ලොකියවිරතීනමෙව තත්ථ එකන්තකුසලභාවස්ස වුත්තත්තා. ලොකුත්තරවිරතියො පන ඵලස්ස මග්ගපටිබිම්බභූ-තත්තා මග්ගසදිසතො අට්ඨඞ්ගික[3]-සත්තඞ්ගිකතාය ච භවිතබ්බංති න එකන්තකුසලභාවෙන වවත්ථාපෙතුං යුත්තාති[4] කත්වා උපරි ලොකුත්තරඵලෙසුපි අට්ඨඞ්ගිකතාභෙදෙ මග්ගො උද්ධටොති.

1. M. සූචනතො. 2. M. සම්පයුත්තධම්මවසෙන. 3. M. අට්ඨඞ්ගිකතාය. 4. M එවං ච.

(39.) **තථාධිපතිනො** ති ආදි අධිපතිවසෙන විසෙසදස්සනං, සබ්බසම්පි තෙභූමකකුසලානං අඤ්ඤො ආයූහනකාලො, අඤ්ඤො විපච්චනකාලො; තස්මා න තානි අත්තනො විපාකෙහි අධිපතිං ගාහාපෙතුං සක්කොන්තීති න තෙ ඡන්දාදීනි ධුරං කත්වා පවත්තන්ති. ලොකුත්තරකුසලානි පන ආයූහනකාලස්ස විපච්චනකාලස්ස ච අනන්තරාභාවතො අත්තනො ඡන්දාදීනං බලානං[1] අවූපසන්තකාලෙයෙව විපාකං නිබ්බත්තෙන්තීති අනන්තරපච්චයා හුත්වා විපාකෙහි අධිපතිං ගාහාපෙතුං සක්කොන්ති. එවඤ්ච කත්වා උපරි ලොකුත්තරවිපාකානං අධිපතියොගං වක්ඛති. යස්මා **මොරවාපිවාසිමහාථෙරෙන** විපාකානං ආගමනතො අසංඛාරසසංඛාරිකභාවො ඉච්ඡිතො, **තිපිටකචූළනාගත්ථෙරෙන** පච්චයතො, තස්මා උභින්නං මතිදස්සනත්ථමාහ: (40) **අසංඛාර - සසංඛාරවිධානං** ති ආදි, පුරිමත්ථෙරො හි යථා මුඛෙ චලිතෙ ආදාසතලෙ මුඛනිමිත්තං චලති. එවං අසංඛාරිකස්ස කුසලස්ස විපාකො අසංඛාරිකො; සසංඛාරිකස්ස සසංඛාරිකොති ආහ. තස්මා තස්ස මතිදස්සනත්ථං **අසංඛාර සසංඛාරවිධානං පන පුඤ්ඤතො** ති වුත්තං. දුතියත්ථෙරො පන අසංඛාරිකාදිසු යෙන කෙනචි චෙතනාකම්මෙ ආයූහිතෙ ආසන්නමරණස්ස අත්තනො පරෙසං වා පයොගෙන විනා අසංඛාරෙන අප්පයොගෙන කම්මනිමිත්ත - ගතිනිමිත්තපච්චුපට්ඨානෙ පටිසන්ධි උප්පජ්ජමානා අසංඛාරිකා; යස්ස කස්සචි පයොගබලෙන[2] කම්මාදිපච්චුපට්ඨානෙ සසංඛාරිකා. තථා භවඞ්ගචුතියොපි තදාරම්මණං ච පණීතාපණීත - උතුභොජනාදිපච්චයවසෙන අනන්තරනිරුද්ධ - කුසලාකුසලස්ස වසෙන වා අසංඛාරං සසංඛාරන්ති, එවං පච්චයතො අසංඛාරිකාදිවිධානමාහ. තස්මා තස්ස මතිදස්සනත්ථං (40) **ඤෙය්‍යං පච්චයතො චෙවා**ති ආදි වුත්තං. ඉදමෙව පන ආචරියා පසංසන්ති (41) **හීනාදීනං විපාකත්තා** අධිපතියොගාභාවෙපි හීනමජ්ඣිමපණීතානං කුසලානං විපාකත්තා. එතෙන ආගමනතො හීනාදිභාවං විභාවෙති. වෙනෙය්‍යසන්තානගත - කිලෙසමලවිධමනෙන තස්ස පුනාතීති පුඤ්ඤං. පුඤ්ඤ[3] වාදෙ, වචීඝොසො එතස්ස, වුත්තනයෙනෙව පුඤ්ඤං වදතීති වා පුඤ්ඤවාදී. තෙන **පුඤ්ඤවාදිනා**. (42) **එකන්තෙන සවත්ථුකං** ති වුත්තෙපි රූපලොකෙ පවත්ති අනිවාරිතො ති ආහ **කාමලොකස්මිං** ති. **න පනඤ්ඤත්ථ ජායතෙ** ති ඉමිනා පන ව්‍යතිරෙකතො ලද්ධමත්ථං දස්සෙති.

**8.** එවං තාව සහෙතුකවිපාකෙ නිද්දිසිත්වා ඉදානි අහෙතුකෙ නිද්දිසිතුං **අහෙතුකවිපාකචිත්තානං පනා**ති ආදි වුත්තං. තස්මා

1. M. බලස්ස. 2. M. සප්පයොගෙන. 3. පුඤ්ඤ.

පන සහෙතුකස්ස කම්මස්ස අහෙතුකො විපාකො හොතීති?
වුච්චතෙ: චක්ඛුවිඤ්ඤාණාදීනං තාව පඤ්චන්නං ආරම්මණා-
භිනිපාතමත්තත්තා අලොභාදිසම්පයොගො න සම්භවති. තථා
මන්දතරකිච්චෙසු සම්පටිච්ඡනසන්තීරණෙසූති එවං හෙතූනං
උප්පත්තියා අසම්භවතො ච තෙසං අහෙතුකතා දට්ඨබ්බා.
උපෙක්ඛාදියොගෙ පන චක්ඛුවිඤ්ඤාණාදීනං තාව චතුන්නං
ඉට්ඨාරම්මණෙපි පවත්තමානානං වත්ථාරම්මණසංඝට්ටනාය දුබ්බල-
භාවතො උපෙක්ඛාසහගතතා. කායවිඤ්ඤාණස්ස ච තාය බලව-
භාවතො සුඛසහගතතා හොති. සම්පටිච්ඡනං පන ආරම්මණ-
ඝට්ටනයොග්ගභාවෙන ඔළාරිකත්තා චතුප්පත්තක්ඛණාතීතවසෙන
චිරජාතත්තා ච දුබ්බලං අත්තනො නිස්සයෙන සහ අසමානජාතිකං
ච චක්ඛාදිවත්ථුං නිස්සාය උප්පන්නෙහි චක්ඛුවිඤ්ඤාණාදීහි
ලද්ධානන්තරපච්චයතාය අපුබ්බනිස්සයතාය ච ආරම්මණරසස්සාදෙ
දුබ්බලං ති ඉට්ඨාදීසු ආරම්මණෙසු උපෙක්ඛාසහගතමෙව. සන්තී-
රණම්පන වුත්තවිපරීතතො ඉට්ඨාරම්මණෙ සොමනස්සසහගතං,
ඉට්ඨමජ්ඣත්තෙ ච උපෙක්ඛාසහගතං ති දට්ඨබ්බං. මනොවිඤ්ඤාණධාතු
විය විසිට්ඨමනනකිච්චාභාවතො **මනොමත්තා,** නිස්සත්ත-
නිජ්ජීවාදිඅත්ථෙහි ධාතු චාති, මනොධාතු. සා හි සති පි විඤ්ඤාණ-
භාවෙ මනොවිඤ්ඤාණතො සම්භුය[1] විසිට්ඨමනනකිච්චාකරණතො[2]
මනනමත්තා යෙව හොතීති. වුත්තලක්ඛණවිපරීතතො පන
මනො ච තං විඤ්ඤාණං චාති මනොවිඤ්ඤාණං. තදෙව
යථාවුත්තඨෙන ධාතූති **මනොවිඤ්ඤාණධාතු.** විඤ්ඤාණපඤ්චකං
නියතාරම්මණං යථාක්කමං රූපාදිඑකෙකසෙව ආරම්මණ-
කරණතො. සෙසත්තයං අනියතාරම්මණං පඤ්චාරම්මණික-
ඡළාරම්මණිකභාවතො,

දට්ඨබ්බතාය **දිට්ඨං,** රූපායතනං. **9.** සොතබ්බතාය **සුතං,**
සද්දායතනං. මුනිතබ්බතාය **මුතං,** සම්පත්තසෙව ගහෙතබ්බතා-
යාති අත්ථො; ගන්ධාදිත්තයස්සෙතං නාමං. චක්ඛාදීහි විනා කෙවලං
මනසා එව විජානිතබ්බතාය **විඤ්ඤාතං,** ධම්මායතනං. අනාමට්ඨ-
කාලවිසෙසවචනත්තා පනෙසං අතීතානාගතාපි රූපාදයො
දිට්ඨාදිසද්දෙහි වුච්චන්ති. තෙනෙව හි දට්ඨබ්බතායාති ආදිනා
කාලසාමඤ්ඤෙනෙව තෙසං නිබ්බචනං වුත්තං. දිට්ඨං ආරම්මණං
යස්ස තං දිට්ඨාරම්මණං, එවං සුතාරම්මණාදිසු. **චක්ඛුතො පවත්තං** ති
චක්ඛුද්වාරතො පවත්තං. සබ්බවාක්‍යානං අවධාරණඵලත්තා.
තෙන මනොධාතුආදීනං චක්ඛුවිඤ්ඤාණභාවො නිවාරිතො හොති,
තෙසං ද්වාරන්තරතො පි පවත්තිසම්භවතො. අථ වා **චක්ඛුතො**

1. M. සම්භවස්ස. 2. M. —කිච්චස්ස අකරණතො.

**පවත්තං** ති ඉදං සඤ්ජාතිප්පවත්තිං සන්ධාය වුත්තං, න සඤ්චරණප්පවත්තිං; තස්මා යථා කුම්භිමුඛතො[1] උදකං සඤ්චරණවසෙන පවත්තති, එවං පවත්තමිධ ගහිතං. යථා පන චන්දකන්තපාසාණතො[2] උදකං සඤ්ජාතිවසෙන පවත්තති, එවං පවත්තමෙවෙදං **චක්ඛුතො පවත්තං** ති ගහිතං. යථා කිං? යථා කුච්ඡිතො සමුට්ඨිතං පිත්ත - සෙම්හ - රුහිරාදි මුඛතො සන්දන්තම්පි මුඛස්සවොති න වුච්චති, මුඛතො යෙව පන සමුට්ඨහිත්වා තතො සවන්තං[3] ඛෙලං මුඛස්සවොති වුච්චති එවං හදයවත්ථුසන්නිස්සයතො උට්ඨහිත්වා චක්ඛුතො පවත්තමානං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං නාම න හොති, චක්ඛුතො යෙව පන සමුට්ඨහිත්වා තතො පවත්තමානං චක්ඛුවිඤ්ඤාණං නාමාති. යො පන ඉමමත්ථං අසල්ලක්ඛෙත්වා ව්‍යඤ්ජනමත්තෙන යෙව අභිනිවිසිත්වා තං ද්වාරප්පවත්තානං සෙසානම්පි චක්ඛුවිඤ්ඤාණභාවං මඤ්ඤෙය්‍ය, තං නිවාරෙතුං පකාරන්තරෙන පි විග්ගහං දස්සෙන්තො ආහ: **චක්ඛුම්හි සන්නිස්සිතං** ති. යථා චක්ඛුතො පවත්තං, චක්ඛුසන්නිස්සිතං වා විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං, එවං සොතවිඤ්ඤාණාදීසු පි "සොතතො පවත්තං, සොතසන්නිස්සිතං වා විඤ්ඤාණං සොතවිඤ්ඤාණං"ති ආදිනා යොජනං අතිදිසන්තො[4] ආහ **තථා සොතවිඤ්ඤාණාදීනි** ති.

චක්ඛුසන්නිස්සිතං හුත්වා රූපස්ස විජානනං ලක්ඛණමෙතස්සාති **චක්ඛුසන්නිස්සිත - රූපවිජානනලක්ඛණං.** තත්ථ චක්ඛුසන්නිස්සිතවචනෙන දිබ්බචක්ඛාදිකං අඤ්ඤං රූපාරම්මණවිඤ්ඤාණං නිවත්තෙති. විජානනගහණෙන චක්ඛුසන්නිස්සිතෙ ඵස්සාදිකෙ[5] නිවත්තෙති. චක්ඛුරූප-ගහණෙන නිස්සයතො ආරම්මණතො ච චිත්තං විභාවෙති, උභයාධීනවුත්තිකත්තා. යදි චක්ඛු නාම න සියා අන්ධාපි රූපං පස්සෙය්‍යුං, න ච පස්සන්ති. යදි ච නීලාදිරූපං නාම න සියා, දෙසාදිනියමෙන න භවිතබ්බං; අත්ථෙව ච නියමො. ඵකන්තසාරම්මණතා ච චිත්තස්ස වුත්තාති. ආරම්මණෙන විනා නීලාදිආභාසං (?) චිත්තං පවත්තතී ති එවං පවත්තො මිච්ඡාවාදෙති ගහෙතබ්බං. තෙනාහ භගවා "චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං"ති ආදි.

එත්ථ සියා. කිම්පනෙතං චක්ඛු රූපඤ්ච විඤ්ඤාණස්ස පච්චයො හොන්තං එකමෙව පච්චයො හොති, උදාහු අනෙකං ති? චක්ඛු තාව එකම්පි රූපං පන අනෙකමෙව සංගතං.[6] කිං කාරණං? පච්චයභාවවිසෙසතො. චක්ඛු හි චක්ඛුවිඤ්ඤාණස්ස

1. M. කුණ්ඩිමුඛතො. 2. B. මන්දකන්දපාසාණතො. 3. M. සවන්තං
4. M. අතිදීපෙන්තො. 5. M. ඵස්සාදිධම්මෙ. 6. M. සංහිතං.

නිස්සය - පුරෙජාත - ඉන්ද්‍රිය - විප්පයුත්තපච්චයෙහි පච්චයො හොන්තං අත්ථිභාවෙනෙව හොති. තස්මිං සති තස්ස භාවතො, අසති අභාවතො යතො තං අත්ථි - අවිගතපච්චයෙහිස්ස පච්චයොති වුච්චති. ස්වායං පච්චයභාවො න එකස්මිං න සම්භවතීති එකම්පි චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයො හොති. රූපං පන යදිපි චක්ඛු විය පුරෙජාත - අත්ථි - අවිගතප්පච්චයෙහි පච්චයො හොති, පුරෙතරං උප්පන්නං හුත්වා විජ්ජමානක්ඛණෙයෙව උපකාරකත්තා. තථාපි අනෙකමෙව සංගතං හුත්වා[1] පච්චයො හොති, ආරම්මණභාවතො. යං හි තං ආරම්මණං තස්ස යථා තථා උපලබ්භනීයවසෙනෙව ආරම්මණපච්චයභාවො. විඤ්ඤාණස්ස ච ඉන්ද්‍රියාධීනවුත්තිකස්ස ආරම්මණසභාවූපලද්ධි න, එකද්විකලාපගතවණ්ණවසෙන හොති, නාපි කතිපයකලාපගතවණ්ණවසෙන. අථ ඛො ආභොගානුරූපං ආපාථගතවණ්ණවසෙනාති අනෙකමෙව රූපං සංහච්චකාරිතාය විඤ්ඤාණස්ස පච්චයො හොතීති. අමුමෙව හි විසෙසං විභාවෙතුං "චක්ඛුං ච පටිච්ච රූපෙ චා" ති පාළියං[2] වචනභෙදො කතොති. එවං සොතවිඤ්ඤාණෙ පි යථාරහං වත්තබ්බං. ඝාණවිඤ්ඤාණාදීනම්පන සම්පත්තගාහිතාය අත්තනො නිස්සයෙන සහ අල්ලීනස්සෙව ගහණතො එකකලාපගතම්පි ගන්ධාදිකං තෙසං උප්පත්තියා පච්චයො හොති. [ඝට්ටිතමෙව ගණ්හන්තීති එකමෙව ගන්ධාදිකං ගණ්හාති.][3]

**රූපමත්තාරම්මණරසං** ති රූපායතනමත්තස්සෙව ආරම්මණකරණරසං. මත්තසද්දෙන යථා ආරම්මණන්තරං නිවත්තෙති එවං රූපායතනෙපි ලබ්භමානෙ එකච්චෙ විසෙසෙ නිවත්තෙති. න හි චක්ඛුවිඤ්ඤාණං වණ්ණමත්තතො අඤ්ඤං කිඤ්චි නීලාදිවිසෙසං තත්ථ ගහෙතුං සක්කොති. තෙනාහ භගවා: "පඤ්චහි විඤ්ඤාණෙහි න කිඤ්චි ධම්මං පටිවිජානාති, අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා" ති. චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජමානං රූපාරම්මණෙ එව උප්පජ්ජනතො තදභිමුඛභාවෙන ගය්හතීති **රූපාභිමුඛභාවපච්චුපට්ඨානං** ති ආහ. අත්තනො අනන්තරං උප්පජ්ජමානානං අරූපධම්මානං සමනන්තරවිගතා අරූපධම්මා පවත්තිඔකාසදානෙන අනන්තර - සමනන්තර - නත්ථි - විගතප්පච්චයෙහි උපකාරකා, නිස්සයාරම්මණධම්මතාය[4] ආසන්නකාරණන්ති දස්සෙන්තො ආහ: **"රූපාරම්මණාය ක්‍රියාමනොධාතුයා අපගමපදට්ඨානං** ති. සොතවිඤ්ඤාණාදීසුපි වුත්තනයෙනෙව අත්ථො වෙදිතබ්බො.

---

1. M. සංහිතං හුත්වා. 2. M මරම්මපොත්ථකෙ නත්ථි. 3. මරම්මපොත්ථකෙ නත්ථි 4. M. නිස්සයාරම්මණා ධම්මා විය.

කිරියාමනොධාතුයා ආරම්මණභෙදතො භින්නසභාවත්තා ආහ **කිරියාමනොධාතූනං** ති: චක්ඛුවිඤ්ඤාණාදීහි ගහිත-රූපාදිආරම්මණං තදනන්තරමෙව අපරිපතන්තං කත්වා සම්පටිච්ඡන්තී ගණ්හන්තී විය හොතීති වුත්තං **රූපාදිසම්පටිච්ඡනරසා** ති තථාභාවෙන සම්පටිච්ඡනභාවෙන පච්චුපට්ඨාතීති **තථාභාවපච්චුපට්ඨානා.** ඡසු ආරම්මණෙසු කදාචි පඤ්චන්නං, ජවනඞ්ගාදිවසෙන තතොපි ඌනානං, බ්‍රහ්මලොකෙ ච ද්වින්නමෙව විජානනසභාවාපි සබ්බාරම්මණවිජානනලක්ඛණාති[1] වුත්තා. තං සභාවං නාතිවත්තන්තතො ඡසෙව වා ඉතරෙසං ආරම්මණානං අනොතාගධත්තා. **සන්තීරණාදිරසා** ති යථාසම්භවං සන්තීරණ-තදාරම්මණකිච්චා, සන්තීරණ-තදාරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුතිකිච්චාති අධිප්පායො. **හදයවත්ථුපදට්ඨානා** ති ඉදං ඉමාසං ද්වින්නං මනොවිඤ්ඤාණධාතූනං අනිබද්ධට්ඨානතාය නිබන්ධකාරණං දස්සෙතුං වුත්තං. වුත්තනයෙන පන තං තං අනන්තරාතීත-විඤ්ඤාණපගමපදට්ඨානතාපි වත්තුං වට්ටති යෙව. අහෙතුක චිත්තානං විසුං විසුං ලක්ඛණාදිකස්ස දස්සිතත්තා පරිසෙසතො අහෙතුකචිත්තානං එකසදිසමෙව ලක්ඛණාදිකන්ති විඤ්ඤායති. තම්පන හෙට්ඨා විභාවිතමෙව.

ඉදානි ඉමාසං ආරම්මණාදිතො භෙදං දස්සෙතුං **තත්ථ පඨමා** ති ආදි වුත්තං. **එකන්තමිට්ඨාරම්මණෙ** ති එකන්තෙනෙව ඉට්ඨාරම්මණෙ අනිට්ඨාරම්මණෙති අත්ථො. **10. පඤ්චසු ඨානෙසූ** ති සහෙතුකවිපාකානං වුත්තෙසු චතූසු සම්පටිච්ඡන-වොට්ඨපනානං අන්තරාළ සංඛාත-සන්තීරණට්ඨානෙ චාති පඤ්චසු ඨානෙසු, පඤ්චසු කිච්චෙසු වාති අත්ථො. කිඤ්චාපි සොමනස්සපටිසන්ධිකස්ස දොමනස්සජවනාවසානෙ තදාරම්මණභවඞ්ගසම්භවෙ අසති යං කිඤ්චි පරිචිතපුබ්බං පරිත්තාරම්මණමාරබ්භ උපෙක්ඛාසහගතං සන්තීරණමුප්පජ්ජතීති ඉච්ඡිතං. තථා පන උප්පජ්ජමානස්ස කදාචි යෙව සම්භවතො යෙභුය්‍යප්පවත්තිං ගහෙත්වා ඡට්ඨානානි අවත්වා පඤ්චෙව වුත්තානි. අථ වා තං උප්පජ්ජමානං තදාරම්මණට්ඨානෙ යෙව නිබ්බත්තතීති තංවසෙනෙව තස්සාපි ඨානං සංගහිතන්ති දට්ඨබ්බං. අචක්ඛුසංවත්තනික-කම්මනිබ්බත්තතාය ජාතියා අන්ධොති **ජච්චන්ධො.** කිඤ්චාපි හි ජාතික්ඛණෙ අණ්ඩජ-ජලාබුජානං සබ්බෙසම්පි චක්ඛු නත්ථි, යස්ස භාවාභාවතො අන්ධානන්ධවිචාරණා භාවෙය්‍ය; තථා පි චක්ඛුස්ස උප්පජ්ජනාරහකාලෙපි චක්ඛුප්පත්තිවිබන්ධකෙන කම්මුනා පටිහතසාමත්ථියෙන පටිසන්ධිදායකෙන ඉතරෙනාපි වා කම්මෙන තස්ස අනුප්පාදියමානත්තා සත්තො ජච්චන්ධොති වුච්චති. අථවා

1. M. ජලාරම්මණ.-

ජච්චන්ධොති පසූතියං[1] යෙව අන්ධො, මාතුකුච්ඡියං යෙව අන්ධො හුත්වා නික්ඛන්තොති අත්ථො. තෙන අහෙතුක – තිහෙතුකානං මාතුකුච්ඡිගතකාලෙපි චක්ඛුස්ස අවිජ්ජමානතං සිද්ධං හොති. එවං ජාතිබධිරාදීසුපි යථාරහං වත්තබ්බං. **ජච්චජළොති** ජාතියා අඤ්ඤාණකො. කිඤ්චාපි දුහෙතුකපටිසන්ධිකොපි ජාතියං අඤ්ඤාණකො, තස්ස පන පවත්තියං පඤ්ඤා සම්භවතීති. වුත්තනයෙන යෙභුය්‍යතො[2] පවත්තියම්පි පඤ්ඤායාසම්භවතො ජච්චජළො වෙදිතබ්බො. **ජච්චුම්මත්තකොති** සුරාමෙරයපානාදි–උම්මත්තකභාවසංවත්තනික-කම්මපරිභාවිතෙන කම්මෙන ගහිතපටිසන්ධිකො. **පණ්ඩකොති** පරදාරගමනාදිකම්ම – පරිභාවිතෙන කම්මුනා ගහිතපටිසන්ධිකො. සො පඤ්චවිධො: ආසිත්තපණ්ඩකො, උසූයපණ්ඩකො, පක්ඛපණ්ඩකො, ඔපක්කමික පණ්ඩකො, නපුංසකපණ්ඩකොති ඉධ පන ඔපක්කමිකපණ්ඩකස්ස සහෙතුකස්සාපි භාවතො නපුංසකස්ස කස්සචි විසුං ගහණතො තයොව පණ්ඩකා අධිප්පෙතා. ආදිසද්දෙන ජාතිමූග–ජාතිපඞ්ගුල–මම්මනාදීනං සංගහො. කෙචි පන: එකච්චෙ අහෙතුකපටිසන්ධිකා අවිකලින්ද්‍රියා හුත්වා ථොකං අවිචාරණපකතිකාපි හොන්ති, තස්මා තාදිසානම්පි ඉධ ආදිසද්දෙන සංගහොති වදන්ති. එවඤ්ච ජච්චන්ධාදීනමෙව අයං පටිසන්ධීති න ගහෙතබ්බා ජච්චන්ධාදයො පන ඉමිනා පටිසන්ධිං ගණ්හන්තීති ගහෙතබ්බං.

**තිහෙතුක – පුඤ්ඤස්සාති** තිහෙතුකස්සාපි උක්කට්ඨපුඤ්ඤස්ස. දුහෙතුකපුඤ්ඤකම්මස්ස පන සබ්බත්ථාපි සොළසන්නං විපාකානං අසම්භවතො තප්පටික්ඛෙපකරත්තා[3] වෙදනාය **තිහෙතුක පුඤ්ඤස්සාති** අවිසෙසතො වුත්තං.

**කාමාවචරවිපාකවණ්ණනා නිට්ඨිතා.**

මහග්ගතවිපාකානං තංතංකුසලාගමනවසෙනෙව ඣානංගභානි, න පන භාවනාවිසෙසෙනාති තෙසං පහානඞ්ගානි අනුද්ධටානි. **උපපත්තියන්ති** උප්පත්තිභවෙ **අරූපාවචරවිපාකවිඤ්ඤාණානි වුච්චන්ති**ති සම්බන්ධො. (44) **කුසලානුගතං පාකා**ති කුසලානුරූපං කුසලසදිසං කත්වා, යථා කාමාවචරවිපාකා කුසලතො සදිසම්පි[4] විසදිසම්පි කත්වා විභත්තා, එවමකත්වා කුසලසදිසමෙව කත්වාති අත්ථං වදන්ති. අට්ඨකථායම්පන කුසලානන්තරං කත්වා මහග්ගතවිපාකානං භාජිතපාළිං සන්ධාය **කුසලානුගතං පාකා භාජිතං** ති වුත්තං. පාළියං හි: "කතමෙ ධම්මා අබ්‍යාකතා? කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කටත්තා උපචිතත්තා චක්ඛු–

1. B. පච්චූනියං. 2. මිරම්මපොත්ථකෙ නත්ථි. 3 M තප්පටික්ඛෙප–පරත්තා. 4. M පොත්ථකෙ නත්ථි.

විඤ්ඤාණං උප්පන්නං හොති”ති ආදිනා කාමාවචරවිපාකං විභජිත්වා මහග්ගතවිපාකං විභජන්තෙන “කතමෙ ධම්මා අබ්‍යාකතා? යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි = පෙ = පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති = පෙ = අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා, තස්සෙව රූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි =පෙ= පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉමෙ ධම්මා අබ්‍යාකතා” ති එවං කුසලං උද්දිසිත්වා තදනන්තරං කත්වා මහග්ගතවිපාකං විභත්තං. තස්මා යථා කාමාවචරවිපාකං එවං අවිභජිත්වා ඉදං කුසලානන්තරං කත්වා විභත්තන්ති ඉමමත්ථං ජොතෙතුං අට්ඨකථායං “කුසලානුගතං කත්වා”ති වුත්තං. ඉමිනාපි ච ආචරියෙන පරිහාරමුඛෙන වක්ඛමාන - අත්ථවිසෙසවචනිච්ඡාය තත්ථ වුත්තනයෙනෙව චොදනා කතා. එවං හි සති කුසලානන්තරං යෙව ඵලං උප්පජ්ජතීති ඤාපනං සුඛුප්පන්නං හොතීති අයමෙත්ථ අම්හාකං ආචරියමග්ගො.[1] **මහග්ගතන්ති** මහග්ගතවිපාකං; තං හි ඉධ අධිකතං[2]. **කාමාවචරපුඤ්ඤං ච නාසමානඵලං යතො** ති යස්මා කාමාවචරකුසලං අසමානඵලං හොති, තිහෙතුකස්ස දුහෙතුකාහෙතුකවිපාකානං, දුහෙතුකස්ස ච අහෙතුකවිපාකානම්පි ජනනතො; න එවමිදං. ඉදම්පන එකන්තෙනෙව සදිසවිපාකජනනතො සමානඵලමෙව, තස්මාති අත්ථො. එත්ථ ච කුසලන්ති අවුත්තෙපි **කාමාවචරපුඤ්ඤංවා** ති උපමිතත්තා උපමෙයස්ස පි කුසලභාවො විඤ්ඤායති. කස්මා පනෙතං සදිසවිපකං, න කමාවචරං විය විසදිසවිපාකන්ති? වුච්චතෙ: කාමාවචරපුඤ්ඤං හි ආචිණ්ණත්තා රූපතණ්හාදි –. නානාවත්ථුක – කාමතණ්හූපනිස්සයතො ආචිණ්ණන්ති. තස්මා තදුපනිස්සයං කුසලං තදනුරූපතො නානාවත්ථුකං විපාකං ජනෙති. මහග්ගතම්පන ආචිණ්ණෙනා එකවත්ථුකායෙව භවතණ්හාය වසෙන ආචිණ්ණන්තීති තදනුරූපතො තං නානාවත්ථං[3] අජනෙත්වා එකාවත්ථමෙව[4] ජනෙතීති.

(45) **සබ්බථා** ති ධම්මතො ආරම්මණතො පටිපදාදිතො ච. තථාහි යෙ ඵස්සාදයො කුසලෙ ච ලබ්භන්ති, තෙ විපාකෙපි ලබ්භන්ති යස්මිං ච ආරම්මණෙ කුසලං පවත්තති, තත්ථෙව[5] ඉදං විපාකම්පි. යාව පටිපදාදයො කුසලස්ස ලබ්භන්ති, තාව ඉමස්ස විපාකස්සපීති. කාමං යස්ස කස්සාපි ඣායා තං තං වත්ථු සදිසාව. මහන්තස්ස පන කුසලවිපාකස්ස මහන්තාහි යෙව උපමාහි[6] භවිතබ්බන්ති **ගජාදීනං** ති ආදි වුත්තං. අපරෙ

1. M ආචරියස්ස මග්ගො. 2. M අධිගතං. 3. M. නානාවත්ථුං. 4 M. එකාවත්ථුමෙව. 5. M. තස්සෙව 6. M. මහන්තායෙව උපමාය.

අපරෙ අත්තභාවෙ භවං වෙදනීයස්සාති (46) **අපරාපරියවෙදනීයං** යදි අපරාපරියවෙදනීයං න හොති කථඤ්චරහි ඉමස්ස ඵලුප්පත්තී ති ආහ ඣානා **අපරිහීනස්සා** ති ආදිං. **කුසලානන්තරං** ති කුසල භවානන්තරං. යස්මිං හි භවෙ තං කුසලං කතං, සො ඉධ කුසලසද්දෙන උපචාරතො ගහිතො, කම්මානන්තරං යෙව[1] ඵලස්ස අසම්භවතො න හි තං ලොකුත්තරකුසලං විය අනන්තර ඵලනිප්ඵාදකං, අථ ඛො ඒකච්චං කාමාවචරකුසලං විය අපරාපරියවෙදනං අහුත්වා සතිපි අනෙකෙ යෙව කාමාවචරකම්මෙ මහොඝො විය පරිත්තං උදකං තං අජ්ඣොත්ථරිත්වා අත්තනො යෙව විපාකදානෙන එකන්තෙන අනන්තරභවෙ යෙව ඵලං නිබ්බත්තෙතීති නනු ච අපරිහීනඣානස්සෙව කස්සචි නිකන්ති-වසෙන කාමභවෙ පටිසන්ධි හොති; තථා හි **තිස්සමහාබ්‍රහ්මා** උපරිබ්‍රහ්මලොකූපපත්තියා භාවිතමග්ගො භික්ඛූහි යාචිතො තතො චවිත්වා මොග්ගලිබ්‍රාහ්මණස්ස ගෙහෙ පටිසන්ධිං අග්ගහෙසීති වුත්තං; තං කථන්ති? නිකන්තිබලෙනෙව ඣානං පරිහායති. තතො පරිහීනජ්ඣානො නිබ්බත්තතී ති වදන්ති. අපරෙ පන ආචරියා අනීවරණාවත්ථාය නිකන්තියා ඣානස්ස පරිහානි වීමංසිත්වා ගහෙතබ්බාති වත්වා සතිපි මහග්ගතකම්මුනො විපාක පටිබාහනසමත්ථස්ස[2] පරිත්තකම්මස්ස අභාවෙ "ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා"ති වචනතො කාමභවෙ චෙතොපණිධි මහග්ගතකම්මස්ස විපාකං පටිබාහිත්වා පරිත්ත කම්මුනො විපාකස්ස ඔකාසං කරොතී ති වදන්ති. තං යුත්තං. (47) **එතස්සා** ති ඉමස්ස අත්ථස්ස **ඤාපනත්ථං**ති සම්බන්ධො.

එවං අවිසෙසෙන කුසලසදිසතං නිද්දිසිත්වා[3] ඉදානි විසෙසං දස්සෙතුං (48) **පටිපදක්කමො චෙවා** ති ආදි වුත්තං. යථා හි දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ඣානං උප්පාදෙත්වා පුනප්පුනං සමාපජ්ජන්තස්ස තං ඣානං තංපටිපදමෙව හොති, එවං තස්මිං තස්මිං අපරිහීනෙ තස්ස තස්ස විපාකො නිබ්බත්තමානො තං තං පටිපදෙව භවිතුං අරහති. ඡන්දාධිපත්‍යාදිභාවො පන තස්මිං ඛණෙ විජ්ජමානානං ඡන්දාදීනං අධිපතිපච්චයභාවෙන හොති, න ආගමනවසෙන. තථා හි එකමෙව ඣානං නානාඛණෙසු නානාධිපතෙය්‍යං හොති. තස්මා විපාකස්ස ආගමනවසෙන ඡන්දාධිපතෙය්‍යාදිතා න ගහිතා. තෙනාහ (49) **අනාධිපතිකං** ති. තදභාවතො යෙව සරසතො තස්ස හීනාදිතා න සම්භවතී ති සාපි ඣානාගමනතොව වුත්තා.

**රූපාවචරවණ්ණනා නිට්ඨිතා.**

1. M. කම්මානන්තරසෙව. 2. M. සමත්ථසෙව. 3. M. අභිදිසිත්වා.

මග්ගචිත්තස්ස විය ඵලචිත්තස්ස මග්ගඞ්ගයොගතො භෙදභාවෙන චතුමග්ගයොගතො ති අවත්වා [11.] **චතුමග්ගයුත්තචිත්තඵලත්තා** ති වුත්තං. චතූහි අරියමග්ගෙහි සම්පයුත්තකුසලචිත්තස්ස ඵලත්තා චතුබ්බිධසාමඤ්ඤඵල සම්පයුත්තචිත්තභාවොති අත්ථො. සොතාපත්තිමග්ගස්ස ඵලචිත්තං සොතාපත්තිමග්ගඵලචිත්තං, එවං සෙසෙසු. මග්ගවීථියං ද්වික්ඛත්තුං තික්ඛත්තුං වා ඵලසමාපත්තියා අපරිච්ඡින්න පරිමාණං පවත්තමානං පි ද්වීසෙව ඨානෙසු පවත්තියා දුවිධමෙව හොතී ති ආහ "මග්ගඵල-සමාපත්තිවසෙන පවත්තනතො දුවිධං"ති.
(50) **මග්ගස්සානන්තරෙ ඵලෙ ලබ්භන්ති** මග්ගාගමනතොති අධිප්පායො. මග්ගො හි ආගමනතො සුඤ්ඤතොති ලද්ධනාමො සගුණාලම්බනවසෙන අනිමිත්ත-අප්පණිහිතනාමම්පි ලභතී ති ඵලස්ස නාමත්තයම්පි දෙති. තථා ආගමනතො අප්පණිහිතො මග්ගො සගුණාරම්මණවසෙන අනිමිත්තසුඤ්ඤතනාමකො[1] ඵලස්ස නාමත්තයම්පි දෙති. එවඤ්ච කත්වා අභිධම්මෙ එකෙකස්ස ඵලස්ස තීණි තීණි නාමානි වුත්තානි. නනු ච අභිධම්මෙ සගුණාරම්මණතො නාමං අනධිප්පෙතන්ති වුත්තං? සච්චං වුත්තං තං පන නාමලාභං සන්ධාය, න නාමදානං. තත්ථ හි වවත්ථානකරත්තාභාවතො තථා අනධිප්පෙතං, න අලබ්භනතො ඉධ පන එකෙකස්ස ඵලං නාමත්තයම්පි ලභතී ති වවත්ථානපයොජනාභාවතො සගුණාරම්මණෙහි පි ලද්ධනාමදානස්ස අධිප්පෙතත්තා තිවිධම්පි නාමං දෙති. එකන්තෙන චෙතං එවං සම්පටිච්ඡිතබ්බං. ඉතරථා විපස්සනාපි සරසතො[2] ලද්ධනාමං මග්ගස්ස න දදෙය්යාති.

(51.) **පරභාගස්මිං** ති අපරභාගෙ. **වළඤ්ජනඵලෙසු** ති සමාපජ්ජනවසෙන අනුභවිතබ්බඵලෙසු. **වළඤ්ජනඵලෙසු නා** ති මග්ගාගමනං සන්ධාය පටික්ඛිත්තං ති ආහ: **විපස්සනාවසෙනෙවා** ති ආදිං. වළඤ්ජනඵලංහි විසුං විපස්සනාවසෙනෙව නිබ්බත්තතීති තස්ස තංවසෙන නාමලාභො. යදි එවං මග්ගස්ස විය අනිමිත්තලාභො න සියා? තං න. යථා මග්ගානන්තරඵලස්ස[3] විය වළඤ්ජක ඵලසමාපත්තියා පි මග්ගාගමනතොව ඨානපටිපදභෙදො හොති, එවං අනිමිත්තනාමම්පි ලබ්භති (52) **හොන්ති සාධිපතිනෙවා** ති එත්ථ කාරණං වුත්තමෙව. (53) **මග්ගභාවෙනා** ති සොළසහි ආකාරෙහි චතුසච්චපටිවෙධකමග්ගභාවෙන, කිලෙසමාරණවසෙන ගමනසඞ්ඛාතෙන, නිබ්බාණත්ථිකෙහි මග්ගිතබ්බභාවසඞ්ඛාතෙන වා මග්ගභාවෙන **ඵලං මග්ගමුප්පදය මග්ගො නාමාති වුච්චතී** ති සයං ඵලසභාවම්පි මග්ගස්ස ඵලත්තා තංසදිසතාය වා තදුපාදය

1. M. - සුඤ්ඤතඅප්පණිහිතනාමකොති. 2 M. විපස්සනතො. 3 M. මග්ගානන්තරස්ස.

මග්ගො ති වුච්චති, මග්ගඞ්ගං, මග්ගපරියාපන්නං ති ආදිසූති අධිප්පායො.

**ලොකුත්තරවණ්ණනා නිට්ඨිතා.**

යථා අතිඉට්ඨෙ ඉට්ඨමජ්ඣත්තෙ ච ආරම්මණෙ වෙදනාභෙදසම්භවතො කුසලවිපාක-මනොවිඤ්ඤාණධාතු දුවිධා හොති සොමනස්සසහගතා, උපෙක්ඛාසහගතා ති, න එවං අනිට්ඨෙ[1] අනිට්ඨමජ්ඣත්තෙ ච ආරම්මණෙ වෙදනාභෙදො අත්ථී ති අකුසලවිපාක-මනොවිඤ්ඤාණධාතු එකවිධා වා ති **සත්තඅකුසලවිපාකානී** ති වුත්තං. සති හි තත්ථ වෙදනාභෙදෙ අතිඅනිට්ඨෙ දොමනස්සෙන භවිතබ්බං; න ච පටිඝෙන විනා දොමනස්සං උප්පජ්ජතී ති. කායවිඤ්ඤාණස්ස දුක්ඛසහගතතා කුසලවිපාකෙ වුත්තවිපරියායෙන වෙදිතබ්බා. එත්ථ ච අකුසලවිපාකෙසු ලබ්භමාන-දුක්ඛං විය නාතිකටුකාපි උපෙක්ඛා එකන්තනිහීනස්ස අකුසලස්ස විපාකභාවතො දුක්ඛසභාවත්තා හීනා එව. න හි අකුසලස්ස විපාකො අදුක්ඛො හොති. උපෙක්ඛාභාවො පනස්ස බලවතා බාධියමානස්ස පටිපහරිතුං[2] අසක්කොන්තස්ස දුබ්බලස්ස පුරිසස්ස තෙන කරියමානබාධස්ස[3] උපෙක්ඛනා විය දට්ඨබ්බං. **ඉමානි සත්ත අකුසලවිපාකචිත්තානී** ති ඉමානි සත්ත එකෙකස්ස අකුසලස්ස විපාකචිත්තානි, න පන කුසලවිපාකෙ විය තිහෙතුකාදිපුඤ්ඤවිසෙසෙන. උද්ධච්චසහගතස්සපි හි පවත්තියං සත්තෙව විපාකා ලබ්භන්ති කස්මා පනෙත්ථ යථා කුසලවිපාකං සහෙතුකම්පි උඩටං; න එවං අකුලවිපාකං ති? හෙතූනං අසම්භවතො. ලොභාදීනං හි එකන්තසාවජ්ජතාය අයොනිසොමනසිකාරහෙතුකානං නත්ථි විපාකභාවො. අලොභාදීනම්පි එකන්තමනවජ්ජසභාවකාරණස්ස[4] තබ්බිදූරතාය නෙව අකුසලවිපාකභාවො. න හි අලොභාදීනං පටිපක්ඛා ලොභාදයො තෙ අභිනිප්ඵාදෙන්ති. තස්මා ඉදං සබ්බථා හෙතුප්පවත්තියා[5] අසම්භවතො අහෙතුකමෙවා ති. **කම්මනිමිත්ත ගතිනිමිත්තෙසු** ති එත්ථ අතීතභවෙ ආයූහිතං අපරාපරියවෙදනීයං උප්පජ්ජවෙදනීයං වා කම්මං කම්මං නාම. කම්මකරණකාලෙ චෙතනාය ගහිතමාරම්මණං කම්මනිමිත්තං නාම. උප්පජ්ජිතබ්බ-භවපරියාපන්නා නරකාදිසු අග්ගිජාලාදිවණ්ණා ගතිනිමිත්තං නාම. (54) **ඉමෙ** ති අකුසලවිපාකා තෙසං **අනිට්ඨානිට්ඨමජ්ඣත්ත** විසයෙසු පවත්තිවචනෙන තබ්බිපරියායෙන කුසලවිපාකානං ඉට්ඨමජ්ඣත්තවිසයෙසු පවත්ති අත්ථතො ආපන්නා ති සා විසුං න වුත්තා. **සුඛාදිත්තයයුත්තා** ති සුඛ - සොමනස්සුපෙක්ඛායුත්තා.
[12.] **එවං** ති ආදි යථාවුත්තවිපාකානං නිගමනං.

**අකුසලවිපාකවණ්ණනා නිට්ඨිතා**

---

1 M අතිඅනිට්ඨෙ. 2. B පටිප්පහරිතුං 3 M කරියමානානාවස්ස
4 M සභාවානං කාරණස්ස 5 M සහෙතුප්පවත්තියා.

(55) **පාකස්ස** අසුරස්සඤ්ඤතං ගබ්භපරිපාකස්ස සාසනතො විනාසනතො පාකසාසනො වුච්චති සක්කො දෙවරාජා. තෙන පූජිතොති **පාකසාසනපූජිතො**. පාකං වා පරිපක්කං සාසනමෙතෙසන්ති පාකසාසනා, ඛීණාසවා. තෙහි පූජිතොති පාකසාසනපූජිතො.

**විපාකවණ්ණනා නිට්ඨිතා.**

**12. දානාදිවසෙනාති** පවත්තනාකාරමත්තතො දානාදිවසෙන, න පුඤ්ඤක්‍රියවසෙන, ඛීණාසවසන්තානගතස්ස පුඤ්ඤකිරියස්සාභාවතො ති වුත්තෙනාවායමත්ථො [13] ආවජ්ජෙතී ති **ආවජ්ජනං**. ආභුජති ඔනොජෙති පරිනාමෙති වාරෙතීති වා අත්ථො, තං හි ආපාථගතමාරම්මණං පච්චමාභුජති, චක්ඛුවිඤ්ඤාණාදීනි වීථිචිත්තානි ආපාථගතාරම්මණාභිමුඛං ඔනොජෙති, චිත්තසන්තානං වා පුරිමාකාරතො අඤ්ඤථා පරිනාමෙති අනුප්පබන්ධතො පවත්තනකං භවංගචිත්තසන්තානං පරතො පවත්තිතුං අදත්වා, ආපාථගතං වා ආරම්මණං අඤ්ඤත්ථ ගන්තුං අදත්වා වාරෙති. හසිතං උප්පජ්ජති, උප්පාදියති වා එතෙනාති හසිතුප්පාදං; තදෙව චිත්තංති **හසිතුප්පාදචිත්තං**. වොට්ඨපෙතීති **වොට්ඨපනං**. කස්මා පනෙත්ථ ආවජ්ජන - වොට්ඨපනානි උපෙක්ඛාසහගතානි, හසිතුප්පාදං ච සොමනස්සසහගතංති? වුච්චතෙ: ආවජ්ජනං නාම අපුබ්බාරම්මණෙ සකිදෙව පවත්තනමත්ත -- සන්තතිවිච්ඡෙදවසෙන පවත්තනතො දුබ්බලං,[1] භවංග – ප්පච්චයං[1] වා සබ්බසො විසය-රසමනුභවිතුං න සක්කොතීති ඉට්ඨාදිසු සබ්බත්ථ උපෙක්ඛායුත්තමෙව හොති. වොට්ඨපනං ච වුත්තවිපරියායෙන වෙදනාහෙදුරහම්පි සමානං විපාකප්පබන්ධං විච්ඡින්දිත්වා විසදිසචිත්තප්පබන්ධස්ස නිබ්බත්තනතො සන්තතිපරිනාමතො යෙව කිච්චන්තරෙ ව්‍යාවටත්තා විපාකං විය ආරම්මණරසස්සාදෙ අසමත්ථමෙවාති සබ්බත්ථ උපෙක්ඛාසහගතමෙව. හසිතුප්පාදම්පන වුත්තවිපරීතතො පරි-හීනවිපල්ලාසානං ඛීණාසවානං සන්තානෙ ඉට්ඨාරම්මණෙ යෙව උප්පජ්ජනතො සබ්බථා සොමනස්සසහගතමෙවාති ලක්ඛණාදිතො පනෙතාසු පුරිමං චක්ඛුවිඤ්ඤාණාදීනං පුරෙචරං රූපාදිවිජානන-ලක්ඛණං; ආවජ්ජනරසං; තථාභාවපච්චුපට්ඨානං; භවඞ්ගවිච්ඡෙද පදට්ඨානං. දුතියං සබ්බාරම්මණවිජානනලක්ඛණං;[2] තං අරහතං අනොළාරිකෙසු වත්ථූසු හසිතුප්පාදනරසං; තථාභාවපච්චුපට්ඨානං; ඒකන්තතො හදයවත්ථුපදට්ඨානං. තතියම්පි සබ්බාරම්මණ - විජානන-ලක්ඛණං[2]; පඤ්චද්වාරමනොද්වාරෙසු වොට්ඨපනාවජ්ජනරසං; තථාභාවපච්චුපට්ඨානං; අහෙතුකවිපාක – මනොවිඤ්ඤාණධාතු – භවංගානං අඤ්ඤතරාපගමපදට්ඨානං ති.

---

1. M දුබ්බලභවංගප්පච්චයං 2. M ජලාරම්මණ

**භවඞ්ගං ආවට්ටයමානා** ති භවඞ්ගසන්තානං ආවට්ටෙන්ති විය. **සාධාරණා** ති සෙක්ඛාසෙක්ඛපුථුජ්ජනානං සාධාරණා. **අසාධාරණා** ති අසෙක්ඛානං යෙව ආවෙණිකා. තෙනාහ: **ඛීණාසවස්සෙවා ති. ඡසු ද්වාරෙසු අනුළාරෙසු ආරම්මණෙසූ** ති චක්ඛාදිසු ඡසු ද්වාරෙසු පධාන-සාරුප්පට්ඨානාදිභූතෙසු[1] ඡසු රූපාදිආරම්මණෙසු. පධානසාරුප්පං හි ඨානං දිස්වා "දිට්ඨධම්මසුඛවිහාරස්ස සාරුප්පමිදං ඨානං මයා ලද්ධං"ති තුස්සන්තස්ස චක්ඛුද්වාරෙ රූපාරම්මණෙ; භණ්ඩභාජනට්ඨානෙ මහාසද්දං සුත්වා "එවරූපා ලොලුප්පතණ්හා මෙ පරිහීනා"ති තුස්සන්තස්ස සොතද්වාරෙ සද්දාරම්මණෙ, ගන්ධෙහි පුප්ඵෙහි වා චෙතියපූජනකාලෙ "එවරූපෙන ගන්ධෙන භගවන්තං පූජෙමී"ති තුස්සන්තස්ස ඝාණද්වාරෙ ගන්ධාරම්මණෙ, රසසම්පන්නං පිණ්ඩපාතං සබ්‍රහ්මචාරීහි සහ භාජෙත්වා පරිභුඤ්ජනකාලෙ "සාරාණීයධම්මො වත මෙ පූරිතො"ති තුස්සන්තස්ස ජිව්හාද්වාරෙ රසාරම්මණෙ, ආභිසමාචාරිකවත්තපූරණකාලෙ "කායෙන වත්තපටිවත්තං පූරෙමී"ති තුස්සන්තස්ස කායද්වාරෙ ඵොට්ඨබ්බාරම්මණෙ ති එවං පඤ්චසු ද්වාරෙසු පඤ්චාරම්මණෙසු පවත්තන්ති. මනොද්වාරෙ පන යථාවුත්තෙස්වෙව පඤ්චසු පච්චුප්පන්නාරම්මණෙසු **ඝටිකාරසුත්තාදීසු** විය භගවතො පුබ්බෙනිවාසඤාණෙන පරිඤ්ඤාතෙ අතීතාරම්මණෙ, "අඞ්ගිස්සරො නාම පච්චෙකබුද්ධො භවිස්සතී"ති ආගතට්ඨානාදීසු විය අනාගතංසඤාණෙන පරිච්ඡින්නෙ ආරම්මණෙ චා ති එවං ඡස්වෙවාරම්මණෙසු හසිතං උප්පාදෙන්තීති වෙදිතබ්බං. තත්ථ ච අතීතංසාදීසු අප්පටිහතඤාණන්ති වත්වා "ඉමෙහි තීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තී"ති[2] වචනතො විචාරණපඤ්ඤාරහිතාය එතාය කථං භගවතො උප්පත්ති යුජ්ජෙය්‍යාති? හසිතුප්පාදචිත්තෙන පවත්තියමානම්පි භගවතො සිතකරණං පුබ්බෙනිවාස-අනාගතංස-සබ්බඤ්ඤුතඤාණානං අනුවත්තකත්තා ඤාණානුපරිවත්තී යෙව. එවම්පන ඤාණානුපරිවත්තීභාවෙ සති න කොචි පාළිවිරොධො. එවඤ්ච කත්වා අට්ඨකථායං "තෙසං ඤාණානං චිණ්ණපරියන්තෙ ඉදං චිත්තං උප්පජ්ජතී" ති වුත්තං. අවස්සං චෙතං එවං ඉච්ඡිතබ්බං. ඉතරථා අඤ්ඤස්සාපි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස අහෙතුකචිත්තස්ස භගවතො උප්පත්ති න යුජ්ජෙය්‍ය. න හි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස තංසමුට්ඨිතාය විඤ්ඤත්තියා කායකම්මාදිභාවං ආපජ්ජනභාවො විබන්ධතී ති. එත්ථ ච පඤ්චද්වාරෙ ඉමිනා චිත්තෙන සොමනස්සුප්පාදනමත්තං දට්ඨබ්බං; න හාසුප්පාදනං. පඤ්චද්වාරිකචිත්තානං අවිඤ්ඤත්තිජනකත්තා, මනොද්වාරෙ පන හාසුප්පාදනං. තෙනෙව හි

1. M ඨානාදිගතෙසු 2. M. ඤාණානුපරිවත්තං.

අට්ඨකථායං “පඤ්චද්වාරෙ සොමනස්සිකො හොතී”ති එත්තකමෙව වුත්තං. “මනොද්වාරෙ ච හාසයමානං”ති. ඉධ පන හසිතුප්පාදකිච්චාති අවිසෙසවචනං පඤ්චද්වාරෙ සොමනස්සකරණවසෙන පවත්තස්සපි මනොද්වාරෙ හාසජනනස්ස ච සභාවං සන්ධාය වුත්තන්ති වෙදිතබ්බං. **හසිතුප්පාදනකිච්චා** ති හසිතස්සෙව උප්පාදනකිච්චා. තෙනෙව හි තං හසිතුප්පාදං ති වුච්චති, න පන අඤ්ඤෙසං හසිතුප්පාදචිත්තානං අභාවතො. තථා හි වක්ඛති “**කුසලතො-චතූහී**”ති ආදිං.

**ඡ අසාධාරණඤාණානී**ති ආසයානුසයඤාණං, ඉන්ද්‍රියපරොපරියඤාණං, යමකපාටිහාරියඤාණං, මහාකරුණාසමාපත්තිඤාණං, සබ්බඤ්ඤුතඤාණං, අනාවරණඤාණන්ති ඉමානි ඡ පච්චෙකබුද්ධාදීහි අසාධාරණානි ඤාණානි. නනු ච සබ්බඤ්ඤුතඤාණමෙව අනාවරණඤාණං, ඉතරථා සබ්බඤ්ඤුතානාවරණඤාණානං අසබ්බඤ්ඤුත - සාවරණඤාණතාව ආපජ්ජෙය්‍ය; තථාහි යදි සබ්බඤ්ඤුතඤාණතො අඤ්ඤමනාවරණඤාණං සියා, තස්ස සාවරණත්තා සාවරණෙ ච විසයෙ සභාවපටිවෙධාභාවතො සබ්බඤ්ඤුභාවං න සිජ්ඣෙය්‍ය; අනාවරණඤාණස්ස ච අසබ්බධම්මාරම්මණභාවෙන යත්ථ තං නප්පවත්තති තත්ථාවරණසම්භවතො අනාවරණභාවොපි න සියාති? සච්චමෙතං එකමෙව තං ඤාණං අනවසෙස - සංඛතා - සංඛතසම්මුති - ධම්මවිසයත්තා සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ච ආවරණාභාවතො නිස්සංගචාරමුපාදාය (?) අනාවරණඤාණන්ති එවං විසයප්පවත්තිභෙදෙන අඤ්ඤෙහි අසාධාරණභාවදස්සනත්ථං ද්වෙධා වුත්තන්ති. යථාහ: “සබ්බං සංඛතාසංඛතමනවසෙසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං. තත්ථාවරණං නත්ථීති අනාවරණඤාණං” ති ආදි.[1]

**ඉධ ඨත්වා** ති “හසිතස්ස උප්පාදනතො හසිතුප්පාදං”ති වුත්තචිත්තස්ස ආගතට්ඨානෙ ඨත්වා. **පරිගණ්හිතබ්බානි** ති[2] පරිච්ඡින්දිත්වා ගණ්හිතබ්බාති.[3] කිඤ්චාපි රූපාවචරක්‍රියානං ඣානඞ්ගප්පහාණං විපාකෙ විය ආගමනතො අහුත්වා කුසලෙ විය භාවනාවිසෙසෙනෙව පවත්තාකාරමත්තං හොති. පඨමජ්ඣානස්ස පන පහාණඞ්ගසම්භවාභාවතො එකරසවසෙනෙව[4] නිද්දිසිතුං සෙසානම්පි පහාණඞ්ගං අවත්වා සම්පයොගඞ්ගමෙව තෙසු දස්සිතන්ති. යස්මා පන භාවනාවසෙන පවත්තාකාරමත්තං විනා භාවනාය කාතබ්බස්ස නීවරණප්පහාණාදිකිච්චස්ස අභාවතො උජුකං

---

1. ඡ අසාධාරණඤාණාදයො මරම්මපොත්ථකෙ න විජ්ජන්ති. 2. B. පරිගණීතබ්බානි. 3. B. ගණීතබ්බානි. 4. M. එකස්ස වසෙනෙව.

භාවනා නාම න හොති, තස්මා [14.] **භාවනාකාරවසප්පවත්තානීති** ආකාරගහණං කතන්ති. **නන්ති** තං, යථාවුත්තා වා රූපාරූපසමාපත්ති.

(59) **සමාපන්නා සචෙ ක්‍රියා** ති එත්ථ කිඤ්චාපි සා එව සමාපත්ති සමාපජ්ජිතුං න සක්කා, නිරුද්ධානං අනුප්පජ්ජනතො පටිලද්ධසමාපත්තිකස්සෙව පන සමාපජ්ජිතුකාමතාය සද්ධිං යෙව සමාපජ්ජනතො පඨමජ්ඣානාදිමෙව පටිලභිත්වා දුතියජ්ඣානාදිකං සමාපජ්ජිතුං අසක්කුණෙය්‍යභාවතො ච, පුබ්බෙ පටිලද්ධසමාපත්තිසදිසං පුන සමාපජ්ජනතො (58) **පුථුජ්ජනකාලස්මිං** අභිනිබ්බත්තිතසමාපත්තිසදිසා. එත්ථ සා එව තථා වුත්තා.

(61.) **එකචිත්තක්ඛණත්තා** ති එකචිත්තක්ඛණෙ යෙව පවත්තනතො. යදි හි සො පුනප්පුනං උප්පජ්ජෙය්‍ය, තදා තස්ස අරහතො උප්පත්තියා ක්‍රියාභාවො ඉච්ඡිතබ්බො සියා සකිං යෙව පන පවත්තති, චතුසච්චපටිවෙධකිච්චස්ස එකවාරෙනෙව පරිනිට්ඨානතො තංකිච්චෙන ච විනා[1] තස්ස[1] අනුපලබ්භනීයත්තා. තෙනාහ "න පාරං දිගුණං යන්තී" ති. තස්මා නත්ථි ලොකුත්තරං ක්‍රියාචිත්තන්ති අයමෙත්ථාධිප්පායො.

(62.) **ක්‍රියාක්‍රියාපත්ති - විභාගදෙසකො** ති යා ආපත්තියො කායවාචාහි අකාතබ්බං කත්වා ආපජ්ජති, තා ක්‍රියා; යා පන ආපත්තියො කායවාචාහි කාතබ්බං අකරොන්තො ආපජ්ජති, තා අක්‍රියා. ක්‍රියා ච අක්‍රියා චාති ක්‍රියාක්‍රියා. ක්‍රියාක්‍රියා ච තා ආපජ්ජිතබ්බතො ආපත්තියො චාති ක්‍රියාක්‍රියාපත්තියො. තාසං විභාගං දෙසෙතීති **ක්‍රියාක්‍රියාපත්ති - විභාගදෙසකො**. අථ වා ක්‍රියාජ්ඣානභූතා සමාපත්තියො ක්‍රියාපත්තියො, කුසලභූතා පන සමාපත්තියො අක්‍රියාපත්තියො. තාසං විභාගං දෙසෙතීති **ක්‍රියාක්‍රියාපත්තිවිභාගදෙසකො**. **යං ක්‍රියාක්‍රියං චිත්තං** ති සම්බන්ධො පඤ්චන්නං මාරානං ජිතත්තා ජිනො **සක්‍රියාක්‍රියාරතො** ති සබ්බසත්තානං හිතස්ස කරණෙ අහිතස්ස ච අකරණෙ නිරතො. අථ වා එකන්තමිට්ඨවිපාකත්තා හිතාති කුසලානමෙතං අධිවචනං. තප්පටිපක්ඛත්තා අහිතාති අකුසලානමෙතමධිවචනං. යථාක්කමං හෙතෙසං ක්‍රියායං අක්‍රියායංච රතොති **හිතාහිතානං සක්‍රියාක්‍රියාරතො**. අථවා හිතාහිතාති කුසලාකුසලා එව. තෙසං [ක්‍රියාය ක්‍රියාමත්තස්ස අවිපාකභාවස්ස කරණතො ක්‍රියාක්‍රියාති අරහත්තඵලවිමුත්ති වුච්චති. තස්මිං රතොති][2] **හිතා =පෙ= ක්‍රියාරතො**. අථ වා හිතාහිතානං පුග්ගලානං සක්‍රියාක්‍රියාය අත්තනො අත්තනො

1. M. විනාසනස්ස. 2. M. ක්‍රියාක්‍රියාමත්තාවිපාකභාවං කාතුං ඉච්ඡතීති.

කිච්චස්ස ඉධලොක - පරලොකත්ථිපථාදනස්ස කරණෙ රතො ති **හිතාහිතානං** =පෙ= **රතො.** (64.) සබ්බෙ **ලොකුත්තරෙ අප-නෙත්වා** යෙ **එකූනනවුතිචිත්තුප්පාද** වුත්තා තානි චිත්තානි මයා නිද්දිට්ඨානීති සම්බන්ධො.

(65) පාටවං අත්ථෙන්ති පත්ථෙන්ති, පාටවසංඛාතො වා අත්ථො එතෙසන්ති **පාටවත්ථිනො. උග්ගහෙතබ්බා** ති සවණ-පරිපුච්ඡාවසෙන උග්ගණ්හිතබ්බා. උග්ගණ්හිත්වා ච පන න කෙවලං උග්ගහණමත්තෙන යෙව ඨාතබ්බන්ති දස්සෙන්තො ආහ **චින්තෙතබ්බා පුනප්පුනං** ති. න හි සක්කා උග්ගහණමත්තෙන-තෙවත්ථ සබ්බථා සන්නිට්ඨානං ගන්තුන්ති අධිප්පායො. (66.) **අභි-ධම්මමහොදධිං** ති ධම්මසඞ්ගණීආදි - සත්තප්පකරණවසෙන ඨිත මභිධම්මපිටකමහණ්ණවං, ඛන්ධායතනාදිවසෙන ඨිතං පරමත්ථ-මහණ්ණවං වා. **තරන්ති** ති අත්ථගහණවසෙන උත්තරන්ති. සුතමයඤාණමූලකෙන වා භාවනාඤාණෙන ඔතරන්තීති අත්ථො. **ඉමං ලොකං** ති පච්චුප්පන්නභවං. **පරං ලොකන්ති** අනාගතභවං. **තරන්ති** ති අතික්කමන්ති. ඉධ ලොකස්මිං හි ඡන්දරාගප්පහාණ-වසෙන ඉමං ලොකං තරන්ති. ආයතිභවුප්පාදකස්ස කම්මස්ස කම්මක්ඛයකරඤාණෙන විනාසනතො පරලොකං තරන්ති, අනුපාදපරිනිබ්බාණවසෙන පරිනිබ්බන්තීති[1] අත්ථො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර සංවණ්ණනාය පඨමපරිච්ඡෙදවණ්ණනා නිට්ඨිතා.**

---

1. M. පරිනිබ්බායන්ති.

## චෙතසිකනිද්දෙස වණ්ණනා.

එත්තාවතා ච චිත්තං චෙතසිකං රූපං නිබ්බාණං ති එවං උද්දිට්ඨෙසු චතූසු ධම්මෙසු චිත්තං තාව ජාති-භූමි-සම්පයොග-පවත්තාකාරාදිවසෙන විභාගෙන නිද්දිසිත්වා ඉදානි තදනන්තරං උද්දිට්ඨෙ චෙතසිකධම්මෙ නිද්දිසිතුං චිත්තානන්තරමුද්දිට්ඨා ති ආදි ආරද්ධං.

**16**. (67.) විභාගං ති ජාතිආදිවසෙන විභාගං, තෙසු තෙසු චිත්තෙසු යථාරහං සම්පයොගවසෙන විසුංවිසුංභාවඤ්ච කතමෙ පන චෙතසිකා යෙසං විභාජනං වුච්චතී ති තෙ සහ නිබ්බචනෙන සරූපතො දස්සෙතුං **තත්ථ චිත්ත-සම්පයුත්තා** ති ආදි වුත්තං. **තත්ථ චිත්තසම්පයුත්තා** ති ඉදං චෙතසිකලක්ඛණදස්සනං තෙන යෙ චිත්තෙන සහ සම්පයොගලක්ඛණෙන යුත්තා, තෙ යෙව චෙතසිකානි දස්සෙති. කිම්පන තං සම්පයොගලක්ඛණංති? එකුප්පාද-එකනිරොධ-එකාලම්බන-එකවත්ථුක-සංඛාතා පකාරා. සම්පකාරෙහි යුත්තා ති සම්පයුත්තා තත්ථ යදි එකුප්පාදනාමත්තෙනෙව සම්පයුත්තතා අධිප්පෙතා, සහුප්පත්තිකානං රූපාරූපධම්මානං අඤ්ඤමඤ්ඤසම්පයුත්තතා ආපජ්ජෙය්‍යාති එකනිරොධගහණං. එවම්පි අවිනිබ්භොගරූපානං අඤ්ඤමඤ්ඤසම්පයුත්තතා ආපජ්ජෙය්‍යාති එකවත්ථුකගහණං. එවම්පි අවිනිබ්භොගරූපෙසු එකං මහාභූතං සෙසභූතොපාදරූපානං නිස්සයපච්චයො හොති, තස්මා[1] තානි එකවත්ථුකානීති, චක්ඛාදීනං නිස්සයභූතානි වා භූතානි "එකං වත්ථු එතෙසං නිස්සිතං"ති එකවත්ථුකානීති විකප්පෙන්තස්ස තෙසං සම්පයුත්තතාපත්ති සියාති තං නිවාරණත්ථං එකාරම්මණගහණං. පටිලොමතො වා එකාරම්මණාති වුත්තෙන එකවීථියං පඤ්චවිඤ්ඤාණ-සම්පටිච්ඡනාදීනං[2] නානාවීථියං පර-සන්තානෙ ච එකස්මිං ආරම්මණෙ උප්පජ්ජමානානං භින්නවත්ථුකානං සම්පයුත්තතා ආපජ්ජෙය්‍යාති එකවත්ථුකගහණං. එවං පි මරණාසන්නවීථියං සම්පටිච්ඡනසන්තීරණාදීනං සම්පයුත්තතා ආපජ්ජෙය්‍යාති එකනිරොධගහණං කිම්පන නානුප්පාදපි එවං තිවිධලක්ඛණා හොන්ති, අථ එකුප්පාද එවාති විචාරණාය එකුප්පාද යෙව එවං තිවිධලක්ඛණා හොන්තී ති දස්සනත්ථං එකුප්පාද ති වුත්තං. ඉති ඉමෙහි චතූහි සම්පයොගලක්ඛණෙහි යෙ චිත්තසම්පයුත්තා තෙ චෙතසිකා නාමාති එවං චෙතසිකලක්ඛණං ඨපිතං හොති.

කථම්පනෙතෙ චෙතසිකා නාමාති ආහ: **චිත්තෙන** භවා ති. චෙතසි භවා චෙතසිකාති වත්තබ්බෙ චිත්තසද්දස්ස පි චෙ

1. M. තෙන. 2. - සම්පටිච්ඡනසන්තීරණානං.

තොසද්දෙන සහ සමානත්ථතාය අඤ්ඤමඤ්ඤං දස්සෙතුං **විනෙකා භාවා චෙතසිකා**ති වුත්තං. **නියතා** ති නියතුප්පත්තිකා කරුණා-මුදිතාදයො විය කදාචි අනුප්පජ්ජිත්වා යදා[1] තං චිත්තං උප්පජ්ජති, තදා[2] තෙන අවිනිබ්භුත්තා[3] හුත්වා ජායමානාති අත්ථො. **සරූපෙනාගතා** ති ඡන්දාදයො විය. "යෙවා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා ධම්මා" ති එවං යෙවාපනකවසෙන අනාගන්ත්වා "ඵස්සො හොති වෙදනා හොතී"ති ආදිනා සරූපෙනෙව පාළියං ආගතා. "යෙවා පනා"ති එවං දෙසනා එතෙසංති **යෙවාපනකා**. **එකූනතිංස ධම්මානි** කිච්චතො[4] භෙදං[4] අනාමසිත්වා කෙවලං අසම්භින්නධම්මවසෙනෙව එකෙනූනතිංස-ධම්මා. පාළියම්පන චිත්තෙන සහ තිංසධම්මෙ ගහෙත්වා තෙසං කිච්චභෙදතො ගහණෙන ඡප්පඤ්ඤාස ධම්මා වුත්තා. **කථමිදං**ති සරූපපුච්ඡා. **ඵස්සො** =පෙ= **චිත්තුජ්ජුකතා**නි යථාපුච්ඡිතානං සරූපදස්සනං. ඉති - සද්දො, පරිසමාපනෙ, නිදස්සනෙ වා.

**පුන තෙත්තිංස හොන්ති**ති සම්බන්ධො. තෙත්තිංස හොන්ති, තෙ යෙව එකූනතිංස ධම්මාති අධිප්පායො. **කදාචි උප්පජ්ජන්තී**ති වුත්තං, තං කථං දට්ඨබ්බං ති ආහ: **ඉමෙසූ** ති ආදි. **කරුණා-මුදිතාවසෙනා** ති පඨමසමන්නාහාරතො පට්ඨාය ගොත්‍රභූපරියොසානප්පවත්ත-කරුණාමුදිතාදිපරිකම්මවසෙන **කරුණා පුබ්බභාගෙ**ති කරුණාය පුබ්බභාගෙ. පරිකම්මවසෙන පවත්ත-කරුණාභාවනාය අප්පණොකාසතො[5] පුරිමකොට්ඨාසෙ. පඨම-සමන්නාහාරතො පට්ඨාය ගොත්‍රභූපරියොසානප්පවත්තපරිකම්ම-කොට්ඨාසො හුත්වාති අත්ථො එවං **මුදිතාපුබ්බභාගෙ**ති එත්ථාපි. භාගසද්දස්ස ද්‍රව්‍යවුත්තිතාය තප්පුරිසස්ස ච උත්තරපදත්ථප්ප-ධානතාය කරුණාපුබ්බභාගොති ආදිනා පුල්ලිඞ්ගෙන වුත්තං. **එක** - සද්දස්ස පන ගුණවුත්තිතාය ගුණවිසෙසමනුවත්තමානො[6] සො තස්ස ලිඞ්ගවසෙන පරිනමතීති කරුණාමුදිතාපෙක්ඛාය **එකා**ති ඉත්ථිලිංගෙන වුත්තන්ති. න පනෙකතො උප්පජ්ජන්ති, කිඤ්චරහි විසුං විසුං යෙවාති අත්ථො තෙනෙව හි "කරුණාපුබ්බභාගෙ[7] වා මුදිතාපුබ්බභාගෙ[7] වා"ති විකප්පො වුත්තොති. කස්මා පනෙතා ද්වෙ එකතො නුප්පජ්ජන්තීති? භින්නාලම්බණතො. කරුණා හි දුක්ඛිතසත්තෙ ආරබ්භ තෙසං දුක්ඛාපනයනකාම-තාවසෙන පවත්තති; මුදිතා සුඛිතසත්තෙ ආරබ්භ තෙසං සුඛානු-මොදනවසෙන. තස්මා උභින්නම්පි භින්නවිසයත්තා න එකස්මිං චිත්තෙ උප්පත්ති සම්භවතීති.

1. M යද යද 2. M. තද තද. 3. M අභිනිබ්බත්තා 4. M කිච්චභෙදං 5 M අප්පණාකොට්ඨාසතො 6. M. ගුණවිසෙසවති වත්තමානො 7. M පුබ්බභාගා.

**මිච්ඡාකම්මන්තාදීහීති** ආදිසද්දෙන මිච්ඡාවාචා - මිච්ඡාජීවානං ගහණං. **සම්මාකම්මන්තාදීනි පරිපූරෙන්තීති** සම්මාකම්මන්ත-සම්මාවාචා - සම්මාජීවානි පරිපූරෙන්ති. **එකා විරතී** ති තීසු එකා විරති උප්පජ්ජති. සම්මාකම්මන්තං පූරෙන්තී පඨමා, සම්මාවාචං පූරෙන්තී දුතියා, සම්මාජීවං පූරෙන්තී තතියා විරති උප්පජ්ජතීති අත්ථො. **කරුණාමුදිතාහි සහ** න උප්පජ්ජන්ති, තාසං පඤ්ඤත්තාරම්මණත්තා, විරතියා ච එකන්තපරිත්තාරම්මණත්තා. **අඤ්ඤමඤ්ඤේන ච** න උප්පජ්ජන්ති අඤ්ඤමඤ්ඤස්සපි භින්න විසයත්තා. මිච්ඡාකම්මන්තාදීනං හි ආරම්මණානෙව යථාක්කමං සම්මාකම්මන්තාදීන මාරම්මණානි. **තතො** විරතිභාවතො **එතාසු** ති ඉමේසු පඤ්චසු.

**17.** (68.) විරතීනම්පි සංගහණත්ථං කරුණාමුදිතාසූති වත්තබ්බෙ ගාථාබන්ධසුඛත්ථං ආදිසද්දලොපවසෙන **කරුණාමුදිතාසූ**ති වුත්තං. එවඤ්ච කත්වා වුත්තං **එකෙනා**ති. ඉතරථා එකායා ති වත්තබ්බං ති. කිම්පනෙත්ථ කාරණං? චතූසු බ්‍රහ්මවිහාරෙසු ද්වෙව ඉධ නිද්දිට්ඨා, න ඉතරාති චොදෙන්තො ආහ: (69) **කස්මා පනා**ති ආදි. **උපෙක්ඛා න ච උද්ධා**ති සම්බන්ධො. නවහි ලොකුත්තරධම්මෙහි ජනං රඤ්ජෙතීති **ධම්මරාජා**. දිට්ඨධම්මසම්පරායිකත්ථෙහි සදෙවකං ලොකං අනුසාසතීති **සත්ථා** (70) **අබ්‍යාපාදෙන මෙත්තා ගහිතා,** සත්තහිතාකාරප්පවත්තිකාලෙ[1] මෙත්තාභාවූපගමනතො; තෙනෙව හෙට්ඨා[2] මෙත්තායනාති ආදිනා නිද්දිට්ඨො[3]. **තත්‍රමජ්ඣත්තතාය උපෙක්ඛා ගහිතා** තස්සායෙව සත්තෙසු මජ්ඣත්තාකාරප්පවත්තාය උපෙක්ඛාබ්‍රහ්මවිහාර භාවතො.

(71) ආදිච්චෙන සහ සමානගොත්තතාය, අරියසාවකභාවෙන වා තස්ස භගවතො පුත්තතාය ආදිච්චො බන්ධු ඉමස්ස, ආදිච්චස්ස වා බන්ධූති **ආදිච්චබන්ධු** (72) **රාසිං** ති ඵස්සපඤ්චකාදි - සත්තරස රාසිං. පඨමමහාචිත්තුප්පාදවසෙන හි "ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීතිසුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාසංකප්පො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති, සතිබලං හොති, සමාධිබලං හොති, පඤ්ඤාබලං හොති, හිරිබලං හොති,

1. M තස්සෙව හිතාකාරප්පවත්තිකාලෙ 2. M. හෙට්ඨ. 3. B නිද්දිට්ඨො.

ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අමොහො හොති, අනභිජ්ඣා හොති, අබ්‍යාපාදො හොති, සම්මාදිට්ඨි හොති, හිරි හොති, ඔත්තප්පං හොති, කායපස්සද්ධි හොති, චිත්ත පස්සද්ධි හොති, කායලහුතා හොති, චිත්තලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සම්පජඤ්ඤං හොති, සමථො හොති, විපස්සනා හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති,'' එවං ධම්මුද්ධාරං කරොන්තෙන භගවතා ඵස්සාදයො තිංසධම්මෙ ඡප්පඤ්ඤාස කත්වා ඵස්සපඤ්චකරාසි, ඣානපඤ්චකරාසි, ඉන්ද්‍රියට්ඨකරාසි, මග්ගපඤ්චකරාසි, බලසත්තකරාසි, හෙතුත්තිකරාසි, කම්මපථත්තිකරාසි, ලොකපාලදුකරාසි, ඡයුගලකරාසි, උපකාරදුකරාසි, විරියසමථදුකරාසීති සත්තරසන්නං රාසීනං වසෙන විභඞ්ගො[3] කතො. කථං? ඵතෙසු හි චිත්තං තාව ඵස්සපඤ්චකං පත්වා චිත්තං හොතීති වුත්තං, ඉන්ද්‍රියානි පත්වා මනින්ද්‍රියං විතක්කො ඣානඞ්ගානි පත්වා විතක්කො හොතීති වුත්තො, මග්ගඞ්ගානි පත්වා සම්මාසඞ්කප්පොති. සද්ධා ඉන්ද්‍රියානි පත්වා සද්ධින්ද්‍රියං හොතීති වුත්තා, බලානි පත්වා සද්ධාබලන්ති. හිරි බලානි පත්වා හිරිබලං හොතීති වුත්තං; ලොකපාලදුකං පත්වා හිරීති. ඔත්තප්පෙපි එසෙව නයො. අලොභො මූලං පත්වා අලොභො හොතීති වුත්තො, කම්මපථං පත්වා අනභිජ්ඣාති. අදොසො මූලං පත්වා අදොසො හොතීති වුත්තො, කම්මපථං පත්වා අබ්‍යාපාදොති. ඉමෙ සත්ත ද්වීසු ඨානෙසු විභත්තා. වෙදනා ඵස්සපඤ්චකං පත්වා ''වෙදනා හොතී''ති වුත්තා, ඣානඞ්ගානි පත්වා සුඛන්ති, ඉන්ද්‍රියානි පත්වා සොමනස්සින්ද්‍රියන්ති, එවමයං එකො ධම්මො තීසු ඨානෙසු විභත්තො. විරියම්පන ඉන්ද්‍රියානි පත්වා විරියින්ද්‍රියං හොතීති වුත්තං; මග්ගඞ්ගානි පත්වා සම්මාවායාමොති, බලානි පත්වා විරියබලන්ති. විරියසමථං පත්වා පග්ගාහොති. සති පි ඉන්ද්‍රියානි පත්වා සතින්ද්‍රියං හොතීති වුත්තා, මග්ගඞ්ගානි පත්වා සම්මාසතීති, බලානි පත්වා සතිබලන්ති, උපකාරදුකං පත්වා සති හොතීති එවං ඉමෙ ද්වෙ ධම්මා චතූසු ඨානෙසු විභත්තා. සමාධි පන ඣානඞ්ගානි පත්වා චිත්තස්සෙකග්ගතා හොතීති වුත්තො; ඉන්ද්‍රියානි පත්වා සමාධින්ද්‍රියන්ති, මග්ගඞ්ගානි පත්වා සම්මාසමාධීති, බලානි පත්වා සමාධිබලන්ති, යුගනද්ධදුකං පත්වා සමථොති, විරියසමථං පත්වා අවික්ඛෙපොති, එවමයං එකො ධම්මො ඡසු ඨානෙසු විභත්තො. පඤ්ඤා පන ඉන්ද්‍රියානි පත්වා පඤ්ඤින්ද්‍රියං හොතීති වුත්තා; මග්ගඞ්ගානි පත්වා

3. M. විභාගො.

සම්මාදිට්ඨීති, බලාති පත්වා පඤ්ඤාබලන්ති, මූලාති පත්වා අමොහොති, කම්මපථම්පත්වා සම්මාදිට්ඨීති, උපකාරද්දුකං පත්වා සම්පජඤ්ඤන්ති, යුගනද්ධදුකං පත්වා විපස්සනාති, එවමයං එකො ධම්මො සත්තසු ඨානෙසු විභත්තොති. එවමෙතෙ ද්වාදසධම්මා ඉන්ද්‍රියාදිතංතංකිච්චවන්තතාය ද්විට්ඨානිකාදිභෙදෙන සත්තරසසු රාසීසු විභත්තා. ඉතරෙ අට්ඨාරස කිච්චවසෙන භෙදාභාවතො එකට්ඨානිකා යෙවාති.

ඉමෙසු පන සත්තරසසු රාසීසු යෙවාපනකධම්මා එකරාසිම්පි න භජන්ති, තංතංකිච්චාභාවතොති කත්වා වුත්තං (72) **රාසී භජන්ති නා**ති. නනු චෙතෙ කිඤ්චාපි සෙසරාසයො න භජන්ති තෙසං සදිසකිච්චසංගහවසෙන ඨිතත්තා, ඵස්සපඤ්චකරාසි පන ඛන්ධසංගහවසෙනෙව ඨපිතොති චෙතනාය විය තෙසං සංඛාරක්ඛන්ධසංගහතො තත්ථ සමවරොධො යුත්තොති? තං න. ඛන්ධසංගහවසෙන ඨපිතො පි ඵස්සපඤ්චකරාසි සබ්බචිත්තසාධාරණධම්මෙ සංගහෙත්වා ඨපිතො. ඡන්දාදීනං තිණ්ණං පකිණ්ණකවසෙන උප්පජ්ජමානානං සබ්බචිත්තසාධාරණතාය අභාවතො මනසිකාරස්ස ච සති පි සබ්බචිත්තසාධාරණත්තෙ නිප්පරියායතො සංඛාරක්ඛන්ධසංගහාභාවතො න එතෙසං ඵස්සපඤ්චකරාසිභජනම්පි යුත්තන්ති. කස්මා පන මනසිකාරස්ස නිප්පරියායතො ඛන්ධසංගහාභාවොති? වුච්චතෙ : ඨපෙත්වා චෙතනං සෙසධම්මානං සකසකකිච්චෙසු පි පරාධීනභාවෙන පවත්තනතො අභිසංඛරණලක්ඛණං නිප්පරියායතො න ලබ්භති යදි න ලභෙය්‍ය චිත්තෙකග්ගතා - ජීවිතින්ද්‍රියානං සබ්බචිත්තසාධාරණත්තා වෙදනාවිඤ්ඤාණානි විය තානි ඵස්සපඤ්චකෙ වත්තබ්බානි සියුං. න පනෙවං වුත්තානි. තස්මා ඨපෙත්වා චෙතනං සෙසධම්මානං අභිසංඛාරලක්ඛණං නිප්පරියායතො න ලබ්භතීති න තෙසං නිප්පරියායතො ඛන්ධසංගහො ලබ්භති. චෙතනාය යෙව පන සකකිච්චපරකිච්චසාධනවසෙන පවත්තනතො නිප්පරියායතො අභිසංඛරණලක්ඛණස්ස අත්ථිතාය ඛන්ධසංගහෙ ලබ්භතීති. යදි එවං කථං එසො ඵස්සපඤ්චකෙ වුත්තොති? "ඵස්සපච්චයා වෙදනා," "ඵුට්ඨො සඤ්ජානාතී"ති ආදිවචනතො වෙදනා සඤ්ඤා චෙතනා විඤ්ඤාණන්ති ඉමෙසං අරූපක්ඛන්ධානං උද්දෙසට්ඨානෙ ඨත්වා[2] චෙ'සං[3] පච්චයස්සපි උද්දිසිතුකාමතාය එසො තත්ථ වුත්තො.

(72) **දුබ්බලා**ති සකවිසයෙ ච පරායත්තභාවෙනෙව පවත්තනතො දුබ්බලා. අධිමොක්ඛො හි සමාධිස්ස පරිව්‍යත්තභාවෙ ව්‍යත්තභාවතො සමාධායත්තවුත්තී. මනසිකාරොපි චෙතනාය

---

1. M අභිසංඛරණ—. 2. ඨපෙත්වා. 3. M. තෙසං.

පරිව්‍යත්තභාවෙ ව්‍යත්තභාවතො චෙතනායත්තවුත්තී ති පරායත්තා ච තෙ හොන්ති (73) මනසි **කරොතී**ති මනසිකාරො. මනසිකාරසද්දස්ස හි අත්ථමත්තසන්දස්සනවසෙන ගාථාබන්ධසුඛත්ථං අසමාසනිද්දෙසො දීඝකරණං මජ්ඣෙ ච වසද්දවචනං ති. තෙන **මුනිවරෙනා** ති සම්බන්ධො.

(74.) **පඨමාභිනිපාතත්තා** ති ආරම්මණෙ ඵුසනවසෙන පඨමමෙව අභිනිපතනතො. සබ්බෙපි චෙතසිකා චිත්තායත්තා චිත්තකිරියභාවෙන වුච්චන්තීති **චිත්තස්සා** ති වුත්තං. කිරාති අරුචිසූචනං. එවං කෙසඤ්චි[1] වචනං[1] දස්සෙත්වා ඉදානි තමෙව විත්ථාරෙතුං (57.) **ඵුසිත්වා පනා** ති ආදි වුත්තං. මහාසංඝිකා හි පඨමං ඵස්සො ආරම්මණං ඵුසති, අථ තෙන ඵුට්ඨො[2] දුතියං වෙදනා වෙදියති, එවං එතෙහි ඵුට්ඨවෙදිතං තතියං සඤ්ඤා සඤ්ජානාති. තෙහි පන ඵුට්ඨවෙදිතසඤ්ඤාතෙ චතුත්ථං චෙතනා[3] සම්පයුත්ත-ධම්මෙ අභිසන්දහතීති ආදිනා වදන්ති. (76) **බලවපච්චයත්තා** ති යථා පාසාදං පත්වා ථම්භා සෙස-දබ්බසම්භාරානං බලවපච්චයා, එවමෙස යස්මා සෙසසම්පයුත්තානං බලවපච්චයො, තස්මාති අත්ථො. **තස්මා** ති හෙතුනිගමනං.

(77) **සහෙව** චාති ච – සද්දො අට්ඨානප්පයුත්තො. සො **චිත්ත ජාතං** ති ඉමස්ස අනන්තරං දට්ඨබ්බො. තස්මා චිත්තානං චිත්ත ජාතං ච එකුප්පාදාදිභාවෙන සහෙව පවත්තිතො ති එවමෙත්ථ පදසම්බන්ධො වෙදිතබ්බො. **ඉදං** ති ඉදං යථා වුත්තවිධානං. එවං **පඨමාභිනිපාතත්තා** ති කාරණං පරිහරිත්වා ඉදානි **බල-වපච්චයත්තා** ති ඉදං පරිහරන්තො ආහ: (78) **බලවපච්ච-යත්තෙපි කාරණං න ච දිස්සතී** ති. චසද්දො අවධාරණෙ, නෙව දිස්සතී ති අත්ථො. සෙසධම්මානං පි හි සහජාතපච්චයසභාවස්ස සාධාරණත්තා තස්සෙව බලවපච්චයභාවෙ න කිඤ්චි කාරණං දිස්සතී ති. යදි සබ්බමිදමකාරණං, කථඤ්චරහි එසො පඨමං වුත්තොති ආහ: (79) **දෙසනාක්කමතො** ති අදිං. "වෙදනා හොති, එසො හොති; සඤ්ඤා හොති, එසො හොති; චෙතනා හොති, එසො හොති; චිත්තං හොති, එසො හොති; වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, විතක්කො හොතී"ති ආදීහි ආහරිතුම්පි වට්ටෙය්‍ය, දෙසනාද්වාරෙන පන එසො පඨමං වුත්තොති වෙදිතබ්බො. යථා චෙත්ථ, එවං සෙසධම්මෙසුපි පුබ්බාපරක්කමො නාම න පරියෙසිතබ්බො.

**17. වචනත්ථලක්ඛණාදියී ති** වචනත්ථතො ලක්ඛණාදිතො ච. **ඵුසතී** ති කත්තුනිද්දෙසො. තත්ථ කාරණං හෙට්ඨා වුත්තමෙව.

---

1. M. මහාසංඝිකමතං. 2 M. ඵුට්ඨං. 3. M. චෙතනාය.

ඵුසතීති එතෙන වාති එසො. සම්පයුත්තධම්මා හි ආරම්මණෙ පවත්තමානා තං ඵුසනලක්ඛණෙන ඵුසන්තා විය හොන්ති. ආරම්මණඵුසනමත්තං වා එසොති පි සාධනත්තයම්පි යුජ්ජතෙව. ඵුසනං ලක්ඛණමෙතස්සාති **ඵුසනලක්ඛණො**. වෙදනාය පච්චයභාවෙන ආරම්මණ-ඵුසනලක්ඛණො ති අත්ථො. **සංඝට්ටනරසො** ති මනොද්වාරෙ චිත්තාලම්බණානං සංඝට්ටනතො සංඝට්ටනකිච්චො. අයං හි ආරම්මණෙ අනල්ලීයමානො රූපං විය චක්ඛුං, සද්දො විය ච සොතං චිත්තමාරම්මණං ච ඝට්ටෙති. පඤ්චද්වාරෙසු වා වත්ථාරම්මණ - සංඝට්ටනෙන සම්පජ්ජතී ති සංඝට්ටනසම්පත්තිකො එසො සංඝට්ටනරසො ති වුත්තො. "යථා ද්වෙ පාණී වජ්ජෙය්‍යුං"ති ආදීසු පාණීම්හි ඝට්ටනං තබ්බිසෙසභූතා රූපධම්මා, එවං චිත්තස්ස ආරම්මණෙ සංඝට්ටනං තබ්බිසෙසභූතො එකො චෙත-සිකධම්මොති දට්ඨබ්බො. තිකසන්නිපාතසංඛාතස්ස[1] අත්තනො කාරණස්ස වසෙන පවෙදිතත්තා **සන්නිපාතපච්චුපට්ඨානො**, "චක්ඛුං ච පටිච්චා"ති හි වචනතො චක්ඛු - රූප - විඤ්ඤාණාදීනං තිණ්ණං සන්නිපාතවසෙන ගහෙතබ්බතාය උපට්ඨානතො සන්නිපාත-සංඛාතස්ස කාරණස්ස වසෙන උපට්ඨානමස්සාති උපට්ඨානට්ඨෙන පච්චුපට්ඨානෙන සන්නිපාතපච්චුපට්ඨානතා වුත්තා. "ඵස්සපච්චයා වෙදනා"ති වචනතො වෙදනා ඵලමස්සාති **වෙදනාපච්චුපට්ඨානො**. තජ්ජසමන්නාහාරෙන[2] චෙව ඉන්ද්‍රියෙන ච පරික්ඛතෙ විසයෙ අනන්තරායෙනෙව උප්පජ්ජනතො **ආපාථගතවිසයපදට්ඨානො**. අයං හි තස්ස ඵස්සස්ස කාරණභූතො තදනුරූපභූතො සමන්නා-හාරොති තජ්ජාසමන්නාහාරසංඛාතෙන ආවජ්ජනෙන චෙව චක්ඛාදි ඉන්ද්‍රියෙන ච යථාක්කමං ආරම්මණකරණ - තදභිමුඛභාවවසෙන පරික්ඛටෙ අභිසංඛතෙ ආපාථගතෙ යෙව විසයෙ එකන්තෙනෙව උප්පජ්ජනතො අපාථගතො විසයො පදට්ඨානං ආසන්නකාරණං ඉමස්සාති **ආපාථගතවිසයපදට්ඨානො**.

තත්ථ චායං ධම්මො චෙතසිකො, සබ්බායං අරූපධම්මො සමානො කථං ඵුසනලක්ඛණො හොතීති අනොතාලිතවොදනං මනසිකත්වා තංසාධනත්ථං[3] **අරූපධම්මොපි සමානොති** ආදි වුත්තං. තත්ථ **ඵුසනාකාරෙනෙව පවත්තතීති** ඉමිනා අරූපස්සාපි සතො තස්ස ධම්මස්ස අයං සභාවොති දස්සෙති. සා ච තස්ස ඵුසනාකාරප්පවත්ති අම්බිලං අම්බපක්කාදිං ඛාදන්තං පස්සන්තස්ස පරස්ස ඛෙළුප්පත්ති, පරං බාධියමානං දිස්වා දයාලුකස්ස සරීරකම්පනං, රුක්ඛසාඛග්ගෙ දුඞිතං පුරිසං දිස්වා භූමියං ඨිතස්ස

1 M තිණ්ණං සන්නිපාත—. 2. M. තජ්ජාසමන්නාහාරෙන
3. M. තස්සා සොධනත්ථං.

ඉතරපුරිසස්ස[1] ජංඝාචලනං, පිසාචාදිං භාසිතබ්බං දිස්වා උත්තරන්තොම්හීති එවමාදි. විය දට්ඨබ්බා. **ඵස්සො**ති සො යථාවුත්තලක්ඛණාදිකො ඵස්සො

18. **සුඛන්**ති සුඛවෙදනාසම්පයුත්තත්තා පසත්ථං. **මනො**ති විඤ්ඤාණං. **සුමනස්ස භාවො**ති සුමනසංඛාතස්ස විඤ්ඤාණස්ස භාවො; ස්වායං සද්දප්පවත්තිනිමිත්තතො අත්ථො සො සොමනස්සං. සොමනස්සවෙදනාසම්පයුත්තත්තා හි සුමනසද්දො, තස්මිං විඤ්ඤාණෙ පවත්තති. වෙදෙත[2] අනුභවනාකාරෙන අයන්ති පවත්තතීති[3] වෙදයිතං. තං ලක්ඛණමිස්සාති **වෙදයිතලක්ඛණං**. ඉට්ඨස්ස ඉට්ඨාකාරතොව අනුභවනං කිච්චමස්සාති **ඉට්ඨානුභවනරසා** සා හි සභාවතො ඉට්ඨාරම්මණං ඉට්ඨවසෙන, ඉතරඤ්ච ඉට්ඨාකාරෙනෙව අනුභවති. තත්ථ ඉට්ඨාකාරානුභවනං කුසලාකුසලචිත්තසම්පයුත්ත වෙදනාය ලබ්භති, තස්සා අනිට්ඨස්සපි කප්පනාවසෙන ඉට්ඨාකාරෙන ගහණතො. සභාවතො පන ඉට්ඨානුභවනං අබ්‍යාකතචිත්තසම්පයුත්තායපි ලබ්භති, තස්සා විපල්ලාසගාහාභාවා. **රාජා විය සුභොජනරසන්**ති ඉමිනා ඉදං දීපෙති: ඵස්සස්ස ඵුසනමත්තමෙව හොති, සඤ්ඤාය සඤ්ජානනමත්තමෙව, චෙතනාය චෙතයිතමත්තමෙව, විඤ්ඤාණස්ස විජානනමත්තමෙව. එකංසතො පන ඉස්සරවතාය සාමිභාවෙන වෙදනා යෙව ආරම්මණරසං අනුභවති, රාජා විය සූදකාරෙන සම්පාදිතං සුභොජනරසන්ති. අස්සාදීයතීති අස්සාදො; සුඛවෙදනා. තෙනාහ භගවා: "යා භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වුච්චති භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධෙසු අස්සාදො" ති. චෙතොසන්නිස්සිතත්තා චෙතසි භවො අස්සාදොති චෙතසිකස්සාදො, තථා පච්චුපට්ඨාතීති **චෙතසිකඅස්සාදපච්චුපට්ඨානා**. පස්සද්ධකායො සුඛං වෙදියතීති ආහ **පස්සද්ධිපදට්ඨානා**ති. ඉදං පන නිරාමිසසොමනස්සස්ස වසෙන වෙදිතබ්බං.

නීලාදිභෙදස්ස ආරම්මණස්ස සඤ්ජානනං, තමෙව සඤ්ඤං කත්වා ජානනං ලක්ඛණං එතිස්සාති **සඤ්ජානනලක්ඛණා**. **පච්චභිඤ්ඤාණකරණරසා**ති පති අභිඤ්ඤායති[5] එතෙනාති පච්චභිඤ්ඤාණං තදෙවෙතන්ති පුන පච්චභිඤ්ඤාණනිමිත්තං; සණ්ඨානාදිකො ආකාරො. තස්ස කරණං රසො කිච්චමස්සාති පච්චභිඤ්ඤාණකරණරසා. සා හි උප්පජ්ජමානා පච්ඡා සඤ්ජානනස්ස කාරණභූතං සණ්ඨානාදිකං ආකාරං ගහෙත්වා උප්පජ්ජතීති. ඉදං ච නිමිත්තකාරිකාය නිමිත්තෙන සංජානන්තියා ච සබ්බාය සමානසඤ්ඤාය යොජෙතබ්බං. නිමිත්තෙන සංජානන්තීපි හි පුන අපරාය සඤ්ඤාය

1. M. පුරිසස්ස. 2. M. වෙදනාය. 3. M. අයිතං පවත්තං.
4. M. සංචෙතනාමත්තමෙව. 5. M. පච්චභිඤ්ඤායති.

සඤ්ජානනස්ස නිමිත්තං කරොතීති. තං ච කුසලාකුසලක්‍රියාජවනසඤ්ඤං ධුරං කත්වා වෙදිතබ්බං. තම්පනෙතං අභිඤ්ඤාණකරණං කථං දට්ඨබ්බන්ති ආහ: **වඩ්ඪකිස්ස අභිඤ්ඤාණකරණමිවා**ති. යථා වඩ්ඪකිස්ස දාරූසු ඉදං උද්ධං, ඉදං අධොති එවං පච්චභිඤ්ඤාජානන-පච්චයභූතස්ස සඤ්ඤාණස්ස කරණං, එවමස්සා පුන සඤ්ජානනපච්චයං නිමිත්තකරණන්ති වුත්තං හොති. හත්ථිදස්සක අන්ධා විය ඉදමෙව සච්චන්ති සඤ්ඤාය යථාගහිතනිමිත්තවසෙන අභිනිවෙසකරණතො **යථාගහිත =පෙ= අභිනිවෙසපච්චුපට්ඨානා.** එතෙන සඤ්ඤාය ආකාරගහණං කත්වා ඨිතස්ස දිට්ඨිආදීනං උප්පජ්ජනතො අකුසලසඤ්ඤාය අනුරූපවසෙන ඵලපච්චුපට්ඨානං දස්සිතං හොති. අථ වා අභිනිවෙසකරණන්ති "ඉදමෙව සච්චං"ති සඤ්ඤාභිනිවෙසමත්තමෙව, තස්මා උපපරික්ඛාවසෙන[1] යථාගහිත-නිමිත්තවසෙන අභිනිවෙසකරණාකාරෙන උපට්ඨානතො ආකාර-පච්චුපට්ඨානා වුත්තා. තිණපුරිසකෙසු මිගපොතකානං පුරිසාති උප්පන්නසඤ්ඤා විය අවිකප්පසභාවත්තා **යථාඋපට්ඨිතවිසයපදට්ඨානා.** එත්ථ ච ඤාණවිප්පයුත්තසඤ්ඤාය ආකාරගහණවසෙන උප්පජ්ජනකාලෙ චිත්තං අබ්බොහාරිකං සඤ්ඤානුගතං[3] හොති. ඤාණසම්පයුත්තචිත්තෙන පන සසම්භාරපථවියා අනුගතා සෙස-ධාතුයො විය සඤ්ඤා චිත්තං ච අබ්බොහාරිකං ඤාණානුගතිකං හොති.

**අභිසන්දහතී**ති පබන්ධති, පවත්තෙතීති. "ගණ්හථ, ගණ්හථා"ති වදන්තී විය සම්පයුත්තධම්මෙ ආරම්මණෙ පයොජෙති, සකසකකිච්චෙව වවත්ථපෙතීති[4] අත්ථො. **චෙතයිතලක්ඛණා**ති නිද්දෙක්කන්තස්ස පබුද්ධක්ඛණෙ සම්භමප්පවත්ති විය චෙතසො උස්සාහභාවලක්ඛණා. අථ වා අභිසන්දහතීති වුත්තත්තා යොජනලක්ඛණාත්වෙව අත්ථො. **ආයූහනරසා**ති චෙතසිකඉරියතරසා, පයොගරසාති වුත්තං හොති. කුසලාකුසලක්‍රියාජවනසම්පයුත්තායෙව[5] පනෙතං ලබ්භති. **සංවිදහනපච්චුපට්ඨානා**ති "ත්වං ඉදං කරොහී"ති විචාරෙන්තී විය හොතීති විචාරණපච්චුපට්ඨානා. එතාය හි පවත්තමානාය සබ්බෙපි සම්පයුත්තධම්මා යථාසකකිච්චපසුතා හොන්ති; තෙනෙව හෙසා **සකකිච්ච – පරකිච්චසාධිකා** වුත්තා. ජෙට්ඨසිස්සො පරෙ සජ්ඣායන්තෙ උය්‍යොජෙන්තො සයම්පි සජ්ඣා-යති. තස්මිං හි සජ්ඣායිතුං ආරද්ධෙ සෙසසිස්සාපි සජ්ඣායන්ති. මහාවඩ්ඪකිම්හි කිස්මිඤ්චි වඩ්ඪකීකම්මං කාතුං ආරද්ධෙ ඉතරෙපි කරොන්ති යෙවාති ආහ: **ජෙට්ඨසිස්ස – මහාවඩ්ඪකී ආදයො වියා**ති. ආදිසද්දෙන ජෙට්ඨන්තෙවාසිකාදීනං ගහණං.

---

1. M. උපපරික්ඛාභාවෙන. 2. M. අභිනිවෙසාකාරෙන. 3. M සඤ්ඤානුගතිකං. 4. M. පඨපෙතීති! 5. M. සම්පයුත්තායෙව.

යථාපච්චයං පවත්තමානානං ධම්මානං නත්ථි කාචි වසංවත්තිතාති වචනවත්තිභාවනිවාරණත්ථං **විතක්කනං විතක්කො**ති වුත්තං. ඌහනං ආරම්මණස්ස පරිකප්පනං, තස්මිං අභිනිරොපනංති වා වුත්තං හොති. යස්මා චිත්තං විතක්කබලෙන ආරම්මණෙ අභිරූළ්හං විය හොති, තස්මා වුත්තං **ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛණො**ති. යථා හි කොචි ගාමවාසිකො පුරිසො රාජවල්ලභං තං සම්බන්ධිනං මිත්තං වා නිස්සාය රාජගෙහං ආරොහති, අනුපවිසති, එවං විතක්කං නිස්සාය චිත්තං ආරම්මණං ආරොහති. න හි ද්විපඤ්චවිඤ්ඤාණ - දුතියජ්ඣානාදිකෙ විතක්කො උපලබ්භති යස්ස බලෙන තං ආරොහති, තස්මා සභාවතො භාවනාබලෙන තත්ථ අනුප්පජ්ජනකො සච්චං, තම්පි විතක්කබලෙන ආරොහති. යථා හි සො පුරිසො පරිචයෙන තෙන විනාපි නිරාසංකො රාජගෙහං පවිසති, එවං පරිචයෙන විතක්කෙන විනාපි අවිතක්කං චිත්තං ආරම්මණං ආරොහති. පරිචයොති චෙත්ථ සන්තානෙ අභිණ්හං පවත්තස්ස වසෙන චිත්තස්ස ආරම්මණාභිරොහනං චිරපරිචිතං. තෙන තං[1] කදාචි විතක්කෙන විනාපි තත්ථ පවත්තතෙව; යථා තං ඤාණසහිතං හුත්වා සම්මසනවසෙන[2] චිරපරිචිතං කදාචි ඤාණරහිතම්පි සම්මසනවසෙන[2] පවත්තති, යථා වා කිලෙසසහිතං හුත්වා පවත්තං සබ්බසො කිලෙසරහිතම්පි පරිචයෙන කිලෙසවාසනාවසෙන පවත්තති, එවං සම්පදමිදං දට්ඨබ්බං. අථ වා ද්විපඤ්චවිඤ්ඤාණං අවිතක්කම්පි වත්ථාලම්බණඝට්ටනස්ස බලවතාය, දුතියජ්ඣානාදීනි ච හෙට්ඨිමහෙට්ඨිමභාවනාය බලවතාය ආරම්මණං ආරුහන්ති. ආදිතො, ආමුඛං[3] වා හනනං පහරණමත්තං **ආහනනං**, පරිතො පරිවත්තෙත්වා හනනං, විසෙසෙන පහරණං **පරියාහනනං**. තං කිච්චමස්සාති **ආහනනපරියාහනනරසො**. තථා හි තෙන යොගාවචරො ආරම්මණං තක්කාහතං[4] විතක්කපරියාහතං කරොතීති. ආනයනං චිත්තස්ස ආරම්මණෙ උපනයනං ආකඩ්ඪනං වා; තථා හුත්වා පච්චුපට්ඨානමස්සාති **ආනයනපච්චුපට්ඨානො**.

**තෙනා**ති තෙන විචාරෙන, කාරණභූතෙන හෙතුභූතෙන වා චිත්තං **ආරම්මණෙ විචරති** අනුවිචරති. අවිචාරචිත්තස්ස පන අවිතක්කචිත්තෙ වුත්තානුසාරෙන පවත්ති වෙදිතබ්බා. විචරණං **අනුසඤ්චරණං** අනුපරිගමනං. ස්වායං විසෙසො සන්තානම්හි ලබ්භමානො ජවනසන්තානෙ පාකටො හොතීති දට්ඨබ්බො. එස නයො සෙසෙසුපි. ආරම්මණස්ස අනුමජ්ජනං අනුමසනං පරිමජ්ජනමස්ස ලක්ඛණන්ති **ආරම්මණානුමජ්ජනලක්ඛණො**. තථා හි විචාරො පරිමජ්ජනහත්ථො විය සංසාරණහත්ථො වියාති වුච්චති.

---

1. M. තං චිත්තං. 2. B. සමථවසෙන. M. 3. අභිමුඛං.
4. M. විතක්කපරියාහතං.

**තථා**ති ආරම්මණෙ **සහජාතානං** අනුයොජනං, ආරම්මණෙ අනුවිචරණසඞ්ඛාත - අනුමජ්ජනවසෙනව වෙදිතබ්බං ධම්මානං හි සභාවවිනිමුත්තා කාචි කිරියා නාම නත්ථි. තථා ගහෙතබ්බාකාරො බොධනෙය්‍යජනානුරොධවසෙන පන පරමත්ථතො එකසභාවොපි සභාවධම්මො පරියායවචනෙහි විය සමාරොපිතරූපෙහි බහූහි පකාරෙහි පකාසීයති. එවං හි සො සුට්ඨු පකාසිතො හොතීති. **අනුප්පබන්ධපච්චුපට්ඨානො**ති ආරම්මණෙ චිත්තස්ස අවිච්ඡින්නස්ස විය පවත්තිපච්චුපට්ඨානො තථා හි සො අනුසන්ධානතාති නිද්දිට්ඨො.

එත්ථ විචාරතො ඔළාරිකට්ඨෙන තස්සෙව පුබ්බඞ්ගමට්ඨෙන පඨම ඝණ්ටාභිරවො විය චෙතසො පඨමාභිනිපාතො විතක්කො; අනුරවො විය අනුසඤ්චරණං විචාරො. යථා හි ඝණ්ටාභිඝාතජො පඨමාභිරවො අනුරවතො ඔළාරිකො පුබ්බඞ්ගමො ච හොති, එවං ආරම්මණාභි-නිරොපනට්ඨෙන විතක්කො ඔළාරිකො ච පුබ්බඞ්ගමො විය ච හොති. තතො සුඛුමට්ඨෙන අනුමජ්ජනසභාවෙන[2] ච ඝණ්ටානුරවො විය අනුප්පබන්ධො විචාරො. විප්ඵාරවා චෙත්ථ විතක්කො, චිත්තස්ස පඨමුප්පත්තිකාලෙ චිත්තස්ස පරිප්ඵන්දනභූතො, ආකාසෙ උප්පතිතුකාමස්ස සකුණස්ස පක්ඛවික්ඛෙපො විය, පදුමාභිමුඛපාතො විය ච ගන්ධානුබද්ධචෙතසො භමරස්ස. සන්තවුත්ති විචාරො චිත්තස්ස නාතිපරිප්ඵන්දනභාවො, ආකාසෙ උප්පතිතස්ස සකුණස්ස පක්ඛප්පසාරණං විය, පදුමස්ස උපරිභාගෙ පරිබ්භමණං විය ච පදුමාභිමුඛපතිතස්ස භමරස්ස. ආගමට්ඨකථායම්පන විපරියායෙන ආගතං. තථා ච වුත්තං දුකනිපාතට්ඨකථායං: "ආකාසෙ ගච්ඡන්තස්ස මහා සකුණස්ස උභොහි පක්ඛෙහි වාතං ගහෙත්වා පක්ඛෙ සන්නිසීදපෙත්වා ගමනං විය ආරම්මණෙ චෙතසො අභිනිරොපනභාවෙන පවත්තො විතක්කො. වාතගහණත්ථං පක්ඛෙ ඵන්දාපයමානස්ස ගමනං විය අනුමජ්ජනභාවෙන පවත්තො විචාරො"ති වුත්තං. තම්පි අනුප්පබන්ධෙන පවත්තියං යුජ්ජති. තථා හි උපචාරෙ අප්පණායං වා සන්තානෙන පවත්තියං විතක්කො නිච්චලො හුත්වා ආරම්මණං අනුපවිසිත්වා විය පවත්තති, න පඨමාභිනිපාතෙ විය පාකටො හොතීති.

**පීණයතී**ති කායචිත්තං අප්පෙති[3] වඩ්ඪෙති වා. **සම්පියායනලක්ඛණා**ති ආරම්මණං කල්ලතො ගහණලක්ඛණා. **පීණනරසා**ති කායචිත්තානං පරිබ්‍රූහනකිච්චා. **ඵරණරසා වා**ති පණීතරූපෙහි කායස්ස ව්‍යාපනරසා අත්තනා සම්පයුත්ත - චිත්තසමුට්ඨානෙහි රූපෙහි සකලරූපකායව්‍යාපනං කරොතීති වුත්තං හොති. න හි අඤ්ඤථා ඉමිස්සා ඵරණං හොති ධම්මානං අබ්‍යාපාරත්තාය කෙසග්ගමත්තම්පි සඞ්කමනාභාවතො. උදග්ගභාවො **ඔදග්‍යං**.

1 M අවිච්ඡින්නං විය 2. M අනුමජ්ජනට්ඨෙන 3 M තප්පෙති

එකං ආරම්මණං අග්ගමෙතස්සාති එකග්ගං, චිත්තං. යෙන පන ධම්මෙන යොගතො තං එකග්ගං නාම හොති, සො එකග්ගභාවො. සො පන චිත්තස්සෙව හොති, න යස්ස කස්සචීති ආහ: **චිත්තස්ස එකග්ගභාවො** ති. නිවාතෙ දීපසිඛාය ඨිති විය චිත්තස්ස ඨිතීති වුත්තං හොති. විසාරස්ස ව්‍යග්ගභාවස්ස පටිපක්ඛො සභාවො අවිසාරො. න විසාරභාවමත්තතා[1] ඉමිස්ස ලක්ඛණං ති ආහ **අවිසාරලක්ඛණං** ති. අවික්ඛෙපො සම්පයුත්තධම්මානං අවික්ඛිත්තතා, අවිසාරාවික්ඛෙපානං සමාධානභාවතො අත්ථතො විසෙසාභාවෙපි සමුඛෙන සම්පයුත්තමුඛෙන ච උභයං වුත්තං ති[2] දට්ඨබ්බං. අවූපසමලක්ඛණස්ස වික්ඛෙපස්ස පටිපක්ඛතාය චිත්තස්ස උපසමනාකාරෙන පච්චුපට්ඨාතී ති **උපසමපච්චුපට්ඨානො. විසෙසතො** ති යෙභුය්‍යෙන. සුඛවිරහිතොපි අත්ථි සමාධීති සො යෙභුය්‍යෙන **සුඛපදට්ඨානො** හොති. අථ වා **විසෙසතො** ති අතිසයෙන. "සුඛිනො චිත්තං සමාධියතී"ති වචනතො හි සුඛං සමාධිස්ස විසෙසකාරණං; සුඛවිරහිතස්ස පි තදුපනිස්සයෙනෙව සම්භවතො.

**සද්දහන්ති එතායාති** කම්මඵලාදිසද්දහනකිරියාය පවත්තමානානං ධම්මානං තත්ථ අධිපතිභාවෙන[3] සද්ධාය පච්චයතං දස්සෙති. තස්සා හි ධම්මානං තථා පච්චයභාවෙ සති තංසමඞ්ගී පුග්ගලො සද්දහතීති වොහරීයති. සද්දහනං සද්ධෙය්‍යවත්ථුනො පත්තියායනං, තං ලක්ඛණමෙතිස්සාති **සද්දහනලක්ඛණා**. **කාලු-සියමලං** විධමෙත්වා සම්පයුත්තානං, පුග්ගලස්සෙව වා පසාදං අනාවිලභාවකරණං කිච්චමෙතිස්සාති **පසාදනරසා**. යථාකථං වියාති ආහ **උදකප්පසාදකමණි වියා** ති. **අකාලුසියපච්චුපට්ඨානාති** අනාවිලභාවපච්චුපට්ඨානා. රතනත්තයං, කම්මං කම්මඵලඤ්ච සද්ධෙය්‍යවත්ථු. තං ඉමිස්සා ආසන්නකාරණන්ති **සද්ධෙය්‍යවත්ථු-පදට්ඨානා.** න හි සද්ධාය අවත්ථුභූතෙසු තිත්ථියාදිසු සා උප්පජ්ජති. සා පනායං කුසලධම්මානං ආදානෙ හත්ථො විය, සම්පත්තිසම්පදානෙ විත්තං විය, අමතකසිඵලඵලනෙ බීජං විය ච දට්ඨබ්බා, "සද්ධාහත්ථො මහානාම අරියසාවකො" "සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං" "සද්ධා බීජං තපො වුට්ඨී"ති ආදි වචනං හෙත්ථ සාධකං.

**සරන්ති එතායා** ති සරණකිරියාය පවත්තමානානං ධම්මානං තත්ථ ආධිපච්චභාවෙන සතියා පච්චයතං දස්සෙති. තස්සා හි ධම්මානං තථා පච්චයභාවෙ සති තංසමඞ්ගී පුග්ගලො සරතී ති වොහරීයති, උදකෙ අලාබු විය පිලවිත්වා ගන්තුං අදත්වා පාසාණස්ස විය නිච්චලස්ස ආරම්මණස්ස ඨපනං අපම්මුට්ඨකරණං

1 M. - මත්තං. 2 M වුත්තන්ති. 3. M. ආධිපච්චභාවෙන.

අපිලාපනං; තං ලක්ඛණමෙතස්සාති **අපිලාපනලක්ඛණා**. සාහි ආරම්මණෙ දළ්හපතිට්ඨිතත්තා එසිකා වියාති වුච්චති. සම්මොසපච්චනීකං කිච්චං අසම්මොසො; න සම්මොසාභාවමත්තං. "සතාරක්ඛෙන චෙතසා විහරතී"ති වුත්තත්තා චෙතොගුණරතනාපහාරකානං කිලෙසචොරානං[1] නිවාරණතො ආහ **ආරක්ඛපච්චුපට්ඨානා**ති. තථා හෙසා චක්ඛුද්වාරාදිරක්ඛනතො දොවාරිකො වියාති වුච්චති. පඨමං සඤ්ඤාය ථිරුප්පත්තභාවෙ පච්ඡා සතියා පදට්ඨානභාවතො ආහ **ථිරසඤ්ඤාපදට්ඨානා**ති. අථ සති-සඤ්ඤානං කිං නානාකරණන්ති? සඤ්ඤා තාව පඨමං අගහිතනිමිත්තං[2] සඤ්ජානාති, ගහිතනිමිත්තෙන[3] පුන පච්චභිඤ්ඤාණප්පච්චයං[4] නිමිත්තං කරොති. පඨමං අනභිතෙ පන සඤ්ඤාකිච්චං අප්පධානං හොති; සති පන පඨමං අගහිතනිමිත්තඤ්ච සරති, ගහිතනිමිත්තම්පි. ගහිතනිමිත්තෙ පන සතිකිච්චං ගුණභූතං හොතීති ඉදමෙතාසං නානත්තං.

19. **වීරභාවො**ති යෙන වීරො නාම හොති සො ධම්මො. **වීරානං වා කම්ම**න්ති යෙන කම්මෙන වීරො නාම හොති, තං වීරානං කම්මං නාම. විරියං පන තස්ස සාධකභාවතො තථා වුත්තං. ධම්මවිනිමුත්තං වා කිඤ්චි කම්මං නත්ථීති විරියමෙව කම්මභාවෙන වුත්තන්ති දට්ඨබ්බං. විධිනා ඊරෙතබ්බං පවත්තෙතබ්බන්ති වා **විරියං**, උස්සාහො, තංතංකිච්චසමාරම්භො පරක්කමො වා. උපත්ථම්භනම්පන සම්පයුත්තධම්මානං කොසජ්ජපක්ඛෙ පතිතුං අදත්වා ධාරණං අනුබලප්පදානං. සම්පයුත්තානං සංසීදනභාවනිවාරකො ධම්මො, න සංසීදනාභාවමත්තං. අසංසීදනභාවෙන පච්චුපට්ඨාතීති **අසංසීදනභාවපච්චුපට්ඨානං**. "සංවිග්ගො යොනිසො පදහතී"ති වචනතො **සංවෙගපදට්ඨානං**. සංවෙගොති චෙත්ථ සංවෙගමයං ඤාණං. අසංවෙගපුබ්බිකාය පන කුසලකිරියාය විරියාරම්භවත්ථු පදට්ඨානං. තත්ථ විරියාරම්භවත්ථූනි නාම: මග්ගො ගන්තබ්බො හොති; ගතො[5] කම්මං කාතබ්බං හොති; කම්මං කතං[6] අප්පමත්තකො ආබාධො උප්පන්නො හොති, ගිලානා වුට්ඨිතො හොති, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, ලභති පාරිපූරින්ති එවං වුත්තානි එතානි අනුරූපපච්චවෙක්ඛනසහිතානි අට්ඨවිරියාරම්භවත්ථූනි තම්මූලකානි වා පච්චවෙක්ඛනානීති. එත්ථ විතක්කො සම්පයුත්තධම්මෙ ආරම්මණං ආරොපෙති; චෙතනා තෙ තංතංකිච්චෙසු නියොජෙති; විරියම්පන තෙසං සංසීදිතුං අදත්වා උස්සාහෙතීති අයං විතක්ක-චෙතනාවිරියානං විසෙසො.

1. M. කිලෙසචොහාරානං. 2. M. ගහිතනිමිත්තං 3. M. අගහිතනිමිත්තං. 4. M. පච්චාභිඤ්ඤාණ- 5. M. මග්ගං ගතො 6. M. B. කතං. 7. M. තෙ.

**පජානනලක්ඛණා**ති විසෙසෙන ජානනලක්ඛණා යථාසභාව-පටිවෙධලක්ඛණාති අත්ථො. විසයස්ස ආරම්මණස්ස ඔභාසනං පකාසනං, තමපටිච්ඡාදකසම්මොහන්ධකාරස්ස විධමනතොති විසයොභාසනං. තං කිච්චමස්සාති **විසයොභාසනරසා**. කත්ථචි විසයෙ අසම්මුය්හනාකාරෙන සම්මොහපටිපක්ඛතාය වා පච්චුපට්ඨානතො, සම්මොහාභාවස්ස පච්චුපට්ඨානතො වා **අසම්මොහපච්චුපට්ඨානා**.

අත්තනා අනුපාලෙතබ්බානං සහජාතධම්මානං අනුපාලනං ජීවිතස්ස ව්‍යාපාරො, න ච[1] තෙසං ජීවනන්ති, තං තස්ස කාරණභාවං පුරක්ඛත්වා වුත්තං **ජීවනන්ති** තෙනාහ.. රූපාරූපජීවිතින්ද්‍රියස්ස අනුරූපතො ලක්ඛණාදිකං දස්සෙතුං **අත්තනා අවිනිබ්භුත්තානං ධම්මාන**න්ති වුත්තං. සම්පයුත්තානන්ති හි වුච්චමානෙ රූපධම්මානං[2] සම්පයොගාභාවතො රූපජීවිතින්ද්‍රියස්ස සංගහො න සියා **අවිනිබ්භුත්තාන**න්ති පන වුත්තෙ[3] යානි අවිනිබ්භොගරූපානි රූපජීවිතින්ද්‍රියෙන සද්ධිං අවිනිබ්භුත්තානි අවිසංසට්ඨානි යෙ ච අරූපධම්මා අරූපජීවිතින්ද්‍රියෙන සම්පයුත්තා, තෙසං සබ්බෙසං සංගහො හොතීති. **පවත්තනරස**න්ති උප්පාදතො යාව භඞ්ගා අනුපාලනතො අන්තරා අනිවත්තනසභාවසාධනෙන තෙසං පවත්තනකිච්චං. කෙචි පන රූපජීවිතින්ද්‍රියං තෙසං ඨිතික්ඛණතො පට්ඨාය. අරූපජීවිතින්ද්‍රියං උප්පාදතො පට්ඨාය පවත්තියා පච්චයොති වදන්ති. තං න යුත්තං; පට්ඨානෙ හි: "අව්‍යාකතං ධම්මං පටිච්ච අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච ඉන්ද්‍රියපච්චයං කම්මපච්චයසදිසං"ති අසඤ්ඤසත්තානං ඉන්ද්‍රියපච්චයො කම්මපච්චයසදිසං කත්වා වුත්තො තස්මා රූපජීවිතින්ද්‍රියම්පි උප්පාදතො පට්ඨාය පච්චයො හොතීති දට්ඨබ්බං උප්පාදතො යාව භඞ්ගා ඨපනතො **ඨපනපච්චුපට්ඨානං** අනුපාලනවසෙන යාපයිතබ්බා පවත්තෙතබ්බා ධම්මා පදට්ඨානා ඉමස්සාති **යාපයිතබ්බධම්මපදට්ඨානං**. යදි එතං තෙසං අනුපාලනාදිසාධකං, කථං[4] තෙසං නිරොධො හොති, එවං හි සබ්බකාලං ඨාතබ්බන්ති ආහ: **සන්තෙපි චා**ති ආදිං. **අනුපාලනලක්ඛණාදිම්හී**ති ආදිසද්දෙන පවත්තනරසාදිමෙව සංගණ්හාති. **අත්ථික්ඛණෙ යෙවා**ති අත්තනා අනුපාලෙතබ්බානං අත්තනො වා අත්ථික්ඛණෙ යෙව. **උදක**න්ති තළාකගතජලං දණ්ඩගතජලං වා. තත්ථ තළාකගතඋදකස්ස ගහණෙ අත්තනා අනුපාලෙතබ්බධම්මානං අත්ථික්ඛණෙ අනුපාලනං සාධිතං හොති, දණ්ඩගතජලස්ස පන ගහණෙ අත්තනො අත්ථික්ඛණෙ අනුපාලනං. අත්තනා අනුප්පාදිතධම්මෙ කථං පාලෙතීති ආහ: **ධාති විය කුමාර**න්ති. යදි සෙසධම්මානං පවත්තිකාර

1. M. තං ච. 2. M. රූපධම්මෙ. 3. M වුත්තත්තා 4 B න

ණෙන කෙනචි භවිතබ්බං, ජීවිතස්ස පන කිං පවත්තිකාරණන්ති ආහ: **සයම්පවත්තිතධම්මසම්බන්ධෙනෙව පවත්තතීති.** යථාකථං වියාති ආහ: **නියාමකො වියාති** සොපි අත්තනා පවත්තියමානනාවාසම්බන්ධෙන පවත්තතීති යදි ධම්මානං පවත්ති ජීවිතින්ද්‍රියපටිබද්ධං, භඞ්ගතො උද්ධම්පි කිං නප්පවත්තෙතී ති ආහ: **භඞ්ගතො උද්ධං** ති කස්මාති ආහ: **අත්තනො ච පවත්තෙතබ්බානං ච අභාවාති** භඞ්ගක්ඛණෙ පන කථන්ති ආහ: **න භඞ්ගක්ඛණෙ ඨපෙතීති**.

යස්මා ලොභපටිපක්ඛො අලොභො, යෙ ධම්මා තෙන සම්පයුත්තා, තංසමඞ්ගිනො වා සත්තා, තෙ න ලුබ්භන්ති, සයම්පි කදාචි න ලුබ්භතෙව, අත්තනො[1] වා අලුබ්භනාකාරො එව ච සො හොති. තස්මා වුත්තං න **ලුබ්භන්ති තෙනා** ති ආදිං. එස නයො **න දුස්සන්ති තෙනා** ති ආදිසුපි අලග්ගභාවො ආරම්මණං නිස්සාය පවත්තන්තස්සපි තත්ථ අනාසත්තතා. තෙනාහ **කමලදලෙ ජලබින්දු වියා** ති අපරිග්ගහො කස්සචි වත්ථුනො මමත්තවසෙන අසඞ්ගහො. **මුත්තභික්ඛු** වියාති ඛීණාසවභික්ඛු විය. සොහි මුත්තරාගත්තා කත්ථචි මමායනරහිතො හොති අනල්ලීනො භාවො අධිප්පායො එතස්සාති **අනල්ලීනභාවො**, එවං හි අසුචිම්හි පතිතපුරිසො වියාති උපමාය සමෙති. යථා හි තස්ස පුරිසස්ස සතිපි කායෙන අල්ලීයනභාවෙ අනල්ලීනො,[2] එවං අලොභොපි ආරම්මණකරණවසෙන ගහිතෙපි ආරම්මණෙ අලග්ගභාවෙන අනල්ලීනභාවො අනල්ලීනාකාරොයෙව පවත්තතී ති එවං සභාවො හි සො ධම්මොති.

චණ්ඩිකභාවො **චණ්ඩික්කං**, ඵරුසභාවො. අත්ථතො පන කොපොයෙව. තබ්බිපක්ඛො[3] අඵරුසභාවො අචණ්ඩික්කං. **අවිරොධො** අවිග්ගහො, අප්පටිපක්ඛසභාවො. **ආඝාතවිනයනරසො** ති එත්ථ ආඝාතො නාම පරස්ස අත්තනාතං, අත්තනො පරං උද්දිස්ස, පරස්ස ච පරං උද්දිස්ස පවත්තො උපනාහො, බලවකොපො. තස්ස විනයනරසො ති අපනයනරසො. **සොම්මභාවො** අමජ්ජනවසෙන සිලාදනියතා, සීතලභාවො වා. තෙනාහ: **පුණ්ණචන්දො වියා** ති.

**කායදුච්චරිතාදීහී** ති හෙතුම්හි කරණවචනං. හිරීයති ලජ්ජනාකාරෙන ජිගුච්ඡීයති. **තෙහි යෙවා** ති කායදුච්චරිතාදීහි යෙව. **ඔත්තප්පන්තී** ති උබ්බිජ්ජන්ති. හිරි පාපෙ ගූථෙ විය පස්සන්තී ජිගුච්ඡතී ති ආහ **පාපජිගුච්ඡනලක්ඛණා** හිරීති. ඔත්තප්පං තෙ උණ්හං විය පස්සන්තං තතො උත්තසතීති වුත්තං **උත්තා-**

1. M අත්ථතො. 2. මතො අනල්ලීනො. (?) 3. M තප්පටිපක්ඛො.

**සලක්ඛණං ඔත්තප්පං** ති. උභො ච **පාපානං අකරණරසා** ති ලජ්ජනාකාරෙන පාපානං අකරණරසා හිරි, උත්තාසනාකාරෙන[1] ඔත්තප්පං. **පාපතො සඞ්කොචනපච්චුපට්ඨානා** ති වුත්තප්පකාරෙනෙව පාපතො සඞ්කොචනාකාරෙන පච්චුපට්ඨානා. **අත්තගාරව - පරගාරවපදට්ඨානා** ති අත්තගාරවපදට්ඨානා හිරි, අජ්ඣත්තසමුට්ඨානතාය අත්තාධිපතිතාය ච; පරගාරවපදට්ඨානං ඔත්තප්පං බහිද්ධාසමුට්ඨානතාය ලොකාධිපතිතාය ච. අත්තානං හි ගරුං කත්වා හිරියා පාපං ජහාති,[2] කුලවධූ විය. පරං ගරුං කත්වා ඔත්තප්පෙන පාපං ජහාති,[2] වෙසියා විය. අජ්ඣත්තසමුට්ඨානාදිතා ච තෙසං තත්ථ තත්ථ පාකටභාවෙන වෙදිතබ්බා, න පන තෙසං කදාචි අඤ්ඤමඤ්ඤවියොගතො. න හි ලජ්ජනං නිබ්භයං, පාපභයං වා අලජ්ජනං අත්ථි. හිරියා බලවභාවෙ පන ඔත්තප්පං අබ්බොහාරිකං හොති, ඔත්තප්පස්ස බලවභාවෙ හිරි අබ්බොහාරිකා. ඉමෙ ච ද්වෙ ධම්මා[3] ලොකපාලානි වුච්චන්ති යථාහ: "ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා ලොකං පාලෙන්ති; කතමෙ ද්වෙ? හිරි ච ඔත්තප්පං ච. ඉමෙ ද්වෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං. න ඉධ පඤ්ඤායෙථ මාතාති වා මාතුලානීති වා"ති ආදිං.

පස්සම්භනං දරථවූපසමො. කායසද්දො සමූහවාචකො. සො චෙත්ථ වෙදනාදිඛන්ධත්තයං. වත්තිච්ඡාවසෙන හි සද්දො විසිට්ඨවුත්ති හොතීති ආහ **කායොති වෙදනා** ති ආදිං. **වෙදනාදයො** ති වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධොති තයො ඛන්ධා. තථා ච වුත්තං "තත්ථ කතමා තස්මිං සමයෙ කායපස්සද්ධි හොති? යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්සා"ති ආදි. **දරථොති** සාරම්භො, දොමනස්සපච්චයානං උද්ධච්චාදීනං කිලෙසානං, තථා පවත්තානං වා චතුන්නං ඛන්ධානමෙතං අධිවචනං. තස්ස වූපසමනං ලක්ඛණ-මස්සාති **කායචිත්තදරථවූපසමලක්ඛණා**. [20.] **කායචිත්තදරථ-නිම්මද්දනරසා** ති යථාවුත්තානමෙව පටිපක්ඛධම්මානං අභිභව-නරසා. දරථනිම්මද්දනෙන පරිළාහපරිප්ඵන්දවිරහිතො සීතිභාවො. අවූපසමො පරිප්ඵන්දනෙන[4] අසන්තවුත්තිතා. **උද්ධච්චාදිකිලෙසා** ති උද්ධච්චප්පධානා, උද්ධච්චාධික - චිත්තුප්පාදසම්පයුත්තා කිලෙසා; තෙ හි උද්ධච්චවසෙන අවූපසමකරා, උද්ධච්චං වා ආදිං කත්වා සබ්බෙ එව කිලෙසා උද්ධච්චාදිකිලෙසා. එවං සෙසෙසුපි.

**ගරුභාවො දන්ධතා** ථීනමිද්ධාදිකානං, තථා පවත්තානං වා චතුන්නං ඛන්ධානමෙතමධිවචනං. දන්ධතාය පටිපක්ඛො **අදන්ධතා,** අගරුභාවො. **ථද්ධභාවො** ථම්භො, දිට්ඨිමානාදිකානං, තප්පධානා-නං වා චතුන්නං ඛන්ධානං එතං නාමං ථද්ධභාවනිම්මද්දනතො[5]

1. M උත්තාසනාකාරෙන 2 M. පජහති. 3. M සුක්කාධම්මා
4 M. පරිප්ඵන්දනං. 5. M. -භාවතොයෙව

කත්ථචි ආරම්මණෙ අප්පටිහතාකාරෙන පච්චුපට්ඨාති,[1] සම්පයුත්තානං වා තත්ථ අප්පටිඝාතං පච්චුපට්ඨපෙන්තීති **අප්පටිඝාතපච්චුපට්ඨානා**.

කම්මනි සාධු කම්මඤ්ඤං; න කම්මඤ්ඤං අකම්මඤ්ඤං. තස්ස භාවො **අකම්මඤ්ඤභාවො**. දානසීලාදිපුඤ්ඤකිරියාය අසමත්ථතා අත්ථො කාමච්ඡන්දාදි - සංකිලෙසධම්මා, තප්පධානා වා චත්තාරො අකුසලක්ඛන්ධා අකම්මඤ්ඤභාවනිම්මද්දනෙනෙව සම්පත්තාකාරෙන ආරම්මණස්ස ගහණං **ආරම්මණකරණසම්පත්ති**. වුත්තාවසෙසා කාමච්ඡන්දාදයො තදෙකට්ඨා ච සංකිලෙසධම්මා සෙසනීවරණාදයො. ඉමා පන ද්වෙ විනිබන්ධනිම්මද්දනෙන පසාදනියවත්ථුසු පසාදවහා, හිතකිරියාසු විනියොගක්ඛමභාවාවහා, සුවණ්ණස්ස විසුද්ධි වියාති දට්ඨබ්බා.

ගෙලඤ්ඤං අස්සද්ධියාදයො තදෙකට්ඨා ච පාපධම්මා. තප්පටිපක්ඛො අගෙලඤ්ඤභාවො ලක්ඛණං එතාසන්ති **අගෙලඤ්ඤභාවලක්ඛණා**. ගෙලඤ්ඤනිම්මථනෙනෙව[2] තස්මිං එතාසං ආදීනවො දොසො උපද්දවො වා, න වා එතා ආදීනං කපණං චන්ති පවත්තන්තීති නිරාදීනවා. තෙනාකාරෙන පච්චුපතිට්ඨන්ති, තං වා සම්පයුත්තෙසු පච්චුපට්ඨාපෙන්තීති **නිරාදීනවපච්චුපට්ඨානා**.

කායසම්බන්ධී චිත්තසම්බන්ධී ච උජුභාවොති ලක්ඛිතබ්බතාය **කායචිත්තඅජ්ජවලක්ඛණා**. කායචිත්තානං නඞ්ගලසීස - චන්දකොටි - ගොමුත්තවංකතාසංඛාතානං කුටිලභාවානං, අත්ථතො මායා - සාඨෙයාදිභූතානං නිම්මද්දනතො **කායචිත්තකුටිලභාවනිම්මද්දනරසා**. තතො යෙව සබ්බථාපි අජිම්හභාවෙන පච්චුපතිට්ඨන්ති, සම්පයුත්තානං වා අජිම්හතං පච්චුපට්ඨාපෙන්තීති **අජිම්හතාපච්චුපට්ඨානා**.

නනු ච කායපස්සද්ධිආදීනං ද්වින්නං ද්වින්නං ධම්මානං එකෙකපටිපක්ඛත්තා දරථනිම්මද්දනාදිකිච්චං එකෙකමෙව කරොති. කස්මා පන ද්වෙ ද්වෙ ධම්මා වුත්තාති? න ඛො පනෙවං චින්තෙතබ්බං. භගවතාපි තථෙව දෙසිතත්තා. කස්මා පන භගවතා තථා දෙසිතා? සභාවධම්මභාවතො. න හි භගවතා පුබ්බෙ අවිජ්ජමානා එතෙ ධම්මා දෙසනාවසෙන උප්පාදිතා. අථ ඛො සභාවතො විජ්ජමානා යෙව සයම්භුඤාණෙන සම්මා සච්ඡිකත්වා යථාසභාවං දෙසිතා. තස්මා කථමෙත්ථ භගවතා සභාවතො විජ්ජමානස්ස ධම්මස්ස භාපනං කාතුං සක්කා? සභාවතො විජ්ජමානතාය චෙත්ථ භගවතො වචනමෙව පමාණං. න හි භගවා යථාධම්මසාසනාධිකාරෙ අයථාධම්මං කථෙය්‍යාති.

1. M. පච්චුපතිට්ඨාති 2. M. නිම්මද්දනෙනෙව.

යස්ස පන විජ්ජමානස්සාපි අකථනං, තං අඤ්ඤහෙතුකං; න චෙත්ථ තාදිසො හෙතු උපලබ්භති යෙන ඉමේසු ඒකෙකධම්මස්ස අකථනං ති. යථා පන ද්වින්නං පුරිසානං එකො යෙව වෙරිකො හොති, තස්ස තෙ පුරිසා ඔතාරං දිස්වා ඒකතො හුත්වාව හනන්ති. එවමෙව ද්වෙ ධම්මා එකතො හුත්වා එකං පටිපක්ඛං ධම්මං හනන්ති. යථා ච පන තෙ විසුං දිස්වාපි[1] තං වෙරිං හනන්ති, න එවමෙතෙ තං විසුං හනන්ති, තෙසං අඤ්ඤමඤ්ඤං අවිනාභාවතො. තස්මා එතෙ පටිපක්ඛධම්මානං එකෙකභාවෙපි ද්වෙ ද්වෙව යෙව වුත්තා ති. අපි ච චිත්තපස්සද්ධිආදීහි චිත්තමෙව පස්සද්ධං ලහු මුදු කම්මඤ්ඤං පගුණං උජුං ච හොති; කාය-පස්සද්ධිආදීහි පන රූපකායොපීති තදත්ථදස්සනත්ථං භගවතා එතේව ද්විධා වුත්තා, න සමාධිආදිසු.

ඡන්දනං ඡන්දො, ආරම්මණෙන අත්ථිකතා. "ඡන්දො කාමො"ති ආදිසු පන තණ්හාපි ඡන්දොති වුච්චති. "ඡන්දං ජනෙති වායමතී"ති ආදිසු විරියම්පී ති තතො නිවත්තනත්ථං වුත්තං **කත්තුකම්‍යතායෙතං අධිවචනං** ති. කත්තුකම්‍යතා[2] වුච්චති කරණිච්ඡා. චෙතසිකස්ස ධම්මස්ස ච සාරම්මණත්තා කරණිච්ඡා නාම ආලම්බණස්ස ආලම්බිතුකාමතාමුඛෙනෙව හොතී ති ආලම්බණ-කරණිච්ඡාලක්ඛණො ඡන්දො කත්තුකම්‍යතාලක්ඛණොති වුත්තො. තෙනෙවාහ: **ආරම්මණපරියෙසන-රසො, ආරම්මණෙන අත්ථිකතාපච්චුපට්ඨානොති ච**. යදග්ගෙන පනායං අත්ථිකතො ආරම්මණපරියෙසනරසො, තදග්ගෙන සම්පයුත්තධම්මානම්පි හොති යෙව, එකාරම්මණතාය තෙන තෙසං. තෙනෙවෙස[3] ආරම්මණගහණෙ චෙතසො හත්ථප්පසාරණං වියාති වුච්චති. කථම්පන වත්ථුවිස්සජ්ජනවසෙනපි පවත්තමානචෙතනාසම්පයුත්තො ඡන්දො ආරම්මණෙන අත්ථිකො හොති? නනු අවොචුම්හ "ආරම්මණකරණිච්ඡාලක්ඛණො" ති. තස්මා සංගාමගතස්ස[4] ඉස්සාසස්ස ඛිපිතබ්බඋසූනං ගහණෙ අත්ථිකතා විය දානවත්ථුවිස්සජ්ජනවසෙන පවත්තඡන්දෙපි විස්සජ්ජිතබ්බෙන තෙන අත්ථිකො යෙවාති. ස්වායං කුසලෙසු උප්පන්නො කුසලච්ඡන්දො නාම හොති, යොනිසොමනසිකාරසමුට්ඨානත්තා; තබ්බිපරීතො පන අකුසලෙසු උප්පන්නො අකුසලච්ඡන්දො

අධිමුච්චනං ආරම්මණසන්නිට්ඨානවසෙන වෙදිතබ්බං; න පසාදනවසෙන. තෙනාහ **සන්නිට්ඨානලක්ඛණො** ති යථා තථා හි ආරම්මණෙ නිච්ඡයනං අධිමුච්චනං; අනධිමුච්චන්තස්ස පාණාති-

1. M. සහාපි 2 M. කත්තුකාමතා. 3. M. පොත්ථකෙ නත්ථි 4 M සංගාමගත

ජාතාදිසු දූතාදිසු වා පවත්තියා අභාවතො. සද්ධා පන පසාදනීයෙසු පසාදාධිමොක්ඛොති අයමෙතෙසං විසෙසො. වොට්ඨපනං පන යථා සන්තීරිතෙ අත්ථෙ නිච්ඡයනාකාරෙන පවත්තිත්වා පරතො පවත්තමානානං තථා පවත්තියා පච්චයො හොති. යදි එවං විචිකිච්ඡාසම්පයුත්තෙසු ධම්මෙසු කථන්ති? තෙසම්පි එකංසෙනෙව සංසප්පනාකාරස්ස පච්චයතාය දට්ඨබ්බං. දුරකස්ස විය ඉතො චිතොව සංසප්පනතස්ස[1] කරිස්සාමි න කරිස්සාමීති අනිච්ඡයස්ස පටිපක්ඛා කිරියා **අසංසප්පනං** යෙසු චිත්තුප්පාදෙසු අයං සන්නිට්ඨානලක්ඛණො අධිමොක්ඛො, තෙසං ආරම්මණධම්මා යෙව සන්නිට්ඨාතබ්බත්තා සන්නිට්ඨෙය්‍යධම්මා; සො පදට්ඨානමස්සාති **සන්නිට්ඨෙය්‍යධම්මපදට්ඨානො.** ඉන්දඛීලො ති එසිකත්ථම්භො වුච්චති.

**තෙසු තෙසු ධම්මෙසූ**ති යෙසු ධම්මෙසු සයං උප්පන්නා තෙසු අත්තනා සම්පයුත්තෙසු චිත්තචෙතසිකධම්මෙසු. අනාරම්මණත්තෙපි හි තෙසු සම්පවත්තෙසු උදාසීනභාවතො[2] **තත්‍රමජ්ඣත්තතා** ති වුච්චති. සමං අවිසමං වාහිතං, අත්තනා[3] පවත්තිතසම්පයුත්තානං වා යථාසකකිච්චෙසු පවත්තනං ලක්ඛණමෙතිස්සාති **සමවාහිතලක්ඛණා.** තත්ථ සමං හුත්වා පවත්තනලක්ඛණාති අත්ථො[4]. අපක්ඛපතිතභාවො වුත්තො හොති; සමං කත්වා පවත්තනලක්ඛණාති අත්ථො. අවිසමං කත්වා පවත්තනලක්ඛණාති අත්ථෙ ඌනාධිකතානිවාරණං, උදාසීනභාවෙන පවත්තමානාපි එසා සම්පයුත්තධම්මෙ සමං කත්වා යථාසකං කිච්චෙසු පවත්තෙතීති; යථා රාජා තුණ්හී නිසින්නොපි අධිකරණධම්මට්ඨෙ යථාසකකිච්චෙසු සමං අප්පමත්තෙ පවත්තෙතීති. අලීනුද්ධතප්පවත්තිපච්චයත්තා[5] ධම්මානං ඌනාධිකතාය ලීනුද්ධතභාවස්ස නිවාරණකිච්චාති වුත්තං **ඌනාධිකතානිවාරණරසා** ති. යදි එවං කථං සහජාතාධිපතීනං අධිපතිභාවො? ආධිපච්චං හි තෙසං කිච්චතො අධිකභාවො ති? නායං දොසො. තම්පි හි තස්සා කිච්චමෙව යං සහජාතධම්මානං අධිපතිභාවෙ පවත්තාපනං. යථා හි රඞ්ගමණ්ඩලගතො නච්චාචරියො තෙ තෙ නටකෙ යථාසකං අනුරූපභූමියං යොජෙති, එවමෙසාපි අත්තනා සම්පයුත්තධම්මෙසු අධිපතිභාවෙ ඨිතෙ අධිපතිභාවෙ යොජෙති, ඉන්ද්‍රියත්තෙ ඨිතෙ ඉන්ද්‍රියත්තෙ; න පන සකසකකිච්චතො[6] ඌනං අධිකං වා පවත්තිතුං දෙතී ති. "ඉදං නිහීනකිච්චං හොතු, ඉදං අතිරෙකකිච්චං"ති එවං පක්ඛපාතවසෙන විය පවත්තිපක්ඛ-

1. M සංසප්පනස්ස. 2. M. උදාසීනභාවො 3. B. M. අත්තනො. 4. M. අත්ථො. 5. M -පච්චයානං 6. M. කිච්චෙ තෙ. 7. M. චිත්තචෙතසිකානං.

පාතො, තං උපච්ඡින්දන්තී විය හොතී ති **පක්ඛපාතුපච්ඡෙදනරසං**-යා චිත්තචෙතසික - අජ්ඣුපෙක්ඛනෙන[1] සමං පවත්තෙසු ආජානීයෙසු සාරථි විය දට්ඨබ්බා.

**කිරියා කාරො** ති කාරසද්දස්ස භාවසාධනං[2] ආහ. තෙන කාරොති[3] තාසද්දං, ක්‍රියා යෙවාති දීපිතං හොති. **මනස්මිං කාරො** ති මනසි ආරම්මණස්ස කරණං. යෙන මනො ආරම්මණෙ කරියති, ආරම්මණෙන'ස්ස සංයොජනතො, තතො එව තෙන ආරම්මණම්පි මනසි කරීයතීති **මනසිකාරො** ති වෙත්ථ අලුත්තසමාසො දට්ඨබ්බො. **පුරිමමනතො** ති භවඞ්ගමනතො **විසදිසං මනං** ති විථිජවනමනං තං කරොතී ති මනසිකාරො. මනසිකාරසාමඤ්ඤෙන විථිජවනපටිපාදකොපි දස්සෙති.

[එත්ථ පන උපයොගත්ථභුම්මවචනෙන සමාසො දට්ඨබ්බො[4]. සම්පයුත්තධම්මෙ ආරම්මණාභිමුඛං සාරෙන්තො පයොජෙන්තො විය හොතීති මනසිකාරො **සාරණලක්ඛණො** ති වුත්තො. **සංයොජනරසො** ති පයොජනරසො[5]. විතක්කො සම්පයුත්තානං ආරම්මණෙ[6] අභිනිරොපනසභාවත්තා ආරම්මණෙ චිත්තං පක්ඛිපන්තො විය හොති. චෙතනා අත්තනා[6] ආලම්බණං ගණ්හන්තී සම්පයුත්තෙ පි සකසකකිච්චං කාරෙන්තී[7] අත්තනා කරණෙන බලං නියොජෙන්තො බලනායකො විය හොති; මනසිකාරො සම්පයුත්තෙ ආරම්මණෙ පයොජෙති ආජානීයානං[8] පයොජනකසාරථි වියාති අයමෙතෙසං විසෙසො. **ආරම්මණාභිමුඛභාවපච්චුපට්ඨානො** ති ආරම්මණෙ සංයොජනවසෙන තදභිමුඛභාවපච්චුපට්ඨානො.

[එත්ථ සතියා අප්පමුස්සනවච්ඡින්දතා විසයාභිමුඛභාවපච්චුපට්ඨානතා; මනසිකාරස්ස පන සංයොජනවසෙනාති අයමෙතෙසං විසෙසො[4] ආරම්මණපටිපාදකස්ස සංඛාරක්ඛන්ධපරියාපන්නතාවචනං ඉතරමනසිකාරානං විඤ්ඤාණක්ඛන්ධපරියාපන්නතං දස්සෙති.

මහිංසාසකා පන ආවජ්ජනස්ස විඤ්ඤාණභාවෙ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස සබ්බවිසයතා පරිහායෙය්‍ය[9]; තස්මා තං ජවනසම්පයුත්තං සංඛාරක්ඛන්ධපරියාපන්නමෙවාති වදන්ති. තෙසං හි අයමධිප්පායො: යදි තං විසුං චිත්තසභාවො[10] සියා පච්චුප්පන්නචිත්තමාරම්මණං කත්වා පවත්තස්ස තස්ස අනන්තරං උප්පජ්ජමානජවනානං පච්චුප්පන්නාරම්මණතා න භවෙය්‍ය, අඤ්ඤදත්ථු අතීතාරම්මණතාව සියා. එවඤ්ච සති සබ්බඤ්ඤුතඤ්ඤාණස්සාපි පච්චුප්පන්නචිත්තා-

1. චිත්තචෙතසිකානං. 2. M භාවසාධනතං. 3. M කරොති 4 අයං පාඨො මරම්මපොත්ථකෙ නත්ථි. 5. M පොත්ථකෙ නත්ථි. 6. M අත්තනො. 7. M. කාරෙතීති 8. M. ආජානිය. 9. M. පරිහියෙථ. 10. M. චිත්තසභාවං.

රම්මණතාය අභාවතො අසබ්බවිසයතා ආපජ්ජෙය්‍ය. යදග්ගෙන ච තං අසබ්බවිසයං තදග්ගෙන සාවරණම්පි හොති, යත්ථ නප්පවත්තති තත්ථ ආවරණසම්භවතො. තස්මා'ස්ස සකලලොකසිද්ධො සබ්බඤ්ඤුභාවො අනාවරණභාවො ච පරිහායෙථ[1] ජවනසම්පයුත්තභාවෙ පන සති ආවජ්ජනස්ස නායං ඉට්ඨවිඝාතො ආපජ්ජතී ති. තයිදං තෙසමභිනිවෙසමත්තං. "ආවජ්ජනං කුසලානං ඛන්ධානං අකුසලානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො"ති වචනෙන තස්සානන්තරං කුසලාකුසලුප්පත්තියා දීපිතත්තා. සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පන පච්චුප්පන්නචිත්තාරම්මණභාවො එවං වෙදිතබ්බො: අතීතාදිවසෙන හි විභාගමකත්වා "ඉමස්ස චිත්තං ජානාමී"ති පවත්තස්ස ආවජ්ජනං සාමඤ්ඤෙන යං කිඤ්චි අභිමුඛීභූතං චිත්තමාවජ්ජති, තතො ජවනානිපි අත්තනො අත්තනො අභිමුඛීභූතං චිත්තමාරම්මණං කත්වා පවත්තන්ති. න චෙත්ථ ජවනානං භින්නාරම්මණතා ආසංකිතබ්බා, චිත්තසාමඤ්ඤෙන ආරම්මණස්ස අභින්නත්තා. තස්මා සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පච්චුප්පන්නචිත්තාරම්මණතං පටිච්ච න කාචි විහෙසා අනුභවිතබ්බාති. කිං වා එතෙන යුත්තිවාදෙන? නනු වුත්තං භගවතා "අචින්තෙය්‍යො බුද්ධවිසයො"ති? තස්මා අපරිමිතපුඤ්ඤසම්භාරෙකඵලස්ස[2] අචින්තෙය්‍යසභාවත්තා ආවජ්ජනෙන විනාපි විසයගහණෙ විබන්ධාභාවතො යත්ථ කත්ථචි පවත්ති[3] අප්පටිහතා යෙවාති. කෙචි පනෙත්ථ ආවජ්ජනං අනාගතචිත්තමාරම්මණං කත්වා නිරුජ්ඣති, ජවනමෙව පන පච්චුප්පන්නමාරම්මණං ගණ්හාතී ති වදන්ති. යස්මා පන "අනාගතාරම්මණා ආවජ්ජනා පච්චුප්පන්නාරම්මණානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො' ති පාළි නත්ථි, තස්මා තං අප්පමාණං.

**කරොතී** ති කරුණා. කිං කරොති? කෙසං? කිං නිමිත්තං ති ආහ **පරදුක්ඛෙ සති සාධූනං හදයකම්පනං** ති. කම්පනං ති ච පරෙසං දුක්ඛං දිස්වා තස්ස අසහනාකාරෙන චිත්තස්ස අඤ්ඤථත්තං. තයිදං සප්පුරිසානං යෙව හොතී ති ආහ **සාධූනං** ති, සප්පුරිසා හි අත්තපරහිතසාධනෙන සධූති වුච්චන්ති **කිණාතී** ති ඉමස්ස අත්ථමාහ **විනාසෙතී** ති; අදස්සනං ගමෙතීති අත්ථො. තෙනාහ **පරදුක්ඛාපනයනාකාරප්පවත්තිලක්ඛණා** ති. පරෙසං දුක්ඛස්ස අපනයනං හොතු වා මා වා, සො[4] දුක්ඛපනයනාකාරො. තථාපවත්තිලක්ඛණාති **පර = පෙ = ලක්ඛණා**. අපනෙතුකාමතාය තාය පරෙසං දුක්ඛස්ස අසහනං අනධිවාසනං **පරදුක්ඛාසහනා**. න විහිංසා අවිහිංසා; සත්තානං අවිහෙඨනං. තං පච්චුපට්ඨාපෙති, විහිංසාය වා පටිපක්ඛභාවෙන පච්චුපට්ඨාතීති ති **අවිහිංසාපච්චුපට්ඨානා**.

1. M. පරිහියෙථ. 2. M. -සම්භාරෙවා ඵලස්ස. 3. M. පොත්ථකෙ නත්ථි. 4. M. යො. .

**පමොදලක්ඛණා** ති පරසම්පත්තියා පමොදලක්ඛණා. **අනිස්සායනරසා** ති ඉස්සායනස්ස උස්සූයනස්ස පටිපක්ඛභාවකිච්චා. **සත්තානං සම්පත්තිදස්සනපච්චුපට්ඨානා** ති[1] පන්තසෙනාසනෙසු අධිකුසලධම්මෙසු ච අරමණං **අරති**. සා අත්ථතො ඉස්සාදිකං දොමනස්සසහගතං පීතම්ඛාදිකං උබ්බච්චං ච තත්ථ පුරිමං පර-සම්පත්තිවිසයං, දුතියං පන සෙනාසනාදිවිසයං ති දට්ඨබ්බං. අරතියා විහනනාකාරෙන පච්චුපතිට්ඨති තස්සා විඝාතං වා වූපසමං පච්චුපට්ඨපෙති ති **අරතිවිඝාතපච්චුපට්ඨානා**.

**අනියතෙන ඉච්ඡන්ති** ති ඉමිනා චෙතසිකන්තරභාවෙන ඉච්ඡන්ති ති දස්සෙති.

**කායදුච්චරිතතො** ති වත්ථුවීතික්කමසංඛාත - කායදුච්චරිතතො. **කායදුච්චරිතාදිවත්ථූනං** ති පරපාණ - පරධන[2] - පරඉත්ථි ආදීනං කායදුච්චරිතාදීනමාලම්බණභූතානමෙව වත්ථූනං **අවීතික්කමලක්ඛණා** ති අමද්දනලක්ඛණා. **කායදුච්චරිතාදිවත්ථුතො** සංකොචනක්‍රියාපදෙසෙන කායදුච්චරිතාදිතො යෙව සංකොචනක්‍රියා වුත්තාති දට්ඨබ්බා. න හි විරතියො දුච්චරිතවත්ථුතො අකිරිය පච්චුපට්ඨානා යුජ්ජන්ති, අථ ඛො දුච්චරිතතො යෙව. විරතීනං ච සොරච්චවසෙන සංකොචනං, අකිරියා ච හිරොත්තප්පානං ජිගුච්ඡනාදිවසෙනාති අයමෙතෙසං විසෙසො. **සද්ධාහිරොත්තප්ප =පෙ= පදට්ඨානා** ති එත්ථ 'සද්ධාදයො සබ්බෙව ධම්මා කායදුච්චරිතාදිවිරතීනං පදට්ඨානා'ති එකෙ. අපරෙ පන කම්ම - කම්මඵලං සද්දහන්තස්ස කායදුච්චරිතාදිං **අකරණතො** හිරොත්තප්පසම්පන්නස්ස මුසාවාදාදිඅකථනතො අප්පිච්ඡ - සන්තුට්ඨි - සල්ලෙඛ-ගුණසමන්නාගතස්ස මිච්ඡාජීවවජ්ජනතො ච සද්ධාදයො තිණ්ණං ධම්මානං යථාක්කමෙන පදට්ඨානාති වදන්ති. **කෙචි** ති **අභයගිරිවාසිනො**. **ඉමාසු** ති ඉමාසු තීසු විරතීසු. **එකං නියතං විරතිමිච්ඡන්ති** ති අඤ්ඤං එකං චතුත්ථිං නියතං විරතිමිච්ඡන්ති. අථ වා නිද්ධාරණත්ථෙ භුම්මවසෙන ඉමාසං අන්තරෙ එකං නියතවිරතිමිච්ඡන්තී ති අත්ථො. උභයථාපි පන තෙසං ඉච්ඡා න යුජ්ජති. අපරාය විරතියා ධම්මසෙනාපතිනාපි අදෙසිතත්තා, විසයස්ස ච සදා සන්නිහිතත්තාභාවෙන නියතාය එව එතිස්සා අභාවතො. තෙනෙව හි **අභයගිරිවාසිනො** යෙව ච කෙචි ඉමාසං තිවිධත්තං අනියතත්තං ච ඉච්ඡන්ති. වුත්තං හි තෙහි:

1. ද්වීසුපි සීහළ මරම්මපොත්ථකෙසු ඌනතා දිස්සති. "පන්තසෙනාසු"ති වචනතො පුරිමභාගෙ "අරතිවිඝාතපච්චුපට්ඨානා" ආගන්තබ්බං. පුරිමපදස්සපි වණ්ණනා ඌනා 2. M. කායසුචරිතාදීනං. 3. M. එකිස්සා. 4. B. තෙව.

"කරුණා මුදිතා සම්මා - වාචා - කම්මන්ත - ආජීවා
සෙහුය්‍යතො අනියතා හොන්ති ගොචරභෙදතො"ති

එත්ථ පන "සෙහුය්‍යතො"ති වචනං ලොකුත්තරචිත්තෙසු සබ්බදා එකතො යෙව ලබ්භමානත්තං සන්ධාය වුත්තං.

22. **දුතියවිඤ්ඤාණා සම්පයොගං ගච්ඡන්ති** ති සම්බන්ධො. යථා චිත්තං එවං තංසම්පයුත්තධම්මාපි දුතියෙ සසංඛාරා එවාති ආහ **සසංඛාරාසංඛාරවිභත්තමෙව හෙතු විසෙසො** ති. **තථා** ති යථා තතියෙ, තථා චතුත්ථෙපි. පීතියා සුඛපදට්ඨානත්තා සුඛස්ස චෙත්ථ අභාවතො ආහ: **ඨපෙත්වා පීතිං** ති. නනු ච කරුණා මුදිතා උපෙක්ඛාසහගතෙ න සම්භවන්තීති වදන්ති, තස්මා යථා පීතියා එවං තාසම්පි පටික්ඛෙපො කාතබ්බො ති? න කාතබ්බො; අප්පණාප්පත්තිතො පුබ්බෙ කරුණාමුදිතානං උපෙක්ඛාසහගතානම්පි සම්භවතො. කරුණා - මුදිතාභාවනාකාලෙ හි අප්පණා-වීථිතො පුබ්බෙ උපෙක්ඛාසහගතචිත්තෙනාපි පරිකම්මං හොති; අප්පණාවීථියම්පන සොමනස්සසහගතචිත්තෙනෙව. එකාවජ්ජන-වීථියා වෙදනාපරිවත්තනාභාවතො. තස්මා **පුබ්බභාගවසෙන** කරුණාමුදිතානම්පි උපෙක්ඛාසහගතෙසු සම්භවො හොතීති ආචරියා අපරෙ පන සබ්බදාපි තාසං උපෙක්ඛාසහගතෙසු සම්භවං න ඉච්ඡන්ති; **අවසෙසා පඤ්චමෙන සම්පයොගං ගච්ඡන්ති** ති අවිසෙසෙන වුත්තත්තා ඉදානි විසෙස - දස්සනත්ථමාහ: **සොම-නස්සානෙ වා** ති ආදිං. (81.) **කරුණාමුදිතාදයො**ති කරුණා මුදිතා චෙව විරතිත්තයඤ්ච. තෙනාහ **පඤ්චා** ති.

එවං කාමාවචරකුසලචිත්තසම්පයුත්තෙ දස්සෙත්වා ඉදානි රූපාවචරචිත්තසම්පයුත්තධම්මෙ දස්සෙතුං **මහග්ගතෙසු පනා** ති ආදිමාහ. තත්ථ **ඨපෙත්වා විරතිත්තයං**ති විරතිත්තයං වජ්ජෙත්වා. කස්මා පනෙත්ථ විරතිත්තයං පරිච්චත්තංති? වුච්චතෙ: සුවිසුද්ධකාය කම්මාදිකස්ස චිත්තසමාධානවසෙන රූපාරූපාවචරකුසලප්පවත්ති, න කායකම්මාදීනං සොධනවසෙන, නාපි දුච්චරිත - දුරාජීවානං සමුච්ඡෙදනවසෙන. තථා හි නීවරණධම්මානං අවත්ථාත්තයං හොති: වීතික්කමාවත්ථා, පරියුට්ඨානාවත්ථා, අනුසයාවත්ථාති. තත්ථ වීතික්කමාවත්ථාය පටිපක්ඛං කාමාවචරකුසලං; පරියුට්ඨානාවත්ථාය රූපාරූපාවචරං; අනුසයාවත්ථාය ලොකුත්තරකුසලං. දුච්චරිත-දුරාජීවානං පන ඨපෙත්වා විතික්කමාවත්ථං අනුසයාවත්ථං ච වීතික්කමාවත්ථාය විසුං පරියුට්ඨානාවත්ථා න උපලබ්භති යස්සා[1] විපච්චනිකං රූපාරූපාවචරකුසලං සියා. තස්මා තං නෙව

1. M. තස්සා.

කාමාවචරකුසලං විය තෙසං වීතික්කමාවත්ථං සොධෙති, න ච ලොකුත්තරං විය අනුසයාවත්ථං සමුච්ඡින්දති පටිප්පස්සම්භෙති වා. සීලවිසුද්ධියං සීලසොධනවසෙන කාමාවචරකුසලෙනෙව විගතවීතික්කමස්ස[1] පරිසුද්ධකායකම්මාදිකස්ස යොගිනො චිත්තසමාධානවසෙන පවත්තතීති මහග්ගතචිත්තුප්පාදෙ විරතීනං අසම්භවොයෙව. ඉමමෙව හි අත්ථං සාධෙතුං; **විරතියො පනා**ති ආදි ආරද්ධං. **තෙත්තිංස** කරුණාදිජ්ඣානවසෙන පවත්තනකාලෙ **තතොති** තතො තතියෙ වුත්තචෙතසිකතො. කරුණාමුදිතානං අප්පනාප්පත්තානමෙකන්ත-සොමනස්සසහගතත්තා ආහ **පඤ්චමෙන තතො කරුණාමුදිතාවජ්ජා**ති.

**රූපාවචරපඤ්චමෙ වුත්තනයෙනා**ති තිංසෙවාති අධිප්පායො. යදි එවං රූපාවචරතො කො විසෙසොති ආහ: **අරූපාවචරභාවො වෙත්ථ විසෙසො**ති. පඤ්චමෙ රූපසඤ්ඤාභාවතො රූපාවචරභාවො. ඉධ පන රූපසඤ්ඤාසමතික්කමෙන පත්තබ්බත්තා **අරූපාවචරභාවො**ති අයමෙවස්ස තතො විසෙසොති අත්ථො.

**පඨමජ්ඣානිකෙ**ති පඨමජ්ඣානවති. **මග්ගචිත්තෙ**ති චතුබ්බිධෙපි මග්ගඤාණෙ. **දුතියජ්ඣානිකාදිභෙදෙ**ති දුතිය-තතිය-චතුත්ථ-පඤ්චමජ්ඣානිකෙ. **වුත්තනයෙනා** ති **දුතියෙ විතක්කවජ්ජා**ති ආදිනා වුත්තනයෙන. කිං අවිසෙසෙනාති? නොති, ආහ **කරුණාමුදිතානං**ති ආදිං. මග්ගධම්මෙසු පාදකජ්ඣානාදිවසෙන කදාචි සම්මාසංකප්පවිරහො සියා, න පන විරතිවිරහො, කායදුච්චරිතාදීනං සමුච්ඡින්දනවසෙනෙව[2] අරියමග්ගස්ස පවත්තනතොති ආහ; **නියතවිරතිභාවො**ති. ලොකුත්තරභාවොති ඡබ්බිසුද්ධිපරම්පරාය පත්තබ්බත්තා ලොකතො උත්තරණභාවො.

එවං කුසලචෙතසිකානං සම්පයොග-වචනත්ථලක්ඛණාදීනි දස්සෙත්වා ඉදානි අකුසලචෙතසිකානි දස්සෙතුං **අකුසලා පනා**ති ආදි ආරද්ධං. **යෙවාපනකා**ති කිඤ්චාපි පඨමෙ අනියතයෙවාපනකා න ලබ්භන්ති. අකුසලෙසු පන ලබ්භමාන-යෙවාපනධම්මෙ එකත්ථ දස්සෙතුං තෙසම්පි ඉධෙව වචනං දට්ඨබ්බං. එවඤ්ච කත්වා උපරි ධම්මානං උද්දෙසානන්තරං **එවං යෙවාපනා**ති ආදි වුත්තං. විචිකිච්ඡාසහගතෙ ඡන්දාධිමොක්ඛානං, උද්ධච්චසහගතෙ ඡන්දස්ස ච අභාවතො වුත්තං (83.) **පටිපාටියා දසසු චිත්තෙසූ**ති (82) **නිද්දිට්ඨා**ති නිස්සෙසෙන දස්සිතා. හතා විහතා විද්ධස්තා පාපා, අපායාදිදුක්ඛපාපනතො පාපාති සංඛාතා අකුසලධම්මා යෙන, සො භගවා **හතපාපො**, තෙන. ලාභො අලාභො අයසො යසො

1. M පිහිතවීතික්කමස්ස. 2 M. සමුච්ඡින්නාවසෙන.

(192.) **කාමරූපභවෙස්වෙව අට්ඨාරස භවන්ති හී**ති රූපාවචර-කුසලක්‍රියාචිත්තානි චෙව කුසලවිපාකානි ච චක්ඛුසොතවිඤ්ඤාණ-සම්පටිච්ඡනසන්තීරණානි, වොත්ථපනවජ්ජානි ච ද්වෙ අහෙතුකක්‍රියාචිත්තානි, පඨම-මග්ගවිඤ්ඤාණන්ති අට්ඨාරස චිත්තානි කාමරූපභවෙ යෙව භවන්ති, න අරූපභවෙ. තත්ථ හි සබ්බසො රූපසඤ්ඤානං සමතික්කන්තත්තා රූපාවචරකුසලක්‍රියානුප්පජ්ජන්ති; චක්ඛුවිඤ්ඤාණාදීනි වත්ථුද්වාරවිරහතො, හසිතුප්පාදො එකන්තවත්ථුනිස්සයත්තා, සොතාපත්තිමග්ගො පරතොඝොසපච්චයා යෙව නිබ්බත්තනතො න උප්පජ්ජන්ති. ද්වෙ **චත්තාළීසා**ති අට්ඨපරිත්තකුසලානි, චත්තාරි ආරුප්පකුසලානි, පඨමමග්ගවජ්ජානි සත්තලොකුත්තරචිත්තානි, පටිඝද්වයවජ්ජිතානි දසඅකුසලචිත්තානි, පුබ්බෙ වුත්ත-අහෙතුකක්‍රියාද්වය-වජ්ජිතානි නව කාමාවචරක්‍රියාචිත්තානි, චත්තාරි අරූපාවචරක්‍රියාචිත්තානීති එවං ද්වාචත්තාළීසචිත්තානි තීසුපි භවෙසු හොන්ති.

---

1. මරම්මපොත්ථකෙ නත්ථි 2 M සබ්බෙසං භූමීනං. 3. M. චත්තාරො අරූපාවචරවිපාකා

එවං භවවසෙන චිත්තුප්පත්තිං දස්සෙත්වා ඉදානි කාලවසෙන දස්සෙතුං ආහ (193) **ඨපෙත්වා පනා**ති ආදිං. **සබ්බාසං**ති නිද්ධාරණෙ සාමිවචනං. අට්ඨමහාක්‍රියා, අරහත්තමග්ගඵලචිත්තානි, අනාගාමිඵලං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලක්‍රියානි **තෙරසෙව චිත්තානි** අපායරහිතාසු ඡබ්බිධාසු භූමිසු හොන්ති; අපායෙසු විපාකාවරණසබ්භාවෙ එතෙසං අනුප්පජ්ජනතො (194) **අපරානි ඡ චිත්තානී**ති සම්බන්ධො. තානි පන රූපභවසාධාරණානං පඤ්චපරිත්තවිපාකානං, ක්‍රියාමනොධාතුයා ච වසෙන වෙදිතබ්බානි. (195) **පඤ්ච චිත්තානී**ති දිට්ඨිසම්පයුත්ත - විචිකිච්ඡාසම්පයුත්ත වසෙන පඤ්චචිත්තානි තානි හි පඤ්චසු සුද්ධාවාසභූමිසු න ලබ්භන්ති, තත්ථ අනාගාමී-ඛීණාසවානමෙව අධිවුත්ථත්තා, තෙසං ච පඨම මග්ගෙනෙව ඉමෙසං පඤ්චන්නං විඤ්ඤාණානං අනුප්පාදධම්මතං ආපාදිතත්තා.

(196.) **අපරානි ද්වෙ**ති තතියාරුප්ප-කුසලක්‍රියාචිත්තානි, තානි හි නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙසු අතික්කන්තාලම්බණත්තා, අපායෙසු ච අහෙතුකපටිසන්ධිකත්තා නුප්පජ්ජන්ති. (197.) **චතුවීසතිභූමිසු ද්වෙ චා**ති විඤ්ඤාණඤ්චායතනකුසලක්‍රියාවසෙන ද්වෙ චිත්තානි (198) **තෙවීස භූමිසු ද්වෙ චා**ති ආකාසානඤ්චායතන කුසලක්‍රියාචිත්තානි. (199) **එකාදසවිධ**න්ති රූපාවචරකුසලක්‍රියා හසිතුප්පාදො චාති එකාදස. (200) සොතාපත්තිඵලා යාව අනාගාමි මග්ගා චත්තාරෙව චිත්තානි සුද්ධාවාස-අපායවජ්ජෙසු එකවීසති භූමිසු භවන්ති. (201) **එකං** සොතාපත්තිමග්ගචිත්තං සුද්ධාවාස-අපාය-ආරුප්පභූමිවජ්ජෙසු සත්තදසසු භූමිසු ජායති. (202) ද්වෙ දොසමූලානි, කුසලවිපාක ඝාණ-ජිව්හා-කායවිඤ්ඤාණානි, සත්ත අකුසලවිපාකානීති **ද්වාදසචිත්තානි** මහග්ගතභූමිවජ්ජාසු **එකාදසසු කාමභූමිසු** ජායන්ති. (203) අට්ඨමහාවිපාකචිත්තානි කාමාවචර-දෙවමනුස්සවසෙන සත්තභූමිසු ජායන්ති. (204) **ඡසු භූමිසූ**ති වෙහප්ඵල-සුද්ධාවාසසංඛාතාසු ඡසු පඤ්චමජ්ඣානභූමිසු. **චත්තාරි පන චිත්තානි තීසු තීසෙව භූමිසූ**ති චතුත්ථජ්ඣාන විපාකො පරිත්තසුභ-අප්පමාණසුභ-සුභකිණ්ණවසෙන තීසු භූමිසු ජායති. දුතියජ්ඣානවිපාකො තතියජ්ඣානවිපාකො ච පරිත්තාභ අප්පමාණාභ - ආභස්සරවසෙන තීසු භූමිසු; පඨමජ්ඣානවිපාකො බ්‍රහ්මපාරිසජ්ජ - බ්‍රහ්මපුරොහිත - මහාබ්‍රහ්මවසෙන තීසු භූමිසු හොන්ති එවං චත්තාරි චිත්තානි එකෙකවසෙන තීසු තීසු භූමිසු ජායන්ති.

එවං එත්තකානෙව චිත්තානි එත්තකාසු භූමිසු උප්පජ්ජන්තීති චිත්තනියමවසෙන උප්පත්තිං දස්සෙත්වා ඉදානි එත්තිකාසු එව

භූමිසු එත්තකානි චිත්තානි උප්පජ්ජන්තීති භූමිනියමවසේන දස්සේතුං (206.) **කුසලාකුසලා කා**මෙති ආදි ආරද්ධං. තත්ථ **කා**මෙ කුසලාකුසලා වීසති, **තේසං පණ්ණරස අහේතුකවිපාකා ආවජ්ජනද්වයං** චාති **සත්තතිංසේව මානසා නරකාදිසු චතුස්වපි අපායේසු ජායරෙ** අවසේසානි පන සත්තරස කාමාවචරවිපාකක්‍රියාචිත්තානි, පඤ්චතිංස මහග්ගත - ලෝකුත්තරානීති ද්වේපඤ්ඤාසමානසා කදාචිපි තේසු නුප්පජ්ජන්ති, අභූමිභාවතෝති අත්ථෝ.

(208.) **අසීතිභේද**යාති වුත්තාවසේසානි අසීතිචිත්තානි (209) **ඝානාදිවිඤ්ඤාණත්තය**න්ති කුසලවිපාකං ඝාණාදිවිඤ්ඤාණත්තයං. **අපුඤ්ඤජා පාකා**ති අකුසලවිපාකානං සබ්බසමේව ගහිතත්තා ඝාණාදිවිඤ්ඤාණත්තයං අගහිතං; විසේසේන තම්පි පාරිසේසඤ්ඤායේන කුසලවිපාකමේව විඤ්ඤායති. (213) **දෝමනස්සං**ති දෝමනස්සසහගතං. **ක්‍රියා ච ද්වේ**ති වොට්ඨපනවජ්ජිතා ද්වේ අහේතුකක්‍රියා (214) **භූමිවසේනේවා**ති පුග්ගලේ අනාමසිත්වා කේවලං භූමිවසේන. **පුග්ගලානං වසේන ච** භූමිවසේන ච **චිත්තුප්පත්තිං විභාවයේ**ති සම්බන්ධෝ.

(216) **පඤ්චභූමිසූ**ති චතුරපාය-මනුස්සවසේන පඤ්චභූමිසු. අහේතුකානං පටිසන්ධිසදිසතදාලම්බනවසේන **සත්තතිංසේවා**ති වුත්තා. අඤ්ඤදත්ථමේතං පන ද්විහේතුක - තදාලම්බණස්සාපි සම්භවතෝ එකචත්තාළීස හෝන්ති. **ආචරිය ජෝතිපාලත්ථේරස්ස** අධිප්පායේන තිහේතුක - විපාකේහි පි සද්ධිං පඤ්චචත්තාළීසේවාති දට්ඨබ්බං. (217) **අහේතුකස්ස වුත්තේහී**ති අහේතුකසත්තස්ස වුත්තේහි සත්තතිංසමානසේහි සහ. (218) **නව ක්‍රියා**ති මහාක්‍රියා අට්ඨ, හසිතුප්පාදෝ චාති, ඉමානි අසාධාරණක්‍රියාචිත්තානි නව (220) **චතුපඤ්ඤාසමානසා**ති වත්වා තේසං සරූපතෝ දස්සනත්ථං ආහ **දුහේතුකස්සා**ති ආදිං. පුන **චතුපඤ්ඤාසා**ති ආදි පන නිගමනං (223) **පඤ්ඤාසමේවස්ස චිත්තානී**ති තිහේතුක පුථුජ්ජනස්ස වුත්ත-චතුපඤ්ඤාසචිත්තේසු දිට්ඨිවිචිකිච්ඡාසහගත-වජ්ජානි එකූනපණ්ණාස, සෝතාපත්තිඵලං ති ඉමානි පණ්ණාසේව චිත්තානි **අස්ස** කාමාවචරස්ස **සෝතාපන්නස්ස දේහිනෝ ජායනේන. නවතිංසේවා**ති එකූනචත්තාළීස චිත්තානි.

(224.) [**පඨමං ඵලං**ති සෝතාපත්තිඵලං.[1] (225) **දුතියං ච ඵලං හිත්වා**ති සකදාගාමිඵලං හිත්වා, චසද්දේන සෝතාපත්තිඵලං

1. මරම්මපොත්ථකේ නත්ථි

ච ඨිත්වාති අත්ථො. **අනාගාමිනො ඵලෙන සහ යානි** අට්ඨචත්තාලීස **චිත්තානි, තානි අනාගාමිස්ස සන්තානස්ස ජායන්ති.** (226) **චත්තාලීසං ච චත්තාරී** ති තෙවීසතිකාමාවචරවිපාකචිත්තානි, වීසතික්‍රියාචිත්තානි, අරහත්තඵලං චාති චතුචත්තාලීස චිත්තානි.

(227) **සකං සකං** ති සොතාපන්නස්ස සොතාපත්තිමග්ග-චිත්තං, සකදාගාමිනො සකදාගාමිමග්ගචිත්තං ති ආදිනා අත්තනො මග්ගචිත්තං. කස්මා පන තෙසං එකෙකමෙව චිත්තං හොතී ති ආහ **එකචිත්තක්ඛණිකා හි තෙ** ති. (228.) **පඤ්චතිංසෙවා** ති සත්තරස කාමරූපාරූප - කුසලචිත්තානි, පටිඝද්වයවජ්ජිතානි දසඅකුසලානි, රූපභවෙ ලබ්භනකානි පඤ්චපරිත්තවිපාකානි[1] ආවජ්ජනද්වයං, පඨමජ්ඣානවිපාකො චාති පඤ්චතිංස චිත්තානි **තිසු පඨමජ්ඣානභූමිසු පුථුජ්ජනස්ස** ජායන්ති.

(232.) **ඨිත්වා වා** ති එත්ථ වසද්දෙන පඨමඵලස්ස ගහණං දස්සෙති. තෙන අපුඤ්ඤපඤ්චකං ඨිත්වා පඨමඵලං ගහෙත්වා වාති අත්ථො. **අපුඤ්ඤපඤ්චකං** ති දිට්ඨිසම්පයුත්ත - විචිකිච්ඡා-සහගතවසෙන පඤ්ච අකුසලචිත්තානි (233.) **තාණා** ති තෙසු සොතාපන්නස්ස වුත්තෙසු. (234.) **තාණෙවා** ති සකදාගාමිස්ස වුත්තෙසු. (234) **පුඤ්ඤජං සම්පටිච්ඡනං, සන්තීරණද්වයං චෙවා** ති සම්බන්ධො. එවං පඨමජ්ඣානභූමියං පුථුජ්ජන - සොතා - පන්නාදිවසෙන චිත්තසම්භවං දස්සෙත්වා ඉදානි තෙසංයෙව වසෙන දුතියජ්ඣානාදිභූමියං දස්සෙතුං (237.) **පුථුජ්ජනස්සා** ති ආදි ආරද්ධං. දුතියජ්ඣාන - තතියජ්ඣානවිපාකානං එකසත්තස්සෙව අසම්භවෙපි දුතියජ්ඣානතලෙ නිබ්බත්තා[2] පුථුජ්ජනාදයො[3] පුථුජ්ජනාදිභාවසාමඤ්ඤෙන එකතො ගහෙත්වා **දුතියජ්ඣාන - තතියජ්ඣානපාකතො** ති වුත්තං. පරිත්තසුභාදිතො පට්ඨාය යාව අකනිට්ඨා තතිය - චතුත්ථජ්ඣානභූමිසු පඤ්චමජ්ඣානභූමියං වුත්තා ගණනාය චිත්තප්පවත්ති වෙදිතබ්බා. තෙනාහ (242.) **පරිත්ත-සුභාදීනං** ති ආදිං.

(247 ) **චතුවීසති චිත්තානී** ති අට්ඨ පරිත්තකුසලානි, චත්තාරි ආරුප්පකුසලානි, පටිඝද්වයවජ්ජිතානි දසඅකුසලචිත්තානි, පඨමාරුප්පවිපාකො, මනොද්වාරාවජ්ජනං චාති චතුවීසති චිත්තානි **පඨමාරුප්පභූමියං පුථුජ්ජනස්ස ජායන්ති.** (250 ) **දස පඤ්ච චාති** අට්ඨ මහාක්‍රියා, චතස්සො ආරුප්පක්‍රියා, මනොද්වාරාවජ්ජනං, පඨමාරුප්පවිපාකො, අරහත්තඵලං චාති පණ්ණරසචිත්තානි පඨමාරුප්පභූමියං අරහතො හොන්ති. (251 ) **තෙවීසාපි** පඨමා-

1. M. පඤ්චඅහෙතුකවිපාකානි. 2. නිබ්බත්ත. 3. M. පොත්ථකෙ නත්ථි.

රුප්පභූමියං පුථුජ්ජනස්ස චුතෙසු චතුවීසතිචිත්තෙසු ආකාසානඤ්චායතන-කුසලවිපාකවජ්ජානි බාවීසති, දුතියාරුප්පවිපාකො චාති තෙවීසති දුතියාරුප්පභූමියං පුථුජ්ජනස්ස හොන්ති. තත්ථෙව තිණ්ණං ඵලට්ඨසෙඛානං පුථුජ්ජනස්ස චුතෙසු අකුසලපඤ්චකවජ්ජානි අට්ඨාරස, තං තං ඵලං චාති එකූනවීසති චිත්තානි හොන්ති. (252) **ක්‍රියා ද්වාදසාති** අට්ඨ මහාක්‍රියා, ආකාසානඤ්චායතනවජ්ජිතා තිස්සො අරූපක්‍රියා, මනොද්වාරාවජ්ජනන්ති ද්වාදසක්‍රියාචිත්තානි. **පාකො**ති එකො දුතියාරුප්පවිපාකො. (253.) දුතියාරුප්පභූමියං පුථුජ්ජනස්ස චුතෙසු විඤ්ඤාණඤ්චායතන-කුසලවිපාකවජ්ජානි එකවීසති, ආකිඤ්චඤ්ඤායතනවිපාකො චාති **බාවීසති චිත්තානි** තතියාරුප්පභූමියං පුථුජ්ජනස්ස උප්පජ්ජන්ති. (254) පුථුජ්ජනස්ස චුතෙසු අපුඤ්ඤපඤ්චකවජ්ජානි සත්තරස, පඨමඵලං චාති **අට්ඨාරස** තතියාරුප්පභූමියං **සොතාපන්නස්ස** උප්පජ්ජන්ති. **තානී**ති තානෙව අට්ඨාරසචිත්තානි, **පඨමං ඵලං ඨපෙත්වා**ති හි වචනතො දුතියඵලං පක්ඛිපිත්වාති අයමත්ථො අවුත්තසිද්ධො න හි සකදාගාමිනො[1] සකදාගාමිඵලඤ්ච නුප්පජ්ජති. එවඤ්ච කත්වා වුත්තං (255) **ඨපෙත්වා දුතියං ඵලං**ති. එත්ථාපි අනාගාමිඵලං පකරණසිද්ධමෙවාති දට්ඨබ්බං.

(256.) අට්ඨමහාක්‍රියා, ද්වෙ තතිය-චතුත්ථාරුප්පක්‍රියා, මනොද්වාරාවජ්ජනං, ආකිඤ්චඤ්ඤායතනවිපාකො, අරහත්තඵලන්ති **තෙරස චිත්තානි තතියාරුප්පභූමියං ඛීණාසවස්ස** ජායන්ති. (257.) තතියාරුප්පභූමියං පුථුජ්ජනස්ස චුතෙසු බාවීසතිචිත්තෙසු ආකිඤ්චඤ්ඤායතන-කුසලවිපාකවජ්ජා වීසති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකොති **එකවීසතිචිත්තානි චතුත්ථාරුප්පභූමියං** පුථුජ්ජනස්ස ජායන්ති. (258) පුථුජ්ජනස්ස චුතෙසු අපුඤ්ඤපඤ්චකවජ්ජානි සොළස, සොතාපත්තිඵලං චාති **සත්තරස** තත්ථෙව **සොතාපන්නස්ස** හොන්ති. (260.) අට්ඨමහාක්‍රියා, ද්වෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතන-විපාකක්‍රියා, මනොද්වාරාවජ්ජනං අරහත්තඵලං චාති ද්වාදස චිත්තානි තත්ථෙව අරහතො උප්පජ්ජන්ති. (261) ආරුප්පකුසලානි චෙව ක්‍රියාපි ච උප්පජ්ජන්ති, න පන විපාකාති අධිප්පායො. (262.) **උද්ධම්බමරූපීනං**ති විඤ්ඤාණඤ්චායතනාදීසු අරූපීනං. **හෙට්ඨිමා හෙට්ඨිමා**ති විඤ්ඤාණඤ්චායතනිකානං ආකාසානඤ්චායතන-කුසලවිපාකා නුප්පජ්ජන්ති. ආකිඤ්චඤ්ඤායතනිකානං ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන-කුසල

1. M. පොත්ථකෙ නත්ථි.

විපාකා ති එවමාදිනා හෙට්ඨිමහෙට්ඨිමාරුප්පා නුප්පජ්ජන්ති; කස්මාති ආහ **දිට්ඨාදීනවතො කිරා** ති. කිරාති අනුස්සුතියං. **දිට්ඨාදීනවතො** ති ආරම්මණෙ ඣානෙ ච දිට්ඨදොසත්තා[1]

(263.) **කුසලානුත්තරා** ති ලොකුත්තරකුසලා (266) **සබ්බො රූපා මහග්ගතො** ති සබ්බො රූපාවචරමහග්ගතචිත්තුප්පාදො; **මනොධාතු** ති කිරියාමනොධාතු, විපාකමනොධාතූනං කාමවිපාකග්ගහණෙන ගහිතත්තා. (269) **එවං ඡසද්ඛයෙ ඤෙය්‍යං හිත්වා හෙට්ඨිමහෙට්ඨිමං** ති දුතියාරුප්පභූමියං වුත්තස්ස දුතියාරුප්පත්තයං ඨපෙත්වා අත්තනො විපාකෙන සහ තතියාරුප්පභූමියං එකූනචත්තාළීස චිත්තානි; තත්ථ වුත්තස්ස තතියාරුප්පත්තයං ඨපෙත්වා අත්තනො පාකෙන සහ සත්තතිංසාති **එවං ඡසද්ඛයෙපි හෙට්ඨිමහෙට්ඨිමං හිත්වා** චිත්තගණනා **ඤෙය්‍යා.**

(270.) **අත්තනො අත්තනො** ති පඨමාරුප්පභූමියං පඨමාරුප්පපාකො, දුතියාරුප්පභූමියං දුතියාරුප්පපාකොති එවං අත්තනො අත්තනො විපාකා. **චත්තාරො ච අනාසවා** ලොකුත්තරවිපාකාති එවං **චතූසු අරූපභූමිසු** එකෙකාය භූමියා පඤ්ච පඤ්ච විපාකා ජායන්ති. (271) **ක්‍රියා තෙරසෙව සියුං,** තා සබ්බා **පඨමාරූප්පභූමියං ඛීණාසවස්ස ජායන්ති** ති සම්බන්ධො (272) දුතියාරුප්පභූමියං ඛීණාසවස්ස පඨමාරුප්පක්‍රියාචිත්තං වජ්ජෙත්වා ද්වාදසෙව ක්‍රියා හොන්ති. තතියාරුප්පභූමියං දුතියාරුප්පක්‍රියාචිත්තං වජ්ජෙත්වා එකාදස. චතුත්ථාරුප්පභූමියං තතියාරුප්පක්‍රියාචිත්තං වජ්ජෙත්වා දසෙව ඤෙය්‍යා.

ඉදානි කෙවලං පුග්ගලවසෙන තෙසතෙසමෙව පුග්ගලානං ආවෙණිකචිත්තං දස්සෙතුං (274) **අරහතො පනා** ති ආදිනා අරහතො යෙව උප්පජ්ජනකචිත්තං දස්සෙත්වා අනාගාමිආදීනං පාටිපුග්ගලිකං සකසකඵලචිත්තං පාකටමෙවා ති සංඛිත්තං. **අරහතො** ති ඛීණාසවස්ස. අරහතො භාවො අරහත්තං'' අරහත්තඵලංති අත්ථො තං හි ''අරීනං හතත්තා අරහා''ති ආදිනා අරහන්තසද්දස්ස පවත්තිනිමිත්තභාවෙන අරහත්තං ති වුච්චති. (275) ඉදානි තෙසං තෙසං පුග්ගලානං සාධාරණචිත්තානි දස්සෙතුං **චතුන්නං ච ඵලට්ඨානං** ති ආදි වුත්තං

(290.) **සුසාරං** ති අත්ථව්‍යඤ්ජනවසෙන පරිච්චජිතබ්බස්ස ඵෙග්ගුභූතස්ස[2] අභාවතො සුට්ඨු සාරං, සබ්බසො සාරංති අත්ථො. **පරං** ති සුසාරත්තා එව පරං. සත්තානං ඉහලොක – පරලොක–

1. B. දිට්ඨිදොසත්තා. 2. M. ඵෙග්ගුස්ස.

හිතපටිච්ඡාදකස්ස අවිජ්ජන්ධකාරස්ස විධමනතො **මොහන්ධකා-රපදීපං.** **විජානනාති** ති අත්ථවසෙන විතෙත්තන්ති. **චාලෙවන්ති** ති වචනසෙසෙන සම්බන්ධායති රාගදොසානං මොහෙන සහ අවිනාභා-වතො තස්ස අනුපගමනං සභාවසිද්ධමෙවාති[1] **මොහන්ධකාරපදීපං** ති වත්වාපි නරං =පෙ= **නොපයන්ති** ති අනුපගමනමෙව වුත්තං. **මොහන්ධකාරපදීපං** ති වා වචනෙනෙව මොහස්ස අනුපගමො වුත්තො හොතීති රාගදොසානමෙව අනුපගමනං වුත්තං. මූලභූතානම්පන තිණ්ණං අනුපගමනවචනෙන සෙසකිලෙසානම්පි අනුපගමනං වුත්තමෙවාති දට්ඨබ්බං.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාරවණ්ණනාය පඤ්චමපරිච්ඡෙදවණ්ණනා නිට්ඨිතා.**

1. M B අත්ථසිද්ධමෙවාති

## (ආරම්මණ විභාග)

**43.** (291.) **එතෙසං** ති යථාවුත්තප්පභෙදානං තනු ච "චිත්තං චෙතසිකං"ති ආදිනා චිත්තාදීනි යෙව උද්දිට්ඨානීති තානෙව නිද්දිසිතබ්බානි, ආරම්මණම්පන අප්පකතං, තං කස්මා ඉධ වුච්චතීති චොදනං මනසි කරිත්වා ආහ: **තෙන විනා නත්ථි හි සම්භවො** ති. යස්මා ආරම්මණෙන විනා චිත්තස්ස සම්භවො නත්ථි, න හි අනාරම්මණං චිත්තං නාම අත්ථි, තස්මා තං ඉදං චිත්තං කං ආරබ්භ උප්පජ්ජතීති ආසංකානිවාරණත්ථං **ඉතො පරං ආරම්මණං දස්සිස්සාමී** ති අත්ථො.

(292.) කතිවිධං පන තං ආරම්මණං? කිං සරූපං වාති ආහ: **රූපං සද්දං** ති ආදිං. වචනත්ථං පන තෙසං සයමෙව වක්ඛති. **ඡළාරම්මණකොවිදා** ති ඡන්නං ආරම්මණානං ව්‍යාකරණෙ කුසලා බුද්ධාදයො. (293) **භූතා** ති චත්තාරො මහාභූතා. **උපාදායා** ති නිස්සාය. **චතුසමුට්ඨිතො** ති කම්මාදීහි චතූහි පච්චයෙහි සමුට්ඨිතො. නිදස්සිතබ්බං නිදස්සනං; කිං තං? දට්ඨබ්බභාවො, චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරභාවො. සහ නිදස්සනෙනාති සනිදස්සනො. පටිහඤ්ඤතීති පටිහනතීති[1] වා පටිඝො. යෙන ව්‍යාපාරාදි - විකාරපච්චයන්තර සහිතෙසු සුඛදුක්ඛාදීනං නිස්සයෙසු විකාරුප්පත්ති, යො සයං නිස්සයවසෙන ච සම්පත්තානං, අසම්පත්තානං ච පටිමුඛභාවො, අඤ්ඤමඤ්ඤපතනං[2] සො පටිඝොති අත්ථො. තත්ථ සයංසම්පත්ති ඵොට්ඨබ්බසනිස්සයවසෙන සම්පත්ති ගන්ධ - රස - ඝාණ - ජිව්හා - කායානං. ඉතරෙසං උභයථාපි අසම්පත්ති. තස්මා ඉධ අසම්පත්තානං පටිමුඛභාවො පටිඝොති වුච්චති. සහ පටිඝෙනාති සප්පටිඝො. සනිදස්සනො ච සො සප්පටිඝො චාති **සනිදස්සනසප්පටිඝො**. එත්ථා'හ: යස්ස දට්ඨබ්බභාවො අත්ථි, සො සනිදස්සනො චක්ඛුවිඤ්ඤාණගොචරභාවො ච දට්ඨබ්බභාවො. තස්ස ච රූපතො[3] අනඤ්ඤත්තා කථං සහ නිදස්සනෙන සනිදස්සනොති යුජ්ජතීති? වුච්චතෙ: අනඤ්ඤත්තෙපි තස්ස අඤ්ඤෙහි ධම්මෙහි රූපායතනං විසෙසෙතුං අඤ්ඤං විය කත්වා වුත්තං "සහ නිදස්සනෙන සනිදස්සනං"ති. ධම්මසභාවසාමඤ්ඤෙන හි එකීභූතෙසු ධම්මෙසු[4] යො නානත්තකරො විසෙසො සො අඤ්ඤං[5] විය කත්වා උපචරිතුං යුත්තො. එවං හි අත්ථවිසෙසාවබොධො හොති. **රූපාරම්මණසඞ්ඛාතො** ති අයං එවරූපො වණ්ණො රූපාරම්මණන්ති සඞ්ඛාතො. ඉදං වුත්තං හොති: චත්තාරො මහාභූතෙ උපාදාය

1. M. පටිහනතන්ති. 2. ඝට්ටනං (?) 3. M. රූපායතනභාවතො.
4. M. පොත්ථකෙ නත්ථි 5. M අඤ්ඤ,

තෙ අමුඤ්චිත්වා පවත්තමානො කම්මසමුට්ඨානො චිත්තසමුට්ඨානො උතුසමුට්ඨානො ආහාරසමුට්ඨානො ච නීලාදිවසෙන දිස්සමානො, ඉන්ද්‍රියෙහි සඞ්ඝට්ටනතො වණ්ණො **රූපාරම්මණං** නාමාති.

(295) චිත්තං ච උතු ච චිත්තොතූ. තෙහි සම්භවති, තෙ වා සම්භවා පච්චයා ඉමස්සාති චිත්තොතුසම්භවො. සහ විඤ්ඤත්තිසමුට්ඨාපකවිඤ්ඤාණෙන පවත්තො සද්දො **සවිඤ්ඤාණකසද්දො.** සවිඤ්ඤාණකසද්දො[1] පන න කෙවලං සවිඤ්ඤාණකසන්තානප්පවත්තොව, කුච්ඡිසද්දාදිවසෙන[2] තස්ස උතුසමුට්ඨිතස්සපි සම්භවතො.

(296.) **ගන්ධයතී** ති කලාපපරම්පරාය සඤ්චාරීයති. **සූචනතො** ති අත්තනො වත්ථුස්ස සුපාකටකරණතො. ගන්ධො හි ඉදං සුගන්ධං, ඉදං දුග්ගන්ධන්ති පකාසෙති. පටිච්ඡන්න - පුප්ඵඵලාදීනි ඉදමෙත්ථ අත්ථීති පෙසුඤ්ඤං කරොන්තං විය හොතී ති (297) **රමමානා** ති[3] අස්සාදවසෙන තුස්සමානා **රසන්තී** ති අසන්ති, අනුභවන්තී ති අත්ථො. එත්ථ[1] රකාරො පදසන්ධිකරො. එවං හි රමමානා තං අසන්තී ති රසොති නිරුත්තිනයො සුන්දරො හොති. ඉතරථා රසන්ති අස්සාදෙන්තී ති වුච්චමානෙ රමමානාති[3] ඉදං නිරත්ථකමෙව සියා අථ වා රමමානා ති[3] ඉතො රකාරං, රසන්තී ති ඉතො සකාරං ච ගහෙත්වා රසොති නිරුත්තිනයො දට්ඨබ්බො.

(298.) ඵුසීයතී ති ඵුට්ඨියති. කිං තං **ඵොට්ඨබ්බං** නාමාති ආහ: **පථවී - තෙජ - වායවො** ති. ඉමිනා ධාතුත්තයමෙව කායවිඤ්ඤෙය්‍යභාවසඞ්ඛාත - ඵොට්ඨබ්බසභාවං[4]; න ඵොට්ඨබ්බං[5] නාම[5] අඤ්ඤන්ති දස්සෙති. කස්මා පනෙත්ථ ආපොධාතු න ගහිතා? නනු සීතතා ඵුසිත්වා ගය්හති, සා ච ආපොධාතු යෙවාති? සච්චං; ගය්හති. න පන සා ආපොධාතු. කිඤ්චරහි තෙජොධාතු එව. මන්දෙ හි උණ්හභාවෙ සීතබුද්ධි, න සීතතා නාම කොචි ගුණො අත්ථි කෙවලං පන උණ්හභාවස්ස මන්දතාය සීතාභිමානො.[6] කථමෙතං විඤ්ඤාතබ්බන්ති චෙ? සීතබුද්ධියා අනවට්ඨිතත්තා, පාරාපාරෙ විය. තථා හි ඝම්මකාලෙ ආතපෙ ඨත්වා ඡායං පවිට්ඨානං සීතබුද්ධි හොති, තත්ථෙව[7] පථවිගබ්භතො උට්ඨිතානං උණ්හබුද්ධි. කිඤ්චරහි[8] හිමපාතසමයාදිසු සීතස්ස පරිපාචකත්තදස්සනතො ච තෙජොධාතු එව සීතතාති දට්ඨබ්බා යදි ච සීතතා ආපොධාතු සියා, එකස්මිං කලාපෙ උණ්හභාවෙන සද්ධිං උපලබ්භෙය්‍ය, ද්වින්නං

1. M පොත්ථකෙ නත්ථි. 2. M. කුච්ඡියං—. 3. M. රසමානාති. 4 M ඵොට්ඨබ්බං නාම. 5. මරම්ම පොත්ථකෙ නත්ථි 6. M සීතාභිමානො. 7. M. තත්ථෙව 8. M. පොත්ථකෙ නත්ථි

ධාතූනං අවිනිබ්භොගපවත්තිතො. න ච පනෙවං උපලබ්භති. තස්මා විඤ්ඤායති; න ආපොධාතු සීතතාති. ඉදං චතුම්මහාභූතානං අවිනිබ්භොගවුත්තිතං ඉච්ඡන්තානං උත්තරං. අනිච්ඡන්තානම්පි පන චතුන්නං මහාභූතානං එකස්මිං කලාපෙ කිච්චදස්සනෙන සභාගවුත්තිතාය සාධිතාය ඉදමෙව උත්තරං.

කෙචි පන වායොධාතු සීතතාති වදන්ති. තෙසම්පි ඉදමෙව උත්තරං. යදි වායොධාතු සීතතා සියා, එකස්මිං කලාපෙ උණ්හභාවෙන සද්ධිං උපලබ්භෙය්‍ය න ච පනෙවං උපලබ්භති; තස්මා විඤ්ඤායති න වායොධාතු සීතතාති. යෙ පන වදන්ති: ද්‍රවතා ආපොධාතු, සා ච ඵුසිත්වා ගය්හතීති. තෙ වත්තබ්බා:— ද්‍රවභාවොපි නාම ඵුසීයතීති ඉදං ආයස්මන්තානං අධිමානමත්තං, සණ්ඨානෙ විය. වුත්තං හෙතං පොරාණෙහි:

"ද්‍රවතාසහවුත්තීනි තීණි භූතානි සම්ඵුසං
ද්‍රවතං සම්ඵුසාමීති ලොකොයමභිමඤ්ඤති.
භූතෙ ඵුසිත්වා සණ්ඨානං මානසා ගය්හතෙ යථා
පච්චක්ඛතො ඵුසාමීති, ඤාතබ්බා ද්‍රවතා තථා"ති.

(299) **සබ්බං නාමං** ති සබ්බං චිත්තං චෙතසිකං නිබ්බානන්ති සමත්තං නාමං. චිත්තචෙතසිකා හි ආරම්මණං පති නමනතො නාමං; නිබ්බානං පන චිත්තස්ස අත්තානං පති නාමනතො නාමං. **රූපං** ති නිප්ඵන්නානිප්ඵන්නරූපං. කිං අවිසෙසතාති චෙ? තොති ආහ: **භිත්වා රූපාදිපඤ්චකං** ති. **ලක්ඛණානී** ති අනිච්චාදිලක්ඛණානි. **පඤ්ඤත්තී** ති නාමුපාදායවසෙන ද්‍රවිධා පඤ්ඤත්ති.

(300.) ඉමානි පන ඡබ්බිධානි ආරම්මණානි සබ්බානි සබ්බත්ථ ලබ්භන්ති, උදාහු කත්ථචි කානීති ආහ: **ඡළාරම්මණානී** ති ආදිං. **තීණි රූපෙ** ති රූපාවචරභූමියං රූප - සද්ද - ධම්මවසෙන තීණි ආරම්මණානි ලබ්භන්ති. ඝානාදිත්තයස්ස පන තත්ථ අභාවතො ගන්ධාරම්මණාදීනි ධම්මාරම්මණතො විසුං න ලබ්භන්ති. අරූපභවෙ පන සබ්බසො රූපානං අභාවතො එකං ධම්මාරම්මණමෙව ලබ්භති, න අඤ්ඤං ති ආහ **ආරුප්පෙ ධම්මාරම්මණමෙකකං** ති. නනු ච අරූපභවතො යෙව චවිත්වා කාමභවෙ නිබ්බත්තන්තානං අරූපභවෙ යෙව ගතිනිමිත්තවසෙන රූපාරම්මණං උපට්ඨාතීති? සච්චං, උපට්ඨාති. තං කාමභවෙ ආරම්මණං; උප්පජ්ජිතබ්බභවස්මිං හි වණ්ණො ගතිනිමිත්තවසෙන උපට්ඨාති.

එවං ඡ ආරම්මණානි සරූපතො පවත්තිප්පභෙදතො ච දස්සෙත්වා ඉදානි තෙසු **අභයගිරිවාසීනං** කඤ්චි විප්පටිපත්තිං දස්සෙත්වා තං පටික්ඛිපිතුං (301.) **ඛණවත්ථුපරිත්තත්තා**ති ආදි වුත්තං. තත්ථ **ඛණවත්ථුපරිත්තත්තා**ති ඛණස්ස චෙව වත්ථුනො ච පරිත්තත්තා. **යෙ රූපාදයො**ති සම්බන්ධො. **යෙසං**ති යෙසං ආචරියානං ලද්ධි **යෙසං**ති වා ධම්මරම්මණෙන සහ සම්බන්ධිභාවතො වුත්තං වවත්ථාපකත්තා; තෙ හි ධම්මාරම්මණං වවත්ථපෙන්තා අත්තනා සහ තං සම්බන්ධෙන්ති. තස්මා ධම්මාරම්මණෙන සහ සම්බන්ධිභාවාපෙක්ඛාය යෙසන්ති සාමිවචනන්ති. ඉමිනා පන ඉදං වුත්තං හොති: යෙ රූපාදයො පඤ්ච ආරම්මණා සන්තත්ත අයොගුළෙ පතිතං ජලබින්දු විය පරිත්තක්ඛණිකා, දිබ්බචක්ඛුනාපි අසක්කුණෙය්‍යගහණා, පරමාණු විය පරිත්තවත්ථුකා, තතො ච සකසකවිඤ්ඤාණස්ස[1] ආපාථං න ගච්ඡන්ති, කෙවලම්පන මනොවිඤ්ඤාණස්සෙව ගොචරාති, තෙ ධම්මාරම්මණං නාමාති යෙසං ලද්ධි, තෙ යෙසං වා ධම්මාරම්මණං නාමාති එතෙනෙව ච අතීතානාගතභාවෙන, අතිදූර - අච්චාසන්නභාවෙන, කුඩ්ඩාදි අන්තරිතභාවෙන ච ආපාථං අනාගච්ඡන්තානම්පි රූපාදීනං සංගහො කතො හොතීති; එවං ලද්ධිකා පන තෙ "ඉමෙසං ඛො ආවුසො පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං නෙව පච්චනුභොන්තානං මනො පටිසරණං; මනො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතී"ති ඉමං සුත්තං ආහරිත්වා පටික්ඛිපිතබ්බාති දස්සෙන්තො ආහ: (302.) **තෙ පටික්ඛිපිතබ්බාව**ති ආදිං තත්ථ පටික්ඛිපිතබ්බාති න අනුවත්තිතබ්බා, "න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනු-භොන්තාන"න්ති චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියස්ස ගොචරං න පච්චනුභොති, තථා සොතින්ද්‍රියං චක්ඛුන්ද්‍රියස්සාති ආදිනා අඤ්ඤමඤ්ඤස්ස ආරම්මණං නෙව පච්චනුභොන්තානං නානුභවන්තානං න ගණ්හන්තානං, **නෙසන්ති** තෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං. **තං ච ගොචරං මනො පච්චනුභොතී**ති සම්බන්ධො. තං පඤ්චවිධං ආරම්මණං චසද්දෙන ධම්මාරම්මණං ච මනො පච්චනුභොති. චිත්තං ආරම්මණං කරොතීති අත්ථො. අයං පනෙත්ථ අධිප්පායො: යදි චක්ඛාදීනමාපාථගතානි විනා අවසෙසා ධම්මාරම්මණා හොන්ති, තදා තංවිසයං චිත්තං පඤ්චින්ද්‍රියානං විසයං පච්චනුභොන්තං නාම න හොති. අත්තනො යෙව පන විසයං පච්චනු-භොන්තං නාම හොති එවඤ්ච සති මනොව නෙසං ගොචරවිසයං පච්චනුභොතීති දුප්පරිහාරියං භවෙය්‍ය. න ච තං සුත්ත

---

1 M. විඤ්ඤාණානං

ච්චනං සක්කා අතික්කාමෙතුං. තස්මා වුත්තනයෙන චක්ඛාදීනං අනාපාථගතාපි මනොගොචරා රූපාදයො රූපාදිආරම්මණානෙව හොන්ති, න ධම්මාරම්මණානි. යදි රූපාද්‍යාරම්මණං චිත්තං අත්තනො විසයං නානුභොති, පරවිසයමෙව අනුභොති, කථං දස්සනාදිකිච්චං න කරොති, තං තං කිච්චානං නිස්සයභූතස්ස වත්ථුනො අනිස්සිතත්තා. කථං වරහි පඤ්චින්ද්‍රියානං විසයං පච්චනුභොති නාම? දස්සනාදිකිච්චස්ස අකරණෙපි චක්ඛුවිඤ්ඤාණාදීහි දිට්ඨාදිආකාරස්සෙව ගහණතො පඤ්චින්ද්‍රියානං විසයං පච්චනුභොති නාම. යදි හි චක්ඛුවිඤ්ඤාණාදීහි දිට්ඨාදිආකාරං න ගණ්හාති රූපාදීනං නිලත්තාදිවසෙන ජානනං මනොවිඤ්ඤාණමෙව කරොති, න පඤ්චවිඤ්ඤාණානීති තථා ජානනමෙව න හොති. තස්ස පන අභිතායෙවෙතං විඤ්ඤාතබ්බං; අනාපාථගතරූපාද්‍යාරම්මණං චිත්තං අත්තනො විසයං න පච්චනුභොති නාම, අථ ඛො පඤ්චින්ද්‍රියානං විසයමෙව පච්චනුභොතීති. අථ සියා: න මයං චිත්තස්ස පඤ්චින්ද්‍රියානං[1] විසයානුභවනං පටික්ඛිපාම, තස්ස පන අනුභවනං දස්සනාදිකිච්චවිරහෙන ධම්මාරම්මණවසෙනෙවාති[2] තම්පි න; සුත්තෙන තථා ආගතට්ඨානස්ස අභාවතො. යදි හි චිත්තං දස්සනාදිකිච්චවිරහෙන පඤ්චින්ද්‍රියවිසයං ධම්මාරම්මණවසෙනෙව පච්චනුභොති, පඤ්චින්ද්‍රියානං විසයං පච්චනුභවමානා මනොධාතු - මනොවිඤ්ඤාණධාතු පි ධම්මාරම්මණායෙව සියා. එවඤ්ච සති "ධම්මායතනං මනොධාතුයා මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො"ති පට්ඨානෙ වත්තබ්බං සියා තථා පන අවත්වා "රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා- තංසම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. රූපායතනං =පෙ= ධම්මායතනං මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො"ති වුත්තං. පඤ්චින්ද්‍රියානං විසයං පච්චනුභොන්තී මනොධාතු - මනොවිඤ්ඤාණධාතුයො තං පඤ්චින්ද්‍රියානං විසයවසෙන පච්චනුභොන්ති, න ධම්මාරම්මණවසෙනාති නිට්ඨෙත්ථ ගන්තබ්බං.

එවං එකෙනාකාරෙන පටික්ඛෙපවිධිං දස්සෙත්වා පුන අපරෙනපි කාරණෙන දස්සෙන්තො ආහ: (304) **දිබ්බචක්ඛාදිඤාණානං**ති ආදීනි. ආදිගහණෙන දිබ්බසොතඤාණගහණං. **ඉතිපි න යුජ්ජතී**ති න කෙවලං පුබ්බවුත්තෙනෙව කාරණෙන, අථ ඛො ඉමිනාපි කාරණෙන න යුජ්ජතීති වුත්තං හොති. යදි පි

1. M. පඤ්චින්ද්‍රිය. 2. M - නෙවාති වෙ.

චක්ඛාදීනං ආපාථගතරූපාදීනි ධම්මාරම්මණා නාම හොන්ති, තදා දිබ්බචක්ඛාදීනි රූපාදිආරම්මණානි න සියුං, තෙසං පසාදවිසයානං රූපසද්දානං පරිග්ගණ්හනතො එවඤ්ච සති සුත්තෙසු දිබ්බචක්ඛු - දිබ්බසොතානං ධම්මාරම්මණත්තංව වත්තබ්බා,[1] න[2] රූපාදිආරම්මණතා. වුත්තා ච සා; තස්මා චක්ඛාදීනං අවිසයා රූපාදයො රූපාදාරම්මණානෙව, න ධම්මාරම්මණානීති. තෙනෙව ච ධම්මසංගහෙ පි "යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති =පෙ= අවික්ඛෙපො හොතී"ති වුත්තං. කිඤ්ච, අනාපාථගතානං ධම්මාරම්මණත්තෙ සබ්බඤ්ඤුතඤාණං රූපාදිආරම්මණං න හොතීති ආපජ්ජති. **එවං සතීති** යදි කදාචි රූපාදිආරම්මණං හුත්වා කදාචි ධම්මාරම්මණං හොති, කදාචි වා ධම්මාරම්මණං හුත්වා කදාචි රූපාදිආරම්මණං හොති, තදා තෙසං රූපාදිආරම්මණානං **නියමො පි නට්ඨං** භවෙ, "ඉදං රූපාදිආරම්මණං ඉදං ධම්මාරම්මණං"ති නියමො න භවෙය්‍ය, ආරම්මණසංකරො භවෙය්‍යාති අත්ථො.

එවං ඡබ්බිධං ආරම්මණං දස්සෙත්වා ඉදානිස්ස අනන්තරභෙදං පරිත්තාරම්මණාදිත්තිකවසෙන දස්සෙතුං ආහ (306) **සබ්බමාරම්මණං** ති ආදිං. **ඡබ්බිධං පරිකිත්තිතං එතං සබ්බං ආරම්මණං**ති සම්බන්ධො. **පරිත්තත්තිකාදීනං** ති පරිත්තාරම්මණත්තිකාදීනං. පරිත්තාරම්මණත්තිකො හි ඉධ පරිත්තත්තිකොති වුත්තො මජ්ඣපදලොපවසෙන. ආදිග්ගහණෙන මග්ගාරම්මණත්තිකො අතීතාරම්මණත්තිකො අජ්ඣත්තාරම්මණත්තිකොති ඉමෙසං තිණ්ණං තිකානං සංගහො. තත්ථ "පරිත්තාරම්මණා ධම්මා, මහග්ගතාරම්මණා ධම්මා අප්පමාණාරම්මණා ධම්මා"ති එවමාගතො පරිත්තාරම්මණත්තිකො, ආදිපදවසෙන. මග්ගාරම්මණා ධම්මා, මග්ගහෙතුකා මම්මා, මග්ගාධිපතිනො ධම්මාති එවමාගතො මග්ගාරම්මණත්තිකො. අතීතාරම්මණා ධම්මා, අනාගතාරම්මණා ධම්මා, පච්චුප්පන්නාරම්මණා ධම්මාති එවමාගතො අතීතාරම්මණත්තිකො. අජ්ඣත්තාරම්මණා ධම්මා, බහිද්ධාරම්මණා ධම්මා, අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා ති එවමාගතො අජ්ඣත්තාරම්මණත්තිකො ති වෙදිතබ්බං.

(307.) **ක්‍රියාහෙතුද්වයං** ති අහෙතුකක්‍රියාද්වයං. හසිතුප්පාදමනොධාතු, ඉතරස්ස මහග්ගතාදි - ආලම්බනවසෙන පි[3] චක්ඛ-

---

1 B අවත්වා. 2. B. පොත්ථකෙ නත්ථි. 3 M. ආරම්මණතාවසෙනාපි.

මානත්තා. (308) **ඉට්ඨාදිභෙදා**ති ආදි පරිත්තාරම්මණභාව විභාවනං. ඉට්ඨාදිභෙදා ති ඉට්ඨ - ඉට්ඨමජ්ඣත්ත - අනිට්ඨ - අනිට්ඨමජ්ඣත්තභෙදා. **පටිපාටියා** ති රූපං චක්ඛුවිඤ්ඤාණස්ස, සද්දෙ සොතවිඤ්ඤාණස්සාති ආදිනා අනුක්කමතො. (309) **රූපාදි පඤ්චකං සබ්බං මනොධාතුත්තයස්ස තු** ති කිරියාමනොධාතුයා චෙව කුසලාකුසලවිපාකවසෙන[2] දුවින්නං මනොධාතූනංච සබ්බං රූපාදිපඤ්චකං ගොචරං. තා හි හදයවත්ථුං නිස්සාය චක්ඛුවිඤ්ඤාණාදීනං පුරිමපච්ඡිමා හුත්වා නියමතො[3] රූපාදීනෙව ආරබ්භ පවත්තන්ති.

(311) **කාමධාතුයං** ති කාමභවෙ. තත්ථ හි තෙසං **සබ්බෙසං** වත්ථාරම්මණානි උපලබ්භන්ති **චත්තාරී**ති තෙසෙව කිරියාමනොධාතු, කුසලවිපාකචක්ඛුසොතවිඤ්ඤාණානි, තථා සම්පටිච්ඡනානි ඉමානි චත්තාරි චිත්තානි. සෙසානි පන වත්ථාරම්මණාභාවෙන තත්ථ නුප්පජ්ජන්ති **නෙව කිඤ්චි** ති වත්ථාරම්මණානං සබ්බසො අභාවතො එතෙසු කිඤ්චි න ජායති.

(312) **මහාපාකානං** ති ආදි පඨමපරිච්ඡෙදෙ වුත්තත්ථමෙව. (313.) **පච්චුප්පන්නා**නි පච්චුප්පන්නා එවං පරිත්තාරම්මණෙ දසෙත්වා ඉදානි මහග්ගතාරම්මණෙ අප්පමාණාරම්මණෙච දසෙතුං (314) **දුතියාරුප්පචිත්තං චා** ති ආදි වුත්තං. තත්ථ දුතියාරුප්පචිත්තං පඨමාරුප්පාරම්මණතො, චතුත්ථාරුප්පං තතියාරුප්පාරම්මණතො ච මහග්ගතාරම්මණං. **ඡබ්බිධං** ති කුසල - විපාක - ක්‍රියාවසෙන පච්චෙකං තිවිධතාය ඡප්පකාරං.

(316.) ඤාණං පරිහීනං එතෙසං, ඤාණතො පරිහීනාති වා **ඤාණහීනා** (317.) **පරිත්තාරම්මණා** =පෙ= **හොන්ති තෙ** ති අට්ඨඤාණවිප්පයුත්තචිත්තුප්පාදා සෙඛ - පුථුජ්ජන - ඛීණාසවානං කදාචි නිරුස්සුක්කභාවෙන ආදරාකරණවසෙන අකම්මඤ්ඤසරීරතා - අඤ්ඤවිහිතතාහි වා අසක්කච්චදානපච්චවෙක්ඛණ[3] - ධම්මසවණාදිසු අතිපගුණවිපස්සනාය ච කාමාවචරධම්මෙ ආරබ්භ පවත්තිකාලෙ **පරිත්තාරම්මණා**; අතිපගුණ - පඨමජ්ඣානාදීනං පච්චවෙක්ඛණකාලෙ මහග්ගතාරම්මණා කසිණනිමිත්තාදිපඤ්ඤත්තිපච්චවෙක්ඛණකාලෙ පරිත්තාරම්මණාදිවසෙන **නවත්තබ්බා**. අකුසලෙසු චත්තාරො දිට්ඨිසම්පයුත්ත - චිත්තුප්පාදා චතුපඤ්ඤාස - කාමාවචරධම්මානං රූපස්ස ච අත්තා සත්තො ති පරාමසන - අස්සාදනාභිනන්දනකාලෙ පරිත්තාරම්මණා. තෙනෙවාකාරෙන

---

1. M විපාකවිභාගවසෙන 2. M ජයනං, 3. M අසක්කච්චදාන - නංපච්චවෙක්ඛණ.

මහග්ගතධම්මෙ ආරබ්භ පවත්තකාලෙ මහග්ගතාරම්මණා. පණ්ණත්තිධම්මෙ ආරබ්භ පවත්තකාලෙ සියා න වත්තබ්බා පරිත්තාරම්මණාදිවසෙන දිට්ඨිවිප්පයුත්තානි තෙ යෙව ධම්මෙ ආරබ්භ විනා පරාමාසෙන අස්සාදනාභිනන්දනවසෙන පවත්තියං, පටිඝසම්පයුත්තානි දොමනස්සවසෙන පවත්තියං, විචිකිච්ඡාසම්පයුත්තං ද්වෙළ්හකභාවෙන, උද්ධච්චසහගතං වික්ඛිත්තවසෙන අවූපසමවසෙන ච පවත්තියං. පරිත්ත-මහග්ගත-නවත්තබ්බා-රම්මණානීති වෙදිතබ්බා

(318) **ක්‍රියතො පි චා**ති තථා ක්‍රියාචිත්තතොපි ඤාණසම්පයුත්තා චත්තාරොති අත්ථො. **ක්‍රියාවොට්ඨපනම්පි චා**ති සරූපකථනමෙතං, න පන කුසල-විපාකවොට්ඨපනස්ස විජ්ජ-මානත්තා. (319) **තිවිධො හොති ගොචරො**ති පරිත්ත-මහග්ගත අප්පමාණවසෙන තිවිධොපි ගොචරො හොති. කථං? කුසල-ක්‍රියාවසෙන අට්ඨඤාණසම්පයුත්ත-චිත්තුප්පාද සෙඛ-පුථුජ්ජන-ඛීණාසවානං සක්කච්ච දානපච්චවෙක්ඛණ-ධම්මසවණ-විපස්සනාදිසු කාමාවචරධම්මෙ ආරබ්භ පවත්තිකාලෙ කාමාවචරා-ලම්බණික-අභිඤ්ඤාය පරිකම්මානුලොමකාලෙ ච පරිත්තාරම්මණා; පඨමජ්ඣානාදි-පච්චවෙක්ඛණකාලෙ, මහග්ගතාරම්මණඣානාදීනං පරිකම්මකාලෙ, මහග්ගතධම්මෙ ආරබ්භ සම්මසනකාලෙ ච මහග්ගතාරම්මණානි[1] යථාලාභං ගොත්‍රභුවොදානකාලෙ පන ලොකුත්තරධම්මපච්චවෙක්ඛණකාලෙ නිබ්බාණාරම්මණා; අභිඤ්ඤාය පරිකම්මකාලෙ ච අප්පමාණාරම්මණා. පණ්ණත්තිපච්චවෙක්ඛණ-කාලෙ, පඤ්ඤත්තාරම්මණිකඣානාභිඤ්ඤානං පරිකම්මකාලෙ ච න වත්තබ්බාරම්මණා[2] අභිඤ්ඤාද්වයස්ස පරිත්තාදි ආරම්මණත්තං සත්තරසමපරිච්ඡෙදෙ වක්ඛති ක්‍රියාවොට්ඨපනම්පි යථාවුත්ත ධම්මානං තං තං ආරම්මණෙ පවත්තමානානං පුරෙචරං හුත්වා තං තදෙව ආවජ්ජන්තං පවත්තතීති පරිත්තාදිආරම්මණං. පඤ්චද්වාරෙ වොට්ඨපනවසෙන පවත්තියං පරිත්තාරම්මණමෙව.

(320) **වුත්තාවසෙසානී**ති යථාවුත්තෙහි අවසිට්ඨානි පණ්ණරස රූපාවචර-කුසලවිපාකක්‍රියාචිත්තානි, පඨම-තතියානි ඡ අරූපාවචරානීති එකවීසතිචිත්තානි **නවත්තබ්බාරම්මණානී**ති පරිත්තාදිවසෙන නවත්තබ්බස්ස කසිණාදිනිමිත්ත-සත්තපඤ්ඤත්ති-ආකාස-විඤ්ඤාණාභාවස්ස ආරම්මණකරණතො නවත්තබ්බා-රම්මණානීති.

**පරිත්තාරම්මණත්තිකං සමත්තං.**

1. M. රම්මණා හොන්ති 2 M. නවත්තබ්බා.

එවං පරිත්තාරම්මණත්තිකවසෙන විසයවිභාගං[1] ආරම්මණ-විභාගං ච දස්සෙත්වා ඉදානි යස්මා අප්පමාණාරම්මණෙසු[2] මහග්ගා-රම්මණනිද්දෙසෙනෙව[2] මහග්ගාරම්මණත්තික-සංගහිතොපි විසයි-විභාගො නිද්දිට්ඨො හොති, තස්මා තං පහාය අතීතාරම්මණත්ති-කවසෙන දස්සෙතුං (321) **දුතියාරුප්පවිඤ්ඤාණං** චාති ආදි වුත්තං. තත්ථ දුතියාරුප්පචිත්තං අතීතස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස ආරම්මණකරණතො, චතුත්ථාරුප්පං තතියාරුප්පස්ස ආරම්මණ-කරණතො එකන්තමතීතාරම්මණං.

(322.) **පච්චුප්පන්නාව ගොචරාති** රූපාදිම්හි ධරමානෙ-යෙව පඤ්චද්වාරිකචිත්තානං උප්පජ්ජනතො අනාගතාරම්මණං පන නියතං කිඤ්චි නත්ථි, අනාගතංසඤාණස්සපි පඤ්චමජ්ඣා-නතො අභිඤ්ඤත්තා. (324) **සියාතීතාරම්මණා පච්චුප්පන්නා-නාගතගොචරාති** අට්ඨ තාව මහාවිපාකා දෙවමනුස්සානං පටිසන්ධිග්ගහණකාලෙ කම්මං වා කම්මනිමිත්තං වා ආරබ්භ පවත්තියං අතීතාරම්මණා භවංගචුතිකාලෙපි එසෙව නයො. ගතිනිමිත්තං පන කදාචි කම්මනිමිත්තං ච ආරබ්භ පටිසන්ධි-ගහණකාලෙ තදනන්තරං භවංගකාලෙ ච පච්චුප්පන්නාරම්මණා. තථා පඤ්චද්වාරෙ තදාරම්මණවසෙන පවත්තියං. මනොද්වාරෙ පන අතීතානාගතපච්චුප්පන්නාරම්මණානං ජවනානං ආරම්මණං ගහෙත්වා පවත්තියං අතීතානාගතපච්චුප්පන්නාරම්මණා කුසලා-කුසලවිපාකාහෙතුක-උපෙක්ඛාසහගත-මනොවිඤ්ඤාණධාතුද්ව-යෙපි හි එසෙව නයො. කෙවලං හි තා යථාක්කමං මනුස්සෙසු ජච්චන්ධාදීනං, අපායෙසු ච සබ්බෙසං පටිසන්ධියො හොන්ති පඤ්චද්වාරෙ ච සන්තීරණකාලෙ පච්චුප්පන්නාරම්මණාව හොන්තීති අයමෙතාසං විසෙසො. සොමනස්සසහගතා පන පඤ්චද්වාරෙ සන්තීරණවසෙන තදාරම්මණවසෙන ච පවත්තිකාලෙ පච්චුප්පන්නා-රම්මණා. මනොද්වාරෙ තදාරම්මණකාලෙ අතීතානාගත-පච්චුප්පන්නාරම්මණාති වෙදිතබ්බා. හසිතුප්පාදචිත්තං පන ඛීණාසවානං පඤ්චද්වාරෙ පහට්ඨාකාරං කුරුමානං පච්චුප්පන්නා-රම්මණං හොති. මනොද්වාරෙ අතීතාදිභෙදෙ ධම්මෙ ආරබ්භ හසිතුප්පාදවසෙන පවත්තියං අතීතානාගතපච්චුප්පන්නාරම්මණං.

(324.) **කුසලාකුසලාති** ආදිසු කුසලෙසු තාව චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා සෙඛපුථුජ්ජනානං අතීතාදිභෙදානි ඛන්ධධාතුආයතනානි සම්මසනකාලෙ පච්චවෙක්ඛණකාලෙ අතීතාදි ආරම්මණිකඅභිඤ්ඤාදීනං පරිකම්මකාලෙ අතීතානාගතපච්චුප්-

---

1. M. විසයිවිභාගං, 2. M. අප්පමාණාරම්මණනිද්දෙසෙනෙව.

පන්නාරම්මණා; පඤ්ඤත්ති - නිබ්බානපච්චවෙක්ඛණකාලෙ, ගොත්‍රභුවොදානකාලෙ, පඤ්ඤත්ති-නිබ්බානාරම්මණිකඅභිඤ්ඤානං පරිකම්මාදිකාලෙ ච නවත්තබ්බාරම්මණා. පඤ්ඤත්ති - නිබ්බානානි ඉධ අතීතාදිකාලවසෙන නවත්තබ්බානීති තදාරම්මණානි අතීතාරම්මණාදිවසෙන නවත්තබ්බානි. තෙනාහ (325) **සන්ත-පඤ්ඤත්තිකාලෙසූති**. යථාසම්භවං සන්තස්ස නිබ්බානස්ස පඤ්ඤත්තියා ච ආරම්මණකරණකාලෙති අත්ථො. පොත්ථකෙසු පන **සඤ්ඤාපඤ්ඤත්තිකාලෙසූති** ලිඛන්ති. සො අපපාඨො. තස්ස පන අපපාඨභාවං අජානන්තා අත්ථභානිම්පි අසල්ලක්ඛෙත්වා වචනවිපල්ලාසවසෙන "පඤ්ඤත්තිකාලස්මිං"ති[1] අත්ථං ලිඛන්ති.

ඤාණවිප්පයුත්තානිපි වුත්තනයෙනෙව වෙදිතබ්බානි. කෙවලං හි තෙසං මග්ග-ඵල නිබ්බාණපච්චවෙක්ඛණානි නත්ථි. ඤාණවිරහෙන ලොකුත්තරධම්මාලම්බනෙ අසමත්ථභාවතොති අයමෙව විසෙසො. අකුසලෙසු චත්තාරො දිට්ඨිසම්පයුත්තචිත්තුප්පාදා අතීතාදිභෙදානං තෙභූමකධම්මානං අස්සාදනාභිනන්දන - පරාමසනකාලෙ අතීතාදිආරම්මණා; තථෙව පඤ්ඤත්තිං ආරබ්භ පවත්තනකාලෙ නවත්තබ්බාරම්මණා. දිට්ඨිවිප්පයුත්තෙසුපි එසෙව නයො කෙවලං හි තත්ථ පරාමාසගහණං නත්ථි. ද්වෙ පටිඝසම්පයුත්තචිත්තුප්පාදා අතීතාදිභෙදෙ ධම්මෙ ආරබ්භ දුස්සනකාලෙ අතීතාදිආරම්මණා; පණ්ණත්තිං ආරබ්භ දුස්සනකාලෙ නවත්තබ්බාරම්මණා විචිකිච්ඡුද්ධච්චසම්පයුත්තා තෙසු ධම්මෙසු අනිට්ඨංගතභාවෙන ච අවූපසමවික්ඛෙපවසෙන[2] ච පවත්තියං අතීතානාගතපච්චුප්පන්නා, නවත්තබ්බාරම්මණා ච. ක්‍රියාසු[3] අට්ඨ සහෙතුකචිත්තුප්පාදා කුසලචිත්තුප්පාදගතිකා එව තත්ථ හි ඤාණසම්පයුත්තා කුසලෙසු ඤාණසම්පයුත්තෙහි, ඤාණවිප්පයුත්තා ඤාණවිප්පයුත්තෙහි සමානා කෙවලං පන තෙ සෙඛපුථුජ්ජනානං උප්පජ්ජන්ති. ඉමෙ ඛීණාසවානන්ති අයමෙත්ථ විසෙසො. ක්‍රියා-හෙතුකමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා පඤ්චද්වාරෙ වොට්ඨපනවසෙන පවත්තියං පච්චුප්පන්නාරම්මණා; මනොද්වාරෙ අතීතානාගතපච්චුප්පන්නාරම්මණානං චෙව පඤ්ඤත්ති-නිබ්බා-රම්මණානං ච ජවනානං පුරෙචාරිකකාලෙ අතීතානාගත - පච්චුප්පන්න-නවත්තබ්බාරම්මණා.

අභිඤ්ඤාද්වයස්ස අතීතාදිආරම්මණතං වක්ඛති; (325) **අභිඤ්ඤාමානසා ද්වෙපි සියාතීතාදිගොචරා =පෙ= නවත්තබ්බාති** ආදිනා. කසිණනිමිත්තාදි - පඤ්ඤත්තාරම්මණත්තා අතීතාදි-

1. M. — කාලස්මිං සතිති, 2. B. අවූපසම. 3. M. කාමක්‍රියාසු.

ආරම්මණාදිනා න වත්තබ්බා (327) **ක්‍රියාපඤ්චාති** ඤාණසම්පයුත්තා චතස්සො, අහෙතුක-මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතාති ඉමා පඤ්චක්‍රියා **රූපවතා පඤ්චමම්පි ක්‍රියාති** රූපාවචරපඤ්චමජ්ඣානසංඛාතා ක්‍රියාභිඤ්ඤා ච **නත්ථි කිඤ්චි අගොචරං**ති අතීතාදිභෙදෙසු කාලවිනිමුත්තෙසු[1] ච අගොචරං නාම කිඤ්චි නත්ථි සබ්බමෙව තෙසං ගොචරං හොතීති අත්ථො.

## අජ්ඣත්තාරම්මණත්තිකං.

වුත්තනයානුසාරෙනෙව අජ්ඣත්තාරම්මණත්තිකසංගහිතො විසයවිභාගො[2] සක්කා විඤ්ඤාතුන්ති සො විසුං න උද්ධටො. සංඛෙපතො[3] පනෙස එවං වෙදිතබ්බො:- විඤ්ඤාණඤ්චායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති ඉමෙ තාව කුසලවිපාකක්‍රියාවසෙන ඡචිත්තුප්පාදා අත්තනො සන්තානසම්බන්ධං හෙට්ඨිමසමාපත්තිං ආරබ්භ පවත්තනතො අජ්ඣත්තාරම්මණා රූපාවචරචතුත්ථජ්ඣානානි[4], පඨම - තතියාරුප්පානි, ලොකුත්තරකුසලවිපාකානි ච නියකජ්ඣත්තතො බහිද්ධාභාවෙන බහිද්ධාභූතානි පඨවිකසිණාදීනි ආරබ්භ පවත්තිතො බහිද්ධාරම්මණානි. සබ්බෙව කාමාවචරකුසලාකුසලාබ්‍යාකතා ධම්මා, රූපාවචරපඤ්චමජ්ඣානං ච අජ්ඣත්තබහිද්ධාරම්මණානි. තත්ථ කාමාවචරකුසලතො චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා අත්තනො ඛන්ධාදීනි පච්චවෙක්ඛන්තස්ස අජ්ඣත්තාරම්මණා. පරෙසං ඛන්ධාදිපච්චවෙක්ඛණෙ, පණ්ණත්ති-නිබ්බානපච්චවෙක්ඛණෙ ච බහිද්ධාරම්මණා; තදුභයවසෙන අජ්ඣත්තබහිද්ධාරම්මණා. ඤාණවිප්පයුත්තෙසු පි එසෙව නයො. කෙවලං හි තෙසං නිබ්බානපච්චවෙක්ඛණා නත්ථි. අකුසලා පි අත්තනො ඛන්ධාදීනං අස්සාදාභිනන්දන - පරාමාසාදිකාලෙ අජ්ඣත්තාරම්මණා; පරස්ස ඛන්ධාදිසු චෙව අනින්ද්‍රියබද්ධ-රූපකසිණාදීසු ච තථෙව පවත්තිකාලෙ බහිද්ධාරම්මණා; තදුභයවසෙන අජ්ඣත්තබහිද්ධාරම්මණා. ද්වෙපඤ්චවිඤ්ඤාණානි තිස්සො මනො-ධාතුයො චාති ඉමෙ තෙරස චිත්තුප්පාදා අත්තනො රූපාදීනි ආරබ්භ පවත්තියං අජ්ඣත්තාරම්මණා; පරෙසං[5] රූපාදිසු පවත්තා බහිද්ධාරම්මණා; තදුභයවසෙන අජ්ඣත්තබහිද්ධාරම්මණා. සොමනස්සසහගතසන්තීරණං පඤ්චද්වාරෙ සන්තීරණ-තදාලම්බන වසෙන අත්තනො පඤ්ච රූපාදිධම්මෙ, මනොද්වාරෙ තදාරම්මණ වසෙනෙව අඤ්ඤෙපි අජ්ඣත්තිකෙ කාමාවචරධම්මෙ ආරබ්භ පවත්තියං අජ්ඣත්තාරම්මණං, පරෙසං ධම්මෙසු පවත්තමානං

1. M කාලවිමුත්තෙසු. 2. M B. විසයවිභාගො. 3. M. සරූපතො. 4. M චතුත්ථජ්ඣානානි. 5. M. පරස්ස.

බහිද්ධාරම්මණං; තදුභයවසෙන අජ්ඣත්තබහිද්ධාරම්මණං. උපෙක්ඛා සහගතසන්තීරණද්වයෙපි එසෙව නයො. කෙවලං පන තං සුගතිදුග්ගතීසු පටිසන්ධි-භවංග-චුතිවසෙනාපි අජ්ඣත්තාදිභෙදෙසු කම්මාදිසු පවත්තති. අට්ඨමහාවිපාකානිපි පටිසන්ධි-භවංග-චුති-තදාරම්මණවසෙන අජ්ඣත්තාදිභෙදෙසු ධම්මෙසු පවත්තනතො අජ්ඣත්තාදිආලම්බනානි. හසිතුප්පාදම්පි අත්තනො රූපාදීනි ආරබ්භ පහංසාකාරවසෙන පවත්තියං අජ්ඣත්තාරම්මණං; පරස්ස රූපාදිසු පවත්තං බහිද්ධාරම්මණං. මනොද්වාරෙපි අත්තනො කතකිරියපච්චවෙක්ඛණෙන හසිතුප්පාදනෙ අජ්ඣත්තාරම්මණං; පරෙසං කතකිරියපච්චවෙක්ඛණෙන බහිද්ධාරම්මණං; තදුභයවසෙන අජ්ඣත්තබහිද්ධාරම්මණං. මනොද්වාරාවජ්ජනං පන මනොද්වාරෙ ආවජ්ජනවසෙන පඤ්චද්වාරෙ ච වොට්ඨපනවසෙන පවත්තියං අජ්ඣත්තාදිආරම්මණං. අට්ඨමහාක්‍රියා කුසලගතිකා යෙව. කෙවලං හි තා ඛීණාසවානං උප්පජ්ජන්ති; කුසලානි සෙඛපුථුජ්ජනානං ති එත්තකමෙව නානත්තං. රූපාවචරපඤ්චමජ්ඣානස්ස අජ්ඣත්තාදිආරම්මණතං වක්ඛති.

(328) ඵලං මග්ගං ති ච සාමඤ්ඤෙන පුච්ඡිතත්තා ආහ: (329.) **චත්තාරො ඤාණසංයුත්තා පුඤ්ඤතො** ති අරහත්තමග්ගඵලානි පන තෙ ජානිතුං න සක්කොන්ති, තථා කුසලාභිඤ්ඤා ච. තෙනාහ (332.) **සබ්බසු පනාති** ආදිං. (333) වොට්ඨපනස්ස ආවජ්ජනකිච්චසමයං සන්ධාය ගාථාබන්ධසුඛත්ථං **වොට්ඨපනම්පි චාති** වුත්තං. (334) **චත්තාරො ඤාණසංයුත්තා'භිඤ්ඤාචිත්තං ච පුඤ්ඤතොති** ඉදං ඤාණසම්පයුත්තස්සාපි සෙඛපුථුජ්ජනසන්තානප්පවත්තස්ස අග්ගමග්ගඵලජානනෙ අසමත්ථතාය නිදස්සනමත්තං. කුසලාභිඤ්ඤාචිත්තම්පි පන තං ගොචරං කාතුමසමත්ථමෙව. එවං ච කත්වා හෙට්ඨා (333) **ක්‍රියාභිඤ්ඤා මනොධාතු** ති වුත්තං.

(335.) **කස්මා** ති කාරණපුච්ඡා. **අරහතොති** ආදි විස්සජ්ජනං හිසද්දො යස්මාති ඉමස්ස අත්ථෙ. යස්මා පුථුජ්ජනා වා සෙක්ඛා වා අරහතො මග්ගචිත්තං ඵලචිත්තං වා[1] ජානිතුං න සක්කොන්ති තස්මාති අත්ථො. අයං ච තෙසං අසමත්ථතා අනධිගතත්තා. අනධිගතෙ ච විසයෙ සබ්බෙසං මොහො අත්ථෙවාති දස්සෙතුං (336) **පුථුජ්ජනො න ජානාති** ති ආදි වුත්තං. **සොතාපන්නස්ස මානසං** ති සොතාපන්නස්ස පාටිපුග්ගලිකං මග්ගඵලසංඛාතං ලොකුත්තරමානසං. එවං **සකදාගාමිස්ස මානසං** ති ආදිසුපි ලොකියමානසං පන අරහන්තස්සාපි ජානන්ති. තථා හි වුත්තං:

1. M. ඵලමානසං ච.

“අථ ඛො මාරො පාපිමා භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය”ති. වුත්තමෙවත්ථං සංඛිපිත්වා දස්සෙන්තො ආහ (338) **හෙට්ඨිමොති** ආදිං. යථෙව හෙට්ඨිමො හෙට්ඨිමො පුග්ගලො උපරූපරිචිත්තං න ජානාති එවං උපරිමොපි හෙට්ඨිමස්ස චිත්තං න ජානාතීති? නො න ජානාති. සො පන අත්තනා අධිගතවිසයත්තා ජානාති යෙවාති දස්සෙන්තො ආහ **උපරූපරීති** ආදිං. යථා උපරූපරීති වුත්තං එවං හෙට්ඨිමස්ස හෙට්ඨිමස්සාති වත්තබ්බෙ එකං හෙට්ඨිමසද්දං වසද්දෙන සංගහෙත්වා **හෙට්ඨිමස්ස ච මානසං** ති වුත්තං.

එවං විසයීපධානවසෙන විභාගං දස්සෙත්වා ඉදානි විසයප්පධානවසෙන දස්සෙතුං ((339.) **යො ධම්මොති** ආදි වුත්තං. (340.) කුසලමෙව ආරම්මණන්ති **කුසලාරම්මණං**. **කාමෙති** පදං උභයත්ථ සම්බන්ධිතබ්බං. කාමෙ කුසලාරම්මණං කාමෙ කුසලාකුසලස්සාති. කිඤ්චාපි හි අකුසලස්ස එකන්තකාමාවචරත්තා න තස්ස විසෙසිතබ්බතා අත්ථි; කුසලම්පන විසෙසිතබ්බමෙවාති තදපෙක්ඛාය **කාමෙති** උපරිපදෙන සම්බන්ධිතබ්බමෙව. අථ වා අකුසලසහචරියතො කුසලම්පි කාමාවචරමෙව ගය්හතීති **කාමෙති** ඉදං පුරිමපදස්සෙව විසෙසනං දට්ඨබ්බං. (341) **කාමාවචරපාකස්සාති** පඤ්චවිඤ්ඤාණසම්පටිච්ඡනානං එකන්තෙන රූපක්ඛන්ධාරම්මණත්තා තදවසෙසස්ස එකාදසවිධස්ස කාමාවචරවිපාකස්ස. **කාමක්‍රියස්සාති** වුත්තනයෙනෙව මනොධාතුවජ්ජිතස්ස දසවිධකාමාවචරක්‍රියාචිත්තස්ස. **එතෙසං =පෙ= ආරම්මණං සියාති** එත්ථ කුසලස්ස තාව අත්තනා කතස්ස දානාදිකාමාවචරකුසලස්ස පසන්නචිත්තෙන අනුස්සරණකාලෙ, තදෙව[1] පරෙහි කතස්ස අනුමොදනකාලෙ, තස්සෙව දුවිධස්සපි අනිච්චතාදිවසෙන පච්චවෙක්ඛණකාලෙ, චෙතොපරියඤාණාදීනං පරිත්තකුසලාරම්මණිකා - අභිඤ්ඤානං පරිකම්මාදිකාලෙ ච ආරම්මණං හොති. අකුසලෙසු ච චතුන්නං දිට්ඨිසම්පයුත්තානං කාමාවචරකුසලං ආරබ්භ අස්සාදනාභිනන්දනපරාමසනකාලෙ, දිට්ඨිවිප්පයුත්තානං කෙවලං අස්සාදනාදිකාලෙ ච, ද්වින්නං පටිඝසම්පයුත්තානං අත්තනා පරෙහි ච කතකුසලමාරබ්භ විප්පටිසාර-දුස්සනකාලෙ, විචිකිච්ඡාචිත්තස්ස අසන්නිට්ඨානකාලෙ, උද්ධච්චසහගතස්ස අවූපසමවික්ඛෙපකාලෙ[2] ච ආරම්මණං හොති.

අභිඤ්ඤාචිත්තද්වයෙ කුසලස්ස සෙඛපුථුජ්ජනානං අත්තනා පරෙහි වා කතකුසලස්ස අනුස්සරණකාලෙ, පරචිත්තවිජානනකාලෙ, “ඉමිනා පුඤ්ඤකම්මෙන මනුස්සෙසු කාමාවචරදෙවෙසු නිබ්බත්තතී” ති ජානනකාලෙ අනාගතෙ දානාදිපුඤ්ඤනි-

1. M. තථෙව. 2. M. අරූපසම —

කරිස්සතීති[1] වා ජානනකාලෙ; ක්‍රියාචිත්තස්සාපි ඛීණාසවානං අත්තනා පරෙහි වා කතකම්මානුස්සරණකාලාදිසු ආරම්මණං හොති. කාමාවචරවිපාකෙසු නවන්නං සුගතිපටිසන්ධීනං කම්ම - නිමිත්තාරම්මණිකපටිසන්ධිකාලෙ සබ්බම්පි තදාරම්මණානං කාමාවචරකුසලාරම්මණික - ජවනානන්තරං තදාරම්මණකාලෙ ච ආරම්මණං හොතීති.

දසවිධකාමාවචරක්‍රියාසු ච අඨන්නං මහාක්‍රියාචිත්තානං ඛීණාසවානං කාමාවචරකුසල - පච්චවෙක්ඛණ - සම්මසනකාලෙ, පරිත්තාරම්මණික-ක්‍රියාභිඤ්ඤානං පරිකම්මාදිකාලෙ, හසිතුප්පාදස්ස දානාදීනි පච්චවෙක්ඛිත්වා තුස්සනකාලෙ, මනොද්වාරාවජ්ජනස්ස පන කාමාවචරකුසලාරම්මණිකජවනානං පුරෙචාරිකකාලෙ ච ආරම්මණං හොතීති එවං කාමාවචරකුසලං (341.) **ජනානං රාසීනං ආරම්මණං** හොතීති

(342.) **තතො**ති යථාවුත්තරාසිතො. තෙනාහ: **පඤ්චන්නං රාසීනං**ති එත්ථ ච ක්‍රියාචිත්තෙසු හසිතුප්පාදෙ න සම්භවති, එකන්තපරිත්තාරම්මණත්තා. තත්ථ කාමාවචරකුසලස්ස තාව සෙඛපුථුජ්ජනානං ඣානපච්චවෙක්ඛණ - සම්මසනකාලෙ, රූපාව-චරකුසලාරම්මණිකඅභිඤ්ඤානං පරිකම්මාදිකාලෙ, අකුසලස්ස ච වුත්තනයෙන පරාමසනාදිකාලෙ, අභිඤ්ඤාසු කුසලාභිඤ්ඤාය සෙඛපුථුජ්ජනානං අත්තනා පරෙහි වා අතීතභවෙ උප්පාදිත - ඣානානුස්සරණකාලෙ පරෙසං රූපාවචරචිත්තපරිච්ඡින්දනකාලෙ, ඉමිනා කමෙමන ඉමස්මිං බ්‍රහ්මලොකෙ නිබ්බත්තිස්සතීති ජානනකාලෙ ච, අනාගතෙ ඣානං භාවෙස්සතීති වා ජානන කාලෙ; ක්‍රියාභිඤ්ඤාය ච ඛීණාසවානං යථාවුත්තවසෙන පවත්ති කාලෙ ච නවවිධස්ස පන ක්‍රියාචිත්තස්ස ඛීණාසවානං හෙට්ඨා වුත්තනයෙනෙව රූපාවචරකුසලපච්චවෙක්ඛණකාලෙති එවං රූපාවචරකුසලං පඤ්චන්නං රාසීනං ආරම්මණං හොතීති.

(343, 344.) **අරූපකුසලං චාපි ආරම්මණපච්චයො හොති**ති සම්බන්ධො. **තෙභූමකුසලස්සා**ති සබ්බස්ස කාමාවචරකුසලස්ස, රූපාවචරකුසලෙසු කුසලාභිඤ්ඤාය, අරූපාවචරකුසලෙසු දුතිය චතුත්ථකුසලානං[2] චාති ඉමස්ස තෙභූමකකුසලස්ස. එස නයො **තෙභූමක-ක්‍රියස්සා**ති[3] එත්ථාපි. **චතුත්ථ - දුති** චතුත්ථ-දුතියානං. චතුත්ථදුත්‍යානං චතුත්ථදුතියානංති වා හි වත්තබ්බෙ ගාථාබන්ධවසෙන විභත්තියා, සවිභත්තිස්ස වා තියසද්දස්සලොපං කත්වා චතුත්ථදුති වුත්තං. **ඉමෙසං** =පෙ= **පච්චයො**ති කාමාවචරකුලසස්ස තාව

1. B. M. කාරාමි කරිස්සාමීති. 2. M. දුතියචතුත්ථකුසලස්ස 3. M — ක්‍රියායාති.

අභිඤ්ඤාකුසලස්ස ච රූපාවචරාරම්මණේසු වුත්තනයේනේව, දුතියචතුත්ථාරුප්පස්ස පඨම-තතියවසේනාති එවං තේභූමක කුසලස්ස; තථා සේඛපුථුජ්ජනානං[1] අත්තනෝ සන්තානගතස්ස පරසන්තානගතස්ස වා අරූපකුසලස්ස ජානනකාලේ, කාම රූපාවචරක්‍රියාචිත්තස්ස සේඛපුථුජ්ජනකාලේ යේව අත්තනා නිබ්බත්තිත-පඨමතතියාරුප්පං ආරබ්භ, ඛීණාසවකාලේ දුතිය චතුත්ථාරුප්පනිබ්බත්තනේ ආරුප්පක්‍රියාචිත්තස්සාති එවං ද්විභූ–මකක්‍රියස්ස; හෙට්ඨාවුත්තනයේනේව අකුසලස්ස, චතුත්ථදුතියානං ච අරූපාවචරවිපාකානන්ති එවමේතේසං අට්ඨන්නං රාසීනං ආරුප්ප කුසලමාරම්මණං හෝති.

(345) පරිච්ඡිජ්ජ ගාහිකාය තණ්හාය ආපන්නන්ති පරියාපන්නං, තේභූමකධම්මජාතං; න පරියාපන්නන්ති අපරියාපන්නං. තදේව පුඤ්ඤං චාති **අපරියාපන්නපුඤ්ඤං. කාමාවචරතෝපි ච කුසලස්ස ක්‍රියස්සාති** සම්බන්ධෝ. **රූපතෝ**ති රූපාවචරතෝ. (346.) **චතුන්නං =පෙ= සදූ**ති සේඛානං මග්ගපච්චවෙක්ඛණකාලේ මග්ගාරම්මණික – කුසලාභිඤ්ඤාය පරිකම්මාදිකාලේ ඤාණසම්ප–යුත්තකුසලස්ස; ඛීණාසවානං මග්ගපච්චවෙක්ඛණකාලේ, මග්ගා රම්මණික-ක්‍රියාඅභිඤ්ඤාය ච පරිකම්මකාලේ ඤාණසම්පයුත්තක්‍රියා චිත්තස්ස; තේසං තේසං ජවනානං පුරේචරවසේන පවත්තිකාලේ මනෝද්වාරාවජ්ජනස්ස; සේඛානං අත්තනෝ පරේසං වා මග්ග–පජානනකාලේ අභිඤ්ඤාද්වයස්සාති එවමේතේසං චතුන්නං රාසීනං අපරියාපන්නකුසලමාරම්මණං හෝති.

(346.) **තථේවාකුසලං =පෙ= ඊරිත**න්ති සේඛානං පහීනාව සිට්ඨකිලේස – පච්චවෙක්ඛණකාලේ, සේඛපුථුජ්ජනානං අත්තනෝ පරේසං වා සන්තානප්පවත්තාකුසලසම්මසනකාලේ, අකුසලා–රම්මණික – කුසලාභිඤ්ඤාය පරිකම්මාදිකාලේ, කාමාවචරකුසලස්ස අත්තනෝ පරේසං වා පවත්ත-අකුසලානුස්සරණාදිසු රූපාවචර කුසලස්ස; ඛීණාසවානං පහීනකිලේස – පච්චවෙක්ඛණේ, අඤ්ඤ සන්තානගත-අකුසලසම්මසනාදිකාලේ, පහීනකිලේසපච්චවෙක්ඛ–ණේන තුස්සනකාලේ, සබ්බසම්පි තංතංජවනානං පුරේචර කාලේ ච කාමාවචරක්‍රියාචිත්තස්ස; කුසලාභිඤ්ඤාය වුත්තනයේන රූපාවචරක්‍රියාචිත්තස්ස; පරාමාස – අස්සාදාභිනන්දනාදිවසේන පවත්තියං අකුසලස්ස; උද්ධච්චරහිත? – කම්මාරම්මණවසේන අකුසලවිපාකසන්තීරණස්ස; කාමාවචරජවනානං අනුස්සරණකාලේ සබ්බම්පි ඒකාදසතදාරම්මණවිපාකස්සාති. එවං (347) **කාමාවචර පාකානං**ති එවමේතේසං ඡන්නං රාසීනං අකුසලමාරම්මණං හෝති.

1. M සේඛපුථුජ්ජනකාලේ

(348) **විපාකාරම්මණං =පෙ= පච්චයො**ති සෙඛපුථුජ්ජනානං විපාකසම්මසනාදිකාලෙ කාමාවචරකුසලවිපාකඛන්ධානුස්සරණාදිසු රූපාවචරකුසලස්ස, වුත්තනයෙනෙව ඛීණාසවානං පටිපජ්ජනකාලෙ[1] අභිඤ්ඤාවිපාකාභාවං ආරබ්භ තුස්සනකාලෙ, යථාවුත්තජවනානං පුරෙචරකාලෙ කාමාවචරක්‍රියාචිත්තස්ස; කුසලෙ වුත්තනයෙනෙව රූපාවචරක්‍රියාචිත්තස්ස, විපාකං ආරබ්භ තදාරම්මණප්පවත්තියං විපාකාරම්මණිකකම්මුනා පටිසන්ධිං ගණ්හන්තස්ස; කම්මනිමිත්තවසෙන පවත්තියං ච කාමාවචරවිපාකස්ස; අස්සාදාභිනන්දන-පරාමාසාදිවසෙන පවත්තියං අකුසලස්සාති එවමෙතෙසං ඡන්නං රාසීනං කාමාවචරවිපාකමාරම්මණ පච්චයො හොති. රූපාවචරවිපාකාරම්මණෙපි ඉමිනා ච නයෙන යොජෙතබ්බං.[2] කෙවලං හි තං කාමාවචරවිපාකානං, ක්‍රියාචිත්තෙසු ච හසිතුප්පාදස්ස ආරම්මණං න හොතීති අයමෙත්ථ විසෙසො.

ලොකුත්තරවිපාකස්ස කාමාවචරකුසලක්‍රියානමාරම්මණක්කමො අප්පමාණාරම්මණනිද්දෙසෙ වුත්තනයෙනෙව වෙදිතබ්බො. කාමාවචරක්‍රියාචිත්තස්ස කාමාවචරකුසලාදි-ඡන්නං රාසීනමාරම්මණක්කමො කුසලාරම්මණෙ වුත්තසදිසොව. කෙවලං හි එත්ථ යදෙතං ඛීණාසවසන්තානෙසෙව නියතං නවවිධං ක්‍රියාචිත්තං, තං පරසන්තානප්පවත්තකුසලාකුසලස්ස ආරම්මණං[3] හොති[3]; සසන්තානෙව සෙඛපුථුජ්ජනකාලෙ, අනාගතාරම්මණික අභිඤ්ඤාය පරිකම්මාදිවසප්පවත්තකුසලස්ස ආරම්මණං හොති. විපාකෙසු ච පටිසන්ධි-භවංග-චුතිසංඛාත-විපාකානං කම්මාරම්මණවසෙන ආරම්මණං න හොතීති අයමෙව විසෙසො.

රූපාවචරවිපාකක්‍රියාචිත්තස්ස පඤ්චන්නං රාසීනං ආරම්මණක්කමො කුසලාරම්මණෙ වුත්තසදිසොව. විසෙසොපි කාමාවචරක්‍රියාරම්මණෙ වුත්තනයෙනෙව වෙදිතබ්බො. අරූපක්‍රියාචිත්තස්සාපි තෙසං පඤ්චන්නං රාසීනං ගොචරභාවො වුත්තසදිසොව ආරුප්පක්‍රියස්ස පන පඨමතතියං දුතියචතුත්ථෙසෙව ගොචරො හොති.

එවං රූපනිබ්බානවජ්ජිතමාරම්මණං දස්සෙත්වා ඉදානි රූපාරම්මණං නිබ්බානාරම්මණං ච දස්සෙතුං. (357.) **රූපං චතුසමුට්ඨාන**න්ති ආදි ආරද්ධං. රූපන්ති අට්ඨවීසතිවිධො භූතොපාදායභෙදභින්නො රූපක්ඛන්ධො. කිඤ්චාපි න සබ්බමෙව රූපං පච්චෙකං චතුසමුට්ඨානං; සමුට්ඨිතො[4] පන රූපක්ඛන්ධො චතූහි

---

1 M. විපාකසම්මසනාදිකාලෙ පුථුජ්ජනකාලෙ, 2. M. යොජනා කාතබ්බං. 3. M. පොත්ථකෙ නත්ථි. 4 B. M සමුදිතො

එව සමුට්ඨාතීති කත්වා වුත්තං චතුසමුට්ඨානන්ති. (358) **කාමපාකක්‍රියස්සාති** කාමාවචරවිපාකස්ස කාමාවචරක්‍රියාචිත්තස්ස ච. තත්ථ කාමාවචරකුසලස්ස තාව වණ්ණදානාදිපුඤ්ඤක්‍රියාකාලෙ, වණ්ණාදීනං අනිච්චාදිවසෙන සම්මසනකාලෙ, අභිඤ්ඤානං[1] පරිකම්මාදිකාලෙ; අකුසලස්ස අස්සාදනාභිනන්දන - පරාමාසාදිකාලෙ, අභිඤ්ඤාද්වයස්ස ඉද්ධිවිධභූතස්ස සුවණ්ණ - දුබ්බණ්ණාදි - රූපනිම්මාණකාලෙ; පුබ්බෙනිවාසානුස්සතිභූතස්ස "පුරිමභවෙ එවංවණ්ණො අහොසින්ති ආදිනා අනුස්සරණකාලෙ; දිබ්බචක්ඛුභූතස්ස චවමාන-උප්පජ්ජමානසත්තානං වණ්ණදස්සනකාලෙ; දිබ්බසොතභූතස්ස සද්දසවණකාලෙ; අනාගතංසඤාණභූතස්ස "අනාගතෙ එවං වණ්ණො භවිස්සාමී"ති ආදිනා ජානනකාලෙ; කාමාවචර විපාකෙසු ද්විපඤ්චවිඤ්ඤාණසම්පටිච්ඡනද්වයස්ස යථායොගං රූපාදි විජානනකාලෙ; සුඛසන්තීරණස්ස සන්තීරණ - තදාලම්බනකාලෙ; උපෙක්ඛාසන්තීරණද්වයස්ස සන්තීරණ-තදාලම්බන-කම්මනිමිත්ත-ගතිනිමිත්තාලම්බනකාලෙ, සහෙතුකවිපාකස්ස කම්මනිමිත්තගතිනිමිත්තාලම්බනකාලෙ, තදාරම්මණකාලෙ ච; කාමාවචරක්‍රියාසු පන කුසලෙ වුත්තනයානුසාරෙන අට්ඨමහාක්‍රියාචිත්තස්ස; "එවරූපං වණ්ණමද්දසින්"ති තුස්සනකාලෙ හසිතුප්පාදස්ස; පඤ්චද්වාරමනොද්වාරෙසු වොත්ථපනාවජ්ජනකාලෙ මනොද්වාරාවජ්ජනස්ස ච පඤ්චද්වාරෙ ආවජ්ජනකාලෙ පඤ්චද්වාරාවජ්ජනස්ස ච ආරම්මණං හොතීති එවං චතුසමුට්ඨානිකං රූපං **ඡන්නං රාසීනමාරම්මණං හොති.**

(359) නිබ්බානම්පන ගොත්‍රභූ-වොදානකාලෙ, නිබ්බානාරම්මණික-අභිඤ්ඤාය පරිකම්මාදිකාලෙ ච කාමාවචරතිහෙතුක කුසලස්ස; අතීතභවෙ සච්ඡිකත - නිරොධානුස්සරණකාලාදීසු රූපාවචරකුසලස්ස; වුත්තනයෙනෙව කාමරූපාවචරක්‍රියාචිත්තස්ස මග්ගඵානං තදනන්තරඵල - වලඤ්ජනඵලකාලෙසු අපරියාපන්න කුසලවිපාකස්ස චාති එවං ඡන්නං රාසීනං ආරම්මණං හොතීති දස්සෙතුං **නිබ්බානාරම්මණන්ති** ආදි වුත්තං. **උභයස්සාති** කාමාවචර-රූපාවචරවසෙන දුවිධස්ස.

(361) **නානප්පකාරකන්ති** ආදසමපරිච්ඡෙදෙ වක්ඛමානෙන නයෙන නානාවිධප්පකාරං. (362.) **නවන්නං පන රාසීනං හොතාරම්මණපච්චයොති** කාමාවචරකුසලස්ස, අකුසලස්ස, හසිතුප්පාදමනොධාතුවජ්ජිත-කාමාවචරක්‍රියාචිත්තානං චෙව ද්වින්නං අභිඤ්ඤාචිත්තානං ච සබ්බාපි පඤ්ඤත්ති; රූපාවචරකුසලවිපාක-ක්‍රියානං කසිණනිමිත්තාදිකා, පඨමාරුප්පකුසලවිපාකක්‍රියානං

---

1. M. අභිඤ්ඤාය.

ආකාසපඤ්ඤත්ති, තතියාරුප්පකුසලාදීනං තිණ්ණං අභාවපඤ්ඤත්තීති, එවං පඤ්ඤත්ති නවන්නං රාසීනං ආරම්මණපච්චයො හොති. එවං යො ධම්මො යස්ස ධම්මස්ස ආරම්මණං හොති, තං එකෙකද්වාරවසෙන දස්සෙත්වා ඉදානි සබ්බෙපි චතුභූමකචිත්තුප්පාදෙ ඡහි ආරම්මණෙහි යොජෙත්වා දස්සෙතුං (363) **රූපාරම්මණිකා ද්වෙ**ති ආදි ගාථාත්තයං වුත්තං. තං හෙට්ඨා වුත්තත්ථමෙව.

(366) **පඨමාරුප්පකුසල**න්ති ආදි පන හෙට්ඨා වුත්තනයම්පි අරූපාවචරාලම්බණෙසු අරූපාවචරධම්මානං සෙඛාසෙඛවසෙන නානප්පකාරතො පවත්ති ආකාරං පකාසෙතුං වුත්තං. **කුසලස්සා**ති සෙඛපුථුජ්ජනානං දුතියාරුප්පකුසලස්ස, **විපාකස්ස** පන ඛීණාසවානං පවත්තමානස්සාපි ආරම්මණං හොති, තස්ස පුරිමභවෙ කම්මනිමිත්තාරම්මණත්තා. අරූපභවෙ අතිසන්තභාවෙන පවත්තමානං භවඞ්ගචිත්තං න භාවනාය පරිසුද්ධං උපට්ඨාතීති ආහ (367) **පඨමාරුප්පපාකො**ති ආදිං. (368.) **පඨමං තු ක්‍රියාචිත්තං පුඤ්ඤස්ස** දුතියාරුප්පචෙතසො ආරම්මණං න හොති, විපාකස්ස දුතියාරුප්පචෙතසො ආරම්මණං න හොතීති සම්බන්ධො. තත්ථ ඛීණාසවකාලෙ කස්සචි කුසලස්ස අභාවතො **න පුඤ්ඤස්සා**ති වුත්තං. ආකාසානඤ්චායතනක්‍රියාසමඞ්ගිස්ස විඤ්ඤාණඤ්චායතනවිපාකචිත්තං නප්පවත්තතීති **න පාකස්සා**ති වුත්තං.

ඛීණාසවස්ස දිට්ඨධම්මසුඛවිහාරත්ථං නිරොධසමාපජ්ජනත්ථං ච සමාපත්තියො සමාපජ්ජන්තස්ස පඨමාරුප්පක්‍රියාචිත්තං දුතියස්ස ආරම්මණං හොතීති ආහ (369) **පඨමං තු ක්‍රියාචිත්ත**න්ති ආදිං. (370) **ද්විධා**ති ච වත්වා තමෙව දුවිධං තිවිධන්ති තිවිධතඤ්ච දස්සෙතුං **කුසලාකුසලස්සාපි විපාකස්ස ච තං සියා,** (372.) **ක්‍රියස්සාපි ක්‍රියා** හොතීති ආදි වුත්තං. තං වුත්තනයමෙව. (373) **එවමෙව ද්විධා චෙව තිධා චාරම්මණං සියා**ති පඨමාරුප්පචිත්තෙන වුත්තනයෙන සෙඛපුථුජ්ජනානං ද්විධා, ඛීණාසවානං ච තිධා ආරම්මණං හොතීති අත්ථො.

(374) **යං යං ගොචරං ආරබ්භා**ති රූපාරූපනිබ්බානපඤ්ඤත්තීසු යං යං ගොචරං ආරබ්භ, **යෙ** යෙති අරූපධම්මා.

(375.) **යො නරො**ති යො ගහට්ඨො පබ්බජිතො වා මාණවො. **කිරා**ති අනුමතියං; තස්ස **උත්තරතෙවා**ති ඉමිනා සම්බන්ධො. **පාර**න්ති අවසානං, තං ඉමස්ස පරමනිපුණගම්භීරනයසමඞ්ගිතාය යාථාවතො ඔතරන්තෙහි අකසිරෙන තරිතුං අසක්කුණෙය්‍යත්තා

දුප්පාපුණෙය්‍යංති කත්වා ආහ **දුත්තරංති**. **උත්තරං** උත්තමං. අභිධම්මාවතාරස්ස හි උත්තමතාය තදෙකදෙසභූතං පාරම්පි උත්තමමෙව හොති. **සොති** සො සමුත්තිණ්ණාභිධම්මාවතාර පාරො තරො. **උත්තරතෙව** පන සක්කොති තං උත්තරිතුංති අත්ථො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාරසංවණ්ණනාය ඡට්ඨපරිච්ඡෙදවණ්ණනා නිට්ඨිතා.**

---

# සත්තමපරිච්ඡෙදවණ්ණනා.

## (විපාකචිත්තප්පවත්ති.)

**49.** (376) **අනන්තඤාණෙනා**ති අනන්තාරම්මණප්පවත්තඤාණෙන. **නිරඞ්ගණෙනා**ති එත්ථ රාගාදයො අකුසලා අඞ්ගනන්ති එතෙහි, තංසමඞ්ගිනො පුග්ගලා නිහීනභාවං ගච්ඡන්තීති අඞ්ගණාති වුච්චන්ති. යථාහ: "රාගො අඞ්ගණං දොසො අඞ්ගණං, මොහො අඞ්ගණං; පාපකානං ඛො ආවුසො අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අඞ්ගණං"ති ච ආදිං. අත්තසන්තානෙ සීලාදිගුණෙ එසී ගවෙසීති ගුණෙසී, තෙන **ගුණෙසිනා**. කරුණාය[1] යුත්තො[1], සා අස්ස අත්ථීති වා කාරුණිකො, තෙන **කාරුණිකෙන**. එත්ථ ච **අනන්තඤාණෙනා**ති ඉමිනා භගවතො සබ්බඤ්ඤුභාවමාහ. **නිරඞ්ගණෙනා**ති ඛීණාසවභාවං. **ගුණෙසිනා**ති පුබ්බචරියං. **කාරුණිකෙනා**ති මහාකරුණාය සමඞ්ගීභාවං. එත්තකෙන පන ථොමනෙන භගවතො විපාකදෙසනාය නිය්‍යානිකාදිභාවං දීපෙති. අසබ්බඤ්ඤුනා හි දෙසිතං අනිය්‍යානිකං හොති; අඛීණාසවෙන දෙසිතං අපාකටං; අපුඤ්ඤවතා දෙසිතං න පතිට්ඨාති; අකාරුණිකෙන වුත්තං සුඛුද්‍රයකං න හොති. භගවතො පන සබ්බඤ්ඤුභාවතො තෙන දෙසිතං නිය්‍යානිකං, ඛීණාසවත්තා පාකටං, පුඤ්ඤවන්තතාය පතිට්ඨාති, මහාකරුණාසමඞ්ගිතාය සුඛුද්‍රයකන්ති. **විපාකචිත්තප්ප**වත්තින්ති විපාකචිත්තානං උප්පත්තිං.

(377.) ඉදානි විපාකකථාය මාතිකාවසෙන අට්ඨකථාය ඨපිතෙ දසප්පකාරෙ දස්සෙතුං **එකූනතිංස කම්මානී**ති ආදි වුත්තං. තත්ථ යථාරද්ධාය විපාකකථාය මූලකාරණභාවතො එකූනතිංසකම්මානීති පඨමං කම්මවවත්ථානං කතං. කම්මෙ පන කථිතෙ විපාකකථාය අධිට්ඨානභූතවිපාකාපි කථෙතබ්බාති **පාකා ද්වත්තිංස දස්සිතා**ති දුතියං විපාකවවත්ථානං කතං. කම්මවිපාකානං ච අද්වාරෙසු අදිස්සනතො **තීසු ද්වාරෙසු** =පෙ= **දිස්සරෙ**ති තතියං කම්මද්වාර-විපාකද්වාරා වුත්තා. කම්මවිපාකානං වචනප්පසඞ්ගෙ යෙව එකස්සෙව කම්මස්ස තං තං පච්චයමාගම්ම අනෙකඵලනිප්ඵාදනං දස්සෙතුං (378) **කුසලා කාමලොකස්මිං** =පෙ= **විවිධං ඵල**න්ති චතුත්ථං කාමාවචරකුසලස්ස පවත්ති-පටිසන්ධීසු නානාඵලනිප්ඵාදනං වුත්තං. එවං වුත්තෙන පන පවත්තිපටිසන්ධීනං ලබ්භමානවිපාකවසෙන වුත්තභාවං අජානන්තා තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙනාති "එකපුප්ඵං චජිත්වාන

---

1. M. කරුණාය නියුත්තා.

අසීතිං කප්පකොටියො දුග්ගතිං නාභිජානාමී"ති එවමාදිවචනස්ස ව්‍යඤ්ජනච්ඡායාය අත්ථං ගහෙත්වා දින්නපටිසන්ධිකායපි චෙතනාය පුන පටිසන්ධිදානං මඤ්ඤෙය්‍යුන්ති (379) **එකාය චෙතනායෙකා පටිසන්ධි පකාසිතා**ති පඤ්චමං; එකෙන කම්මෙන එකිස්සා එව පටිසන්ධියා නිබ්බත්තනං වුත්තං, එකස්මිං භවෙ නානාකම්මස්ස විපාකප්පවත්තිං සුණන්තා "දිස්වා කුමාරං සතපුඤ්ඤලක්ඛණ"න්ති ආදිවචනස්ස ච අත්ථං අජානන්තා නානාකම්මෙන එකා එව පටිසන්ධි හොතීති විනෙය්‍යුන්ති **නානාකම්මෙහි** . =පෙ= **පටිසන්ධියො**ති ඡට්ඨං නානාකම්මස්ස නානාපටිසන්ධිදානං වුත්තං; තථා විපච්චනනස්ස ච එතස්ස කම්මස්ස සොළසවිපාකානි, ද්වාදස මග්ගො, අහෙතුකට්ඨකම්පීති අයං විපාකවිභාගො හෙතුභෙදවසෙන හොතීති දස්සනත්ථං (380) **තිහෙතුකං** =පෙ= (383) **න ච හොති තිහෙතුකා**ති සත්තමං අට්ඨකථාය ආගතහෙතුකිත්තනං දස්සිතං. තං පන හෙතුකිත්තනං එකෙකස්ස කම්මස්ස විපාකවිභාගදස්සනත්ථන්ති.

ඉදානි **තිපිටකචූළනාගත්ථෙරස්ස,** මොරවාපිවාසී **මහාදත්තත්ථෙරස්ස, තිපිටකමහාධම්මරක්ඛිතත්ථෙරස්සා**ති තිණ්ණං ථෙරානං වාදෙසු "එකාය චෙතනාය ද්වාදස විපාකානි, එත්ථෙව දසක මග්ගො අහෙතුකට්ඨකම්පි" ති ආගතස්ස දුතියථෙරවාදස්ස; "එකාය චෙතනාය දසවිපාකානි, එත්ථෙව අහෙතුකට්ඨකම්පී"ති ආගතස්ස තතියථෙරවාදස්ස ච න සම්මාපතිට්ඨිතත්තා සුප්පතිට්ඨිතස්ස පඨමථෙරවාදස්ස වසෙන දස්සෙතුං විපාකෙසු අසංඛාරසසංඛාර විධානං පච්චයබලෙන හොති, නො කම්මබලෙනාති දීපනත්ථං අට්ඨමං (384) **අසංඛාරමසංඛාර**න්ති ආදිනා කම්මෙන සහ අසමානම්පි කත්වා සංඛාරභෙදො වුත්තො. කම්මස්ස සොමනස්සුපෙක්ඛාසහගතාභාවෙපි ආරම්මණවසෙන යෙව විපාකවෙදනාය පරිවත්තනං දස්සෙතුං (386) **ආරම්මණෙන** =පෙ= **පරිවත්තනා**න්ති නවමං ආරම්මණෙන වෙදනාපරිවත්තනං වුත්තං. කම්මවසෙන චෙව ආරම්මණවසෙන ච අනියතස්ස තදාරම්මණස්ස ජවනවසෙන නියමදස්සනත්ථං **තදාරම්මණ** =පෙ= **නියාමිත**න්ති දසමං ජවනෙන තදාරම්මණනියමො වුත්තොති.

(377) **එකූනතිංසකම්මානී**ති කුසලාකුසලවසෙන වීසති පරිත්තානි නවමහග්ගතානීති එකූනතිංසකම්මානි. යස්මා පනෙසා වට්ටවසෙන විපාකකථා, තස්මා ලොකුත්තරකුසලං වජ්ජෙත්වා එකූනතිංසෙව කම්මානි වුත්තානි. එවං **පාකා-ද්වත්තිංසා**ති එත්ථාපි තෙවීසති පරිත්තා නව මහග්ගතාති ද්වත්තිංස. **තීසු ද්වාරෙසූ**ති කාය-වචී-මනොද්වාරවසෙන තීසු

ද්වාරෙසු. කම්මද්වාරවවත්ථානං හෙට්ඨා සංඛෙපතො දස්සිතමෙව. විත්ථාරතො පනෙතං අට්ඨසාලිනියා ධම්මසංගහට්ඨකථාය තංසං-වණ්ණනාදිතො[1] ච ගහෙතබ්බං. කාමං කම්මානි පි ඡසු ද්වාරෙසු පවත්තන්ති; පඤ්චද්වාරප්පවත්තානි පන අවිපාකානි; මනොද්වාරඤ්ච ද්වාරත්තයවසෙන භින්නානි[2] විපාකදායකානමෙව සංගණ්හනත්ථං **තීසු ද්වාරෙසූති** වුත්තං. **ඡසූති** චක්ඛුද්වාරාදීනි පඤ්ච මනොද්වාරං චාති ඡසු විපාකද්වාරෙසු.

(378.) **තං තං පච්චයමාගම්මාති** කාරකසම්පදාදිකං තං තං පච්චයමාගම්ම. තෙනාහු පොරාණා:

"කාලොපධිප්පයොගානං ගතියා ච යථාරහං
සම්පත්තිං ච විපත්තිං ච කම්මමාගම්ම පච්චතී"ති.

අථ වා **තං තං පච්චයන්ති** සොමනස්සාදිහෙතුභූතං තං තං සහකාරිපච්චයං. **විවිධං ඵලන්ති**. සොමනස්සුපෙක්ඛාසහගත-සහෙතුකාහෙතුක-සසංඛාරාසංඛාරවසෙන නානප්පකාරඵලං.

(379.) **එකාය චෙතනායාති** උපපජ්ජවෙදනියභූතාය අපරාපරියවෙදනියභූතාය ච එකාය චෙතනාය. දිට්ඨධම්මවෙදනියභූතාය[3] පන පවත්තිවිපාකමෙව නිබ්බත්තති[4] නො පටිසන්ධිං. කිඤ්චාපි **තිහෙතුකන්ති** අවිසෙසෙන වුත්තං; උක්කට්ඨමෙව පන තිහෙතුකකම්මං තිහෙතුකවිපාකං දෙති; තථා දුහෙතුකම්පි උක්කට්ඨමෙව ද්විහෙතුකවිපාකං දෙති. ඔමකං පන තිහෙතුකකම්මං දුහෙතුකුක්කට්ඨසදිසං දුහෙතුකාහෙතුකමෙව විපාකං දෙති. තථා දුහෙතුකම්පි අහෙතුකමෙව විපාකං දෙති. උක්කට්ඨොමක-විභාගො ච පනෙස කුසලාකුසලපරිවාරලාභතො[5] ආසෙවන-විප්පටිසාරප්පවත්තිතො වා දට්ඨබ්බො. යං කම්මං අත්තනො පවත්තිකාලෙ පුරිමපච්ඡාභාගප්පවත්තෙහි කුසලධම්මෙහි පරිවාරිතං, පච්ඡා වා ආසෙවනලාභෙන[6] සමුදාචිණ්ණං, තං උක්කට්ඨං. යං පන කරණකාලෙ අකුසලධම්මෙහි පරිවාරිතං, පච්ඡා වා දුක්කතං මයාති විප්පටිසාරුප්පාදනෙන පරිභාවිතං, තං ඔමකං නාම හොති.

අථ[7] යථාවුත්තවිධානං කිං පටිසන්ධිප්පවත්තීනං අවිසෙසෙන, උදාහු පවත්තිවසෙනෙවාති චෙ? පවත්තිවසෙනෙව. පටිසන්ධියං පන අයං විසෙසොති දස්සෙන්තො ආහ (382.) **තිහෙතුමොමකන්ති**

1. M. තං තං වණ්ණනාදිතො. 2. M. භින්නානං. 3. M — වෙදනිය භූතා. 4. M. නිබ්බත්තෙති. 5. M. — පරිවාරතො. 6. B ආසෙවනාභාවෙන. 7. M. අපෙථ.

ආදිං. එත්ථාපි තිහෙතුක-උක්කට්ඨකම්මෙනෙව තිහෙතුකපටිසන්ධි හොති. ඔමකෙන පන දුහෙතුකඋක්කට්ඨෙන ච දුහෙතුකපටිසන්ධි; දුහෙතුකොමකෙන පන අහෙතුකා චාති අයං විසෙසො වෙදිතබ්බො. යස්මා පනෙත්ථ ඤාණං ජච්චන්ධාදිවිපත්තිනිමිත්තස්ස මොහස්ස සබ්බාකුසලස්සෙව ච පටිපක්ඛං, තස්මා තංසම්පයුත්තකම්මං ජච්චන්ධාදිවිපත්තිපච්චයං න හොතීති තිහෙතුකං අතිදුබ්බලම්පි සමානං දුහෙතුකපටිසන්ධිමෙව ආකඩ්ඪති, නාහෙතුකන්ති ආහ: **න ච හොති අහෙතුකා**ති.

(619.) **කතත්තා පච්චයා**ති කතත්තා එව පච්චයා, න විජ්ජමානතාය වා අවිජ්ජමානතාය වාති අත්ථො. තෙනාහ: **කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොතී"ති ආදිං. යදි එවං අරහතො කතකම්මම්පි කතත්තාව පච්චයො සියාති? න ඉදමෙවං. යථා හි අච්ඡින්නමූලස්මිං රුක්ඛෙ පුප්ඵිතං බීජසමත්ථම්පි කුසුමං මූලෙ ඡින්නමත්තෙන න ඵලදායකං හොති, එවං අරහතොපි කිලෙසමූලස්ස අච්ඡින්නකාලෙ සන්තානෙ පවත්තම්පි කම්මං කිලෙසමූලෙ ඡින්නමත්තෙන යෙව ඵලදානෙ අසමත්ථභාවං පාපුණාති. තෙනාහු පොරාණා:

> "බාලජනජ්ඣාරුළ්හො තිභවරථො[1] කම්මකිලෙසචක්කො
> සංකිලෙසචක්කවිධමිතො[2] න වහති කම්මෙකචක්කොපී"ති

කතත්තා වෙ පච්චයා, නිච්චඵලදානෙ[3] න කොචි විබන්ධොති[3] ආහ **පටිභොගාදික**න්ති ආදිං. පටිභොගාදිකන්ති "මූලං දස්සාමී"ති භණ්ඩගහණං ඉණගහණං ච සඞ්ගණ්හාති. අයම්පෙත්ථ අධිප්පායො: පාටිභොග-කිරියාදීනං විජ්ජමානතා වා අවිජ්ජමානතා වා නිය්යාතනෙ පටිභණ්ඩදානෙ ඉණදානෙ ච පච්චයො න හොති. අථ ඛො කරණමත්තං, න ච තං නිය්යාතනාදීනං නිච්චමෙව පච්චයො හොති. නිය්යාතනාදිම්හි පන කතෙ පච්චයත්තාභාවතො. එවමෙව ඵලුප්පාදනම්පති[4] කම්මස්ස විජ්ජමානතා වා අවිජ්ජමානතා වා පච්චයො න හොති, අථ ඛො කරණමත්තමෙව. එවං ච[5] සති විපක්කාවිපාකානං[6] පච්චයො[6] න හොතීති.

(621) පරමස්ස උත්තමස්ස අත්ථස්ස පකාසනතො **පරමත්ථප්පකාසනො.** පීතිබුද්ධිවඩ්ඪනොති පීතියා ඤාණස්ස ච පීතිසහගතස්ස වා ඤාණස්ස විවඩ්ඪනතො

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම**
**අභිධම්මාවතාරවණ්ණනාය නවමපරිච්ඡෙදවණ්ණනා**
**නිට්ඨිතා.**

---

1. M. ජාතිරථො 2 M කිලෙසචක්ක-. 3. M. නිච්චඵලදායකො විබන්ධොති.
4. M. විපාකුප්පාදනෙපි. 5. M. කරණමත්තං ච. 6. M. විපක්කාවිපාකපච්චයො.

# දසමපරිච්ඡෙදවණ්ණනා

## රූපවිභාගො.

(622) **ආදිම්හි** ති උද්දෙසගාථායං. **ඉදානි** ති විපාකචෙතසිකවිභාවනානන්තරං: **විභාවනං** ති නිද්දෙස-පටිනිද්දෙසවසෙන සරූපතො පකාසනං. (623) **රුප්පතීති** සීතුණ්හාදීහි විකාරමාපජ්ජති, ආපාදියතීති වා. අත්ථො විකාරුප්පත්ති ච සීතාදිවිරොධිපච්චයසන්නිධානෙ විසදිසුප්පත්ති යෙව. න හි යථාසකං පච්චයෙහි උප්පජ්ජිත්වා ඨිතධම්මානං අඤ්ඤෙන කෙනචි විකාරාපාදනං සක්කා කාතුං; තස්මා පුරිමුප්පන්නරූපසන්තති විය අහුත්වා පච්ඡා උප්පජ්ජමානානං විසභාගපච්චයසමවායෙන විසදිසුප්පත්ති යෙව ඉධ රුප්පනං ති දට්ඨබ්බං, එවං ච කත්වා සංඛ්‍යාතං (?) පරිණාමවාදෙ[1] පච්චක්ඛාතො හොති. නනු ච අරූපධම්මානම්පි විරොධිපච්චයසමවායෙ විසදිසුප්පත්ති ලබ්භතීති? සච්චං; ලබ්භති. න පන විභූතතරං. විභූතතරා හෙත්ථ විසදිසුප්පත්ති අධිප්පෙතා, උක්කට්ඨගතිවසෙන. යථා "අභිරූපස්ස කඤ්ඤා දාතබ්බා"ති. කුතො එතං විඤ්ඤායතීති චෙ? සුත්තෙ[2] සීතාදිගහණතො. තථා හි "කිඤ්ච භික්ඛවෙ රූපං වදෙථ? රුප්පතීති ඛො භික්ඛවෙ, තස්මා රූපං ති වුච්චති. කෙන රුප්පති? සීතෙන පි රුප්පති, උණ්හෙන පි රුප්පති, ජිඝච්ඡාය පි රුප්පති, පිපාසාය පි රුප්පති, ඩංසමකස-වාතාතප-සිරිංසප-සම්ඵස්සෙන පි රුප්පති. රුප්පතීති ඛො භික්ඛවෙ, තස්මා රූපං ති වුච්චතී"ති එත්ථ හි සීතාදිගහණං සීතාදිනා ඵුට්ඨස්ස රුප්පනං විභූතතරං; තස්මා තදෙවෙත්ථ ගහිතන්ති ඤාපනත්ථං, ඉතරථා රුප්පතීති සාමඤ්ඤවචනෙනෙව සිද්ධෙ සීතාදිගහණං නිරත්ථකං සියාති.

යදි එවං කථං බ්‍රහ්මලොකෙ රූපසමඤ්ඤා? න හි තත්ථ උපඝාතකො සීතාදිඵස්සවිසෙසො ලබ්භතීති? සච්චං; තත්ථාපි තංසභාවානතිවත්තනතො අරුප්පමානස්සපි රුප්පනසභාවානතිවත්තනතො රූපසමඤ්ඤා හොති. යථා අදුද්ධම්පි ඛීරං තංසභාවානතිවත්තනතො දුද්ධන්ති වුච්චතීති. අථ වා කිඤ්චාපි තත්ථ උපඝාතකො සීතාදිඵස්සවිසෙසො නත්ථි, අනුග්ගාහකො පන අත්ථි. තථාහි බ්‍රහ්මානං උතුජරූපං අත්ථි, තස්මා අත්ථෙව තත්ථ රුප්පනං ති න කොචි තත්ථ රූපසමඤ්ඤාය විබන්ධොති.

---

1 M. විපරිණාමවාදෙ 2. M. පොත්ථකෙ නත්ථි 3 M. අරූපනස්සපි.

**රූපයතීති** වාති සයං විජ්ජමානමෙව අත්තනො සන්තානං විකාරමාපාදයතී ති අත්ථො. ඉති පුරිමවිග්ගහෙන විකාරුප්පත්ති රූපන්ති දීපිතං; ඉමිනා පන විරොධිපච්චය-සන්නිපාතෙ විජ්ජමානස්සෙව යො අත්තනො සන්තානෙ විසදිසුප්පත්ති හෙතුභාවො; තං රුප්පනන්ති දීපිතං හොති. ඉමස්මිං පක්ඛෙ අරූපස්ස රූපසමඤ්ඤුපසංගො එව නත්ථි. නිරුද්ධමෙව හි තං අනන්තරාදිපච්චයෙහි අරූපං උප්පාදෙති, න විජ්ජමානන්ති. ඝට්ටනෙන විකාරුප්පත්තියං රූපසද්දස්ස රූළ්හි: තස්මා අරූපධම්මානං ඝට්ටනාභාවතො න තෙසු රූපසමඤ්ඤාති කෙචි පටිඝාතො රුප්පනන්ති අපරෙ. තෙසං මතෙන චක්ඛුවාපි සප්පටිඝරූපානමෙව රූපසමඤ්ඤුපසංගො. අථ ඛො අවයවවොහාරෙ සමුදායොපි වොහරීයතීති සබ්බමෙව රූපං රූපසමඤ්ඤං ලභති.

කෙචි පනෙත්ථ රූපයතීති වණ්ණායතනවසෙන වුත්තන්ති වදන්ති. තං හි වණ්ණවිකාරං ආපජ්ජමානං රූපයති හදයඞ්ගතභාවං පකාසෙතී ති; තයිදං උපරිවණ්ණායතනනිද්දෙසෙ විසුංයෙව වුච්චතීති න තස්ස ඉධ සංවණ්ණනෙ පයොජනං අත්ථි.

**සුරූපොති** ද්වත්තිංසමහාපුරිසලක්ඛණ-අසීතිඅනුබ්‍යඤ්ජන-බ්‍යාමප්පභා-කෙතුමාලාදීහි අලංකතත්තා සොභනරූපකායො. සභාවත්ථො වා රූපසද්දො "යං ලොකෙ පියරූපං සාතරූපං"ති ආදීසු විය. තස්මා සුරූපො ති සොභනසභාවො. තෙන දසබල-චතුවෙසාරජ්ජාදි - අසාධාරණ - ගුණවිසෙස - සමායොගදීපනතො සත්ථු ධම්මකායසම්පත්තියාපි සොභනතා දස්සිතා හොති.

(624) **භූතොපාදායභෙදතො** ති එත්ථ තදධීනවුත්තිතාය භවන්ති එත්ථ උපාදායරූපං ති භූතං. අථ වා මහාභූතා යෙව ඉධ පුරිමපදලොපෙන භූතසද්දෙන වුත්තා. තෙනාහ: චතුබ්බිධා මහාභූතා ති. භූතානි උපාදියතෙව, න පන සයං තෙහි අඤ්ඤෙහි වා උපාදියතීති උපාදායං. එවං ච කත්වා චතුන්නං මහාභූතානං අඤ්ඤමඤ්ඤං නිස්සාය පවත්තමානානම්පි උපාදාය රූපතාපසංගො නත්ථි. න හි තෙ කෙවලං අඤ්ඤමඤ්ඤං උපාදියන්තෙව, අථ ඛො සයං උපාදායරූපෙහි උපාදියන්තිපි. තස්මා උපාදායසද්ද - ගහණසාමත්ථියතො න මහාභූතානං උපාදායරූපතාපසංගොති. අථ වා "චතුන්නං මහාභූතානං උපාදායරූපං"ති වචනතො චතුමහාභූතසන්නිස්සිතතාව උපාදාරූපලක්ඛණං, න භූතත්තයාදිසන්නිස්සිතතාපීති න තෙසං උපාදායරූපතාති. භූතං ච උපාදාය ච භූතොපාදායං. තෙසං වසෙන භෙදතොති භූතුපාදායභෙදතො. භූතසද්දස්ස උභයලිඞ්ගත්තා ආහ: **මහාභූතා** ති. **උපාදා**ති උපාදායරූපානි. පටිසංඛා යොනිසොති ආදීසු විය එත්ථ යකාරලොපො දට්ඨබ්බො.

කතමෙ පනෙතෙ චත්තාරො මහාභූතා, කථං ච තෙ මහාභූතානි සඞ්ඛ්‍යාතා, කානි ච උපාදායරූපානි, කථඤ්ච තානි උපාදායරූපානී ති වුච්චන්තී ති ඉමං චොදනං හදයෙ කත්වා කමෙන සොධෙන්තො ආහ: (625) **පඨවීධාතූති** ආදිං. **චත්තාරොමෙ** ති චත්තාරො ඉමෙ. මහා ච සො භූතො චා ති මහාභූතො. තෙන **මහාභූතෙන,** සදෙවකෙ ලොකෙ මහන්තභාවෙන පාතුභූතෙන සම්මාසම්බුද්ධෙනාති අත්ථො. අථ වා

"කාලො ඝසති භූතානි සබ්බානෙව සහත්තනා.
යො ච කාලඝසො භූතො, ස භූතපචනිං පචී" ති

ආදිසු විය භූතසද්දස්ස සත්තෙසු ඛීණාසවෙසු ච පවත්තනතො **මහාභූතෙනා** ති මහතා සත්තෙන මහාඛීණාසවෙනාති වා අත්ථො. ඛීණාසවො පි හි පරික්ඛීණපටිසන්ධිකත්තා භූතො යෙව, න භවති න ච භවිස්සතීති භූතොති වුච්චති.

(626) **මහන්තා පාතුභූතාති** උපාදින්නකසන්තානෙ පි අනුපාදින්නකසන්තානෙ පි සසම්භාරධාතුවසෙන මහන්තා හුත්වා පාතුභූතා, ජාතා නිබ්බත්තාති අත්ථො. තෙසං අනුපාදින්න සන්තානෙ:

"ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච
එත්තකං බහලත්තෙන සංඛාතායං වසුන්ධරා"ති

ආදිනා නයෙන මහන්ත-පාතුභූතතා වුත්තා. උපාදින්න සන්තානෙපි අනෙකයොජනසතික-මච්ඡකච්ඡප-තිගාවුතප්ප-මාණ-දෙවදානවාදි-සරීරවසෙන දට්ඨබ්බා. වුත්තම්පි හෙතං: "සන්ති භික්ඛවෙ මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා"ති ආදි.

**මහාභූතසමා** ති අනෙකභූතවිසෙසදස්සනෙන අනෙකභූතදස්සනෙන[1] ච මහන්තා භූතා, මහන්තානි අබ්භූතානි වා එතෙසූති මහභූතා, මායාකරා යක්ඛාදයො වා. ජාතිවසෙනෙව මහන්තා භූතා ති මහාභූතා; තෙහි එතෙ සමාති මහාභූතසමා, එතෙ හි යථා මායාකාරා අමණිං යෙව උදකං මණිං කත්වා දස්සෙන්ති, අසුවණ්ණං යෙව ලෙඩ්ඩුආදිකං සුවණ්ණං කත්වා දස්සෙන්ති, යථා ච සයං නෙව යක්ඛා, න පක්ඛිනො සමානා යක්ඛාදිභාවම්පි දස්සෙන්ති, එවමෙව සයං අනීලානෙව හුත්වා නීලං උපාදායරූපං දස්සෙන්ති, සයං අපීතා =පෙ= සයං අනොදාතා යෙව හුත්වා ඔදාතං උපාදායරූපං දස්සෙන්තී ති

1 M අනෙකබ්භූතදස්සනෙන

මායාකාරමහාභූතසාමඤ්ඤතො මහාභූතා ච. යථා යක්ඛා මහාභූතා යං ගණ්හන්ති, නෙව තස්ස අන්තොසරීරෙ - ඨානං උපලබ්භන්ති, න සරීරතො බහි, න ච තස්ස අඞ්ගමංගං නිස්සාය න තිට්ඨන්ති; යදි හි සරීරස්ස අන්තො ඨිතා සකලසරීරෙ ච ව්‍යාපනං සියා, අථ ච බහි ඨිතා යක්ඛගහිතකෙන කත කුසලාකුසලං යක්ඛස්ස න සියා. යදි චස්ස අඞ්ගමඞ්ගං නිස්සාය ඨිතා යක්ඛගහිතකෙ පහටෙ යක්ඛස්ස දුක්ඛවෙදනුප්පත්ති සියා; න ච සරීරෙ රාජිට්ඨානං භවෙය්‍ය; යස්මා පනෙතං සබ්බං අත්ථි, තස්මා තෙ අනිද්දිසිතබ්බට්ඨානා.[1] එවමෙතෙ පි න අඤ්ඤමඤ්ඤස්ස අන්තො න බහි ඨිතා උපලබ්භන්ති; න ච අඤ්ඤමඤ්ඤං නිස්සාය න තිට්ඨන්ති. යදි හි අඤ්ඤමඤ්ඤස්ස අන්තො ඨිතා, න සකසකකිච්චකරා සියුං, අඤ්ඤමඤ්ඤං අනුපවෙසනතො අථ අඤ්ඤමඤ්ඤතො බහි ඨිතා, විනිබ්භුත්තා සියුං. තථා ච සති අවිනිබ්භුත්තවාදො පරිහායෙය්‍ය. තස්මා අනිද්දිසිතබ්බට්ඨානාති. යක්ඛමහාභූතසමානතාය මහාභූතසමා. අනිද්දිසිතබ්බට්ඨානා පි චෙතෙ යථාසකං කිච්චවිසෙසෙන සෙසානං තිණ්ණං උපකාරකා හොන්තා[2] සහජාතාදිනා පච්චයෙන පච්චයා හුත්වා අඤ්ඤමඤ්ඤං නිස්සාය තිට්ඨන්ති. **වංචකත්තා අභූතෙනාති** යක්ඛිනීආදයො විය අභූතෙන අතවෙජ්ජත මනාපවණ්ණසණ්ඨානාදිනා සත්තානං වඤ්චකත්තා මහන්තානි අභූතානි එතෙසූති **මහාභූතානි සම්මතා**. යථා හි යක්ඛිනී ආදයො මනාපෙහි කාළ - සාමාදිවණ්ණෙහි පුථුලකටි - ආදි සණ්ඨානෙහි[3] හත්ථභමුආදි - වික්ඛෙපෙහි ච අත්තනො භයානක භාවං පටිච්ඡාදෙත්වා සත්තෙ වඤ්චෙන්ති, අත්තනො වසං නෙන්ති එවමෙතෙ පි ඉත්ථිපුරිසාදිසු මනාපෙන ඡවිවණ්ණෙන මනාපෙන ච අංගපච්චංගසණ්ඨානෙන මනාපෙන ච හත්ථපාදඞ්ගුලිභමුක- වික්ඛෙපෙන අත්තනො කක්ඛළත්තාදිසරසලක්ඛණං[4] පටිච්ඡාදෙත්වා බාලජනං වඤ්චෙන්ති, අත්තනො සභාවං දට්ඨුං න දෙන්තා. තං අත්තනො වසං නෙන්ති.

(627) **චක්ඛුසොතංති** ආදිසු රූපමෙව **රූපතා**. හදයං ච තං වත්ථු ච මනොධාතු-මනොවිඤ්ඤාණධාතූනං ති හදයවත්ථු. හදයස්ස වා විඤ්ඤාණස්ස වත්ථූති හදයවත්ථු පුරිමපදලොපෙන පන වත්ථුනති වුත්තං කබලිංකාරො ආහාරො යෙව **ආහාරතා**. කිඤ්චාපි ධම්මසංගණියං රූපුද්දෙසෙ[5] කබලිංකාරො ආහාරො ඔසානෙ උද්දිට්ඨො. ඉධ පන නිප්ඵන්නරූපානං එකට්ඨානෙ

1. M ආදිස්සිතබ්බට්ඨානා 2. M හොන්ති 3 M පුද්ලපීවරකටිආදි සණ්ඨානෙහි 4. M කක්ඛළත්තාදිසරීරලක්ඛණං 5 M රූපනිද්දෙසෙ

දස්සනත්ථං හදයවත්ථුඅනන්තරං උද්දිට්ඨොති ලහුතා ආදි යාසං මුදුතා කම්මඤ්ඤතානන්ති ලහුතාදයො. තාසං තයං **ලහුතාදිත්තයං.** තත්ථ ලහුභාවො ලහුතා, තථා මුදුතා. කම්මනි සාධු කම්මඤ්ඤං, තස්ස භාවො කම්මඤ්ඤතා. ලහුතාදීනං සයං අනිප්ඵන්නත්තා නිප්ඵන්නානං රූපානං රූපවිකාරභාවං දස්සෙතුං **රූපස්සාති** විසෙසනං කතං (629) **චතුවීසති** ති ගණනපරිච්ඡෙදො බලරූපාදීනං[1] නිසෙධනත්ථො. තත්ථ යං වත්තබ්බං, තං පරතො ආවිභවිස්සති.

(630) **නිස්සායාති** නිස්සාය එව, න පන නිස්සය-වසෙන. චතූහි උපාදානෙහි විනිමුත්තවත්තනතාය[2] නික්ඛන්තං උපාදානතො මානසං එතස්සාති **නිරුපාදනමානසො** (631) **පත්ථටත්තාති** පුථුත්තා. තෙන පුථුභාවතො පුථුවී. පුථුවී එව පඨවීති නිරුත්තිනයෙන සද්දසිද්ධි දීපිතා හොති. අයම්පන සසම්භාරපඨවියා-වසෙන යුජ්ජති සා හි පුථුභූතා පත්ථටාති. ලක්ඛණපඨවියා වසෙන පන පත්ථටෙන පඨවී, සහජාතරූපානං පතිට්ඨාභාවෙන පක්ඛායති උපට්ඨාතී ති අත්ථො. පුරිමො පි වා අත්ථො ලක්ඛණ-පඨවියා වසෙන ලබ්භති. **වායනතොති** සමුදීරණතො; දෙසන්තරුප්පත්තිහෙතුභාවෙන භූතසංඝාතස්ස පාපනතොති අත්ථො. **තෙජෙතීති** පරිපාචෙති, නිසෙති, තික්ඛභාවෙන සෙසභූතත්තයං උස්මාපෙතීති අත්ථො. ගාථාබන්ධවසෙන චෙත්ථ ඉතිසද්දලොපතො තෙජෙතිච්චෙව වුත්තං, එවං **ආපෙතීති** එත්ථාපි. තස්මා තෙජෙතීති තෙජො, ආපෙතීති ආපොති වුත්තං හොති. **ආපෙති පාලනාති** අනුපාලෙතබ්බරූපපරිසොසානං ආපෙති පත්ථරති; තථා හෙතං ආබන්ධනකිච්චන්ති වුච්චති. ආපීයතී ති වා ආපො, සොසීයතී ආපියතීති[3] අත්ථොති කෙචි. අයම්පනත්ථො සසම්භාරාපෙ යුජ්ජතීති වදන්ති. ලක්ඛණාපෙ පි යුජ්ජතෙව. සො පි ඵරුස-පාචක - විසොසනාකාරෙන සෙසභූතත්තයෙන පීයමානො විය පවත්තතී ති. ආපායතී ති වා ආපො. බ්‍රෑහෙති වඩ්ඪෙතීති අත්ථො. තථා හෙ'ස පරිබ්‍රෑහනරසො. තෙසන්ති යථාවුත්තානං භූතොපාදාය-භෙදානං රූපානං.

(632) **පවක්ඛාමී** ති කථෙස්සාමි. කිං කාරණාති ආහ: **ලක්ඛණාදීසු** ති, ආදිසද්දො හෙතු අත්ථො. යස්මා ලක්ඛණාදීසු ඤාතෙසු සති යථාවුත්තානං භූතොපාදායරූපානං **ධම්මා ආවිභවන්ති**, යස්මා ලක්ඛණාදිසු ඤාතෙසු ධම්මා ආවිභවිස්සන්ති-

---

1 M. බලවරූපාදීනං 2 M නිබ්බත්තතාය 3. M. පිවීයතීති

තස්මා තෙසං සරසතො[1] ආවිභාවහෙතූති අත්ථො. කානි පන තානි ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානානි යෙසු ඤාතෙසු ධම්මා ආවිභවිස්සන්තීති ඉමං චොදනං සොධෙතුං ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානානි සරූපතො කථෙන්තො ආහ (633.) **සාමඤ්ඤං වා**ති ආදිං.

**සාමඤ්ඤං** සාධාරණො අනිච්චාදිකො සභාවො; කක්ඛලාදි-ඵුසනාදිකො අසාධාරණසභාවො. **කිච්ච**න්ති සන්ධාරණාදිකිච්චං. **සම්පත්ති**ති සම්පන්නභාවො, "සුරසො ගන්ධබ්බො"ති ආදිසු විය ගන්ධබ්බසම්පත්තියා රසසද්දෙන වුච්චමානත්තා සම්පත්ති රසොති. (634) **ඵල**න්ති සහජාත-නානාබන්ධිකවසෙන ඕතඵලං. **උපට්ඨානනයො**ති ගහෙතබ්බභාවෙන ඤාණස්ස උපට්ඨානාකාරො **ආසන්නකාරණ**න්ති පධානකාරණං, (635) ලක්ඛීයති අනෙනාති ලක්ඛණං. කක්ඛලත්තං ලක්ඛණමෙතිස්සාති කක්ඛලත්තලක්ඛණා නනු ච කක්ඛලත්තමෙව පථවීධාතූති? සච්චමෙතං. තථාපි විඤ්ඤාතාවිඤ්ඤාත-සද්දත්ථතාවසෙන අසම්භින්නෙපි ධම්මෙ කප්පනාසිද්ධෙන භෙදෙන එව නිද්දෙසො කතො, එවං හි අත්ථ-විසෙසාවබොධො හොතීති. අථ වා ලක්ඛීයතීති ලක්ඛණං. කක්ඛලා හුත්වා ලක්ඛීයමානා ධාතු කක්ඛලත්තලක්ඛණාති එව-මෙත්ථ අත්ථො දට්ඨබ්බො. සෙසාසුපි[2] එසෙව නයො. **පතිට්ඨානරසා**ති සහජාතධම්මානං පතිට්ඨාභාවකිච්චා. අසහජාතානම්පි සන්තති-වසෙන පතිට්ඨාභාවො හොතෙව. තතො එව තෙසං සම්පටිච්ඡනාකාරෙන ඤාණස්ස පච්චුපට්ඨාතීති **සම්පටිච්ඡනපච්චු-පට්ඨානා**, ඉමිනා කිච්චවසෙනෙවෙත්ථ පච්චුපට්ඨානන්ති දස්සෙති. පදට්ඨානං පනෙත්ථ චතුන්නම්පි එකතො කත්වා වක්ඛති.

**පග්ඝරණලක්ඛණා**ති දවතාභාවතො විස්සන්දනලක්ඛණා. **බ්‍රූහනරසා**ති සහජාතධම්මානං මිලාතභාවූපගමනං අදත්වා වඩ්ඪනකිච්චා. තථා හි සා තෙසං පීණිතභාවං[3] දස්සෙතීති වුච්චති. **සංගහපච්චුපට්ඨානා**ති බාහිරඋදකං විය න්හානියචුණ්ණස්ස සහජාතධම්මානං විප්පකිරිතුං[4] අදත්වා සම්පිණ්ඩනවසෙන සංගණ්හනපච්චුපට්ඨානා.

**පරිපාචනරසා**ති පරිණතභාවකරණරසා. **මද්දවානුප්පදාන-පච්චුපට්ඨානා**ති බාහිරග්ගි විය ජතුලොහාදීනං සහජාතධම්මානං මුදුභාවානුප්පදානපච්චුපට්ඨානා.

---

1 M. පරසතො. 2, M සෙසෙසුපි 3. M. පිණ්ඩිතභාවං 4. B. M. විප්පකිණ්ණිතුං.

**විත්ථම්භනලක්ඛණාති** පූරණලක්ඛණා. **සමුදීරණරසාති** කම්පනරසා. **අභිනීහාරො** භූතත්තයස්ස දෙසන්තරුප්පත්තිහෙතුභාවො, නීහරණං වා බීජතො[1] අංකුරාදිකස්ස විය. **එකෙකා චෙත්ථ සෙසභූතත්තයපදට්ඨානාති වෙදිතබ්බාති** පථවීධාතු ආපාදිභූතත්තයස්ස[2] පදට්ඨානා. ආපොධාතු පථවීතෙජාදිභූතත්තයස්ස[2] පදට්ඨානාති එවං එකෙකා ධාතු අවසිට්ඨභූතත්තයපදට්ඨානා. ආරොහපරිණාහවසෙන හි මජ්ඣිමෙ ඉමස්මිං සරීරෙ පරිග්ගය්හමානා පරමාණුභෙදසංචුණ්ණා සුඛුමරජභූතා පථවීධාතු දොණමත්තා සියා සා ච තතො උපඩ්ඪප්පමාණාය ආපොධාතුයා යථා න විකිරති, එවං ආබන්ධනවසෙන සංගහිතා. යථා පන පග්ඝරණසභාවාය ආපොධාතුයා වසෙන කිලින්නභාවං පිච්ඡිලභාවං නාපජ්ජති එවං තෙජොධාතුයා අනුපාලිතා යථා පන තස්සා වසෙන න විකිරීයති එවං වායොධාතුයා විත්ථම්භිතා සංඝාතභාවං පාපිතා. එවං සුඛුමරජභූතාපි ආබන්ධන - පරිපාචන - සමුදීරණ-කිච්චාහි ආපො - තෙජො - වායොධාතූහි ලද්ධප්පච්චයා සිනෙහෙන තෙමිතා, තෙජසා පරිපක්කා, වායුනා විත්ථම්භිතා පිට්ඨචුණ්ණාදීනි විය ඉතොචිතො ච අවිකිරියමානා අවිද්ධංසියමානා නානාප්පකාර-ඉත්ථිපුරිස-මිගාදි[3] - භාවවිභාගං උපගච්ඡන්ති; අණු-ථූල-දීඝ-රස්සසිථිල කඨිනාදිභාවං[4] ච පකාසෙති. යූසගතා ආබන්ධනාකාරභූතා පනෙත්ථ ආපොධාතු පථවීපතිට්ඨිතා තෙජානුපාලිතා වායො-විත්ථම්භිතා න ගලති, න පග්ඝරති, න පරිස්සවති; එවං තීහි ධාතූහි අනුපාලිතා අපග්ඝරමානා අපරිස්සවමානා පීණිතභාවං දස්සෙති; එසා හි අනුබ්‍රූහනරසා අසිතපීතාදිපරිපාචිකා[5] චෙත්ථ උසුමාකාරභූතා උණ්හත්තලක්ඛණා තෙජොධාතු පථවීපතිට්ඨිතා ආපොසංගහිතා වායොවිත්ථම්භිතා ඉමං කායං පරිපාචෙති, වණ්ණසම්පත්තිං චස්ස ආවහති, යථානුභූතස්ස ආහාරස්ස සම්මාපරිණාමනෙන රසාදිසම්පත්තියා හෙතුභාවං ගච්ඡන්තී ඉමං කායං පරිපාචෙති; වණ්ණසම්පත්තිං ච ආවහති. කම්මූප-නිස්සයාය පි හි චිත්තප්පසාදහෙතුකාය ච සරීරවණ්ණසම්පදාය තෙජොධාතු විසෙසප්පච්චයා; පගෙව උතුආහාරසමුට්ඨානාය රූපසම්පත්තියාති. තාය ච පන පරිපාචිතො අයං කායො න පූතිභාවං ගච්ඡති. අංගමංගානුසටා චෙත්ථ සමුදීරණ-විත්ථම්භනලක්ඛණා වායොධාතු පථවීධාතුයා අත්තනි පතිට්ඨාපීයති යථා සහජාතධම්මෙහි විසුං න හොති, එවං ආපොධාතුයා සංගය්හති, යථා සහජාතධම්මා[6] න[6] පරිස්සවන්ති, එවං තෙජොධාතුයා

1 M බීජාදිතො. 2. M. භූතත්තය. 3 M ඉත්ථිපුරිසලිංගාදි. 4. B. M. —රස්සපිරසාඨිනාදිභාවං. 5. M. පරිපාචිතා. 6. B. M සහජාතධම්මානං.

අනුපාලියති. සා එවං තීහි ධාතූහි යථාරහං අනුපාලියමානා ඉදං කායං විත්ථම්භෙති, තාය පන විත්ථම්භිතො අයං **කායො න පරිපතති, උජුකං තිට්ඨති.** ඉච්චෙවං එකෙකාය ධාතුයා තිස්සන්නං ධාතූනං වසෙනෙව පවත්තනතො වුත්තං "එකෙකාවෙත්ථ සෙසභූතත්තයපදට්ඨානාති වෙදිතබ්බා"ති.

එවං භූතරූපානං සද්ධිං වචනත්ථෙහි ලක්ඛණාදයො දස්සෙත්වා ඉදානි උපාදායරූපානි[1] දස්සෙන්තො ආහ **චක්ඛු**න්ති ආදිං. අනෙකත්ථත්තා ධාතූනං චක්ඛති-සද්දස්ස විභාවනත්ථාපි සම්භවතීති කත්වා වුත්තං **විභාවෙතී**ති. **චක්ඛතී**ති පන විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය, අභිව්‍යත්තං වදන්තං විය හොතීති අත්ථො. අථ වා චක්ඛතීති විඤ්ඤාණාධිට්ඨිතං රූපං අස්සාදෙන්තං විය හොතීති අත්ථො. චක්ඛතීති හි අයං සද්දො "මධුං චක්ඛති, ව්‍යඤ්ජනං චක්ඛතී"ති ආදිසු විය අස්සාදනත්ථො. වුත්තං හෙතං: "චක්ඛුං ඛො මාගන්දිය රූපාරාමං රූපරතං රූපසම්මුදිත"න්ති. චක්ඛති ච **රූපෙසු ආවිඤ්ඡනරස**න්ති. යදි එවං "සොතං ඛො මාගන්දිය සද්දාරාම"න්ති ආදිවචනතො සොතාදීනම්පි සද්දාදිඅස්සාදනභාවො අත්ථීති තෙසම්පි චක්ඛු-සද්දාභිධෙය්‍යතා ආපජ්ජතීති, නාපජ්ජති නිරූළ්හත්තා. නිරූළ්හො හි එස චක්ඛුසද්දො ලොචනෙ යෙව, පදුමාදිසු පඞ්කජාදිසද්දා වියාති.

(635.) චක්ඛුරූපස්ස නිද්දෙසප්පකරණෙ පි චක්ඛුසද්ද-සාමඤ්ඤතො ආගතං සබ්බම්පි චක්ඛුං පභෙදතො දස්සෙතුං **තත්ථ චක්ඛූ**ති ආදි වුත්තං. **තත්ථ** තස්මිං චක්ඛුනිද්දෙසෙ **පඤ්ඤාමංසප්පභෙදතො**ති පඤ්ඤාචක්ඛු-මංසචක්ඛූති එවං පඤ්ඤා-මංසානං වසෙන පභෙදතො **තත්ථා**ති තස්මිං දුවිධෙ චක්ඛුම්හි. පඤ්ඤා එව **පඤ්ඤාමයං. නාමතො**ති නාමෙහි පඤ්චවිධං ති සම්බන්ධො. (636.) කතමෙහී ති[2] ආහ **බුද්ධ-ධම්ම-සමන්තෙනා**හීති, බුද්ධචක්ඛු ධම්මචක්ඛු සමන්තචක්ඛූති ඉමෙහි නාමෙහි. **ඤාණ-දිබ්බෙහී**ති ඤාණචක්ඛු-දිබ්බචක්ඛූති ච නාමෙහි **යථානුක්කමතො**ති යථාවුත්ත-අනුක්කමතො. **නානත්ත**න්ති භෙදං. **මෙ**ති මය්හං සන්තිකා, මය්හං වචනතොති අත්ථො. **නිබොධථ** ජානාථ.

තත්ථ "අද්දසං ඛො අහං භික්ඛවෙ බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ"ති ආදිනා ආගතං බුද්ධචක්ඛු නාමාති දස්සෙන්තො ආහ (637) **ආසයානුසයෙ**ති ආදිං. තත්ථ **ආසයානුසයෙ**ති සත්තානං ආසයෙ ච අනුසයෙ ච. තස්මිං පවත්තන්ති අත්ථො.

---

1. M. — රූපානං 2. M. කතමෙහි නාමෙහීති.

තත්ථ ආගන්ත්වා සෙති චිත්තං එත්ථාති ආසයො, ව්‍යග්ඝාසයො විය. යථා හි ව්‍යග්ඝා ගොචරං සන්ධාය[1] පක්කන්තාපි පුන ආගන්ත්වා වනගහනෙ යෙව සයති, තෙනෙව[2] ච[2] තං තස්ස ආසයොති වුච්චති, එවං අඤ්ඤත්ථාපි පවත්තං චිත්තං ආගන්ත්වා යත්ථ සයති, තං තස්ස ආසයොති වෙදිතබ්බං. සො පන සස්සතදස්සනාදිවසෙන චතුබ්බිධො හොති. වුත්තං හෙතං:

සස්සතුච්ඡෙදදිට්ඨී ච ඛන්ති චෙවානුලොමිකා
යථාභූතං ච යං ඤාණං එතං ආසයසඤ්ඤිතං ති.

අනුසයකථා උපරි ආගමිස්සති. **ඉන්ද්‍රියානං පරොවරෙති** සද්ධාපඤ්චමකානං ඉන්ද්‍රියානං තික්ඛමුදුභාවෙ තික්ඛං හි ඉන්ද්‍රියං උක්කට්ඨගතත්තා පරං; මුදු ඔවරං[3], අවරත්තං[2] අනුක්කට්ඨත්තං ගතත්තා. ඉදං පන බුද්ධචක්ඛු ඡසු අසාධාරණඤාණෙසු පුරිමඤාණද්වයං ති දට්ඨබ්බං.

(638) **හෙට්ඨාමග්ගත්තයෙ ඤාණං ධම්මචක්ඛූති සඤ්ඤිතංති** "තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදී"ති එවං වුත්තං හෙට්ඨා තීසු මග්ගෙසු ඤාණං ධම්මචක්ඛූති සඤ්ඤිතං. **ඤාණං සබ්බඤ්ඤුතං පත්තා**ති සබ්බඤ්ඤුභාවසංඛාත - ඤාණං; තං හි සබ්බඤ්ඤුභාවො නාම හොති. **ඤෙය්‍යං සමන්තචක්ඛූති** ඛන්ධාදිවසෙන සමන්තතො සබ්බසො දස්සනට්ඨෙන සමන්තචක්ඛූති ඤෙය්‍යං. තෙනෙවාහ:

"න තස්ස අද්දිට්ඨ මිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ"ති

(639.) **යං චක්ඛුං උදපාදීති ආගතන්ති** යං ඤාණං "ඉදං දුක්ඛන්ති භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදී",ති එවං තත්ථ තත්ථ සුත්තෙසු ආගතං, චතූසු සච්චෙසු තෙපරිවට්ටවසෙන දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතන්ති එවමාදිනා ද්වාදසවිධෙන ආකාරෙන පවත්තං ඉදං ඤාණචක්ඛු.

යා පන "අද්දසං ඛො අහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙනා"ති ආදිනා ආගතා පඤ්චමජ්ඣානසඤ්ඤිතා[4] අභිඤ්ඤා-චිත්තසම්පයුත්තා පඤ්ඤා, අයං දිබ්බචක්ඛූති දස්සෙතුං **අභිඤ්ඤා-**

1. M. ගොචරත්ථාය. 2. M. පොත්ථකෙ නත්ථි. 3. M. අපරං.
4. M. පඤ්චමජ්ඣානසංඛාත.

**විභජ්ජා** ති ආදි වුත්තං. එත්ථ ච පඨම - තතියඤාණානි කාමාවචරානි යෙව. චතුත්ථම්පන පුරිමද්වයම්පි කාමාවචරං ති **ආනන්තරියෙන** වුත්තං ඤාණචක්ඛුනා සහ අරියමග්ග - විපස්සනාඤාණං ති පි යුජ්ජතීති අපරෙ. අග්ගමග්ගෙන සහ විපස්සනාපච්චවෙක්ඛණඤාණං ති පන යුත්තං විය දිස්සති.

එවං පඤ්ඤාචක්ඛුස්ස පභෙදං දස්සෙත්වා පුන මංසචක්ඛුස්සාපි පභෙදං දස්සෙතුං (640) **මංසචක්ඛුපී** ති ආදි වුත්තං **සසම්භාරපසාදතො** ති සසම්භාරචක්ඛු පසාදචක්ඛූ ති ඉමෙසං ද්වින්නං වසෙන. සම්භරීයන්ති එතෙහී ති සම්භාරා, අවයවා. තෙ පන උපත්ථම්භකභූතා චතුසමුට්ඨානික - රූපසන්තතියො දට්ඨබ්බා; සහ සම්භාරෙහීති සසම්භාරං. **සසම්භාරං ච නාම මංසපිණ්ඩො පවුච්චති** ති සම්බන්ධො. (641) **අක්ඛිකූපට්ඨිනා හෙට්ඨා** ති හෙට්ඨාගත අක්ඛිකූපස්ස අට්ඨිනා **පරිච්ඡින්නො** ති සම්බන්ධො. **උද්ධං** ති අක්ඛිකූපතො උද්ධං **උභතො අක්ඛිකොටියා** ති අක්ඛිකූපස්ස උභයභාගෙ අට්ඨිකොටීහි. **මත්ථලුංගෙන අන්තතො** ති අක්ඛිකූපස්සබ්භන්තරෙ ඨිතෙන මත්ථලුංගෙන. **නහාරුසුත්තකෙන ආබද්ධො** ති නහාරුරජ්ජූහි අන්තො මත්ථලුංගෙන සහ ආබද්ධො.

(643) **සකලො පි ච ලොකො** ති සකලොපි බාලපුථුජ්ජනලොකො. **යං** ති යං මංසපිණ්ඩං. **කමලස්ස දලං විය** ති පුථුල - සුවිමල[1] - නීලතාය නීලුප්පලදලං විය ති **ගණ්හාති**[2]. **චක්ඛු නාම න තං හොති** ති තථා ගය්හමානං තං චක්ඛු නාම න හොති. කිඤ්චරහි තං ති ආහ: **වත්ථු තස්සා** ති **වුච්චතී** ති. **තස්සා** ති තස්ස යථාධිප්පෙතස්ස පරමත්ථචක්ඛුතො. **ඉදං පනා** ති නිගමනං. තං පන සසම්භාරචක්ඛු යෙහි සම්භාරෙහි සම්භරීයති, තෙ සරූපතො ගණනතො ච දස්සෙතුං (645) **වණ්ණො ගන්ධො** ති ආදි වුත්තං. **භාවො** ති ඉත්ථියා ඉත්ථිභාවො, පුරිසස්ස පුරිසභාවොති[3] ලබ්භමානකභාවො. **සම්භවො** ති ආපොධාතු එව සම්භවභූතමාහ. **සණ්ඨානං** ති තෙන තෙනාකාරෙන සන්නිවිට්ඨෙසු මහාභූතෙසු තංතංසණ්ඨානවසෙන විඤ්ඤෙය්‍යමානං වණ්ණායතනමාහ ආපොධාතු - වණ්ණායතනෙහි ච අනත්ථන්තරභූතානම්පි සම්භවසණ්ඨානානං විසුං වචනං තථාභූතානං අභූතානං ච ආපාදීනං යථාවුත්තමංසපිණ්ඩෙ විජ්ජමානත්තා. ආපොධාතු - වණ්ණායතනානං හි සන්තානවසෙන පවත්තමානානං අවත්ථාවිසෙසො සම්භවො සණ්ඨානං චාති.

---

1. M. පුථුල විපුල. 2. M. ජානාතී ති ගණ්හාති. 3. M. පුම්භාවොති.

**දසෙතෙ** ති චත්තාරො ධාතුයො තංනිස්සිතා වණ්ණාදයොති ඉමෙ දස. **චතුසමුට්ඨානා** ති අනෙකන්තකහෙතුත්ත[1] මිදං නිදස්සනං, චතුසමුට්ඨානිකත්තා ති වුත්තං හොති. (648) **චක්ඛු කායප්පසාදෙ ච**=පෙ= **ජීවිතමෙව චා** ති ඉමානි එකන්තකම්මසමුට්ඨානානි, පුරිමානි ච චතුසමුට්ඨානානී ති **චත්තාළීසං ච චත්තාරි ච රූපානි භවන්ති**, චතුචත්තාළීස රූපානි හොන්තී ති අත්ථො. (649) **ඉමෙසං පන රූපානං වසෙනා** ති යථාවුත්තානං සංඛෙපතො චුද්දසන්නං විත්ථාරතො චතුචත්තාළීසානං ච රූපානං වසෙන. **පරිපිණ්ඩිතං** ති සමන්තතො පිණ්ඩිතං යත්ථ[2] සෙතම්පි[2] අත්ථි[2], කණ්හම්පි ලොහිතම්පි, පථවී පි ආපොපි තෙජොපි වායොපි ඉදං පන සෙම්හුස්සදත්තා සෙතං හොති, පිත්තුස්සදත්තා කණ්හං, රුහිරුස්සදත්තා ලොහිතකං, පථවුස්සදත්තා පත්ථිනං හොති, ආපුස්සදත්තා පග්ඝරති, තෙජුස්සදත්තා පරිඩය්හති වායුස්සදත්තා සම්භමති. [ඉදං සම්භාරවන්තතාය **සම්භාරචක්ඛූ** ති **පණ්ඩිතෙහි** බුද්ධාදීහි **පකාසිතං** පරිදීපිතං [2]

(650) **එත්ථ සිතො** ති එතං සසම්භාරචක්ඛුං නිස්සිතො තදායත්තභූතො.[3] තෙනාහ **එත්ථ පටිබද්ධො** ති. **චතුන්නං පන භූතානං පසාදො** ති චතුන්නං භූතානං පසන්නභාවො පසාදො. (652.) **සෙතෙන මණ්ඩලෙනස්සා** ති පාඨො යුජ්ජති. පොත්ථකෙසු පන **සෙතෙ තු මණ්ඩලෙ තස්සා** ති ලිඛන්ති. **කණ්හමණ්ඩලමජ්ඣෙ** ති ඉධාපි කණ්හමණ්ඩලස්ස මජ්ඣෙති වත්තබ්බෙ චතුත්ථද්වී ති ආදිසු විය ඡන්දානුරක්ඛණත්ථං විභත්තිලොපං කත්වා කණ්හමණ්ඩලමජ්ඣෙති වුත්තං. එවං හි අත්ථො ච යොජනා ච සුට්ඨු උපපන්නා හොන්ති. අට්ඨකථායම්පි හි "සෙතමණ්ඩලපරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ"ති වුත්තං. අපරෙ පන යථාඨිතවසෙනෙව පාඨං ගහෙත්වා සබ්බසො පරික්ඛිත්තස්ස තස්ස එතස්ස සසම්භාරචක්ඛුනො මජ්ඣෙ සෙතමණ්ඩලෙ කණ්හමණ්ඩලමජ්ඣෙ ති[4] යොජෙන්ති. **දිට්ඨිමණ්ඩලෙ** ති අභිමුඛෙ ඨිතානං සරීරසණ්ඨානුප්පත්තිදෙසභූතෙ දිට්ඨිමණ්ඩලෙ.

(653.) **සන්ධාරණ** =පෙ= **හුත්වානා** ති සන්ධාරණ-නහාපන-මණ්ඩන-බීජනකිච්චෙහි චතූහි ධාතීහි ඛත්තියකුමාරො විය සන්ධාරණ-බන්ධන-පරිපාචන-සමුදීරණ-කිච්චෙහි අත්තනිස්සයභූතෙහි චතූහි ධාතූහි කතුපකාරං හුත්වා. **උතුචිත්තාදිනා** ති තිසන්තතිරූපසමුට්ඨාපකෙහි උතුචිත්තාහාරෙහි. එත්ථ ච කලාපන්තරගතා උතුආහාරා අධිප්පෙතාති වදන්ති. (654) **ආයුනා**

1 M. අනන්තාගබ - 2. M. පොත්ථකෙ නත්ථි. 3 M. තදායත්තවුත්තො. 4. M. කණ්හමණ්ඩලමජ්ඣෙති.

**සතතපාලනං** ති චතුධාතුනිස්සිතෙනෙව ජීවිතින්ද්‍රියෙන රක්ඛියමානං. තථාහෙතං කම්මජරූපපරිපාලනලක්ඛණං. **වණ්ණගන්ධරසාදීහි** ති ආදිග්ගහණෙන ඔජං සංගණ්හාති. වණ්ණගන්ධරසොජාදීහී ති වා පාඨො. (655) **චක්ඛුද්වාරං ච සාධයං** ති යථායොගං චක්ඛුද්වාරභාවං සාධයමානං. චක්ඛුවිඤ්ඤාණස්ස හි නිස්සයභාවතො වත්ථුභාවං, පවත්තිමුඛභාවතො ද්වාරභාවං ච සාධෙති. සම්පටිච්ඡනාදීනං පන තදාලම්බණාවසානානං අඤ්ඤනිස්සිතත්තා ද්වාරභාවමෙව සාධෙති, න වත්ථුභාවං. **ඌකාසිරසමානෙන පමාණෙනා** ති ඌකාසිර සමානෙන පදෙසප්පමාණෙන ලක්ඛිතං හුත්වා; ඌකාසිරසමානප්පමාණෙ ඨානෙ වා ති අත්ථො. **පතිට්ඨිතං** ති[1] සත්ත අක්ඛිපටලානි ව්‍යාපෙත්වා සත්තසු පිචුපටලෙසු ආසිත්තතෙලං විය ඨිතං[2]. එවං ච කත්වා චක්ඛුස්ස අනෙකකලාපගතතා සිද්ධා හොති. සඋපද්දවානං පටලනිරාකරණෙපි හි චක්ඛු විජ්ජතෙ වාති. යථා ච චක්ඛු, එවමිමස්ස නිස්සයභූතා චතස්සො ධාතුයො ආයුවණ්ණාදීනි ච සත්ත අක්ඛිපටලානි ව්‍යාපෙත්වා ඨිතානෙව අවිනිබ්භොගවුත්තිතායාති ගහෙතබ්බං.

**වුත්තං** ති ධම්මසෙනාපතිනා වුත්තං (656) **රූපානි මනු පස්සතී** ති මකාරො පදසන්ධිකරො අඤ්ඤමඤ්ඤං සමණමචලොති ආදිසු විය. අථ වා **මනූ** ති මනුස්සො. මච්චොති අත්ථො. කිඤ්චාපි චක්ඛු රූපං න පස්සති; කිං චරහි තංනිස්සිතං විඤ්ඤාණමෙව. තථාහි "මඤ්චා උක්කුට්ඨිං කරොන්තී" ති ආදිසු විය නිස්සිතක්‍රියං නිස්සයෙ විය[3] කත්වා වොහාරසම්භවතො චක්ඛුප්පසාදෙන පස්සතීති වුත්තං. **ආචරියජොතිපාලත්ථෙරෙනාපි** ඉමිනාව අධිප්පායෙන ඉදං වුත්තං. ඉදමෙත්ථ සන්නිට්ඨානං[4] කිං චක්ඛු රූපං පස්සති, උදාහු විඤ්ඤාණං ති? කිඤ්චෙත්ථ යදි චක්ඛු පස්සෙය්‍ය, අඤ්ඤවිඤ්ඤාණසමංගිනො පි චක්ඛු පස්සෙය්‍ය; අථ විඤ්ඤාණං, කුඩ්ඩාදිඅන්තරිතම්පි පස්සෙය්‍ය. තස්ස අප්පටිඝාතත්තා. නායං දොසො; යස්ස චක්ඛු පස්සතීති මතං, තස්සාපි න සබ්බං චක්ඛු පස්සති; අථ ඛො විඤ්ඤාණාධිට්ඨිතමෙව. යස්ස පන විඤ්ඤාණං පස්සතීති මතං, තස්සා පි න සබ්බං විඤ්ඤාණං පස්සති, අථ ඛො චක්ඛුනිස්සිතමෙව; තං ච අන්තරිතෙ නුප්පජ්ජති, යත්ථ ආලොකස්ස කුඩ්ඩාදීහි විබන්ධො; යත්ථ පන සො නත්ථි ඵලිකම්මියපටලාදිම්හි[5], තත්ථ අන්තරිතෙ පි උප්පජ්ජති එව. තස්මා තං අනුප්පජ්ජනත්තා අන්තරිතං න පස්සති. ඉදමෙව සන්නිට්ඨානං. යං ඛො චක්ඛුවිඤ්ඤාණං පස්සතීති; තං හි දස්සන

1. M. තිට්ඨී ති. 2 M. තිට්ඨති. 3. M. පොත්ථකෙ නත්ථි.
4. B. සන්නිට්ඨාතබ්බං. 5. M. ඵලිකබ්භපටලාදිම්හි.

කිච්චං, යදි එවං කථං "චක්ඛුනා රූපං දිස්වා"ති? තෙන ද්වාරෙන කරණභූතෙනාති අයමෙත්ථ අභිසන්ධි. අථ වා නිස්සිත ක්‍රියා නිස්සයස්ස වුච්චති, යථා "මඤ්චා උක්කුට්ඨිං කරොන්ති"ති

**ඌකාසිරසමූපමන්**ති ඌකාසිරසමානූපමං, ඌකාසිරප්පමාණන්ති වුත්තං හොති. ඉදං චස්ස පතිට්ඨානොකාසවසෙන වුත්තං, න පන අත්තනො පමාණවසෙන. තං හි පරමාණුපරියන්තෙන පමාණෙන අතිසුඛුමමෙවාති. ඌකාසිරප්පමාණෙ පන පදෙසෙ ඉදං පවත්තති. න කෙවලං ච ඉදමෙව, සබ්බානි පි සබ්බට්ඨානිකරූපානි තත්ථ පවත්තන්තෙව. ඉදං ච තත්ථ නිබ්බත්තන්තං තං පදෙසං පූරෙත්වා එව නිබ්බත්තති. එකූනපණ්ණාසකලාපවසෙන ච සහෙව පවත්තති. සත්තරසචිත්තක්ඛණායුකත්තා රූපානං, එකෙකස්ස ච චිත්තස්ස තීසු තීසු ඛණෙසු කම්මජරූපානං උප්පජ්ජමානත්තා.

66. **සුණාතීති සොතන්**ති එත්ථ කිං සොතං සුණාති, උදාහු විඤ්ඤාණන්ති ආදිනා හෙට්ඨා වුත්තනයෙන යථාසම්භවං යොජෙතබ්බං. **තනුතම්බලොමාචිතෙ**ති සසම්භාරසොතබිලස්ස අන්තො සුඛුමෙහි තම්බවණ්ණලොමෙහි සඤ්චිතෙ. **අංගුලිවෙඨකසණ්ඨානෙ**ති අංගුලිමුද්දිකාසණ්ඨාන – මංසයුත්තෙ පදෙසෙ. **වුත්තප්පකාරාහී**ති සන්ධාරණාදිකිච්චාහි. **ආයුනා පරිපාලියමානන්**ති එත්ථ වණ්ණාදීහි පරිවාරිතන්ති සම්බන්ධිතබ්බං. **තිට්ඨතී**ති පුබ්බෙ වුත්තනයෙන තං පදෙසං පූරෙත්වා තිට්ඨති. සෙසං වුත්තනයෙන වෙදිතබ්බං.

**ඝායතී**ති ගන්ධොපාදානං කරොති. **සායතී**ති රසං වින්දති. **ජීවිතමව්හයතී**ති එත්ථ රසග්ගහණමූලකත්තා අජ්ඣොහරණස්ස ජීවිතනිමිත්තං අජ්ඣොහරණරසං ජීවිතං, තං අව්හයතීති තස්මිං නින්නතාය තං අව්හයන්තමිව හොති. **උප්පලදලග්ගසණ්ඨානෙ**ති මජ්ඣෙ ජිව්හාස්ස උප්පලදලස්ස අග්ගභාගසණ්ඨානෙ පදෙසෙ. **මලානන්**ති කිලෙසාදිමලානං චෙව මලවිසයානං ච සාසවධම්මානං. අනුත්තරියභාවං අගච්ඡන්තෙසු කාමරාගනිදානකම්මජනිතෙසු, කාමරාගස්ස ච විසෙසපච්චයෙසු ඝාන-ජිව්හා-කායෙසු. කායස්ස විසෙසතො සාසවපච්චයත්තා සො යෙව තෙසං ආයොති වුච්චති.[1] තෙන හි ඵොට්ඨබ්බසුඛං අස්සාදෙන්තා සත්තා මෙථුනම්පි සෙවන්ති. අථ වා කායින්ද්‍රියවත්ථුකා චත්තාරො ඛන්ධා බලවකාමරාගාදිහෙතුභාවතො විසෙසතො මලා; තෙසමයං ආයො හෙතූති කායොති වුත්තො. **ඉමස්මිං කායෙ**ති ඉමස්මිං සසම්භාරකායෙ. සොපි හි කුච්ඡිතානං කෙසලොමාදිමලානං ආය

1. M. පොත්ථකෙ නත්ථි.

භාවතො කායොති වුච්චති. **යාවතා උපාදින්නං අත්ථි**ති ඉමිනා කෙසග්ග-නඛග්ගාදිසු කායප්පසාදස්ස අභාවමාහ. **කප්පාස-පටලස්නෙහො විය**ාති ඉමිනා තස්ස නිරන්තරභාවං.

**67**. ඉමෙ ච පන චක්ඛාදයො රූපාදිගොචරනින්නතාය වම්මික - උදක - ආකාස - ගාම - සීවථිකාසංඛාත - ගොචරනින්න අහි - සුංසුමාර - පක්ඛි - කුක්කුර - සිගාලා විය දට්ඨබ්බා. විසමජ්ඣාසයතාය හි චක්ඛු වම්මිකජ්ඣාභිරතසප්පො විය; බිලජ්ඣාසයතාය සොතං උදකබිලාභිරතසුංසුමාරො විය; ආකාසජ්ඣාසයතාය ඝානං අජටාකාසාභිරතපක්ඛි විය; ගාමජ්ඣාසයතාය ජිව්හා ගාමාභිරතකුක්කුරො විය; උපාදින්නකජ්ඣාසයතාය කායො ආමකසුසානාභිරතසිගාලො වියාති. විසමජ්ඣාසයතායාති[1] චක්ඛුස්ස විසමජ්ඣාසයං විය හොතීති කත්වා වුත්තං, චක්ඛුමතො වා පුග්ගලස්ස අජ්ඣාසයවසෙන චක්ඛු විසමජ්ඣාසයං. එස නයො සෙසෙසුපි.

**දට්ඨුකාමතා =පෙ= ලක්ඛණ**න්ති එත්ථ දට්ඨුං කාමෙතීති දට්ඨුකාමො; තස්ස භාවො දට්ඨුකාමතා. රූපතණ්හායෙතං අධිවචනං. සා පන අනාගතෙ චක්ඛාදිසු ආදීනවපටිච්ඡාදිකාවිජ්ජාමූල-පත්ථනාසභාවා පාකටා අපාකටාති දුවිධා. තත්ථ යා අයං "ඊදිසං ච සුඛුමං ඊදිසං ච සම්විසමං ගහණසමත්ථං[2] චක්ඛු හොතූ"ති එවං කම්මායූහනතො පුබ්බෙ පච්ඡා වා උප්පන්නා පාකටා; ඉන්ද්‍රියවිසෙසමපන අනාමසිත්වා අවිසෙසෙන පරි-පුණ්ණායතන - භවසම්පත්තිං පත්ථෙත්වා අපත්ථෙත්වා වා තත්ථ අවිගතතණ්හාවසෙන කම්මං කරොන්තස්ස අප්පහීනභාවෙන අනුසයිතා අපි කම්මසාමත්ථියවිචිත්තතාහෙතුභූතා අපාකටා. සා දුවිධාපි නිදානං උපනිස්සයො යස්ස, තං දට්ඨුකාමතානිදානං, තදෙව කම්මං, තං සමුට්ඨානමෙතෙසන්ති දට්ඨුකාමතානිදානකම්ම-සමුට්ඨානානි, එවංවිධානං භූතානං පසාදෙ දට්ඨුකාමතා =පෙ= පසාදො; තං ලක්ඛණමස්ස, තථා හුත්වා ලක්ඛීයතීති වා **දට්ඨුකාමතානිදානකම්මසමුට්ඨාන-භූතප්පසාදලක්ඛණං.**

තත්ථ[3] ගබ්භසෙය්‍යකානං දින්නපටිසන්ධිකං අඤ්ඤංවා කම්මං චක්ඛාදීනි නිබ්බත්තෙති, ඔපපාතිකානං පන පටිසන්ධික්ඛණෙයෙව පරිපුණ්ණායතනානං නිබ්බත්තමානානං පටිසන්ධිජනකමෙව කම්මං පරිපුණ්ණායතනානං[4] සකලමත්තභාවං නිබ්බත්තෙතීති

---

1. M. විසමජ්ඣාසයතා ච 2. M. ඊදිසං ඊදිසං ච සුඛුමතමවිසයගහණසමත්ථං. 3. M එත්ථ ච. 4. M. පරිපුණ්ණ.

ගහෙතබ්බං කථම්පන එකකම්මුනා නිබ්බත්තමානානං චක්ඛාදීනං විසෙසොති? කාරණස්ස භින්නත්තා. තංතංභවපත්ථනාභූතා හි තණ්හා තංතංභවපරියාපන්නායතනාභිලාසතාය සයං විචිත්තරූපා උපනිස්සයභාවෙන තංතංභවනිබ්බත්තකකම්මස්ස පි විචිත්තභෙදතං විදහති. යතො තදභිහිතවිසෙසං ච තං තථා විධසමත්ථතායොගෙන අනෙකරූපාපන්නං විය අනෙකවිසිට්ඨසභාවං ඵලං නිබ්බත්තෙතීති. න චෙත්ථ සමත්ථාසමත්ථසභාවතො අඤ්ඤ[1] වෙදිතබ්බො.[1] කාරණවිසෙසෙන ආහිත-විසෙසස්ස විසිට්ඨඵලනිබ්බත්තනසමත්ථභාවතො[2] එකස්සෙව කම්මස්ස සොළසාදි-විපාකනිබ්බත්තන-හෙතුභාවෙන ච අයමත්ථො සම්පටිච්ඡිතබ්බො. ලොකෙ පි ච එකස්සෙව සාලිබීජස්ස පරිපුණ්ණාපරිපුණ්ණතණ්ඩුලඵල-නිබ්බත්තිහෙතුතා දිස්සතෙව. කිං වා එතාය යුත්තිචින්තාය? යතො කම්මඵලං චක්ඛාදීනි විපාකානි ච[3] සබ්බසො බුද්ධානං යෙව ඤාණස්ස විසයො, න අඤ්ඤෙසං, අතක්කාවචරත්තා. තෙනෙව ච භගවතා "කම්මවිපාකො අචින්තියො, න චින්තෙතබ්බො, යො චින්තෙය්‍ය උම්මාදස්ස විඝාතස්ස භාගී අස්සා"ති ආදීනවං දස්සෙත්වා පටික්ඛිත්තං

**රූපෙසු ආවිඤ්ජනරසං** ති ආවිඤ්ජනං පුග්ගලස්ස ආවජ්ජනාදි-විඤ්ඤාණස්ස වා තන්නින්නභාවප්පත්තියා හෙතුභාවො. **ආධාරභාවපච්චුපට්ඨානං** ති නිස්සයපච්චයභාවතො ආලොකාදි-නිස්සයෙන කදාචි උප්පජ්ජමානම්පි හි චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජනකාලෙ චක්ඛුං නිස්සාය එව උප්පජ්ජතී ති එත්ථාහ: චක්ඛුවිඤ්ඤාණුප්පත්තිසමයෙ සම්භවන්තෙසු මන්දමන්දමජ්ඣිමායුකෙසු එකූනපඤ්ඤාස-චක්ඛූසු කතමං චක්ඛුවිඤ්ඤාණස්ස ආධාරභාවං පච්චනුභොතීති? වුච්චතෙ: "පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණෙ උප්පන්නං ඨානප්පත්තං පුරෙජාතං වත්ථුං නිස්සාය දුතියභවඞ්ගං උප්පජ්ජති; තෙන සද්ධිං උප්පන්නං ඨානප්පත්තං පුරෙජාතං වත්ථුං නිස්සාය තතියභවඞ්ගං උප්පජ්ජති; ඉමිනා නයෙන යාවතායුකං චිත්තප්පවත්ති වෙදිතබ්බා"ති මග්ගාමග්ගඤාණදස්සනනිද්දෙසෙ වුත්තනයෙන එකචිත්තක්ඛණාතීතං චක්ඛු රූපෙ ඝට්ටිත්වා විඤ්ඤාණස්ස නිස්සයො හොති. තස්මා ද්වීසු භවඞ්ගචලනෙසු පුරිමස්ස අනන්තරපච්චයභූතෙන භවඞ්ගචිත්තෙන සහ උප්පන්නන්ති අයමත්ථො ඉධ සීහළසංවණ්ණනාය, **විසුද්ධිමග්ගස්ස** සීහළසංවණ්ණනායං ච වුත්තො. **තලාකගාමමූලවාසී දාඨානාගත්ථෙරෙන** පන "ආවජ්ජනෙන, තස්ස අනන්තරපච්චයභූතෙන භවඞ්ගෙන

1. M. අඤ්ඤ වෙදිතබ්බා. 2. M. විසිට්ඨඵලනිප්ඵාදන -. 3. M. කම්මවිපාකො ච

වා සහ උප්පන්නං චක්ඛුං''ති වුත්තං. තං දුවුත්තං. එවං සති අඤ්ඤස්මිං ඝට්ටිතෙ අඤ්ඤං චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සයො හොතී ති වුත්තං හොති. එවං ච භවංගචලනතො හෙට්ඨා තතියචතුත්ථෙහි යාව තෙරසම්චිත්තෙන සහ උප්පන්නම්පි නිස්සයො හොතී ති ආපජ්ජෙය්‍ය. තමෙවං[1] වත්තබ්බං: තතිය-චතුත්ථචිත්තතො පට්ඨාය උප්පන්නං කෙසංචි වීථිචිත්තානං ද්වාරභාවං න ගච්ඡති, නිරුද්ධත්තා; මනොද්වාරස්ස නිරුද්ධස්සෙව ද්වාරභාවදස්සනතො[2]. යදි සියා, ''පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණෙ උප්පන්නං වත්ථුං නිස්සාය දුතියභවංගං උප්පජ්ජතී''ති ආදි-වචනතො එකචිත්තක්ඛණාතීතමෙව නිස්සයොති අධිප්පෙතන්ති, ඉදම්පි එකචිත්තක්ඛණාතීතං නිස්සයොති යුජ්ජතී ති. එවං සති ''තස්ස අනන්තරපච්චයභූතෙන භවංගෙන වා''ති වචනං යුජ්ජෙය්‍ය[3]. තෙන හි චිත්තක්ඛණද්වයාතීතම්පි නිස්සයොති පටිඤ්ඤාතං සියා. තස්මා නායං ථෙරස්ස අධිප්පායොති දිස්සති. එකචිත්තක්ඛණාතික්කමොතිච අනතීතෙකචිත්තක්ඛණස්ස දුබ්බල-තාය එකචිත්තක්ඛණාතික්කමෙන තස්ස බලවතාදීපනත්ථං ච වුච්චති, න පන ද්වත්තිචතුචිත්තක්ඛණාතීතානං[4] නිස්සයභාවා-භාවතො. එවං ච කත්වා වුත්තං **ආචරියධම්මපාලත්ථෙරෙන**: ''සම්පටිච්ඡනාදීනි චුතිආසන්නානි තදුද්ධං කම්මජරූපස්ස අනුප්පත්තිතො එකස්මිං යෙව හදයවත්ථුස්මිං වත්තන්තී'ති. තස්මා තං ථෙරස්ස මනොරථමෙවාති න සාරතො පච්චෙතබ්බං.

සහජාතෙසු බහූසු පසාදෙසු කිං එකො නිස්සයො හොති, උදාහු සබ්බෙ යෙවාති? නනු වුත්තං පුබ්බෙ ''එකම්පි චක්ඛු, විඤ්ඤාණස්ස පච්චයො හොතී''ති. කතමං පන තන්ති? යං තත්ථ විසදං හුත්වා රූපාභිඝාතාරහං[5]. **විසුද්ධිමග්ග සීහළසංවණ්ණනායං** පන සබ්බෙ යෙව නිස්සයා හොන්තීති වත්වා යදි එවං ''චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං''ති එත්ථ රූපෙ චාති වචනං විය චක්ඛූනීතිපි බහුවචනං වත්තබ්බන්ති අනුයොගං කත්වා තං විසොධනත්ථං ''සසම්භාරචක්ඛුද්වයනිස්සිතං පසාදද්වයං නිස්සාය එකමෙව විඤ්ඤාණං උප්පජ්ජතීති ගණ්හෙය්‍යුන්ති ඉමං විප්පටිපත්තිං නිරාකරොන්තෙන භගවතා බහුවචනමකත්වා ''රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මා-නං ආලම්බණපච්චයෙන පච්චයො''ති ආදිසු විය සාමඤ්ඤවසෙන එකවචනං කතං''ති වුත්තං. **ආචරියධම්මපාලත්ථෙරෙන** පන තදෙව සීහළසංවණ්ණනාය වචනං අනිච්ඡන්තෙන ''එකම්පි චක්ඛු

1. M. න මෙතං. 2. M. ද්වාරභාවස්ස දස්සනතො. 3. M. න යුජ්ජෙය්‍ය. 4. M. ද්වතිචතු - 5 M. රූපාභිඝට්ටනාරහං.

විඤ්ඤාණස්ස පච්චයො හොති, රූපං පන අනෙකමෙව පච්චයභාවවිසෙසතොති වුත්තං. තථා චෙව **අම්හෙහි පි හෙට්ඨා** විභාවිතං ති. යෙසං භූතානං අයං පසාදො, තෙ යෙව ඉමස්ස ආසන්නකාරණන්ති වුත්තං: **දට්ඨුකාමතා = පෙ = පදට්ඨානං ති.**

සොතප්පසාදාදීනම්පි ලක්ඛණාදිනිද්දෙසෙසු වුත්තනයානුසාරෙන අත්ථො යොජෙතබ්බො. **කෙචී** ති මහාසංඝිකෙසු එකච්චෙ. (658.) චක්ඛාදීසු තෙජාදිඅධිකතාමත්තං[1] තංනිස්සයභූතානං තදධිකතායාති දස්සෙන්තො **තෙජාධිකානං** ති ආදිමාහ. තත්ථ **තෙජාධිකානං** ති පමාණවසෙන චතුන්නං ධාතූනං සමභාවෙපි කිච්චවසෙන තෙජොධාත්වාධිකානං. එවං සෙසෙසුපි. **ආකාසානිල** =පෙ= **සෙසකා** ති ආකාසාධිකානං භූතානං පසාදො සොතං; වායුඅධිකානං ඝානං; තොයාධිකානං ජිව්හා; ඛිතිසංඛාත පඨවාධිකානං කායොති අත්ථො. එවමෙතෙ වදන්තානං කිං උත්තරං ති ආහ (659.) **තෙ පනෙවං** ති ආදිං. **සුත්තං ආහරථා** ති න තුම්හාකං වචනමත්තෙනෙව අයමත්ථො සක්කා සද්ධාතුං, තස්ස පන පරිදීපකං සුත්තං ආහරථ, සුත්තෙන හි ආහටෙ තස්ස නෙය්‍යත්ථතං නීතත්ථතං ච විචාරෙත්වා යදි තස්ස වසෙන අයමත්ථො පඤ්ඤායෙථ, ගණ්හෙය්‍යාම තන්ති අධිප්පායො. **සුත්තමෙව** =**පෙ**= **න කිඤ්චිපී** ති ඉතො චිතො ච සුත්තං ගවෙසමානා පි **අද්ධා** එකන්තෙන කිඤ්චිපි එකගාථාපදමත්තම්පි තදත්ථපරිදීපකං සුත්තං න දක්ඛිස්සන්තෙව. තිපිටකබුද්ධවචනෙ[2] තාදිසස්සෙව සුත්තන්තස්ස අභාවතො. කිඤ්චාපි සුත්තවසෙන අයමත්ථො න දිස්සති යුත්තිතො පන දිස්සතී ති චෙ, තම්පි නත්ථී ති දස්සෙන්තො ආහ (660.) **විසෙසෙ සතී** ති ආදිං. **භූතානං හි විසෙසෙ සති පසාදො කථං භවෙ?** නෙව භවෙය්‍ය; කිං කාරණන්ති ආහ: **සමානානං හි භූතානං පසාදො පරිදීපිතො** ති යස්මා සමානානමෙව භූතානං පසාදො පොරාණෙහි සමුදීරිතො, න විසමානං, පඨවීධාතු අධිකකලාපස්ස කක්ඛළත්තා, ආපොධාතු අධිකකලාපස්ස විස්සන්දනතො, තෙජොධාතුඅධිකකලාපස්ස පරිඩය්හමානතො,[3] වායොධාතුඅධිකකලාපස්ස ච විකිරණතො[4] න තෙසු පසාදෙ පතිට්ඨාතුං සක්කොන්ති, තස්මා තෙසං කිච්චතො සමානානං යෙව පසාදෙ උප්පජ්ජෙය්‍ය, නො විසමානං ති. යදි එවං කථං පසාදනං විසිට්ඨතාති[5] ආහ **තස්මා** ති ආදිං.

---

1 M තෙජාධිකතා නාම. 2 M තෙපිටකෙ බුද්ධවචනෙ. 3. M. පරිඩය්හමානත්තා 4. M විසරණතො 5. M. විසෙසතා

(661.) යස්මා වුත්තප්පකාරෙන පසාදවත්ථුකානං භූතානං විසෙසෙන න භවිතබ්බං, තස්මා එතෙසං **පසාදනිස්සයභූතානං** භූතානං[1] ඉදං ඌනං ඉදමධිකන්ති එතං **විසෙසපරිකප්පනං සබ්බසො** සබ්බාකාරෙන **පහාය** (662.) **යස්මා කම්මවිසෙසො පසාදානං විසෙසතා** යථා අවිසෙසෙ පි භූතානං රූපරසාදයො[2] අඤ්ඤමඤ්ඤං විසදිසා හොන්ති, එවං චක්ඛාදයො භූතවිසෙසාභාවෙ පි[3] අඤ්ඤමඤ්ඤං විසදිසා හොන්ති. සො පන විසෙසභාවො[4] කම්මවසෙන විඤ්ඤාතබ්බො. එකම්පි හි කම්මං පඤ්චායතනිකත්ත-භාවපත්ථනානිප්ඵන්නං චක්ඛාදීනං[5] විසෙසහෙතුතාය අඤ්ඤ-මඤ්ඤස්ස අසාධාරණං විසිට්ඨං සාමත්ථියවිසෙසතො න හි යෙන විසෙසෙන චක්ඛුස්ස පච්චයො, තෙනෙව සොතස්ස හොති, ඉන්ද්‍රියන්තරභාවප්පත්තිතො.

"පටිසන්ධික්ඛණෙ මහග්ගතචෙතනා කටත්තාරූපානං කම්මපච්චයෙන පච්චයො"ති වචනතො **පටිසන්ධික්ඛණෙ** විජ්ජමානානං සබ්බෙසං යෙව කටත්තාරූපානං එකා චෙතනා කම්මප්පච්චයො හොතීති විඤ්ඤායති. නානාචෙතනාහි[6] ඉන්ද්‍රියුප්පත්තියං සති පරිත්තෙන ච මහග්ගතෙන ච කම්මෙන නිබ්බත්තං[7] තං[7] පවත්තිරූපං[8] ආපජ්ජෙය්‍ය, න චෙකා පටිසන්ධි අනෙකකම්මනිබ්බත්තා හොතීති සිද්ධමෙකෙන කම්මෙන අනෙකින්ද්‍රියුප්පත්ති හොතීති. **න හි භූතවිසෙසෙන හොති එතෙසං විසෙසතාති ඉදං** නිගමනවසෙන වුත්තං

(663) එවං කම්මවිසෙසතො විසිට්ඨෙසු ච එතෙසු **ආරම්මණගහණෙ** අයං විසෙසොති දස්සෙතුං **එවමෙතෙසූ**ති ආදි වුත්තං. **අප්පත්තගාහකන්ති** අසම්පත්තගාහකං. අත්තතො හි නිස්සයෙන සහ අනල්ලීනනිස්සයෙ එව රූපාදිවිසයෙ විඤ්ඤාණුප්පත්තිහෙතුභාවතො. කෙචි පන තම්පි සම්පත්තගාහකමෙවාති වදන්ති. තං අසුන්දරං, සාන්තරෙ අධිකෙ ච විසයෙ විඤ්ඤාණුප්පත්තිහෙතුභාවතො. යදි හි චක්ඛුසොතානි සම්පත්ත-විසයමෙව ගණ්හන්ති, චක්ඛුප්පසාදතො විච්ඡින්නදෙසෙ ඨිතෙසු තාරකාදිසු නිස්සයවසෙන ච, පමාණතො අධිකෙසු චන්දමණ්ඩලාදිසු රූපායතනෙසු, සොතප්පසාදතො ච විච්ඡින්නදෙසසම්භූතෙසු උදරචම්ම - සඞ්ඛචම්මාදිඅන්තරිතෙසු කුච්ඡිසද්ද - සඞ්ඛසද්දාදිසු, පුප්ඵලෙසු සමුද්දසද්දාදිසු සද්දායතනෙසු විඤ්ඤාණුප්පත්ති න සියා;

---

1 M. පොත්ථකෙ නත්ථි 2. M රූපානං රසාදයො 3 M. භූතවිසෙසා—භාවෙපි 4. M පනායං විසිට්ඨභාවො 5 M. චක්ඛාදි 6. M නානාචෙතනාය හි තද 7. M. පොත්ථකෙ නත්ථි 8. M කටත්තාරූපං

සම්පත්තගාහකානං කායින්ද්‍රියාදීනං තථා අදස්සනතො.[1] එත්ථ චෙ වදෙය්‍ය; අධිට්ඨානතො බහි ඉන්ද්‍රියස්ස පවත්ති හොතීති තං සම්පත්තවිසයමෙවාති, යත්තකං විසයං තත්තකං විසයගහණාකාරං ඵරිත්වාව තං[2] ගණ්හාති, තස්මා අසිද්ධමෙතං. සාන්තරෙ අධිකෙ ච විසයෙ විඤ්ඤාණුප්පත්තිහෙතුභාවතොති. තං න, අධිට්ඨානතො බහි ඉන්ද්‍රියුප්පත්තියා එව අභාවා. අධිට්ඨානදෙසෙ එව හි ඉන්ද්‍රියං පවත්තති. තත්ථ කිච්චාදිප්පයොග - දස්සනතො. සති ච එතස්ස බහිප්පවත්තියං අධිට්ඨානෙ පිහිතෙ පි විසයගහණං සියා; තස්මා අධිට්ඨානදෙසෙ ඨිතානං යෙව චක්ඛුසොතානං අසම්පත්තවිසයස්සෙව ගහණතො න අසිද්ධමෙතං "සාන්තරෙ අධිකෙ ච විඤ්ඤාණුප්පත්තිහෙතුභාවතො"ති. තෙනාහු පොරාණා:

"සබ්බගොචරයොගෙ පි දිට්ඨං රූපරවෙසු යං
විච්ඡින්නාපුථුවිඤ්ඤාණං[3] සම්පත්තග්ගාහබාධකං"ති.

තස්සත්ථො; සබ්බෙසං චක්ඛාදීනං ගොචරෙන රූපාදිනා **යොගෙ** එකකාරියසාධකත්තා පබන්ධඝට්ටනෙ[4] වා සමානෙ සති **රූපරවෙසු** රූපසද්දායතනෙසු විසයභූතෙසු, චක්ඛාදිතො දූරභාවෙන චෙව කෙනචි අන්තරිතභාවෙන[5] ච විච්ඡින්නෙසු, පමාණතො පුථුලෙසු ච විසයෙසු උප්පජ්ජමානං යං විඤ්ඤාණං, තං චක්ඛුසොතානං සම්පත්තගාහස්ස සම්පත්තගහණස්ස බාධකන්ති.

අපි ච යදි චක්ඛු සම්පත්තගාහකං සියා, අත්තනො මණ්ඩලෙ ඨිතං වණ්ණම්පි පස්සෙය්‍ය, තථා අක්ඛිපුටෙ අඤ්ජනං, පඛුමමූලෙ[7] සංසියමානං[8] අඤ්ජනසලාකං පි පස්සෙය්‍ය, න ච පනෙතං දිස්සති, තස්මා තංනිස්සයෙ දෙසෙ ඨිතමෙව විසයං ගණ්හාති. සොතායතනම්පි යදි සම්පත්තගාහකං අභවිස්ස, චිත්තසමුට්ඨානං සද්දායතනං සොතවිඤ්ඤාණස්ස කදාචි පි ආරම්මණපච්චයො න සියා. න හි බහිද්ධා චිත්තසමුට්ඨානානං උප්පත්ති අත්ථි. පට්ඨානෙ ච "සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා ආරම්මණපච්චයෙන පච්චයො"ති අවිසෙසෙනෙව සද්දස්ස සොතවිඤ්ඤාණාරම්මණභාවො වුත්තො. කිඤ්ච, යදි සොතං සම්පත්තගාහකං සියා අත්තනො විසයප්පදෙසෙ යෙව ගහෙතබ්බතො ගන්ධස්ස විය සද්දස්සා පි දිසාදෙසවවත්ථානං න සියා. එවං ච සද්දානුසාරෙන කණ්ඩං පාතෙන්තස්ස සද්දවෙධිනො අත්තනො[9] කණ්ණබිලෙ

1 M. දස්සනතො 2 M පොත්ථකෙ නත්ථි 3. M. විච්ඡින්ද —. 4. M. සම්බන්ධ ඝට්ටනෙ 5. M. අන්තන්තරිතභාවෙන 7. M. පඛුමමූලං අක්ඛිවණ්ණං, පඛුමමූලෙ 8 M. ඝට්ටියමානං 9. . පොත්ථකෙ නත්ථි.

සෙව සරපාතනං සියා. තස්මා යත්ථ උප්පන්නො සද්දො, තත්ථෙව ඨිතො සොතපථෙ ආපාථමාගච්ඡති. යදි එවං කථං දූරෙ ඨිතෙහි රජකාදිසද්දා චිරෙන සූයන්ති, අසම්පත්තගාහකත්තෙන හි දූරාසන්නදෙසවත්තීනං සමකමෙව සවණෙන භවිතබ්බන්ති? නයිදමෙවං; දූරාසන්නානං යථාපාකටෙ සද්දෙ ගහණවිසෙසතො. යථා හි දූරාසන්නානං වචනසද්දෙ යථාපාකටෙව ගහණවිසෙසතො අක්ඛරවිසෙසානං ගහණං අගහණං ච හොති, එවං රජකාදිසද්දෙ පි ආසන්නස්ස ආදිතො පභුති යාව අවසානා කමෙන පාකටීභූතෙ, දූරස්ස ච අවසානෙ මජ්ඣෙ වා පිණ්ඩවසෙන යංකිඤ්චි[1] පාකටීභූතෙ යථාපාකටං නිච්ඡයගාහකානං සොතවිඤ්ඤාණවීථියා පරතො පවත්තානං මනොද්වාරිකජවනානං ගහණවිසෙසතො "ලහුකං සුතො, චිරෙන සුතො"ති අභිමානො හොති. සොතවිඤ්ඤාණුප්පවත්ති පන උභයත්ථ සමානා, සද්දස්ස උප්පන්නදෙසෙ ඨිතස්ස අත්තනො විජ්ජමානක්ඛණෙ යෙව සොතාපාථගමනතො. යදි සද්දස්ස භූතපරම්පරාය සමන්තතො පවත්ති නත්ථි, කථං පටිඝොසුප්පත්තී ති? දූරෙ ඨිතොපි සද්දො, අඤ්ඤත්ථ පටිඝොසුප්පත්තියා භාජනාදිචලනස්ස ච පච්චයො හොති, අයොකන්තො විය අයොචලනස්සාති දට්ඨබ්බං.

**සෙසං තු පන** =පෙ= **ගාහකා**ති යං පන අවසෙසං ඝාන-ජිව්හා-කායසංඛාතං පසාදත්තයං, තං සම්පත්තගාහකං හොති, නිස්සයවසෙන චෙව සයං ච ඝාණාදිනිස්සයෙ[2] අල්ලීනෙ යෙව විසයෙ විඤ්ඤාණුප්පත්තිහෙතුභාවතො. ගන්ධරසානං නිස්සයෙසු ඝාණජිව්හානං නිස්සයෙහි සහ අල්ලීනෙසු[3] යෙව ගන්ධරසා විඤ්ඤායන්ති. ඵොට්ඨබ්බං ච භූතත්තයරූපං[4] කායනිස්සයෙ අල්ලීනමෙව විඤ්ඤායතීති.

**වණ්ණවිකාරං ආපජ්ජමානං** ති දෙසාදිකාරණෙහි අපරාපරවණ්ණස්ස උප්පත්තිවසෙන වණ්ණවිකාරං ආපජ්ජමානං. **හදයංගතභාවං** ති චිත්තගතං අජ්ඣාසයං. **පකාසෙති** ති රූපමිව පකාසං කරොති, සවිග්ගහමිව දස්සෙතී ති අත්ථො. අනෙකත්ථත්තා හි ධාතූනං පකාසනත්ථො එස[5] රූපසද්දො දට්ඨබ්බො. **තං පන රූපං** ති සම්බන්ධො. චක්ඛුම්හි චක්ඛුස්ස වා පටිහනනං ලක්ඛණමෙතස්සාති **චක්ඛුපටිහනනලක්ඛණං**. එවං සොතපටිහනනලක්ඛණං ති ආදිසුපි. පටිහනනං චෙත්ථ විසයවිසයීනං අඤ්ඤමඤ්ඤාභිමුඛභාවො යොග්‍යදෙසාවට්ඨානං පටිඝාතො වියාති

1. M. පවත්ති. 2 M. අත්තනො නිස්සයෙ. 3. M. අල්ලීනා. 4. M. භූතත්තය. රූපකායනිස්සයෙන 5. M. එව.

කත්වා. යථා පටිඝාතෙ සති දුබ්බලස්ස චලනං හොති, එවං විසයාභිමුඛභාවෙ සති විසයිනො තංසම්බන්ධස්ස ච වත්ථුරූපස්ස තන්නිස්සිතස්ස ච භවංගස්ස චලනං හොති. සො රූපස්ස චක්ඛුම්හි චක්ඛුස්ස වා රූපෙ හොති. තෙනාහ: චක්ඛුම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි රූපං සනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි[1]; යං චක්ඛුං අනිදස්සනං සප්පටිඝං රූපම්හි සනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි[1] ච'' ආදිං. විසයභාවො ආරම්මණපච්චයතා. **ගොචරභාවපච්චුපට්ඨානං** ති එත්ථ අත්ථිභාවො විසයතා, තබ්බහුලතා ගොචරභාවොති අයං විසය - ගොචරානං විසෙසො.

**68. සද්දායතී** ති උදාහරීයති, සකෙහි වා පච්චයෙහි සොතවිඤ්ඤෙය්‍යභාවං උපනීයතී ති අත්ථො. **අත්තානං ගන්ධයතී** ති සුගන්ධං ති වා දුග්ගන්ධං ති වා අත්තානං පකාසෙති; තෙනාහ **සූචයතී** ති.

ඉත්ථියා එව ඉන්ද්‍රියං **ඉත්ථින්ද්‍රියං**. යථා චක්ඛාදීනි ඉන්ද්‍රියානි පුරිසස්සාපි හොන්ති, නයිදං තථා, ඉදම්පන නියමෙන ඉත්ථියා එව හොති. තස්මා ඉත්ථින්ද්‍රියං ති වුච්චති. එවං පුරිසින්ද්‍රියෙපි. (664) ඉත්ථියා භාවො, ඉත්ථීති වා භවති එතෙන චිත්තං අභිධානං වාති **ඉත්ථිභාවො. පටිසන්ධිසමුට්ඨිතං** ති පටිසන්ධියංයෙව සමුට්ඨිතො, පටිසන්ධිචිත්තෙන සහ එකක්ඛණෙ සමුට්ඨිතො: එතෙන ඨපෙත්වා ලිඞ්ගපරිවත්තනං චක්ඛුන්ද්‍රියාදීනං[2] විය ඉමස්ස අපාතුභාවමාහ. **යං චෙතං ඉත්ථිලිඞ්ගාදී** ති යං පනෙතං ඉන්ද්‍රියඵලභූතං ඉත්ථිලිංගාදි, ආදිග්ගහණෙන ඉත්ථිනිමිත්ත - ඉත්ථිකුත්ත - ඉත්ථාකප්පානං සංගහො. තත්ථ විසද - අවිසද - හත්ථපාදදිතා ච සණ්ඨානං "ඉත්ථිලිංගං". ඉත්ථීනං හි හත්ථපාදගීවා උරාදීනං[3] සණ්ඨානං පුරිසානං විය න හොති, තථා හි තාසං හෙට්ඨිමකායො විසදො හොති; උපරිමකායො අවිසදො; හත්ථපාදා ඛුද්දකා; මුඛං ඛුද්දකං; ථනමංසවිසදතා[4], නිම්මස්සුදාඨිකතා[5], කෙසබන්ධන - වත්ථග්ගහණං ච "ඉත්ථිනිමිත්තං." දහරකාලෙපි සුප්පක - මුසලකාදීහි කීළා, මකචි - වාකෙන[6] සුත්තකන්තනං ති එවමාදි "ඉත්ථිකුත්තං", ඉත්ථිකිරියාති අත්ථො. අවිසදඨාන - ගමනාදිආකාරො "ඉත්ථාකප්පො." පුරිසම්පි හි අවිසදං දිස්වා මාතුගාමො විය තිට්ඨති නිපජ්ජති නිසීදති ඛාදති භුඤ්ජතී ති වදන්ති. ඉදම්පන ඉත්ථිලිංගාදිපරිදීපනං ආකුලංති[7] වත්වා අඤ්ඤ-

1. M පටිහඤ්ඤි. 2. M. චක්ඛුන්ද්‍රියාදීනි 3. M. - ගීවාඋරූආදි. 4. M. ථනමංසා අවිසද 5. M තා නිම්මස්සුදාඨිකා 6. M. මකචිකවාක් සෙන B මකචිකාකක්සෙන 7 M අනාකුලංති

ථාපි වණ්ණෙන්ති ආචරියා. කථං? යොනිප්පදෙසො ඉත්ථිලිංගං. සරාධිප්පායා ඉත්ථිනිමිත්තං. අවිසදඨානගමනාදයො ඉත්ථිකුත්තං; ඉත්ථිසණ්ඨානං ඉත්ථාකප්පොති. එත්ථ අධිප්පායො නාම පුරිසස්මිං මෙථුනතණ්හා. සා හි තාසං නිච්චං බලවතරා පවත්තති, අතො සාපි ඉත්ථීති සඤ්ජානනස්ස නිමිත්තතාය ඉත්ථිනිමිත්තන්ති වුච්චති. කිඤ්චාපි ඉත්ථීති සඤ්ඤාණස්ස නිමිත්තතාය කුත්තාකප්පානම්පි නිමිත්තෙන යෙව අනන්තොගධතා. තථාපි තෙසං විසුං ගහණතො සරාධිප්පායා එව නිමිත්තභාවෙන අධිප්පෙතා.

කිම්පනෙතං ඉත්ථිලිංගාදි ඉත්ථින්ද්‍රියං විය පටිසන්ධිසමුට්ඨිතං හොතීති ආහ (665) **ඉත්ථින්ද්‍රියං පටිච්චා**ති ආදිං. කිඤ්චාපි ඉත්ථිලිංගාදීනි යථාසකං කම්මාදිනා පච්චයෙන සමුට්ඨහන්ති. යෙභුය්‍යෙන පන ඉත්ථින්ද්‍රියසහිතෙ යෙව සන්තානෙ තං - තදාකාරා හුත්වා සම්භවන්ති, ඉතරත්ථ න භවන්තී ති තෙසං තබ්භාවභාවිතං උපාදාය ඉන්ද්‍රියං පටිච්ච ජායන්තී ති වුත්තන්ති; එවං ච කත්වා වක්ඛති "ඉත්ථිලිංගනිමිත්තකුත්තාකප්පානං කාරණභාවපච්චු-පට්ඨානං"ති. ඊදිසෙනෙව කාරණභාවසංඛාතෙන අධිපතිභාවෙන තස්ස ඉන්ද්‍රියතා වුත්තා, ඉන්ද්‍රියසහගතෙ සන්තානෙ ඉත්ථිලිංගාදි ආකාරරූපප්පච්චයානං අඤ්ඤථා අනුප්පාදනතො; න පන ඉත්ථින්ද්‍රියාදිපච්චයසම්භවතො. තථාහෙතං ජීවිතින්ද්‍රියං විය එකකලාපගතානං ආහාරො විය කලාපන්තරරූපානං උපත්ථම්භක මනුපාලකං[1] වා න හොති. එවං ච කත්වා ජීවිතින්ද්‍රිය - ආහාරානං විය ඉමස්ස ඉන්ද්‍රියතා අත්ථි - අවිගතපච්චයතා පාළියං න වුත්තා. යස්මා පච්චයන්තරාධීනානි ඉත්ථිලිංගාදීනි, තස්මා යත්ථස්ස ආධිපච්චං තං සදිසෙසු ච තංචිත්තගතරූපෙසු ච[2] තංසණ්ඨානතා දිස්සති.

යස්මා පනෙතෙ ඉත්ථින්ද්‍රියං පටිච්ච ජායන්තාපි ගබ්භ-සෙය්‍යකානං පටිසන්ධියං න සමුට්ඨහන්ති, පවත්තෙයෙව සමුට්ඨහන්ති, තස්මා ආහ (665.) **පවත්තෙ එව ජායන්ති න තානි පටි-සන්ධියං**ති. සංසෙදජඔපපාතිකානං පන කිඤ්චි ඉත්ථින්ද්‍රියෙන සහ පටිසන්ධියමෙව නිබ්බත්තන්ති. (666) **නවා**ති වකාරො වචනියන්තර සමුච්චයෙ. කිඤ්චාපීති ඉමස්ස අත්ථො දට්ඨබ්බො: යස්මා ලිංගාදි ආකාරෙසු රූපෙසු රූපායතනං චක්ඛුවිඤ්ඤෙය්‍යං, තස්මා ආහ **ඉත්ථිලිංගාදයො චක්ඛුවිඤ්ඤෙය්‍යා හොන්ති වා න වා**ති. යස්මා පන රූපායතනතො[3] අඤ්ඤානි යථායොගං සොතවිඤ්ඤෙය්‍යානි චෙව මනොවිඤ්ඤෙය්‍යානි ච, තස්මා වුත්තං **නවා**ති.

---

1. M. ජනකමුපත්ථම්භක - 2 M. මතච්ඡින්නකතරූපෙසුපි. 3. M තතො

යථාවුත්තප්පභෙදො පුරිසින්ද්‍රියෙ පි යථාසම්භවං යොජෙතබ්බොති අතිදෙසං කරොන්තො ආහ (667) **එසෙව ච නයොති** ආදිං. **සෙසෙ** පි ති එත්තකෙ යෙව වුත්තෙන ඉතො සෙසෙසු සබ්බෙසු පි ති කදචි කොචි චිඤ්ඤාතය්‍යාති ආහ **පුරිසින්ද්‍රියෙති**. **පඨමකප්පාන**න්ති පඨමකප්පිකනරානං. තෙසං හි ආභස්සර බ්‍රහ්මලොකතො චවිත්වා ඉධූපපන්නානං දීඝස්ස කාලස්ස අච්චයෙන ඔළාරිකං ආහාරං ආහරතං මුත්තකරීසෙසු සඤ්ජාතෙසු නික්ඛමනත්ථාය නවමුඛානි[1] භිජ්ජන්ති. පුරිසස්ස පුරිසභාවො ඉත්ථියා ච ඉත්ථිභාවො පාතුරහොසි (=පාතුභවති?). යථා හි පුරිමත්තභාවෙසු පවත්ත - උපචාරජ්ඣානානුභාවෙන යාව සත්තසන්තානෙසු කාමරාගවික්ඛම්භනවෙගො න පටිප්පස්සම්භති, න තාව බහලකාමරාගූපනිස්සයානි ඉත්ථිපුරිසින්ද්‍රියානි පාතුරහෙසුං; යදා පනස්ස විච්ඡින්නතාය බහලකාමරාගවෙගො[2] ලද්ධාවසරො අහොසි, තදා තදූපනිස්සයානි තානි සත්තානං සන්තානෙසු ජායන්ති. **පරතොති** පඨමකප්පතො අපරභාගෙ. **පවත්තෙ පි =පෙ= පරිවත්තන්ති** ති යථා තං සොරෙය්‍යකසෙට්ඨිපුත්තස්ස වියාති අධිප්පායො. අපි-සද්දෙන පඨමපාරාජිකායං විනීතවත්ථුපාළියං ආගතභික්ඛුස්ස භික්ඛුනියා ච විය පටිසන්ධියං සමුට්ඨිතස්ස පි පවත්තෙ පරිවත්තනං දීපෙති. යථාහ: “තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඉත්ථිලිංගං පාතුරහොසි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරිස්සා භික්ඛුනියා පුරිසලිංගං පාතුභූතං හොති”ති. යස්ස පන පටිසන්ධියං ද්වීසු එකම්පි න සමුට්ඨිතං, සො අභාවකො නාම. තස්ස පවත්තියම්පි ඉන්ද්‍රියුප්පත්ති න හොතී ති දට්ඨබ්බා. කිං පනෙතස්ස උභයස්ස පි නිබ්බත්තියා විනාසස්ස ච කාරණං, යතො ඉදං සමුට්ඨාති පරිවත්තතී ති වුච්චතී ති ඉදං අනුයොගං මනසිකරිත්වා ආහ:

(669) **මහතා පාපකම්මෙනාති** ආදිං. එත්ථ **මහතාති** පරදාරිකකම්මාදිනා මහාබලෙන පාපකම්මෙන උපනිස්සයභූතෙන. **මහතා කුසලෙන වාති** ඉදං සුගතිං සන්ධාය වුත්තං. දුග්ගතියම්පන උභයම්පි අකුසලකම්මෙනෙව ජායති. ඉන්ද්‍රියෙ විනට්ඨෙ එකන්තෙන ලිංගම්පි විනස්සතෙවාති ආහ **ඉත්ථිලිංගං විනස්සතීති** අයං පනෙත්ථ අධිප්පායො දට්ඨබ්බො: ඉමෙසු ද්වීසු පුරිසින්ද්‍රියං උත්තමං, ඉත්ථින්ද්‍රියං හීනං; පුරිසින්ද්‍රියස්ස අන්තරධානං මහන්තෙන අකුසලෙන කම්මෙන හොති, සමුට්ඨානං මහන්තෙන කුසලකම්මෙන, ඉත්ථින්ද්‍රියස්ස අන්තරධානං දුබ්බලාකුසලෙන, සමුට්ඨානං දුබ්බලකුසලෙන. දුග්ගතියං පන උභයස්සපි අන්තරධානං

---

1. චණ්මුඛානි. 2. M -කාමරාගො.

සමුට්ඨානං ච අකුසලෙනෙව හොතීති. යදි සුගතියං ඉත්ථින්ද්‍රියම්පි කුසලෙනෙව නිබ්බත්තති, කථඤ්චරහි පරදාරිකකම්මං කත්වා නිරයෙ පච්චිත්වා තෙනෙව පාපකම්මෙන පඤ්චසතක්ඛත්තුං මනුස්සලොකෙ ඉත්ථි හුත්වා නිබ්බත්තන්ති ආදි වචනන්ති? නායං විරොධො, නිස්සන්දඵලවසෙන වුත්තත්තා. තථා හි පටිසන්ධියං තාව පුරිසින්ද්‍රියනිබ්බත්තනාරහම්පි කම්මං කදාචි පරදාරිකාදිනා බලවපාපකම්මෙන පටිබාහිතසාමත්ථියං අස්ස,[1] තදා අත්තනො පුරිසින්ද්‍රියනිබ්බත්තනෙ අසමත්ථතාය ඉත්ථින්ද්‍රියමෙව නිබ්බත්තෙති. පවත්තියම්පන අත්තනො බලවභාවෙන ඉත්ථින්ද්‍රියූපනිස්සයං පරදාරිකාදිමකුසලකම්මං පටිබාහෙත්වා පටිසන්ධිතො පට්ඨාය පුරිසින්ද්‍රියං සමුට්ඨාපෙන්තං කදාචි ලද්ධසාමග්ගිතා – සඤ්ජාතබල විසෙසෙන පරදාරිකාදිනා කම්මෙන පටිබාහිතසාමත්ථියං භවෙය්‍ය, තදා අත්තනො දුබ්බලතාය පුරිසින්ද්‍රියං න නිබ්බත්තෙති, ඉත්ථින්ද්‍රියමෙව නිබ්බත්තෙති; එවං පරදාරිකාදිකම්මූපනිස්සයෙන ඉන්ද්‍රියස්ස නිබ්බත්තනතො තං තෙන නිබ්බත්තිතං කත්වා වුච්චති; යදා පන තං කම්මං පුන සාමග්ගිපටිලාභතො පරික්ඛීණ පාපකම්මතාය වා බලප්පත්තං අභවිස්ස, තදා දින්නවෙධං විය රුක්ඛං තදුපගමෙ අත්තනො බලානුරූපං පුරිසින්ද්‍රියං නිබ්බත්තෙති. ඉත්ථින්ද්‍රියං පන අත්තනො කාරණාභාවතො නුප්පජ්ජති: උභයස්ස පන නිබ්බත්තියම්පි විසදිසින්ද්‍රියනිබ්බත්තනතො[2] පුරෙ-සත්තරසමචිත්තස්ස ඨිතිකාලමුපාදාය තංතංසමුට්ඨාපකං කම්මං තං තං ඉන්ද්‍රියං ජනෙති. සත්තරසමචිත්තෙන සහ උප්පන්නං විසදිසින්ද්‍රියුප්පත්තිතො පුරිමචිත්තෙන සහ නිරුජ්ඣති. යදි හි සත්තරසමචිත්තස්ස උප්පාදතො පරම්පි උප්පජ්ජෙය්‍ය, ඉතරං නුප්පජ්ජති. එකස්මිං සන්තානෙ ද්වින්නං සහුප්පත්තියා අනිච්ඡිතත්තා. තෙනෙව හි: "යස්ස පුරිසින්ද්‍රියං උප්පජ්ජති, තස්ස ඉත්ථින්ද්‍රියං උප්පජ්ජතී"ති ඉමස්මිං පඤ්හෙ "නො"ති පටික්ඛෙපො කතොති. එවං ච කත්වා වක්ඛති (671) **උභතොබ්‍යඤ්ජනස්සාති** ආදිං.

එකස්මිං ච නිරුද්ධෙ තප්පටිබද්ධානි ලිංගාදීනි කතිපයදිවසෙහි නිරුජ්ඣන්ති. තෙසු නිරුද්ධෙසු ඉතරානි අනුක්කමෙන ජායන්තීති ආචරියා. ඉත්ථිනිමිත්තුප්පාදකකම්මතො පුරිස නිමිත්තුප්පාදකකම්මතො වාති උභතො ද්විධං ව්‍යඤ්ජනමස්සාති උභතොව්‍යඤ්ජනො. තස්සාපීති යස්ස ද්විධම්පි ව්‍යඤ්ජනමත්ථි, තස්සාපි **එකමෙව ඉන්ද්‍රියං සියා,** කිම්පන ඉතරස්සාති දස්සෙති. නනු ච ද්විධෙ ව්‍යඤ්ජනෙ සති ඉන්ද්‍රියද්වයෙනාපි භවිතබ්බං;

1. M. පොත්ථකෙ නත්ථි 2. M —නිබ්බත්තිතො.

ව්‍යඤ්ජනං හි තං තං ඉන්ද්‍රියං පටිච්ච ජායතීති? සච්චං, ජායති. එත්ථ පි ඉත්ථිඋභතොව්‍යඤ්ජනස්ස ඉත්ථින්ද්‍රියං පටිච්ච ඉත්ථිනිමිත්තමෙව යාවජීවං පවත්තති. පුරිසඋභතොව්‍යඤ්ජනස්ස පුරිසින්ද්‍රියං පටිච්ච පුරිසනිමිත්තමෙව. ඉතරම්පන තස්ස ඉත්ථිලිංගං[1] පුරිසින්ද්‍රියහෙතුතො ජායති. තම්පන යෙන කාරණෙන හොති, තං දස්සෙතුං **එවං සන්තෙති** අනුයොගං කත්වා **නවාභාවොති** ආදිනා සොධනං[2] වුත්තං. **එවං සන්තෙති** එකස්මිං යෙව ඉන්ද්‍රියෙ සති. **අභාවොති** යම්පටිච්ච ජායති තස්ස අභාවතො. පුරිසඋභතොව්‍යඤ්ජනස්ස ඉත්ථිව්‍යඤ්ජනාභාවො, ඉත්ථිඋභතොව්‍යඤ්ජනස්ස පුරිසව්‍යඤ්ජනාභාවොති අත්ථො. (672) **නවාභාවො සියාති** නෙව දුතියව්‍යඤ්ජනස්ස අභාවො සියා. **න තං ව්‍යඤ්ජනකාරණංති** තං ඉන්ද්‍රියං දුතියව්‍යඤ්ජනස්ස කාරණං න හොති. කස්මා? සදා අභාවතො ඉත්ථිඋභතොව්‍යඤ්ජනස්ස හි යදා ඉත්ථියා රාගචිත්තං උප්පජ්ජති, තදා පුරිසව්‍යඤ්ජනං පාකටං හොති; ඉත්ථිව්‍යඤ්ජනං පටිච්ඡන්නං ගුළ්හං. තථා ඉතරස්ස ඉතරං. යදි ච නෙසං ඉන්ද්‍රියං දුතියව්‍යඤ්ජනකාරණං භවෙය්‍ය සදාපි ව්‍යඤ්ජනද්වයං තිට්ඨෙය්‍ය; න පන තිට්ඨති. තස්මා වෙදිතබ්බමෙතං න තස්ස තං ව්‍යඤ්ජනකාරණංති. කිඤ්චරහි **කාරණංති** චෙ? **තස්ස =පෙ= කාරණංති.** තත්ථ **කම්මසහායංති** පුරිමභවසිද්ධස්ස ඉන්ද්‍රියනිබ්බත්තක-කම්මස්ස සහායං. **රාගචිත්තංති** ඉත්ථියා පුරිසස්මිං පුරිසස්ස ඉත්ථියං උප්පන්නමෙථුනරාගචිත්තං. තස්මිං හි උප්පන්නෙ තං පාකටං හොති; තස්මිං පටිප්පස්සද්ධෙ පටිච්ඡන්නං හොති. යස්මා පනිමස්ස එකමෙවින්ද්‍රියං හොති, තස්මා ඉත්ථිඋභතොව්‍යඤ්ජනකො සයම්පි පරං උද්දිස්ස ගබ්භං ගණ්හාති; අත්තානං උද්දිස්ස පරම්පි ගණ්හාපෙති. සො හි ඉත්ථින්ද්‍රියවන්තතාය සයං ගණ්හාති, පරෙසු උපක්කමකරණතො පරංපි ගණ්හාපෙති. පුරිසඋභතොව්‍යඤ්ජනකො පරෙසු උපක්කමකරණතො පරං ගබ්භං ගණ්හාපෙති; සයම්පන පුරිසින්ද්‍රියවන්තතාය න ගබ්භං ගණ්හාති. යස්මා ඉත්ථින්ද්‍රියෙ සති ඉත්ථිලිංගාදයො හොන්ති, තෙසු ච සන්තෙසු ඉත්ථීති පකාසො හොති, තස්මා තං තස්ස පකාසනකාරණංති ආහ **ඉත්ථීති පකාසනකාරණංති.** දුවිධම්පි පනෙතං ඉන්ද්‍රියං කායප්පසාදො විය සකලසරීරව්‍යාපකං. න ච තස්ස කායප්පසාදෙන සංකරො ලක්ඛණභෙදතො නිස්සයභෙදතො වා

**69. සහජරූපපරිපාලනලක්ඛණංති** යථා අත්තනා සහජාතරූපානි තීසු ඛණෙසු පවත්තන්ති, එවං අනුපාලනලක්ඛණං. ජීවිතින්ද්‍රියස්ස එකන්තකම්මජත්තා සහජාතග්ගහණෙනෙව අනුපාලෙතබ්බානම්පි කම්මජභාවො සිද්ධොති ගහණං න කතං. යථාසකං

1. M. ඉත්ථින්ද්‍රියං. 2. B. සමාධානං.

ඛණත්තයමත්තට්ඨායිතම්පි කම්මජරූපානං පවත්තිහේතුභාවේ-
නේව තං අනුපාලකං. තේනාහ **තේසං පවත්තනරස**න්ති. පවත්තනං
චෙත්ථ වුත්තනයේන තේසං යාපනං ඨපනං; ඨිතිහේතුකතා. න හි
කම්මජානං කම්මමේව ඨිතිහේතු භවිතුං සක්කෝති, ආහාරජාදීනං
ආහාරාදි විය; කිං කාරණං? තංඛණාභාවතෝ. කම්මං හි චිරනිරුද්ධං
රූපස්ස පච්චයෝ හෝති, තතෝ තංසමුට්ඨානරූපානි මතපිතිකා
විය පුත්තා චූළපිතුආදිනිස්සයේන, අඤ්ඤනිස්සයේනේව පවත්තන්ති.
අඤ්ඤං ච තේසං යාපනසමත්ථං නත්ථි අඤ්ඤත්ථ ජීවිතින්ද්‍රියේනාති,
තදේව තේසං පවත්තනරසං. ආහාරජාදයෝ පන ධරමානක-
පිතිකා විය පුත්තා අඤ්ඤනිරපෙක්ඛා සකසකපච්චයවසේනේව
පවත්තන්ති. ආහාරාදයෝ හි අත්තනෝ අත්ථික්ඛණේ යේව
රූපානි සමුට්ඨාපෙත්වා තේසං ඨිතිපවත්තියාව තිට්ඨන්ති; තතෝ
තංසමුට්ඨානානි ජීවිතින්ද්‍රියනිරපෙක්ඛානි පි තංතංපච්චයවසේනේව
තිට්ඨන්තීති න අඤ්ඤං ඨපනකාරණං පච්චාසිංසන්ති. කම්ම-
සමුට්ඨානම්පි චේතං උප්පාදතෝ පට්ඨාය යේව අනුපාලකං.
යාපෙතබ්බානි පවත්තෙතබ්බානි සහජාතභූතානි පදට්ඨානමේ-
තස්සාති **යාපෙතබ්බභූතපදට්ඨානං**.[1]

(674) **මනෝවිඤ්ඤාණධාතූ**ති ඨපෙත්වා අරූපාවචරවිපාක
මනෝවිඤ්ඤාණධාතුං අවසේස-මනෝවිඤ්ඤාණධාතු. තේනාහ
**පඤ්චවෝකාරේ**ති. **යං රූපං නිස්සාය** මනෝධාතු-මනෝ
විඤ්ඤාණධාතු ච **පඤ්චවෝකාරේ පවත්තන්ති, තං වත්ථූ**ති
**පවුච්චතී**ති සම්බන්ධෝ. **පඤ්චවෝකාරේ**ති ච විසේසනං
මනෝවිඤ්ඤාණධාතුවසේන කතං. මනෝධාතු පන චතුවෝ-
කාරභවේ නත්ථේව. පාළියං අනාගතස්සාපි හදයවත්ථුනෝ
ආගමතෝ යුත්තිතෝ ච අත්ථිභාවෝ විඤ්ඤාතබ්බෝ. තත්ථ ආගමෝ
තාව: “යං රූපං නිස්සාය මනෝධාතු මනෝවිඤ්ඤාණධාතු ච
පවත්තන්ති තං රූපං මනෝධාතුයා මනෝවිඤ්ඤාණධාතුයා
තංසම්පයුත්තකානං ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ”ති
එවමාදි පට්ඨානවචනං, යුත්ති පන එවං වේදිතබ්බා: නිප්ඵන්න-
උපාදායරූපනිස්සයං ධාතුද්වයං පඤ්චවෝකාරභවේ රූපපටිබද්ධ-
වුත්තිත්තා; යං යං හි රූපපටිබද්ධවුත්ති, තං තං නිප්ඵන්න-
උපාදාය - රූපනිස්සයං දිස්සති, යථා චක්ඛුවිඤ්ඤාණධාතු. තත්ථ
න තාව රූපායතනාදීනං ඔජාය ච තංනිස්සයතා යුජ්ජති.
ඉන්ද්‍රියබද්ධතෝ[2] බහි පි තේසං පවත්තිදස්සනතෝ; නාපි
ඉත්ථින්ද්‍රියපුරිසින්ද්‍රියානං, තදුභයවිරහිතේ අභාවකසන්තානේ පි
ධාතුද්වයදස්සනතෝ, ජීවිතින්ද්‍රියස්සාපි සහජපරිපාලනලක්ඛණං

1. පෙළපොත. යාපයිතබ්බ —. 2. M. ඉන්ද්‍රියපටිබද්ධතෝ.

කිච්චන්තරං විජ්ජතීති න තංනිස්සයතා යුජ්ජති. තං හි කිච්චන්තරෙ පසුතං න ඉමාසං[1] නිස්සයො භවිතුං සක්කොති. තස්මා පාරිසෙසතො තෙසං නිස්සයො හදයවත්ථු නාම අත්ථීති විඤ්ඤාතබ්බං. හොතු තාව ධාතුද්වයනිස්සයො වත්ථු උපාදායරූපං ච. තං පනෙතං කම්මසමුට්ඨානං පටිනියතකිච්චං හදයපදෙසෙ ඨිතමෙකං ති දට්ඨබ්බං. කථමෙතං විඤ්ඤායතීති? වුච්චතෙ: වත්ථුරූපභාවතො; කම්මසමුට්ඨානවත්ථු විය. යං හි විඤ්ඤාණස්ස වත්ථුභූතං රූපං තං කම්මසමුට්ඨානං, යථා චක්ඛුප්පසාදෙ. තතො එව පටිනියතකිච්චං අඞ්ගීකත්වා මනසිකත්වා සබ්බං චෙතසා සමන්නාහරිත්වා කිඤ්චි චින්තෙන්තස්ස හදයප්පදෙසස්ස ඛිජ්ජනතො තදෙදං තිට්ඨතීති විඤ්ඤායති. යථාහු ආචරියා:

“කම්මජං වත්ථුභාවා තං චක්ඛුං ච නියතක්‍රියං
චින්තෙන්තස්ස[3] උරොභෙද තත්‍රට්ඨන්ති විජානියං”ති

යදි මනොධාතු - මනොවිඤ්ඤාණධාතූනං නිස්සයභූතං හදයවත්ථු නාම අත්ථි, කස්මා පනෙතං රූපකණ්ඩෙ න වුත්තං? න හි ලබ්භමානස්ස අවචනෙ කාරණං අත්ථීති? නො නත්ථි. කාරණන්තරසම්භවතො කිම්පන තං කාරණං? දෙසනාභෙදෙ. යථා හි චක්ඛුවිඤ්ඤාණාදීනි එකන්තතො චක්ඛාදිනිස්සයානි, න එවං මනොවිඤ්ඤාණං එකන්තෙන හදයවත්ථුනිස්සිතං, පඤ්චවොකාරභවෙ යෙව තංනිස්සයත්තා; එකන්තෙන[3] නිස්සිතවසෙනෙව ච වත්ථුදෙසනා පවත්තා; “අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථූ”ති ආදිනා චක්ඛුවිඤ්ඤාණාදීහි නිස්සිතෙහි විසෙසිතත්තා; යම්පි එකන්තෙන හදයවත්ථු-නිස්සයං, තස්ස වසෙන අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස වත්ථූති ආදිනා දුකාදිසු වුච්චමානෙසු න තදනුගුණා ආරම්මණදුකාදයො සම්භවන්ති. න හි “අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි රූපං න මනොවිඤ්ඤාණස්ස ආරම්මණං”ති සක්කා වත්තුං ති, වත්ථාරම්මණදුකා භින්නගතිකා සියුං, න එකරසා දෙසනා භවෙය්‍ය. එකරසං ච දෙසනං දෙසෙතුං තත්ථ භගවතො අජ්ඣාසයො. තස්මා තත්ථ හදයවත්ථු න වුත්තං; න අලබ්භමානත්තා. එසා හි භගවතො පකති, යං එකරසෙනෙව දෙසනං දෙසෙතුං ලබ්භමානස්සාපි කස්සචි අග්ගහණං. තථා හි නික්ඛෙපකණ්ඩෙ පි චිත්තුප්පාදවිභාගෙන අවුච්චමානත්තා අවිතක්කාවිචාරපදවිස්සජ්ජනෙ විතක්කො විචාරො චාති වත්තුං න සක්කාති අවිතක්කවිචාරමත්ත - පද විස්සජ්ජනෙ ලබ්භමානො පි විතක්කො න උද්ධටො. අඤ්ඤදත්ථා විතක්කො චාති වත්තබ්බං සියාති.

1. B. ඉමස්ස. 2. M. චින්තාය ච. 3. M. පොත්ථකෙ නත්ථි.

නිස්සයභාවතො උපරි ආරොපෙත්වා වහන්තං විය පච්චුපට්ඨාතීති **උබ්බහනපච්චුපට්ඨානං**. චතූසු ආහාරෙසු ඉධ රූපාධිකාරතො කබළිංකාරාහාරො ගහෙතබ්බොති ආහ: **ආහාරතා කබළිංකාරාහාරොති**. තත්ථ කබළං කරීයතීති කබළීකාරො, ආහරීයතීති ආහාරො. කබළං කත්වා අජ්ඣො-හරීයතීති අත්ථො. ඉදං ච සවත්ථුකං කත්වා ආහාරං දස්සෙතුං වුත්තං. කබළිංකාරාහාරස්ස **පන** ඔජා ඉධ ආහාරො නාම; තෙනාහ: **යාය ඔජායාති** ආදිං. සො ච රූපාහරණසභාවො උපත්ථම්භනබලකරො අංගමංගානුසාරී රසාහරණභූතො භූත-නිස්සිතො එකො විසෙසො, බාහිරාහාරපච්චයං පටිලභිත්වා එව අජ්ඣත්තිකාහාරො රූපං උප්පාදෙතීති. අයං අජ්ඣත්තිකාහාරස්ස උපනිස්සයභාවෙනාපි රූපං ආහරතීති ආහ: **ඔජට්ඨමකරූපං ආහරතීති** ඔජා අට්ඨමී යස්ස තං ඔජට්ඨමකං.

(675) **යාය ඔජායාති**. අත්තනො උදයානන්තරං[1] රූප-ජනනතො ඔජාසංඛාතාය ඔදනකුම්මාසාදිවත්ථුගතාය යාය[2] ඔජාය **යත්ථ යත්ථාති** යම්හි යම්හි ජනපදෙ නගරාදීසු ච **කබළිංකාරො ආහාරොති පවුච්චති** තබ්බත්ථුකත්තාති අධිප්පායො. කිම්පන වත්ථුතො කිච්චං, කිං ඔජායාති චෙ? පරිස්සයහරණං වත්ථුස්ස කිච්චං, පාලනං ඔජායාති දස්සෙන්තො ආහ (676) **අන්නපානාදිකංති** ආදිං. **අග්ගිං හරති කම්මජංති** කම්මජතෙජං ගණ්හාති. අන්තොකුච්ඡියං හි ඔදනාදිවත්ථුස්මිං අසති කම්ම ජතෙජො උට්ඨහිත්වා උදරපටලසංඛාත - උපාදින්නරූපං ගණ්හාති, ''ඡාතොස්මි, ආහාරං මෙ දෙථා''ති වදාපෙති. භුත්තකාලෙ උදර පටලං මුඤ්චිත්වා අනුපාදින්නවත්ථුං ගණ්හාති. අථ සත්තො එකග්ගො හොති. යථා හි ඡායාරක්ඛසො ඡායං පවිට්ඨං දිස්වා ගහෙත්වා දෙවසංඛලිකාහි[3] බන්ධිත්වා අත්තනො භවනෙ මොදන්තො ඡාතකාලෙ ආගන්ත්වා සීසෙ ඩසති, සො දඩ්ඪො[4] විරවති. තං විරවං සුත්වා සචෙ අඤ්ඤෙපි මනුස්සා ආගච්ඡන්ති, ආගතාගතෙ ගහෙත්වා ඛාදිත්වා සකභවනෙ මොදති. එවං යං යං අන්නපානාදිකං වත්ථු, තං කම්මජතෙජො ගහෙත්වා ජීරාපෙත්වා පුන උදරපටලං ගණ්හාති. තස්මා අන්නපානාදිකං වත්ථු අත්තනො උදරපටලං පවිට්ඨකාලෙ උපාදින්නකායං ගහෙත්වා ඨිතං තතො මොචෙත්වා අත්තානං ගණ්හාපනවසෙන තං අත්තනො සන්තිකං ආහරති. **කෙවලංති** ඔජාය[5] වියුත්තං[5] වත්ථු ජීවිතං කම්මජභූතං තං පාලෙතුං න සක්කොති.

---

1. B. උපාදයනන්තරං. 2. M. ඵරණ. 3. M. දෙවසංඛලිකාය. 4. M. දණ්තො. 5. M. ඔජාවියුත්තං.

(677) **ඔජා සක්කොති =පෙ= ජීවිතන්ති** ඔජා ජීවිතං **පාලෙතුං** සක්කොති, කම්මජතෙජං **හරිතුං න** සක්කොති, ආමාසයස්ස[1] අපුණ්ණත්තාති අධිප්පායො. **උපත්ථම්භනපච්චුපට්ඨානාති** ඔජට්ඨමකරූපාහරණවසෙනෙව ඉමස්ස කායස්ස උපත්ථම්භනවසෙන පච්චුපට්ඨාති

**කායෙනාති** රූපකායෙන. **අත්තනො භාවන්ති** අත්තනො අධිප්පායං. **විඤ්ඤාපෙන්තානන්ති** පරෙසං ඤාපෙන්තානං, **කායගහණානුසාරෙනාති** ඵන්දමානකායගතවණ්ණස්ස ගහණභූතානං චක්ඛුද්වාරික-ජවනානන්තරප්පවත්තානං නිච්ඡයගහණසඞ්ඛාතානං මනොද්වාරික – ජවනානං අනුසරණෙන, තෙසං අනන්තරං ති අත්ථො. පඤ්චද්වාරෙ හි රූපාදිආරම්මණෙ ආපාථමාගතෙ යථාපච්චයං කුසලාකුසලජවනෙ උප්පජ්ජිත්වා භවඞ්ගං ඔතිණ්ණෙ මනොද්වාරිකජවනං තං යෙවාරම්මණං කත්වා භවඞ්ගං ඔතරති. පුන තස්මිං යෙව ද්වාරෙ විසයං වවත්ථපෙත්වා ජවනං භවඞ්ගං ඔතරති. තස්මා චක්ඛුද්වාරිකජවනානන්තරප්පවත්තානං ද්වින්නං ජවනවාරානමනන්තරං තතියවාරෙ පවත්තාය මනොද්වාර-ජවනවීථියා එව ගහිතාය එතාය කරණභූතාය චතුත්ථවාරෙ මනොද්වාරජවනෙනෙව භාවො විඤ්ඤායති. එතෙන විඤ්ඤත්ති සද්දස්ස කරණසාධනතා වුත්තා. **සයං වාති** ආදිනා පන කම්ම-සාධනත්තමාහ. එවං විඤ්ඤත්තිසද්දස්ස කාරකද්වයෙ සම්භවං දස්සෙත්වා ඉදානි කායසද්දෙන සහ කම්මධාරයසමාසං දස්සෙතුං කායොති වොහාරස්ස විඤ්ඤත්තියම්පි පවත්තිං දස්සෙන්තො **කායෙන සංවරොති** ආදි – සුත්තමාහ.

**කායවිප්ඵන්දනෙන අධිප්පායවිඤ්ඤාපනහෙතුත්තාති** විප්ඵන්ද-මානකායෙන කරණභූතෙන අධිප්පායවිඤ්ඤාපනහෙතුභාවතො **කායෙන** විඤ්ඤාපෙතීති පි කායවිඤ්ඤත්තීති සම්බන්ධො. අයම්පනෙත්ථ අත්ථො: විඤ්ඤත්තියා කායවිප්ඵන්දනස්ස හෙතුභාවතො තංහෙතුකං කායවිප්ඵන්දනසඞ්ඛාතං කායං ගහෙත්වා අධිප්පාය ජානනතො විඤ්ඤත්ති අධිප්පායවිඤ්ඤාපනස්ස කාරණභාවෙන ගය්හතීති කායෙන අධිප්පායං විඤ්ඤාපෙති. තථා කායවිප්ඵන්දනං ගහෙත්වා තස්ස කාරණමෙත්ථ අත්ථීති විඤ්ඤත්තියා ගය්හමානත්තා සයං ච කායෙන විඤ්ඤායති, තස්මා කායෙන විඤ්ඤත්තීතිපි කායවිඤ්ඤත්තීති.

(678.) **චිත්තජානිලධාතුයාති** අභික්කමාදිප්පවත්තකචිත්ත සමුට්ඨාන – වායොධාතුයා. **ආකාරවිකාරතාති** ආකාරභූතො විකාරො. කස්ස[2] පන සා ආකාරවිකාරතාති? සාමත්ථියතො

1, M. ආසයස්ස. 2, M. කාය.

වායොධාතුඅධිකානං චිත්තජමහාභූතානං. කිං තං සාමත්ථියං? චලනහෙතුතා චිත්තජතා උපාදාරූපතා ච. අථ වා චිත්තජානිල-ධාතුයා එකා ආකාරවිකාරතාති සම්බන්ධො. න කෙවලං හි සාමිවචනං චලනසම්බන්ධාපෙක්ඛාය එව, අථ ඛො ආකාරවිකාර සම්බන්ධාපෙක්ඛාය පීති. යදි එවං, කථං විඤ්ඤත්තියා උපාදාය රූපතා, "චිත්තජානිලධාතුයා"ති ආදිවචනෙහි වායොධාතුයාව ආකාරවිකාරතා විඤ්ඤත්තීති ආපජ්ජතීති? න ච එකභූතනිස්සිතං උපාදායරූපං නාම අත්ථි, "චතුන්නං මහාභූතානං උපාදායරූපං"ති වචනතොති? නායං දොසො. චතුන්නං විකාරතා චතුසු එකස්සාපි හොති. චතුසාධාරණධනං විය. අනිලධාතුඅධිකකලාපො වා ඉධ අනිලධාතූති වුච්චති, තදධිකෙ තංවොහාරතො. යථා සම්භාර පථවීධාතුයා අධිකභාවෙන පථවීවොහාරො, තස්මා වායොධාතු අධිකානං චිත්තජමහාභූතානං එකා ආකාරවිකාරතා කාය විඤ්ඤත්තීති න කොචි විරොධො. අධිකතා ච තස්සා සාමත්ථියතො දට්ඨබ්බා, න පමාණතො. ඉතරථා හි තෙසං අවිනිබ්භොගවුත්තිතා න යුජ්ජෙය්‍ය. අධිකතා[1] හි අත්තනො අධිකංසෙන[2] ඉතරෙහි විනිබ්භොගපවත්තිතො[3] හොති[4], සාමත්ථියාධිකත්තං ච කාරණානුකාරිතාය. කාරණං හි අභික්කමාදිප්පවත්තකං චිත්තං; තං චලනාධිප්පායසභාවං. තතො සමුට්ඨිතකලාපෙ අනුකරොන්තො වායොධාතුයා එව අධිකත්තං යුත්තංති. කෙචි පන වායොධාතුයා එව ආකාරවිකාරතාති ගණ්හන්ති. තෙසං මතෙන උපාදාරූපත්තං දුරූපපන්නං.[5] න හි එකස්ස විකාරො චතුන්නං උපාදාරූපංති සක්කා වත්තුං. කීදිසී පනායං විකාරතාති ආහ:

(678) **සහජාතස්ස රූපස්ස චලනෙ හෙතූති.** තත්ථ **සහජාතස්සා**ති අත්තනා සහ ජාතස්ස. යස්මා උතු-චිත්තාහාරජානං චලනං චිත්තජරූපසම්බන්ධෙනෙව හොති, නදීසොතචලනෙන තත්ථ පක්ඛිත්ත-සුක්ඛගොමයපිණ්ඩාදීනං විය. විඤ්ඤත්තිවසෙන පන චිත්තජාතමෙව චලනං; තස්මා වුත්තං "සහජාතස්සා"ති **රූපස්සා**ති රූපකායස්ස. **චලනෙ**ති සන්ථම්භන-සන්ධාරණ-චලන සංඛාතෙ චලිතභාවෙ. සන්ථම්භනාදිකම්පි චලනාභිමුඛතාය චලනංති යුජ්ජති. **හෙතූ**ති හෙතුභූතා සහකාරීකාරණභූතා.[6] එත්තාවතා ච කිං වුත්තං හොති? කායවිඤ්ඤත්ති නාම නෙව ඵන්දමානරූපකායො, න ඵන්දනං, න ච ඵන්දමානා වායොධාතු. අථ ඛො මහන්තං පාසාණං උක්ඛිපන්තස්ස සබ්බථාමෙන ගහණකාලෙ සරීරස්ස උස්සහනවිකාරො විය රූපකායස්ස

1. M. අධිකා 2. M. අධිකවසෙන. 3. M. - පවත්තිතො. 4. M. හොන්ති. 5. M. දුරූපපාදං 6. B. පොත්ථකෙ නත්ථි.

පරිප්ඵන්දනපච්චයසභාවෙන ලබ්භමානො එකො ආකාරවිකාරො කායවිඤ්ඤත්ති නාමාති වුත්තං හොති. තත්‍ථ ච ඵන්දමානවණ්ණාදිවිනිම්මුත්තො කොචි විකාරො අත්‍ථි, තස්ස වණ්ණගහණානන්තරං ගහණං හොතීති කථමෙතං විඤ්ඤායතීති? අධිප්පායගහණතො. න හි විඤ්ඤත්තිවිකාරරහිතෙසු රුක්ඛචලනාදීසු අධිප්පායගහණං දිට්ඨං, හත්‍ථචලනාදීසු පන දිට්ඨං; තස්මා ඵන්දමානවණ්ණාදිවිනිම්මුත්තො කොචි විකාරො අත්‍ථි අධිප්පායස්ස විඤ්ඤාපකොති සම්පටිච්ඡිතබ්බමෙතං එකන්තෙන; ඤාපකො ච හෙතු සයං ගහිතො යෙව අත්තනො[1] ඤාපෙතබ්බමත්‍ථං ඤාපෙති, න විජ්ජමානතාමත්තෙනාති. ඤාපෙතබ්බවණ්ණගහණානන්තරං විකාරගහණම්පි අනුමානතො සිද්ධං. තථා හි වදන්ති:

"විසයත්තමනාපන්නා සද්දා නෙවත්‍ථබොධකා
න සත්තාමත්තතො[2] අත්‍ථෙ තෙ අඤ්ඤාතා පකාසකා"ති

යදි විකාරගහණමෙව කාරණං අධිප්පායගහණස්ස, කස්මා අගහිතසංකෙතානං අධිප්පායගහණං න හොතීති? න කෙවලං විකාරගහණමෙව අධිප්පායගහණස්ස කාරණං, අථ ඛො පුරිමසිද්ධසම්බන්ධගහණං ච ඉමස්ස උපනිස්සයොති දට්ඨබ්බං. යථා හි අරඤ්ඤෙ උදකතිත්‍ථෙ උස්සාපෙත්වා ඨපිතගොසීසාදීනි උදකනිමිත්තානීති දිස්වා තදනන්තරප්පවත්තාය අවිඤ්ඤායමානන්තරාය මනොද්වාරජවනවීථියා ගොසීසාදීනං උදකසහචාරිපකාරසඤ්ඤාණාකාරං ගහෙත්වා උදකමෙත්‍ථ අත්‍ථීති විජානනං, එවං ඵන්දමානවණ්ණං ගහෙත්වා තදනන්තරප්පවත්තාය අවිඤ්ඤායමානන්තරාය මනොද්වාරවීථියා පුරිමගහිතසම්බන්ධූපනිස්සයසහිතාය සාධිප්පායවිකාරගහණං හොතීති සහජාතරූපචලනස්ස විඤ්ඤත්තිවිකාරසහිතාය වායොධාතුයා හෙතුභාවො යුත්තො.[3] කිං සබ්බා එව වායොධාතු සහජරූපං චාලෙතීති? ඉමං චොදනං සොධෙතුං:

(681.) **ලභිත්වා පනුපත්‍ථම්භං**ති ආදි වුත්තං. උපත්‍ථම්භෙතීති උපත්‍ථම්භං, උපත්‍ථම්භකපච්චයන්ති අත්‍ථො. **එකාවජ්ජනවීථියං**ති මනොද්වාරජවනවීථිං සන්ධායාහ, පඤ්චද්වාරිකවීථියා විඤ්ඤත්තිසමුට්ඨාපකත්තාභාවතො. **හෙට්ඨා ඡහි ච ජවනෙහී**ති සත්තසු ජවනෙසු හෙට්ඨිමෙහි ඡහි ජවනෙහි **සමුට්ඨිතං වායොධාතුං** උපත්‍ථම්භං ලභිත්වාති සම්බන්ධො. කෙචි පන පොත්‍ථකෙසු **වායොධාතුසමුට්ඨිතං**ති පාඨං දිස්වා උපත්‍ථම්භන්ති භාවසාධන

1. M. අත්තනො. 2. B. සත්තාමත්තනො. 3. B වුත්තො.

වසෙන ගහෙත්වා හෙට්ඨා ඡහි චිත්තෙහි උප්පන්න-වායොධාතු-සමුට්ඨිතං උපත්ථම්භං ලභිත්වාති යොජෙන්ති. (682) **විඤ්ඤත්ති-සහිතත්තනා** සයං විඤ්ඤත්තිසහිතා අත්තනා සහජාතං චිත්තජරූපං දෙසන්තරුප්පත්තිහෙතුභාවෙන චාලයති, න ඉතරථාති අත්ථො. අයම්පනෙත්ථ අධිප්පායො: යථා නාම සත්තහි යුගෙහි ආකඩ්ඪිතබ්බසකටෙ සත්තමයුගයුත්තා එව ගොණා හෙට්ඨා ඡසු යුගෙසු යුත්තගොණෙහි ලද්ධුපත්ථම්භා සකටං චාලෙන්ති, පඨමයුගාදියුත්තා පන සන්ථම්භන-සන්ධාරණමත්තමෙව සාධෙන්තා තෙසං උපත්ථම්භකා හොන්ති, එවමෙවං සත්තමජවන-සමුට්ඨිතා වායොධාතු හෙට්ඨා ඡහි ජවනෙහි සමුට්ඨිත-වායොධාතුතො ලද්ධුපත්ථම්භා චිත්තජරූපං චාලෙති, පඨමජවනාදිසමුට්ඨිතා පන සන්ථම්භනධාරණමත්තං සාධෙන්තා තස්ස උපත්ථම්භකා හොන්ති. දෙසන්තරුප්පත්ති යෙව වෙත්ථ චලනං; උප්පන්නදෙසතො කෙසග්ගමත්තම්පි ධම්මානං චලනාභාවතො. ඉත්ථං ධම්මානං අව්‍යාපාරතා ඛණිකතා ච න සියා.

කථම්පන තස්ස සහජාතරූපානං දෙසන්තරුප්පත්තියා හෙතුභාවොති? යථා අත්තනා සහජරූපානි හෙට්ඨිමජවනාදි-සමුට්ඨිතරූපෙහි පතිට්ඨිතට්ඨානතො අඤ්ඤත්ථ උප්පජ්ජන්ති, එවං තෙහි සහ තත්ථ උප්පත්ති යෙවස්ස දෙසන්තරුප්පත්ති හෙතුභාවොති දට්ඨබ්බං. අථ ඵන්දමානවණ්ණගහණානන්තරං විඤ්ඤත්තිගහණස්ස වුත්තත්තා විඤ්ඤත්තිසහිතානි සත්තමජවන සමුට්ඨිතාය එව ච විසෙසිතත්තා චලනාකාරසහිතා එව වායො-ධාතු විකාරසහගතාති? නයිද මෙවං. දෙසන්තරුප්පත්ති-හෙතුභාවෙන චලයිතුමසක්කොන්තියො පි සන්ථම්භනසන්ධාරණ-මත්තකරණෙන[1] පඨමජවනාදිසමුට්ඨිතවායොධාතුයො පි විඤ්ඤත්තිවිකාරසහිතා එව. යෙන දිසාභාගෙන ගන්ත්වා අභික්කමාදීනි පවත්තෙතුකාමො, තදභිමුඛභාවවිකාරසම්භවතො. අධිප්පායසහභාවීනං හි විකාරං විඤ්ඤත්තිමාචික්ඛන්ති. තෙ නෙව හි භගවතා "කතමං තං රූපං කායවිඤ්ඤත්ති? යං කුසලචිත්තස්ස වා =පෙ= අව්‍යාකතචිත්තස්ස වා අභික්කමන්තස්ස වා =පෙ= පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භි-තත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං කායවිඤ්ඤත්ති"ති සන්ථම්භන-සන්ධාරණානම්පි පච්චයභාවාකාරො විඤ්ඤත්ති[2]ති වුත්තො. එවං ච කත්වා මනොද්වාරාවජ්ජනානම්පි විඤ්ඤත්තිසමුට්ඨාපකතාවචනං සුට්ඨු වුත්තං හොති.

1. M. — මත්තතා. 2. M. කායවිඤ්ඤත්ති ති.

(383.) **චිත්තජාතාය පථවීධාතුයා උපාදින්නකඝට්ටනෙ පච්චයො එකො ආකාරවිකාරො අයං වචීවිඤ්ඤත්තීති විඤ්ඤෙය්‍යාති** සම්බන්ධො. තත්ථ **චිත්තජාතායාති** චිත්ත-සමුට්ඨාතාය. **උපාදින්නකඝට්ටනෙති** උපාදින්නකලාපසංඛාතස්ස අක්ඛරුප්පත්තිට්ඨානස්ස ඝට්ටනසඞ්ඛාතෙ කිච්චෙ, ඝට්ටනස්සාති අත්ථො. **පච්චයොති** තස්ස සහකාරීකාරණභූතො. **එකො ආකාරවිකාරොති** ඝට්ටියමානඋපාදින්නරූපතො ඝට්ටෙන්තියා පථවීධාතුතො ච විනිවට්ටො පථවීධාතුයා උපාදින්නකඝට්ටන පච්චයභාවරූපො එකො ආකාරවිසෙසොති අත්ථො. **පථවීධාතුයාති** සාමිවචනං උභයසම්බන්ධාපෙක්ඛන්ති ආදි කායවිඤ්ඤත්තියං වුත්ත නයෙන වෙදිතබ්බං.

**අසම්පත්ත විසෙසො:** යථා තත්ථ ඡන්දමානවණ්ණගහණානන්තරං ගය්හන්ති, එවමිධ සූය්‍යමානසද්දසමනන්තරං ති[1] දට්ඨබ්බං. ඉධ ච සන්නිට්ඨානාදීනං අභාවෙන ඝට්ටනෙන සද්ධිං යෙව සද්දස්ස උප්පජ්ජනතො "ලභිත්වා පතුපජ්ජමානං"ති ආදිනයො න ලබ්භති. ඝට්ටනං හි පඨමජවනාදීසු පි ලබ්භතෙ ව. තෙනාහ (684) **සහ සද්දවසෙනාති**. අථ ඝට්ටන-චලනානං කො විසෙසොති?

ඝට්ටනං පච්චයවිසෙසෙන භූතකලාපානං අඤ්ඤමඤ්ඤං ආසන්නතරුප්පාදො; චලනං එකස්ස පි දෙසන්තරුප්පාදන පරම්පරතා ති, අයමෙතෙසං විසෙසො. ගොසීසාදූපමා පෙත්ථ යථාසම්භවං යොජෙතබ්බා. **සා වාති** සා එව සහසද්ද විඤ්ඤත්ති **සක්‍යකුලින්දුනාති** සුපරිසුද්ධ-ගගනතල-සදිසස්ස සක්‍යරාජකුලස්ස අවභාසකත්තෙන තස්ස නිසාකරභූතෙන. අථ වා ඉන්දති පරමිස්සරියං කරොතීති ඉන්දූති ඉන්දුසද්දස්ස උත්තමවාචකත්තා සක්‍යකුලුත්තමෙනාති අත්ථො.

(685.) අථ විඤ්ඤත්ති තාව සහසද්දා ච. සද්දො පන චිත්තජො අවිඤ්ඤත්තිකො අත්ථීති වෙ? නත්ථීති දස්සෙන්තො ආහ **සද්දො න චිත්තජොති** ආදිං. **විඤ්ඤත්තිඝට්ටනං ති** විඤ්ඤත්තිපච්චයං පථවීධාතුයා ඝට්ටනං **ධාතුසංඝට්ටනෙනෙවා ති** ආදිනා වුත්තමෙවත්ථං සමත්ථෙති. යස්මා ධාතුසංඝට්ටනෙනෙව සද්දො ජායති, න තෙන විනා, තස්මාති අත්ථො. අනෙන ච යෙ වදන්ති "විතක්කවිප්ඵාරසද්දො න සොතවිඤ්ඤෙය්‍යො"ති **මහාඅට්ඨකථායං** වුත්තත්තා චිත්තසමුට්ඨානො විතක්කවිප්ඵාරසද්දො විඤ්ඤත්තියා විනාපි උප්පජ්ජති, යා තාය වාචාය විඤ්ඤාපනතාති හි වචනතො අසොතවිඤ්ඤෙය්‍යෙන සද්දෙන සහ විඤ්ඤත්ති න

---

1. — සද්දසවණානන්තරං ති.

උප්පජ්ජති, තතොව චිත්තජොපි සද්දනවකො අත්ථී"ති තෙසං වාදං පටික්ඛිපති. **මහාඅට්ඨකථාවාදෙ** පි හි සද්දො ච හොති, න සොතවිඤ්ඤෙය්‍යොති විරුද්ධමෙතන්ති මඤ්ඤමානෙහි සංගහකාරෙහි පටික්ඛිත්තොව. **ආනන්දාචරියො** පන අට්ඨකථාවාදං අපටික්ඛිපිත්වාව තත්ථ අධිප්පායං වණ්ණෙති; කථං? ජිව්හා-තාලු චලනාදිකර - විතක්කසමුට්ඨිතං විඤ්ඤත්තිසහජමෙව සුඛුමසද්දං දිබ්බසොතෙන සුත්වා ආදිසතී ති සුත්තෙන, **පට්ඨානෙ** ච ඔළාරිකං සද්දං සන්ධාය සොතවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයභාවො වුත්තොති ඉමිනා අධිප්පායෙන විතක්කවිප්ඵාරසද්දස්ස අසොතවිඤ්ඤෙය්‍යතා වුත්තාති.

(686) **විඤ්ඤාපනතො** ති වචීඝොසෙන අධිප්පායවිඤ්ඤාපනහෙතුත්තා. **සයං විඤ්ඤෙය්‍යතො** ති වචීගහණානුසාරෙන[1] වචීඝොසෙන ච හෙතුනා සයං විඤ්ඤෙය්‍යත්තා. **තස්සා** ති විඤ්ඤත්තිසද්දස්ස. **සම්භවො කාරණද්වයෙ** ති විඤ්ඤාපයතී ති විඤ්ඤත්ති, විඤ්ඤායතීති විඤ්ඤත්තී ති එවං හෙතුම්හි කම්මනි වා තස්ස සම්භවො නිබ්බත්ති හොතී ති අත්ථො. කිං පනෙතං විඤ්ඤත්තිද්වයං චිත්තසමුට්ඨානං, උදාහු කම්මාදිසමුට්ඨානන්ති ආහ (687.) **විඤ්ඤත්තිද්වයං** ති ආදිං. **අට්ඨ රූපානි විය** ති සක-සක-කලාපගත-අට්ඨ-රූපානි විය විඤ්ඤත්තිද්වයස්ස එකතො වුච්චමානත්තා කායවිඤ්ඤත්තිසහජකලාපෙ සද්දො න ලබ්භතී ති වචීවිඤ්ඤත්තිකලාපෙ ලබ්භමානම්පි තං හිත්වා අට්ඨ ඉච්චෙව වුත්තං. යථාවුත්තවිකාරගහණමුඛෙන "අයං ඉදං නාම කාතුකාමො"ති තංසමඞ්ගිනො අධිප්පායො විඤ්ඤායතී ති ආහ **අධිප්පායප්පකාසනරසා** ති. කායවිප්ඵන්දනහෙතුභූතාය වායොධාතුයා විකාරත්තා තස්ස කායවිප්ඵන්දනස්ස හෙතුභාවාකාරෙන පච්චුපට්ඨාතීති වුත්තං **කායවිප්ඵන්දනහෙතුභාවපච්චුපට්ඨානා** ති. වායොධාතුයා කිච්චාධිකතාය ආහ **චිත්තසමුට්ඨානවායොධාතුපදට්ඨානා** ති. **වචීඝොසස්ස හෙතුභාවපච්චුපට්ඨානා** ති වුත්තනයෙනෙව වචීඝොසසංඛාතස්ස චිත්තජසද්දස්ස හෙතුභාවපච්චුපට්ඨානා.

කෙචි පනෙත්ථ ඝට්ටනෙන පච්චයොති වුත්තත්තා ඝට්ටනානන්තරං සද්දස්ස උප්පත්ති හොතී ති ගහෙත්වා චිත්තසමුට්ඨාන-පථවීධාතු උපාදින්නඝට්ටනමත්තං කරොති; ඝට්ටිතක්ඛණෙ උතුසමුට්ඨානොව සද්දො උප්පජ්ජති. සො පන චිත්තපච්චයත්තා පරියායෙන චිත්තසමුට්ඨානොති වුච්චතී ති වදන්ති. තෙසං මතෙන චිත්තජසද්දො යෙව න ලබ්භති. තස්මා එවං අගහෙත්වා උදකතාපන-

---

1. M. ගහණානුසාරෙන. 1. B. ගණ්ඨෙන.

කාලෙ අඤ්ඤාලද්ධකෙ යෙව උප්පජ්ජනකසද්දො විය උපාදිනෙන ඝට්ටනා උප්පජ්ජමානචිත්තසමුට්ඨාන-පථවීධාතුයා උප්පත්තිසමකාලමෙව තස්මිං කලාපෙ නවමං හුත්වා අඤ්ඤො යෙව භූතිකසද්දො උප්පජ්ජතී ති ගහෙතබ්බං. තස්මා චිත්තසමුට්ඨාන - සද්දො පි වචීවිඤ්ඤත්තිවසෙනෙව උප්පජ්ජති. අච්ඡරාපහරණාදිසද්දො පන වචීවිඤ්ඤත්තියා අභාවතො චිත්තපච්චය-උතුසමුට්ඨානො යෙවාති.

(688.) විග්ගහාභාවතො න කස්සති, කසිතුං ඡින්දිතුං න සක්කාති අකාසො, සො යෙව ආකාසොති ආහ **න කස්සතී ති ආකාසො** ති. කො පනෙසොති ආහ: **රූපානං විවරො** ති. කණ්ණච්ඡිද්දාදිරූපානං අන්තරං ති අත්ථො. අනෙන අජටාකාසමාහ. **යො රූපානං පරිච්ඡෙදො** ති ඉමිනා ඉධාධිප්පෙතමාකාසං. සො පන රූළ්හිවසෙන ආකාසොති වුච්චති. රූපානි පරිච්ඡින්දති, සයං වා තෙහි පරිච්ඡිජ්ජති, තෙසං වා පරිච්ඡෙදමත්තන්ති රූපපරිච්ඡෙදො. ලක්ඛණමෙතස්සාති රූපපරිච්ඡෙදලක්ඛණො. අයං හි තං තං රූපකලාපං පරිච්ඡින්දන්තො විය හොති. තෙනාහ **රූපපරියන්තප්පකාසනරසො** ති. අයං රූපානං හෙට්ඨිමො පරියන්තො, අයමුපරිමොති එවං විභාවනකිච්චොති අත්ථො. අත්ථතො පන යස්මා රූපානං පරිච්ඡෙදමත්තං හුත්වා ගය්හති, තස්මා වුත්තං **රූපමරියාදපච්චුපට්ඨානො** ති.

එත්ථාහ: කිම්පනෙස රූපෙ පරිච්ඡින්දන්තො චතුසමුට්ඨානකලාපතො පරිච්ඡින්දති, අථ එකසමුට්ඨානබහුකලාපතො, උදාහු එකෙකසමුට්ඨාන - එකෙකකලාපතො, එකෙකරූපතො වාති? එකෙකසමුට්ඨාන - එකෙකකලාපතොති දට්ඨබ්බං. යදි හි චතුසමුට්ඨානකලාපතො එකසමුට්ඨානබහුකලාපතො වා පරිච්ඡින්දෙය්‍ය[1], එවං සති එකකලාපගතරූපානං විය නානාකලාපගතරූපානම්පි අවිනිබ්භොගප්පවත්තිතා ආපජ්ජෙය්‍ය; අථ වා එකෙකරූපතො පරිච්ඡින්දති, එවං සති එකෙකකලාපගතරූපානම්පි නානාකලාපගතරූපානං විය අඤ්ඤමඤ්ඤවිනිබ්භොගවුත්තිතාපසඞ්ගො සියා. උභයම්පි පනෙතං අනිට්ඨං. තස්මා එකෙකසමුට්ඨාන - එකෙකකලාපතො පරිච්ඡින්දති ති දට්ඨබ්බං. **අසම්ඵුට්ඨභාව - ඡිද්දවිවරභාවපච්චුපට්ඨානො වා** ති අසම්ඵුට්ඨභාවපච්චුපට්ඨානො වා ඡිද්දවිවරභාවපච්චුපට්ඨානො වා ති වුත්තං හොති. තත්ථ යස්මිං කලාපෙ භූතානං පරිච්ඡෙදො, තෙහෙව අසම්ඵුට්ඨභාවෙන පච්චුපට්ඨානතො අසම්ඵුට්ඨභාවපච්චුපට්ඨානො. කිඤ්චාපි හි කලාපන්තරභූතා කලා-

1. M. පරිච්ඡින්දති.

පන්තරභූතෙහි සම්බුද්ධාව එකඝනපිණ්ඩභාවෙන පවත්තා. තථාපි ධම්මතො අඤ්ඤමඤ්ඤවිවිත්තත්තා අසංකිණ්ණා එව. තෙසං ච යා විවිත්තතා අඤ්ඤමඤ්ඤං අසංකිණ්ණතා අයං ආකාසධාතු[1]. සො පන තෙසං පරිච්ඡෙදෙ භූතන්තරෙහි විය තෙහි සො අසම්ඵුට්ඨොව. ඉතරථා පරිච්ඡින්නතා න සියා, තෙසං භූතානං ව්‍යාපිභාවාපත්තිතො. අව්‍යාපිභාවො හි අසම්ඵුට්ඨතා. තෙනාහ භගවා ඉමස්ස නිද්දෙසෙ "අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහී"ති.

අථවා කලාපන්තරභූතානං අඤ්ඤමඤ්ඤං අසංකිණ්ණභාවෙන පච්චුපට්ඨානතො අසම්ඵුට්ඨතාපච්චුට්ඨානභාවො වුත්තො. කණ්ණච්ඡිද්ද-මුඛවිවරාදිවසෙන ඡිද්දවිවරභාවස්ස පච්චුපට්ඨානතො ඡිද්දවිවරභාවපච්චුපට්ඨානතා වුත්තා. රූපපරිච්ඡෙදෙ හි සති ඡිද්දවිවරභාවො හොති. යෙසං රූපානං පරිච්ඡෙදො, තෙහෙව තෙසං පරිච්ඡෙදභාවෙන ලබ්භතීති වුත්තං **පරිච්ඡින්නරූප-පදට්ඨානො ති.**

**රූපස්ස ලහුතාදිත්තයනිද්දෙසෙ** ති රූපස්ස ලහුතා, රූපස්ස මුදුතා, රූපස්ස කම්මඤ්ඤතාති ඉමස්ස රූපලහුතාදිත්තයස්ස නිද්දෙසෙ සම්පතෙත ඉදං වුච්චතීති අධිප්පායො. (689.) **හෙට්ඨා වුත්තනයෙනෙවාති** අරූපස්ස ලහුතාදිසු කායලහුභාවො කායලහුතාති ආදිනා වුත්තනයානුසාරෙනෙව රූපස්ස ලහුභාවො රූපලහුතාති ආදිනා රූපසම්බන්ධීභාවෙන රූපවිකාරාපි විඤ්ඤාතබ්බා. රූපස්ස ලහුභාවො ලහුතා. සා රූපස්ස ගරුභාවවූපසමලක්ඛණා; ගරුභාවනිම්මද්දනරසා; අදන්ධතාපච්චුපට්ඨානා. රූපස්ස මුදුභාවො මුදුතා; සා රූපස්ස ථද්ධභාවවූපසමලක්ඛණා; ථද්ධභාවනිම්මද්දනරසා; සබ්බක්‍රියාසු අවිරොධිතාපච්චුපට්ඨානා. රූපස්ස කම්මඤ්ඤභාවො කම්මඤ්ඤතා; සා රූපස්ස අකම්මඤ්ඤභාවවූපසමලක්ඛණා; අකම්මඤ්ඤභාවනිම්මද්දනරසා; සරීරක්‍රියාසු අනුකූලභාවපච්චුපට්ඨානා; කම්මඤ්ඤරූපපදට්ඨානාති. අයමෙත්ථ පනෙත්ථ තත්ථ තත්ථ අමෙහි වුත්තානුසාරෙන වෙදිතබ්බො. ඉමා පන තිස්සො රූපානං විකාරභාවතො රූපවිකාරාති වුච්චන්තීති දස්සෙතුං **තිස්සො =පෙ= විභාවිතා ති** වුත්තං. යථාක්කමං පනෙතා රූපස්ස දන්ධත්තකර-ධාතුක්ඛොභපටිපක්ඛ-පච්චයසමුට්ඨානා, ථද්ධත්තකර ධාතුක්ඛොභ - පටිපක්ඛපච්චයසමුට්ඨානා, රූපානං සරීරක්‍රියාසු අනුකූලභාවකර - ධාතුක්ඛොභපටිපක්ඛ - පච්චයසමුට්ඨානාති වෙදිතබ්බා. තත්ථ **ධාතුක්ඛොභොති** වාතපිත්තසෙම්හප්පකොපො; රසාදිධාතූනං වා විකාරාවත්ථා. ද්විධා වුත්තාපි අත්ථතො පථවීධාතුආදීනං යෙව විකාරොති දට්ඨබ්බං. පටිපක්ඛප්පච්චයා සප්පායඋතුආහාර

1. M. පරිච්ඡෙදෙ.

විකම්භිතත්තා.[1] සා ච[2] තංතංවිකාරස්ස විසෙසපච්චයභාවතො වුත්තා. අවිසෙසෙන පන සබ්බෙසං පච්චයා. තථා හි තෙ කදාචිපි අඤ්ඤමඤ්ඤං න විජහන්ති; තථා අවිජහන්තානං පන දුබ්බිජානියං නානත්තංති තං පකාසනත්ථං (690) **එතාසංති** ආදි වුත්තං. **කමතො ච නිදස්සනං**ති සම්බන්ධො. ලහුතාය හි අරොගී නිදස්සනං; මුදුතාය මද්දිතචම්මං; කම්මඤ්ඤතාය සුධන්තං සුවණ්ණං. තත්‍ර චෙත්ථ අරොගිනො තාව නිදස්සනං යුත්තං, තස්ස ඉන්ද්‍රියබද්ධසන්තානගතත්තා. සුපරිමද්දිතචම්ම-සුවණ්ණානං පන කථං? න හි අනින්ද්‍රියබද්ධරූපසන්තානෙ ලහුතාදීනි සම්භවන්ති, තත්ථ ධාතුක්ඛොභපටිපක්ඛපච්චයාභාවතො? සච්චං; මුදුකම්මඤ්ඤසදිස රූපනිදස්සනමත්තමෙතං; න පන තත්ථ ඉධාධිප්පෙතමුදුතාකම්මඤ්ඤතාසම්භවතො[3]. යදි එවං කථං තූලපිචුආදීසු ලහුභාවාදිකංති? න තත්ථ පරමත්ථතො ලහුභාවාදිකං අත්ථි; ගරුභාවාදිහෙතූනං පන අභාවතො තත්ථ ලහුභාවාදිවොහාරො.

(691.) **කම්මං කාතුං න සක්කොතී**ති එකන්තෙන තාසං පච්චුප්පන්නපච්චයාපෙක්ඛත්තා, ඉතරථා සබ්බදාභාවිනීහි ලහුතාදීහි භවිතබ්බං සියා. [71.] **අදන්ධතාලක්ඛණා**ති අගරුභාවලක්ඛණා. ගරුභාවස්ස විනොදනං ඛිපනං අපනයනං කිච්චමෙතිස්සාති **ගරුභාවවිනොදනරසා.** කිඤ්චාපි හි අයං රූපානං ගරුභාවං විනොදෙතුං සක්කොති, ගරුරූපපටිපක්ඛානං පන අදන්ධරූපානං විකාරත්තා "ජාති[4] උප්පාදෙතී"ති ආදීසු විය පරියායෙන ගරුභාවං විනොදෙති නාම. තස්සා හි විජ්ජමානාය උප්පන්නරූපානං අගරුභාවො යෙවාති. එස නයො මුදුතාකම්මඤ්ඤතාසු.

චෙතසිකලහුතාදයො පන අත්තනො අත්තනො පච්චනීකානං තංතංඅකුසලධම්මානං විද්ධංසනභාවෙන පවත්තන්තීති විකාරමත්තභාවතො නිප්පරියායෙන ච තාසං තංකිච්චතා ලබ්භතීති දට්ඨබ්බං. **ලහුපරිවත්තිතාපච්චුපට්ඨානා**ති අදන්ධස්ස අරොගීපුරිසස්ස අපරාපරං සංකන්තිපරිවත්තනං විය අදන්ධපරිවත්තනං හුත්වා පච්චුපට්ඨාතීති අත්ථො. යස්ස රූපස්ස ලහුතා තස්සෙව විකාරභාවෙන උපලබ්භනතො **ලහුරූපපදට්ඨානා.** එවමිතරාසුපි. **අථද්ධතා**ති අකඨිනතා. අත්තනො මුදුභාවෙනෙව සබ්බකිරියාසු අවිරුද්ධා හුත්වා පච්චුපට්ඨාතීති **අවිරොධිතාපච්චුපට්ඨානා.** මුදු හි කත්ථචි න විරුජ්ඣති. තීසු ඨානෙසු පටිපක්ඛත්ථෙ අකාරො. දන්ධතාහෙතූනං පටිපක්ඛසමුට්ඨානත්තා ලහුතාදීනංති කෙචි. අපරෙ පන සන්තා-පටිසෙධෙති වදන්ති.

---

1. M—ආහාරාවිකම්භිතත්තාවිත්තතා 2. M. තෙ ච. 3. M. -සම්භවතො. 4. M. ජාති තං.

සරීරෙන කත්තබ්බකිරියානං අනුකූලතාසඞ්ඛාතො කම්මඤ්ඤ-භාවො ලක්ඛණමෙතිස්සාති සරීරක්‍රියානුකූල - කම්මඤ්ඤභාව ලක්ඛණා. අකම්මඤ්ඤං දුබ්බලං නාම හොතීති කම්මඤ්ඤතා අදුබ්බලභාවපච්චුපට්ඨානා වුත්තා. (692.) **රූපානමාචයො හොති** ආදීසු යො නිප්ඵන්නරූපානං ආදිතො චයො, යථාපච්චයං තතො තතො ආගතස්ස විය චයොති වා ආචයසඞ්ඛාතො රූපානං පඨමුප්පාදෙ වඩ්ඪි චයො[1] උපචයොති උද්දෙසෙ වුත්තො. "උපඤ්ඤත්තං උපසිත්තං"ති ආදීසු විය උපසද්දස්ස පඨමූපරි අත්ථදස්සනතො. යා පන තෙසං යෙව රූපානං අනුප්පබන්ධතා අනුප්පබන්ධනවසෙන පවත්ති, සා සන්තතීති පවුච්චති. පටිසන්ධික්ඛණෙ හි රූපුප්පත්ති ආදිචයභාවතො ආචයො නාම; තතො පරං යාව සත්තරසමචිත්තුප්පාද වඩ්ඪිභාවතො උපචයො නාම. තදා හි රූපස්ස කම්ම - චිත්ත - උතුහි චයො යෙව, න හානි. අථ වා යාව ආහාරසමුට්ඨානරූපුප්පාදෙ චක්ඛාදි - උප්පාදෙ වා තාව උපචයො නාම; තතො පරං පන චුතිපරියොසානං සන්තති නාම. එවං ච කත්වා "යො ආයතනානං ආචයො සො රූපස්ස උපචයො, යො රූපස්ස උපචයො සා රූපස්ස සන්තතී"ති එවං උපචය-සන්තතීනං අත්ථතො නානත්තාභාවදීපනත්ථං වුත්තාය පාළියා අට්ඨකථායං "ආචයො නාම නිබ්බත්ති, උපචයො නාම වඩ්ඪි, සන්තති නාම පවත්තී"ති වත්වා "නදීතීරෙ ඛතකූපම්හි උදකුග්ග-මනකාලො විය ආචයො නිබ්බත්ති; පරිපුණ්ණකාලො විය උපචයො වඩ්ඪි; අජ්ඣොත්ථරිත්වා ගමනකාලො විය සන්තතී"ති උපමා වුත්තා. **රූපානමාචයොති** චෙත්ථ බහුවචනනිද්දෙසෙන උප්පාදෙ නාම උප්පජ්ජමානානං විකාරො, විකාරත්තෙන ච සති අනත්තතො විකාරවන්තධම්මභෙදභින්නත්තා එකක්ඛණෙ පි උප්පජ්ජමානානං බහුන්නම්පි රූපානං විසුං විසුං යෙව උප්පාද විකාරභාවො, න පිණ්ඩස්සෙවාති[2] දීපිතං හොති. න කෙවලං ච රූපානමෙව උප්පත්ති ඊදිසී, අථ ඛො අරූපධම්මානම්පි උප්පාදෙ රූපාරූපධම්මානං ජරතා අනිච්චතා, රූපස්ස ලහුමුදුකම්මඤ්ඤතා වා ති දට්ඨබ්බං.

(693.) **ජාතිරූපං** ති දීපිතං අට්ඨකථාසු. උභයස්සාපි රූප්පනසභාවත්තාති අධිප්පායො. යදි එවං කස්මා විභජ්ජ වුත්තං? භගවතා තථෙව දෙසිතත්තා. භගවතාපි කස්මා තථා දෙසිතන්ති ආහ: **වුත්තමාකාරනානත්තා**ති. ආකාරනානත්තං හෙට්ඨා විභාවිතමෙව. ආකාරස්ස[3] පඨමුප්පත්ති උපචයො;

---

1. M. චයො 2. M. පිණ්ඩං යෙවාති. (අපපාඨො.) 3. M. අක්ඛරස්ස.

පුනප්පුනං උප්පත්ති සන්තති. එවං සෙසසමුට්ඨානරූපානම්පි[1] දට්ඨබ්බං ති එවම්පි තෙසං ආකාරනානත්තං වණ්ණෙන්ති. **වෙනෙය්‍යානං වසෙන වා**ති තද කිර සොතූනං එවං චිත්තං උප්පන්නං: අයං ජාති සබ්බෙසං ධම්මානං පභවො[2]; තම්පන න කුතොචි ජායති, යථා තං පකතිවාදීනං පකතීති. තෙසං මිච්ඡාගාහං විධමෙන්තො සත්ථා ජාති නාම න අඤ්ඤා, උපචය-සන්තතිවසෙන ඨිතා රූපුප්පත්ති යෙව පන තථා පවුච්චති. සා ච. යස්ස උප්පාදෙ තස්ස පච්චයෙහෙව ජාතපරියායං ලභතීති දස්සනත්ථං උපචයො සන්තතීති ද්විධා භින්දිත්වා දෙසෙතීති ආචරියා.

**පුබ්බන්තතො**ති පුබ්බකොට්ඨාසතො, අනාගතභාවතො ති අත්ථො. උප්පජ්ජමානො රූපධම්මො උප්පාදෙ අනාගතක්ඛණතො උම්මුජ්ජාපෙන්තො විය හොතීති වුත්තං **උම්මුජ්ජාපනරසො**ති. ඉමෙ රූපධම්මා "සම්පටිච්ඡථ නෙ" නිය්‍යාතෙන්තො විය ගය්හතීති වුත්තං **නිය්‍යාතනපච්චුපට්ඨානො**ති. පරිපුණ්ණභාව-පච්චුපට්ඨානතා උපරි චයො උපචයොති ඉමස්ස අත්ථස්ස වසෙන වෙදිතබ්බා. යථා උප්පාදක්ඛණප්පත්තං උප්පන්නං නාම හොති ආදිකම්මෙ තප්පච්චයස්ස වසෙන, එවං උප්පාදක්ඛණගතං උපචිතං නාම හොතීති වුත්තං **උපචිතරූපපදට්ඨානො**ති. **පවත්තිලක්ඛණා**ති අනුප්පබන්ධතො උප්පත්තිවසෙන පවත්ත-මානරූපානං පවත්තනන්ති ලක්ඛිතබ්බා. **අනුප්පබන්ධනරසා**ති පුබ්බාපරවසෙන අනුප්පබන්ධනකිච්චා. අසති හි උප්පාදෙ පුබ්බාපරවසෙන අනුප්පබන්ධො න සියා. අනුප්පබන්ධනරසත්තා යෙව අනුපච්ඡෙදවසෙන ගහෙතබ්බතො ආහ: **අනුපච්ඡෙද-පච්චුපට්ඨානා**ති. පුබ්බාපරවසෙන ඝටිතරූපෙසු උපලබ්භනතො වුත්තං **අනුප්පබන්ධකරූපපදට්ඨානා**ති.

**ජීරණ**න්ති ජිණ්ණභාවො, අභිනවභාවහානීති අත්ථො. (694.) **පාකටා** රූපධම්මෙසු, ඛණ්ඩිච්චාදිභාවෙන දන්තාදිසු විකාර-දස්සනතො. ඉතරා තදභාවතො **අපාකටා.** කාමං රූපධම්මානම්පි ඛණිකජරා පටිච්ඡන්නා එව, යං අවීචිජරාතිපි වුච්චති. අරූප ධම්මානං පන ජරාය සුට්ඨු පටිච්ඡන්නභාවදස්සනත්ථං **පාකටා රූපධම්මෙසූ**ති අවිසෙසෙන වුත්තං. ඛණ්ඩිච්චාදිවිකාරො පන ඛණිකජරාය නත්ථි. රූපපරිපාකො රූපධම්මානං ජිණ්ණතා. ජරප්පත්තස්ස භංගො අවස්සභාවීති වුත්තං **උපනයනරසා**ති, භංගුපනයනකිච්චාති අත්ථො. **සභාවානපගමෙ** පීති කක්ඛලත්තාදි-

1. M. තිසමුට්ඨානරූපානම්පි. 2. M සභාවො.

සභාවානපගමෙ පි; ඨිතික්ඛණෙ හි ජරා නාම; න ච තද්-ධම්මසභාවං[1] විජහති. නවභාවො උප්පාදවත්ථා, තස්සා අපගමභාවෙන ගය්හතීති ආහ **නවභාවාපගමපච්චුපට්ඨානාති.** **වීහිපුරාණභාවො වියාති** වීහිභාවානපගමෙ පි අභිනවභාවාපගමනකරො වීහිපුරාණභාවො විය. වීහිපුරාණභාවො තාව රසාදිං[2] අපනෙති, අයම්පන කෙවලං උප්පාදවත්ථමෙව අපනෙති. පරිතො සබ්බතො භිජ්ජනන්ති ලක්ඛිතබ්බාති **පරිභෙදලක්ඛණා.** නිච්චං නාම ධුවං. රූපං පන ඛණභඞ්ගිතාය න නිච්චන්ති අනිච්චං. තස්ස භාවො අනිච්චතා, සා පන ඨිතිප්පත්තරූපං ඨිතියමෙව විනාසභාවෙන සංසීදෙන්තී විය හොතීති **සංසීදනරසා.** යස්මා ච සා භඞ්ගභාවතො ඛයවයාකාරෙනෙව ගය්හති, තස්මා වුත්තං **ඛයවයභාවපච්චුපට්ඨානාති.** අනුක්කමෙන විනාසො ඛයො නාම; දීපවට්ටිකානුසාර - තෙලස්ස[3] විය සහ නිරොධො වයොති වදන්ති.

**72. සමොධානතොති** රාසිතො. **කෙචීති** අභයගිරිවාසිනො. මිද්ධරූපස්ස වදනසීලා, මිද්ධං වාදෙ එතෙසන්ති වා මිද්ධවාදිනො. **මිද්ධරූපං නාමාති** උතුචිත්තාහාරවසෙන තිසමුට්ඨානං මිද්ධං නාම රූපං. **තෙ පටික්ඛිපිතබ්බාති** සම්බන්ධො. කථං පටික්ඛිපිතබ්බාති ආහ: **අද්ධා මුනීසීති** ආදිං. **නත්ථි නීවරණා තවාති** සොතාපත්තිමග්ගෙන විචිකිච්ඡානීවරණස්ස; අනාගාමිමග්ගෙන කාමච්ඡන්ද - ව්‍යාපාද - කුක්කුච්චනීවරණානං, අරහත්තමග්ගෙන ථිනමිද්ධුද්ධච්චනීවරණානං[4] ච පහීනත්තා. අයමෙත්ථ අධිප්පායො: යදි මිද්ධං රූපං සියා, අප්පහාතබ්බං භවෙය්‍ය, "රූපක්ඛන්ධො අභිඤ්ඤෙය්‍යො පරිඤ්ඤෙය්‍යො, න පහාතබ්බො, න භාවෙතබ්බො, න සච්ඡිකාතබ්බො"ති, "කතමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා? චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච; ඉමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා"ති වචනෙන රූපධම්මානං පහාතාභාවතො. එවං ච සති තස්ස නීවරණභාවො විරුජ්ඣෙය්‍ය, නීවරණානං පහාතබ්බත්තා, න හි නීවරණා අප්පහාතබ්බතෙන:

"යා මෙ කඞ්ඛා පුරෙ ආසි; තං මෙ අක්ඛාසි චක්ඛුමා
අද්ධා මුනීසි සම්බුද්ධො, නත්ථි නීවරණා තවා"ති

---

1. M. ධම්මො සභාවං 2. M. සබ්බාවත්ථාහි (අපපාඨො.)
3. M. දීපවට්ටිකාය සහ තෙලස්ස 4. M ථිනමිද්ධනීවරණානං ච

නීවරණප්පහාණෙන භගවතො වොමතා යුජ්ජෙය්‍ය. යදි සියා "රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථා"ති ආදි වචනතො රූපස්ස පහාතබ්බතාපි පඤ්ඤායතීති? තං න. තබ්බිසය ඡන්දරාගප්පහාණස්ස තත්ථ අධිප්පෙතත්තා, තෙනාහ භගවා: "යො භික්ඛවෙ රූපෙ ඡන්දරාගවිනයො තං තත්ථ පහාණං"ති. න ච පනෙතං සක්කා වත්තුං එත්ථා පි තබ්බිසයඡන්දරාගප්පහාණ-වසෙනෙව වුත්තන්ති, සාධකවචනාභාවතො, කාමච්ඡන්දාදීනං තථා පහාණස්ස අනධිප්පෙතත්තා ච. තස්මා "තත්ථි නීවරණා තවා"ති ආදි-වචනෙහි විරුජ්ඣනතො න මිද්ධං රූපන්ති.

යදි පන පරො දළ්හමූළ්හගාහිතාය තබ්බිසයඡන්දරාගප්ප-හාණවසෙනෙව නීවරණප්පහාණං අධිප්පෙතන්ති ඡලවාදං[1] ඔඩ්ඩෙය්‍ය, තස්ස තං නිසෙධනත්ථං පුන ථීනමිද්ධනීවරණස්ස අවිජ්ජානීවරණෙන සහ සම්පයොගවචනං ච ආහරන්තො ආහ **"ථීනමිද්ධනීවරණං"**ති ආදිං, ථීනමිද්ධනීවරණං නීවරණං චෙව අවිජ්ජානීවරණෙන නීවරණසම්පයුත්තං ති සම්බන්ධො, ඉදං වුත්තං හොති:- චතූහි සම්පයොගො හොතීති වචනතො අරූපධම්මානමෙව අඤ්ඤමඤ්ඤසම්පයොගො ලබ්භති, න රූප-ධම්මානං අඤ්ඤමඤ්ඤං, අරූපෙහි වා, තස්මා යදි මිද්ධං රූපං සියා න තං සම්පයොගවචනමරහති. අථ සියා: යථාලාභවචනමෙත්ථ[2] සක්කා විඤ්ඤාතුං "සක්ඛරකථලකං මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පී"ති ආදිසු සක්ඛරකථලකස්ස චරණා-යොගතො මච්ඡගුම්බාපෙක්ඛාය චරණං, උභයාපෙක්ඛාය ඨානං ති එවං යථාලාභං යොජීයති, එවමිධාපි ථීනාපෙක්ඛාය සම්පයොග-වචනං, උභයාපෙක්ඛාය නීවරණවචනං ති? තම්පි න, රූපභාව-ස්සෙව අසිද්ධත්තා, සිද්ධෙ හි රූපභාවෙ අසිද්ධවතො[3] යථාලාභයොජනා යුජ්ජෙය්‍යාති. එත්තකෙනෙව මිද්ධස්ස අරූපභාවෙ සිද්ධෙපි යථා ද්වික්ඛත්තුං බද්ධං සුබද්ධං හොති, එවං නෙකසුත්තසාධිතං අප්පධංසියං හොතීති පට්ඨානපකරණෙ "නීවරණං ධම්මං පටිච්ච = පෙ = පච්චයා"ති ඉමස්ස විභඞ්ගෙ "ආරුප්පෙ = පෙ = උප්පජ්ජතී"ති වුත්තං අරූපභවුප්පත්තිං ආහරන්තො ආහ **මහාපකරණෙ පට්ඨානෙ** ති ආදිං.

ඛාන්තිකන්තිආදීනම්පි ධම්මතො ලොභාදිභාවතො කාමච්ඡන්දනීවරණාදීහි අභින්නත්තා වුත්තං කාමච්ඡන්දනීවරණන්ති ආදිං. එත්ථ සියා: "පඤ්චිමෙ භික්ඛවෙ ආවරණීයා ධම්මා නීවරණා"ති ආදිසු ථීනමිද්ධස්ස නීවරණභාවෙන එකතො

---

1. M. ඡලවාදං, 2. B. උභයථා වචනමෙත්ථ. 3. N. අසම්භවතො.

ආගතත්තා ඉධාපි ථිනමිද්ධනීවරණන්ති එකතො වුත්තං. ථිනමෙව ච පන අරූපභවෙ උප්පජ්ජති, න මිද්ධන්ති, නයිදං ච සාරං[1], කුක්කුච්චස්ස න ගහිතත්තා. යදි හි එකතො ගහිතමෙතෙනෙව ඉධාපි එකතො ගහණං සියා, කුක්කුච්චස්සපි තත්ථ එකතො වුත්තස්ස ඉධ ගහණං භවෙය්‍ය;[2] න පනෙවං අත්ථි, උද්ධච්චනීවරණං යෙව වුත්තත්තා. තස්මා න තස්ස අරූපභවුප්පත්තිං සක්කා පටිබාහිතුන්ති.

ආදිසද්දෙන "කෙවලො හායං භික්ඛවෙ අකුසලරාසි යදිදං පඤ්චනීවරණා;" "පඤ්චනීවරණෙ පහාය විගතථිනමිද්ධො ති තස්ස ථිනමිද්ධස්ස වන්තත්තා චත්තත්තා මුත්තත්තා පහීනත්තා පටිනිස්සට්ඨත්තා, තෙන වුච්චති විගතථිනමිද්ධො"ති; "ඉදං චිත්තං ඉමම්හා ථිනමිද්ධම්හා සොධෙති, විසොධෙති, පරිසොධෙති, මොචෙති විමොචෙති පරිමොචෙතීති එවමාදිං පාළිං සඞ්ගණ්හාති. යදිපි සියා දුවිධං මිද්ධං රූපං අරූපන්ති. තං පි න විසෙසවචනාභාවතො[3]. න හි විසෙසෙත්වා මිද්ධං නීවරණෙසු දෙසිතං. "යදපි භික්ඛවෙ ථිනං තදපි නීවරණං, යදපි මිද්ධං තදපි නීවරණං, ථිනමිද්ධං නීවරණං ති ඉති හිදං උද්දෙසං ආගච්ඡතී"ති අවිසෙසෙන වුත්තා, තස්මා මිද්ධස්ස දුවිධතං පරිකප්පෙත්වාපි න සක්කා නීවරණභාවං නිවත්තෙතුං. සක්කා හි වත්තුං: යං තං අරූපතො අඤ්ඤං මිද්ධං පරිකප්පිතං, තම්පි නීවරණං මිද්ධසභාවත්තා, ඉතරනීවරණං වියාති. යදි මිද්ධස්ස රූපභාවං න සම්පටිච්ඡථ, කථං භගවතො නිද්දාති? නනු මිද්ධස්ස නිද්දා පචලායිකාති ආදිනා විභඞ්ගෙ වුත්තත්තා නිද්දාභාවො සිද්ධොති? නයිදමෙවං; ඉත්ථිලිඞ්ගාදීසු විය නිද්දාහෙතුතො මිද්ධස්ස නිද්දාභාවෙන විභත්තත්තා. එවම්පි නිද්දාහෙතුතො මිද්ධස්ස රූපභාවං[4] න[4] සම්පටිච්ඡථ[4], කථං භගවතො නිද්දාති? සා භගවතො නත්ථීති න සක්කා වත්තුං, "අභිජානාමි ඛො පනාහං අග්ගිවෙස්සන දිවා සුපිත"ති ආදිවචනතො ති? න නිද්දා භගවතො මිද්ධෙන; අථ ඛො සරීරගෙලඤ්ඤෙන. තං ච භගවතො නත්ථීති න සක්කා වත්තුං "පිට්ඨි මෙ ආගිලායති; තමහං ආයමිස්සාමී"ති වචනතො, න චෙත්ථ එවමවධාරණං දට්ඨබ්බං. මිද්ධමෙව නිද්දාහෙතූති. න හෙතු එව පන මිද්ධං ති එවමවධාරණං. තස්මා අඤ්ඤොපි අත්ථි නිද්දාහෙතු. කො පනසොති? සරීරගෙලඤ්ඤං, තස්මා න භගවතො නිද්දා මිද්ධහෙතුකාති දට්ඨබ්බා.

1. M. නයිදමසාරං. 2. M. සම්භවෙය්‍ය. 3. M. විසෙසනාභාවතො. 4. M. අභාවතො.

**72. විසුං විසුං අභාවං දස්සෙතුං** ති වායොධාතු-ආදිතො විසුං විසුං තබ්භාවං දස්සෙතුං කථං පන සො දස්සෙතබ්බොති ආහ **වායොධාතුයා** ති ආදිං. තත්ථ කායබලං නාම අත්ථතො වායොධාතුයා පවත්තිආකාරවිසෙසො, තස්සා විප්ඵාරභාවතො. යතො පාණානං[1] බලන්ති වදන්තීති වුත්තං **වායොධාතුයා ගහිතාය බලරූපං ගහිතමෙවා** ති. සම්භවො කාමධාතුයං එකච්චානං සත්තානං ඉන්ද්‍රියපරිපාකපච්චයො ආපොධාතුයා පවත්තිආකාරවිසෙසොති ආහ **ආපොධාතුයා සම්භවරූපං** ති. ගහිතාය ගහිතමෙවාති සම්බන්ධො. උපචයසන්තතීහි විනිමුත්තො රූපුප්පාදෙ නත්ථි, උප්පාදවත්ථාය ච අඤ්ඤා ජාති නාම නත්ථෙවාති වුත්තං **උපචයසන්තතිහි ජාතිරූපං** ති. කම්මසමුට්ඨානස්ස පි රොගස්ස විසභාගපච්චයසමුප්පන්නො ධාතුක්ඛොභො ආසන්නකාරණං, පගෙව ඉතරස්ස. සො අත්ථතො රූපධම්මානං පාකාවත්ථා ඨිතිභංගක්ඛණෙසු එව සියාති වුත්තං: **ජරතා අනිච්චතාහි රොගරූපං ගහිතං** ති.

රූපානි සමුට්ඨහන්ති ජායන්ති එතෙහීති රූපසමුට්ඨානානි: කානි පන තානීති ආහ: **උතුචිත්තාහාරකම්මානී** ති. (699) **ආහාරො රූපහෙතුයො** ති එත්ථ ඉතිසද්දො පක්ඛිපිතබ්බො කම්මං උතු ච චිත්තං ච ආහාරොති ඉමෙ රූපහෙතුයො ති. රූපහෙතූති ච රූපස්ස ජනකපච්චයො ති අත්ථො. තෙනාහ **එතෙහෙවා** ති ආදිං. එකමෙකං යෙව සමුට්ඨානං එතෙසන්ති **එකසමුට්ඨානා**. නනු එකතො එව පච්චයතො පච්චුප්පන්නස්ස උප්පත්ති නත්ථි ති? සච්චං; නත්ථි රූපජනකපච්චයෙසු **එකතාති**[2] අයමෙත්ථ අභිසන්ධි.

(700.) **අට්ඨින්ද්‍රියානි** ති චක්ඛාදීනි පඤ්ච, ඉත්ථිපුරිසින්ද්‍රියද්වයං, ජීවිතින්ද්‍රියං චාති අට්ඨින්ද්‍රියානි. (701) **කායවචීවිඤ්ඤත්ති**-වසෙන විඤ්ඤත්තිද්වයං. (702.) **ද්වීහි** ති කොචි චිත්තෙන, කොචි උතුනා චාති එවං ද්වීහි. න හි එකස්සෙව ද්වෙ එකක්ඛණෙ පච්චයා හොන්ති. එවං සෙසෙසුපි. **උතුආහාරචිත්තෙහි ලහුතාදිත්තයං කතං** ති එකෙකං උතුනා ආහාරෙන චිත්තෙන චාති තීහි කතං. (703.) **චතස්සො පි ච ධාතුයො** ති චත්තාරි මහාභූතානි; තානි හි නිස්සත්තනිජ්ජීවට්ඨෙන ධාතූති වුච්චන්ති. කම්මාදීහි චතූහි භවන්ති ති **චතුබ්භවා**. **ද්වෙ** ති ජරතා-අනිච්චතා.

---

1. M. බාලානං. 2. M. එකන්තාති.

ඉදානි මිස්සකසමුට්ඨානානි පි ගහෙත්වා තංතංපච්චයජාතානං ගණනපරිච්ඡේදං දස්සෙතුං (705) **කම්මෙනා** ති ආදි වුත්තං. තත්ථ අට්ඨින්ද්‍රියානි, වත්ථු, සුද්ධට්ඨකං, සන්තතූපචයාකාසානි **වීසති** කම්මජා. විඤ්ඤත්තිද්වයං, සද්දො, ලහුතාදිත්තයං සුද්ධට්ඨකාදයො එකාදසාති **සත්තරස චෙතසා** ජායරෙ, චිත්තජානි අත්ථො. සද්දො, ලහුතාදිත්තයං, සුද්ධට්ඨකාදයො එකාදසාති **දසපඤ්චෙව පණ්ණරස** උතුනා ජායරෙ. ලහුතාදිත්තයං සුද්ධට්ඨකාදයො එකාදසාති චුද්දස ආහාරතො (706) **ජරතාඅනිච්චතාහි තෙ අට්ඨසට්ඨි** ච හොන්තෙවාති සම්බන්ධො.

(707.) **ජරතානිච්චතා** චෙව **න කෙහි චි සමුට්ඨිතා** ති වත්වා පන තත්ථ කාරණං දස්සෙතුං **ජාතස්සා** ති ආදි වුත්තං. තත්ථ **ජාතස්ස පාකභෙදත්තා** ති ජරතාය ජාතධම්මස්ස පාකත්තා, අනිච්චතාය ච භෙදත්තාති අත්ථො. ඉදං වුත්තං හොති: ජරතා අනිච්චතා නාම උප්පන්නධම්මස්ස හොන්ති, නො උප්පජ්ජමානස්ස. යදි හි උප්පජ්ජමානස්ස සියුං, තදා තාසම්පි ජායමානත්ත පරියායො යුජ්ජෙය්‍ය. උප්පන්නස්ස ධම්මස්ස පන ජාතිතො පරං ඉමාසං සම්භවතො න තා ජායන්තීති වත්තුං වට්ටතීති. යදි පන කොචි තෙසම්පි ජාතභාවෙ කො විරොධොති පටිපජ්ජෙය්‍ය, තස්ස තං දුග්ගාහං විධමෙන්තො ආහ: **ජායෙය්‍යුං** ති ආදිං. හොන්තු නාම තෙසම්පි පාකභෙදා, තදාපි කො විරොධොති ආහ: (708.) **න හී** ති ආදිං. **පාකො න පරිපච්චති** ති සම්බන්ධො. එතෙන න භිජ්ජති ති ච දීපිතං හොති, පක්කස්ස හි භඞ්ගො නියතො. **භෙදො වා න ච භිජ්ජති** ති එත්ථාපි පක්කභාවො වුත්තොව. න හි අපක්කං භිජ්ජතී ති. අඤ්ඤථා උප්පාදභඞ්ගානං අනඤ්ඤත්තප්පසඞ්ගතො. **නත්ථි තං** ති පාකභෙදානං පච්චනභිජ්ජනං නත්ථී ති වුත්තමෙවත්ථං සංඛිපිත්වා ආහ. එත්තාවතා කිං වුත්තං හොති?

යදි ජරතාඅනිච්චතා කෙනචි පච්චයෙන ජායෙය්‍යුං, තදා උප්පන්නස්ස නාම ජරාය භඞ්ගෙන ච භවිතබ්බං ති තෙසං ජරතා - අනිච්චතා පි සියුං. න ච පනෙතා උපලබ්භන්ති. තස්මා යස්මා න ජරතා අඤ්ඤජරාය ජීරති භිජ්ජති වා, න භඞ්ගො අඤ්ඤෙන භඞ්ගෙන භිජ්ජති ජීරති වා; ඉතරථා සාපි ජරා අපරාය ජරාය භඞ්ගෙන ච ජීරති භිජ්ජති, සො ච භඞ්ගො අඤ්ඤෙන භඞ්ගෙන භිජ්ජති ජීරතීති අනවට්ඨානපසඞ්ගතොති වුත්තං හොති.

(709.) **ජාතස්සා** ති ආදිනිගමනං. අථ වා උත්තරිං වත්තබ්බචොදනාය යථාලද්ධගහණං[1]. **සියා ඛණස්සා** ති ආදි පරමතා සඞ්කිතං. **එත්ථා** ති එතස්මිං[2] ජරතාඅනිච්චතාද්වයං න පච්චති න භිජ්ජති වාති අධිකාරෙ. **රූපස්සුපචයොති හී** ති ඉතිසද්දො ආදි අත්ථො. තෙන "රූපස්ස උපචයො සන්තතී"ති වචනෙනාති අත්ථො (710.) **එවං පාකොපි පච්චතු භෙදො පි පරිභිජ්ජතූ** ති සම්බන්ධො. අයමෙත්ථ අධිප්පායො: යථා කම්මාදීහි උප්පජ්ජන-කරූපානං නිද්දෙසෙ "කතමං තං රූපං උපාදින්නං? චක්ඛායතනං =පෙ= කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා, රූපායතනං =පෙ= ඵොට්ඨබ්බායතනං, ආකාසධාතු, රූපස්ස උපචයො සන්තති, කබලිංකාරො ආහාරො"ති ආදිනා උපචයසන්තතීනං නිද්දිට්ඨත්තා ජාති' ජායතී ති දීපිතං හොති, තස්සා අපරජාතියා අභාවෙපි; එවං ජරාභංගානං අපරජරාභංගාභාවෙ පි ජීරණං භිජ්ජනං ච සම්පටිච්ඡිතබ්බං, ඉතරථා ජාතියා පි භෙදතා[3] තදවත්ථා යෙවාති.

(711.) **න චෙවා** ති ආදි යථාසංකිත-පරමතස්ස පටික්ඛිපනං යදි ජාති ජායතීති න වත්තබ්බං, එවං ච සති නිද්දෙසෙ කස්මා වුත්තන්ති ආහ **ජායමානස්සා** ති ආදිං. ඉදං වුත්තං හොති: අසතිපි ජාතියා ජායමානතෙන ජායමානධම්මානං අභිනිබ්බත්ති භාවතො තස්සා තප්පච්චයභාවවොහාරො අනුමතොති තත්ථ වුත්තා, න පරමත්ථතො ජායමානත්තා. ජායමානස්ස හි අභිනිබ්බත්තිමත්තං ජාති. තස්මා අසිද්ධෙන අසිද්ධසාධනමෙතන්ති (712.) **තස්මා** ති ආදිනා පුනාපි පරමතාසංකං කත්වා පටික්ඛිපති. තත්ථ **යෙසං ධම්මානං ජාති සා තප්පච්චයත්තවොහාරං අභිනිබ්බත්තිසම්මුතිං ච ලභති** වාති සම්බන්ධො. (713) **තථා** ති යථා ලබ්භතෙව තථා. යං තං සද්දා හි අව්‍යභිචාරිතසම්බන්ධා. තෙසං ධම්මානං පච්චයා එතිස්සාති තප්පච්චයා; තප්පච්චයස්ස භාවො තප්පච්චයත්තං. තප්පච්චයත්තෙන පවත්තො වොහාරො තප්පච්චයත්තවොහාරො; තං කම්මපච්චයභාවාදිවොහාරං ති අත්ථො. **අභිනිබ්බත්තිසම්මුතින්** ති අභිනිබ්බත්තිවසෙන පවත්ත-සම්මුතිං. **කම්මාදිසම්භවන්** ති කම්මාදි-චතුප්පච්චයසමුට්ඨානං. (715.) **ජනකානං පච්චයානං ආනුභාවක්ඛණුප්පාදෙ** අභාවතොති සම්බන්ධො. අයමෙත්ථ අත්ථො: යෙ තෙ රූපානං ජනකපච්චයා තෙසං තදුප්පාදනං පති අනුපරතව්‍යාපාරානං

1. M. ඵලඨපනං. 2. M. පොත්ථකෙ නත්ථි. 3. M. මොදතං.

යො සො පච්චයභාවූපලක්ඛණීයො[1] කිච්චානුභාවක්ඛණො, තදා ජායමානානං ධම්මානං විකාරභාවෙන ලබ්භමානත්තං සන්ධාය විනෙය්‍යපුග්ගලවසෙන ජාතියා පච්චයතො ජාතත්තං අනුඤ්ඤාතං, තතො පුරෙ පච්ඡා ච අනුපලබ්භනතො[2]. එවං ච කත්වා වුත්තං (715) **ජාතියා පන ලබ්භතී**ති. ජරාභඞ්ගානං පන පච්චයානුභාව-ලක්ඛණතො උත්තරිං ඨිතිභඞ්ගක්ඛණෙසු ලබ්භමානත්තා න එවං අනුඤ්ඤාතුං සක්කාති. **ජාතියා පන ලබ්භ**ති සො වොහාරොති අධිප්පායො. (716) **තප්පච්චයත්තා වොහාර**න්ති ආදිගාථාද්වයං නිගමනවසෙන වුත්තං. අථ කිං ඉමාය ජිව්හාකණ්ඩුයනෙන,[3] නනු වුත්තං භගවතා සුත්තන්තෙ "ජරාමරණං භික්ඛවෙ අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං"ති; තස්මා කථමෙතං වුච්චති "ජරතානිච්චතා චෙව න කෙහිචි සමුට්ඨිතා"ති? යො වදෙය්‍ය තස්ස විතක්කං දසෙත්වා පටික්ඛිපිතුං (718) **අනිච්ච**න්ති ආදි වුත්තං. කස්මා තන්ති[4] ආහ (719) **සා හි පරියායදෙසනා**ති, පරියායදෙසනත්තමෙව විභාවෙතුං **අනිච්චා-න**න්ති ආදි වුත්තං. (720) **අනිච්චං සඞ්ඛතං** චාති වසදෙදන පටිච්චසමුප්පන්නන්ති සඞ්ගණ්හාති. අයං හෙත්ථ අධිප්පායො: අනිච්චසඞ්ඛතධම්මානං ජරාමරණත්තා තෙසු සන්තෙසු හොති, අසන්තෙසු න හොති; න හි අජාතං පරිපච්චති භිජ්ජති වා. තස්මා තං ජාතිප්පච්චයත්තං සන්ධාය ජරාමරණං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, තතො යෙව ච අනිච්චන්ති පරියායෙන සුත්තෙ ආගතං. යථා විඤ්ඤත්තිආදීනං නිප්පරියායතො චිත්තසමුට්ඨානතාභාවෙපි චිත්තජානං විකාරත්තා චිත්තසමුට්ඨාන භාවොති. **විඤ්ඤත්තියො වියා**ති ච නිදස්සනමත්තං දට්ඨබ්බං.

ලහුතාදීනම්පි චිත්තජාදිභාවස්ස පරියායෙනෙව ඉච්ඡිතත්තා නිප්පරියායෙන අට්ඨාරසෙව නිප්ඵන්නරූපානි කම්මාදි-සමුට්ඨානානීති. (720) **තය**න්ති ජාති - ජරා - භඞ්ගසඞ්ඛාතං ලක්ඛණරූපත්තයං. (721.) **නභපුප්ඵං**[5] **වියා**ති ආකාසකුසුමං විය. යථා ආකාසකුසුමං සබ්බසො අජාතත්තා නත්ථි, එවමිදම්පි නත්ථීති අත්ථො. **නිච්චං වාසඞ්ඛතං වියා**ති යථා අසඞ්ඛතං නිබ්බානං කෙනචි අසඞ්ඛතත්තා නිච්චං ධුවං, එවමිදම්පි කෙනචි අසඞ්ඛතත්තා **නිච්චං** සස්සතං වාති අත්ථො. **නොභයං පනිද**න්ති ඉදම්පන උභයම්පි නභපුප්ඵං[5] විය නො නත්ථි, න ච නිබ්බානං විය අසඞ්ඛතං වාති අත්ථො. **නිස්සයායත්තවුත්තිතො**ති ජායමාන - පරිපච්චමාන - භිජ්ජමානානං ජාතිආදිමත්තභාවෙන

1. M පච්චයූපලක්ඛණීයො. 2. M. අනුපලබ්භමානත්තා. 3. M. ගීවාකණ්ඩුයනෙන. 4. M. න වත්තබ්බන්ති. 5. M. ඛපුප්ඵං.

ජායමානනිස්සය-පටිබද්ධවුත්තිත්තා. තමෙව නිස්සයායත්තවුත්තිතං සමත්ථෙතුං (722.) **භාවෙ පථවිආදීනන්**ති ආදි වුත්තං: අයමෙත්ථ සංඛෙපත්ථො: පථවීආදීනං නිස්සයානං භාවෙ ජාතිආදිත්තයං පඤ්ඤායති, තස්මා නො තප්පි. යස්මා ච තෙසං අභාවෙ න පඤ්ඤායති, තස්මා න නිච්චන්ති. ඉමමෙව ච අභිනිවෙසං නිසෙධෙතුං භගවතා ජාතියා චතුජත්තං ජරා-මරණස්ස ච අනිච්චතාදිපරියායො වුත්තොති දට්ඨබ්බං.

**74. නිප්ඵන්නානි නාමා**ති රූපස්ස පරිච්ඡෙදො, රූපස්ස විකාරො, රූපස්ස ලක්ඛණන්ති ආදිනා පරිච්ඡෙදාදිභාවං අතික්කමිත්වා අත්තනො කක්ඛළත්තාදිනා සභාවෙන පරිච්ඡිජ්ජ ගහෙතබ්බත්තා, අපරියායෙනෙව කම්මාදිපච්චයෙහි නිප්ඵන්නත්තා වා නිප්ඵන්නානි නාම; තබ්බිපරීතතො අනිප්ඵන්නා. සෙසකා අනිප්ඵන්නානී ති සුත්වා පරො අනිට්ඨං ආපාදෙන්තො ආහ: (724) **යදි හොන්ති** ති ආදිං. (725.) **තෙසමෙව චා**ති ආදිනා පන තං පටික්ඛිපති. කායවිකාරො කායවිඤ්ඤත්ති නාම; වචීවිකාරො වචීවිඤ්ඤත්ති නාම; පරියොසානං ආකාසධාතු නාම; ලහුභාවො ලහුතා නාම; මුදුභාවො මුදුතා නාම; කම්මඤ්ඤ-භාවො කම්මඤ්ඤතා නාම; නිබ්බත්ති උපචයො නාම; පවත්ති සන්තති නාම; ජිරණාකාරො[2] ජරතා නාම; හුත්වා අභාවාකාරො අනිච්චතා නාමාති එවං තෙසං යෙව අට්ඨාරසන්නං නිප්ඵන්න-රූපානං විකාරභූතත්තා [**නිප්ඵන්නා චෙව සංඛතා** ච තෙසං යෙව ච රූපානං විකාරත්තා][3] තෙ අසංඛතා නාම කථං භවෙය්‍යුන්ති සම්බන්ධො.[4] යදි හි අනිප්ඵන්නරූපානං නිස්සයභූතා නිප්ඵන්නරූපා සංඛතා, තෙසං පන විකාරභූතා කථං අසංඛතා නාම හොන්තී ති අත්ථං වණ්ණෙන්ති. චකාරො පනෙත්ථ ආගම-සිද්ධොති දට්ඨබ්බං.

(726) **ඉත්ථිභාවො** =පෙ= **වණ්ණිතා** ති පෙක්ඛඩ්ඪපදං[5] (727.) **එවං සනෙන තු** ති ආදි චොදනා. (728) **අඤ්ඤං පනා** ති ආදි පරිහාරො. තත්ථ (727) **චක්ඛුකායප්පසාදනං එකත්තං උප්පජ්ජති** ති චක්ඛුප්පසාදෙ කායප්පසාදභාවස්ස කායප්පසාදෙ ච චක්ඛුප්පසාදභාවස්ස සම්භවතො පුරිමස්ස ඵොට්ඨබ්බාවභාසත්තං, ඉතරස්ස ච රූපාවභාසත්තං හොතී ති චක්ඛුකායප්පසාදනං එකීභාවො භවෙය්‍යාති අත්ථො. නිදස්සනමත්තමෙතං; සොත-කායප්පසාදාදීනම්පි වුත්තනයෙන එකත්තං යෙවාති. (728)

1. M. ඛං පුප්ඵං. 2. M. ජීරණභාවො. 3. M. පොත්ථකෙ නත්ථි. 4. M. සම්බන්ධං කත්වා. 5. M. ඵලඩ්ඪපදං.

**අඤ්ඤං පන අඤ්ඤත්ථ න වත්තතී** ති[1] ඨපෙත්වා අඤ්ඤමඤ්ඤවිනිබ්භොගවසෙන පවත්තිං අඤ්ඤං රූපං අඤ්ඤස්මිං රූපෙ පරමත්ථතො නෙවත්ථි. භින්නනිස්සයභාවෙන කලාපන්තරගතත්තා. චක්ඛුප්පසාදෙ හි දට්ඨුකාමතානිදාන - කම්මසමුට්ඨිත-භූතනිස්සිතො. කායප්පසාදෙ ඵුසිතුකාමතානිදාන - කම්මජභූත-නිස්සිතො. **අසංකරං** ති අසංකිණ්ණං.

යදි එවං න සබ්බත්ථ කායායතනාදිකං ති? තම්පි නත්ථි; පරමත්ථතො[2] විනිබ්භුජිත්වා හි තෙසං නානාකරණං පඤ්ඤපෙතුං න[2] සක්කාති දස්සෙතුං (729) **අඤ්ඤමඤ්ඤවිනිබ්භොගවසෙනා** ති වුත්තං; **අඤ්ඤමඤ්ඤ =පෙ= පවත්තිතො** අඤ්ඤමඤ්ඤං සන්තානතො අවිනිබ්භුජ්ජනවසෙන අවිසංසට්ඨවසෙන පවත්තනතො; අවිනිබ්භොගරූපවසෙනාති පන අත්ථො න හොති; න හි චක්ඛු - කායප්පසාදා එකකලාපගතඅවිනිබ්භොගරූපා. **ඨානන්තරං වත්තුං න සක්කා** ති යථා රූපරසාදීනං විවෙචෙතුං අසක්කුණෙය්‍යතාය අඤ්ඤමඤ්ඤව්‍යාපිතා වුච්චති, න ච පරමත්ථතො රූපෙ රසො අත්ථි, යදි සියා රූපගහණෙනෙව රසගහණං ගච්ඡෙය්‍ය; එවං කායායතනාදීනම්පි පරමත්ථතො න සබ්බත්ථ අත්ථිතා. "ඉදං එත්ථ, ඉදං එත්ථා"ති ඨානන්තරං පන **සමයඤ්ඤුනා** කෙනචි **න සක්කා වත්තුං**ති.

(730.) **අත්ථි කායප්පසාදෙ**ති ඉතිසද්දො යස්මාති ඉමස්ස අත්ථෙ. තෙනාහ '**තස්මා එවමුදීරිතං**' ති, සබ්බට්ඨානිකං ති එවං උදීරිතං. (731.) **ලක්ඛණාදිවසෙනාපී** ති ලක්ඛණ - රස-පච්චුපට්ඨාන - පදට්ඨානවසෙනාපි, **ධජානං** = පෙ = **උපමතං ගතා** ති යථා පඤ්චවණ්ණානං නීලාදිපඤ්චවණ්ණ - සුත්තමයානං, එකමෙකස්ස වා එකෙකවණ්ණවසෙන ධජානං උස්සාපිතානං[2] ඡායා තෙසං උපමතං උපමානභාවං ගතා සම්පන්නාති අත්ථො. කෙචි පන ඡායා උපමා එතෙසංති ඡායූපමා. ඡායූපමානං භාවො ඡායාඋපමතා; තං ගතා එතෙ ධම්මාති වදන්ති. තම්පන තෙහි ඡායා උපමතං ගතාති එත්ථ බහුබ්බීහිවසෙනෙව රස්සත්තං ති මඤ්ඤමානෙහි වුත්තං භවෙය්‍ය; ගාථාබන්ධත්ථං පන රස්සත්තං ති දට්ඨබ්බං. චතුත්ථදුතිආදිසු පිහන්තිලොමපි කත්වා දස්සෙන්තො ආචරියො ඊදිසෙසු ඨානෙසු ව්‍යඤ්ජනෙ ආදරං ජනෙති. යං පන තෙසං ති හෙට්ඨාපදං ධම්මානං ති උපරිපදං වා සම්බන්ධිතුං අනිච්ඡන්තෙහි වුච්චති තත්ථ **නානත්තං සමුපාගතං** ති. තං එත්ථ අකාමාපි සම්බන්ධිතබ්බමෙව, න හි නානත්තං සමුපාගතං

1. M නවත්තති. 2. M. පොත්ථකෙ නත්ථි.

කෙසං ති[1] නාපෙක්ඛතීති. අථාපි තත්ථ "නානත්තං සමුපාගතා"ති පාඨං පරිකප්පෙය්‍යුං, හොතු තාව පොත්ථකෙසු අදිස්සමානපාඨම්පි පරිකප්පෙත්වා තෙසං තුට්ඨි. අයං පනෙත්ථ අධිප්පායො: යථා පඤ්චවණ්ණානං ධජානං එකතො කත්වා උස්සාපිතානං කිඤ්චාපි ඡායා එකාබද්ධා විය හොති, අඤ්ඤමඤ්ඤං පන අසම්මිස්සාව. එවමෙව ඉමෙ සබ්බට්ඨානිකරූපා කිඤ්චාපි එකාබද්ධා විය හොන්ති, ලක්ඛණතො පන අඤ්ඤමඤ්ඤභින්නසභාවා අසම්මිස්සා යෙව. එකකලාපට්ඨාපි හි ලක්ඛණතො භින්නසභාවා, කිම්පන නානාකලාපට්ඨානි.

(733.) අත්තනො පච්චයෙහි ලොකෙ නියුත්තං විදිතං ති ලොකිකං; තස්ස භාවො ලොකිකත්තං. හිනොති පතිට්ඨහති සම්පයුත්තධම්මරාසි එතෙනාති හෙතු. මූලට්ඨෙන උපකාරකො ලොභාදිකො අලොභාදිකො ච. තාදිසො න හොතීති න හෙතු. පච්චයෙහි සංඛතං අභිසංඛතං ති සංඛතං. ආභවග්ගං ආගොත්‍රභුං වා සවන්තීති ආසවා; සහ ආසවෙහීති සාසවං, අසවෙහි ආලම්බිතබ්බං ති අත්ථො. **පච්චයායත්තවුත්තිතො** ති අත්තනො අත්තනො පච්චයාධීනප්පවත්තිතාය; සප්පච්චයත්තා ති වුත්තං හොති. නිදස්සනමත්තමෙතං; කාමාවචරත්තා අහෙතුකත්තා. හෙතුවිප්පයුත්තත්තා, ඔඝනීයත්තා යොගනීයත්තා සංයොජනීයත්තා, ගන්ථනීයත්තා, උපාදානීයත්තා නීවරණියත්තා, සංකිලෙසිකත්තා පරාමට්ඨත්තා, අචෙතසිකත්තා, චිත්තවිප්පයුත්තත්තා න රූපාවචරත්තා, න අරූපාවචරත්තා, න අපරියාපන්නත්තා, අනියානිකත්තා, අනිච්චත්තා ති එවමාදිනාපි කාරණෙන එකවිධමෙවාති.

එවං එකවිධනයං දස්සෙත්වා ඉදානි ආදිසද්දෙන සංගහිතදුවිධනාදිනයං දස්සෙතුං (734) අජ්ඣත්තිකා බහිද්ධා වාති ආදිනා අජ්ඣත්තිකදුකාදයො ආරද්ධා. තත්ථ අජ්ඣත්තිකදුකෙ තාව ආභිතො අහම්මානො එත්ථාති අත්තා, අත්තභාවො. තං අත්තානං අධිකිච්ච උද්දිස්ස පවත්තං[2] අජ්ඣත්තං; ඉන්ද්‍රියබද්ධධම්මා. තෙසු භවා අත්තනි වා භවාති අජ්ඣත්තිකානි. කාමං අඤ්ඤෙපි අජ්ඣත්තං සම්භූතා අත්ථි, රුළ්හිවසෙන පන චක්ඛාදීනෙව අජ්ඣත්තිකාති වුච්චන්ති. අථ වා "යදි මයං න හොම, ත්වං කට්ඨකලිංගරූපමො භවිස්සසී"ති වදන්තා විය අත්තභාවස්ස සාතිසයං උපකාරන්තීති තානෙව විසෙසතො අජ්ඣත්තිකනාමං ලභන්ති

---

1. M. තෙසං ති. 2. M. පවත්තන්තා.

(734) ඉන්ද්‍රියානින්ද්‍රියාති ආධිපච්චට්ඨෙන **ඉන්ද්‍රියානි** සෙසං තදභාවතො **අනින්ද්‍රියං**. තත්ථ චක්ඛාදීනං පඤ්චන්නං චක්ඛු-විඤ්ඤාණාදිසු ආධිපතෙය්‍යං, තෙසං පටුමන්දභාවාදි-අනුවත්තනතො. ඉත්ථින්ද්‍රිය - පුරිසින්ද්‍රියද්වයස්ස ඉත්ථිලිංගාදිහෙතුභාවෙ, ජීවිතින්ද්‍රියස්ස ච සහජරූපපාලනෙති[1] දට්ඨබ්බං. විසයවිසයී-භාවතො ඝට්ටනවසෙන ගහෙතබ්බත්තා **ඔළාරිකං**, තබ්බිපරීතත්තා **සුඛුමං**. උපාදින්නන්ති කම්මුනා ගහිතං; කම්මනිබ්බත්තං හි මමෙතං ඵලං"ති කම්මුනා ගහිතං විය හොති.

75. **එකාදසවිධං** = පෙ = **සප්පටිඝං** ති චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යත්තා සනිදස්සනත්තාභාවතො අනිදස්සනං, අඤ්ඤ-මඤ්ඤපතනවසෙන පන පටිඝසම්භවතො[2] සප්පටිඝං. උභය-පටික්ඛෙපෙන **අනිදස්සනඅප්පටිඝං**. **කම්මතො ජාතං** ති එත්ථ යං එකන්තතො කම්මසමුට්ඨානං **අට්ඨ ඉන්ද්‍රියානි වත්ථුං** වා ති නවවිධං රූපං, යං ච එකාදසවිධෙ චතුසමුට්ඨානෙ කම්මසමුට්ඨානං එකාදසවිධමෙව රූපං ති එතං විසතිවිධම්පි කම්මතො උප්පජ්ජ-නතො **කම්මජං**. යං හි ජාතං යං ච ජායිස්සති, තං සබ්බම්පි කම්මජංති වුච්චති, යථා දුඛංති. කම්මතො අඤ්ඤං අකම්මං; අකම්මතො ජාතං අකම්මජං. අඤ්ඤත්ථො හි අයමකාරො. තෙනාහ: **තදඤ්ඤපච්චයා ජාතං** ති කම්මතො අඤ්ඤපච්චයතො ජාතං, උතුචිත්තාහාරජංති අත්ථො. චිත්තජාදීති වුත්තනයානු-සාරෙන යොජෙතුං සක්කාති න දස්සිතානි.

දිට්ඨචතුක්කෙ දට්ඨබ්බංති දිට්ඨං; යං රූපායතනං අද්දක්ඛි, යං ච පස්සති, යං ච පස්සෙය්‍ය, තං සබ්බං දිට්ඨං නාම, දිට්ඨසභාවානතිවත්තනතො, යථා ඉට්ඨං ති (?) එස නයො සුතාදිසුපි. 76. **දිට්ඨං නාම රූපායතනං**, චක්ඛුවිඤ්ඤාණ-විඤ්ඤෙය්‍යත්තා; **සුතං නාම සද්දායතනං**, සොතවිඤ්ඤාණ-විඤ්ඤෙය්‍යත්තා; **මුතං නාම** ගන්ධරසඵොට්ඨබ්බායතනත්තයං මුත්වා පත්වා ගහෙතබ්බතො, පසාදෙන සහ සම්බන්ධනතො වා. තථා හෙතං සම්පත්තග්ගාහකවිසයං වුත්තං. **විඤ්ඤාතං නාම** අවසෙසං, කෙවලං මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යත්තා.

**ද්වාරං චෙව වත්ථු චා** ති අත්තනිස්සිතානං චක්ඛුවිඤ්ඤාණාදීනං අඤ්ඤනිස්සිතානං සම්පටිච්ඡනාදීනං ච පවත්තිමුඛභාවතො ද්වාරං චෙව, අත්තනිස්සිතානං ආධාරභාවතො[3] වත්ථු ච. **ද්වාරමෙව හුත්වා න වත්ථු** ති කෙවලං කම්මද්වාරභාවතො

---

1 M. කම්මජරූපපාලනෙති 2. M. පටිඝසම්භාවනතො 3. M. ආධාරණභාවතො.

ද්වාරමෙව, තන්නිස්සිතස්ස චිත්තුප්පාදස්ස අභාවතො න වත්ථු. **වත්ථුමෙව හුත්වා න ද්වාරං** ති මනොධාතුමනොවිඤ්ඤාණධාතූනං නිස්සයභාවතො වත්ථුමෙව; චක්ඛාදයො විය සපරනිස්සයානං[1] පවත්තිද්වාරාභාවතො න ද්වාරං. **සෙසං සබ්බං[2] රූපං** වුත්තවිපරියායතො නෙව ද්වාරං, න වත්ථු ච. **චතුත්ථචතුක්කෙ[3] තතියපදං** ති "වත්ථුමෙව හුත්වා නෙවින්ද්‍රියං" ති පදං.

පුන **පඤ්චවිධං** ති සම්බන්ධො. (740) **චතුජං ති පකාසිතං** චතූහි යෙව සමුට්ඨානතො. චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යං රූපායතනං තෙන ගහෙතබ්බතො, න පන චක්ඛුවිඤ්ඤාණෙනෙව විඤ්ඤෙය්‍යතො. තථා හෙතං ආවජ්ජනාදීහි චෙව මනොද්වාරිකජවනෙහි ච විඤ්ඤායතීති. එස නයො සොතවිඤ්ඤෙය්‍යාදීසුපි. මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යං පන කෙවලං මනොවිඤ්ඤාණෙනෙව විඤ්ඤාතබ්බං; න හි රූපාදිතො අඤ්ඤත්ථ චක්ඛුවිඤ්ඤාණාදීනි වත්තන්ති.

**77. ඡවත්ථුඅවත්ථුභෙදතො** ති ඡන්නං වත්ථූනං අවත්ථුස්ස ච භෙදතො. **මනොධාතුවිඤ්ඤෙය්‍යං** රූපාදිපඤ්චකං. මනායතනස්ස අරූපත්තා ධම්මායතනස්ස ච එකදෙසතො රූපත්තා ආහ **ආයතනභෙදතො එකාදසවිධං** ති.

අරූපභවෙ රූපුප්පත්තියා අභාවතො, අසඤ්ඤිභවස්ස ච රූපභවපරියාපන්නත්තා වුත්තං (743). **කාමරූපභවද්වයෙ** ති. (744) **භුම්මවජ්ජෙසු** ති භුම්මදෙවානං වජ්ජනං, යොනිවිභාගං පත්වා තෙසං මනුස්සසදිසත්තා. **පුරිමා තිසෙසා** ති අණ්ඩජ-ජලාබුජ - සංසෙදජයොනියො. තා හි යථාවුත්තප්පභෙදෙසු න ලබ්භන්ති. තාසං ච පටික්ඛෙපෙන පච්ඡිමා ඔපපාතිකා යොනි අනුඤ්ඤාතාති අත්ථතො ආපන්නමෙව හොති. තත්ථ නිරයෙති උස්සදනම්පි ගහණතො අවීචිමහානිරයෙ කිටපාණකානම්පි සරීරං පච්ඡා අවඩ්ඪනකං[4] හුත්වාව නිබ්බත්තන්ති, නිජ්ඣාමතණ්හිකපෙතානං නිච්චාතුරතාය කාමස්සාභාවතො[5] ගබ්භගහණං න හොති. තස්මා අණ්ඩජ - ජලාබුජයොනියො තත්ථ න සන්ති. ආදිත්තත්තා කුච්ඡියං ගබ්භො න පතිට්ඨාතීති කෙචි. නිබ්බත්තමාතානං ච පාපකම්මානුභාවෙන මහාදුක්ඛස්ස පත්තබ්බත්තා මහන්තෙනෙව සරීරෙන භවිතබ්බං ති සංසෙදජයොනි පි තෙසං න හොති. අග්ගිජාලාය සන්තප්පමානසරීරතාය තෙසං නිබ්බත්තන-

1. M. සපරනිස්සිතානං 2, M. වීසතිවිධං, 3. M චතුත්ථචතුක්කෙති වත්ථුචතුක්කෙ. 4. M. වඩ්ඪනකං. 5. M. කාමස්ස අභාවතො.

කාලෙ අලලට්ඨානෙ පුප්ඵාදීසු ච සම්භවාභාවතො සංසෙදතාං නපෙක්ඛාතිපි වදන්ති. තෙන තෙසං ඔපපාතිකාව යොනීති ආහ (744) **නිජ්ඣාමතණ්හිකා** ති.

අථ සංසෙදජ-ඔපපාතික-යොනීනං කො විසෙසොති? සංසෙදජො තාව ඛුද්දකසරීරො හුත්වා පදුමගබ්භාදිං නිස්සාය නිබ්බත්තෙන්තො කමෙන වඩ්ඪති. ඉතරො පන යත්ථ යත්ථ නිබ්බත්තති, තත්ථ තත්ථ පරිච්ඡින්නප්පමාණසරීරොව සොළසවස්සුද්දෙසිකො විය පරිපුණ්ණංගපච්චංගො පාතුභවති. (745) **සෙස ගතිත්තයෙති** ඨපෙත්වා දෙවගතිං නිරයගතිං ච අවසෙස - මනුස්ස - පෙත තිරච්ඡානසඞ්ඛාතෙ ගතිත්තයෙ. මනුස්සෙසු හි කෙචි අණ්ඩජාපි හොන්ති, කුන්තපුත්ත-ද්වෙභාතිකත්ථෙරා විය. කෙචි සංසෙදජාපි හොන්ති පදුමගබ්භෙ නිබ්බත්ත-පොක්ඛරසාතිබ්‍රාහ්මණාදයො විය. කෙචි ඔපපාතිකාපි හොන්ති, අම්බපාලිගණිකාදයො විය. නිජ්ඣාමතණ්හිකාවසෙසපෙතා පන සබ්බචතුප්පද-පක්ඛිජාති-දීඝජාතිආදයො සබ්බෙ තිරච්ඡානා ච චතුයොනිකා වාති. **ගබ්භෙ** මාතුකුච්ඡියං සෙතීති ගබ්භසෙය්‍යකො, සො යෙව රූපාදීසු සත්තතාය සත්තො, තස්ස (746.) **ගබ්භසෙය්‍යක-සත්තස්ස තිංසරූපානීති** කාය - භාව - වත්ථුදසකවසෙන සමතිංසකම්මජ-රූපානි යෙව; තදා හි නෙව චිත්තජරූපං අත්ථි, පටිසන්ධිචිත්තස්ස රූපසමුට්ඨාපකත්තාභාවතො. නාපි උතුජං, පුරිමුප්පන්න-උතුනො අභාවා උතු හි ඨානප්පත්තො රූපං සමුට්ඨාපෙති. න ච ආහාරජං, තස්මිං කාලෙ අජ්ඣොහටස්ස අභාවතො. තස්මා කම්මසමුට්ඨානානි යෙව තිංසරූපානි පටිසන්ධික්ඛණෙ නිබ්බත්තන්ති, යානි **කලලරූපානීති** වුච්චන්ති. පරිපිණ්ඩිතානි ච තානි ජාතිඋණ්ණාය එකස්ස අංසුනො පසන්නතිලතෙලෙ පක්ඛිපිත්වා උද්ධටස්ස පග්ඝරිත්වා අග්ගෙ ඨිතබින්දුමත්තානි අච්ඡානි විප්පසන්නානි පසන්නතිලතෙලබින්දුසමානානි හොන්ති. යථාහු:

"තිලතෙලස්ස යථා බින්දු සප්පිමණ්ඩො අනාවිලො,
එවං වණ්ණපටිභාගං කලලං සම්පවුච්චතී"ති.

**සභාවසෙසවාති** අවධාරණෙන අභාවකස්ස භාවදසකාභාවතො තිංසරූපානං අසම්භවං දීපෙති. තෙනාහ: (747) **අභාවගබ්භසෙය්‍යානං =පෙ= කායවත්ථුවසෙන ද්වීති අභාවගබ්භසෙය්‍යානන්ති** ඉමිනා අභාවඔපපාතිකානං න එවං නිද්දෙසතීති කෙචි. සභාවකගබ්භසෙය්‍යකස්ස පන වත්වා තතො නිවත්තනත්ථං අභාවගබ්භසෙය්‍යකසත්තානන්ති වුත්තන්ති දට්ඨබ්බං. පුබ්බෙ ගබ්භසෙය්‍යකග්ගහණෙන අණ්ඩජානම්පි ගහණෙ ඉධ විසුං වචනං ගොබලිබද්දඤ්ඤායවසෙනාති දට්ඨබ්බං. න පන

තෙසං අභාවකභාවනිවත්තනත්ථන්ති. ඉතරථා හි විසතිරූපානං වචනං විරුජ්ඣති. අභාවකභාවො පනෙත්ථ අණ්ඩජානං පකරණතො දට්ඨබ්බො. න හි ගබ්භසෙය්‍යකසද්දෙන සමාසභූතං අභාවකසද්දං ඉධ ආනෙතුං සක්කාති.

(748,) **ගහිතාගහණෙනෙත්ථ එකාදස භවන්ති** තෙති එකස්මිං කලාපෙ ගහිතරූපානං අපරකලාපෙ අගහණවසෙන සුඞ්ඨකං ජීවිතං කායපසාදෙ වත්ථුරූපන්ති අභාවකස්ස පටිසන්ධික්ඛණෙ එකාදසරූපානි භවන්ති. සභාවකස්ස පන ද්වීසු භාවෙසු එකෙන සහ ද්වාදසරූපානි හොන්ති. එසෙව ච නයොති වුත්තෙසු වක්ඛමානෙසු ච පටිසන්ධික්ඛණිකකලාපෙසු අගහිතගහණෙන

රූපගණනා එවං විඤ්ඤෙය්‍යා.[1] නනු ච **සබ්බසු දසකෙසූති** වුත්තං, කථමෙත්ත තෙ දසකා ජානිතබ්බාති ආහ (749) **ජීවිතෙනාති** ආදිං.

**සුඬ්ඪමට්ඨකන්ති**[2] චත්තාරි මහාභූතානි තන්නිස්සිතා වණ්ණ-ගන්ධ - රස - ඔජාති ඉදං ජීවිතාදිනා අසම්මිස්සං සුඞ්ඨකං. ඉමානි යෙව හි අට්ඨ කත්ථචි අවිනිබ්භොගවසෙන පවත්තිතො අවිනිබ්භොගරූපානි, අවංකසතො කලාපොති ච වුච්චන්ති. **ආචරියජොතිපාලත්ථෙරෙන** පන නිප්ඵන්නානිප්ඵන්නවසෙන දසරූපානි අවිනිබ්භොගවුත්තිකානි එකො කලාපොති ච වත්වා පුන තං සමත්ථනත්ථං ඉදං වුත්තං හොති:

"අවිනිබ්භොගවුත්තීනි චතුජානෙකලක්ඛණා
නිප්ඵන්නානන්'ථ වා තෙසු භින්නාකාසෙකලක්ඛණෙ"ති[3]

(750) කායො දසමො එත්ථාති **කායදසකං**, අසාධාරණෙන වා කායෙන ලක්ඛිතං දසකං කායදසකං. එස නයො චක්ඛුදසකාදීසු. **පරිපුණ්ණං** කපිතං ඤාතන්ති වා අත්ථො. (752.) කාමාවචර-දෙවෙසු සබ්බකාලං පටිසන්ධිප්පවත්තීසු සන්තතියා රූපානං ලබ්භනතො වුත්තං **නිච්චං රූපානි සන්තතීති**. න හි තෙ කදාචි විකලින්ද්‍රියා අභාවකා වා හොන්ති. මනුස්සෙසු පන ඔපපාතිකසත්තානං අවිසෙසෙන වුත්තෙපි ආදිකප්පිකානං භාවදසකස්ස පටිසන්ධික්ඛණෙ අභාවතො තෙසං සඞ්ඝරූපානීති වෙදිතබ්බං. ජීවිතනවකම්පි ඔපපාතිකානං සංසෙදජානං ච කාමාවචරසත්තානං පවත්තෙ යෙව හොති, තස්ස පාවකගහිතා[4]

---

1. M රූපගහණෙ නයො එසෙව ඤෙය්‍යො 2. M සුඞ්ඨකමට්ඨකන්ති.
3. M. භින්නාන කායලක්ඛණෙති. 4. B. පාවගහිතා.

සඞ්වුතත්තා, තස්ස ච අජ්ඣොහටාහාරසන්නිස්සයෙන සම්භවතො. සංසෙදජානම්පි පරිපුණ්ණංගපච්චඞ්ගානං නිබ්බත්තනතො ඔපපාතිකෙහි විසෙසො නත්ථීති තෙසං විසුං අගහණං. විභඞ්ගෙපි හි "කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්සචි එකාදසායතනානි පාතුභවන්ති, කස්සචි දසායතනානි, අපරානි කස්සචි දසායතනානි කස්සචි නවායතනානි, කස්සචි සත්තායතනානි පාතුභවන්තී"ති ඉමස්ස නිද්දෙසෙ "ඔපපාතිකානං සත්තානං"ති ඔපපාතිකගහණමෙව කතං, න සංසෙදජගහණං. තං ච පරිපුණ්ණායතනානං සංසෙදජානං ඔපපාතිකෙසු සංගණ්හනතො. තථා හි වුත්තං අට්ඨකථායං: "සංසෙදජයොනිකා පරිපුණ්ණායතනභාවෙන ඔපපාතිකසංගහෙ (හං) කත්වා වුත්තා"ති පධානාවයවාය යොනියා සබ්බපරිපුණ්ණායතනයොනිං දස්සෙතුං **ඔපපාතිකසත්තානං** ති වුත්තං.

(754) **චක්ඛු - සොත - වත්ථුවසා** ති චක්ඛුදසක-සොත-දසක - වත්ථුදසකවසා. **ආනන්දාචරියො** පනෙත්ථ රූපධාතුයං පටිසන්ධිවිඤ්ඤාණෙන සහ චක්ඛුසොතවත්ථුසත්තකානං ජීවිතඡක්කස්සාති චතුන්නං කලාපානං වසෙන සත්තවීසති රූපානි උප්පජ්ජන්ති, තත්ථ ගන්ධ - රසාහාරානං පටික්ඛිත්තත්තා"ති වත්වා පුන තං සමත්ථෙන්තො "පාළියං හි රූපධාතුයා උප්පත්තික්ඛණෙ ඨපෙත්වා අසඤ්ඤසත්තානං දෙවානං පඤ්චායතනානි පාතුභවන්ති පඤ්චධාතුයො පාතුභවන්තී"ති වුත්තං, තථා "රූපධාතුයා ඡ ආයතනානි නව ධාතුයො"ති සබ්බසංගාහකවසෙන තත්ථ විජ්ජමානායතනධාතුයො දස්සෙතුං වුත්තං. **කථාවත්ථුම්හි** ච ඝානායතනාදීනං විය ගන්ධායතනාදීනං ච තත්ථ භාවො පටික්ඛිත්තො: "අත්ථි තත්ථ ගන්ධායතනං ති? න හෙවං වත්තබ්බෙ"ති ආදිනා. න ච අඵොට්ඨබ්බායතනානං පඨවීධාතුආදීනං විය අගන්ධරසායතනානං ගන්ධරසානං තත්ථ භාවො සක්කා වත්තුං. ඵුසිතුං සක්කුණෙය්‍යතාවිනිමුත්තස්ස පඨවාදිසභාවස්ස විය ගන්ධරසායතනභාවවිනිමුත්තස්ස ගන්ධරසභාවස්ස අභාවා. යදි ඝාණසම්ඵස්සාදීනං කාරණභාවො නත්ථීති තානි[1] ආයතනානී ති න වුච්චෙය්‍යුං, ධාතුසද්දො පන නිස්සත්තනිජ්ජීවවාචකොති[2] ගන්ධධාතු රසධාතු ති අවචනෙ කාරණං නත්ථි. ධම්මසභාවො ච තෙසං එකන්තෙන ඉච්ඡිතබ්බො, සභාවධාරණාදි - ලක්ඛණතො අඤ්ඤස්ස අභාවා, ධම්මානං ච ආයතනභාවො එකන්තතො යමකෙ වුත්තො: "ධම්මා ආයතනං ති? ආමන්තා"ති. තස්මා තෙසං ගන්ධරසායතනභාවාභාවෙපි කොචි ආයතනභාවො වත්තබ්බො, යදි ච ඵොට්ඨබ්බභාවතො අඤ්ඤො පඨවිආදිභාවො විය ගන්ධ-

1. M. පොත්ථකෙ නත්ථි. 2. M නිස්සත්තනිජ්ජීවවිභාවකානි

රසභාවතො අඤ්ඤො තෙසං කොචි සභාවො සියා, තෙසං ධම්මායතනසංගහො. ගන්ධරසභාවෙ පන ආයතනභාවෙ ච සති ගන්ධො ච සො ආයතනං චාති ගන්ධායතනං, රසො ච සො ආයතනං චාති රසායතනං ති ඉදමාපන්නමෙවාති ගන්ධරසායතනභාවො ච න සක්කා නිවාරෙතුං; තතො ආහාරාති වචනතො කබලිංකාරාහාරස්ස තත්ථ අභාවො විඤ්ඤායති; තස්මා යථා පාළියා අවිරොධො හොති, තථා ගන්ධරසොජා හිත්වා රූපගණනා කාතබ්බා. එවං හි ධම්මතා, න විලොමතා, හොතී"ති වදන්ති.

ආචරිය **ජොතිපාල – ධම්මපාලත්ථෙරා** පන තං පටික්ඛිපන්ති. තථා ච වුත්තං තෙහි: "රූපාවචරසත්තානං ඝාණජිව්හායතනාභාවතො විජ්ජමානාපි ගන්ධරසා ආයතනකිච්චං න කරොන්තී"ති තෙ අනාමසිත්වා පාළියං පඤ්චායතනානි පාතුභවන්ති, ඡ ආයතනානීති ච ආදි වුත්තං. තතො ආහාරාති ච අජ්ඣොහරිතබ්බස්ස ආහාරස්ස අභාවෙන ඔජට්ඨමකරූපසමුට්ඨාපනසංඛාතස්ස ආහාරකිච්චස්ස අකරණතො; න සබ්බෙන සබ්බං ගන්ධරසානං ඔජාය ච අභාවතො; ඉති විසයිනො කිච්චස්ස ච අභාවෙන විසයකිච්චවා[1] ච ධම්මො[1] න වුත්තො; යස්මිං හි භවෙ විසයී නත්ථි, තස්මිං තංහෙතුකො නිප්පරියායෙන විසයස්ස ආයතනභාවො නත්ථී ති විජ්ජමානස්සපි අවචනං යථා තත්ථෙව රූපභවෙ පථවී තෙජොවායොධාතූනං ඵොට්ඨබ්බායතනභාවෙන අවචනං.[2] යස්ස පන යත්ථ වචනං තස්ස තත්ථ විසයීසම්භවහෙතුතො නිප්පරියායෙන ආයතනභාවො වුත්තො; යථා තත්ථෙව රූපායතනස්ස වචනං[2]. යදි විසයීසබ්භාවහෙතුකො විසයස්ස නිප්පරියායෙන ආයතනභාවො, කථමසඤ්ඤසත්තානං ද්වෙ ආයතනානි පාතුභවන්තී ති? අසඤ්ඤසත්තානං හි චක්ඛායතනං නත්ථි, අථ තදභාවෙන රූපායතනං අඤ්ඤෙසං අවිසයොති? නායං විරොධො. යෙන අධිප්පායෙන රූපධාතුයා සඤ්ඤීනං ගන්ධායතනාදීනං අවචනං තෙන රූපායතනස්සපි අවචනන්ති, අසඤ්ඤීනං එකං ආයතනං වත්තබ්බං. යථාසකං හි ඉන්ද්‍රියගොචරභාවාපෙක්ඛාය තෙසං නිප්පරියායෙන ආයතනභාවො අත්ථි. තෙසු නිද්දිසියමානෙසු තදභාවතො රූපධාතුයං සඤ්ඤීනං ගන්ධාදිකෙ විසුං ආයතනභාවෙන අවත්වා ධම්මසභාවානතිවත්තනතො මනොවිඤ්ඤාණස්ස ච විසයභාවූපගමනතො ධම්මායතනොගධෙ කත්වා පඤ්චායතනානී ති පාළියං වුත්තං. එතදත්ථං හි ධම්මායතනන්ති සාමඤ්ඤතො නාමකරණං. පිණ්ඩවට්ටකානි[3] වා තානි කත්වා

1 M විසයෙ, කිච්චභාවධම්මො. 2. M. ඵොට්ඨබ්බො නත්ථි. 3. B. පිණ්ඩවණ්ඩකානි.

පඤ්චායතනානී ති වුත්තං. යෙන ච පන අධිප්පායෙන අසඤ්ඤීනං රූපායතනං වුත්තං තෙන සඤ්ඤීනම්පි අසඤ්ඤීනම්පි ගන්ධායතනාදීනං විසුං ගහණං කාතබ්බං ති ඉමස්ස නයස්ස දස්සනත්ථං "අසඤ්ඤසත්තානං දෙවානං ද්වෙ ආයතනානි පාතුභවන්තී"ති වුත්තං. අසන්තිපි හි තත්ථ අනන්තො ඉන්ද්‍රියෙසු රූපස්ස වණ්ණායතනසභාවාතික්කමො නත්ථෙවා ති තං රූපායතනං තෙව වුච්චති. ඉමිනා ච නයදස්සනෙන ගන්ධාදීනි තීණි පටික්ඛිපිත්වා සඤ්ඤීනං අඩ්ඪායතනානි, අසඤ්ඤීනං පඤ්චාති අයමත්ථො දස්සිතො හොති. එවං චෙතං සම්පටිච්ඡිතබ්බං. අඤ්ඤථා රූපලොකෙ ඵුසිතුං අසක්කුණෙය්‍යතාය පඨවිආදීනං බ්‍රහ්මූනං වචීඝොසො එව ච න සියා. න හි පටිහනනනිඝංසනමන්තරෙන[1] සද්දප්පවත්ති අත්ථි; න ච ඵුසනසභාවානං කත්ථචි අඵුසනභාවතා සක්කා විඤ්ඤාතුං. ඵොට්ඨබ්බායතනස්ස ච භූතත්තයස්ස අභාවෙ රූපභවෙ රූපායතනාදීනම්පි සම්භවො එව න සියා. තස්මා ඵුසිතුං අසක්කුණෙය්‍යතාය පි පඨවිආදීනං තත්ථ කායින්ද්‍රියභාවෙන තෙසං ඵොට්ඨබ්බභාවො න වුත්තො. එවං ච කත්වා රූපධාතුයං තෙසං සප්පටිඝතාවචනං ච සමත්ථිතං හොති. වුත්තං හි: "අසඤ්ඤසත්තානං අනිදස්සනසප්පටිඝං එකං මහාභූතං පටිච්ච ද්වෙ මහාභූතා"ති ආදි. පටිඝො ච නාම භූතත්තයස්ස කායප්පසාදං පති තංනිස්සයභූතත්තය-ඝට්ටනද්වාරෙන අභිමුඛභාවො. ඉධ පන තංසභාවතා, සො ච ඵුසිතුං අසක්කුණෙය්‍යභාවො[2] ඝට්ටනාය අභාවතො නත්ථි. යදි තත්ථ අසන්ති පි විසයිම්හි රූපායතනං පි ගහෙත්වා ද්වෙ ආයතනානී ති වුත්තං, අථ කස්මා ගන්ධායතනාදීනි ගහෙත්වා පඤ්චායතනානීති න වුත්තං ති? නයදස්සනවසෙන දෙසනා පවත්තාති වුත්තොවායමත්ථො. අථ වා තත්ථ රූපායතනස්සෙව වචනං කදාචි අඤ්ඤභූමිකානං පසාදස්ස විසයභාවං සන්ධාය; න පන ඉතරෙසං අභාවතො. නාපි පරියායෙන ගන්ධායතනාදීනං ආයතනභාවාභාවතො. අසඤ්ඤීනං හි රූපායතනං සමානතලවාසීනං වෙහප්ඵලානං උපරිභූමිකානං ච සුද්ධාවාසානං පසාදස්ස විසයභාවං ගච්ඡති, න පන ගන්ධරසාති නෙව තත්ථ අවචනං යුත්තං. **කථාවත්ථුම්හි** ච නිප්පරියායෙන ගන්ධායතනාදීනං අත්ථිභාවං පටිජානන්තං සන්ධාය පටිසෙධො කතො. යදි පි චෙතං වචනං තත්ථ ගන්ධායතනාදීනං අභාවවිභාවනං න හොති, අත්ථිභාවදීපනං පන අඤ්ඤවචනම්පි නත්ථෙවාති? නයිදමෙවං; අට්ඨකථාසු තත්ථ තත්ථ තෙසං අත්ථිභාවස්ස

1 M පටිඝට්ටන-නිඝංසමන්තරෙන (ද්වීසුපි "මන්තරෙනා"ති දිස්සති. තථාපි ඉධ මනා-සද්දස්ස අත්ථෙ "අන්තරෙන" නිපාතොති මඤ්ඤාමි.
2. B. M. අසක්ඛුණෙය්‍යභාවස්ස

නිධාරෙත්වා වුත්තත්තා. යං හි අට්ඨකථාවචනං පාළියා න විරුජ්ඣති, තං පාළි විය පමාණභූතං, අගරහිතාය ආචරියපරම්පරාය යාවජ්ජතනා ආගතත්තා; තත්ථ සියා යං පාළියා න විරුජ්ඣති අට්ඨකථාවචනං තං පමාණං. ඉදම්පන විරුජ්ඣතී ති. නයිදමෙවං; යථා න විරුජ්ඣති තථා පටිපාදිතත්තා.[1] චක්ඛාදීනං ආයතනානං තංනිස්සයානං ච විඤ්ඤාණානං සත්තසුඤ්ඤතා – සංදස්සනත්ථං භගවතො ධාතුදෙසනානි[2] ආයතනභාවෙන වුත්තානං සෙව ධාතුභාවදීපනතො ධාතුභාවස්සාපි තෙසං අවචනං යුජ්ජති එව. තස්මා යථා පාළියා අවිරොධො හොති, තථා චක්ඛුදසකාදී-වසෙන ඉධ රූපගහණනා කතානි න එත්ථ ධම්මතාවිලොමතාසං-කාය ඔකාසොති වෙදිතබ්බංති

(756) **ජච්චන්ධ-බධිරානි** ජනානුරක්ඛනත්ථං දීඝකරණං. න හි ජච්චන්ධ – බධිර – අඝානරහිතෙ නපුංසකෙ චක්ඛු – කාය – ජිව්හාදසකවසෙන තිංසානි යුජ්ජති. ඉදං ච ඔපපාතිකස්ස ජච්චන්ධ – බධිර – අඝාණක – නපුංසකස්ස[3] ජිව්හාකායවත්ථු දසකානං වසෙන තිංසරූපානි උපපජ්ජන්තීති අට්ඨකථාවාදං ගහෙත්වා වුත්තං. **ආනන්දාචරියො** පන පාළියා න සමෙතීති වත්වා පටික්ඛිපති. තථා චා' හ: "න පනෙතං පාළියා සමෙති, න හි පාළියං කාමාවචරානං සංසෙදජොපපාතිකානං අඝානකානං උපපත්ති වුත්තා. **ධම්මහදයවිභඞ්ගෙ** හි "කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්සචි එකාදසායතනානි පාතුභවන්ති, කස්සචි දසායතනානි, කස්සචි අපරානි දසායතනානි, කස්සචි නවායතනානි, කස්සචි සත්තායතනානි පාතුභවන්තී"ති වුත්තං; න වුත්තං "අට්ඨායතනානි පාතුභවන්තී"ති. යදි හි අඝාණකස්සාපි උපපත්ති සියා, තික්ඛත්තුං "දසායතනානි පාතුභවන්තී"ති වත්තබ්බං සියා, තික්ඛත්තුං ච නවායතනානි පාතුභවන්තී"ති; නවෙතං වුත්තං. **යමකෙ** ච ඝාණජිව්හානං සහප්පවත්ති වුත්තා; තස්මා තං උපපරික්ඛිත්වා ගහෙතබ්බං"ති. අයං හෙත්ථ ආචරියස්ස අධිප්පායො: ධම්මහදයපාළියං හි එකාදසාති පරිපුණ්ණායතනස්ස සද්දායතනවජ්ජානි එකාදසායතනානි වුත්තානි. "කස්සචි දසායතනානී"ති අන්ධස්ස චක්ඛායතනවජ්ජානි. "අපරානිපි දසායතනානී"ති බධිරස්ස සොතායතනවජ්ජානි. නවායතනානීති අන්ධබධිරස්ස චක්ඛුසොතායතනවජ්ජානි. "සත්තායතනානී"ති ගබ්භසෙය්‍යකස්ස රූප – ගන්ධ – රස – කාය – ඵොට්ඨබ්බ – මන – ධම්මායතනවසෙන වුත්තං. යදි චක්ඛු –

1. B. පටිපාදියත්තා. 2. M. ධාතුයො දෙසනා. 3. M. ජච්චන්ධබධිර-ඝාණ රහිතෙ.

සොත - ඝාණ - විකලො පි උප්පජ්ජෙය්‍ය තස්ස අට්ඨායතනානි වත්තබ්බානි සියුං. න ච වුත්තං "අට්ඨායතනානි පාතුභවන්තී"ති. තස්මා තත්ථෙව චක්ඛු - සොත - ඝාණවිකලො සති ච අඝාණකුප්පත්තියං පුනපි "කස්සචි අපරානි දසායතනානි පාතුභවන්තී"ති වත්තබ්බං සියා. තථා ච සති යථා අන්ධබධිරස්ස වසෙන "කස්සචි නවායතනානි පාතුභවන්තී"ති එකවාරං වුත්තං. එවං අන්ධාඝාණකස්ස බධිරාඝාණකස්ස ච වසෙන "කස්සචි අපරානි නවායතනානි, කස්සචි අපරානි නවායතනානී"ති වත්තබ්බං සියා. කාමභවෙ ච අජිව්හස්ස සත්තස්ස අභාවතො ඝාණජිව්හායතනානං සහප්පවත්තිවචනතො ච තත්ථෙව කාමධාතුයං අඝාණකස්ස සම්භවොති.

**ජොතිපාලත්ථෙරාදයො** පන "සංසෙදජස්ස ජච්චන්ධබධිර අඝාණකනපුංසකස්ස ජිව්හා - කාය - වත්ථුදසකානං වසෙන තිංසරූපානි උප්පජ්ජන්තී"ති වුත්තං, න[1] ඔපපාතිකස්ස. **ධම්මහදයවිභඞ්ගපාළියං** ච උප්පත්තික්ඛණෙති වුත්තත්තා ඔපපාතිකස්ස වසෙන නයො නීතො. යමකට්ඨකථායං ච වුත්තං: "කාමධාතුයං අඝාණකො ඔපපාතිකො නත්ථි; යදි භවෙය්‍ය, "කස්සචි අට්ඨායතනානි පාතුභවන්තී"ති වදෙය්‍යාති, යං පි **ධම්මහදයවිභඞ්ගෙ** "කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්සචි එකාදසායතනානි පාතුභවන්තී" ති ආදීනං නිද්දෙසෙ "ඔපපාතිකානං සත්තානං"ති[2] ආදිනා ඔපපාතිකගහණමෙව කතං, න සංසෙදජගහණං. තං පරිපුණ්ණායතනානං යෙව සංසෙදජානං ඔපපාතිකෙසු සංගහවසෙන වුත්තන්ති වෙදිතබ්බං. තථාහි වුත්තං අට්ඨකථායං "සංසෙදජයොනියා[3] පරිපුණ්ණායතන භාවෙන ඔපපාතිකසංගහං කත්වා වුත්තං"ති. පධානාය වා යොනියා සබ්බං පරිපුණ්ණායතනයොනිං සංගහෙත්වා දස්සෙතුං ඔපපාතිකානන්ති වුත්තන්ති ච තස්මා න කොචි පාළිවිරොධොති ච වදන්ති.

අපරෙ පනාහු: කාමධාතුයං අඝාණකො ඔපපාතිකො නත්ථි; යදි භවෙය්‍ය "කස්සචි අට්ඨායතනානි පාතුභවන්තී"ති වදෙය්‍යාති. ඉදං මනුස්සෙසු සංසෙදජ - ඔපපාතිකානං වසෙන වුත්තං; තෙ හි පරිපුණ්ණායතනාව. කෙසඤ්චි පන අඝාණකජීවානං[4] අත්ථිභාවතො අපායෙසු සංසෙදජොපපාතිකෙ සන්ධායෙතං වුත්තන්ති වදන්ති. තං ආනන්දාචරියානං මතෙන පටික්ඛෙපාරම්භමෙවාති.

---

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. පෙතානන්ති 3. M. — යොනිකා.
4. M. අඝානකකීටානං.

(757.) **උක්කංසාවකංසස්ස අනන්තරෙති** සත්තතීති වුත්ත - උක්කංසපරිච්ඡෙදස්ස, තිංසාති[1] වුත්ත - අවකංස-පරිච්ඡෙදස්ස ච මජ්ඣෙ. **අනුරූපතො** =පෙ= (758) **විභාවිනාති** ජාතිඅන්ධස්ස සට්ඨිරූපානි චක්ඛුදසකාභාවතො, තථා බධිරස්ස සොතදසකාභාවතො; අන්ධබධිරස්ස පන පණ්ණාස චක්ඛුසොත-දසකාභාවතොති ආදිනා නයෙන අඤ්ඤමඤ්ඤූපෙක්ඛාය පරිපුණ්ණ-රූපානං පාණීනං වසෙන **රූපානං සමුප්පත්ති විඤ්ඤාතබ්බාති** අත්ථො. යං පනෙත්ථ වත්තබ්බං තං වුත්තමෙවාති.

එවං තීසු භවෙසු පටිසන්ධියං රූපප්පවත්තිං දස්සෙත්වා ඉදානි පවත්තියං දස්සෙතුං (759) සත්තවීසතිරූපානීති ආදිං වුත්තං කාමාවචරසත්තස්ස හි පරිපුණ්ණායතනස්ස අන්තරා පසාදවිඝාතෙ අසති[2] යාව මරණචිත්තස්ස[3] හෙට්ඨා සත්තරසමචිත්තං තාව සත්තවීසති රූපානි පවත්තන්ති. අපරිපුණ්ණායතනස්ස පන ජච්චන්ධාදිකස්ස හෙට්ඨා වුත්තනයෙන රූපහාපනවඩ්ඪනානි[4] වෙදිතබ්බානි. තත්ථ අට්ඨවීසති යෙව රූපානි කාමභවෙ පවත්තන්තීති ආහ **අප්පවත්තනතොති** ආදිං.

(760.) **ඝාණං** =පෙ= **න විජ්ජරෙති** කාමවිරාගභාවනා-වසෙන ගන්ධාදිගාහකෙසු පසාදෙසු විරත්තා හොන්තීති ඝාණාදිත්තයං නත්ථි. චක්ඛුසොතෙසු පන අනුත්තර-දස්සනාදි අත්ථං විරත්තා න හොන්තීති තානි තෙසං උප්පජ්ජන්ති. භාවද්වයං කාමරාගූපනිස්සයත්තා න උප්පජ්ජති. කෙචි පන ලහුතාදිත්තයම්පි රූපභවෙ නත්ථි, දන්ධත්තකර - ධාතුක්ඛොභා-භාවතො. සති හි තාදිසෙ ධාතුක්ඛොභෙ තප්පටිපක්ඛෙහි ලහුතාදීහි භවිතබ්බන්ති වදන්ති. තං අකාරණං. න හි වූපසමෙ තබ්බපච්චනීකාපෙක්ඛාය[5] තබ්බිරොධිධම්මසමුප්පාදෙ. තථා සති සහෙතුකක්‍රියාචිත්තුප්පාදෙසු කායලහුතාදීනං අභාවො එව සියා. තස්මා පඤ්ච ච රූපානි සඤ්ඤී-බ්‍රහ්මානං නුප්පජ්ජන්ති, අවසෙසානි තෙවීසති රූපානි උප්පජ්ජන්ති. අසඤ්ඤීබ්‍රහ්මානං පන පඤ්චපසාදරූපානි, භාවද්වයං, හදයවත්ථු, විඤ්ඤත්තිද්වයං ලහුතාදිත්තයංති තෙරසරූපානි වජ්ජෙත්වා අවසෙසානි පණ්ණරස උප්පජ්ජන්ති.

(761) **චතුසන්තති** ති චතුන්නං පච්චයානං වසෙන චතුසන්තතිරූපානි. **රූපෙ හොන්ති තිසන්තතීති** බ්‍රහ්මානං අනාහාරභාවෙන ආහාරජරූපානං අභාවතො තිස්සො සන්තතියො

1 B. තියානි. 2. M අසති අන්ධබධිරාදිපසාදවිඝාතෙ 3. B. චරිමචිත්තස්ස.
4. M. රූපානං — 5. M. - පච්චනීකාපෙක්ඛා.

**ද්විසන්තතී**ති චිත්තජාහාරජානං අභාවතො ද්වෙ සන්තතියො. **බහිද්ධා එකසන්තතී**ති කම්මජාදීනං තිස්සන්නම්පි අභාවතො උතුජසන්තති යෙව.

එවං පටිසන්ධිප්පවත්තීසු රූපානං ගණනපරිච්ඡෙදං වත්වා ඉදානි තත්ථ තෙසං උප්පත්තික්කමං දස්සෙතුං (762.) **රූපං නිබ්බත්තමානං** ති ආදි වුත්තං. **සබ්බෙසං**ති කාමරූපභවිකානං සබ්බෙසං සත්තානං. **පටිසන්ධික්ඛණෙ පනා**ති එත්ථ "දසකත්තයං හොතී"ති පාඨසෙසො. තෙනාහ **යථෙවා**ති ආදිං. **පටිසන්ධික්ඛණෙ** දසකත්තයං හෙට්ඨා වුත්තම්පි, **තං ච ඛො සන්ධිචිත්තස්සා** ති ආදි තං විසෙසං දස්සෙතුං පුන වුත්තං. චිත්තස්ස තීසු ඛණෙසු කම්මජරූපානං සමුප්පත්තිතො ආහ (764) **තථෙවා**ති ආදිං. **තිංස තිංසෙවා**ති තිංස තිංසෙව කම්මජරූපානි. **ආනන්දාචරියො** පන චිත්තස්ස ඨිතික්ඛණමෙව නත්ථි, භංගක්ඛණෙ රූපුප්පාදො නත්ථීති චතුසමුට්ඨානිකානි පි රූපානි චිත්තස්ස උප්පාදක්ඛණෙ යෙව හොන්තීති ආහ. වුත්තං හි තෙන:-යො චෙත්ථ චිත්තස්ස ඨිතික්ඛණො වුත්තො, සො ච අත්ථි නත්ථීති විචාරෙතබ්බො. **චිත්තයමකෙ** හි උප්පන්නං උප්පජ්ජමානංති එතස්ස විභංගෙ "භඞ්ගක්ඛණෙ උප්පන්නං, නො ච උප්පජ්ජමානං"ති එත්තකමෙව වුත්තං, න වුත්තං ඨිතික්ඛණෙ භංගක්ඛණෙ චාති, තථා නුප්පජ්ජමානං නුප්පන්නංති එත්ථ "භංගක්ඛණෙ නුප්පජ්ජමානං නො ච නුප්පන්නං"ති එත්තකමෙව වුත්තං, න වුත්තං ඨිතික්ඛණෙ භංගක්ඛණෙ චාති. එවං නිරුද්ධං නිරුජ්ඣමානංති එතෙසං පරිපුණ්ණවිස්සජ්ජනෙ උප්පාදක්ඛණෙ අනාගතං චාති වත්වා ඨිතික්ඛණෙ අවචනං; අතික්කන්තකාලවාරෙ ච "භංගක්ඛණෙ චිත්තං උප්පාදක්ඛණං වීතිවත්තං"ති[1] වත්වා ඨිතික්ඛණෙති අවචනං ඨිතික්ඛණාභාවං චිත්තස්ස දීපෙති. සුත්තෙපි "ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතී"ති තස්සෙව එකස්ස අඤ්ඤථත්තභාවතො යස්සා අඤ්ඤථත්තං පඤ්ඤායති තස්සා සා සන්තති ඨිතීති න සක්කා වත්තුං, විජ්ජමානං තං[2] ඛණද්වයසමංගී ඨිතංති, යො චෙත්ථ චිත්තස්ස නිරොධක්ඛණෙ රූපුප්පාදො වුත්තො, සො ච විචාරෙතබ්බො. කස්මා? "යස්ස වා පන සමුදයසච්චං නිරුජ්ඣති, තස්ස දුක්ඛසච්චං උප්පජ්ජතීති? නො"ති වුත්තංති. න ච චිත්තසමුට්ඨානරූපමෙව සන්ධාය පටික්ඛෙපො කතොති සක්කා විඤ්ඤාතුං, චිත්තසමුට්ඨානස්ස[3] රූපාධිකාරස්ස අභාවතොති. ආචරියස්ස හි අයමධිප්පායො:- උප්පන්න-උප්පජ්ජමානවාරාදිසු ඨිතික්ඛණෙති අවචනං චිත්තස්ස

1. M. වීතික්කන්තංති. 2. B. වා. 3. M. චිත්තසමුට්ඨාන.

චිත්තසමුට්ඨානරූපස්සෙව[1] ඨිතික්ඛණො නාම නත්ථීති ඉමමත්ථං දීපෙති. න හි යථාධම්මසාසනෙ අභිධම්මෙ ලබ්භමානස්ස අවචනෙ කාරණං දිස්සති. න කෙවලමභිධම්මෙ අවචනමෙව චිත්තස්ස ඨිතික්ඛණාභාවජොතකං, අපි ච ඛො "ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතී"ති එවං භගවතා[2] වුත්තපාළි පි[2]. අඤ්ඤථත්තං නාම පුබ්බාපරවිසෙසො. අපි ච යථාභූතො ධම්මො උප්පජ්ජති, කිං තථාභූතොව භිජ්ජති, උදාහු අඤ්ඤථාභූතො? යදි තථාභූතොව භිජ්ජති න ජරතාය සම්භවො; අඤ්ඤථාභූතො අඤ්ඤො එව සොති සබ්බථාපි ඨිතික්ඛණස්ස අභාවො යෙව. යදි ච චිත්තස්ස භංගක්ඛණෙ රූපං උප්පජ්ජෙය්‍ය, තං දුක්ඛසච්චංති කත්වා නොති වත්තුං සක්කා වුත්තං ච තං. තස්මා විඤ්ඤායති චිත්තස්ස නිරොධක්ඛණෙ රූපුප්පාදො නත්ථීති.

ආචරිය **ජොතිපාල-ධම්මපාලත්ථෙරානං** පනෙතං නක්ඛමති, තෙ හි එකධම්මාධාරභාවෙ පි උප්පාදනිරොධානං අඤ්ඤො උප්පාදක්ඛණො, අඤ්ඤො නිරොධක්ඛණො, උප්පාදාවත්ථං හි උපාදාය උප්පාදක්ඛණො, නිරොධාවත්ථං උපාදාය නිරොධක්ඛණො. උප්පාදාවත්ථාය ච භින්නා නිරොධාවත්ථාති එකස්මිං යෙව ච සභාවධම්මෙ යථා ඉච්ඡිතබ්බා, අඤ්ඤථා අඤ්ඤො යෙව ධම්මො උප්පජ්ජති, අඤ්ඤො නිරුජ්ඣතීති ආපජ්ජෙය්‍ය. එවං නිරොධාවත්ථාය විය නිරොධාභිමුඛාවත්ථායපි භවිතබ්බං. සා ඨිති ජරතා චාති සම්පටිච්ඡිතබ්බමෙතං. යදි තං එවං, කස්මා පාළියං ඨිතික්ඛණො න වුත්තොති? විනෙය්‍යජ්ඣාසයානුරොධෙන නය-දස්සනවසෙන පාළිගති ති වෙදිතබ්බා. අභිධම්මදෙසනාපි හි කදාචි විනෙය්‍යජ්ඣාසයානුරොධෙන පවත්තති, යථා[3] රූපස්ස උප්පාදො උපචයො සන්තතීති භින්දිත්වා දෙසිතො. හෙතුසම්පයුත්තදුකාදිදෙසනා වෙත්ථ නිදස්සිතබ්බා.

යස්ස වා පනාති ආදිපුච්ඡාය විසජ්ජනෙ ච අරූපලොකං චිත්තසමුට්ඨානරූපං වා සන්ධාය 'නො' ති සක්කා වත්තුං. අයං හි යමකදෙසනාය පකති යදිදං යථාසම්භවං යොජනාති. අථ වා පච්චාසත්තිඤ්ඤායෙන යස්ස[4] සමුදයසච්චං නිරුජ්ඣති, තෙනස්ස[5] දුක්ඛසච්චං උප්පාදෙතබ්බංති? චිත්තචෙතසික-තප්පටිබද්ධරූප-සංඛාතං, තස්ස තදා උප්පත්ති නත්ථීති 'නො' ති විසජ්ජනං; න සබ්බස්ස සමුප්පාදෙ නිරොධවචනතො.[6] තස්මා න සක්කා චිත්තස්ස ඨිතික්ඛණෙ භංගක්ඛණෙ ච රූපුප්පාදං පටික්ඛිපිතුංති වදන්ති.

---

1. M. පොත්ථකෙ නත්ථි. 2. M එවමාගතා සුත්තන්තපාළිපි. 3. M. තථා. 4. M. යං. 5. M. තෙන යං. 6. M. වචනතො.

උතුජරූපානි පන පටිසන්ධිචිත්තස්ස ඨිතික්ඛණතො පට්ඨාය අට්ඨකවසෙන උප්පජ්ජන්ති. පටිසන්ධික්ඛණෙ හි උප්පන්නානං කම්මජරූපානං අබ්භන්තරෙ සහුප්පාදෙකනිරොධා තෙජොධාතු ඨානං පත්වා තස්ස ඨිතික්ඛණෙ අට්ඨරූපානි සමුට්ඨාපෙති. තත්ථ උප්පන්නා තෙජොධාතු සද්ධිං චිත්තස්ස භඞ්ගක්ඛණෙන, තත්ථ උප්පන්නා - පඨමභවඞ්ගස්ස උප්පාදක්ඛණෙනාති එවමාදිනා අට්ඨකං, කදාචි සද්දපාතුභාවකාලෙ තෙන සහ සද්දනවකං ච උප්පජ්ජති. චිත්තජරූපානි ච පටිසන්ධිතො අනන්තරං පඨමභවඞ්ගතො පට්ඨාය රූපජනකචිත්තානං උප්පාදක්ඛණෙ අට්ඨකවසෙන, සද්දපාතුභාවාදි-කාලෙ සද්දනවකාදිවසෙන ච පවත්තන්ති. ආහාරජානි පන එකස්ස ද්වින්නං වා සත්තාහානං අතික්කමෙ නිබ්බත්තන්ති. තත්ථ ච අජ්ඣොහටාහාරපච්චයෙන ආහාරො රූපං සමුට්ඨාපෙති, ගබ්භසයනස්ස ච කුතො අජ්ඣොහරණාහාරොති? මාතිතො. මාතරා හි භුත්තං කුච්ඡිගතස්ස සරීරෙ අබ්භඞ්ගං[1] විය ආහාරකිච්චං කරොති. තෙනාහු පොරාණා:

"යං චස්ස භුඤ්ජතී මාතා අන්නං පානං ච භොජනං
තෙන සො තත්ථ යාපෙති මාතුකුච්ඡිගතො නරො"ති.

තස්මා මාතරා අජ්ඣොහටාහාරෙන අනුග්ගහිතා සරීරබ්භන්තරිකා ඔජා ලද්ධපච්චයා රූපං සමුට්ඨාපෙති. චක්ඛුසොතඝාණ-ජිව්හාදසකා පන ඡසත්තාහෙ[2] අතික්කම්ම පච්ඡා සත්තමෙ සත්තාහෙ උප්පජ්ජන්ති. එකාදසමෙ සත්තාහෙති ආනන්දාචරියො අවොච. අයමෙත්ථ ගබ්භසෙය්‍යකානං රූපප්පවත්තිනයො.

ඔපපාතිකානං පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණෙ කම්මසමුට්ඨා-නානි සත්තතිරූපානි උප්පජ්ජන්ති. තථෙවස්ස ඨිතික්ඛණෙ භඞ්ගක්ඛණෙ ච සත්තති සත්තතීති ආදිනා වුත්තනයෙන උක්කංසාවකංසතො කාමභවිකසත්තානං රූපීබ්‍රහ්මානං ච යථා-වුත්තනයෙනෙව යථානුරූපං කම්මසමුට්ඨානානං උතුසමුට්ඨානානං ච පවත්ති වෙදිතබ්බා. ආහාරජරූපං පන කාමාවචරානං සබ්බපඨමං අත්තනො මුඛගතඛෙළං අජ්ඣොහරණකාලෙ උප්පජ්ජති. සඤ්ඤීබ්‍රහ්මානං සබ්බෙන සබ්බං නත්ථි. අසඤ්ඤීනං ච චිත්තජාහාරජානි නත්ථෙවාති අයං විසෙසො

එවං උප්පජ්ජමානෙසු ච පනෙතෙසු රූපෙසු යං චිත්තස්ස උප්පාදක්ඛණෙ උප්පන්නං, තං අත්තනා සහුප්පන්නචිත්තං ආදිං කත්වා සත්තරසමචිත්තස්ස නිරොධක්ඛණෙ නිරුජ්ඣති, ඨිතික්ඛණෙ

1. M. අබ්භඤ්ජනං. 2. M. පඤ්චපසාද-වත්ථුං.

උප්පන්නං අට්ඨාරසමස්ස උප්පාදක්ඛණෙ නිරුජ්ඣති. භඞ්ගක්ඛණෙ උප්පන්නං ඉමස්ස ඨිතික්ඛණෙ නිරුජ්ඣතී ති. එවං උප්පජ්ජන්තං නිරුජ්ඣන්තං ච යාව මරණචිත්තස්ස හෙට්ඨා සත්තරසමචිත්තං තාව යථාරහං චතුසන්තතිආදිවසෙන පවත්තති. ආසන්නමරණස්ස පන චුතිතො සත්තරසමචිත්තස්ස ඨිතික්ඛණමාදිං කත්වා කම්මජරූපං න සමුට්ඨාති. යදි සියා, මරණං න සියා අනුපච්ඡින්නත්තා. කම්මජරූපානං කම්මජරූපසමුච්ඡෙදෙ හි මතොති වුච්චති. වුත්තං හි:

"ආයු උස්මා ච විඤ්ඤාණං යදා කායං ජහන්ති' මං
අපවිද්ධො තදා සෙති නිරත්ථං ච කලිඞ්ගරං"ති.

සත්තරසමෙන සහ උප්පන්නං ච තං චුතිචිත්තෙන සහ නිරුජ්ඣති. අපරං ච න උප්පජ්ජති. ආයුක්ඛයා, කම්මක්ඛයා, උභයක්ඛයා, උපක්කමෙන වා කස්සචී ති එවං කම්මජස්සෙව හි මරණං හොති; සතිපි ආහාරජෙ අට්ඨකථාමතෙන චිත්තජෙ ච. තම්පි අපගතජීවස්ස න උප්පජ්ජති. උතුජරූපං පන පවත්තතෙව. තථා සංසෙදජානං. ඔපපාතිකානං පන සරීරනික්ඛෙපාභාවතො තම්පි නප්පවත්තතී ති.

(765.) උප්පාදවයත්තාය නිච්චො ධුවො න හොතීති **අනිච්චො.** නිච්චඛණිකතාය වා න ඉච්චො, සස්සතාදිවසෙන අනුපගන්තබ්බොති **අනිච්චො.** අයං හි විනාසො ජනකපච්චයතො අඤ්ඤහෙතුනිරපෙක්ඛතාය නිච්චඛණිකොව හොති. ධුවසාරවිරහිතත්තා **අධුවො.** අවසවත්තනතෙන **අනත්තා.** උදයවයපටිපීළනෙන දුක්ඛවත්ථුතාය ච දුක්ඛානං ඛන්ධො සමූහොති **දුක්ඛක්ඛන්ධො.** එවංවිධො පන සුඛෙහි අමිස්සො යෙවාති ආහ **කෙවලො** ති. කස්සචි පි රූපස්ස සුඛසභාවස්ස අභාවතො සකලොපි වා දුක්ඛක්ඛන්ධොති වුත්තං **දුක්ඛක්ඛන්ධො ච කෙවලො** ති.

(766.) පච්චයයාපනීයතාය[1] රොගමූලතාය වා **රොගතො.** සො හි යථාරහං පච්චයෙහි යාපෙතබ්බතාය යාප්‍යරොගො වියාති රොගතො දට්ඨබ්බො. යාප්‍යව්‍යාධි හි රොගො; ඉතරො ආබාධො; මූලව්‍යාධි විය වෙස අනුබද්ධව්‍යාධිනං කිලෙසරොගාදීනං ච මූලභාවතො රොගතො දට්ඨබ්බො. දුක්ඛසූලයොගිතාය[2] හි කිලෙසාසුචිපග්ඝරණතාය උප්පාද - ජරාභඞ්ගෙහි උද්ධුමාත - පරිපක්ක - පභින්නතාය ච **ගණ්ඩතො.** සො හි දුක්ඛදුක්ඛතා

1. M. පච්චයස්සූපනිස්සයතාය. 2. M. දුක්ඛතාසූලයොගිතාය.

සංඛාරදුක්ඛතා විපරිණාමදුක්ඛතා ති තිවිධදුක්ඛතාසංඛාතෙන රුජ්ජනෙන යුත්තතාය යථාරහමාරම්මණවසෙන ච[1] රාගාදි-කිලෙසාසුචිවිස්සන්දනතො, අහුත්වා සම්භවනතො, උප්පත්තියා උද්ධුමාතනතා, ජරාභංගෙහි ච[2] යථාක්කමං පරිපක්කපභින්න-භාවතො ගණ්ඩසදිසොති **ගණ්ඩතො** දට්ඨබ්බා. අවසවත්තනතාය අවිධෙය්‍යතාය ච **පරතො**. යථා හි පරො පත්ථෙන්තා පරස්ස වසං ගච්ඡති[3] එවමෙතං සුඛදුක්ඛාදිභාවෙන වසෙ වත්තෙතුං අසක්කුණෙය්‍යතාය අවසවත්තනතො; "මා ජීරථ, මා මීයථා"ති[4] ආදිනා විධාතුං අසක්කුණෙය්‍යතාය අවිධෙය්‍යභාවතො **පරතො** දට්ඨබ්බං. ව්‍යාධිජරාමරණෙහි පලුජ්ජනතො ආබ්‍යසනතො ච **පලොකතො**. ඉදං ව්‍යාධිආදීහි පකාරෙහි භිජ්ජනතො විනස්සනතො එතෙහි එව වා ආබ්‍යසනතො ව්‍යසනත්ථස්ස ලොකසද්දස්ස සවිසිට්ඨස්ස ආබ්‍යසනත්ථතාය පලොකතො දට්ඨබ්බං. **ඡන්දං** ති රජ්ජනවසෙන පවත්තඡන්දං.

(767.) ධම්මසෙනාය පති නායකොති **ධම්මසෙනාපති**. සාරිපුත්තත්ථෙරො, තෙන. හිතසංඛාතො අත්ථො එතස්සාති **හිතත්ථී**, තෙන. **සක්කච්චා** ති උග්ගහණධාරණාදිසු අතන්දිතො[5] හුත්වා.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර-**
**සංවණ්ණනාය දසමපරිච්ඡෙද**
**වණ්ණනා නිට්ඨිතා.**

---

1. M. සම්පත්තාගමවසෙන ච. 2. M. ජරාභංගභාවෙන 3. M. පරො පත්ථෙන්තො පුරිසෙන පරස්ස වසං න ගච්ඡති (අත්ථො න පාකටො 4. M. මරථාති. 5. B. අහින්දිතො.

# එකාදසමපරිච්ඡෙදවණ්ණනා

## (නිබ්බාන නිද්දෙස)

**79.** (768.) ආදිතො **රූපානන්තරං උද්දිට්ඨං යං නිබ්බානං**ති අත්ථො. **තස්ස** විභාවනං **යථාබලං පවක්ඛාමී** ති සම්බන්ධො.

භවාභවං ති භවතො භවං, ඛුද්දකමහන්තභවං වා. **විනනතො** ති සංසිබ්බනතො. තණ්හා හි සංසාරතාසිකාභාවෙන භවතො භවං සුගතිදුග්ගතිවසෙන ඛුද්දකමහන්තභවං වා අපරාපරභාවාය සංසිබ්බෙති, තුන්නකරණං විය කරොති. **නික්ඛන්තත්තා** ති විසංයොගවසෙන නිස්සටත්තා. මරණපටිපක්ඛතාය අමත-සදිසතාය වා **අමතං**. සබ්බදුක්ඛනිස්සටත්තා පරමසුඛං. සබ්බෙපි සංඛාරා සම්මන්ති උපසම්මන්ති[1], අනුප්පත්තිධම්මතං ආපජ්ජන්ති එතෙනාති **සබ්බසංඛාරසමථො**. ඛන්ධූපධිආදයො සබ්බෙපි උපධී උපද්දවා පටිනිස්සජ්ජීයන්ති එතෙනාති **සබ්බූපධිපටිනිස්සග්ගො**. යස්මා තං ආගම්ම කාමතණ්හාදිභෙදා තණ්හා සබ්බසො ඛයං ගච්ඡති නිරුජ්ඣති, තස්මා **තණ්හාක්ඛයො විරාගො නිරොධො** ති ච වුච්චති. අපි ච රුජ්ඣන්ති එත්ථ සත්තා කිලෙසනිගළබද්ධාති රොධො; සංසාරස්සෙතං අධිවචනං. තතො නික්ඛන්තො ති නිරොධො.

(770 ) **අධිගමා**ති තදනුරූපාය පටිපත්තියා අරියමග්ගෙන පටිවිජ්ඣිතෙන රාගක්ඛයාදිභාවෙන සබ්බදුක්ඛසන්තියා සන්තතාය කිලෙසසන්තාපාභාවෙන ච **සන්තිලක්ඛණං**. **අච්චුතිරසං**ති සභාවාපරිච්චජනතො අච්චතසම්පත්තිකං. **අස්සාසකරණරසං**ති අස්සාසකරණකිච්චං. තං හි පානභොජනාදිසුඛෙසු[3] සභය-කන්තාරෙ පරිබ්භමන්තෙන[3] පරිස්සන්තස්ස අද්ධික-පුරිසස්ස අස්සාසජනකභාවෙන උපසිතං වනන්තොදකං විය සබ්බඤ්ඤු-බුද්ධානම්පි වචනපථාතික්කන්ත-මහාදුක්ඛභෙරවෙ සංසාරකන්තාරෙ පරිබ්භමන්තෙන පරිසන්තස්ස යථානුරූපපටිපත්තිමග්ගං පටිපන්නස්ස යොගාවචරස්ස අනාදිම්හි සංසාරෙ සුපිනන්තෙනාපි අදිට්ඨපුබ්බතාය දස්සනසමකාලමෙව පරමස්සාසං ජනෙති. ඛන්ධනිමිත්තවිවිත්තතාය අවිග්ගහං හුත්වා ගය්හතීති **අනිමිත්තපච්චුපට්ඨානං**. සබ්බසංඛත-නිස්සරණූපායභාවතො නිස්සරණං පච්චුපට්ඨාපෙතීති **නිස්සරණ-පච්චුපට්ඨානං**.

---

1. M සම්මන්ති උපසමන්ති. 2 B M උච්චයතාය. 3. M පානභොජනා-දිසුඛුපචයඥතො. කාරිබ්භමන්තෙන. (දුප්පාඨො)

එවං නිබ්බානස්ස ලක්ඛණාදිකං දස්සෙත්වා ඉදානි විතණ්ඩවාදිපක්ඛං දස්සෙත්වා පරිහරන්තො ආහ **එත්ථා**හාති, ආදිං. **න පරමත්ථතො අත්ථි** අඤ්ඤත්‍ර පඤ්ඤත්තිමත්තතොති අධිප්පායො. කුතො පනායමභිනිවෙසොති ආහ **නිප්පීයානං** =පෙ= **අනුපලබ්භනීයත්තා**ති. **යථානුරූපාය පටිපත්තියා**ති සීලසමාධිපඤ්ඤා - සංඛාත - සම්මාපටිපත්තියා. යථා හි චෙතො-ඤාණලාභිනො එව අරියා පරෙසං ලොකුත්තරචිත්තං ජානන්ති, තථාපි ච අරහා එව සබ්බෙසං චිත්තං ජානාති; එවං නිබ්බානම්පි සීලාදි - සම්මාපටිපත්තිභූතෙන උපායෙනෙව උපලබ්භතීති **නත්ථීති න වත්තබ්බං** අරියෙහි උපලබ්භනීයතො. යථා හි ජච්චන්ධ - තෙමිරිකාදීනං[1] අදස්සනෙන සූරියාදයො නත්ථීති න වත්තබ්බා, චක්ඛුමන්තානං ගොචරභාවෙන අත්ථිවාති සිද්ධත්තා; එවමෙතම්පි බාලපුථුජ්ජනස්ස අදස්සනමත්තෙන නත්ථීති න වත්තබ්බං. අරියානං පන පඤ්ඤාචක්ඛුනො සරසෙනෙව උපට්ඨානතො එකන්තෙන සම්පටිච්ඡිතබ්බං අත්ථි නිබ්බානන්ති, අයමෙත්ථ අධිප්පායො.

**අථ** රාගාදීනං **ඛයමත්තමෙව නිබ්බානන්ති** චෙති සම්බන්ධො. **ආයස්මතා සාරිපුත්තත්ථෙරෙන** =පෙ= **දස්සිතො**ති සම්බන්ධො. රාගක්ඛයාදිදීපකං සුත්තං[2] නෙය්‍යත්ථන්ති අධිප්පායෙන [80] **තං නා**ති පටික්ඛෙපං කත්වා එකංසෙන චෙතං සම්පටිච්ඡිතබ්බං, ඉතරථා යථාරුතවසෙන පාළියා අත්ථෙ ගය්හමානෙ බහුදොසා ආපජ්ජන්තීති තෙ දස්සෙතුං **අරහත්තස්සපී**ති ආදි වුත්තං. අරහත්තං **පුට්ඨෙන** තෙනෙවායස්මතා සාරිපුත්තත්ථෙරෙනාති අධිප්පායො **තවමතෙනා**ති සාසනයුත්තිං අවිචාරෙත්වා පාළිදස්සනමත්තෙනෙව විප්පලපතො[3] තව අජ්ඣාසයෙන. **න පනෙතං** සුත්තං තථාපීති අධිප්පායො. ලොකුත්තරඵලචිත්තස්ස රාගාදීනං ඛයමත්තතාපජ්ජනං න යුත්තං, තස්සග්ගඵලස්ස චතුක්ඛන්ධභාවෙන පාළියං ආගතත්තා. **තස්මා**ති යුත්තිං අවිචාරෙත්වා පාළිදස්සනමත්තෙනෙව වොහරන්තස්ස අනිට්ඨප්පසංගතො. **ව්‍යඤ්ජනච්ඡායායා**ති විමද්දසහභූතාය පදත්ථමත්තච්ඡායාය.[4] **උභින්නන්**ති නිබ්බානවසෙන අරහත්තවසෙන ච ආගතානං උභින්නං සුත්තානං, **අත්ථො**ති අධිප්පායො. කො පන සො අත්ථොති ආහ: **යස්ස පනා**ති ආදිං.

---

1. B. තිමිරයුත්තා තෙමිරිකා 2 M රාගක්ඛයාදිනා සකසුත්තං
3. M. විප්පලවතො. 4 M සද්දත්ථමත්තච්ඡායාය.

**රාගාදීනං ඛයොති** රාගාදීනං අනුප්පාද-නිරොධො. සො ධම්මො අක්ඛයොපි සමානො රාගාදීනං ඛයස්ස උපනිස්සයත්තා **ඛයොපචාරෙන** රාගාදීනං ඛයො නිබ්බානන්ති **වුත්තොති. "තිපුසං ජරො, ගුළො සෙම්හං"[1]ති ආදීසු විය ඵලූපචාරෙන වුත්තං සියාති** සම්බන්ධො. කිලෙසානං අනුප්පාදනිරොධක්ඛයකරස්ස මග්ගස්ස ආරම්මණභූතං නිබ්බානං අත්ථතො ඛයස්ස උපනිස්සයොති වත්තබ්බතං ලභතීති ආහ **ඛයස්ස උපනිස්සයත්තාති ඛයොපචාරෙනාති** අත්තනො කාරියභූතස්ස ඛයස්ස අත්තනි උපචාරෙන, තස්ස නාමවසෙනාති වුත්තං හොති. ජරකාරණං තිපුසං ජරොති වුත්තො; සෙම්හකාරණං ගුළො සෙම්හන්ති වුත්තො. **ඛයෙනාති** රාගාදීනං පරික්ඛයාවසානෙ. ඛයොති මග්ගො වුච්චති, "ඛයෙ ඤාණං"ති ආදීසු විය. තස්ස අනෙන නිරොධාවසානෙ උප්පන්නත්තා[2] ඛයොති වුත්තං[2] ඵලූපචාරෙන සමීපූපචාරෙන වා.

**සබ්බෙ බාලපුථුජ්ජනාති** සොණසිගාලාදයො සබ්බෙපි බාලපුථුජ්ජනා. **සමධිගත =පෙ= භවෙය්‍යුං** ඛණවසෙන[3] රාගාදීනං ඛයස්ස තෙසම්පි අත්ථිතාය. තථා ච සති පටිපත්තියා නිරත්ථකභාවො ආපජ්ජෙය්‍යාති අධිප්පායො. **රාගාදිඛයානං බහුභාවතොති** රාගාදීනං විය තෙසං ඛයානම්පි තබ්බිකාරභාවෙන බහුභාවතො. එවං හි සති රාගස්ස ඛයො රාගක්ඛයො, න දොසාදීනං; තථා දොසක්ඛයොපි හි අඤ්ඤො රාගක්ඛයො, අඤ්ඤො දොසක්ඛයො, අඤ්ඤො මොහක්ඛයොති **තිණ්ණං** අකුසලමූලානං ඛයභූතානි තීණි නිබ්බානානි; චතුන්නං උපාදානානං ඛයභූතානි චත්තාරීති ආදිනා බහූනි නිබ්බානානි නාම හොන්ති.

ඉදානි ආදිසද්දසංගහිතෙ දොසෙ දස්සෙතුං **සංඛතලක්ඛණන්ති** ආදි වුත්තං. "තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛතලක්ඛණානි: උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතී"ති වචනතො වයසංඛාතො ඛයො සංඛතලක්ඛණං හොතීති වුත්තං **සංඛතලක්ඛණං නිබ්බානං භවෙය්‍යාති.** "ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං"ති වචනතො ආහ **සංඛතපරියාපන්නන්ති** යං පන සංඛතපරියාපන්නං තං ඉතරසංඛතධම්මා විය අනිච්චං හොති පච්චයාධීනවුත්තිතොති ආහ **සංඛතපරියාපන්නත්තා අනිච්චන්ති.** "අනිච්චා වත සංඛාරා"ති හි වුත්තං.

---

1 M. සෙම්හොති. 2. M. පොත්ථකෙ නත්ථි. 3. M. ඛයාවසානෙ.

එත්තාවතා ච කිං වුත්තං හොති? යදි භවතො මනොරථ-පරිපූරණත්ථං "ඛයං නිබ්බානං"ති වදාම, අසඞ්ඛතස්ස සඞ්ඛත-ලක්ඛණතා[1], සඞ්ඛතපටිපක්ඛස්ස සඞ්ඛතපරියාපන්නතා,[2] සබ්බ-කාලිකභාවෙන නිච්චස්ස[3] අනිච්චතා, තතො ච පරමසුඛස්ස දුක්ඛතා ච ආපජ්ජෙය්‍යාති වුත්තං හොති එත්තාවතා භඞ්ගක්ඛයස්ස නිබ්බානභාවෙ දොසං දස්සෙත්වා ඉදානි අනුප්පාදක්ඛයස්ස තබ්භාවං නිසෙධෙතුං **යදි ඛයො නිබ්බානං භවෙය්‍යාති** ආදි වුත්තං. පඨමමග්ගස්ස අනන්තරපච්චයභූතං ගොත්‍රභු නාම, සෙසමග්ගපුරෙචරං වොදානං නාම, ඵලසමාපත්ති-පුරෙචරං අනුලොමං නාම. තං පන සඞ්ඛතාරම්මණමෙවාති ඉධ න ගහිතං. **භද්දමුඛාති** පරස්ස සාදරාලපනවචනං.[4]

**ඛීයන්තීති** වත්තමානනිද්දෙසෙන ඉදානි ඛීයමානතං පුච්ඡති. එස නයො සෙසෙසුපි. **උපධාරෙත්වාති** උපපරික්ඛිත්වා. "ගොත්‍රභුවොදාන =පෙ= ආරම්මණං වදෙසී"ති පුච්ඡාය "රාගාදීනං ඛයමෙව වදාමී"ති තදා දින්නපටිවචනස්ස අවිරුජ්ඣනවසෙන සතිපුරෙක්ඛාරං කාරෙතීති අධිප්පායො. **ගොත්‍රභුචිත්තාදීනන්ති** ගොත්‍රභු - වොදාන – මග්ගානං ගොත්‍රභුක්ඛණෙ කිලෙසානං අනුප්පාදනිරොධස්ස අභාවතො ආහ **රාගාදයො ඛීයිස්සන්තීති**. **ඵලමෙවාති** කිලෙසානං ඛීණකාලෙ උප්පජ්ජමානං ඵලචිත්තමෙව. **ආරම්මණං අපස්සන්තොති** ගොත්‍රභුආදීනං වත්තබ්බාරම්මණං අපස්සන්තො. අථ වා ඉතරෙසං ආරම්මණභාවෙ සති ගහෙතබ්බං පච්චයං අපස්සන්තො.

**81.** **අපි චාති** ආදි පරියායන්තරෙනපි අනුප්පාදනිරොධස්ස නිබ්බානභාවනිසෙධනං. **උප්පාදීයන්තීති** අඤ්ඤොති පන මග්ගස්ස උප්පත්තියා කිලෙසක්ඛයොපි උප්පාදිතො නාම හොතීති කත්වා වුත්තං; න ඉතරථා තස්ස[5] උප්පාදො නාම අත්ථි. අථ වා අද්ධා **සො =පෙ= නිරුජ්ඣනකො භවිස්සතීති** එත්තකෙන ඛණනිරොධස්ස චෙව අනුප්පාදනිරොධස්ස ච නිබ්බානභාවෙ දොසං දස්සෙත්වා ඉදානි "ඛයෙ ඤාණං"ති ආදීසු විය මග්ගස්සාපි ඛයපරියායන්තා රාගක්ඛයොති ආදි-වචනමත්තෙනෙව පමාණභාවෙන[6] ගහිතෙ මග්ගස්සාපි නිබ්බානභාවප්පසඞ්ගො, තථා ච සති අතිධාවනං සම්භාවෙන්තො ආහ **අපි චාති** ආදිං. එවං හි සති උප්පාදීයන්තීති මග්ගමෙව සන්ධාය තිට්ඨති. යදි මග්ගස්ස නිබ්බානභාවප්පසඞ්ගො ඉධ සම්භාවිතො, එවං සති ගොත්‍රභුස්ස මග්ගාරම්මණාදිදොසා

1. M. සඞ්ඛතලක්ඛණතා. 2. M. — පරියාපන්නතා. 3. B. නිබ්බානස්ස 4. M. අනුනයවචනං. 5 M ඛයස්ස. 6 M. සම්මානභාවෙන.

වත්තබ්බාති? සච්චං, වත්තබ්බං, එත්තකේනාපි පන පරස්ස වචනපටිබාහනං සක්කා කාතුන්ති පරිහාරන්තරදස්සනේ ව්‍යාපාරෝ කතෝ ති **යථානුරූපාය පටිපත්තියාති** ජිවිසුද්ධිපරම්පරාසංඛාතාය යථානුලෝමපටිපත්තියා. **අස්සද්ධෝති** පරූළ්හසද්ධෝ[1] මග්ගගතාය අචලසද්ධාය සමන්නාගතෝ; මග්ගාගතසද්ධාය හි සමන්නාගතෝ ආකාසේ බුද්ධවේසං මාපෙත්වාපි “නිච්චං, සුඛං, අත්තා”ති වදන්තස්ස න සද්දහති, සේය්‍යථාපි **සූරම්බට්ඨෝති** [**අකතඤ්ඤූති** අකතං නිබ්බානං ජානාතීති **අකතඤ්ඤූ**, සච්ඡිකතනිබ්බානෝති අත්ථෝ.[2] **සන්ධිච්ඡේදෝති** භවසන්ධානකරස්ස තණ්හාපාසස්ස ඡින්දිතේන පුනබ්භවපටිසන්ධියාපි ඡින්නත්තා පටිසන්ධිං ඛෙපෙත්වා ඨිතෝ. **හතාවකාසෝති** ඛීණපටිසන්ධිකත්තා යේව ආයතිං කත්ථචි ඔකාසලෝකේ අදිස්සමානත්තා විහතාවකාසෝ. **වන්තාසෝති** කත්ථචි අභිසංගාභාවතෝ ඡඩ්ඩිතතණ්හෝති අත්ථෝ. **උත්තමපෝරිසෝති** සදේවකේ ලෝකේ අග්ගදක්ඛිණෙය්‍යතාය විසිට්ඨපෝරිසෝ.

**අප්පටිවිජ්ඣාති** පටිවිජ්ඣිතුං පටිලභිතුං දුක්කරා. කාමාදීනං නිස්සරණීයතාය නිස්සරණීයා. **යදිදං එතං කාමානං නිස්සරණන්ති** සම්බන්ධෝ. තත්ථ **කාමානං නිස්සරණන්ති** කාමේහි නිග්ගමනං. අථ වා නිස්සරන්ති නිග්ගච්ඡන්ති එත්ථ එතේන වාති නිස්සරණං. කාමානං නිස්සරණට්ඨානන්ති නිස්සරණූපායෝති වා අත්ථෝ. **නෙක්ඛම්මන්ති** පඨමජ්ඣානං, තං හි කාමේහි නික්ඛන්තන්ති නෙක්ඛම්මන්ති ඉධ ගහිතං. අඤ්ඤත්ථ පන පබ්බජ්ජාදයෝ නෙක්ඛම්මන්ති වුච්චන්ති. වුත්තං හි:

“පබ්බජ්ජා, පඨමජ්ඣානං, නිබ්බානං ච විපස්සනා,
සබ්බේපි කුසලා ධම්මා නෙක්ඛම්මන්ති පවුච්චරේ”ති.

**ආරුප්පන්ති** ආකාසානඤ්චායතනං. **භූතන්ති** විජ්ජමානං, ඛන්ධපඤ්චකන්ති අත්ථෝ. “භූතමිදන්ති සාරිපුත්ත සමනුපස්සසී”ති[3] ආදීසු හි ඛන්ධපඤ්චකං භූතන්ති වුච්චති. අත්තනෝ කාරණං පටිච්ච සමං සම්මා ච උප්පන්නන්ති පටිච්චසමුප්පන්නං. **පඨමජ්ඣානාකාසානඤ්චායතනානම්පි අභාවෝ භවෙය්‍යාති** සංඛතනිස්සරණභාවේන වුත්තස්ස නිබ්බානස්ස අභාවප්පත්තියා ච තදේකයෝගනිද්දිට්ඨානං යථාක්කමං කාමරූපනිස්සරණානං පඨමජ්ඣානාකාසානඤ්චායතනානම්පි අභාවෝ යේව ආපජ්ජෙය්‍ය.

---

1. M. පබුද්ධසද්ධෝ. 2. මරම්මපොත්ථකෙ අයං පාඨො නත්ථි. 3. M. සමනුපස්සසීති.

ඉදානි යථාධිප්පෙතමත්ථං ආගමෙන දස්සෙතුං **න තු ඛොති** ආදි වුත්තං. **අත්ථි** =පෙ= **සුඵුස්සිතන්ති**, "නත්ථි නිස්සරණං ලොකෙ කිං විවෙකෙන කාහසී"ති එවං මාරෙන පටිබාහිතෙ තම්පති[1] "අත්ථි නිස්සරණං ලොකෙ පඤ්ඤාය මෙ සුඵස්සිතං"ති නිබ්බානං පතිට්ඨපෙන්තෙන ආලවකත්ථෙරෙන වුත්තං, **සුඵුස්සිතන්ති**[2] සුඵුස්සිතං[3], සච්ඡිකතන්ති වුත්තං හොති. **අජාතන්ති** ආදීනි චත්තාරි පදානි අඤ්ඤමඤ්ඤවෙවචනානි. අථ වා වෙදනාදයො විය හෙතුපච්චයසමවායසංඛාතාය කාරණසාමග්ගියා න ජාතං න නිබ්බත්තන්ති **අජාතං**. කාරණෙන විනා සයමෙව ච න භූතං න උප්පන්නන්ති **අභූතං**. එවං අජාතත්තා අභූතත්තා යෙව න කෙනචි කාරණෙන කතන්ති **අකතං**. ජාත-භූත-කතභාවො ච නාම සංඛතධම්මානං හොති, න අසංඛතසභාවස්ස නිබ්බානස්සාති දස්සනත්ථං **අසංඛතන්ති** වුත්තං. පටිලොමතො වා සමෙච්ච සම්භූය පච්චයෙහි කතන්ති සංඛතං, න තථා සංඛතං සංඛත-ලක්ඛණරහිතන්ති ච **අසංඛතන්ති**. එවං අනෙකෙහි කාරණෙහි නිබ්බත්තිසභාවෙ පටිසිද්ධෙ පකතිවාදීනං පකති විය සියා නු ඛො එකෙනෙව කාරණෙන එතං කතන්ති ආසංකායං න කෙනචි කතන්ති දස්සනත්ථං **අකතන්ති** වුත්තං. එවං අප්පච්චයම්පි සමානං සයමෙව නු ඛො ඉදං භූතං පාතුභූතන්ති ආසංකාය තං නිවත්තනත්ථං **අභූතන්ති** වුත්තං. අයං චෙතස්ස අසංඛතාකත-අභූතභාවො සබ්බෙන සබ්බං අජාතිධම්මත්තාති දස්සෙතුං **අජාතන්ති** වුත්තං.

**අසංඛතන්ති** ඉති-සද්දො ආදිඅත්ථො. තෙන "නො චෙතං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසංඛතං, නයිධ භික්ඛවෙ ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසංඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායතී"ති එවමාදිසුත්තපදං සංගණ්හාති. තෙනාහ **අනෙකෙසු සුත්තන්තෙසූති**. ධම්මෙන සදෙවකස්ස ලොකස්ස සාමී, ධම්මස්ස වා යථිච්ඡිතං දෙසනතො සාමී ඉස්සරොති **ධම්මස්සාමී**[4]. තථාගතසද්දස්සත්ථො හෙට්ඨා කථිතොව. සම්මා සාමං සබ්බධම්මෙ අභිසම්බුද්ධො, සම්මා සයමෙව සම්මොහනිද්දාවිගමෙන පටිබුද්ධො බුද්ධියා විකසිතවාති **සම්මාසම්බුද්ධො**.

**පරිත්තත්තිකෙති** "පරිත්තා ධම්මා, මහග්ගතා ධම්මා, අප්පමාණා ධම්මා"ති එවං පරිත්තාදිධම්මවසෙන ආගතෙ

1. M පොත්ථකෙ තත්ථ 2. M. සුඵුසිතං 3 M. සුඵුඵුස්සිතං. 4. B. සමානස්සමෙව. 5. අසංඛාය. 6. B. නිත්ථානත්ථං. 7. B. ධම්මසාමී.

පරිත්තත්තිකෙ. **න වත්තබ්බාරම්මණානීති**[1] න වත්තබ්බාරම්මණත්තප්පසඞ්ගතො. තෙනාහ [82.] **න වත්තබ්බාරම්මණපක්ඛං භජන්තීති**. **රූපාවචරතිකචතුක්කජ්ඣානානීති** චතුක්කනයෙ තිකජ්ඣානානි පඤ්චකනයෙ චතුක්කජ්ඣානානි. කුසලකිරියානං අභිඤ්ඤාභාවප්පත්තානි පරිත්තාදිකෙපි ආරබ්භ පවත්තනතො වුත්තං **චතුත්ථජ්ඣානස්ස විපාකොති**. **තස්මාති** යථාවුත්තයුත්තිතො පාළිතො ච කිඤ්ච හි යො සඞ්ඛතධම්මාරම්මණං විපස්සනාඤාණං අපි ච අනුලොමභාවප්පත්තං කිලෙසෙ තදඞ්ගවසෙන පජහති; සමුච්ඡෙදවසෙන පජහිතුං න සක්කොති, තථා සම්මුතිසච්චාරම්මණං පඨමජ්ඣානාදි කුසලඤාණං වික්ඛම්භනවසෙනෙව කිලෙසෙ පජහති; න සමුච්ඡෙදවසෙන; ඉති සඞ්ඛතධම්මාරම්මණස්ස සම්මුතිසච්චාරම්මණස්ස ච ඤාණස්ස කිලෙසානං සමුච්ඡෙදප්පහානෙ අසමත්ථභාවතො තෙසං සමුච්ඡෙදප්පහානකරස්ස අරියමග්ග-ඤාණස්ස තදුභයවිපරීතසභාවෙන[2] ආරම්මණෙන භවිතබ්බං, තං ච නිබ්බානමෙව. තෙනාහු පොරාණා:

"ඤාණං යං සඞ්ඛතාලම්බං පඤ්ඤත්තාලම්බමෙව වා
පාපෙ හනති,න තං වත්ථු, තදඤ්ඤං සම්පටිච්ඡියං"ති.

**රූපසභාවාභාවතොති** එත්ථ යථා රූපධම්මානං රුප්පනං සභාවො පටිඝාතවන්තතා කලාපතො වුත්තියා පදෙසසම්බන්ධො සභාවො, එවං නිබ්බානස්ස කත්ථචි පටිඝාතො සප්පදෙසතා වා නත්ථීති දසෙසති. න හි නිබ්බානං අසුකදිසාය අසුකදෙසෙති වා නිද්දිසියති. **පපඤ්චාභාවතොති** තණ්හා-මාන-දිට්ඨිප්පපඤ්චෙහි සහ අනවට්ඨානවසෙන[3] අභාවතො, තෙසං අභාවප්පච්චයතාය ච. තණ්හා-දිට්ඨි මානා හි සංසාරෙ සත්තෙ පපඤ්චෙන්තීති පපඤ්චා නාම.

එවං නිබ්බානං යුත්තිතො සුත්තතො ච සාධෙත්වා ඉදානි තස්ස පරියායදස්සනත්ථං (772) **අච්චන්තමමතං සන්තන්ති**[4] ආදි වුත්තං. තත්ථ සංසාරපවත්තියා පරියොසානභූතත්තා අන්තං. ඉමිනා අනුපාදිසෙසනිබ්බානධාතු කථිතාති වදන්ති. සොපාදිසෙසනිබ්බාන-ධාතු පි වට්ටති. **අමතන්ති** පි පඨන්ති, සො හෙට්ඨා වුත්තත්ථො. උප්පාදවයන්තාභාවෙන **අනන්තං**. කිලෙසපරිළාහාභාවෙන කිලෙ-සක්ඛොභාභාවෙන ච **සන්තං**. පලොකිතත්තාභාවෙන **අපලොකිතං**. අතිත්තිකරභාවෙන **පණීතං**. සබ්බදුක්ඛසඝතතො **සරණං**. කිලෙසචොරෙහි අනුපද්දුතත්තා නිබ්භයතාය **ඛෙමං**. සබ්බුපද්දව-නිවාරණතො **තාණං**. ජාතිආදිදුක්ඛෙහි අනුබද්ධස්ස අල්ලීයිතුං

1. පෙළෙ න වත්තබ්බාරම්මණභාවතො 2. M. විපරීතභාවෙන. 3. M. පකාසනාමඨානවසෙන (දුප්පාඨො) 4. M. අච්චන්තමනන්තන්ති

ගුත්තට්ඨානත්තාය **ලෙණං** යථාපටිපන්නස්ස සන්තිදායකත්තෙන පරමපතිට්ඨාභාවතො **පරායණං**. සබ්බපීළාවිමුත්තත්තාය **සිවං**. උපතිස්සයහීනානං සබ්බඤ්ඤුබුද්ධතො සුත්වාපි ඨපෙත්වා ගුණවසෙන සභාවතො පටිවිජ්ඣිතුං දුක්කරත්තාය **නිපුණං**. අවිපරීතත්තාය **සච්චං**. සබ්බදුක්ඛපරික්ඛයකරත්තාය **දුක්ඛක්ඛයං** තෙජුස්සදත්තාය සන්තත්ත-අයොගුළෙ මක්ඛිකාහි විය චතූහි ආසවෙහි ආලම්බනකරණවසෙන පවත්තිතුං අසක්කුණෙය්‍යත්තාය **අනාසවං** මහාකාරුණිකස්සාපි ධම්මදෙසනාය අප්පොස්සුක්කභාවාපාදනෙන පටිවිජ්ඣිතුං දුක්කරත්තාය **සුදුද්දසං**. ලොකුත්තරධම්මෙසු පි අසංඛතගුණෙන විසිට්ඨත්තාය **පරං**. සංසාරමහාසමුද්දස්ස පරතීරභූතත්තා **පාරං**. මංසචක්ඛුනො දිබ්බචක්ඛුනො වා අගොචරත්තාය **අනිදස්සනං**. නිදස්සනසංඛාතාය උපමාය අභාවතො වා **අනිදස්සනං**. අවිපරිණාමධම්මත්තා **ධුවං**. තතො යෙව පරමපතිට්ඨාභාවතො **දීපං**. රොගාදිපීළාභාවතො **අබ්‍යාපජ්ඣං**. තතො යෙව **අනීතිකං**. තණ්හාලයාභාවතො **අනාලයං** සංඛතාසංඛතෙසු අසංඛතකොට්ඨාසභූතත්තා, පරමපතිට්ඨාභාවතො වා **පදං**. අවිනාසිභාවෙන **අච්චුතං**. තතො යෙව අක්ඛරණතො අවිස්සන්දනතො[1] **අක්ඛරං**. සංඛතනිස්සටත්තා **විමුත්ති**. භවබන්ධනවිමුත්තිහෙතුත්තාය **මොක්ඛං** (776) **එවංති** යථාවුත්තනයෙන. **විඤ්ඤූ යා**ති උග්ගහපරිපුච්ඡාවසෙන ඤාත්වා. **අධිගමූපායො**ති පටිවිජ්ඣනූපායභූතා තිස්සො සික්ඛා **ඤාතබ්බා**ති පටිපජ්ජිතබ්බා.[2]

(777.) සද්ධං බුද්ධිං ච **කරොති** වඩ්ඪෙතීති **සද්ධාබුද්ධිකරං**. **තථාගතම්හෙති** තිපිටකබුද්ධවචනෙ, චතුසච්චෙසු වා පඤ්ඤාය සම්භූතා, පඤ්ඤාය වා සම්භවො එතස්සාති **පඤ්ඤාසම්භවං**. තදෙව සම්පසාදනං, බුද්ධාදීසු අධිමුච්චනං, තං කරොතීති **පඤ්ඤාසම්භවසම්පසාදනකරං**. **අත්ථබ්‍යඤ්ජනසාලිනං**ති අතිමධුරෙහි අත්ථබ්‍යඤ්ජනෙහි සමන්නාගතං. අත්ථබ්‍යඤ්ජනසාරවන්තංති වා අත්ථො, රකාරස්ස **ල**කාරං කත්වා සාරං ජානන්තීති සාරඤ්ඤූ, තෙ විමොහාපෙතීති **සාරඤ්ඤුවිමොහාපනං** **නිට්ඨං**ති පරියොසානං. සුතමයඤාණමූලකං අනුපාදාපරිනිබ්බානංති අත්ථො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාරසංවණ්ණනාය එකාදසමපරිච්ඡෙදවණ්ණනා නිට්ඨිතා.**

---

1. M. අවිනස්සනතො. B. අවිස්සන්දනතො 2. B. පටිපජ්ජිතබ්බා.

# ද්වාදසමපරිච්ඡෙදවණ්ණනා

## (පඤ්ඤත්තිනිද්දෙස)

83. **එත්ථාති** යථාඋද්දිට්ඨධම්මානං නිද්දෙසපරියොසානෙ. **එත්තකමෙවාති** චිත්ත - චෙතසික - රූප - නිබ්බානමත්තමෙව. **පඤ්ඤපෙතබ්බතොති** පරමත්ථධම්මා විය සකසකසභාවවසෙන අපඤ්ඤායමානා හුත්වා ලොකසංකෙතවසෙන පඤ්ඤාපියමානත්තා. **පඤ්ඤාපනතොති** පරමත්ථවසෙන විජ්ජමානාවිජ්ජමානධම්මානං පකාසනවසෙන පඤ්ඤාපනතො. තත්ථ **පඤ්ඤපෙතබ්බතොති** ඉමිනා පඤ්ඤාපීයති පකාරෙන ඤාපීයතීති පඤ්ඤත්තීති එවං කම්මසාධනවසෙන අත්ථපඤ්ඤත්තිභූතා උපාදායපඤ්ඤත්ති වුත්තා. **පඤ්ඤාපනතොති** ඉමිනා පකාරෙන ඤාපෙතීති පඤ්ඤත්තීති එවං කත්තුසාධනවසෙන තස්සා අභිධායකභූත - නාමපඤ්ඤත්ති වෙදිතබ්බා. පඤ්ඤත්තිදුකනිද්දෙසෙ **සංඛා** =පෙ= **අභිලාපොති** ඡහි පදෙහි නාමපණ්ණත්ති ආචරියානං ඉච්ඡිතත්තා වුත්තං **තෙනෙවාහාති** ආදිං.

**තෙසං තෙසං ධම්මානංති** එත්ථ අභිධම්මමාතිකාය වුත්තානං කුසලාකුසලාදිධම්මානං. **සංඛාති** අහං මමාති ආදිනා සංඛායමානත්තා. **සමඤ්ඤාති** සංකෙතවසෙන ඤායමානත්තා. **පඤ්ඤත්තීති** අසංකරවසෙන අනෙකධා විභජිත්වා පඤ්ඤාපියමානත්තා. **වොහාරොති** පාකටං කත්වා වුච්චමානත්තා, කථනවසෙන උපයුජ්ජමානත්තා වා. අත්ථාභිමුඛං නමතීති **නාමං**. තං පනන්වත්ථරුළ්හිවසෙන දුවිධං. සාමඤ්ඤ – ගුණ – කිත්තිම – ඔපපාතිකනාමවසෙන චතුබ්බිධං. **නාමකම්මංති** නාමකරණං. **නාමධෙය්‍යංති** නාමඨපනං. නාමධෙය්‍යංති වාසෙට්ඨාදිනාමං[1]. අක්ඛරද්වාරෙන අත්ථං නීහරිත්වා උත්ති කථනං **නිරුත්ති. බ්‍යඤ්ජනංති** පාකටකරණං. **අභිලාපොති** අභිලපනං.

**අහං** ති රූපාදිඅවිනිමුත්තං[2] අහංකාරබුද්ධිවිසයභූතං අත්තනො ඛන්ධසමූහසන්තානමුපාදාය පඤ්ඤත්තං තදඤ්ඤානඤ්ඤභාවෙන අනිබ්බචනීයං උපාදාපඤ්ඤත්තිං වදන්ති. තෙනාහ **අහං** ති ආදිං. **අහන්ති හි රූපාදයො ධම්මෙ උපාදාය පටිච්ච කාරණං කත්වා** ති උපාදාය පඤ්ඤත්තියා උප්පත්තිං දස්සෙත්වා **යථා** ති ආදිනා තං පකාසෙති. යස්මා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො ති එවං සංඛාති ඉමස්සෙව වෙවචනං, තස්මා වුත්තං

1. M. වා සෙට්ඨා නාමං. 2. M. රූපාදිවිනිමුත්තං.

**ඉදානි පඤ්ඤාපනතො පඤ්ඤත්ති** ති ආදිං. තදනුරූපා ජාතාති **තජ්ජා**. අවිජ්ජමානපඤ්ඤත්ති විය කෙවලං ලොකසංකෙතවසෙනෙව අහුත්වා ධම්මසභාවස්ස අනුරූපවසෙන පවත්තා පඤ්ඤත්ති ති අත්ථො. නාමපඤ්ඤත්ති පි වචනත්ථසංඛාතකාරණං උපාදාය පටිච්ච පවත්තනතො උපාදාය පඤ්ඤත්ති වොහාරං ලභතී ති තස්සාපි **උපාදායපඤ්ඤත්ති**පරියායො වුත්තො. ගණ්ඨිපදකාරෙනාපි ඉමිනා අධිප්පායෙන "උපාදායපඤ්ඤත්තී ති උපාදානවන්ති පඤ්ඤත්ති[1] කාරණවතිං කාරණභූතමත්ථමුපාදාය ගහෙත්වා තංනිස්සයෙන පඤ්ඤාපියති, සබ්බාපි පඤ්ඤත්තිභෙදෙ, අනෙන ලක්ඛණෙන උපාදායපඤ්ඤත්තිපරියායමෙව[2] භජති. අනුපාදාය හි පඤ්ඤත්ති නත්ථී ති වුත්තං. **උපනිධායපඤ්ඤත්ති** ති. පටිපක්ඛභූතං එකං පණ්ණත්තිං උපනිධාය අපෙක්ඛිත්වා පවත්තා පණ්ණත්ති. චක්ඛුසොතගහණෙන අජ්ඣත්තිකායතනානි දස්සෙති; රූපසද්දගහණෙන බාහිරායතනානි. පථවි - තෙජ - වායුගහණෙන ඵොට්ඨබ්බායතනං පභෙදතො දස්සෙති. එතෙන ධම්මායතනෙ පි ලබ්භමානභෙදෙ දස්සිතො ති දට්ඨබ්බං.

යස්මා පථවාදිකා පඤ්ඤත්ති සසම්භාරපථවියං එකස්ස නාමං ගහෙත්වා සමූහමෙවොපාදාය පඤ්ඤාපියති, ඝටාදිකා ච පඤ්ඤත්ති ධම්මසමූහෙසු සබ්බස්සෙව නාමං ගහෙත්වා සමූහමෙවොපාදාය පඤ්ඤාපියති, තස්මා වුත්තං **එකස්ස වා** ති ආදිං. තත්ථ එකස්ස නාමං ගහෙත්වා සමූහමුපාදාය පඤ්ඤාපියමානාය පථවාදිවසෙන පාකටභාවතො තං ඨපෙත්වා ඉතරං දස්සෙතුං **ඝටං** ති ආදි වුත්තං. අයං සමූහපඤ්ඤත්ති නාම සමූහස්ස පඤ්ඤාපනතො. **84.** දිසාකාසාදීසු දිසාගහණෙන ච සූරියපරිවත්තනමුපාදාය පඤ්ඤාපියමානං පුරත්ථිමාදිදිසාපඤ්ඤත්තිං දස්සෙති. ආකාසගහණෙන අසම්ඵුට්ඨධම්මෙ උපාදාය පඤ්ඤාපියමානං කූපගුහාදිකං අජටාකාසපඤ්ඤත්තිං, උග්ඝාටිතාකාසකසිණං උපාදාය පඤ්ඤාපියමානං කසිණුග්ඝාටිමාකාසපඤ්ඤත්තිං ච දස්සෙති[3]. කාලගහණෙන [අතීතාදිධම්මෙ උපාදාය අතීතාදිවසෙන පුබ්බණ්හාදිවසෙන ච පඤ්ඤාපියමානං කාලපඤ්ඤත්තිං, චන්දාවත්තනාදිකමුපාදාය පඤ්ඤාපියමානං පුරත්ථිමාදිදසාපඤ්ඤත්තිං ච දස්සෙති. නිමිත්තගහණෙන බහිද්ධා පථවිමණ්ඩලාදිකං, අජ්ඣත්තිකං ච භාවනාවිසෙසං උපාදාය පඤ්ඤාපියමානං කසිණනිමිත්තාදිකං දස්සෙති. අභාවගහණෙන භාවනාබලෙන අප්පවත්තනසභාවං ආකාසානඤ්චායතනජ්ඣානං උපාදාය පවත්තං ආකිඤ්චඤ්ඤ-

1. B උපාදාය වචීපඤ්ඤත්ති. 2. M උපාදාය පඤ්ඤත්තීමෙව. 3. උග්ඝාටිතාකාසාදිපාඨො මරම්මපොත්ථකෙ නත්ථි. 4, M. පොත්ථකෙ නත්ථි.

යතනක්ඛානාරම්මණං අභාවපඤ්ඤත්තිං **දස්සෙති.** නිරොධග්ගහණෙන භාවනාබලෙන නිරුද්ධං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය පඤ්ඤත්තං නිරොධසමාපත්තිං[1] දස්සෙති. ආදිග්ගහණෙන ච ඛයවයාදිභාවං තං තං ධම්මමුපාදාය පඤ්ඤපියමානං අනිච්චලක්ඛණාදිකං සඞ්ගණ්හාති.

සා හි දිසාකාසාදිකා විය ධම්මසමූහමුපාදාය අපඤ්ඤත්තභාවතො අසමූහපඤ්ඤත්ති යෙවාති. සා අයං දුවිධාපි උපාදාය පඤ්ඤත්ති තජ්ජාපඤ්ඤත්තිවචනත්ථං අමුඤ්චිත්වා පවත්තිතො උපාදාපඤ්ඤත්තියං යෙව සඞ්ගය්හතී ති වුත්තං **විජ්ජමානං පරමත්ථං ජොතෙතී** ති. එවඤ්ච කත්වා උපරි ඡපඤ්ඤත්තියො එත්ථෙව සඞ්ගහං ගච්ඡන්තී ති වුත්තං. **විජ්ජමානං** ති සභාවෙන උපලබ්භමානං. **අවිජ්ජමානං** ති ඨපෙත්වා ලොකසඞ්කෙතං සභාවවසෙන අනුපලබ්භමානං. **නාමමත්තං** ති නාමමත්තවචනං.

**සොතද්වාරජවනානන්තරං ගහිතපුබ්බසඞ්කෙතෙනා** ති එත්ථ පච්චුප්පන්නසද්දාරම්මණාය සොතද්වාරජවනවීථියා තදනුසාරප්පවත්තාය ච අතීතසද්දාරම්මණාය මනොද්වාරජවනවීථියා ච අනන්තරං පවත්තෙන. මනොද්වාරජවනවීථි පි හි සොතද්වාරජවනානන්තරප්පවත්තා තග්ගහණෙනෙව ඉධ ගහිතා. **ගහිතපුබ්බසඞ්කෙතෙනා** ති "අයං ඉමස්ස අත්ථො, ඉදම්මිස්ස වාචකං"ති එවං වචන - වචනත්ථසම්බන්ධගහණවසෙන ගහිතපුබ්බභාගසඞ්කෙතෙන. **යායා** ති යාය නාමපඤ්ඤත්තියා. යාය[2] **කරණභූතාය** මනොද්වාරජවනවිඤ්ඤාණෙන කත්තුභූතෙන; මනොද්වාරජවනවිඤ්ඤාණෙන වා **කරණභූතෙන,** යාය නාමපඤ්ඤත්තියා කත්තුභූතායාති අත්ථො. **පඤ්ඤාපීයතී** ති සම්මුතිපරමත්ථවසෙන දුවිධං අත්ථජාතං පඤ්ඤපියති, විඤ්ඤායතී ති වුත්තං හොති. තෙනාහු පොරාණා:

"අත්ථා යස්සානුසාරෙන විඤ්ඤායන්ති තතො පරං
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙතනිම්මිතා"ති*

කතරජවනවීථියං පනායං විඤ්ඤායතීති? ඝටොති ආදි සද්දං සුණන්තස්ස එකමෙකං සද්දං ආරබ්භ පච්චුප්පන්නාතීතාරම්මණවසෙන ද්වෙ ද්වෙ ජවනවාරා හොන්ති. තතො සද්දසමුදායමාරබ්භ එකො, තතො නාමපඤ්ඤත්තිමාරබ්භ එකොති

1. M. නිරොධපඤ්ඤත්තිං. 2. M. පොත්ථකෙ නත්ථි.

* අභිධම්මත්ථසඞ්ගහ.

එවං සද්දසමුදායාරම්මණාය ජවනවීථියා අනන්තරං නාමපඤ්ඤත්ති පාකටා හොති; තතො පරං අත්ථාවබොධොති ආචරියා. යං **සන්ධාය ජනකනයො** වුත්තොති සම්බන්ධො.

**අවිජ්ජමානාන**න්ති පරමත්ථතො අවිජ්ජමානානං. **කෙනචි ආකාරෙනා**ති පරමත්ථතො ලොකසංකෙතතො වා කෙනචි පකාරෙන අනුපලබ්භමානානං. **පඤ්චමසච්චාදීන**න්ති ආකාසාදි පඤ්චමසච්චාදීනං. ආදිගහණෙන අට්ඨමබොජ්ඣංගාදිකෙ සංගණ්හාති. **පකතිපුරිසාදීන**න්ති සත්ත – රජ – තමානං සමානාවත්ථා **පකති**. අංගුට්ඨාදිපරිමාණො කාරකො වෙදකො අත්තා පුරිසොති ආදිනා පරිකප්පිතානං **පකතිපුරිසාදීනං**, ආදිගහණෙන ආකාසකුසුමාදිං සංගණ්හාති. විජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති පරමත්ථතො විජ්ජමානෙහි තෙවිජ්ජාදීහි[1] අවිජ්ජමානස්ස පුග්ගලස්ස පඤ්ඤත්තත්තා. සෙසෙසුපි ඉමිනාව නයානුසාරෙන අත්ථො වෙදිතබ්බො. එත්ථවාති උපාද-පණ්ණත්තියමෙව.

“කුසග්ගෙනුදකමාදාය සමුද්දෙ උදකං මිණෙ
එවං මානුසකා කාමා දිබ්බකාමාන සන්තිකෙ”ති

වචනතො මනුස්සලොකෙ චක්කවත්තිසම්පත්ති පි දිබ්බ-සම්පත්තිං උපනිධාය හීනා[2] යෙවාති වුත්තං:- **කපණං මානුසකං** =පෙ= **උපනිධායා**ති. මනුස්සලොකෙ භවං **මානුසකං**.

(778.) **පරමත්ථො ච පඤ්ඤත්ති**[3]ච විජ්ජතීති පාඨසෙසො. **තතියා කොචි න විජ්ජති** අනුපලබ්භමානත්තා. වුත්තං හෙතං මහාඅට්ඨකථායං:

“ද්වෙ සච්චානි අක්ඛාසි සම්බුද්ධො වදතං වරො
සම්මුතිං පරමත්ථං ච, තතියං නොපලබ්භතී”ති

**පරවාදෙසු න කම්පතී**ති පකති – පුරිසත්තාදි – වාදීනං[4] පරෙසං තිත්ථියානං වාදෙසු සම්පත්තෙසු නිමිත්තභූතෙසු වා න කම්පති. නප්පවෙධති, න චලතීති අත්ථො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර-
වණ්ණනාය ද්වාදසමපරිච්ඡෙදවණ්ණනා
නිට්ඨිතා.**

1. M. විජ්ජාදීහි. 2. M. නිහීනා. 3. M. පොත්ථකෙ නත්ථි.
4. M. B. පකති පුරිසත්තරාදිවාදීනං.

# තෙරසමපරිච්ඡෙදවණ්ණනා

## (කාරකපටිවෙධො.)

**85. නිද්දිට්ඨො**ති උද්දෙසනිද්දෙසාදිවසෙන දස්සිතා. **කුසලාදයො**ති කුසලාකුසලා. එතෙසං පන න නිද්දිට්ඨොති සම්බන්ධො. දුවෙච්ච කාරකොති වචනං විය වෙදකොති අවුත්තෙපි **අත්තා කාරකො** වෙදකොති අත්තනො ලද්ධියා **තස්ස හි කාරකස්ස වෙදකස්සාති** වුත්තං. **කුසලාකුසලානමභාවො සියා** ඉතරථා අහෙතුකදෙසාපත්තිතොති අධිප්පායො. තෙසං කුසලාකුසලානං ආයත්තා වුත්ති එතෙසංති **තදායත්තවුත්තිනො.** **තෙසං**ති කුසලාකුසලාදීනං. **තස්මා**ති කාරකාභාවෙ කුසලාකුසලානං තබ්බිපාකානං ච අභාවතො නිරත්ථකාති, දෙසෙත්වා පි බොධෙතබ්බාභාවතො නිරත්ථකා. **නායං නිරත්ථකා**ති වත්වාපි **සාත්ථකා**ති වචනං පන පරස්ස දළ්හගාහනත්ථං.[1] ලොකෙපි හි එවං වොහාරං වොහරන්ති: "එවමෙව භවති, නාඤ්ඤථා"ති ආදිං.

**තත්ථා**ති කාරකාභාවෙපි අත්තා අත්ථීති ගහණෙ, **අනුරොධො**ති අනුකූලතා[2] පක්ඛපාතිතාති[2] අත්ථො. **ඉධා**ති කාරකාභාවෙ පි කුසලාදයො අත්ථීති ගහණෙ. **විරොධො**ති පටිඝො එවං කාරකාභාවෙපි කුසලාදීනං සම්භවං[3] යුත්තිතො සාධෙත්වා ඉදානි ලොකසිද්ධෙන නිදස්සනෙන සාධෙතුං **අථාපි**ති ආදි වුත්තං. **අථාපීති** කාරකාභාවෙපි, පථවිගහණෙන පථවොජං දස්සෙති, තථා ආපොගහණෙන ආපොජං. තෙජොති සීතුණ්හවසෙන දුවිධා තෙජොධාතු. **උතූ**ති හෙමන්තාදි – උතු. ආදිග්ගහණෙන බීජාදිකෙ සංගණ්හාති. ජනකප්පච්චයො හෙතු, අනුපාලකපච්චයො පච්චයො නාමාති ආහ: **හෙතුප්පච්චය සාමග්ගියා**ති. "ඵලනිබ්බත්තකො හෙතු, පච්චයො අනුපාලකො"ති හි වුත්තං.

එවං කාරකාභාවෙපි කුසලාකුසලප්පවත්තිං සාධෙත්වා ඉදානි පරපරිකප්පිතං අත්තානමෙව තාව පටික්ඛිපිතුං **අථාපි චෙත්ථා**ති ආදි ආරද්ධං. කාමං පඤ්ඤාපරිබාහිරාය දිට්ඨියා එව අත්තා පරිකප්පීයති; පරො පන පඤ්ඤාය පරිකප්පෙමීති මඤ්ඤති. තස්ස ලද්ධිවසෙන **පඤ්ඤාය පරිකප්පිතො**ති වුත්තං. තං කාරකං[4] **උපපරික්ඛිස්සාම තාවා**ති තිට්ඨතු තාව සා කාරකාභාවෙපි කුසලාකුසලාදීනං භාවාභාවවිචාරණා; පඨමං තමෙව අත්තානං

1. M. දළ්හගාහත්ථං. 2. M. අනුකූලපක්ඛපාතො. 3. M. සබ්භාව. 4. M. පොත්ථකෙ නත්ථි.

උපපරික්ඛිස්සාමීති අත්ථො. දෙසමෙත්ථ වත්තුකාමො පුච්ඡතීති අධිප්පායෙන පටිඤ්ඤං අදත්වාව පුච්ඡන්තො ආහ: **කිං[1] සො සචෙතනො වා හොති, අචෙතනො වා**ති එත්ථ කො තත්ථ දෙසොති අත්ථො. ඉතරො "උභයථාපි දෙසො යෙව, යදි හි අචෙතනං[2] න තං කාරකං වෙදකං ච; යථා තෙ[3] පාකාර–තරුආදයො, අචෙතනො චායං අත්තාති එවං අනුමානෙන කාරකවෙදකත්තාභාවසිද්ධි[4] හොතීති දස්සෙතුං **යදි අචෙතනො**ති ආදි වුත්තං. **අනඤ්ඤො**ති අවිනිබ්භොගවසෙන අනඤ්ඤො; ඉතරථා සචෙතනොති වචනමෙව න උපපජ්ජෙය්‍ය; සහභාවී නාම අඤ්ඤො න හොති. **අත්තනොපි නාසො සියා**ති අවිනිබ්භොගවුත්තිරූපෙසු එකස්ස නාසෙ ඉතරස්සාපි විනාසො විය චෙතනායපි විනාසො න භවති; අවිනිබ්භොගරූපෙසු එකස්ස අවිනාසෙ ඉතරස්සාපි අවිනාසො වියාති අධිප්පායො. **චෙතනාය අනඤ්ඤත්තා**ති කාරණං වත්වා තමෙව සමත්ථෙතුං (86) **චෙතනත්තානං**ති ආදි වුත්තං. අත්තනො අනාසෙ සති චෙතනායපි නාසො න භවතීති සුත්වා පරස්ස නිරුත්තරභාවො චෙතනාය නාසෙ[5] විසෙසකාරණාභාවතොති අධිප්පායෙනාහ: **අථ චෙතනාය යෙවා**ති ආදිං. අත්තාව නස්සතු, තිට්ඨතු චෙතනා; කො හි විසෙසකාරණාභාවෙ අත්තනි අනුරොධො, චෙතනාය විරොධොති අධිප්පායො. **පටිඤ්ඤා හීනා**ති පුබ්බෙ දින්නපටිඤ්ඤා පරිහීනා. **අථ න භවති, පටිඤ්ඤා හීනා**ති යදි අත්තනො අවිනාසෙ[6] චෙතනාය අවිනාසො න භවති, චෙතනත්තානං අනඤ්ඤභාවෙන චෙතනාය නාසෙ අත්තනොපි නාසප්පසංගතො අත්තා න නස්සතීති තව පටිඤ්ඤා හීනා. **වුත්තප්පකාරතො විපරීතං වා**ති යථාවුත්තප්පකාරතො විපරීතං චෙතනාය නාසෙපි අත්තා න නස්සති, අත්තනො පන අනාසෙපි චෙතනා නස්සතීති එවං වා තව අධිප්පායො සියාති අත්ථො. අත්තා නස්සතු, චෙතනා තිට්ඨතු, අඤ්ඤභාවෙ උභින්නං සමායොගක්ඛමතාය[7] භවිතබ්බත්තාති අධිප්පායො. **පටිඤ්ඤා හීනො භවසී**ති චෙතනා යෙව නස්සති, අත්තා න නස්සතීති පටිඤ්ඤාය හීනො භවසි.

ඉධ පනාති අඤ්ඤත්තපක්ඛෙ. **ලක්ඛණඤ්ඤත්තං**ති අඤ්ඤමඤ්ඤං විසදිසෙහි භින්න – ලක්ඛණෙහි කතං. **දෙසන්තරකතං**ති භින්නදෙසකතං. ජාතොව වෙදියති ඤායතීති **ජාතවෙදො**,

1. M. කිංසොවෙත්ථාති. 2. M. අචෙතනං අත්තානං 3. B. M. තං. 4. B. M. — භාවසිද්ධිතොති. 5. M. පොත්ථකෙ නත්ථි. 6. M. විනාසෙ. 7. M. සමානයොගක්ඛමතාය.

අග්ගිසෙසනං අධිවචනං. **ඩය්හමානෙති** උද්ධනෙ පක්ඛිපිත්වා පච්චමානෙ. එකො පවත්තිපදෙසො ඉමෙසන්ති එකදෙසා. තෙසං භාවො එකදෙසතා[1]. **අවිනිබ්භොගතොති** ලක්ඛණතො භෙදෙපි ඨානවසෙන අවිනිබ්භුජ්ජනතො, අවිසංසට්ඨතා **එකදෙසත්තාති** ඉමස්සෙව වෙවචනවසෙන **අවිනිබ්භොගභාවෙ**පීති වුත්තං. (87.) **තං අයුත්තන්ති** තං උභින්නං එකදෙසතා නත්ථීති ඉමිනා, සඟ න යුජ්ජති. **පටිඤ්ඤා හීනාති** යදි පුබ්බපටිඤ්ඤා පමාණං, අයං පටිඤ්ඤා හීනා. යදි වා පන අයං පමාණං ඉතරා හීනාති අත්ථො.

අථ වා චෙතනාය අත්තනො පදෙසවසෙන නානත්තෙන අත්තනො අචෙතනභාවප්පත්තිතො සචෙතනො අත්තාති හෙට්ඨා තයා දින්නපටිඤ්ඤා පරිහීනාති එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො. **අචෙතනො අත්තාති** අත්තා අචෙතනොති කත්වා. **පුබ්බෙ වුත්තදොසතොති** "යදි අචෙතනො සියා"ති ආදිනා ආදිතො වුත්තදොසතො. **තස්මාති** යස්මා එවං උපපරික්ඛියමානො[2] විමද්දනසහො න[3] හොති, තස්මා. **යදි එවන්ති** යදි පරමත්ථතො කුසලාකුසලානං කාරකො තබ්බිපාකානං ච වෙදකො නත්ථි, එවං සන්තෙ **අථ කස්මා භගවතා වුත්තන්ති** සම්බන්ධො.

(779) **සන්ධාවතීති** සංසරති. අත්තනා කතකුසලාකුසලකම්මප්පච්චයත්තා විපාකභූතං සුඛදුක්ඛම්පි අත්තනා කතමෙව නාම හොතීති වුත්තං **සුඛදුක්ඛං සයංකතන්ති**. (780) **සත්තා සංසාරමාපන්නාති**:

"ඛන්ධානං ච පටිපාටි, ධාතුආයතනාන ච
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චතී"ති

එවං වුත්ත-ඛන්ධපටිපාටිආදිවසෙන[4] පවත්තං[4] සංසාරං පුනප්පුනං උප්පත්තිවසෙන පටිපන්නා. **දුක්ඛමස්ස මහබ්භයන්ති** අස්ස සංසාරාපන්නස්ස සත්තස්ස ජාතිආදිදුක්ඛං මහබ්භයං මහාභයසංවත්තනකන්ති අත්ථො. **ඔපපාතිකාති** උප්පජ්ජමානා.

(781.) **භාරා හවෙ පඤ්චක්ඛන්ධාති** රූපාදයො පඤ්චක්ඛන්ධා භාරභූතා සීසෙ නික්ඛිත්තභාරසදිසාති වුත්තං හොති. **භාරහාරො ච පුග්ගලො** තස්ස පඤ්චක්ඛන්ධභාරස්ස හාරකො. **භාරාදානං** පටිසන්ධිවසෙන පඤ්චක්ඛන්ධභාරගහණං, **භාරනික්ඛෙපනන්ති** පුන අගහෙතබ්බතාපාදනෙන අනුපාදාපරිනිබ්බානවසෙන භාරස්ස නික්ඛිපනං.

---

1. M. එකදෙසත්තං. 2. M. -මානෙ 3. M. පොත්ථකෙ නත්ථි.
4. M. -ආදිවසප්පවත්තං.

(782.) **යං** ති කුසලාකුසලකම්මං. **සක්ඛං**ති ආයතනං; එකස්ස පුග්ගලස්සාති සම්බන්ධො (783.) **එකෙන කප්පෙනාති** එකස්මිං කප්පෙ. (784) **අස්සඛො**ති ආදි හෙට්ඨා වුත්තත්ථං, **තං ච ඛො සම්මුතිවසෙන, න පරමත්ථතො**ති වත්වා තදෙව පතිට්ඨාපෙතුං **නනු භගවතා** ති ආදි වුත්තං 88 (785) **කන්නු සත්තො**ති වජිරත්ථෙරෙන[1] වුත්තාපි භගවතො අධිප්පායවසෙනෙව වුත්තත්තා භගවතා වුත්තං නාම හොතීති කත්වා වුත්තං **භගවතා ඉදම්පි වුත්ත**න්ති. **කන්නු සත්තො**ති **පච්චෙසී**ති රූපවෙදනාදීසු කං නාම සත්තො පුග්ගලොති ගණ්හාසි;

(786.) **අංගසම්භාරා**ති චක්කාදිඅවයවසම්භාරෙහි[2] චක්කාදි-අවයවසමොධානෙන[3] වාති අත්ථො. **සද්දො**ති වොහාරො. **තස්මා**ති යස්මා එවං පරමත්ථතො සත්තස්ස අභාවො භගවතා වුත්තො, තස්මා. න වචනමත්තමෙව ආලම්බිතබ්බං, අධිප්පායං පහායාති අත්ථො. දළ්හො මූළ්හො ච හුත්වා ගණ්හාතීති **දළ්හමූළ්හගාහී.** කාරණෙ දස්සිතෙපි අපරිච්චජනවසෙන ගහණං දළ්හගහණං. කාරණස්සෙව දට්ඨුමසමත්ථතාවසෙන ගහණං මූළ්හගහණං. තාදිසෙන න භවිතබ්බන්ති ආහ **න දළ්හ - මූළ්හ-ගාහිනා** භවිතබ්බන්ති. **සුත්තපදාන**න්ති නෙය්‍යත්ථනීතත්ථවසෙන උභයථා ඨිතානං සුත්තන්තානං.

**ද්වෙ සච්චානි වුත්තානි** තථා තථා විනෙතබ්බානං පුග්ගලානං වසෙනාති අධිප්පායො. යෙසං හි සම්මුතිදෙසනාය විසෙසාධිගමො හොති, තෙසං සම්මුතිසච්චවසෙන දෙසෙති. යෙසං පරමත්ථදෙසනාය, තෙසං පරමත්ථසච්චවසෙන දෙසෙති. දෙසභාසාකුසලො විය ආචරියො තංතංදෙසවාසිමාණවානං සකාය සකාය භාසාය. සම්මුතිසච්චං පරමත්ථසච්චං චාති එත්ථ පුග්ගලො සත්තො ඉත්ථි පුරිසො ඛත්තියො බ්‍රාහ්මණො දෙවොති එවමාදි පරමත්ථතො අවිජ්ජමානම්පි ලොකසංකෙතවසෙන[4] තථත්තා සම්මුතිසච්චං. ඛන්ධ-ධාතු-ආයතනානි, සතිපට්ඨානාති එවමාදි පරමත්ථවසෙනෙව වුත්තත්තා පරමත්ථසච්චං. තෙනාහු අට්ඨකථාචරියා:-

"සංකෙතවචනං සච්චං ලොකසම්මුතිකාරණා;
පරමත්ථවචනං සච්චං ධම්මානං භූතකාරණා"ති.
තස්මා වොහාරකුසලස්ස ලොකනාථස්ස සත්ථුනො
සම්මුතිං වොහරන්තස්ස මුසාවාදො න ජායතීති."

1. වජිරාය ථෙරියා (?) 2. M. - සම්භාරෙසු. 3. M. - සමොධානෙන.
4. M. ලොකෙ කතසංකෙතවසෙන

(787.) **යො** සො **ඉමං** **ගන්ථං** **අච්චන්තං** **සතතම්පි** **විජානාති,** **තස්ස** තතො සිද්ධා **පරමා** **පඤ්ඤා** **වෙපුල්ලං** විපුලභාවං ගච්ඡති. (788.) අධිං චිත්තසන්තාපං නීහරති අපනෙතීති **අධිනීහරං**. විමතියා විචිකිච්ඡාය මොහස්ස වා විනාසං කරොති උපනිස්සයභාවතොති **විමතිවිනාසකරං.** අත්ථබ්‍යඤ්ජනරසසම්පදාය[1] මනවජ්ජතො **පියකරං**. **විකසතීති** දිප්පති[2]. **ඉධාති** ඉමස්මිං සාසනෙ, අභිධම්මෙ වා.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර-**
**සංවණ්ණනාය තෙරසමපරිච්ඡෙදවණ්ණනා**
**නිට්ඨිතා.**

1. M. අත්ථබ්‍යඤ්ජනසම්පදාය. 2. M. දිබ්බති.

# චුද්දසමපරිච්ඡෙදවණ්ණනා

## **රූපාවචරසමාධිභාවනානිද්දෙසො.**

**89.** එවං පරමත්ථසම්මුතිවසෙන උභයථාපි සබ්බධම්මෙ සංඛෙපතො. දස්සෙත්වා ඉදානි යස්මා තෙසු උග්ගහණ-පරිපුච්ඡාදි-වසෙන කතපරිචයෙන අත්ථකාමෙන කුලපුත්තෙන එකංසතො භාවනාය අභියොගො කාතබ්බො තස්මා භාවනානයං සංඛෙපතො දස්සෙතුමාරභන්තො ආහ (789) **භාවනානයං** ති ආදිං. **භාවනානයං** ති ලොකියලොකුත්තරභාවනානයං; කුසලධම්මානං වඩ්ඪනකකම්මං ති අත්ථො. දිට්ඨධම්මිකසම්පරායිකං හිතං ආනයති උපනෙතී ති හිතානයො; තං **හිතානයං. මානයං** ති මානෙන්තො. දිට්ඨධම්මිකසම්පරායිකත්ථෙහි අනුසාසන්තො සත්තානං සුඛං ආනෙතී ති සුඛානයො, තං **සුඛානයං**. **පරමං ව්‍යාකරොමි,** පරමං භාවනානයං ති වා යොජනා.

(790.) **මනුස්සානං ධම්මතො උත්තරං ඤාණදස්සනං** ති සම්බන්ධො. තත්ථ මනුස්සානං ධම්මා නාම මනුස්සානං පකතිධම්ම-භූතා දසකුසලකම්මපථා තතො උත්තරිං[1] ඤාණදස්සනං නාම මහග්ගත-ලොකුත්තරධම්මා. තෙ හි ජානනට්ඨෙන, පච්චක්ඛතො විය දස්සනට්ඨෙන ච දස්සනං ති අධිප්පෙතා. උත්තරිමනුස්සානං ති වා යථාඨිතවසෙනෙව සම්බන්ධො බාලපුථුජ්ජනාදිතො උත්තරි මනුස්සානං ඣායීනං චෙව අරියානං චාති අත්ථො.

(791.) **සංඛස්සරසමාචාරෙ** ති ආදීහි සීලවිසුද්ධියා පයො-ජනදස්සනං. තත්ථ සංකාය සරිතබ්බො සමාචාරො අස්සාති **සංඛස්සරසමාචාරො.** යං කිඤ්චි ලාමකකම්මං දිස්වා "ඉදං අසුකෙන කතං භවිස්සතී"ති එවං පවත්තෙතබ්බාය සංකාය අත්තනො වා, පරෙ[2] යං[2] කිඤ්චි මන්තෙන්තෙ දිස්වා "මම ඉදං ච ඉදං ච අසාරුප්පං ජානිත්වා මන්තෙන්තී ති එවං පවත්තාය සංකාය උපගන්තබ්බසමාචාරොති අත්ථො. **දුස්සීලෙ** ති එතදෙව විභාවෙතුං **සීලවජ්ජිතෙ** ති වුත්තං. **දුස්සීලො** ති වා දූසිත-සීලො, ඛණ්ඩාදිභාවං උපගතසීලෙ **සීලවජ්ජිතෙ** ති සබ්බෙන සබ්බං සීලවිරහිතෙ. **නත්ථි ඣානං** ති ලොකියඣානම්පි තාව නත්ථි. **කුතො මග්ගො** ති ලොකුත්තරමග්ගො කුතො කෙන කාරණෙන; ලොකුත්තරධම්මානං හෙතු යෙව න විජ්ජතී ති අත්ථො.

---

1. M. උත්තරං, 2. M. B පරෙසං

සනානං අනුරූපවසෙන අලීනං අනුද්ධතං හුත්වා විරියස්ස පවත්තිං
සන්ධාය "තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා"ති වුත්තං යා
පනස්ස තස්මිං ඛණෙ පවත්තා ආසෙවනා, උප්පාදතො පට්ඨාය
ඨිතිපරියොසානානං ආසෙවනපච්චයභාවවසෙන පවත්තාකාරො,
තං සන්ධාය "ආසෙවනට්ඨෙන සම්පහංසනා"ති වුත්තං. එවං
ධම්මානං අනතිවත්තනාදිභාවසාධනෙන පරියොදපිතස්ස
ඤාණස්ස කිච්චවසෙන ඣානපරියොසානෙ චතූහි ලක්ඛණෙහි
සම්පන්නං නාමාති – වෙදිතබ්බං.

(919.) **විසොධෙත්වාන පාපකෙ**ති පාරිපන්ථිකධම්මෙ
විසෙසෙන පුන සොධෙත්වාති වුත්තං හොති. (920.)
**චිත්තභාවනවෙපුල්ල**න්ති සමාධිභාවනාය විපුලභාවං. යථා හි
භාවනාවසෙන නිමිත්තස්ස උප්පත්ති, එවමස්ස භාවනාවසෙන
වඩ්ඪනම්පි. තස්මා එකඞ්ගුලාදිවසෙන නිමිත්තං වඩ්ඪයන්තස්ස
පුනප්පුනං බහුලීකාරෙන ඣානභාවනා වුඩ්ඪිං විරූළ්හිං,
අභිඤ්ඤාවසෙන වෙපුල්ලං ආපජ්ජති. තෙන වුත්තං
**චිත්තභාවනවෙපුල්ලං =පෙ= වඩ්ඪෙතබ්බ**න්ති. (921.) **වඩ්ඪනා-
භූමියො ද්වෙ**ති වඩ්ඪනට්ඨානානි ද්වෙ යෙව; ද්වීසු ඨානෙසු
අවස්සං එකත්ථ[1] වඩ්ඪෙතබ්බන්ති ආචරියා (922.) **තත්‍රා**ති
සාමිඅත්ථෙ භුම්මවචනං; තස්සාති අත්ථො. තත්‍රාති වා ද්වීසු භූමිසු.
**කසිතබ්බං** =පෙ= **කස්සකො**ති යථා නාම කස්සකො
කසිතබ්බට්ඨානං නංගලෙන පරිච්ඡින්දිත්වා පරිච්ඡෙදබ්භන්තරෙ

1. M. එකත්තං.

කසිතුං ඨානං පරිච්ඡින්දති, එවමෙවං අංගුල-ද්වංගුල-තිවංගුල-චතුරඞ්ගුලමත්තං ච මනසා පරිච්ඡින්දිත්වා යථාපරිච්ඡෙදං වඩ්ඪෙතබ්බං. තතො විදත්ථි-රතන-පමුඛ-පරිවෙණ-විහාරසීමානං ගාම-නිගම - ජනපද - රජ්ජ - සමුද්දසීමානං ච පරිච්ඡෙදවසෙන වඩ්ඪයන්තෙන චක්කවාළපරිච්ඡෙදං කත්වා වා තතො වාපි උත්තරිං පරිච්ඡින්දිත්වා එවමෙවං[1] වඩ්ඪෙතබ්බං. තෙන වුත්තං (923.) **යථිච්ඡකං වඩ්ඪෙතබ්බන්ති**. අපරිච්ඡින්දිත්වා පන න වඩ්ඪෙතබ්බං; න හි අපරිච්ඡෙදෙ භාවනා පවත්තති තථා ච වුත්තං "සාන්තකෙ නො අනන්තකෙ"ති. එවං වඩ්ඪිතං ච තං නිමිත්තං වඩ්ඪිත-වඩ්ඪිතට්ඨානෙ පථවියා උක්කූල-විකූල-නදීවිදුග්ග-පබ්බතවිසමෙසු සංකුසතසමබ්භාහතං මහිසචම්මං[2] විය හොති තස්මිං පන නිමිත්තෙ පත්තපඨමජ්ඣානෙන ආදිකම්මිකෙන ඉදෙනෙව දුතියජ්ඣානාදිඅධිගමාය උස්සාහං අකත්වා තස්මිං යෙව පඨමජ්ඣානෙ පඤ්චහාකාරෙහි චිණ්ණවසිතා භවිතබ්බන්ති දස්සෙතුං (924.) **පත්තස්මින්ති** ආදි වුත්තං.

සුචිණ්ණා වසො වසීභාවො එතෙනාති සුචිණ්ණවසිතා. සුට්ඨු ආසෙවිත - වසිතාති අත්ථො. කතමා තා වසියො යාසං වසෙනායං පඤ්චහාකාරෙහි සුචිණ්ණවසීති ආහ. (925.) **ආවජ්ජනාති** ආදිං. තත්ථ ආවජ්ජනාති ආවජ්ජනමත්තමෙව අධිප්පෙතං, ආවජ්ජනවසිතාය අධිප්පෙතත්තා ආවජ්ජනාය උප්පන්නාය ජවනෙහිපි භවිතබ්බං, තානි ච ඛො ආවජ්ජනතප්ප-රතාය චිත්තාභිනීහාරස්ස යථාවජ්ජිතවසෙන හොන්ති. අධිගමෙන සමං සසම්පයුත්තස්ස ඣානස්ස සම්මා ආපජ්ජනං පටිපජ්ජනං **සමාපත්ති**. අභිභුය්‍ය ඨානං[3] වියාති අධිට්ඨානං. වසිතාති එතෙසු ආවජ්ජනාදිසු යථාරුචිප්පවත්ති; යථිච්ඡිතං යදිච්ඡකං යාවදිච්ඡකං පවත්තෙතුං සමත්ථභාවො. තත්ථ පඨමජ්ඣානතො වුට්ඨාය පඨමං විතක්කං ආවජ්ජයතො භවංගං උපච්ඡින්දිත්වා උප්පන්නාවජ්ජනානන්තරං විතක්කාරම්මණානෙව චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති. තතො ද්වෙ භවංගානි. තතො පුන විචාරාරම්මණං ආවජ්ජනං, වුත්තනයෙනෙව ජවනානීති, එවං පඤ්චසු ඣානංගෙසු පටිපාටියා නිරන්තරං චිත්තං පෙසෙතුං සමත්ථභාවො, තත්ථ අදන්ධායිතත්තං ආවජ්ජන-වසිතා නාම. සමාපජ්ජිතුකාමතානන්තරං ද්වීසු භවංගෙසු උප්පන්නෙසු භවංගං උපච්ඡින්දිත්වා උප්පන්නාවජ්ජනානන්තරං සමාපජ්ජිතුං සමත්ථතා සමාපජ්ජනවසිතා නාම. අයං ච මත්ථ-කප්පත්තා ආවජ්ජන - සමාපජ්ජනා සත්ථු යමකපාටිහාරියකාල-

1. M. පොත්ථකෙ නත්ථි. 2. B. සංකුසතබමහාගාපං විසබමෙ. 3. M. ඨපනං.

ධම්මදෙසනාදීසු ලබ්භති; ධම්මසෙනාපතිස්ස යක්ඛෙන සීසෙ පහාරදින්නසමයෙ, මහාමොග්ගල්ලානත්ථෙරස්ස නන්දොපනන්දදමන-සමයෙ වා ලබ්භති. අඤ්ඤත්ථ පන තතො දන්ධා යෙව.

සෙතු විය සීඝසොතාය නදියා ඔඝං භවඞ්ගවෙගං උපච්ඡින්දිත්වා යථාපරිච්ඡින්නකාලං ඣානං ඨපෙතුං සමත්ථතා, භවඞ්ගපාතතො රක්ඛනයොග්ගතා අධිට්ඨානවසිතා නාම. යථාපරිච්ඡින්නකාලං අතික්කමිතුං අදත්වා වුට්ඨානසමත්ථතා වුට්ඨානවසිතා නාම. අථවා යථාපරිච්ඡින්නකාලතො උපරි ගන්තුං අදත්වා ඨපනසමත්ථතා **අධිට්ඨානවසිතා** නාම. පරිච්ඡින්නකාලස්ස[1] අන්තො අවුට්ඨහිත්වා යථාකාලවසෙනෙව වුට්ඨානසමත්ථතා **වුට්ඨානවසිතා** නාම. අථවා වුත්තනයෙනෙව පරිච්ඡින්නකාලතො අනූනං කත්වා සමාපත්තිං ඨපෙතුං සමත්ථතාව අධිට්ඨානවසිතා නාම. කාල-පරිච්ඡෙදං අතික්කමිත්වා වුට්ඨිතස්සාපි නිද්දාලුකස්ස පටිබුජ්ඣිත්වා පුනප්පුනං නිද්දොක්කමනං විය වුට්ඨිතසමාපත්තිමෙව පුනප්පුනං අසමාපජ්ජිත්වා වුට්ඨානසමත්ථතා, තත්ථ ආලයාකරණයොග්ගතා **උට්ඨානවසිතා** නාම. **පච්චවෙක්ඛණවසිතා** පන ආවජ්ජනවසිතාය එව සඞ්ගහිතා; පච්චවෙක්ඛණජවනානෙව හි තෙසං තෙසං ඣානඞ්ගානං ආවජ්ජනානන්තරං පවත්තන්ති,[2] තස්මා යදග්ගෙන ආවජ්ජනවසියා සිද්ධි, තදග්ගෙන පච්චවෙක්ඛණවසිතා සිද්ධාති වෙදිතබ්බා.

කෙචි පන ඣානඞ්ගානං අපාතුභාවෙපි[3] තෙසු නිරන්තරං ආවජ්ජනාය පවත්තමානසමත්ථතා **ආවජ්ජනවසිතා** නාම; තෙසං යථාසභාවපච්චවෙක්ඛණවසෙන ජවනප්පවත්තනෙ සමත්ථතා **පච්චවෙක්ඛණවසිතා** නාම; අථවා සත්ත පි සත්තන්නං ජවනානං පවත්තියං නිරන්තරං ආවජ්ජනසමත්ථතා **ආවජ්ජන-වසිතා** නාම; වසිතාබලෙන සත්තමජවනං අප්පත්වා චතුපඤ්ච-ජවනෙහෙව පච්චවෙක්ඛණසමත්ථතා **පච්චවෙක්ඛණවසිතා** නාම; අථවා ඤාණවිප්පයුත්තචිත්තෙහි පච්චවෙක්ඛිතුං අසමත්ථභාවෙපි පච්චවෙක්ඛිස්සාමීති උප්පන්න - ආවජ්ජනානන්තරමෙව භවඞ්ගෙසු කාලං අවීතිනාමෙත්වා සීඝමෙව ආවජ්ජිතුං සමත්ථතා **ආවජ්ජන-වසිතා** නාම; වසිතාබලෙන හෙව සමත්ථතා පච්චවෙක්ඛණබලෙන ඤාණවිප්පයුත්තචිත්තෙහි පි පච්චවෙක්ඛිතුං සමත්ථතා පච්ච-වෙක්ඛණවසිතා නාමාති වදන්ති. යස්මා පනෙතා යථාවුත්ත-නියාමෙන පුනප්පුනං ආවජ්ජනාදිනා සාධෙතබ්බා, තස්මා වුත්තං (926) **ආවජ්ජිත්වාති** ආදිං.

1. M. — කාලතො. 2. M. පවත්තානි. 3. M. අපාකටභාවෙපි.

ඉමෙසු පන ආදිකම්මිකෙන සමාපජ්ජනබහුලෙනෙව භවිතබ්බං, න පච්චවෙක්ඛණබහුලෙන. පච්චවෙක්ඛණබහුලස්ස හි ඣානංගානි ථූලානි දුබ්බලානි හුත්වා උපට්ඨහන්ති. අථස්ස තානි එවං උපට්ඨිතත්තා උපරි උස්සුක්කනාය පච්චයතං නාපජ්ජන්ති. සො අප්පගුණෙ ඣානෙ උස්සුක්කමානො පඨමජ්ඣානා ච පරිහායති, න ච සක්කොති දුතියං අධිගන්තුං. තෙන වුත්තං (927.) **පඨමෙ හ'වසිප්පත්තෙනාති** ආදිං. **උභතො භට්ඨොති** පුන පඨමජ්ඣානම්පි සමාපජ්ජිතුං න සක්කොතීති අධිප්පායො. වුත්තං හෙතං භගවතා: "ඉධෙකච්චො භික්ඛු බාලො අබ්‍යත්තො අඛෙත්තඤ්ඤූ අකුසලො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති.[1] සො තං නිමිත්තං නාසෙවති, න භාවෙති, න බහුලීකරොති, න ස්වාධිට්ඨිතං අධිට්ඨාති. තස්ස එවං හොති: යං නූනාහං විතක්කවිචාරානං වූපසමා =පෙ= දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විතක්කවිචාරානං වූපසමා දුතියං ඣානං උපසම්පජ්ජ විහරිතුං. තස්ස එවං හොති: යං නූනාහං විවිච්චෙව කාමෙහි =පෙ= පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විවිච්චෙව කාමෙහි =පෙ= පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං. අයං වුච්චති භික්ඛවෙ උභතො භට්ඨො, උභතො පරිහීනො"ති.

(928.) **කාමසහගතා =පෙ= චරන්තීති** ආරම්මණවසෙන කාමසහගතා හුත්වා සඤ්ඤා චෙව මනසිකාරො ච සමුදාචරන්ති. සඤ්ඤාසීසෙන චෙත්ථ තංසහගතො චිත්තුප්පාදො ගහිතො; මනසිකාරග්ගහණෙන ආවජ්ජනන්ති දට්ඨබ්බං. කාමානුපක්ඛන්දානං සඤ්ඤාමනසිකාරානං වසෙන හානිං පරිහානිං භජතීති හානභාගියං. කෙචි පන "සංකිලෙසන්ති හානභාගියො ධම්මො වුච්චතී"ති වචනතො හානභාගියා කාමසඤ්ඤාදිකා, තෙහි පරිහාපියමානං ඣානම්පි කාරණූපචාරෙන හානභාගියං නාමාති වදන්ති. (929) **තදනුධම්මතා සතීති** තස්සෙව ඣානස්ස අනුධම්මතා ආරම්මණවසෙන තදනුගතා සතිපතිරූපකා නිකන්ති සන්තිට්ඨති.[2] (930.) **අවිතක්කසහගතාති** අවිතක්කං දුතියජ්ඣානං පත්තුකාමස්ස තං සන්තතො මනසිකරොතො ආරම්මණවසෙන තංසහගතා. **විසෙසභාගියන්ති** විසෙසභූතස්ස දුතියජ්ඣානස්ස පදට්ඨානතාය තං භජතීති විසෙසභාගියං.

---

1. M විහරිතුං. 2. M. පොත්ථකෙ නත්ථි.

(931.) **නිබ්බිදසහගතාති** විපස්සනාරම්මණා (932.) **පගුණතොති** වසිතාප්පත්තතො. (933.) **ආසන්නාකුසලාරිකාති** නීවරණපහාණස්ස තප්පඨමතාය ආසන්නනීවරණපච්චත්ථිකා. ථූලං නාම විපුලම්පි ඵෙග්ගු විය සුඛභඤ්ජියන්ති[1] ආහ **ථූලත්තා** =පෙ= **දුබ්බලාති**. **තතොති** දුතියජ්ඣානතො. දුබ්බලානි අංගානි ඉමස්සාති අංගදුබ්බලා (934) **සන්තතො** චින්තයිත්වාති පඨමජ්ඣානෙ විය ඔළාරිකංගානං අභාවතො සන්තධම්මසමංගිතාය ච සන්තන්ති එවං සන්තවසෙන මනසිකත්වා. කිඤ්චාපි හි යෙ ධම්මා දුතියජ්ඣානෙ පීතිසුඛාදයො තෙ පඨමජ්ඣානෙ පි සන්ති, තෙහි පනෙතෙ සන්තතරා පණීතතරා ච හොන්ති. (935) **නිකන්තින්ති** නිකාමනං[3] අපෙක්ඛනන්ති අත්ථො. **පරියාදියාති** ඛෙපෙත්වා වික්ඛම්භෙත්වාති අත්ථො.

(943.) **සම්පසාදනන්ති** සම්පසාදනසංඛාතාය සද්ධාය යොගතො ඣානම්පි සම්පසාදනං; නීලවණ්ණයොගතො නීලවත්ථං විය. නනු චායං සද්ධා පඨමජ්ඣානෙපි අත්ථි, කස්මා ඉදමෙව සම්පසාදනන්ති වුත්තන්ති? වුච්චතෙ: පඨමජ්ඣානං විතක්ක-විචාරක්ඛොභෙන වීචිතරංගසමාකුලම්ව ජලං න සුප්පසන්නං හොති, තස්මා සතිපි සද්ධාය තං සම්පසාදනන්ති න වුත්තං; ඉමස්මිං පන විතක්කවිචාරක්ඛොභාභාවෙන[3] ලද්ධොකාසා බලවතී සද්ධා; තස්මා බලවසද්ධාය සමන්නාගතත්තා ඉදමෙව සම්පසාදනන්ති වුත්තං **අජ්ඣත්තන්ති** නියකජ්ඣත්තං; අත්තනි ජාතං, අත්තනො සන්තානෙ නිබ්බත්තන්ති අත්ථො. **තීණි** අංගානි ඉමස්සාති **තිවංගිකං** (944.) **සෙසන්ති** පීතිආදීනං අඤ්ඤෙසම්පි බලවභාවො, තිණ්ණං චතුන්නං වා ජවනානං පරිකම්මොපචාරානුලොමගොත්‍රභූභාවො, ඡට්ඨෙ සත්තමෙ වා අප්පනාය උප්පත්ති, එකචිත්තක්ඛණතා, තතො භවංගපාතො, පුන භවංගං විච්ඡින්දිත්වා පච්චවෙක්ඛණත්ථාය ආවජ්ජනං, තතො ඣානපච්චවෙක්ඛණන්ති ඉදං සබ්බං වුත්තාවසෙසං **හෙට්ඨා** පඨමජ්ඣානෙ **වුත්තනයෙනෙව** සමුපලක්ඛිතබ්බං.

(948.) **පිහයතොති**[4] **කාමයතො නිකාමයතො. උබ්බිලාපනන්ති** කාමං චායං පරිග්ගහෙසු අපරිච්චත්තපෙමස්ස අනාදීනවදස්සිනො තණ්හාසහගතාය පීතියා පවත්තිආකාරො. ඉධ ච දුතියජ්ඣානපීති අධිප්පෙතා. තථාපි සබ්බසො පීතියං අවිරත්තතායාපි[5] අනුබන්ධෙය්‍යාති උබ්බිලාපනං ඉධ ආදීනවවසෙන වුත්තං. අථවා

1. M. සුඛභඤ්ජනීයන්ති. 2. M නිකාමනතං. 3. M. විතක්කවිචාරපරික්ඛොභාභාවෙන. 4. මූලපොත්ථකෙ පිහයාපි යතො. 5. M. අවිරත්තස්සාපි.

දුතියජ්ඣානචිත්තස්සෙව තතියජ්ඣානං විය අහුත්වා උබ්බිල්ලාපනාකාරෙන පවත්ති උබ්බිල්ලාපනං වියාති උබ්බිල්ලාපනන්ති වුත්තං (949.) **තතියං සන්තතො දිස්වාති** සම්බන්ධො. (957.) **සතියා සම්පජඤ්ඤෙන ච සම්පයුත්තන්ති** සරණලක්ඛණාය සතියා, අසම්මොහලක්ඛණෙන සම්පජඤ්ඤෙන ච සම්පන්නං. කාමං පුරිමජ්ඣානෙසුපි සතිසම්පජඤ්ඤං අත්ථි; න හි මුට්ඨස්සතිස්ස අසම්පජානතො උපචාරමත්තම්පි සම්පජ්ජති, පගෙව අප්පනා. යෙභුය්‍යෙන පන අවිප්පයොගීභාවෙන පවත්තමානෙසු පීතිසුඛෙසු පීතිසඞ්ඛාතස්ස ඔළාරිකඞ්ගස්ස පහානෙන[1] සුඛුමත්තාය ඉධ සාතිසයො සතිසම්පජඤ්ඤබ්‍යාපාරොති ඉධෙව සතිසම්පජඤ්ඤසම්පන්නතා වුත්තාති වෙදිතබ්බා. (958.) **එකඞ්ගවිප්පහීනන්ති** පීතියා පහීනභාවෙන එකඞ්ගවිප්පහීනං සා පනෙසා දුතියජ්ඣානස්ස විතක්කවිචාරා විය අප්පනාක්ඛණෙ යෙව පහීයති; තෙනස්ස සා පහානඞ්ගන්ති වුච්චති; සොමනස්සස්ස පහීනත්තා ආහ එකඞ්ගවිප්පහීනන්ති, තං ච පන සොමනස්සං එකවීථියං පුරිමජවනෙසු යෙව පහීයති පුරිමජ්ඣානෙසු පරිකම්මාදිවසෙන පවත්තානං කාමාවචරජවනානං එකසදිසත්තා ඉධ ලබ්භමානං කඤ්චි විසෙසං දස්සෙතුං **යස්මාති** ආදි වුත්තං.

(974.) **ආසෙවනං න හොතීති** ආසෙවනපච්චයෙන පච්චයො න හොති අයං හෙත්ථ අධිප්පායො: යස්මා පදන්තරසංගහිතස්ස අත්තනො සභාවගාහාපනසඞ්ඛාත - ආසෙවනපච්චයත්තාභාවතො සුඛවෙදනා උපෙක්ඛාවෙදනාය ආසෙවනපච්චයො න හොති, චතුත්ථජ්ඣානෙ ච උපෙක්ඛාවෙදනාය භවිතබ්බං සාතිසයං සුඛවිරාගභාවනත්තා, තස්මා ඉධ අප්පනාවීථියං උපෙක්ඛාසම්පයුත්තජවනෙනෙව භවිතබ්බන්ති.

එවං චතුක්කනයවසෙන ඣානප්පභෙදං දස්සෙත්වා ඉදානි පඤ්චකනයම්පි දස්සෙතුං (976.) **යං චතුක්කනයෙති** ආදි වුත්තං. **ද්විධා පන කත්වාති** විතක්ක-විචාරානං විසුං විසුං පහානඞ්ගවසෙන ගහණතො ද්විධා කත්වා **දුතියං තතියං කතන්ති** අවිතක්කවිචාරමත්තං, අවිතක්කඅවිචාරන්ති එවං දුතියජ්ඣානංචෙව තතියජ්ඣානං ච කතං අභිධම්මෙති අධිප්පායො. සුත්තන්තෙසු හි පඤ්චකනයො සරූපතො න ගහිතො. කස්මා පන අභිධම්මෙ ගහිතොති? පුග්ගලජ්ඣාසයතො. සන්නිසින්නදෙවපරිසාය හි යෙසං පඨමජ්ඣානෙ විතක්කො යෙව ඔළාරිකතො උපට්ඨාසි, ඉතරං සන්තතො, තෙසං චතුරඞ්ගිකං අවිතක්කවිචාරමත්තං

1. M. පහානෙ.

දුතියජ්ඣානං කත්වා පඤ්චකනයං[1] දෙසෙසි, යෙසං විතක්කවිචාරා ඔළාරිකතො උපට්ඨිතා, තෙසං[2] අවිතක්කඅවිචාරං තිවංගිකං කත්වා චතුක්කනයං[3] දෙසෙසි. යෙසං විතක්කොව ඔළාරිකතො උපට්ඨාති, තෙහි තං අතික්කමිත්වා චතුරංගිකං දුතියජ්ඣානං උප්පාදෙතුං සක්කා. යෙසං විතක්කවිචාරා තෙහි ද්වෙපි එකතො අතික්කමිත්වා තිවංගිකං ඣානං උප්පාදෙතුං සක්කා.

(979.) අත්ථව්‍යඤ්ජනවසෙන සුට්ඨු මධුරා, තතො යෙව වරතරා රචනා[4] යස්ස සොයං **සුමධුරවරතර-රචනො.**[5] **කං නු නරං නෙව රඤ්ජයති** න හි එකංපි න රඤ්ජයති.[6] **අතිනිසිත** =පෙ= **වෙදනීයො**යංති අතිතිඛිණබුද්ධිප්පචාරෙහි ජනෙහි වෙදනීයො අයං ගන්ථො පරිච්ඡෙදො වාති අධිප්පායො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර ලීනත්ථවණ්ණනාය චුද්දසමපරිච්ඡෙද වණ්ණනා නිට්ඨිතා**

---

1. M පඤ්චකනයෙන. 2. M. තතො තෙසං 3 M. චතුක්කනයෙන. 4. M වචනං. 5. M. — වරතරවචනො. 6. M සබ්බම්පි ජනං රඤ්ජයති. න හි සචෙතනො එකො රඤ්ජති.

# පඤ්චදසමපරිච්ඡෙදවණ්ණනා

## ( අරූපාවචරසමාධිභාවනානිද්දෙසො )

එවං පථවීකසිණාදිවසෙන චතුක්කපඤ්චකනයවසෙන[1] ඣානානි දස්සෙත්වා යස්මා සෙසකසිණවසෙන නිද්දිසියමානෙ ගන්ථගාරවො හොති, තස්මා තං සබ්බං ඨපෙත්වා අරූපාවචරං විභාවෙතුං (980.) **රූපාරූපං**ති ආදි ආරද්ධං. **රූපාරූපමතීතෙන** රූපාරූපභවං අතික්කන්තෙන, පුනරුප්පත්තිවසෙන[2] රූපාරූපභවං අතික්කන්තෙන, පගෙව කාමභවං. **රූපාරූපාදිවෙදිනා**ති රූපාරූපාදි-භුම්මන්තරවෙදිනා. යස්මා අයං අරූපාවචරසමාධි නාම රූපවිරාගභාවනාවසෙනෙව අභිනිප්ඵාදෙතබ්බා, තස්මා තං උප්පාදෙතුකාමස්ස රූපෙ විරජ්ජනාකාරං විරත්තමානසෙන ච තදත්ථාය පටිපජ්ජනවිධිං දස්සෙතුං (982.) **රූපෙ ඛො**ති ආදි ආරද්ධං දණ්ඩනෙන දණ්ඩො, මුග්ගරාදි; පරපීළනාධිප්පායෙන තස්ස ආදානං දණ්ඩාදානං, ආදිසද්දෙන සත්ථාදාන-කලහ-විග්ගහ-විවාද-තුවංතුවංපෙසුඤ්ඤාදීනං ච ගහණං. **චක්ඛුරොගාදයො**ති ආදිසද්දෙන සොතරොගාදීනං ගහණං. (983 ) **රූපෙ ආදීනවං දිස්වා**ති කරජරූපාදිඔළාරිකරූපෙ තන්නිදානං දොසං දිස්වා. **නිබ්බින්න-මානසො**ති විරත්තමානසො. **අරූපං**ති අරූපාවචරභාවනං.

(984.) **තස්මා කසිණරූපා**ති තම්හා පටිභාගනිමිත්ත-සඞ්ඛාතකසිණරූපා. තත්‍ර චායං රූපෙ ආදීනවං දිස්වා තං සමතික්කමනත්ථාය පටිපජ්ජති, පටිභාගනිමිත්තං ච අරූපං පණ්ණත්තිමත්තත්තා ති, කථං තස්මා නිබ්බිජ්ජතී ති අනුයොගං සන්ධාය ඔපම්මවසෙන තමත්ථං දස්සෙන්තො ආහ: **සූකරාභි-හතොව සා** ති යථා හි වනසූකරෙන පහටමත්තෙන සුනඛො තතො භීතො රූපදස්සනවෙලායං භත්තපචන-උක්ඛලිං දූරතො දිස්වා සූකරපටිභාගතාය තස්සං සූකරසඤ්ඤං උප්පාදෙත්වා උත්‍රසෙනා[3] පලායතෙව, එවමෙව රූපෙ නිබ්බින්නමානසො තං අතික්කමිතුකාමො තප්පටිභාගෙ කසිණරූපෙපි නිබ්බිජ්ජති; සමතික්කමො හොතී ති අධිප්පායො. (985.) **චතුත්ථෙ පන ඣා-නස්මිං**ති ඨපෙත්වා පරිච්ඡින්නාකාසකසිණං නවසු පථවීකසිණාදිසු අඤ්ඤතරස්මිං පටිලද්ධ-චතුත්ථජ්ඣානෙ. කෙචි පන ආලොක-කසිණමපි ඨපෙත්වා අට්ඨසූති වදන්ති තස්ස පන ඨපනෙ කාරණං න

1. M. චතුක්කපඤ්චක. 2. M. පුනානුප්පත්තිවසෙන. 3 M. උත්තා-සන්තො.

දිස්සති, සුප්පවිණේණා ආවරිතො[1] පගුණීකතො ආවජ්ජනාදි-ලක්ඛණො වසීභාවො එතෙනාති **සුචිණ්ණවසී**. (986) **කථං රොති** =පෙ= **යතො** ති යස්මා ඉදං චතුත්ථජ්ඣානවිත්තං මයා නිබ්බිත්ත-කසිණරූපං ආරම්මං කරොති, **ආසන්නසොමනස්සං වා** ති යතො තතියජ්ඣානස්ස ආසන්නතාය ආසන්නසොමනස්ස පච්චත්ථිකං ච; **ථූලං සන්තවිමොක්ඛතො** ති සන්තවිමොක්ඛ-සංඛාත - අරූපජ්ඣානතො එතං යතො ථූලං ඔළාරිකං. අරූපජ්ඣානං හි "යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ අරූපා"ති ආදිසු සන්තවිමොක්ඛං ති වුච්චති. සන්තතාසිද්ධි වස්ස අනුස්සතිතො දට්ඨබ්බා. (987.) **චතුක්කෙ** ති චතුත්ථජ්ඣානෙ. **පඨමාරූපං ච සන්තතො දිස්වා** ති සම්බන්ධො. සන්තවසෙන මනසිකරිත්වාති අත්ථො. සන්තතො මනසිකාරෙනෙව චෙත්ථ පණීතතො සුඛුමතො ච මනසිකාරො සිද්ධොව; න තෙ විසුං ගහිතා.

(988.) **පත්ථරිත්වා** ති පගෙව වඩ්ඪිතං, තදා වඩ්ඪන-වසෙන[2] වා පත්ථරිත්වා. පුබ්බකාලවසෙන චෙතං වුත්තං, තෙන තං උග්ඝාටෙත්වා පච්ඡා න වඩ්ඪෙතබ්බං ති දස්සෙති. න හි තං පච්ඡා වඩ්ඪනත්ථාය වායමියමානම්පි වඩ්ඪතීති. **තෙනා** ති කසිණරූපෙන. ඉදානි තස්ස උග්ඝාටනාකාරං දස්සෙතුං (989.) **ආකාසො ඉති වා** ති ආදිං වත්වා පුන තං සමත්ථෙතුං **උග්ඝා-ටෙන්තො හි** ති ආදි වුත්තං. (990) උදයවසෙන පරිච්ඡෙද - ථරණවසෙන ච අනාභාවතො අනන්තා. **න සංවෙල්ලෙති** ති කටසාර - කිලඤ්ජාදයො විය න පටිසංහරති. (991.) **නාවජ්ජෙන්තො න පෙක්ඛන්තො** ති අනාවජ්ජෙන්තො අනපෙක්ඛන්තො; අඤ්ඤදත්ථු තෙන ඵුට්ඨොකාසං වුත්තනයෙන න මනසිකරොන්තො යෙවාති අධිප්පායො. ඉදං හි වුත්තං හොති: රූපාවචරචතුත්ථජ්ඣා-නස්ස ආරම්මණභූතං කසිණරූපං සබ්බෙන සබ්බං අමනසික-රොන්තො, තෙන ච ඵුට්ඨොකාසං ආකාසො ආකාසොති මනසිකරොන්තො, යදා තං භාවනානුභාවෙන ආකාසං හුත්වා උපට්ඨාති තදා සො කසිණං උග්ඝාටෙති නාමාති.

එවං කසිණුග්ඝාටනවසෙන පටිලද්ධෙ ආකාසනිමිත්තෙන පුන පටිපජ්ජනවිධිං, යස්සත්ථාය යෙස පටිපජ්ජති තදත්ථසිද්ධිං ච දස්සෙතුං (992.) **කසිණුග්ඝාටිමාකාසනිමිත්තං** ති ආදි වුත්තං. ආකාසස්ස අනිමිත්තභාවෙ පි නිමිත්තෙන ඵුට්ඨොකාසභාවතො නිමිත්තංති වුත්තං. (993.) **පඤ්චනීවරණා** =පෙ= **වික්ඛම්භන්ති** ති තනු

1. M වරිතො. 2. M. වඩ්ඪිතවසෙන.

රූපාවචරපඨමජ්ඣානස්ස උපචාරක්ඛණේ යේව නීවරණානි වික්ඛම්භිතානි, න තතෝ පට්ඨාය ච තේසං පරියුට්ඨානං අත්ථි; යදි සියා ඣානතෝ පරිහායෙය්‍යාති? සච්චමේතං; ඉමස්ස පන ඣානස්ස වණ්ණභණනවසේන තං වුත්තං. යථා අඤ්ඤත්ථාපි හෙට්ඨා පහීනානං උපරි පහානවචනන්ති. යේ පන සබ්බේ කුසලා ධම්මා සබ්බේසං අකුසලානං පටිපක්ඛාති කත්වා එවං වුත්තන්ති වදන්ති, තේහි දුතියජ්ඣානුපචාරාදීසු නීවරණවික්ඛම්භනාවචනස්ස කාරණං වත්තබ්බං හෝති. යම්පි චේකේ වදන්ති 'සනේනාව සුඛුමානි රූපාවචරඅවික්ඛම්භනීයානි, තානි සන්ධායේතං වුත්තං'ති, තං තේසං මතිමත්තං. න හි මහග්ගතකුසලේසු ලෝකුත්තරකුසලං විය ඔධිසෝ පහානං නාම අත්ථි. යෝ පන රූපාවචරේහි ආරුප්පානං උළාරඵලතාදිවිසේසෝ, සෝ භාවනා-විසේසේන සන්තතර-පණීතතරභාවේන තේසු යේව පුරිමපුරිමේහි පච්ඡිමපච්ඡිමානං වියාති දට්ඨබ්බං.

(995.) **ඉධාපී** ති න කේවලං රූපාවචරචතුත්ථජ්ඣානතෝ. **සේසානි කාමාවචරානී** ති ආදීසු පන[1] යං වත්තබ්බං අවුත්තං, තං රූපාවචරජ්ඣානනිද්දේසේ වුත්තනයානුසාරේන වේදිතබ්බං (997.) **පුන භාවේතුකාමේනා** ති වුත්තේන පඨමමේව පඨමා-රුප්පස්ස භාවිතත්තා "කිං භාවේතුකාමේනා"ති අනුයෝගේ **දුතියාරුප්පමානසං** ති වුත්තං. න පන දුතියාරුප්පමානසං භාවේතුකාමේනාති ඉමිනා අජ්ඣාසයේන; න හි පඨමං දුතියා-රුප්පං භාවිතන්ති. රූපාවචරජ්ඣානං අනතික්කමිත්වා අනධි-ගන්තබ්බතෝ තම්මනසිකාරසමුදාචාරස්ස හානභාගියභාවාවහනතෝ රූපාවචරජ්ඣානං එතස්ස පච්චත්ථිකං ති කත්වා වුත්තං (998.) **ආසන්න =පෙ= පච්චත්ථිකන්ති වා** ති. වීථිපටිපන්නාය භාවනාය උපරූපරිවිසේසාවහභාවතෝ පණීතභාවසිද්ධිතෝව පඨමාරුප්පතෝ දුතියාරුප්පං සන්තතරසභාවන්ති ආහ **දුතියං සන්තතා පනා** ති **සුපණීතතරා හොන්ති පච්ඡිමා පච්ඡිමා ඉධා** ති.

(1000) **විඤ්ඤාණමිච්චේව මනසා කාතබ්බං** ති විඤ්ඤාණං විඤ්ඤාණං ඉච්චේව මනසා කාතබ්බං, කේවලං අනන්තං අනන්තං ති න මනසිකාතබ්බං. තේනාහ (1001.) **අනන්තං ති =පෙ= මනසා නිධා** ති, "අනන්තවිඤ්ඤාණං අනන්තවිඤ්ඤාණං"ති පන මනසිකාතුං වට්ටති. (1003.) **තස්මිං පන නිමිත්තස්මිං** ති තස්මිං පඨමාරුප්පවිඤ්ඤාණසංඛාතේ විඤ්ඤාණනිමිත්තේ. **විචා-රේන්තස්ස මානසං** ති භාවනාචිත්තං පවත්තේන්තස්ස. (1004.) **ආකාසඵුට්ඨවිඤ්ඤාණේ** ති කසිණුග්ඝාටිමාකාසං ඵරිත්වා පවත්තේ

1. M B පනිධ.

පඨමාරුප්පවිඤ්ඤාණෙ ආරම්මණභූතෙ. **අප්පෙතී** ති අප්පණාවසෙන පවත්තති. සභාවධම්මෙපි ආරම්මණසමතික්කමභාවනා විසෙසභාවතො ඉදං අප්පණාප්පත්තං හොති, චතුත්ථාරුප්පං විය. **අප්පණා** =පෙ= **වුත්තනයෙනෙවා** ති දුතියාරුප්පජ්ඣානෙ පුරිමභාගෙ තීණි චත්තාරි වා ජවනානි කාමාවචරානි උපෙක්ඛාවෙදනාය සම්පයුත්තානෙව හොන්ති. චතුත්ථං පඤ්චමං වා ආරුප්පමානසන්ති ආදිනා අප්පණානයො[1] පඨමාරුප්පජ්ඣානෙ වුත්තනයො ව.

(1005) **ඵරිත්වා පවත්තවිඤ්ඤාණන්ති** පඨමාරුප්පවිඤ්ඤාණං. **විඤ්ඤාණඤ්චන්ති** වුච්චතීති [රුළ්හිසද්දවසෙන විඤ්ඤාණඤ්චං තෙව වුච්චති[2] රුළ්හිසද්දවසෙන වුත්තභාවං ච පකාසෙතුං (1006.) **විඤ්ඤාණානන්තමෙවච වත්තබ්බං සනිදං සියාති** වුත්තං. පුබ්බෙ අනන්තස්ස ආකාසස්ස ආරම්මණකරණවසෙන අනන්තතාය විඤ්ඤාණානන්තන්ති වුත්තං; පුන මනසිකාරවසෙන වා අනන්තතාය තථා වුත්තන්ති දස්සෙතුං **මනසිකාරවසෙනාපීති** ආදි වුත්තං. දුතියාරුප්පං භාවෙන්තො හි පඨමාරුප්පං අනන්තතො අනවසෙසතො මනසිකරොන්තො අනන්තන්ති මනසිකරොති.

(1010) **පඨමාරුප්පවිඤ්ඤාණාභාවොති** කසිණං උග්ඝාටෙත්වා ආකාසො විය ආකාසානඤ්චායතනං පහාය තස්ස අභාවො **මනසිකාතබ්බො**. කස්මා පනෙත්ථ දුතියාරුප්පවිඤ්ඤාණාභාවං අමනසිකත්වා පඨමාරුප්පවිඤ්ඤාණාභාවො මනසිකාතබ්බොති? වුච්චතෙ: තයිදං ආරම්මණාතික්කමනවසෙන පත්තබ්බං, න පන අඞ්ගාතික්කමනවසෙන. තථා ච සති ආරම්මණෙ යෙව සාතිසය දොසදස්සනෙන තං සමතික්කමිතබ්බං. ආරම්මණං ච දුතියාරුප්පස්ස පඨමාරුප්පමෙව; තස්මා කසිණෙ ආදීනවං දිස්වා තං උග්ඝාටෙත්වා තබ්බිවිත්තාකාසස්ස විය පඨමාරුප්පවිඤ්ඤාණෙ ආදීනවං දිස්වා තං පහාය තදභාවස්ස මනසිකරණං යුත්තන්ති.

**අභයගිරිවාසිනො** පන විඤ්ඤාණඤ්චායතනාභාවො යෙව මනසිකාතබ්බොති වදන්ති. තෙ පන ඉමෙසං ආරම්මණාතික්කමනවසෙන පත්තබ්බභාවං අසල්ලක්ඛෙත්වා කථෙන්ති. යදි සල්ලක්ඛෙන්ති, අඤ්ඤස්ස[3] දොසං දිස්වා අඤ්ඤස්ස සමතික්කමෙ අතිප්පසඞ්ගදොසතො න මුච්චන්ති. අථාපි වදෙය්‍යුං· "විඤ්ඤාණඤ්චායතනං සතො සමාපජ්ජති, සතො සමාපජ්ජිත්වා සතො වුට්ඨාති; සතො වුට්ඨහිත්වා තඤ්ඤෙව විඤ්ඤාණං භාවෙතී"ති වචනතො

1. M. -නයෙන. 2. M. පොත්ථකෙ නත්ථි. 3. B. M. අඤ්ඤත්ථ.

විඤ්ඤාණඤ්චායතනාභාවො එව මනසිකාතබ්බොති. තයිදං පාළිඅත්ථං විරජ්ඣිත්වා ගහණවසෙන චින්තිතං. න හෙත්ථ තං යෙව විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං අධිප්පෙතං. යදි හි තං අධිප්පෙතං සියා විඤ්ඤාණඤ්චායතනන්ති තස්ස පධානභාවෙන නිද්දිට්ඨත්තා "තං යෙවා"ති වචනෙනෙව පරියත්තං, කිං විඤ්ඤාණන්ති වචනෙන? අථ සරූපනිද්දෙසත්ථං විඤ්ඤාණවචනං. එවං සති තඤ්ඤෙව විඤ්ඤාණංවායතනන්ති වුත්තං සියා. තස්මා විඤ්ඤාණන්ති වචනෙන යං ආරබ්භ විඤ්ඤාණඤ්චායතනං පවත්තං තස්සෙව ආකාසානඤ්චායතනස්ස ගහණං, න ඉතරස්සාති සුට්ඨු වුත්තං පඨමාරුප්පවිඤ්ඤාණාභාවොති.

එවං[1] මනසිකාතබ්බොති වත්වා මනසිකාරවිධිං දස්සෙතුං (1011.) තමෙව නානි ආදි වුත්තං. අකත්වා මනසාති මනසා[1] ආරම්මණං අකත්වා, සබ්බෙන සබ්බං අචින්තෙත්වා ආකාසං ආකාසන්ති මනසිකරොන්තස්ස, කසිණවිවිත්තාකාසං විය "නත්ථි නත්ථී"ති වා "සුඤ්ඤං සුඤ්ඤන්"ති වා මනසිකරොන්තස්ස විඤ්ඤාණවිවිත්තං අභාවමත්තමෙව උපට්ඨාතීති ආහ නත්ථි නත්ථීති ආදිං. වාසද්දො අනියමත්ථො. තෙන ද්වීසු පකාරෙසු එකෙනපි අත්ථසිද්ධි හොතීති දස්සෙති. අවුත්තවිකප්පනත්ථො වා වාසද්දො, තෙන "විවිත්තං විවිත්තන්"ති ඉමස්සපි පසංගො[2] හොතීති[2] දට්ඨබ්බො, අනියමො පනෙත්ථ තිණ්ණම්පි විසුං විසුං පරියාය භවතොව සිද්ධො. පරියායසද්දො හි විසුං විසුං යෙව අත්ථං සාධෙන්තො පරියායොති ලොකෙ නිරූළ්හො. යථාහු:

"පරියායෙනෙව තෙ යස්මා වදන්තත්ථං, න සංගතා,
පරියායත්ථං තතො සබ්බ[3] – පරියායෙසු වචත්ථිතං"ති

(1013.) තස්මිං නිමිත්තෙනාති පඨමාරුප්පවිඤ්ඤාණස්ස අභාව-සංඛාතෙ ඛාතුප්පත්තිකාරණභූතෙ නිමිත්තෙන. සති සන්තිට්ඨතීති අභාවනිමිත්තාරම්මණා සති සම්මා සුප්පතිට්ඨිතා හුත්වා තිට්ඨති. සතිසීසෙන චෙත්ථ උපචාරජ්ඣානානුගුණානං සඩ්ඪාපඤ්චමානං ඉන්ද්‍රියානං සකිච්චයොගං දස්සෙති. උපචාරජ්ඣානං පන හියොපි සමාධියති මානසන්ති ඉමිනා වුත්තන්ති දට්ඨබ්බං. (1015.) කසිණුග්ඝාටිමාකාසං =පෙ= අභාවකොති එවං පවත්ත-විඤ්ඤාණස්ස නත්ථිභාවසංඛාතෙ විනාසභාවකෙ, න පුරෙ අභාවාදිකෙ. අප්පණායනයො පනෙත්ථ පඨවිකසිණෙ වුත්ත-නයානුසාරෙන වෙදිතබ්බොති ආහ (1016.) අප්පණායං නයොති

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. සංගහො. 3. M. සබ්බං.

ආදිං. එවං යං තත්ථ අවසිට්ඨං[1], තං අතිදිසිත්වා ඉදානි විසෙසං දස්සෙතුං (1017) **ආකාසගතවිඤ්ඤාණං**ති ආදි වුත්තං. **පරිකම්මමනසිකාරෙන තස්මිං අන්තරහිතෙ**ති "නත්ථි නත්ථී"ති පවත්ත-පරිකම්මමනසිකාරෙ අමනසිකරණෙන අස්මිං පඨමාරුප්ප-විඤ්ඤාණෙ අන්තරහිතෙ; න පන ඛණභංගවසෙන ඣානපරිහානි වසෙන වා අන්තරහිතෙ. ඛණභංගවසෙන හි අන්තරධානං ඛණෙ ඛණෙ උපලබ්භති; පරිහානිවසෙන ච අන්තරධානෙ පුන තං අනුප්පාදෙත්වා උත්තරි ඣානාධිගමො නෙව නත්ථීති (1018) **තස්සාපගමමත්තං ච පස්සන්තො වසතී**ති තස්ස පඨමාරුප්පස්ස අභාවමත්තං පස්සන්තො සො යොගාවචරො විහරති. යථාකථං වියාති? ආහ:

(1019) **සන්නිපාත**ංති ආදිං. ඉදං වුත්තං හොති: යථා-නාම කොචි පුරිසො මණ්ඩලමාලාදිසු කත්ථචි කෙනචිදෙව කරණීයෙන සන්නිපතිතං භික්ඛුසංඝං දිස්වා කත්ථචි ගන්ත්වා-සන්නිපාතකිච්චාවසානෙ උට්ඨාය පක්කන්තෙසු භික්ඛූසු පුන තං ඨානං ගන්ත්වා ඔලොකෙන්තො සුඤ්ඤමෙව පස්සති, එවං සම්පදමිදං දට්ඨබ්බංති. තත්‍රිදං ඔපම්මසංසන්දනං: යථා සො පුරිසො-සන්නිපතිතං භික්ඛුසංඝං දිස්වා ගතො, තතො සබ්බෙසු භික්ඛූසු අපගතෙසු තං ඨානං තෙහි සුඤ්ඤමෙව පස්සති; න පන තෙසං කුතොචි අපගතකාරණං, එවමයං යොගාවචරො පුබ්බෙ-විඤ්ඤාණඤ්චායතනචක්ඛුනා පඨමාරුප්පවිඤ්ඤාණං දිස්වා පච්ඡා[2] නත්ථීති මනසිකාරෙන තස්මිං අපගතෙ තතියාරුප්පචක්ඛුනා-තස්ස නත්ථිභාවමෙව පස්සති, න තස්ස අපගතකාරණං වීමංසති; ඣානස්ස තාදිසාභොගාභාවතොති.

(1020.) **චතුත්ථාරුප්ප** =පෙ= **න ච සන්ත**ංති යථා නෙව-සඤ්ඤානාසඤ්ඤායතනචිත්තං සංඛාරාවසෙසසුඛුමභාවප්පත්තියා-සවිසෙසං සන්තං, එවමයං ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති නෙව සන්තා තදභාවතොති අධිප්පායො. චසද්දො පනෙත්ථ අවුත්ත-සමුච්චයත්ථො. තෙන "සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලං, එතං පණීතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං"ති-ඉමස්සපි සංගහො වෙදිතබ්බො. (1020) **චතුත්ථං සන්තතො**ති සංඛාරාවසෙස – සුඛුමභාවෙන සවිසෙසං සන්තතාය අසන්තභාවකර රොගාදිසරික්ඛක – සඤ්ඤාවිරහතො ච සන්තතො දිස්වා. (1024.) **සන්තං සන්තමිදං චිත්ත**ංති ඉමිනා භාවනාකාරං දස්සෙති. විභංගෙ පි හි "තං යෙව ආකිඤ්චඤ්ඤායතනං සන්තතො

1. B. අවිසිට්ඨං. 2. M. පොත්ථකෙ නත්ථි.

මනසිකරොතී"ති අයමෙව භාවනාකාරො ගහිතො. අපරෙ පන පාළියං ඉමස්ස භාවනාකාරො න ගහිතොති වත්වා තත්ථ කාරණං වදන්ති. තත්ථ වත්තබ්බං **විසුද්ධිමග්ගසංවණ්ණනාදිතො** ගහෙතබ්බං.

(1027.) **තතියාරුප්පසඞ්ඛාතක්ඛන්ධෙසු පි චතූසුපි** ආරම්මණභූතෙසූති අධිප්පායො. **අභාවමත්තම්පීති** සුඤ්ඤතාමත්තම්පි. එවං සුඛුමම්පීති අධිප්පායො (1030.) **සන්තාරම්මණතායාති** සන්තං ආරම්මණං එතස්සාති සන්තාරම්මණං, තාය; න ඣානසන්තතාය. න හි තතියාරුප්පසමාපත්ති චතුත්ථාරුප්පතො සන්තතරා. චොදකො යං සන්තතො මනසිකරොති, න තත්ථ ආදීනවදස්සනං භවෙය්‍ය. අසති ච ආදීනවදස්සනෙ සමතික්කමො එව න සියාති, **සන්තතො චෙ මනසිකාරො කථං ච සමතික්කමොති** ආහ. ඉතරො **අනාපජ්ජිතුකාමතායාති**[1] ආදිනා පරිහාරමාහ තෙන ආදීනවදස්සනම්පි අත්ථෙවාති දස්සෙති. යස්මිං හි ඣානෙ අභිරති තත්ථ ආවජ්ජන-සමාපජ්ජනාදිපටිපත්තියා භවිතබ්බං. සා පනස්ස තතියාරුප්පෙ සබ්බසොව නත්ථි, කෙවලං සුඤ්ඤභාවතො[2] ආරම්මණකරණමත්තමෙව. තථාහෙස කිඤ්චාපි තං සන්තතො මනසිකරොති., අථ ඛ්වස්ස "අහමෙතං ආවජ්ජිස්සාමි සමාපජ්ජිස්සාමීති ආභොගසමන්නාහාරො න හොති. කස්මා? ආකිඤ්චඤ්ඤායතනතො නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සමාපත්තියා පණීතතරතාය. යථාහි රාජා මහතා රාජානුභාවෙන නගරවීථියං චරන්තො දන්තකාරාදයො කම්මකාරෙ ඡෙකෙ අනෙකානි දන්තවිකතිආදීනි සිප්පානි කරොන්තෙ දිස්වා "අහො වත රෙ ඡෙකා ආචරියා, ඊදිසානි පි සිප්පානි කරිස්සන්තී"ති එවං තෙසං ඡෙකතායතුස්සති, න පනස්ස එවං හොති "අහො වතාහම්පි රජ්ජං පහාය එවරූපො සිප්පිකො භවෙය්‍යං"ති. තං කිස්ස හෙතු? රජ්ජසිරියා මහානිසංසතාය, තෙසං ජීවිතං තිණායපි අමඤ්ඤමානො තෙ සමතික්කමිත්වාව ගච්ඡති. එවං සම්පදමිදං දට්ඨබ්බං.

(1032.) **සුඛුමං පරන්ති** උක්කංසතො සුඛුමං; පච්ඡිමජ්ඣානුපචාරතො පට්ඨාය හි තවෙජ්ජනියා විනා පවත්තමානාය භාවනාය අනුක්කමෙන සඞ්ඛාරා තත්ථ අන්තිමකොට්ඨාසතං පාපිතාති. යදි එවං කථං භාවනා අන්තතො කිච්චං සාධෙති? නනු චෙසා තදවත්ථං පාපිතා ආරම්මණං න සම්මා උපතිට්ඨායතීති? න ඉදමෙවං දට්ඨබ්බං; භාවනාබලෙන සුඛුමභාවං පාපිතාපි සා

1. M. අනාවජ්ජිතුකාමතානි. 2. M. අඤ්ඤභාවතො.

න අත්තනො කිච්චෙ දුබ්බලත්තං පාපිතා; අථ ඛො සවිප්ඵාරි-කත්තාභාවං ගමිතා තෙන තථා-සුඛුමාපි අත්තනො කිච්චෙසු න දුබ්බලා එවාති න තත්ථ තස්සා අසාමත්ථියං හොති. **යාය සඤ්ඤායාති** යාදිසාය සඤ්ඤාය සද්දප්පවත්තිහෙතුභූතාය **සො** නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමංගී පුග්ගලො නෙවසඤ්ඤී නාසඤ්ඤී ච හොති, නෙවසඤ්ඤානාසඤ්ඤාසමංගිස්ස හි[1] න කෙවලං සඤ්ඤාව එදිසී සුඛුමා නෙවසඤ්ඤානාසඤ්ඤා හොති, අථ ඛො පන වෙදනාදයොපි සුඛුමා. වෙදනාපි නෙවවෙදනා නාවෙදනා, චිත්තම්පි නෙව චිත්තං නාචිත්තං, ඵස්සොපි නෙව ඵස්සො නාඵස්සො, එස නයො සෙසසම්පයුත්තධම්මෙසුපි. සඤ්ඤාසීසෙන පන නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති වුත්තං; නානත්තකායා නානත්තසඤ්ඤිනොති ආදීසු විය.

තනු චෙත්ථ "යදි සඤ්ඤා අත්ථි, කථං නෙව සඤ්ඤාති වත්තුං වට්ටති? යදි නත්ථි, කථං නාසඤ්ඤා"ති අනුයොගං සන්ධාය ඉමමත්ථං උපමාහි සාධෙතුං (1034.) **පත්තමක්ඛණතෙලෙනාති** ආදි වුත්තං. තත්ථ **පත්තමක්ඛණතෙලෙනාති** අනොවුත්ථතාය යාගුයා සද්ධිං අකප්පියට්ඨෙන තෙලං අත්ථීති නාලිපූරාදීනං වසෙන නත්ථීති එවං වත්තබ්බෙ පත්තෙ මක්ඛිතතෙලෙන. **මග්ගසම්මං උදකෙන** වාති උපාහනතෙමනමත්තට්ඨෙන උදකං අත්ථීති, නහානවසෙන නත්ථීති එවං වත්තබ්බෙන "මග්ගසම්මං උදකෙන." **අයං අග්ගීති** කඤ්චි විසෙසං උප්පාදය සභාවතො අත්ථීති වත්තබ්බසෙසව ධම්මස්ස කඤ්චි විසෙසං උප්පාදය නත්ථීති වත්තබ්බතාසංඛාතො අයමත්ථො. පටුසඤ්ඤාකිච්චං කාතුං අසමත්ථතාය හි නෙවසඤ්ඤතා, සංඛාරාවසෙස-සුඛුමභාවෙන නාසඤ්ඤතා ච හොති. තෙනාහ (1036.) **පටුසඤ්ඤාය කිච්චං කාති**[2] ආදිං. ආරම්මණසඤ්ජානනං චෙව විපස්සනාය විසයභාවං උපගන්ත්වා නිබ්බිදාජනනං ච පටුසඤ්ඤාකිච්චං. කථමයං සඤ්ඤාව සමානා සඤ්ඤාකිච්චං කාතුං න සක්කොතීති ආහ **යථා දහනකිච්චං**ති ආදිං. නහාතුකාමස්ස උණ්හසීතභාවං අකත්වා සුඛජනකතාය සුඛොදකං, තස්මිං තෙජොධාතු යථා දහනකිච්චං කාතුං[3] න සක්කොති, එවමෙසා අතිසන්තාරම්මණෙ පවත්තනතො ආරම්මණසඤ්ජානනං කාතුං න සක්කොති, පරම සුඛුමත්තං ගතා. තෙනෙව හෙසා අකතාභිනිවෙසස්ස විපස්සනාඤාණෙන සුඛග්ගය්හා[4] න හොතීති සෙසමාපත්තීසු සඤ්ඤා විය විපස්සනාය විසයභාවං උපගන්ත්වා නිබ්බිදාජනනං

1. M. සමංගී හොති. 2. M. කිච්චස්සාති. 3. M. පොත්ථෙකොත්ථි. 4. M සුඛග්ගණ්හා.

ඤාතුං න සක්කොති. අඤ්ඤෙසු හි ඛන්ධෙසු අකතවිපස්සනාභිනිවෙසො භික්ඛු නෙවසඤ්ඤානාසඤ්ඤායතනක්ඛන්ධෙ සම්මසිත්වා නිබ්බිදං පත්තුං සමත්ථො නාම නත්ථි, අපි ආයස්මා **සාරිපුත්තො.** පකතිවිපස්සකො පන සාරිපුත්තසදිසො භික්ඛු ඛන්ධාදිමුඛෙන විපස්සනං අභිනිවිසිත්වා ද්වාරාලම්බණෙහි සද්ධිං ද්වාරප්පවත්තධම්මානං විපස්සනං ආරභිත්වා ඨිතො සක්කුණෙය්‍ය තබ්බිසයං උදයබ්බයඤාණං උප්පාදෙතුං[1]. සොපි කලාපසම්මසනවසෙනෙව, නො අනුධම්මවිපස්සනාවසෙන[2]. න හි සාරිපුත්තසදිසොපි භික්ඛු චතුත්ථාරුප්පපරියාපන්නෙ[3] ඵස්සාදිධම්මෙ[4] විනිබ්භුජිත්වා විසුං විසුං සරූපතො ගහෙත්වා අනිච්චාදිවසෙන සම්මසිතුං සක්කොති. කෙවලං පන අවිනිබ්භුජ්ජ එකතො ගහෙත්වා කලාපතො සමූහතො යෙව සම්මසිතුං සමත්ථො හොති; එවං **සුඛුමත්තෙන සා විජ්ජති.**

(1038.) **රූපන්ති** කසිණරූපසඞ්ඛාතං පටිභාගනිමිත්තං. **ආකාසන්ති** කසිණුග්ඝාටිමාකාසං. **විඤ්ඤාණන්ති** ආකාසෙ පවත්තවිඤ්ඤාණං. **තදභාවකන්ති** තස්ස ආකාසෙ පවත්තවිඤ්ඤාණස්ස අභාවතං.[5] **කමතො**ති පඨමාරුප්පං රූපමතික්කමිත්වා හොතීති ආදිනා අනුක්කමතො අත්ථතො වුත්තමත්ථං අට්ඨකථාවචනං ආහරිත්වා සාධෙන්තො (1039.) **ආහ චා**ති ආදිමාහ. **ඉදානි** ඉමාසු චතූසු අරූපසමාපත්තීසු (1040.) **පච්ඡිමා පච්ඡිමා** සමාපත්තියො පුරිමපුරිමාහි සමාපත්තීහි **සුප්පණීතතරා** සුට්ඨු පණීතතරා, සුන්දරපණීතතරාති වා අත්ථො. **පාසාදතල-සාටකා**[6]ති චතුභූමකස්ස පාසාදස්ස හෙට්ඨිමතො උපරූපරි සවිසෙස-පඤ්චකාමගුණා චත්තාරො පාසාදතලාදි; ථූල-සණ්හ-සණ්හතර-සණ්හතම සුත්තෙහි විතා ආයාමවිත්ථාරතො සමප්පමාණා සාටකා ච.[7]

(1042) **රූපාරූපං** භවං **අභිභුය්‍ය** නිබ්බානං **යාති.** අථ වා නීවරණෙ අභිභුය්‍ය රූපාරූපභවං යාතීති අත්ථො.

**ඉති අභිධම්මත්ථවිභාවිනියා නාම අභිධම්මාවතාර-**
**සංවණ්ණනාය පණ්ණරසමපරිච්ඡෙද**
**වණ්ණනා නිට්ඨිතා.**

---

1. M. උප්පාදෙය්‍ය. 2. M. අනුපදධම්ම.- 3. M. -පන්නෙසු. 4. M. ධම්මෙසු 5. M. අභාවකං. 6. M. -සාටිකා. 7. M. සාටිකා ච

# සොළසමො පරිච්ඡෙදො.

## අභිඤ්ඤානිද්දෙසො

(1043.) **පරං**ති විසිට්ඨං කත්වා; විසෙසතොති අත්ථො. (1045.) **චතුත්ථජ්ඣානමත්තෙනාපීති** රූපාවචරචතුත්ථජ්ඣානමත්තෙනාපි, තාවස්සං අරූපජ්ඣානෙපීති[1] අධිප්පායො. අරූපාවචරජ්ඣානං අප්පටිලද්ධොපි හි කතාධිකාරො භික්ඛු අභිඤ්ඤං සම්පාදෙතුං සමත්ථො හොති. එත්ථ චතුත්ථජ්ඣානග්ගහණෙන ච හෙට්ඨා තීණි ඣානානි ගහිතානි. තෙසු හි අචිණ්ණවසී චතුත්ථජ්ඣානං උප්පාදෙතුම්පි න සක්කොති. **අභිඤ්ඤාසු අනුයොගං කාතුං** වට්ටතීති වත්වා තත්ථ පයොජනං දස්සෙතුං (1046.) **අභිඤ්ඤා නාමාති** ආදි වුත්තං. **නිට්ඨංගතාති** අධිගතානිසංසතාය චෙව භාවනාසුඛතාය ච නිට්ඨං නිප්ඵත්තිං ගතා. සමාධිභාවනාය හි ලොකියාභිඤ්ඤා උදයඵලභාවෙන පාකටං. සො අභිඤ්ඤාභාවනාය[2] සමන්නාගතො සුඛෙනෙව පඤ්ඤාභාවනං සම්පාදෙස්සති.

(1048.) **දිබ්බානී**ති ආදි ලොකියාභිඤ්ඤානං සරූපතො උද්දිසනං. **දිබ්බානි චක්ඛුසොතානී**ති දිබ්බචක්ඛුඤාණං දිබ්බසොතඤාණං ච දස්සෙති. **ඉද්ධී**ති ඉද්ධිවිධඤාණං. ඉමා පන අභිඤ්ඤායො පත්තුකාමෙන ආදිකම්මිකෙන යොගිනා යස්මා ඔදාතකසිණපරියන්තෙසු අට්ඨසු කසිණෙසු චතුත්ථජ්ඣානං තබ්බසෙන ච අරූපසමාපත්තියො නිබ්බත්තෙත්වා වා තවා කසිණානුලොමතාදීහි චුද්දසහි ආකාරෙහි චිත්තං දමෙතබ්බං. න හි එවං අදමෙත්වා පුබ්බෙ අභාවිතභාවනො ආදිකම්මිකො යොගාවචරො පඤ්ච අභිඤ්ඤායො සම්පාදෙස්සති[3]. තස්මා තං චිත්තපරිදමනං අවස්සං කාතබ්බන්ති දස්සෙතුං (1049 ) **කසිණානුලොමතාදීහී**ති ආදි වුත්තං. **කසිණානුලොමතාදීහී**ති කසිණානුලොමතා, කසිණපටිලොමතා, කසිණානුලොමපටිලොමතා, ඣානානුලොමතා, ඣානපටිලොමතා, ඣානානුලොමපටිලොමතා, ඣානුක්කන්තිකතා, කසිණුක්කන්තිකතා, ඣානකසිණුක්කන්තිකතා, අංගසංකන්තිකතා, ආරම්මණසංකන්තිකතා, අංගාරම්මණසංකන්තිකතා, අංගවවත්ථාපනතා, ආරම්මණවවත්ථාපනතාති ඉමෙහි චුද්දසහි ආකාරෙහි.

---

1. M විනා අවස්සං අරූපජ්ඣානෙහීති 2. M අභිඤ්ඤාය ච සමාධිනා ච. 3 M. නිප්ඵාදෙස්සතීති.

තත්ථ අට්ඨසු කසිණෙසු පටිපාටියා සතක්ඛත්තුං සහස්සක්ඛත්තුම්පි සමාපජ්ජනං, තථෙව උප්පටිපාටියා, පටිපාටි-උප්පටිපාටිවසෙන ච සමාපජ්ජනන්ති. ඉමෙසං තිණ්ණං ආකාරානං වසෙන කසිණානුලොමතාදයො වුත්තා. පඨමජ්ඣානතො පට්ඨාය යාව නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජනං[1] අයං ඣානානුලොමතා නාම. තෙසං පටිලොමතා ඣානපටිලොමතා නාම. තෙසං අනුලොම-පටිලොමතා ඣානානුලොමපටිලොමතා නාම. පඨවීකසිණෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා තත්ථෙව තතියං සමාපජ්ජති, තතො තදෙව උග්ඝාටෙත්වා ආකාසානඤ්චායතනං, තතො ආකිඤ්චඤ්ඤායතනන්ති එවං කසිණං අනොක්කමිත්වා ඣානස්සෙව එකන්තරිකභාවෙන උක්කමනං ඣානුක්කන්තිකතා නාම. එවං ආපොකසිණාදිමූලිකාපි යොජනා කාතබ්බා. පඨවීකසිණෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා පුන තදෙව තෙජොකසිණෙ, තතො නීලකසිණෙ, තතො ලොහිතකසිණෙති ඣානං අනුක්කමිත්වා කසිණස්සෙව එකන්තරිකභාවෙන උක්කමනං කසිණුක්කන්තිකතා නාම. පඨවීකසිණෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා තෙජොකසිණෙ තතියං, නීලකසිණං උග්ඝාටෙත්වා ආකාසානඤ්චායතනං; ලොහිතකසිණතො ආකිඤ්චඤ්ඤායතනන්ති ඉමිනා නයෙන ඣානස්ස චෙව කසිණස්ස ච උක්කමනං ඣානකසිණුක්කන්තිකතා නාම. පඨවීකසිණෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා තත්ථෙව ඉතරෙසම්පි සමාපජ්ජනං අංගසංකන්ති නාම. සබ්බකසිණෙසු එකෙකස්සෙව සමාපජ්ජනං ආරම්මණසංකන්ති නාම. පඨවීකසිණෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා ආපොකසිණෙ දුතියං, තෙජොකසිණෙ තතියං, වායොකසිණෙ චතුත්ථං, නීල-කසිණං උග්ඝාටෙත්වා ආකාසානඤ්චායතනං, පීතකසිණතො විඤ්ඤාණඤ්චායතනං, ලොහිතකසිණතො ආකිඤ්චඤ්ඤායතනං, ඔදාතකසිණතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති එවං අංගානං ආරම්මණානං ච සමතික්කමනං අංගාරම්මණසංකන්ති නාම. පඨමජ්ඣානං නාම පඤ්චංගිකන්ති වවත්ථපෙත්වා දුතියජ්ඣානං චතුරඞ්ගිකං, තතියං තිවංගිකං, චතුත්ථං දුවංගිකං, තථා ආකාසානඤ්චායතනං =පෙ= නෙවසඤ්ඤානාසඤ්ඤායතනං ති එවං ඣානංගමත්තස්සෙව වවත්ථාපනං අංගවවත්ථාපනං නාම. තථා ඉදං පඨවීකසිණං, ඉදං ආපොකසිණං ති ආදිනා ආරම්මණ-මත්තස්සෙව වවත්ථාපනං ආරම්මණවවත්ථාපනං නාම. අංගාරම්මණ-වවත්ථාපනම්පි ච එකෙ ඉච්ඡන්ති. අට්ඨකථාසු පන අනාගතත්තා අද්ධා තං භාවනාමුඛං[2] න හොති.

1. පොත්ථකෙසු නත්ථි. 2. M. භාවනාසුඛං.

ඉමෙහි පන චුද්දසහි ආකාරෙහි චිත්තපරිදමනං කාතුං අට්ඨසමාපත්තිලාභීනං සතෙසු සහස්සෙසු වා එකොව සක්කොති. (1050.) **දන්තෙ** ති චුද්දසහි ආකාරෙහි දන්තෙ. **සමාහිතෙ** ති චතුත්ථජ්ඣානසමාධිනා සමාහිතෙ. **සුද්ධෙ** ති නීවරණදූරීභාවෙන පච්චනීකසමාධානෙන[1] අව්‍යාවටතාය[2] තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය පි සම්පාදිත - සතිපාරිසුද්ධියා සම්භාවෙන[3] වා සුපරිසුද්ධෙ. **පරියොදාතෙ** ති සුධන්තසුවණ්ණස්ස නිඝංසනෙන විය පරිසුද්ධත්තායෙව පරියොදාතෙ, පභස්සරෙති වුත්තං හොති. අථ වා විතක්කවිචාරක්ඛොභවිරහවසෙන **පරියොදාතෙ** ති වුත්තං. **අනඞ්ගණෙ** ති මාදිසස්ස සමාධිසම්පන්නස්ස ඊදිසෙන භවිතබ්බං ති එවං ඣානපටිලාභපච්චයානං "අහො වත මමෙව සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙය්‍යා"ති ආදිනයප්පවත්තානං පාපකානං ඉච්ඡාවචරානං අභාවෙන **අනඞ්ගණෙ**. **අනුපක්කිලෙසෙ** ති උපගන්ත්වා කිලිස්සනට්ඨෙන උපක්කිලෙසසංඛාතානං රාගාදීනං, "අභිජ්ඣා චිත්තස්ස උපක්කිලෙසො, ව්‍යාපාදො =පෙ= කොධො"ති ආදිනා ආගතානං චිත්තුපක්කිලෙසානං වා විගතත්තා **විගතූපක්කිලෙසෙ**. **මුදුභූතෙ** ති පගුණභාවාපාදනෙන සුභාවිතත්තා මුදුභූතෙ, වසීභාවප්පත්තෙති වුත්තං හොති. වසීභාවප්පත්තං හි චිත්තං සුපරිමද්දිතං විය චම්මං සුපරිකම්මකතා විය ච ලාඛා මුදූති වුච්චති. **කම්මනියෙ** ති මුදුත්තා යෙව ඉද්ධිපාදභාවූපගමනෙන කම්මක්ඛමෙ; විකුබ්බණාදිඉද්ධිකම්මයොග්‍යෙති වුත්තං හොති. මුදුජාතං හි චිත්තං කම්මක්ඛමං හොති සුධන්තමිවසුවණ්ණං. උභයම්පි චෙතං සුභාවිතත්තා යෙව හොති. යථාහ: "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං බහුලීකතං මුදුං චෙව හොති කම්මනියං ච යථයිදං භික්ඛවෙ චිත්තං"ති. **ඨිතෙ** ති එතෙසු පරිසුද්ධභාවනාදීසු නිච්චලං අවට්ඨිතෙ. භාවනා - පාරිපූරියා පණීතභාවං සම්පාපුණිත්වා[4] ඨිතෙ. **අචලෙ** ති ඨිතත්තා යෙව අකම්පෙ. **ආනෙඤ්ජප්පත්තෙ** ති වුත්තං හොති. මුදුකම්මඤ්ඤභාවෙහි වා අත්තනො වසෙ ඨිතත්තා ඨිතෙ. සද්ධාදීහි පරිග්ගහිතත්තා අස්සද්ධියාදීහි අකම්පනතො අචලෙ (1051.) **අට්ඨංගසම්පන්නෙ** ති ඨිතිඅචලතානං විසුං අගහණෙන;[5] සමාහිතෙ ති විසුං එකමඞ්ගං කත්වා (ගහණෙන). තාසං පන විසුං විසුං ගහණෙ සුවිසුද්ධතාදීනං සමාහිතචිත්තස්ස අංගභූතත්තා සමාහිතෙති ඉමං අංගභාවෙන අගහෙත්වා සුවිසුද්ධතාදීහි අට්ඨහි අංගෙහි සම්පන්නතා වෙදිතබ්බා. **ඉද්ධිවිධාය** ති ඉද්ධිකොට්ඨාසත්ථාය, ඉද්ධිප්පභෙදාය වා. අත්ථතො පන

2. M. පච්චනීකසමනෙ 2. M. අව්‍යාවතාය. 3. M. - සභාවෙන.
4. M සම්මසිත්වා. 5. M. අග්ගහණෙ

ඉද්ධිවිධා නාම එකස්ස බහුභාවාදි - අනෙකවිධානප්පච්චයභූතං අභිඤ්ඤාඤාණං. **අභිනීහරති** ති අභිඤ්ඤාධිගමත්ථාය පරිකම්ම-චිත්තං කසිණාරම්මණතො අපනෙත්වා අභිඤ්ඤාභිමුඛං පෙසෙති. ඉද්ධිවිකුබ්බනං ති එත්ථ ඉජ්ඣතී ති ඉද්ධි, නිප්ඵජ්ජති පටිලබ්භතී ති වුත්තං හොති. යං හි නිප්ඵජ්ජති පටිලබ්භති ච තං ඉජ්ඣතී ති වුච්චති. යථාහ "කාමං කාමයමානස්ස තස්ස චෙතං සමිජ්ඣතී"ති ආදිං. ඉද්ධි යෙව විකුබ්බනං පකතිවණ්ණාදිවිජහනෙනාති[1] ඉද්ධිවිකුබ්බනං. ඉදං ඉද්ධිසු විකුබ්බණිද්ධියා පධානභාවතො වුත්තං. ඉද්ධි ච විකුබ්බණං චාති ඉද්ධිවිකුබ්බණං. විසුං ගහණම්පි වුත්ත-කාරණෙනෙව දට්ඨබ්බං. යථාපනෙතං නිප්ඵාදෙතබ්බං තං විධිං දස්සෙතුං **අභිඤ්ඤාපාදකජ්ඣානං** ති ආදි වුත්තං. එත්ථ ච අනු-පුබ්බෙන චත්තාරි ඣානානි සමාපජ්ජිත්වා චතුත්ථජ්ඣානතො වුට්ඨායාති කෙචි. තං අයුත්තං. යථිච්ඡිතසමාපජ්ජනත්ථං හි චිත්තපරිදමනං. චතුත්ථජ්ඣානමෙව අභිඤ්ඤාපාදකං, න ඉතරානි.

(1053.) **සතං හොමි =පෙ= මානසං** ති සචෙ සතං ඉච්ඡති "සතං හොමී"ති, සචෙ සහස්සං ඉච්ඡති 'සහස්සං හොමී"ති එවං පරිකම්මමානසං කත්වා. පරිකම්මමානසං ති ච පාදකජ්ඣා-නතො වුට්ඨාය සතං හොමීති ආදිනා පවත්තිතං කාමාවචරචිත්තං පාදකජ්ඣානං ච. **අභිඤ්ඤාපාදකජ්ඣානං පුනාපජ්ජා** ති එත්ථ පුබ්බෙ අභිඤ්ඤාපාදකජ්ඣානසමාපජ්ජනං පරිකම්මචිත්තස්ස සමාධානත්ථං; පුන සමාපජ්ජනං අධිට්ඨානචිත්තස්ස බලග්ගාහත්ථං. **අධිට්ඨාති** ති සතං ආවජ්ජෙත්වා තතො පරං පවත්තානං තිණ්ණං චතුන්නං වා පුබ්බභාගචිත්තානං අනන්තරා උප්පන්නෙන සන්නිට්ඨාපනවසෙන අධිට්ඨානං ති ලද්ධනාමෙන අභිඤ්ඤාඤාණෙන සන්නිට්ඨානං කරොති, සතං නිප්ඵාදෙතී ති අත්ථො. අධිට්ඨානං ති හි සබ්බත්ථ අභිඤ්ඤාඤාණං වුච්චති.

(1055.) **නිමිත්තාරම්මණං** ති පටිභාගනිමිත්තාරම්මණං. **පරිකම්මමානසානෙත්ථ සතාරම්මණිකානි හී** ති එත්ථ එතෙසු පරිකම්මාධිට්ඨානෙසු පරිකම්මමානසානි "සතං හොමී"ති පවත්තානි කාමාවචරමානසානි සතාරම්මණිකානි එකෙකස්ස චිත්තස්ස වසෙන සතාරම්මණිකානි හොන්ති, පච්චෙකං සතං හොමීති පවත්තනතො සහස්සාරම්මණාදීසුපි එසෙව නයො. **තදධිට්ඨානචිත්තං පී** ති තස්ස සතාදිකස්ස අධිට්ඨානචිත්තම්පි. සතාරම්මණිකතා ච පන තෙසං වණ්ණවසෙන. නො සත්තපණ්ණත්තිවසෙන රූපං හි සතං සහස්සං වා කත්වා දස්සෙතබ්බං, න පණ්ණත්ති. එත්ථ ච

1. M. විජහනක්‍රියං-ති.

යදි නීලවණ්ණමෙව සතං අභිනිප්ඵාදෙති, වණ්ණස්ස තං තං සන්තානවසෙන නානත්තෙපි නීලවසෙන එකත්තා එකමෙකං පරිකම්මචිත්තං සබ්බං නීලජාතිං[1] ආලම්බති. යදි පන නානා-වණ්ණං නානාකිරියං, පරිකම්මචිත්තානම්පි බහුභාවො හොති. යදි[2] එකමෙකං එකෙකවණ්ණං, එකෙකවණ්ණෙසු ච නානාකිරියං ආරම්මණං කරොති, අධිට්ඨානචිත්තං පන වණ්ණසාමඤ්ඤං ගහෙත්වාපි පරිකම්මාරම්මණං නානාවණ්ණත්තං[3] අභිනිප්ඵාදෙති, අචින්තෙය්‍යානුභාවත්තා ඉද්ධිවිසයස්ස. (1056.) **අප්පණාවිධානං විසයො** ති විසයගහණං අභිඤ්ඤාචිත්තස්ස ඣානචිත්තස්ස ච පඨමුප්ප-ත්තියං සදිසභාවතො වුත්තං, න තස්ස අප්පණාභාවතො. තෙනෙව හි **පුබ්බවුත්ත**ගහණෙන විසෙසිතන්ති. (1057.) **චතුත්ථජ්ඣානිකං** ති රූපාවචරචතුත්ථජ්ඣානවන්තං, තෙන සම්පයුත්තං. යදි එවං චතුත්ථජ්ඣානස්ස ඉමස්ස ච කො විසෙසොති ආහ (1057.) **පරිකම්මවිසෙසො වා** ති. න එත්ථ පරිකම්මවිසෙසං විනා අඤ්ඤො විසෙසො අත්ථි. අප්පණාය පුබ්බභාගප්පවත්තානි පි තීණි චත්තාරි ජවනානි ගහිතාගහණෙන[4] අගහිතගහණෙන වා පරිකම්මොපචාරානුලොමානි, සබ්බපච්ඡිමං ගොත්‍රභුනාමකන්ති ආදි සෙසං සමානමෙව. තෙනාහ **සෙසං පුබ්බසමං ඉධා** ති.

## ඉද්ධිවිධඤාණං.

(1058.) **දිබ්බසොතං**ති දෙවතානං පිත්තසෙම්හාදීහි අපලි-බුද්ධෙහි දූරෙපි ආරම්මණගහණසමත්ථෙහි දිබ්බසොතපසාදෙහි සමානත්තා, දිබ්බවිහාරවසෙන පටිලද්ධත්තා, අත්තනො ච දිබ්බ-විහාරසන්නිස්සිතත්තා දිබ්බං. සවණට්ඨෙන සොතකිච්චකරණතො තංසදිසතාය ච සොතං. **ඉදං**ති යං උද්දෙසෙ "දිබ්බානි චක්ඛු-සොතානී"ති දිබ්බසොතං උද්දිට්ඨං, තං ඉදන්ති අත්ථො. පඨමං ඔළාරිකසද්දං ආවජ්ජිත්වා පච්ඡා සුඛුමසද්දස්ස ආවජ්ජිතබ්බතො ආහ: (1059) **මහන්තෙ සුඛුමෙ පි චා**ති. පරිචයකරණත්ථං හි පඨමං අරඤ්ඤෙ සීහාදීනං සද්දෙ ආදිං කත්වා සබ්බොළාරිකතො පට්ඨාය යථානුක්කමෙන සුඛුම – සුඛුම – සද්දා ආවජ්ජිතබ්බා. තථා පුරත්ථිමාදීසු දිසාසු ඔළාරිකානම්පි සුඛුමානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකාතබ්බං. තස්ස තෙ සද්දා පාකතිකචිත්තස්සාපි[5] පාකටා හොන්ති. පරිකම්මචිත්තස්ස පන අතිවිය පාකටා. (1060) **තස්සා**ති තස්ස යොගිනො **සද්දස්ස නිමිත්තං**ති. ඔළාරිකස්ස සුඛුමස්ස වා සද්දස්ස යථාවුත්තං උපාදායුපාදාය ලබ්භමානං

---

1. M. නීලජාතං. 2. B. M. පොත්ථකෙසු නත්ථි. 3. M නානාවණ්ණ-වන්තං. 4. M. ගහිතගහණෙන. 5. M. පකතිචිත්තස්සාපි.

ඔළාරිකසුඛුමාකාරං. **මනසිකුබ්බතොති** ඉමිස්සා දිසාය අයං සද්දො ඔළාරිකො සුඛුමො වාති එවං පරිකම්මචිත්තෙන මනසිකරොන්තස්ස. (1061) **සද්දෙසූති** යෙ පරිකම්මචිත්තස්ස විසයභූතා ඔළාරිකා සුඛුමා වා සද්දා, තෙසු සද්දෙසු.[1] **අඤ්ඤතරන්ති** යත්ථස්ස පරිකම්මකරණවසෙන අභිණ්හං මනසිකාරො පවත්තො තං එතං සද්දං. යදි අභිඤ්ඤාචිත්තම්පි පරිකම්මෙන ගහිතමෙව ආරම්මණං කරොති, කො පන තස්ස ඉමස්ස වා විසෙසොති? වුච්චතෙ: පරිකම්මචිත්තං අස්සුතස්ස ගහණතො සද්දමත්තං ගණ්හාති, අභිඤ්ඤාචිත්තං පන අස්සුතම්පි ගණ්හාති,[2] සවණාකාරෙන ගහණතො අත්ථාවබොධස්ස පි පච්චයභාවෙනෙව ගණ්හාතීති අයමෙතෙසං විසෙසො.

(1064.) **සූතකොවිදූති** පරියත්තියං ඡෙකා. **ථාමජාතන්ති** ජාතත්ථාමං, දළ්හභාවප්පත්තන්ති අත්ථො. (1067) **වඩ්ඪෙතබ්බං** පාදකජ්ඣානාරම්මණං කිත්තකන්ති ආහ **එකඞ්ගුලන්තරගතන්ති** ආදිං. පාදකජ්ඣානස්ස හි **ආරම්මණ**භූතං කසිණනිමිත්තං එත්තකං ඨානං එරතූති මනසිකරිත්වා පාදකජ්ඣානං සමාපජ්ජන්තස්ස කසිණනිමිත්තං තත්තකං ඨානං එරිත්වා තිට්ඨති. සො සමාපත්තිතො වුට්ඨාය පුන පාදජ්ඣානං අසමාපජ්ජිත්වාපි අනෙකප්පභෙදෙ පි සද්දෙ ආවජ්ජති සුභාවිතභාවනත්තා. තත්ථඤ්ඤතරං සද්දං ආරබ්භ උප්පන්නාවජ්ජනානන්තරං චත්තාරි **පඤ්ච** වා ජවනානි උප්පජ්ජන්ති, යෙසු[3] පච්ඡිමං ඉද්ධිචිත්තං හොති; එවං යත්තකං සද්දං ඉච්ඡති තත්තකං තත්තකං[4] ආවජ්ජිත්වා ආවජ්ජිත්වා අභිඤ්ඤාඤාණෙන ජානාති. යෙන පන එවං කසිණනිමිත්තං අවඩ්ඪිතං, තෙන[5] පුන පි පාදකජ්ඣානං සමාපජ්ජිතබ්බමෙව. සො'හි තංඨානගතසද්දං පාදකජ්ඣානං සමාපජ්ජිත්වා තතො වුට්ඨාය අභිඤ්ඤාචිත්තෙන සුණාති; තතො එව හි (1067) **පාදකාරම්මණෙන** =පෙ= **සුණාති සොති**[6] වුත්තං. ඉද්ධිවිධලාභී පන සෙසා අභිඤ්ඤාලාභිනො විය විජ්ජමානසද්දාදි - ආරම්මණමත්තමෙව අකත්වා ආගන්තුකරූපනිම්මාපනතො සබ්බත්ථාපි ද්වික්ඛත්තුං පාදකජ්ඣානං සමාපජ්ජිත්වා තං නිප්ඵාදෙන්ති. එකඞ්ගුලද්වඞ්ගුලගහණං චෙත්ථ සුඛුමසද්දාපෙක්ඛාය කතං. (1068). **සුණන්තොති** එවං පරිච්ඡින්දිත්වා පරිච්ඡින්දිත්වා සවණෙන වසීකතාභිඤ්ඤො හුත්වා යථාවජ්ජිතෙ සද්දෙ සුණන්තො. **පාටියෙක්කම්පීති** එකජ්ඣං පවත්තමානෙපි යාව බ්‍රහ්මලොකා එකකොලාහලං කත්වා උට්ඨිතෙ සංඛභෙරිපණවාදිසද්දෙ පච්චෙකං

1 M. පොත්ථකෙ නත්ථි 2. M. ගණ්හන්තං. 3. M. තෙසු 4 M තත්ථගතං 5 B. M. තස්ස. 6. M. සාසඞ්කා

වත්ථුභෙදෙන වවත්ථාපෙතුකාමතාය සති "අයං සංඛසද්දො, අයං භෙරිසද්දො, අයං පණවසද්දො"ති ආදිනා පච්චෙකං යෙව වවත්ථාපෙතුං සක්කොතී යෙවාති.

### දිබ්බසොතඤාණං

(1069) **චෙතොපරියමානසං**ති පරියායතීති[1] **පරියං,** සරාගාදිවසෙන පරිච්ඡිජ්ජ ජානාතීති අත්ථො. "යෙසං ධාතූනං ගති අත්ථො, බුද්ධි පි තෙසං අත්ථො හොතී"ති. චෙතසො පරියං චෙතොපරියං. මනසි භවන්ති මානසං, ඤාණං. චෙතොපරියං ච තං මානසං චාති චෙතොපරියමානසං. **දිබ්බචක්ඛුවසෙනෙවාති** දිබ්බචක්ඛුඋපනිස්සයෙනෙව. තං හි එතස්ස උප්පාදනෙ පරිකම්මං. (1070) **තස්මාති** යස්මා ඉදං දිබ්බචක්ඛුවසෙනෙව පවත්තති, තස්මා. **දිබ්බෙන චක්ඛුනාති** දිබ්බචක්ඛුඤාණෙන **දිස්වාති** සම්බන්ධො. **හදයං**ති න හදයවත්ථුං, අථ ඛො හදයමංසපෙසිං, යං බහි කමලමකුලසණ්ඨානං, අන්තො කොසාතකීඵලසදිසන්ති වුච්චති; තං හි නිස්සාය ඉදන්ති වුච්චමානං ලොහිතං තිට්ඨති. හදයවත්ථු පන ඉමං ලොහිතං නිස්සාය පවත්තති. **ලොහිතං දිස්වාති** ලොහිතස්ස වණ්ණං දිස්වා. දිබ්බචක්ඛුනා පි[2] වණ්ණමෙව පස්සති,[3] තෙනෙව හි තං චක්ඛුසදිසත්තා චක්ඛූති වුච්චති. **පරස්සාති** අඤ්ඤස්ස. යථා හි යො පරො න හොති, සො අත්තා හොති එවං යො අත්තා න හොති, සො පරො. කථම්පන දිබ්බචක්ඛුනා ලොහිතස්ස වණ්ණදස්සනෙන අරූපං[4] චිත්තං[4] විඤ්ඤෙය්‍යන්ති ආහ **සොමනස්සයුත්තන්ති** ආදිං. **ලොහිතං**ති රත්තං නිග්‍රොධඵලසමානවණ්ණං. (1072.) **කාළකං**ති ජම්බුපක්කසදිසවණ්ණං. **තිලතෙලූපමං**ති අනෙන පසන්නභාවමාහ.

කථම්පන චිත්තෙ සොමනස්සසහගතාදිම්හි සති කම්මජස්ස ලොහිතස්ස විවිධවණ්ණභාවාපත්තීති? කිඤ්චාපි හදයවත්ථුසන්නිස්සිතභූතානි කම්මජානෙව. තං පන ලොහිතං කම්මජමෙවාති නත්ථි, චතුසන්තතිරූපස්සාපි තත්ථ ලබ්භමානත්තා. තෙනෙව හි අට්ඨකථායං "ඉදං රූපං සොමනස්සින්ද්‍රියසමුට්ඨානං, ඉදං දොමනස්සින්ද්‍රියසමුට්ඨානං, ඉදං උපෙක්ඛින්ද්‍රියසමුට්ඨානන්ති පරස්ස හදයලොහිතවණ්ණං පස්සිත්වා"ති වුත්තං. එවම්පි යං තත්ථ අචිත්තජං තස්ස යථාවුත්ත-වණ්ණභෙදෙන න භවිතබ්බන්ති? භවිතබ්බං; සෙසසන්තතිරූපානං තදනුවත්තනතො. යථා හි ගමනාදීසු චිත්තජරූපානි උතුජකම්මජාහාරජරූපෙහි අනු-වත්තියන්ති, අඤ්ඤථා කායස්ස දෙසන්තරප්පත්ති[5] න සියා,

1. M පරියාතීති. 2. M. දිබ්බචක්ඛුනාපි 3. M. දිස්සති.
4 M. පරචිත්තං. 5. M දෙසන්තරුප්පත්ති.

එවම්ධාපි චිත්තජරූපං සෙසසන්තතිරූපෙහි අනුවත්තීයති. පසාදකොධාදිවෙලාසු ච චක්ඛුස්ස වණ්ණභෙදපත්ති යෙව තස්සත්ථස්ස නිදස්සනං දට්ඨබ්බං. තස්මා සොමනස්සාදියුත්තචිත්තානුරූපං[1] උප්පන්න - චිත්තසමුට්ඨාන - රූපවසෙන සෙසතිසමුට්ඨානරූපානම්පි නානාවණ්ණතා හොති යෙවාති සුත්තවුත්තං "ලොහිතං ලොහිතං සියා"ති ආදිං

(1073.) **දිස්වා හදයලොහිතන්ති** පඨමං තාව අනුමානඤාණෙන ලොහිතං දිස්වා. **කාතබ්බං ථාමගතන්ති** උප්පාදෙත්වා ථාමගතං[2] කාතබ්බං. චෙතොපරියඤාණං හි උප්පාදෙතුකාමෙන යොගිනා දිබ්බචක්ඛුලාභිනා සතා හෙට්ඨා වුත්තනයෙන රූපාවචරචතුත්ථජ්ඣානං අට්ඨංගසමන්නාගතං අභිනීහාරක්ඛමං කත්වා ආලොකං වඩ්ඪෙත්වා දිබ්බෙන චක්ඛුනා පරස්ස හදයමංසපෙසිං නිස්සාය පවත්තමානස්ස ලොහිතස්ස වණ්ණදස්සනෙන ඉදන්ති ඉමස්ස චිත්තං සොමනස්සසහගතන්ති වා දොමනස්සසහගතන්ති වා නයග්ගාහවසෙන වවත්ථපෙත්වා පාදකජ්ඣානං සමාපජ්ජිත්වා වුට්ඨාය "ඉමස්ස චිත්තං ජානාමී"ති පරිකම්මං කාතබ්බං. කාලසතම්පි කාලසහස්සම්පි පුනප්පුනං පාදකජ්ඣානං සමාපජ්ජිත්වා වුට්ඨාය තථෙව පටිපජ්ජිතබ්බං. තස්සෙවං දිබ්බචක්ඛුනා හදයලොහිතවණ්ණ - දස්සනාදිවිධිනා පටිපජ්ජන්තස්ස ඉදන්ති චෙතොපරියඤාණං උප්පජ්ජිස්සතීති යං තද පවත්තතීති වවත්ථාපිතං චිත්තං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං, තීණි චත්තාරි වා ජවනානි කාමාවචරානි ජවන්ති; චතුත්ථං පඤ්චමං වා අභිඤ්ඤාචිත්තං රූපාවචරචතුත්ථජ්ඣානිකං. තත්ථ යං තෙන[3] සම්පයුත්තං ඤාණං ඉදං චෙතොපරියඤාණං තං හි යත්ථ තෙන[4] පරිකම්මං කතං, තං පරස්ස චිත්තං පච්චවෙක්ඛතො පටිවිජ්ඣන්තං විභාවෙන්තමෙව හුත්වා පවත්තති, රූපං විය ච දිබ්බචක්ඛුඤාණං; සද්දං විය ච දිබ්බසොතඤාණං. තතො පරං පන කාමාවචරචිත්තෙහි සරාගාදිවවත්ථාපනං හොති, නීලාදිවවත්ථාපනං විය. එවමධිගතස්ස පන චෙතොපරියඤාණස්ස ථාමගමනවිධානම්පි අධිගමවිධානසදිසමෙව. තදෙවෙත්ථ ආචරියෙන දස්සිතං. **එවං ථාමගතෙති** ආදි ථාමගමනානිසංසදස්සනං. (1075.) **සබ්බමෙවාති** ඉදං කාමාවචරචිත්තං, රූපාවචරමානසන්ති උභයපදෙන පි සම්බන්ධිතබ්බං. තෙන[5] සබ්බං[5] චතුපණ්ණාසවිධං කාමාවචරචිත්තං පඤ්චදසරූපාවචරචිත්තන්ති සබ්බමෙව පච්චෙකං සරාගාදිප්පභෙදං විජානාතීති අත්ථො.

---

1. M. සොමනස්සාදිනා තංචිත්තානුරූපං. 2. M. ථාමභාවං ගතං.
3. M. තෙන අප්පණාචිත්තෙන 4. M අතෙන 5. M. පොත්ථකෙ නත්ථි.

පුථුජ්ජනස්ස වසෙනායං අභිඤ්ඤකථාති ලොකුත්තරචිත්තං ඉධ න උද්ධටං. තම්පි හි උපරිමො සදිසො වා අරියො හෙට්ඨිමස්ස සදිසස්ස ච චිත්තං ජානාති. හෙට්ඨිමො පන උපරිමස්ස චිත්තං න ජානාති. යථා එතං එවං අරූපාවචරජ්ඣානෙ අකතාභිනිවෙසො පුථුජ්ජනො සෙඛොපි වා අරූපාවචරචිත්තං න ජානාති. අථ සමාපත්තිකස්ස පන වසෙන ඉධ අරූපාවචරචිත්තස්සපි ගහණං[1] වුත්තං. අරහා පන ආරුප්පෙ අකතාභිනිවෙසොපි තප්පටිච්ඡාදක - අවිජ්ජාය විහතත්තා තම්පි ජානාති යෙව.

**චෙතොපරියඤාණං.**

(1076.) **පුබ්බෙ** අතීතජාතිසු. **නිවාසා** නිවුත්ථා අත්තනො සන්තානෙ පවත්තා සපරවිඤ්ඤාණෙහි ගොචරාසෙවනාය ආසෙවිතා ච ඛන්ධා පුබ්බෙනිවාසා. පරවිඤ්ඤාණවිඤ්ඤාතාපි හි පුබ්බෙ නිවසිංසු එත්ථාති පුබ්බෙ නිවාසාති වුච්චන්ති. තෙ පන ඡින්නවටුමකානුස්සරණාදිසු බුද්ධානං යෙව විසයා. පුබ්බෙනිවාසෙසු සරූපවිභාවකං ඤාණං පුබ්බෙනිවාසඤාණං තෙන. **තදනුස්සරණී**ති තෙසං පුබ්බෙනිවාසානං අනුස්සති. හෙට්ඨා තීසු ඣානෙසු යථාරහං පීතිසුඛෙහි කායචිත්තානං සම්පීණනාය චත්තාරි ඣානානි සමාපජ්ජිතබ්බානීති ආහ **ඣානානි පනාති** ආදිං. අඤ්ඤථා පාදකජ්ඣානං සමාපජ්ජිත්වාති[2] වුත්තං සියා. යාය නිසජ්ජාය නිසින්නස්ස අනුස්සරණාරම්භො, සා ඉධ සබ්බපච්ඡිමා නිසජ්ජා.

(1078.) **ඛණතො පභුති =පෙ= පටිලොමකකමාති** තස්මිං භවෙ පුරිමභවාදිසු කතං සබ්බම්පි සංගහෙත්වා සබ්බමාවජ්ජිතබ්බන්ති ආදිතො විසුං විසුං රත්තින්දිවාදිවසෙන දස්සෙති: **දිවසෙ රත්තියං කතන්ති.** සබ්බපච්ඡිමනිසජ්ජාතො පට්ඨාය ආසනපඤ්ඤාපනං සෙනාසනප්පවෙසන්ති පටිලොමෙන සකලං- රත්තින්දිවං කතකිච්චං ආවජ්ජිතබ්බං. කථමාවජ්ජිතබ්බන්ති? යං එත්ථන්තරෙ කතං කිච්චං සබ්බං තං පටිලොමක්කමෙනෙව **ආවජ්ජිතබ්බන්ති** අත්ථො. එත්තකං පන පකතිචිත්තස්සපි පාකටං පරිකම්මචිත්තස්ස අතිපාකටමෙව. සචෙ පනෙත්ථ කිඤ්චි න පාකටං හොති, පුන පාදකජ්ඣානං සමාපජ්ජිත්වා වුට්ඨාය ආවජ්ජිතබ්බං. එත්තකෙන දීපෙ ජලිතෙ විය පාකටං හොති. පාදකජ්ඣාන - සමාපජ්ජනං හි සත්ථකස්ස විය නිසාණසිලා සති- පඤ්ඤානං නිසිතභාවාවහං. තස්ස[3] තා තංසමාපජ්ජනෙන පරමතෙපක්කප්පත්තා හොන්ති.

1. M. ජානනං. 2. M. සමාපජ්ජිත්වා යෙවාති. 3. M. තස්මා.

(1080.) **පුරිමස්මිං භවෙති** ඉමම්හා භවා අනන්තරෙ පුරිමස්මිං භවෙ. (1081.) **නිබ්බත්තනාමරූපං චාති** අනන්තතො පච්චයෙහි නිබ්බත්තනාමරූපං. **සාධුකංති** සුට්ඨු අපරිහාපෙත්වා ආවජ්ජිතබ්බං. පහොති හි ඉමිස්සා අභිඤ්ඤාය කතාධිකාරො භික්ඛු- පඨමවාරෙනෙව පටිසන්ධිං උග්ඝාටෙත්වා චුතික්ඛණෙ නාමරූපං ආරම්මණං කාතුං; තථා අසක්කොන්තෙන හි ධුරනික්ඛෙපං අකත්වා පාදකජ්ඣානමෙව පුනප්පුනං සමාපජ්ජිතබ්බං. තතො ච වුට්ඨාය (වුට්ඨාය) පුනප්පුනං ආවජ්ජිතබ්බං. ආවජ්ජන්තෙන ච පඨමං රූපං ආවජ්ජිත්වා පච්ඡා නාමං ආවජ්ජිතබ්බංති ආචරියා. අපරෙ පන විපරියායෙන වදන්ති. තත්‍ථ පච්ඡිමනිසජ්ජාතො පභුති යාව පටිසන්ධි[1], තාව[1] ආරම්මණං කත්වා පවත්තඤාණං අතීතජාතිසු නිද්දිට්ඨධම්මාරම්මණාභාවතො පුබ්බෙනිවාසා- නුස්සතිඤාණං නාම න හොති. තං පන පරිකම්මඤාණමෙව. යදා පනස්ස පටිසන්ධිං අතික්කම්ම චුතික්ඛණෙ උප්පන්නනාමරූපං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, තස්මිං නිරුද්ධෙ වුත්තනයෙන අප්පණාචිත්තං උප්පජ්ජති, තෙන සම්පයුත්තං ඤාණං පුබ්බෙනිවාසානුස්සතිඤාණං නාම. තෙනාහ **යදා පනාති** ආදිං.

එත්‍ථාහ: කිං එකෙනෙව අභිඤ්ඤාචිත්තෙන චුතික්ඛණෙ පවත්තනාමරූපං සබ්බංපි ආරම්මණං කරොති, උදාහු අඤ්ඤෙන අඤ්ඤෙනාති? කිං චෙත්‍ථ යදි එකෙනෙව, දූරතො චිත්තපටං පෙක්ඛන්තස්ස විය නිරූපිතරූපෙන[2] වවත්‍ථානං හොති. යදි ච අඤ්ඤෙන අඤ්ඤෙන, විසුං විසුං පාදකජ්ඣානසමාපජ්ජනාදිනා භවිතබ්බංති. උභයථාපි න දොසො. ඉද්ධිවිසයස්ස හි අචින්තෙය්‍යත්තා එකෙනපි අභිඤ්ඤාචිත්තෙන නාමරූපෙ පස්සන්තො නිරූපිතරූපෙනෙව පස්සති. නානානිරූපිතරූපෙ අඤ්ඤෙන අඤ්ඤෙන. පඨමමෙව පාදකජ්ඣානං සමාපජ්ජිත්වා වුට්ඨාය සමාහිතචිත්තෙන කතකම්මස්ස පවත්තත්තා පුන සමාපජ්ජනං විනා ආවජ්ජිත්වා ආවජ්ජිත්වා ආරම්මණං කරොති යෙවාති.

**පුබ්බෙනිවාසානුස්සතිඤාණං.**

(1086.) **දිබ්බචක්ඛුනාති** දිබ්බසදිසත්තා, දිබ්බවිහාරවසෙන පටිලභිතබ්බත්තා, අත්තනා ච දිබ්බවිහාරසන්නිස්සයත්තා මහාජුතිකත්තාදීහි වා දිබ්බං. රූපදස්සනට්ඨෙන චක්ඛුමිවාති චක්ඛු. යථා හි මංසචක්ඛු විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය පවත්තති, ඉදං පන තතො සාතිසයං චක්ඛුකිච්චකාරීති[3]. දිබ්බං

1. M පටිසන්ධිතො. 2. M. අනිරූපිතරූපෙන. 3. M චක්ඛුකිච්චකරණාදීහි

ච තං චක්ඛු චාති දිබ්බචක්ඛු. තෙන දිබ්බචක්ඛුනා **කසිණාරම්මණ**න්ති අට්ඨානම්පි කසිණානං වසෙන කසිණාරම්මණං. **අභිනීහාරක්ඛමං කත්වා**ති චුද්දසවිධෙන චිත්තපරිදමනෙන අඞ්ගසමන්නාගත-කරණෙන[1] අභිනීහාරක්ඛමං, දිබ්බචක්ඛුඤාණාභිමුඛං පෙසනාරහං පෙසනයොග්ගං කත්වා. (1087.) **තෙජො** =පෙ= **කසිණම්පි වා ආසන්නං කාතබ්බ**න්ති පාඨසෙසො. ආසන්නං කාතබ්බන්ති දිබ්බචක්ඛුඤාණුප්පත්තියා සමීපභූතං කාතබ්බං. තත්ථ උපචාරජ්ඣානං පගුණතරං කත්වා තං වඩ්ඪෙත්වා[2] ඉච්ඡිතක්ඛණෙ උපට්ඨානයොග්ගං කත්වා ඨපෙතබ්බන්ති වුත්තං හොති.

(1088.) **එත්ථා**ති ඉමස්මිං දිබ්බචක්ඛුනා රූපදස්සනවිසයෙ. **ඔභාසං පරිදීපිත**න්ති ආලොකකසිණස්සෙව පභාවිස්සජ්ජන-සභාවෙන ආලොකකරණෙන[3] ඉතරෙහි විසිට්ඨත්තා විසිට්ඨන්ති පරිදීපිතං. (1089.) **උප්පාදෙත්වා**ති පඨමජ්ඣානනිද්දෙසෙ වුත්තනයෙන උපචාරජ්ඣානුප්පාදනෙන උප්පාදෙත්වා. උප-චාරජ්ඣානුප්පත්තියා හි සද්ධිං පටිභාගනිමිත්තුප්පත්ති යස්මා පාදකජ්ඣානං විජ්ජමානෙ යෙව ආලොකෙ අප්පනාවසෙන පවත්තිමත්තං විනා අත්තනො බලෙන ආලොකං කාතුං[4] න සක්කොති, නාපි යථාපත්ථිතං ඨාවරං කාතුං. පරිකම්මං පන තදුභයම්පි කාතුං සමත්ථං, තස්මා උපචාරභූමියං යෙව තං වඩ්ඪෙතබ්බන්ති ආහ **උපචාරභූමිය**න්ති ආදිං. උපචාරභූමීති චෙත්ථ ආලොකස්ස ඨාවරකරණවසප්පවත්තං පරිකම්මචිත්තමෙවාති දට්ඨබ්බං. (1090.) **අප්පන**න්ති ඣානවසෙන අප්පනං; න හි අකත පරිකම්මස්ස අභිඤ්ඤාවසෙන අප්පනා ඉජ්ඣති[5]. තෙනාහ **පාදකජ්ඣානනිස්සිත**න්ති. පාදකජ්ඣානාරම්මණං හොති. න දිබ්බචක්ඛුස්ස පරිකම්මනිස්සිතං පරිකම්මාරම්මණං හොති; තථා ච සති ආලොකවඩ්ඪනාභාවතො රූපදස්සනම්පි න සියාති අධිප්පායො.

(1091.) **අන්තොගතං** =පෙ= **භවෙ**ති අන්තොගතමෙව රූපගතං පස්සිතබ්බං භවෙය්‍ය, බහිද්ධා විකොපුප්පත්තිහෙතුභාවතො. **පස්සිතබ්බං** දිබ්බචක්ඛුනාති අධිප්පායො. න හි ආලොකෙ ඵරිතෙපි මංසචක්ඛුස්ස ආපාථං හොති. (1092.) **පරිකම්මස්ස වාරොපි අතික්කමතී**ති ඉධ පරිකම්මං නාම යථාවුත්තකසිණා-රම්මණං උපචාරජ්ඣානං. තං රූපගතං පස්සතො නප්පවත්තති, කසිණාලොකවසෙනෙව රූපගතදස්සනං; කසිණාලොකො ච පරිකම්මවසෙනාති තදුභයම්පි පරිකම්මස්ස අප්පවත්තියා න හොති; තෙනාහ: **ආලොකොපී**ති ආදිං. (1093.) **තස්මිං**

1. M. අඞ්ගසම්පන්නතාකරණෙන 2. M. වඩ්ඪෙත්වා 3. M. ආලොකකරණෙ. 4. M ඵරිතුං. 5. M සිජ්ඣති

**අනන්තරහිතෙ රූපගතම්පි ච න දිස්සති,** රූපගතං පස්සතො පරිකම්මස්ස වාරො අතික්කමති. පරිකම්මපසුතස්ස **කසිණා-රම්මණං** ඣානං හොතීති රූපගතං න දිස්සති. කථම්පන පටිපජ්ජිතබ්බන්ති ආහ **තෙනාපීති** ආදිං. (1094) **එවං අනුක්කමෙනෙවා**ති පුනප්පුනං පාදකජ්ඣානං සමාපජ්ජිත්වා තතො වුට්ඨාය අභිණ්හං ආලොකඵරණෙන. **ආලොකො ථාමවා සියා**ති ආලොකගතො චිරට්ඨායී සියා තථා ච සති තත්ථ සුචිරම්පි රූපගතං පස්සති. තෙන වුත්තං (1095.) **ආලොකො එත්ථා**ති ආදිං

සචායමත්ථො තිණුක්කූපමාය විභාවෙතබ්බොති දස්සෙන්තො ආහ (1096.) **තිණුක්කායා**ති ආදිං. එකො කිර රත්තියං තිණුක්කාය මග්ගං පටිපජ්ජි; තස්ස සා තිණුක්කා විජ්ඣායි. අථස්ස සමවිසමානි න පඤ්ඤායිංසු. සො තං තිණුක්කං භූමියං ඝංසෙත්වා පුන උජ්ජාලෙසි. සා පජ්ජලිත්වා පුරිමාලොකතො මහන්තතරමාලොකං අකාසි. එවං පුනප්පුනං විජ්ඣාතං විජ්ඣාතං උජ්ජාලයතො කමෙන සූරියො උට්ඨාසි. සූරියෙ උග්ගතෙ තිණුක්කාය කම්මං නත්ථීති තං ඡඩ්ඩෙත්වා දිවසම්පි අගමාසි. තත්ථ උක්කාලොකො විය පරිකම්මකාලෙ කසිණාලොකො; උක්කාය විජ්ඣාතාය සමවිසමානං අදස්සනං විය රූපගතං පස්සතො පරිකම්මස්ස වාරාතික්කමෙන ආලොකෙ අන්තරහිතෙ රූපගතානං අදස්සනං. උක්කාය ඝංසනං විය පුනප්පුනං පාදකජ්ඣානසමාපජ්ජනං. උක්කාය පුරිමාලොකතො මහන්ත-තරාලොකකරණං විය පුන පරිකම්මං කරොතො බලවතරා-ලොකඵරණං. සූරියුට්ඨානං විය ථාමගතාලොකස්ස යථා වඩ්ඪිතපරිච්ඡෙදං ඵරිත්වා අවට්ඨානං. තිණුක්කං ඡඩ්ඩෙත්වා දිවසම්පි ගමනං විය පරිත්තාලොකං[1] ඡඩ්ඩෙත්වා ථාමගතා-ලොකෙන දිවසම්පි රූපදස්සනං.

එත්තාවතා දිබ්බචක්ඛුස්ස නානාවජ්ජනපරිකම්මං චෙව දිබ්බචක්ඛුඤාණං ච දස්සිතං, න තස්ස උප්පත්තික්කමොති තං දස්සෙතුං (1097.) **උප්පාදක්කමොපී**ති ආදි වුත්තං. තං හෙට්ඨා වුත්තනයත්තා සුවිඤ්ඤෙය්‍යමෙව. **තානි චත්තාරි පඤ්ච වා**ති පොත්ථකෙසු ලිඛන්ති. "තීණි චත්තාරි වා"ති පාඨො. තත්ථ (1100) **අත්ථසාධකචිත්තන්ති** යදත්ථායෙස පටිපන්නො තස්ස අත්ථස්ස[2] සාධනතො අත්ථසාධකභූතං චිත්තං. තස්මිං **හි** උප්පන්නෙ මංසචක්ඛුස්ස අනාපාථගොචරං අන්තොකුච්ඡිගතං,

---

1. M පදිත්තාලොකං. 2. M. තදත්ථ

හදයවත්ථුනිස්සිතං, හෙට්ඨාපථවීතලනිස්සිතං, තිරොකුඩ්ඩ-පබ්බත-පාකාරගතං, පරචක්කවාළගතං ති ඉදං රූපං ආපාථං ආගච්ඡති; මංසචක්ඛුනා දිස්සමානං විය හොති. තදෙවෙත්ථ රූපං සරූපතො විභාවනසමත්ථං චක්ඛුවිඤ්ඤාණං විය; න පන ආවජ්ජනපරිකම්ම-වසෙන පවත්තානි පුබ්බභාගචිත්තානි. තානි හි ආරම්මණං කරොන්තානිපි න යථාවතො තං විභාවෙත්වා පවත්තන්ති, ආවජ්ජන-සම්පටිච්ඡනාදි-චිත්තානි වියාති.

නනු ච අනාගතංසඤ්ඤාණං යථාකම්මූපගඤ්ඤාණං ති ද්වෙ අභිඤ්ඤඤ්ඤාණානි අත්ථි, කස්මා තානි ඉධ න දස්සිතානීති? ආහ (1101.) **අනාගතංසඤ්ඤාණස්සා** ති ආදිං. **ඉජ්ඣන්ති දිබ්බ-චක්ඛුනා** ති විසුං පරිකම්මස්ස අභාවතො දිබ්බචක්ඛුඤ්ඤාණ-පටිලාභෙනෙව තස්ස පරිවාරානි හුත්වා පටිලබ්භානි හොන්ති; තතො යෙව හි තානි තස්ස පරිභණ්ඩඤ්ඤාණානීති වුච්චන්ති. යථා හි සිනෙරුස්ස පරිවාරට්ඨානීයානි තං-සිද්ධියා සිද්ධානි මෙඛලා-ට්ඨානානි පරිභණ්ඩානීති වුච්චන්ති, එවං ඉමානිපි දිබ්බචක්ඛුසිද්ධියා සිද්ධානි තස්ස පරිභණ්ඩානීති වෙදිතබ්බානි. හොතු තාව; චුතූපපාතඤ්ඤාණං පන කිං න දස්සිතන්ති ආහ (1102.) **චුතූපපාත-ඤ්ඤාණම්පී** ති ආදිං. දිබ්බචක්ඛුඤ්ඤාණමෙව හි චුතියං උප්පත්තියං ච රූපං විභාවෙන්තං චුතූපපාතෙ පවත්තත්තා චුතූපපාතඤ්ඤාණං ති වුච්චති, අවසෙසරූපවිභාවනකාලෙ දිබ්බචක්ඛූති වුච්චති. තස්මා පරමත්ථතො නාමද්වයෙන ආහතං[1] තං එකමෙව ඤාණං; දිබ්බචක්ඛුඤ්ඤාණං චුතූපපාතඤ්ඤාණන්ති පන ව්‍යඤ්ජනෙ යෙව නානත්තන්ති. කත්ථචි මනොමයඤ්ඤාණන්තිපි විසුං අභිඤ්ඤඤ්ඤාණං ආගතං, තං අත්ථතො ඉද්ධිවිධඤ්ඤාණමෙව.

**දිබ්බචක්ඛුඤ්ඤාණං.**

(1103.) ඉධාති ඉමස්මිං සාසනෙ. **අනෙන තරෙනා** ති අනෙන අභිධම්මාවතාරනාමකෙන තරෙන.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර-සංවණ්ණනාය සොළසමපරිච්ඡෙද-වණ්ණනා නිට්ඨිතා.**

1. M. ආගතං.

# සත්තරසමපරිච්ඡෙදවණ්ණනා.

## අභිඤ්ඤාරම්මණනිද්දෙසො.

(1104.) **පඤ්ච ඉද්ධිවිධාදීනී** ති

"ඉද්ධිවිධං දිබ්බසොතං, පරචිත්තවිජානනා,
පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛූති පඤ්චිමා"

ති එවමාගතා පඤ්ච. **සත්තාභිඤ්ඤා ඉමා මතා** ති අතීතංසඤාණස්ස පුබ්බෙනිවාසානුස්සතිඤාණෙ මනොමයඤාණස්ස ච ඉද්ධිවිධඤාණෙ අන්තොගධත්තා වුත්තං. අතීතංසඤාණං නාම පරෙසං පච්චුප්පන්නභවෙ යාව පටිසන්ධිපරියොසානං පවත්තචිත්තාලම්බණඤාණං. මනොමයඤාණම්පි මනොමයකායාභිනිම්මාණාදිවසප්පවත්තං ඉද්ධිවිධඤාණං. ඉදානි ඉමෙසං අභිඤ්ඤාඤාණානං ආරම්මණවිනිච්ඡයෙ අසම්මොහත්ථං තං දස්සෙතුමාරභන්තො ආහ (1105) **සත්තානන්තං** ති ආදිං.

(1106.) **චත්තාරො ආරම්මණත්තිකා** ති පරිත්තාරම්මණත්තිකො මහග්ගතාරම්මණත්තිකො අතීතාරම්මණත්තිකො අජ්ඣත්තාරම්මණත්තිකොති ඉමෙ චත්තාරො ආරම්මණත්තිකා. **එත්ථා** ති ඉදං පච්චාමසනං කිං තිකානං, උදාහු ආරම්මණානං ති? කිං චෙත්ථ යදි තිකානං, තදයුත්තං. න හි තිකෙසු අභිඤ්ඤාඤාණානි පවත්තන්ති. අථ ආරම්මණානං, තම්පි අයුත්තං; න හි අඤ්ඤං උද්දිසිත්වා අඤ්ඤස්ස පච්චාමසනං යුත්තං ති. යථා ඉච්ඡසි, තථා හොතු. භවතු තාව තිකානං; නනු වුත්තං "තිකෙසු අභිඤ්ඤාඤාණානි නප්පවත්තන්තී"ති? නායං විරොධො. තිකවොහාරෙන ආරම්මණානං යෙව ගහිතත්තා. අථ වා පන හොතු ආරම්මණානං, නනු වුත්තං "අඤ්ඤං උද්දිසිත්වා අඤ්ඤස්ස පච්චාමසනං අයුත්තං" ති? අයම්පි න දොසො යථාවුත්තකාරණෙනෙව ති. පරිත්තාදිසු සත්තසු අසතිපි වත්ථුභෙදෙ[1] භූමි - කාල - සන්තානභෙදවසෙන භින්නෙසු පරිත්ත - මහග්ගත - අතීතානාගත - පච්චුප්පන්න - අජ්ඣත්ත - බහිද්ධාරම්මණවසෙන සත්තසු පරිත්තාදි ආරම්මණවිභාගෙසු. ඉද්ධිවිධඤාණස්ස මහග්ගතාරම්මණතාය අභාවතො ඉධ මහග්ගතාරම්මණත්තිකො න ලබ්භති.

(1108.) **කායං චිත්තසන්නිස්සිතං කත්වා අදිස්සමානෙන කායෙන ගන්තුකාමො** ති සම්බන්ධො. චිත්තසන්නිස්සිතකරණෙ ච තං විය කායස්ස[2] අදිස්සමානසීඝගතිකතාවසෙන තංගතිකතාපාදනං. යථා චිත්තං න දිස්සති සීඝගාමිතං ච, එවං කායම්පි අදිස්සමානං සීඝගමනං ච කත්වා යථිච්ඡිතට්ඨානං ගන්තුකාමො ති

1. M අත්ථභෙදෙ 2. M. කායං.

අයං හෙත්ථ අත්ථො. **චිත්තවසෙනා** ති මහග්ගතචිත්තවසෙන **පරිණාමෙතී** ති පාඨසෙසො. තෙනාහ (1109.) **මහග්ගතෙ ච චිත්තස්මිං සමාරොපෙතී** ති පාදකජ්ඣානං හි සමාපජ්ජිත්වා වුට්ඨාය "අයං කායො ඉදං චිත්තං විය අදිස්සමානො සීඝගමනො ච හොතූ"ති පරිකම්මං කරොති. පරිකම්මං පන කත්වා පුන සමාපජ්ජිත්වා වුට්ඨාය තථෙව පරිකම්මං කරොන්තො කායං ගහෙත්වා මහග්ගතෙ පාදකජ්ඣානචිත්තෙන සමාරොපෙති, තග්ගතිකං කරොති, තං විය අදිස්සමානං සීඝගමනං ච කරොති. තං පන සීඝගමනං[1] ආභාවිතිද්ධිපාදූනං විය දන්ධං අවත්තිත්වා කතිපයචිත්තවාරෙහෙව ඉච්ඡිතට්ඨානප්පත්තිවසෙන දට්ඨබ්බං; න එකචිත්තක්ඛණෙනෙව. "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ලහුපරිවත්තං යථයිදං භික්ඛවෙ චිත්තං"**ති** හි එත්ථ අඤ්ඤග්ගහණෙන රූපධම්මානං ගහිතත්තා චිත්තක්ඛණවසෙන රූපප්පවත්ති න යුත්තා. යත්ථ යත්ථ තෙ ධම්මා උප්පජ්ජන්ති තත්ථ තත්ථෙව භිජ්ජන්ති, න ච ඉද්ධිබලෙන ධම්මානං කෙනචි ලක්ඛණඤ්ඤථත්තං සක්කා කාතුන්ති.

චිත්තවසෙන රූපකායං පාදකජ්ඣානෙ සමාරොපෙන්තස්ස කායමෙව ආලම්බනන්ති ආහ **කායාරම්මණතො** ති. කායෙ වණ්ණාරම්මණතොති වුත්තං හොති. (1110.) **කායසන්නිස්සිතං කත්වා චිත්තං** ති එත්ථ න චිත්තං කායං විය දන්ධං දිස්සමානං කරොති, කින්තු දන්ධ-දිස්සමානගතිකරණමත්තමෙවා ති දට්ඨබ්බං. (1112.) **අනාගතමතීතං ච කරොති විසයං යදා** ති මහාධාතුනිධානෙ මහාකස්සපත්ථෙරාදීන විය අනාගතං අධිට්ඨහන්තානං අනාගතං ආරම්මණං කරොති. කායවසෙන චිත්තපරිණාමනකාලෙ තදෙව චිරනිරුද්ධං පාදකජ්ඣානමාරම්මණං කරොන්තානං අතීතං ආරම්මණං කරොති, තදා අතීතාරම්මණං අනාගතගොචරං ච හොති. **පච්චුප්පන්නො ගොචරො** පච්චුප්පන්නස්ස රූපකායස්ස ආරම්මණකරණතො. හත්ථි - ආදයො අභිනිම්මිණන්තස්ස[2] පි හි කිඤ්චාපි පරිකම්මං අනාගතාරම්මණං හොති, අධිට්ඨානචිත්තං පන පච්චුප්පන්නාරම්මණමෙව, උපචාරාරම්මණං විය පටිභාගනිමිත්තං, තෙන සහ පාතුභූතමෙව තස්සාරම්මණං හොති.

(1114.) **කායං චිත්තවසෙනා පි =පෙ= සියා** ති අත්තනො කායං චිත්තවසෙන පරිණාමනකාලෙ අජ්ඣත්තස්ස කායස්ස ආරම්මණකරණතො, අත්තනො චිත්තං කායවසෙන පරිණාමනකාලෙ චිත්තස්ස ආරම්මණකරණතො, වාසද්දෙන අවුත්තසමුච්චයත්ථෙන ගහිතෙ අත්තනො කුමාරවණ්ණාදි-අභිනිම්මානකාලෙ

1. M. සීඝගමනත්ථං.

කායස්ස ආරම්මණකරණතො ච අජ්ඣත්තාරම්මණං සියා (1115.) **බහිද්ධා රූපදස්සනෙ**ති බහිද්ධා හත්ථිඅස්සාදිරූපදස්සනකාලෙ. (1116) **පච්චුප්පන්නෙන පරිත්තෙන චා**ති සරූපවිභාවනමෙතං. දිබ්බසොතස්ස හි පච්චුප්පන්නො සද්දො ආරම්මණං හොති, සො ච සභාවතො පරිත්තොව. (1118) **කුච්ඡිසද්දස්සා**ති කුච්ඡියං වාතසද්දස්ස; තත්ථ පාණකසද්දස්ස පන සවණෙ[1] බහිද්ධාරම්මණමෙව, වසිතාප්පත්තස්ස අත්තනො විතක්කවිප්ඵාරසද්දසවණෙපි අජ්ඣත්තාරම්මණන්ති වදන්ති තං පන එකාදසභවඞ්ගචිත්තතො උපරි භවඞ්ගං පවත්තිතුං අදත්වා භවඞ්ගතො වුට්ඨාය ආවජ්ජනසමත්ථතාවසෙන වසිතාප්පත්තස්සෙව යුජ්ජති. **පරස්ස ච සද්දස්සා**ති සම්බන්ධිතබ්බං; න හි පරස්ස කුච්ඡිසද්දසවණෙ යෙව බහිද්ධාරම්මණං හොති. අථ ඛො පරස්ස චිත්තසමුට්ඨානසද්දසවණෙපීති.

(1119.) **පරිත්තාදීසූ**ති පරිත්ත-මහග්ගත-අප්පමාණ-මග්ග-අතීතානාගත-පච්චුප්පන්න-බහිද්ධාරම්මණෙසු **පරිත්තානන්ති.** කාමාවචරචිත්තානං. **මජ්ඣිමානන්ති** පරිත්තඅප්පමාණානං මජ්ඣෙ භවත්තා මජ්ඣිමසඞ්ඛාතානං රූපාවචරචිත්තානං. මජ්ඣෙ භවතත්තං ච දෙසනාවසෙන, න සභාවවසෙන. “චෙතොපරියඤාණං පරස්ස චිත්තමෙව ජානාති, අවසෙසඛන්ධත්තයං පන න ජානාතී”ති ඉමං මහාඅට්ඨකථාපාඨං සන්ධායාහ: (1121) **ජානනෙ පනා**ති ආදිං. අයං හෙත්ථ අධිප්පායො: යස්මා චෙතොපරියඤාණං චිත්තමෙව ජානාති, තස්මා තං මග්ගාරම්මණං න හොති. මග්ගසම්පයුත්තචිත්තපජානනතො පන පරියායෙන මග්ගාරම්මණතා අට්ඨකථායං අනුඤ්ඤාතාති. පට්ඨානෙ පන ‘කුසලා ඛන්ධා ඉද්ධිවිධඤාණස්ස, චෙතොපරියඤාණස්ස, පුබ්බෙනිවාසානුස්සතිඤාණස්ස, යථාකම්මූපගඤාණස්ස, අනාගතංසඤාණස්ස, ආරම්මණ පච්චයෙන පච්චයො”ති වුත්තත්තා චත්තාරොපි ඛන්ධා චෙතොපරියඤාණස්ස ආරම්මණං හොන්ති. තස්මා නිප්පරියායෙනෙව මග්ගාරම්මණතා ලබ්භතීති ඉදමෙත්ථ සංගහකාරානං සන්නිට්ඨානං.

අතීතෙ සත්තදිවසබ්භන්තරෙ අනාගතෙ සත්තදිවසබ්භන්තරෙ යෙව ච පවත්තං පරචිත්තං චෙතොපරියඤාණං ජානාති. තතො පට්ඨාය පන පටිසන්ධිපරියොසානං චුතිපරියොසානං ච පවත්තං අතීතංසඤාණස්ස අනාගතංසඤාණස්ස ච ගොචරන්ති අධිප්පායෙනාහ (1123.) **අතීතෙති** ආදිං. අතීතස්ස අනාගතස්ස ච

1. M. සවණවසෙන. 2. M. මහාඅට්ඨකථාවාදං.

පරිත්තස්ස ජානනං සම්භවති, පච්චුප්පන්නස්ස පන න සම්භවතීති පුච්ඡති (1125.) **කථං ච පනා**ති ආදිං. ඉතරො යත්ථ සම්භවති තං දස්සෙතුං පච්චුප්පන්නං තාව විභජිත්වා දස්සෙන්තො **පච්චුප්පන්නං තිධා** වුත්තන්ති ආදිමාහ. **ඛණ-සන්තති-අද්ධතොති** ඛණපච්චුප්පන්නං සන්තතිපච්චුප්පන්නං අද්ධා-පච්චුප්පන්නන්ති එවං ඛණ-සන්තති-අද්ධාවසෙන වුත්තං.

(1126.) **තික්ඛණසම්පත්තන්ති** උප්පාදට්ඨිතිභඞ්ගවසෙන ඛණත්තයපරියාපන්නං. **පච්චුප්පන්නං ඛණාදිකන්ති** ඛණසද්දාදිකං පච්චුප්පන්නං, ඛණපච්චුප්පන්නන්ති වුත්තං හොති. **එකද්වෙ-සන්තතිවාරපරියාපන්නන්ති** එත්ථ අන්ධකාරෙ නිසීදිත්වා ආලොකට්ඨානං ගතස්ස න තාව ආරම්මණං පාකටං හොති; යාව පන තං පාකටං හොති, එත්ථන්තරෙ පවත්තා රූපසන්තති අරූපසන්තති වා එකද්වෙසන්තතිවාරාති වෙදිතබ්බා. ආලොක-ට්ඨානෙ විචරිත්වා ඔවරකං පවිසස්සාපි න තාව සහසා රූපං පාකටං හොති, යාව තං පාකටං හොති පුබ්බෙ තත්ථ නිසින්නස්ස විය, එත්ථන්තරෙ එකද්වෙ සන්තතිවාරා වෙදිතබ්බා. දූරෙ ඨත්වා පන රජකාදීනං හත්ථවිකාරං, ගණ්ඩි-භෙරිආදි ආකොටන-හත්ථවිකාරං ච දිස්වාපි න තාව සද්දං සුණාති, යාව පන තං සද්දං සුණාති එත්ථන්තරෙ එකද්වෙ සන්තතිවාරා වෙදිතබ්බාති එවං තාව **මජ්ඣිමභාණකත්ථෙරා** වදන්ති. **සංයුත්තභාණකා** පන රූපසන්තති අරූපසන්තතීති ද්වෙ සන්තතියො වත්වා උදකං අක්කමිත්වා ගතස්ස යාව තීරෙ අක්කන්ත-උදකලෙඛා න විප්පසීදති, අද්ධානතො ආගතස්ස යාව කායෙ උසුමභාවො න වූපසම්මති, ආතපා ආගන්ත්වා ගබ්භං පවිසස්ස යාව අන්ධකාරභාවො න විගච්ඡති, අන්තොගබ්භෙ කම්මට්ඨානං මනසිකරිත්වා දිවා වාතපානං විවරිත්වා ඔලොකෙන්තස්ස යාව අක්ඛීනං ඵන්දනභාවො න වූපසම්මති, අයං රූපසන්තති නාම. ද්වෙ තයො ජවනවාරා අරූපසන්තති නාමාති වත්වා තදුභයම්පි සන්තති-පච්චුප්පන්නං[1] නාමාති එවං එකමෙව සන්තතිවාරං වදන්ති. තත්ථ මජ්ඣිමභාණකවාදෙ එකච්චස්ස[2] සීඝම්පි[2] පාකටං හොතීති එකද්වෙසන්තතිවාරාති එකගහණම්පි කතං.

**ආචරියධම්මපාලත්ථෙරො** පන "අතිපරිත්තසභාවා[3] උතු-ආදිසමුට්ඨානා[3]වා එකද්වෙ සන්තතිවාරා වෙදිතබ්බා"ති ආහ. (1126) **එකභවපරිච්ඡින්නන්ති** එකස්මිං භවෙ පටිසන්ධිචුතිවසෙන පරිච්ඡින්නං, එකභවපරියාපන්නධම්මජාතං; යං සන්ධාය වුත්තං

1 M. පච්චුප්පන්නං 2. M. එකපච්චයසීඝම්පි. (දුප්පාඨො) 3. M. අතිපරිත්ත සභාවඋතුආදි—

"යො චාවුසො මනො, යෙ ච ධම්මා, උභයමෙතං පච්චුප්පන්නං, තස්මිං පච්චුප්පන්නෙ ඡන්දරාගපටිබද්ධං හොතී"ති ආදිං. සන්තතිපච්චුප්පන්නං චෙත්ථ අභිධම්මට්ඨකථාසු ආගතං, අද්ධාපච්චුප්පන්නං සුත්තෙ.

(1128.) **කෙචී**ති "අභයගිරිවාසිනො." (1129.) **යථා චා**ති ආදි **තත්ථ** තෙසං ඔපම්මදස්සනං. එකං පුප්ඵං අනන්තතො වණ්ටෙන එකස්ස වණ්ටං ඡිජ්ජතීති සම්බන්ධො. (1130.) **මහාජනස්සපි** =පෙ= **විජ්ඣතී**ති අතීතචිත්තං, අනාගතචිත්තං, ඉමස්ස චිත්තං, අමුකස්ස චිත්තන්ති එවං විභාගං අකත්වා "පරස්ස චිත්තං ජානාමී"ච්චෙව රාසිවසෙන මහාජනස්ස චිත්තෙ ආවජ්ජිතෙ එකස්ස චිත්තං එකෙන චිත්තෙන උප්පාදක්ඛණෙ වා ඨිතික්ඛණෙ වා භඞ්ගක්ඛණෙ වා එකන්තෙන පටිවිජ්ඣතීති අත්ථො. තං පන තෙසං වචනං අයුත්තන්ති දස්සෙතුං (1131.) **යෙනාවජ්ජතී**ති ආදි වුත්තං. වස්සසහස්සම්පි හි එවං ආවජ්ජයතො ආවජ්ජන-ජවනානං එකස්මිං ආරම්මණෙ ඨානං නත්ථි. අභිඤ්ඤාචිත්තං ච සචෙ ඛණපච්චුප්පන්නං ජානාති ආවජ්ජනෙන සහ එකාරම්මණෙ වත්තමානමෙව ජානාති, නො අඤ්ඤථා. තස්මා තෙසං ආවජ්ජනජවනානං ද්වින්නං සහ එකස්මිං ආරම්මණෙ අවට්ඨානාභාවතො තං න යුජ්ජති. භවතු තාව, කො එත්ථ දොසොති චෙති ආහ (1132.) **ජවනාවජ්ජනාන**න්ති ආදිං.

තත්ථ මග්ගඵලවීථිතො අඤ්ඤං අනිට්ඨං, මග්ගඵලවීථියම්පි ආවජ්ජනාදීනං සඞ්ඛාරාලම්බණත්තා, ගොත්‍රභූආදීනං ච නිබ්බාණාරම්මණත්තා නානාලම්බණතා ඉට්ඨා, අඤ්ඤත්‍ර පන අනිට්ඨා. තස්මා අනිට්ඨෙ ඨානෙ ජවනාවජ්ජනානං නානාරම්මණතාපත්තිදොසො අයුත්තොති තං තෙසං වචනං **අයුත්තන්ති පකාසිතං,** අට්ඨකථාසූති අධිප්පායො. යදි එවං කථං චෙතොපරියඤාණං පච්චුප්පන්නාරම්මණං හොතීති ආහ (1133.) **තස්මා**ති ආදිං යස්මා එවං අයුත්තන්ති පකාසිතං තස්මා. (1134.) **ජවනවාරතො**ති එකජවනවාරවසෙන. ඉදං පන ඛණපච්චුප්පන්නානන්තරං ලහුකං කත්වා පච්චුප්පන්නදස්සනත්ථං වුත්තං. තං වත්තමානජවනවීථිතො අතීතානාගතවසෙන ද්වත්තිජවනවීථිපරිමාණකාලෙ පවත්තං පරචිත්තං තං සබ්බම්පි සන්තතිපච්චුප්පන්නං නාමාති අට්ඨකථායං වුත්තං. තස්මා **ජවනවාරතො**ති ද්වත්තිජවනවාරවසෙන දීපෙතබ්බං, තං කාලෙන පච්චුප්පන්නන්ති වුත්තාති අධිප්පායො.

(1134.) **නිද්දිඨං** සංයුත්තඨකථායං. **තත්‍රායං දීපනානයොති** ආදි ජවනවාරස්ස අඩ්ඪපච්චුප්පන්නදීපනමුඛෙන ඉඩ්ඪිචිත්තස්ස පවත්තිආකාරදීපනං. සන්තතිපච්චුප්පන්නම්පි අඩ්ඪපච්චුප්පන්නෙන-නෙව සංගහෙත්වා ආහ (1139.) **අඩ්ඪාවසා** =පෙ= **පනාති. ආනන්දාචරියො** පනෙත්ථ අභිධම්මමාතිකාය ආගතස්ස පච්චුප්පන්නපදස්ස අඩ්ඪාසන්තතිපච්චුප්පන්නපදත්ථතා න කත්ථචි පාළියං වුත්තා, තස්මා චිත්තසාමඤ්ඤෙන චිත්තං ආවජ්ජයමානං අභිමුඛීභූතං විජ්ජමානචිත්තං ආවජ්ජෙති. පරිකම්මානි ච තං තං විජ්ජමානචිත්තං චිත්තසාමඤ්ඤෙනෙව ආරම්මණං කත්වා චිත්තජානන-පරිකම්මානි හුත්වා පවත්තන්ති. චෙතොපරියඤාණං පන විජ්ජමානං චිත්තං පටිවිජ්ඣන්තං තෙන සහ එකක්ඛණෙ යෙව උප්පජ්ජති. තත්ථ යස්මා සන්තානතගහණතො එකාවත්ථා-වසෙන[1] ආවජ්ජනාදීනි චිත්තනෙනව පවත්තානි, තං ච චිත්තමෙව යං චෙතොපරියඤාණෙන විභාවිතං, තස්මා සමානාකාරප්පවත්ති-තො න අනිට්ඨෙ ඨානෙ නානාරම්මණතා හොතීති ඛණපච්චුප්පන්නවසෙන ඉමස්ස පච්චුප්පන්නාරම්මණං ඉච්ඡති.

(1140.) **ඉතරානීති** ආවජ්ජන-පරිකම්මචිත්තානි. (1141.) චක්ඛුද්වාරෙ විඤ්ඤාණන්ති චක්ඛුවිඤ්ඤාණං. (1142.) **අඪ්ඨසූති**[2] චෙතොපරියඤාණස්ස වුත්තෙසු පච්චුප්පන්නාරම්මණං හිත්වා තවත්තබ්බාරම්මණං පක්ඛිපිත්වා අට්ඨසු පරිත්තාදිසු. (1146.) **අතීතෙ** =පෙ= **ඵලම්පි වාති** එත්ථ අත්තනාති නිදස්සනමත්තං; පරෙනපි හි භාවිතමග්ගං සච්ඡිකතඵලං ච පුබ්බෙනිවාසානුස්සති-ඤාණෙන සමනුස්සරති. වාසද්දෙන වා අවුත්තසමුච්චයත්ථෙන අත්තනා භාවිතං මග්ගං ඵලම්පි වා පරෙහි භාවිතං මග්ගං ඵලම්පි වාති එවමත්ථො ගහෙතබ්බො තථා ච වුත්තං අට්ඨකථායං: "අත්තනො පරෙහි භාවිතමග්ගං සච්ඡිකතඵලං ච අනුස්සරණ කාලෙ" ති. එවකාරො පන පදපූරණමත්තමෙව. ඵලම්පි වාති එත්ථ භාවිතන්ති න සම්බන්ධිතබ්බං, න හි ඵලං භාවෙතබ්බං හොති, අථ ඛො සච්ඡිකාතබ්බමෙවාති. (1147.) **සමනුස්සරතො මග්ගන්ති** එත්ථාපි අත්තනා පරෙහි වා භාවිතන්ති සම්බන්ධිතබ්බං. **එකන්තතොති** නියමතො.

තනු චෙතොපරියඤාණ - යථාකම්මූපගඤාණා නි පි අතීතාරම්මණානෙව, කිං පන තෙසං ඉමස්ස ච ආරම්මණෙ නානාකරණන්ති ආහ (1148) **චෙතොපරියඤාණම්පීති** ආදිං, කිඤ්චාපීති අයං නිපාතසමුදායො, එකො වා නිපාතො,

1. M. එකත්ථවසෙන 2. M. පරිත්තාදිසු අඪ්ඨසු

විසෙසානභිධානනිමිත්තෙන උපගමනෙ දට්ඨබ්බො. **අථ ඛො** ති විසෙසාභිධානසමාරම්භො.[1] (1149)**චිත්තමෙවා**ති ඉදං පුබ්බෙ විචාරිත මෙව. **අතීතෙ චෙතනාමත්ත**න්ති ඉදං පුබ්බෙ විය මහාඅට්ඨකථාවාදං සන්ධායෙව වුත්තං, තත්ථ හි යථාකම්මූපගඤාණස්ස චෙතනාමත්තමෙව ආරම්මණං හොති, න චිත්තං, නාපි ඉතරෙ ධම්මා. යතො තං යථාකම්මූපග'න්ති වුච්චතීති ඉමිනා අධිප්පායෙන යථාකම්මූපගඤාණං **අතීතචෙතනාමත්ත**මෙව ආරම්මණං කරොතී ති වුත්තං. හෙට්ඨා දස්සිතපාළිවසෙන සබ්බෙපි චත්තාරො ඛන්ධා යථාකම්මූපගඤාණස්ස ආරම්මණ'න්ති සංගහකාරානං සන්නිට්ඨානං. (1150) **නත්ථි කිඤ්චි අගොචර**න්ති කිඤ්චි ඛන්ධං වා ඛන්ධපටිබද්ධනාමගොත්තාදි වා අගොචරං නාම නත්ථි. තං හි අතීතඛන්ධපටිබද්ධෙසු ධම්මෙසු සබ්බඤ්ඤුතඤාණසමානගතික-මෙවාති අධිප්පායො.

(1151)**අත්තඛන්ධානුස්සරණෙ**ති අත්තනො ඛන්ධානුස්සරණකාලෙ (1152) **සරණෙ නාමගොත්තස්ස=පෙ=ගොචර**න්ති අතීතෙ විපස්සී භගවා අහොසි; තස්ස මාතා බන්ධුමතී, පිතා බන්ධුමාති ආදිනා නයෙන නාමගොත්තාදිං පඨවීනිමිත්තාදිං ච අනුස්සරතො නවත්තබ්බාරම්මණං හොති. නවත්තබ්බගොචරං ති හි පරිත්තාරම්මණ-අතීතාරම්මණත්තිකවසෙන වුත්තං. අජ්ඣත්තාරම්මණත්තිකවසෙන පන ආකිඤ්චඤ්ඤායතනජ්ඣානස්ස ආරම්මණ-භූතධම්මාලම්බනකාලෙ නවත්තබ්බාරම්මණං හොති.

එවං හි සා සබ්බාකාරෙන පිරතරා සිඛාප්පත්තා හොති.[2] අවසෙසපඤ්ඤත්තාරම්මණකාලෙ බහිද්ධාරම්මණං හොතීති. **නාමගොත්ත**න්ති චෙත්ථ බන්ධූපනිබද්ධො[3] සම්මුතිසිද්ධො[4] බ්‍යඤ්ජනත්ථො. බ්‍යඤ්ජනං හි සද්දායතනසංගහිතත්තා පරිත්තං හොති. යථාහ "නිරුත්තිපටිසම්භිදා පරිත්තාරම්මණා"ති.

(1154) **දිබ්බසොතඤාණ**න්ති යස්මා පච්චුප්පන්නං පරිත්තං ච රූපං ආරම්මණං කරොති, තස්මා පච්චුප්පන්නාරම්මණං පරිත්තා-රම්මණං ච හොති. අත්තනො කුච්ඡිගතරූපදස්සනෙ පරස්ස හදයනිස්සිතලොහිතදස්සනාදීසු ච අජ්ඣත්තාරම්මණං බහිද්ධා-රම්මණං ච හොතීති. (1155) **පරිත්තාදීසු අට්ඨසූ**ති පුබ්බෙ-නිවාසානුස්සතිඤාණස්ස වුත්තෙසු අතීතාරම්මණං වජ්ජෙත්වා අනාගතාරම්මණං පක්ඛිපිත්වා අට්ඨසු. (1156) **නිබ්බත්තිස්සන්තං** =පෙ= **පජානතො**ති ඉමිනා නිබ්බත්තක්ඛන්ධජානනමාහ. (1161)

1. M.- සමාරම්භෙ 2. M. පොත්ථකෙ නත්ථි. 3 M. ඛන්ධපටිබද්ධො. 4 M. සම්මුතිසද්දො

**අනාගතංසඤ්ඤාණස්ස අනාගතංව ගොචරං**ති තම්පි අනාගතක්ඛන්ධ පටිබද්ධෙසු ධම්මෙසු සබ්බඤ්ඤුතඤ්ඤාණසමානගතිකමෙව. (1163.) **ජානනෙ නාමගොත්තස්සා**ති අනාගතෙ මෙත්තෙය්‍යො නාම සම්බුද්ධො උප්පජ්ජිස්සති, තස්ස සුබ්‍රහ්මා නාම පිතා භවිස්සති, බ්‍රහ්මවතී නාම මාතාති ආදිනා නයෙන නාමගොත්තාදි-ජානනකාලෙ. (1164) **පරිත්තාදීසු පඤ්චසූ**ති පරිත්ත-මහග්ගත-අතීත- අජ්ඣත්ත - බහිද්ධාරම්මණවසෙන පඤ්චසු. (1165.) **කාමකම්මස්සා**ති කාමාවචරකම්මස්ස

(1169.) **විවිධත්ථවණ්ණපද**න්ති නානප්පකාර-අත්ථපදෙහි ව්‍යඤ්ජනපදෙහි ච සම්පන්නං **මධුරත්ථමතිනීහරං**[1]ති මධුරත්ථං අතිනීහරං වෙති පදච්ඡෙදො.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම**
**අභිධම්මාවතාරසංවණ්ණනාය සත්තරසමපරිච්ඡෙද**
**වණ්ණනා නිට්ඨිතා.**

---

1. මූලගන්ථෙ "මධුරත්ථමණිසාරමුත්තමං" ති විජ්ජති. "මධුරත්ථමතිනිස්ස-යුත්තමං" තිපි පාඨභෙදො දිස්සති.

# අට්ඨාරසමපරිච්ඡෙදවණ්ණනා

## දිට්ඨිවිසුද්ධිනිද්දෙසො.

ඉදානි යස්මා එවං අභිඤ්ඤාවසෙන අධිගතානිසංසාය ථිරතරාය සමාධිභාවනාය සමන්නාගතෙන භික්ඛුනා පඤ්ඤා භාවෙතබ්බා හොති, එවං හි සා සබ්බාකාරෙන ථිරතරා සිඛාප්පත්තා හොති, තස්මා තස්සා භාවනාය විභාවනමාරභන්තො ආහ (1170.) **සමාධිං පනාති** ආදිං. (1172.) **කා පඤ්ඤාති** සරූපපුච්ඡා. **කෙනට්ඨෙනාති** පඤ්ඤාති ඉමිස්සා කො අත්ථො; පඤ්ඤාති පදං කං අභිධෙය්‍යත්ථං නිස්සාය පවත්තතීති අධිප්පායො.

(1173.) **පඤ්ඤා, විපස්සනාපඤ්ඤාති** ඉධාධිප්පෙතමෙව පඤ්ඤං දස්සෙති. අඤ්ඤත්ථ පන බහුවිධො පඤ්ඤප්පභෙදො හොති. **පුඤ්ඤචිත්තසමායුත්තාති** කුසලචිත්තසම්පයුත්තා. එත්ථ පුඤ්ඤග්ගහණෙන දුවිධම්පි අව්‍යාකතං නිවත්තෙති. තථා අත්ථි සංකිලිට්ඨාති එවං පවත්තං මිච්ඡාවාදං පටිසෙධෙති. විපස්සනාග්ගහණෙන කම්මස්සකතාදිවසප්පවත්තං සෙසකුසලපඤ්ඤං. **ජානනා ච පකාරතොති** වුත්තෙන කිමිදං පකාරතො ජානනං නාමාති අනුයොගං මනසි නිධාය සඤ්ජානන - විජානනාකාර-විසිට්ඨං නානප්පකාරතො ජානනන්ති දස්සෙතුං (1174.) **සඤ්ඤා -විඤ්ඤාණ - පඤ්ඤානං කො විසෙසො කිමන්තරන්ති** කථෙතුකම්‍යතාපුච්ඡං කත්වා විස්සජ්ජනමාහ **සඤ්ඤා- විඤ්ඤාණ පඤ්ඤානන්ති** ආදිනා. **ජානනභාවෙන සමෙපි චාති** විසයවිජානනාකාරෙ සමානෙපි. **සඤ්ජානනමත්තකමෙවාති** නීලං පීතන්ති ආදිකං ආරම්මණෙ විජ්ජමානං අවිජ්ජමානං වා සඤ්ඤානිමිත්තං කත්වා ජානනං. තථා හෙසා පුන සඤ්ජානනපච්චය - නිමිත්තකරණරසා.[1] මත්තසද්දෙන විසෙසනිවත්ති - අත්ථෙන විජානනපජානනාකාරෙ නිවත්තෙති. එවකාරෙන කදාචිපි ඉමිස්සා තෙ විසෙසා න සන්තී යෙවාති අවධාරෙති. **ලක්ඛණපටිවෙධන්ති** අනිච්චං දුක්ඛමනත්තාති ලක්ඛණපටිවෙධං **කාතුං නෙව සක්කොතී**; විඤ්ඤාණකිච්චම්පි කාතුං න සක්කොති සඤ්ඤා; කුතො පඤ්ඤාකිච්චං කරෙය්‍යාති ලක්ඛණපටිවෙධං කාතුං න සක්කොති යෙවාති වුත්තං.[2]

(1176.) විඤ්ඤාණම්පන ආරම්මණෙ පවත්තමානං න තත්ථ සඤ්ඤා විය නීලපීතාදිකස්ස සඤ්ජානනවසෙනෙව පවත්තති, අථ ඛො තං තත්ථ අනිච්චතාදිවිසෙසං අඤ්ඤඤ්ච තාදිසං විසෙසං

1 M. - පච්චයකරණරසා. 2. M. ඉතො පරං "න වුත්තං මග්ගං පාපෙතුං න සක්කොතී"ති පාඨො මරම්මපොත්ථකෙ දිස්සති.

ජානන්තමෙව පවත්තතීති ආහ **විඤ්ඤාණං පනාති** ආදිං කථං පන විඤ්ඤාණං ලක්ඛණපටිවෙධං කරොතීති? පඤ්ඤාය දස්සිතමග්ගෙන; ලක්ඛණාරම්මණිකවිපස්සනාය හි අනෙකවාරං ලක්ඛණානි පටිවිජ්ඣිත්වා පවත්තමානාය පගුණභාවතො පරිචයවසෙන ඤාණවිප්පයුත්තචිත්තෙනපි විපස්සනා සම්භවති; යථා තං පගුණස්ස ගන්ථස්ස සජ්ඣායතො ඤායංගතාපි වාරා න විඤ්ඤායන්ති. **ලක්ඛණං පටිවිජ්ඣිතුන්ති** ච ලක්ඛණානං ආරම්මණකරණං සන්ධාය වුත්තං, න පටිවිජ්ඣනං. (1177.) **උස්සක්කිත්වාති** උදයබ්බයඤාණපටිපාටියා ආරභිත්වා මග්ගං පාපෙතුමෙව තං විඤ්ඤාණං න සක්කොති අසම්බොධසභාවත්තා. **වුත්තනයන්ති** විඤ්ඤාණෙ වුත්තනයං. සා හි ආරම්මණං ච ජානාති ලක්ඛණං ච පටිවිජ්ඣති; අත්තනො පන අනඤ්ඤසාධාරණෙන ආනුභාවෙන මග්ගං පාපෙතුං ච සක්කොති[1].

බාල-ගාමික-හෙරඤ්ඤිකානං කහාපණජානනම්ව ච තෙසං ආරම්මණජානනං වෙදිතබ්බං. යථා හි හෙරඤ්ඤිකඵලකෙ ඨපිතං කහාපණරාසිං එකො අසඤ්ජාතවොහාරබුද්ධි බාලදාරකො, එකො ගාමිකපුරිසො, එකො හෙරඤ්ඤිකොති තීසු ජනෙසු පස්සමානෙසු බාලදාරකො කහාපණානං චිත්තවිචිත්ත-දීඝ-චතුරස්ස-පරිමණ්ඩලභාවමත්තමෙව ජානාති, "ඉදං මනුස්සානං උපභොගපරිභොගාවහං, රතනසම්මතං"ති න ජානාති; ගාමිකපුරිසො තදුභයං ජානාති; අයං ඡෙකො මහාසාරො, අයං කූටො, අයං අඩ්ඪසාරො, අයං පරො[2] පාදසාරොති ආදිකං පන විභාගං න ජානාති. හෙරඤ්ඤිකො සබ්බෙපි තෙ පකාරෙ ජානාති, ජානන්තො ච ඔලොකෙත්වා පි ජානාති, ආකොටිතසද්දං සුත්වාපි ජානාති, ගන්ධං ඝායිත්වාපි[3] හත්ථෙන ධාරයිත්වා පි අසුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා නගරෙ වා[4] නදීතීරෙ වා කතොතිපි, අසුකආචරියෙන කතොතිපි ජානාති. තත්ථ සඤ්ඤා අසඤ්ජාතවොහාරබුද්ධිනො බාලදාරකස්ස කහාපණදස්සනං විය විභාගං අකත්වා පිණ්ඩවසෙනෙව ආරම්මණං ගණ්හාති, නීලාදිවසෙන ආරම්මණස්ස උපට්ඨානාකාරමත්තගහණතො. විඤ්ඤාණං ගාමිකපුරිසස්ස කහාපණදස්සනං විය, එකච්චවිසෙසගහණසමත්ථතාය. පඤ්ඤා අනවසෙසගහණසමත්ථත්තා හෙරඤ්ඤිකස්ස කහාපණදස්සනම්ව දට්ඨබ්බාති.

(1178.) **සභාවපටිවෙධනං** ති සකො භාවො, සමානො වා භාවො සභාවො, තස්ස පටිවෙධනං. ඤාතපරිඤ්ඤා-තීරණ-පරිඤ්ඤාවසෙන සභාවසාමඤ්ඤලක්ඛණපටිවෙධනං. ඝටපටාදි-

1 M. නසක්කොති. 2. M පොත්ථකෙ නත්ථි 3 "රසං සායිත්වාපී"ති මරම්මපොත්ථකෙ අධිකං. 4. M. වා පබ්බතෙ වා

පටිච්ඡාදකස්ස බාහිරන්ධකාරස්ස දීපාලොකො විය යථාවුත්ත-ධම්මසභාවපටිච්ඡාදකස්ස **විධංසනරසා**, උප්පජ්ජමානො යෙව හි ඤාණාලොකො හදයන්ධකාරං විධමෙන්තො උප්පජ්ජතී ති ආහ (1179.) **සම්මොහන්ධකාරස්ස විධංසනරසා මතා** ති. තතො යෙව සබ්බධම්මෙසු අසම්මූළ්හතාකාරෙන පච්චුපතිට්ඨති, කාරණ-භූතා වා සයං ඵලභූතං අසම්මොහං පච්චුපට්ඨාපෙතී ති ආහ (1180.) **අසම්මොහපච්චුපට්ඨානා** ති. විපස්සනාපඤ්ඤාය ඉධාධිප්පෙතත්තා සමාධි තස්සා පදට්ඨානං, තථා හි "සමාහිතො යථාභූතං පජානාතී"ති සුත්තපදං ති ආහ **සමාධාසන්නකාරණා** ති, ධම්මසභාවපටිවෙධො නාම පඤ්ඤාය ආවෙණිකො සභාවො, න තෙන තස්සා කොචි විභාගො ලබ්භතී ති ආහ (1181.) **ලක්ඛණෙ-නෙකධා වුත්තා** ති.

ලුජ්ජනපලුජ්ජනට්ඨෙන ලොකොති වුච්චති වට්ටං; තං පරියා-පන්නතාය ලොකෙ නියුත්තා, තත්ථ වා විදිතා ති **ලොකියා**. තත්ථ අපරියාපන්නතා **අලොකියා**. කතමා පනෙත්ථ ලොකියා, කතමා ලොකුත්තරාති ආහ **ලොකියෙනා** ති ආදිං. ලොකියකුසලචිත්තුප්පාදෙසු මග්ගසම්පයුත්තා, ලොකියෙන මග්ගෙන යුත්තා. විසෙසතො පන දිට්ඨිවිසුද්ධිආදි - විසුද්ධිචතුක්ක-සංගහිතමග්ගසම්පයුත්තා සමුදයෙ පවත්තා පඤ්ඤා තදෙකදෙසෙපි පවත්තතීති මග්ගගහණං කතං. පච්චෙකම්පි වා සම්මාදිට්ඨිආදීනං මග්ගසාමඤ්ඤතාති[1] කත්වා ලොකතො උත්තරා උත්තිණ්ණා ති ලොකුත්තරා ලොකුත්තරාපි හි මග්ගසම්පයුත්තා භාවෙතබ්බා. විපස්සනාපරියායෙපි ච[2] සා[2] ලබ්භතෙවාති ලොකුත්තරගහණං න විරුජ්ඣති තෙනාහ (1182.) **ලොකුත්තරෙනා** ති ආදිං.

**සුතමයාදිභෙදා** ති ආදිග්ගහණෙන භාවනාමයං සංගණ්හාති. (1183.) **අත්තනොව චින්තායා** ති තස්ස තස්ස අනවජ්ජස්ස අත්ථස්ස සාධනෙ පරොපදෙසෙන විනා අත්තනො උපායචින්තා-වසෙනෙව. **භූරිපඤ්ඤෙනා** ති මහාපඤ්ඤෙන; පත්ථටතාය පථවි-සමානපඤ්ඤෙන වා ති අත්ථො. (1184.) **පරතො පන සුත්වානා** ති පරතො උපදෙසං සුත්වා. **සුතෙනෙව ච නිප්ඵන්නා** ති අනෙකා-න්තහෙතුවත්ථමිදං විසෙසනං. සුතෙනෙව නිප්ඵන්නත්තා ති අත්ථො. **නිප්ඵන්නත්තා සුතෙන වා** ති වා පාඨො. (1185.) **යථා වා පි තථා වා** ති පරතො සුත්වා වා අසුත්වා වා. **අප්පණාප්පත්තා** ති ඉදං සිඛාප්පත්තං භාවනාමයං දස්සෙතුං වුත්තං, න පන අප්පණාප්පත්තාව භාවනාමයා ති

1 M මග්ගසමඤ්ඤති. 2. M විපස්සනාපරියොසානෙ.

තිස්සො පි පනෙතා පඤ්ඤා පාළිවසෙන එවං වෙදිතබ්බා: "තත්ථ කතමා චින්තාමයා පඤ්ඤා? යොගවිහිතෙසු වා කම්මායතනෙසු යොගවිහිතෙසු වා සිප්පායතනෙසු යොගවිහිතෙසු වා විජ්ජායතනෙසු[1] කම්මස්සකතං සච්චානුලොමිකතං වා. රූපං අනිච්චන්ති වා, සඤ්ඤා, වෙදනා, සංඛාරා, විඤ්ඤාණං අනිච්චන්ති වා, යං එවරූපං අනුලොමිකං ඛන්තිං, දිට්ඨිං රුචිං මුතිං පෙක්ඛං ධම්මනිජ්ඣානක්ඛන්තිං පරතො අසුත්වා පටිලභති, අයං වුච්චති චින්තාමයා පඤ්ඤා. කතමා සුතමයා පඤ්ඤා =පෙ= සුත්වා පටිලභති, අයං වුච්චති සුතමයා පඤ්ඤා. සබ්බාපි සමාපන්නස්ස පඤ්ඤා"ති එත්ථ ච කිඤ්චාපි කම්මායතනාදිවසෙන චින්තාමය-සුතමයපඤ්ඤා මහග්ගතලොකුත්තරවසෙන භාවනාමයපඤ්ඤා ච වුත්තා, ඉධ පන අනභිමහවිකානං දට්ඨබ්බං බොධිසත්තානමෙව ලබ්භමානා චින්තාමයභූතා සච්චානුලොමිකපඤ්ඤා, පූරිතපාරමීනං අවසෙසමහාපඤ්ඤානං ලබ්භමානා සුතමයා සච්චානුලොමිකා පඤ්ඤා, ලොකුත්තරප්පණප්පත්තා අප්පත්තාපි[2] භාවනාමයපඤ්ඤා ච අධිප්පෙතා.

(1186.) **පටිසම්භිදාචතුක්කස්සාති** අත්ථ - ධම්ම - නිරුත්ති-පටිභාණසංඛාතස්ස පටිසම්භිදාචතුක්කස්ස වසෙන. තත්‍ථ චෙත්ථ විපස්සනාපඤ්ඤා අධිප්පෙතා, කස්මා පටිසම්භිදා ආහටාති? විපස්සකානං ඤාණපාටවත්ථං පඤ්ඤාප්පභෙදෙ නිද්දිසියමානෙ පටිසම්භිදාපඤ්ඤාමපි වත්තුකාමතාය; පටිසම්භිදාපඤ්ඤාය වා විපස්සනාඵලභූතත්තා ලොකියලොකුත්තරපඤ්ඤාධිකාරෙ වා ලොකුත්තරපඤ්ඤාය සහ පාපුණිතබ්බං පටිසම්භිදාපඤ්ඤාමපි වත්තුකම්‍යතාය ඉධෙව වුත්තා ති. **අත්ථ-ධම්ම-නිරුත්තීසු ඤාණන්ති** අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, අත්ථධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදාති එවමාගතං අත්ථාදිසු තීසු පභෙදගතං ඤාණත්තයං. **තිසූපීති** යථාවුත්තෙසු තීසු පටිසම්භිදාඤාණෙසු ගොචර - කිච්ච - ලක්ඛණ - රස පච්චුපට්ඨාන - පදට්ඨාන - භූමි - ආදිවසෙන තෙ ආරම්මණං කත්වා පච්චවෙක්ඛන්තස්ස ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති එවං පභෙදගතං ඤාණං. පරිත්ත - මහග්ගත - අප්පමාණවසෙන වා තීසු ඤාණෙසු ඤාණං. පටිසම්භිදාරම්මණම්පි හි පටිභාණපටිසම්භිදා හොති; තෙනෙව ච සුත්තන්තභාජනියපාළියං ඤාණෙසු ඤාණන්ති, අට්ඨකථාය ච සබ්බත්ථ ඤාණාරම්මණං ඤාණන්ති අවිසෙසෙන වුත්තං. එවං ච කත්වා මහග්ගත - පටිසම්භිදාඤාණස්ස අභාවෙපි "නිරුත්තිපටිසම්භිදා පරිත්තාරම්මණා, තිස්සො පටිසම්භිදා සියා

1. M. විජ්ජාට්ඨානෙසු 2. M. පොත්ථකෙ නත්ථි.

පරිත්තාරම්මණා, සියා මහග්ගතාරම්මණා, සියා අප්පමාණාරම්මණා"ති පටිභාණපටිසම්භිදාය මහග්ගතාරම්මණතාපි පඤ්හපුච්ඡකපාළියං වුත්තා. අභිධම්මභාජනියෙ පන "යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා =පෙ= අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා[1] අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා. තෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා; තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා; යාය නිරුත්තියා තෙසං තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, අත්ථධම්මනිරුත්තාභිලාපෙ[2] ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති තෙසු ඤාණෙසු ඤාණං පටිභාණපටිසම්භිදා"ති චිත්තුප්පාදකණ්ඩමෙව දෙසනාය පවත්තත්තා සාවසෙසො පාඨො කතො. චිත්තුප්පාදසංගහිතෙ අත්ථෙ අසෙසෙත්වා දෙසනා හි අභිධම්මභාජනියෙ පවත්තා, න සබ්බඤ්ඤෙය්‍යානි යථාදස්සිත-විසයවචනවසෙන යෙන ඤාණෙන තානි ඤාණානි ජානාතීති වුත්තං, න තං අඤ්ඤාරම්මණතං පටිසෙධෙති දෙසනාය අතප්පරභාවතො. එවං ච කත්වා තත්ථ නිබ්බාණෙ අනාගතෙපි "අත්ථපටිසම්භිදා සියා න වත්තබ්බා අතීතාරම්මණාති පි අනාගතාරම්මණාතිපි පච්චුප්පන්නාරම්මණාති පී"ති අත්ථපටිසම්භිදාය නිබ්බාණාරම්මණතා වුත්තා.

අත්ථ ච **අත්ථෝ**ති සංඛෙපතො හෙතුඵලස්සෙතං අධිවචනං. හෙතුඵලං හි යස්මා හෙතුඅනුසාරෙන අරීයති අධිගමීයති සම්පාපුණීයති, තස්මා අත්ථොති වුච්චති. **ධම්මො**ති පි සංඛෙපතො පච්චයස්සෙතං අධිවචනං. සො හි යස්මා තං තං දහති පවත්තෙති වා සම්පාපුණිතුං වා[3] දෙති[3], තස්මා ධම්මොති වුච්චති. **නිරුත්ති**ති සත්තානං මූලභාසාභූතා මාගධිකා භාසා යාය බුද්ධානං දෙසනා හොති. **පටිභාණං**ති හෙට්ඨා වුත්තං ඤාණත්තයමෙව. වුත්තං හෙතං අභිධම්මෙ: "දුක්ඛෙ ඤාණං =පෙ= තස්ස විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා"ති ආදිං. යස්මා පනායං සංඛෙපතො පභෙදවසෙනෙව වුච්චමානො පාකටො හොති, තස්මා තං සංගහෙත්වා පභෙදතොව [අත්ථාදිකෙ දස්සෙතුං (1187.) **යං කිඤ්චි පච්චයුප්පන්නං**ති ආදි ආරද්ධං. යං කිඤ්චි පච්චයුප්පන්නංති යං කිඤ්චි හෙතාදිපච්චයතො සමුප්පන්නං තං පන ඉදං ඉතො නිබ්බත්තං, ඉදං ඉතොති එවං හෙතුඅනුසාරෙන විඤ්ඤෙය්‍යමත්තමෙව ඉධ අධිප්පෙතං. තථා කුසලාකුසලඵලභූතා විපාකා අව්‍යාපාරසන්තිවසෙන විඤ්ඤෙය්‍යමත්තා, සෙසා අව්‍යාපාරභූතා

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. තත්ථ ධම්ම— 3. M. ධාරෙති.

ක්‍රියාධම්මා අවිපාකසන්තතිවසෙන, අසංඛතනිස්සරණභූතො නිරොධො නිබ්බුතිසන්තතිවසෙන, බුද්ධවචනත්ථභූතො ඛන්ධාදි-පරමත්ථභාවො[1] ධම්මො, ඉමාය අයං දීපිතොති එවං පාළි-අනුසාරෙන විඤ්ඤායමානො ච අත්ථසම්බන්ධං ලභතීති ආහ: **යං කිඤ්චි පච්චයුප්පන්න**න්ති ආදිං.

තත්ථ හෙතුඵලං භාසිතත්ථො ච සකසකහෙතුපටිබද්ධො භාසිතපටිබද්ධො ච විඤ්ඤායතීති පරියායතො, සෙසං සකසක-භාවවසෙනෙව විඤ්ඤායතීති නිප්පරියායතො අත්ථො නාම. තත්ථ පරියායත්ථො සුත්තන්තභාජනියවසෙනෙව වුත්තො, නිප්පරියා-යත්ථො අභිධම්මභාජනියවසෙනාති දට්ඨබ්බං. (1188.) **භාසිත**න්ති පාළිධම්මමාහ. සෙසං අත්ථපඤ්චකෙ වුත්තනයෙන යථාරහං යොජෙත්වා වෙදිතබ්බං. එත්ථ ච නිබ්බානං පත්තබ්බො අත්ථො; භාසිතබ්බත්ථො ඤාපෙතබ්බො අත්ථො; ඉතරො නිබ්බත්තෙතබ්බො අත්ථොති තිවිධො හොති අත්ථො. මග්ගො සම්පාපකො හෙතු, භාසිතං ඤාපකො හෙතු, ඉතරං නිබ්බත්තාපකහෙතූති[2] තිවිධො හෙතූති දට්ඨබ්බං. ක්‍රියාධම්මානං වෙත්ථ අවිපාකතාය ධම්මභාවො න වුත්තො. යදි එවං විපාකා න හොන්තීති අත්ථභාවොපි න වත්තබ්බොති? න, පච්චයුප්පන්නභාවතො. එවං සති කුසලා-කුසලානම්පි පච්චයුප්පන්නත්තා අත්ථභාවො ආපජ්ජති. නායං දොසො, අප්පටිසිද්ධත්තා. විපාකස්ස පන පධානහෙතුතාය පාකටභාවතො ධම්මභාවො එව තෙසං වුත්තො. කිරියානං පච්චයභාවා ධම්මභාවො ආපජ්ජතීති චෙ? නායං දොසො, අප්පටි-සිද්ධත්තා. කම්මඵලසම්බන්ධස්ස පන හෙතුභාවාභාවතො ධම්ම-භාවො න යුත්තොති. අපි ච "අයං ඉමස්ස පච්චයො, අයං පච්චයුප්පන්නො"ති එවං භෙදං කත්වා කෙවලං කුසලාකුසලෙ විපාකක්‍රියාධම්මෙ ච පච්චවෙක්ඛන්තස්ස ධම්මත්ථපටිසම්භිදා න හොන්තීති තෙසං අත්ථධම්මතා න වුත්තාති දට්ඨබ්බං.

(1189.) **සභාවනිරුත්තීති** අවිපරීතනිරුත්ති. අවිපරීත-නිරුත්තීති තස්ස තස්ස අත්ථස්ස බොධනෙ සබ්බකාලං පටිනියත-සම්බන්ධො අව්‍යභිචාරවොහාරො, මාගධභාසාති වුත්තං හොති. සා හි සබ්බකාලං පටිනියතසම්බන්ධා. ඉතරා භාසා පන කාලන්තරෙන පරිවත්තන්ති. අත්ථතො පනෙසා නාමපඤ්ඤත්තීති ආචරියා. යථාහු: නිරුත්ති මාගධීභාසා, අත්ථතො නාමසම්මුතීති. අපරෙ පන: යදි සභාවනිරුත්ති පඤ්ඤත්තිසභාවා, පඤ්ඤත්ති-අභිලපිතබ්බා, න වචනන්ති ආපජ්ජති, එවං ච සති "අත්ථධම්ම

1. M. ඛන්ධාදිපරමත්ථ. 2. M. නිබ්බත්තකහෙතූති.

නිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා"ති ඉදං න සක්කා වත්තුං අභිලාපොති,[1] න හි වචනතො අඤ්ඤං අභිලපිතබ්බං උච්චාරෙතබ්බං අත්ථි; අත්ථි[2] ඵස්සාදිවචනෙහි බොධෙතබ්බං අභිලපිතබ්බං එවං ච සති අත්ථධම්මානම්පි බොධෙතබ්බත්තා තෙසම්පි නිරුත්තිභාවො ආපජ්ජති. අපි ච අට්ඨකථාය "ඵස්සොති ච සභාවනිරුත්ති; ඵස්සා ඵස්සං ති න සභාවනිරුත්තී"ති වචනතො විඤ්ඤත්තිවිකාරසහිතො සද්දො නිරුත්තීති දස්සිතමෙව. තං සභාවනිරුත්තාභිලාපෙ පභෙදගතං ඤාණං නිරුත්තිපටිසම්භිදා. එවමයං නිරුත්තිපටිසම්භිදා සද්දාරම්මණා නාම ජාතා, න පඤ්ඤත්තිආරම්මණාය සොතවිඤ්ඤාණවීථියා පරතො මනොද්වාරෙ නිරුත්තිපටිසම්භිදා පවත්තති

එවං ච කත්වා "නිරුත්තිපටිසම්භිදා පරිත්තාරම්මණා"ති වචනං උපපන්නං හොතීති වදන්ති. **ආචරියජොතිපාලත්ථෙරාදයො** පනාහු: "නිරුත්තිපටිසම්භිදා පච්චුප්පන්නාරම්මණා"ති වචනං පච්චුප්පන්නං සද්දං ගහෙත්වා පච්ඡා ජානනං සන්ධාය වුත්තං. එවං ච සති අඤ්ඤස්මිං පච්චුප්පන්නාරම්මණෙ අඤ්ඤං පච්චුප්පන්නාරම්මණන්ති වුත්තන්ති ආපජ්ජති. යථා පන දිබ්බසොතඤාණං මනුස්සාමනුස්සාදි - සද්දභෙදනිච්ඡයස්ස පච්චයභූතං තංතංසද්දවිභාවකං, එවං සභාවාසභාවනිරුත්තිනිච්ඡයස්ස පච්චයභූතං පච්චුප්පන්නසභාවනිරුත්තිසද්දාරම්මණං, තං විභාවකඤාණං නිරුත්තිපටිසම්භිදාති වුච්චමානෙ න කොචි පාළිවිරොධො. තං සභාවනිරුත්තිසද්දං ආරම්මණං කත්වා පච්චවෙක්ඛන්තස්සාති ච පච්චුප්පන්නසද්දාරම්මණං පච්චවෙක්ඛණං පවත්තෙන්තස්සාති න සක්කා වත්තුං. තං පි ඤාණං සභාවනිරුත්තිං විභාවෙන්තමෙව තංතංපභෙදනිච්ඡයස්ස හෙතුභාවතො නිරුත්තිං භින්දන්තං පටිවිජ්ඣන්තමෙව උප්පජ්ජතීති ච පභෙදගතං පි හොතීති.

(1190.) **තිවිධං**ති ඉදං හෙට්ඨා විභාවිතනයමෙවාති. **පච්චවෙක්ඛන්තෙනා**ති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති අසම්මොහවසෙන පච්චවෙක්ඛන්තස්ස තනු ච තීණි ඤාණානිපි අත්ථධම්මසභාවං නාතිවත්තන්තීති ඤාණෙසු ඤාණං අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා ච හොති කස්මා පන තෙසු =පෙ= මතං ති විසුං වුත්තන්ති? සාරම්මණෙසු තීසු ඤාණෙසු පවත්තඤාණස්ස අධිප්පෙතත්තා. යං හි ඤාණාරම්මණං ඤාණං තස්ස ආරම්මණෙම්පි අසම්මොහවසෙන පටිවිජ්ඣන්තමෙව පවත්තති, තං ඉධ පටිභානපටිසම්භිදා නාම. එවං ච කත්වා වුත්තං "ඉමානි ඤාණානි

1. M. අභිලපිතබ්බොති අභිලාපො. 2. B. M. අට්ඨ.

ඉදමත්ථජෝතකානී’’ති. ඤාණමත්තාරම්මණං පන ඤාණං අත්ථපටිසම්භිදා යෙව හොති. එත්ථ ච කිඤ්චාපි අයං පටිසම්භිදා සාරම්මණෙසු ඤාණෙසු පවත්තති. ආරම්මණානං පන පභෙදං හෙට්ඨා ඤාණත්තයමෙව විභාවෙති. යථා කිං? යථා ධම්මදෙසනාය අසමත්ථො බහුස්සුතො කිඤ්චාපි ධම්මකථිකෙන කථෙතබ්බධම්මං ජානාති; දෙසනා පන ධම්මකථිකස්සෙව විසෙසොති එවං සම්පදමිදං දට්ඨබ්බං.

ඉමාසු පන පච්ඡිමානං තිස්සන්නං සෙඛාසෙඛමග්ගක්ඛණෙ අසම්මොහවසෙන පටිවෙධො හොති, අත්ථපටිසම්භිදාය ආරම්මණකරණවසෙනපි. තථා හි සා මග්ගඵලසභාවාපි හොති. එවං ච කත්වා සා ලොකියලොකුත්තරා; සෙසා තිස්සො ලොකියාව. තෙනාහු පොරාණා

“ලාභො තාසම්මසම්මොහා සෙඛාසෙඛඵලක්ඛණෙ[1]
අත්ථපඤ්ඤා යථාලම්බා, සා ද්විධා’ඤ්ඤා තු සාසවා.’’ති

ඉමා පන චතස්සො පටිසම්භිදා පඤ්චහි ආකාරෙහි විසදභාවං ගච්ඡන්තීති දස්සෙතුං (1119) **පරියත්තීති** ආදි ආරද්ධං. තත්ථ පරියත්තීති බුද්ධවචනස්ස පරියාපුණනං. පාළිඅට්ඨකථාදීසු ගණ්ඨිපද-අත්ථපද-විනිච්ඡයකථා **පරිපුච්ඡා**, පරිතො සබ්බතො ඤාතුං පුච්ඡාති කත්වා. සවණං සක්කච්චං අට්ඨිං කත්වා සොතවිඤ්ඤාණවසෙන ගහණං. **අධිගමො** මග්ගුප්පත්තීති වුත්තං; තං සෙක්ඛභූමියං පභෙදගමනං අප්පවිසයං; අසෙක්ඛභූමියං බහුවිසයන්ති කත්වා වුත්තං. සාතිසයං වා අධිගමනං සන්ධාය එවං වුත්තං. සෙක්ඛසන්තානප්පවත්තානම්පි[2] ඉමාසං අරහත්තප්පත්තියා[3] විසදභාවාධිගමොති. පුබ්බයොගො විය පන අරහත්තප්පත්ති අරහතොපි පටිසම්භිදාවිසදතාය පච්චයො න හොතීති පඤ්චන්නම්පි යථායොගං සෙක්ඛාසෙක්ඛපටිසම්භිදාවිසදතාය කාරණතා යොජෙතබ්බා.

**පුබ්බයොගො** නාම පුබ්බබුද්ධානං සාසනෙ ගතපච්චාගතිකභාවෙන යාව අනුලොම-ගොත්‍රභූසමීපං, තාව විපස්සනාභියොගො. අධිගම-පුබ්බයොගා වෙත්ථ අනුප්පන්නං උප්පාදෙන්ති, උප්පන්නං ච සුවිසදං කරොන්ති. සෙසානි පන සුවිසදභාවස්සෙව පච්චයානි දට්ඨබ්බං. එවං එකවිධාදිවසෙන පඤ්ඤාය පභෙදං දස්සෙත්වා ඉදානි භාවනාවිධානං විභාවෙතුං **කථං භාවෙතබ්බාති** ආදි ආරද්ධං.

1. M. සෙඛාසෙඛපථක්ඛණෙ. 2. M. සෙඛන පත්තානම්පි. 3. M. අරහත්තුප්පත්තියා.

තත්ථ යස්මා ඉමාය පඤ්ඤාය ඛන්ධාදයො ධම්මා භූමි, සීලවිසුද්ධි චෙව චිත්තවිසුද්ධි චාති ඉමා ද්වෙ විසුද්ධියො මූලං, දිට්ඨිවිසුද්ධි-කඞ්ඛාවිතරණවිසුද්ධි - මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි - පටිපදාඤාණදස්සනවිසුද්ධි-ඤාණදස්සනවිසුද්ධීති ඉමා පඤ්චවිසුද්ධියො සරීරං; තස්මා තෙසු භූමිභූතෙසු ධම්මෙසු උග්ගහපරිපුච්ඡාවසෙන ඤාණපරිචයං කත්වා මූලභූතා ද්වෙ විසුද්ධියො සම්පාදෙත්වා සරීරභූතා පඤ්චවිසුද්ධියො සම්පාදෙන්තෙන භාවෙතබ්බාති දස්සෙතුං **ඛන්ධාදීසූති** ආරද්ධං.

(1192.) **ඛන්ධාදීසූති** ඛන්ධායතනධාතු-ඉන්ද්‍රිය - පටිච්චසමුප්පාදාදිභෙදෙසු භූමිභූතෙසු තීසු ලක්ඛණාදිගහණවසෙන ඤාණස්ස පවත්තිට්ඨානභූතෙසු. (1193.) **සීලචිත්තවිසුද්ධීති** මූලභූතං සීලවිසුද්ධිං චිත්තවිසුද්ධිං ච. සති හි සීලවිසුද්ධියං චිත්තවිසුද්ධියං ච අයං පඤ්ඤා මූලජාතා නාම හොති, න අසතීති. **දිට්ඨිවිසුද්ධාදයො පඤ්චාති** උපබ්‍රූහෙතබ්බත්තා සරීරභූතා දිට්ඨිවිසුද්ධාදයො පඤ්ච ඉමිස්සා හි පඤ්ඤාය සන්තානවසෙන පවත්තමානාය පාද - පාණි - සීසට්ඨානියා දිට්ඨිවිසුද්ධි - ආදයො ඉමා පඤ්ච විසුද්ධියො අවයවෙන සමුදායූපලක්ඛණනයෙන සරීරං ති වෙදිතබ්බා. (1194.) **තාය පඤ්ඤාය** ති උග්ගහපරිපුච්ඡාදිවසෙන ඛන්ධාදිසු ධම්මෙසු පවත්තපඤ්ඤාය, **ජනනාදිතො** ති ජාතිජරාමරණාදීහි. භාවෙතබ්බා ති වත්වා ඉදානි යස්මා ඛන්ධාදිසු භූමිසු සීලචිත්තසඞ්ඛාතෙහි මූලෙහි සුප්පතිට්ඨිතෙන පඤ්චවිසුද්ධිසඞ්ඛාතසරීරස්ස වඩ්ඪනෙනෙව පඤ්ඤා පවුඩ්ඪා[1] නාම හොති; තස්මා විපස්සනාපඤ්ඤාය භූමිභූතෙසු ඛන්ධාදිසු එකදෙසදස්සනත්ථං **රූපං** චාති ආදි වුත්තං.

(1196) **තත්ථා** ති තෙසු පඤ්චසු ඛන්ධෙසු. යං කිඤ්චීති අනවසෙසපරියාදානං. **අතීතානාගතාදිනා** ති ආදිනා පන තදෙව එකාදසසු ඔකාසෙසු පක්ඛිපිත්වා දස්සෙති. ආදිගහණෙන පච්චුප්පන්නස්ස ගහණං. **හීනං** ති ආදිසු අකුසලකම්මසමුට්ඨානත්තාය හීනං; කුසලකම්මසමුට්ඨානත්තාය පණීතං; අකුසලවිපාකුප්පත්තිහෙතුභූතත්තාය වා හීනං; විපරියායෙන පණීතං. දුප්පරිග්ගහභූත - සුඛුමරූපාදිවසෙන දූරං; ඉතරවසෙන සන්තිකං ති ආදිනා අත්ථො වෙදිතබ්බො. (1197.) **සබ්බං තමෙකතො කත්වා** ති අතීතාදිවිභාගභින්නං සබ්බං තං රූපරාසිවසෙන බුද්ධියා එකජ්ඣං ගහෙත්වා මහාඋදකක්ඛන්ධොති ආදිසු විය රාසට්ඨෙන **රූපක්ඛන්ධොති වුච්චති**. සුත්තෙපි හි වුත්තං "තදෙකජ්ඣං අභිසංයූහිත්වා අභිසඞ්ඛිපිත්වා"ති. වෙදනාක්ඛන්ධාදීසුපි එසෙව නයො.

1. M. වඩ්ඪිතා.

එකෙකෙසු පන වෙදනාදීසු "සමුද්දො මයා දිට්ඨො"ති ආදීසු විය සමුද්දයවොහාරස්ස අවයවෙපි දිස්සනතො ඛන්ධසද්දො රූළ්හිවසෙන පවත්තතී ති දට්ඨබ්බං. (1200.) සංඛාරක්ඛන්ධො[1] යෙව සංඛාරක්ඛන්ධතා[1]. (1198.) තං යං කිඤ්චි වෙදයිතලක්ඛණං ති සම්බන්ධො. වෙදනාය අතීතාදිවිභාගෙ විත්ථාරකථා **විසුද්ධිමග්ගතො** ගහෙතබ්බා. (1200.) **අභිසංඛාරලක්ඛණං** ති සංඛාරක්ඛන්ධස්ස චෙතනාපධානතාය එවං වුත්තං. සම්පයුත්තධම්මෙ ආරම්මණෙ රාසිකරණලක්ඛණං සම්පිණ්ඩනලක්ඛණං ති වුත්තං හොති. අථ වා "සංඛතමභිසංඛරොන්තී"ති වුත්තත්තා යථා අත්තනො ඵලං[2] සංඛතෙන[2] සම්මදෙව නිප්ඵන්නං හොති, එවං අභිසංඛරණසභාවන්ති අත්ථො. අයම්පන කුසලාකුසලචෙතනාය වසෙන වට්ටති.

එවං විපස්සනාපඤ්ඤාය භූමිභූතෙ ධම්මෙ එකදෙසතො දස්සෙත්වා ඉදානි සීලචිත්තවිසුද්ධීනං හෙට්ඨා වුත්තත්තා අවත්වා ඉදං පඤ්ඤාභාවනාය ආදිභූතං දිට්ඨිවිසුද්ධිං දස්සෙතුං (1202) **චත්තාරො ච මහාභූතා** ති ආදි ආරද්ධං, තං සම්පාදෙතුකාමෙන ච යොගාවචරෙන චතුධාතුවවත්ථානමුඛෙන වා අට්ඨාරසධාතුවසෙන[3] වා පඤ්චක්ඛන්ධවසෙන වා උභින්නං සංඛෙපකොට්ඨාසානං වසෙන වා පටිලද්ධජ්ඣානවසෙන වා නාමරූපස්ස වවත්ථාපෙතබ්බභාවෙපි තෙන තෙන මුඛෙන වවත්ථානප්පකාසනස්ස අතිප්පපඤ්චාවහත්තා යථාධිප්පෙතඛන්ධවසෙනෙව ඉධ වවත්ථානං දස්සිතං. (1203.) **එකාසීතියා චිත්තෙනා** ති එකාසීතියා ලොකියචිත්තෙන, ලොකුත්තරචිත්තානි පන නෙව සුඛවිපස්සකස්ස න සමථයානිකස්ස පරිග්ගහං ගච්ඡන්ති, අනධිගතත්තා.

(1204.) **චත්තාරො' රූපිනො ඛන්ධා** ති චත්තාරො අරූපිනො ඛන්ධා. (1205.) සීතුණ්හාදිවිරොධිප්පච්චයසමවායෙ විකාරාපජ්ජනතො **රූපං රුප්පනලක්ඛණං**. ආරම්මණාභිමුඛං නමනතො **නාමං නමනලක්ඛණං**. **පරිග්ගණ්හතී** ති පරිච්ඡෙදකාරිකාය පඤ්ඤාය පරිච්ඡින්දිත්වා ගණ්හාති. **තාලස්ස කන්දං තු යමකං** ති ද්වීහි බීජෙහි නිබ්බත්තිතං එකීභූතං යමකතාලකන්දං. තං හි යමකං භින්නසන්තානම්පි අභින්නං විය උපට්ඨාති; එවං රූපාරූපධම්මා ති. නාමං ච රූපං චාති එතෙනෙව තස්ස දුවිධභාවෙ සිද්ධෙ **ද්විධා වවත්ථපෙතී** ති ඉදං නාමරූපවිනිමුත්තස්ස අඤ්ඤස්ස අභාවදස්සනත්ථං. තෙනෙවාහ (1207.) **නාමතො රූපතො** ති ආදිං නාමරූපමත්තතාය අවිනිච්ඡිතත්තා සත්තානාදි

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. ඵලසංඛතං. 3. M. ද්වාදසායතනවසෙන.

ඝනභෙදස්ස ච අකතත්තා අභිනිවෙසෙන විනා සමූහෙකත්ත-ගහණවසෙන සත්තොති පවත්තො සම්මොහො **සත්තසම්මොහො**. තස්ස **ඝාතත්ථං** වික්ඛම්භනත්ථං. **බහුස්සුතවසෙනා** ති යථා හි ති ආදිනා ඉධ දස්සිතානං, අඤ්ඤෙසං ච "රූපං චෙ මහාලි, අත්තා අභවිස්ස නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍යා" ති එවමාදීනං සම්බහුලානං සුත්තන්තානං වසෙන. (1209.) **තං** ති තං නාමරූපං

(1210) **අඞ්ගසම්භාරා** ති අඞ්ගසම්භාරහෙතු, තංනිමිත්තං අමුඤ්චිත්වා, සති එව තස්මිංති අත්ථො. සද්දොති වොහාරො. රථොති[1] සම්මුති.[1] **ඛන්ධෙසූ** ති පඤ්චසු උපාදානක්ඛන්ධෙසු. **සන්තෙසූ** ති තෙ අමුඤ්චිත්වා **සත්තොති සම්මුති** වොහාරො, ඉදං වුත්තං හොති: යථා අක්ඛ – චක්ක – පඤ්ජර – ඊසාදිසු අඞ්ගසම්භාරෙසු එකෙනාකාරෙන එකජ්ඣං රාසිභූත්වා සණ්ඨිතෙසු රථොති වොහාරමත්තං හොති, පරමත්ථතො පන එකෙකස්මිං අඞ්ගෙ උපපරික්ඛියමානෙ රථො නාම නත්ථි, එවමෙව උපාදානක්ඛන්ධසංඛාතෙසු රූපාරූපධම්මෙසු සන්තානවසෙන පවත්තමානෙසු සත්තොති වා පුග්ගලොති වා ජීවොති වා වොහාරමත්තං අත්ථි. පරමත්ථතො පන එකෙකස්මිං ධම්මෙ උපපරික්ඛියමානෙ අස්මීති වා අහංති වා ගාහස්ස වත්ථුභූතො සත්තො නාම නත්ථි, කෙවලං නාමරූපමත්තමෙව අත්ථීති එවං පස්සතො හි දස්සනං යථාභූතදස්සනං නාම හොති, යං දිට්ඨිවිසුද්ධීති වුච්චති. සචෙ කොචි සත්තො නාම නත්ථි, කථං චරහි නාමරූපමත්තෙන ගමනාදිකිච්චසිද්ධි හොතීති? අනුයොගං සන්ධායාහ: (1211) **යථාපි** ති ආදිං. අයම්පනෙත්ථ සංඛෙපත්ථො:

යථා දාරුමයයන්තං **නිජ්ජීවං** ජීවවිරහිතං අබ්භන්තරෙ වත්තමානස්ස ජීවස්ස අභාවතො, තතො යෙව **නිරීහකං** නිබ්‍යාපාරං, අථ ච පන **දාරුරජ්ජුසමායොගෙ** පච්චයවිසෙසවසෙන තං දාරුයන්තං **ගච්ඡතිපි තිට්ඨතිපි,** සජීවං සබ්‍යාපාරං විය ගමනාදිකිච්චං සාධෙන්තමිව ඛායති, තථා ඉදං නාමරූපම්පි කිඤ්චාපි නිජ්ජීවං නිරීහකං ච, අථ ච පන අඤ්ඤමඤ්ඤසංගතපච්චයවිසෙසස්ස[2] සමායොගෙ සජීවං සබ්‍යාපාරං ගච්ඡන්තං තිට්ඨන්තං විය ඛායතීති. (1213.) **සච්චතො** ති භූතතො; පරමත්ථතොති වුත්තං හොති. ඉදං නාමරූපං අභිසංඛතයන්තමිව සුඤ්ඤං ජීවාදිනා, පච්චයෙහි අභිසංඛතං ඉදං නාමරූපං යන්තමිව සුඤ්ඤන්ති වා සම්බන්ධො. **දුක්ඛස්ස පුඤ්ජො** ති නිච්චාතුරතාය දුක්ඛස්ස රාසි. **තිණකට්ඨාදිසො** ති අත්තසුඤ්ඤතාය තිණ-කට්ඨූපමො.

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. - සංඛත පච්චය -

(1215) **යමකං** ති යුගලං, සො චස්ස යමකභාවො අඤ්ඤමඤ්ඤනිස්සිතභාවෙනාති ආහ **උභො අඤ්ඤමඤ්ඤනිස්සිතා** ති. තතො එව **එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති,** න හි කදාචි පඤ්චවොකාරභවෙ මරණවසෙන රූපෙ නිරුජ්ඣන්තෙ අරූපං අනිරුජ්ඣන්තං අරූපෙ වා නිරුජ්ඣන්තෙ රූපං අනිරුජ්ඣන්තං අත්ථි; එකවොකාරභව-චතුවොකාරභවෙසු පන තෙසං අඤ්ඤමඤ්ඤං අනිස්සිතප්පවත්තියා කාරණං හෙට්ඨා වුත්තමෙවාති. සො පනායං භංගො පච්චයවසෙනෙව; පච්චයනිරොධෙනෙව නාමරූපනිරොධොති අත්ථො. පච්චයාති වා පච්චයභූතා; අඤ්ඤමඤ්ඤස්ස පච්චයා හොන්තාපි එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති යෙවාති අත්ථො.

(1216) **නිතෙජං** ති තෙජහීනං ආනුභාවවිරහිතං; යත්ථ පන තං නිතෙජං තං දස්සෙතුං න බ්‍යාහරතී ති ආදි වුත්තං. න හි අඤ්ඤත්ථ සද්දහනුස්සාහනාදිසු නාමං නිතෙජං ති සක්කා වත්තුං, නාපි රූපං සන්ධාරණබන්ධනාදිසු. තෙනෙව හි **තථාරූපම්පි නිතෙජං** ති වත්වා **භුඤ්ජාමීති** =පෙ= **න විජ්ජති** ති වුත්තං. (1220.) **නිස්සාය** ති ආදිනා ව්‍යතිරෙකවසෙන පි නාමරූපස්ස නිතෙජතං යෙව විභාවෙති. රූපං ගමනාදික්‍රියාසු නාමං නිස්සාය පවත්තති; නාමං දස්සනාදිකිරියාසු රූපං නිස්සාය. අඤ්ඤමඤ්ඤං නිස්සාය චස්ස අත්තකිච්චසිද්ධිපි පච්චෙකං අසමත්ථතං විභාවෙති; තථා හි නාමරූපස්ස අත්තසුඤ්ඤතා නිබ්‍යාපාරතා ච සුට්ඨුතරං පාකටා හොන්තීති.

කථං පන පච්චෙකං අසමත්ථානං සමූහිතභාවෙ[2] සති සමත්ථතා හොති, අසාමග්ගියං අහෙතූනං සාමග්ගියම්පි අහෙතුකභාවාපත්තිතො? න හි පච්චෙකං දට්ඨුං අසක්කොන්තානං අන්ධානං සතං පි සහස්සම්පි සමූහිතං[3] දට්ඨුං සක්කොතීති චොදනං හදයෙ කත්වා ආහ (1221.) **ඉමස්ස පනා** ති ආදිං. උපමායපි හි අසිද්ධො අත්ථො සාධෙතබ්බො; තෙනෙවාහ: "උපමං තෙ කරිස්සාමි; උපමාය පිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ජානන්තී"ති අයමපනෙත්ථ ජච්චන්ධපීඨසප්පීනං උපමා:- යදා[4] ජච්චන්ධො පීඨසප්පී ච දිසා පක්කමිතුකාමා අස්සු: ජච්චන්ධො පීඨසප්පිං එවමාහ: අහං බො භණෙ සක්කොමි පාදෙහි පාදකරණීයං කාතුං; නත්ථි ච මෙ චක්ඛූනි යෙහි සමවිසමං පස්සෙය්‍යං ති. පීඨසප්පීපි ජච්චන්ධං එවමාහ: "අහං බො භණෙ සක්කොමි චක්ඛුනා චක්ඛුකරණීයං

1. M. සංඛතපච්චයවිසෙසස්ස. 2. M. සමුදිතභාවෙ. 3. M. සමුදිතං.
4. M. B. M. යථා.

**කාතුං**. තත්ථ ච මෙ පාද යෙහි අභික්කමෙය්‍යං වා පටික්කමෙය්‍යං වා"ති. සො තුට්ඨහට්ඨො ජච්චන්ධො පීඨසප්පිං අංසකූටං ආරොපෙසි. පීඨසප්පී ජච්චන්ධස්ස අංසකූටෙ නිසීදිත්වා එවමාහ "වාමං මුඤ්ච, දක්ඛිණං ගණ්හ; දක්ඛිණං වා මුඤ්ච, වාමං ගණ්හා"ති. තත්ථ ජච්චන්ධොපි නිත්තෙජො දුබ්බලො, න සකෙන බලෙන ගච්ඡති; තථෙව පීඨසප්පිපි න සකෙන බලෙන ගච්ඡති. න ච තෙසං අඤ්ඤමඤ්ඤං නිස්සාය ගමනං නප්පවත්තති එවමෙව නාමම්පි නිත්තෙජං, න සකෙන තෙජෙන උප්පජ්ජති, න තාසු තාසු කිරියාසු පවත්තති. රූපම්පි නිත්තෙජං, න සකෙන තෙජෙන උප්පජ්ජති, න තාසු තාසු කිරියාසු පවත්තති. න ච තෙසං අඤ්ඤමඤ්ඤං නිස්සාය උප්පත්ති වා පවත්ති වා න හොති. තෙනාහු පොරාණා:

"න සකෙන බලෙන ජායරෙ,
නොපි සකෙන බලෙන තිට්ඨරෙ,
පරධම්මවසානුවත්තිනො
ජායරෙ සංඛතා අත්තදුබ්බලා.
පරපච්චයතො ච ජායරෙ,
පරආරම්මණතො සමුට්ඨිතා;
ආරම්මණපච්චයෙහි ච
පරධම්මෙහි ඉමෙ පභාවිතා"ති

ඉදානි නාවායන්තිකූපමායපි නාමරූපානං අවසවත්තිතං විභාවෙතුං (1222.) **යථාපි** ති ආදිගාථාද්වයං වුත්තං. තත්ථ **නිස්සායා** ති පතිට්ඨාය. **යන්තී** ති ගච්ඡන්ති. **මනුස්සෙ නිස්සායා** ති හෙතුභූතෙ නියාමක-කම්මකාරාදිමනුස්සෙ නිස්සාය.[1] න හි තෙසං ආරම්මණගහණ[2] - ලඞ්කාරසණ්ඨාපන - උදකුස්සිඤ්චනාදිකිරියාය විනා නාවා ඉච්ඡිතදෙසං පාපුණාති. යථා පන උභොපි අඤ්ඤ-මඤ්ඤං නිස්සාය අණ්ණවෙ ගච්ඡන්ති, එවං නාමං ච රූපං ච උභො අඤ්ඤමඤ්ඤං නිස්සිතා පවත්තන්තී ති අධිප්පායො.

(1224.) **සන්තානසඤ්ඤං විනොදෙත්වා** ති යථාවුත්තනයෙහි අනාදිකාලභාවිතං ඛන්ධපඤ්චකෙ සන්තානගාහං වික්ඛම්භෙත්වා. **නාමරූපස්ස =පෙ= වුච්චතී** ති ඉදං නාමං එත්තකං, න ඉතො-භීයො, "ඉදං රූපං එත්තකං, ඉදං රූපං න ඉතො භීයො"ති ච එවං සබ්බාකාරෙන තෙසං සලක්ඛණසලලක්ඛණමුඛෙන තංමත්ත-භාවදස්සනං එතං අත්තදිට්ඨිමලවිසොධනතො **දිට්ඨිසුද්ධී ති වුච්චති**,

1. M. අපස්සාය. 2. M. සරණගහණ.

බුද්ධාදීහීති අත්ථො. න කෙවලං චෙතං දිට්ඨිවිසුද්ධි යෙව නාමරූප-වවත්ථානංතිපි එතස්සෙව අධිවචනං ති වෙදිතබ්බං. (1225.) **ජාතිආදිතො** ති ජාතිජරාව්‍යාධිආදිතො දුක්ඛතො. යථාහ: “ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධි පි දුක්ඛො, මරණම්පි දුක්ඛං, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. සංඛිත්තෙන පඤ්චුපාදා-නක්ඛන්ධාපි දුක්ඛා”ති. **අන්තද්වයං** ති සස්සතුච්ඡෙදසංඛාතං අන්තද්වයං. අථ වා සත්තස්ස අච්චන්තං අත්ථිභාවසංඛාතං තස්ස නත්ථිභාවසංඛාතං ච අන්තද්වයං. පරමත්ථතො අනුප-ලබ්භනතො හි සත්තො අත්ථී ති වජ්ජෙතබ්බමෙව. ලොකසං-කෙතතො ච උපලබ්භනතො නත්ථීතිපි වජ්ජෙතබ්බමෙවාති, සුට්ඨුතරං පරිසුද්ධං කරොතී ති සම්බන්ධො.

(1226.) **දිට්ඨිගතාදිමලානී**ති දිට්ඨිගතසංඛාතානි මලානි. **අසෙසං** නිස්සෙසතො. **නාසං** විනාසං වික්ඛම්භනං උපෙන්ති. තථා හෙතං දිට්ඨිමලවිසොධනතො දිට්ඨිවිසුද්ධීති වුච්චති.

**ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම අභිධම්මාවතාර**
**සංවණ්ණනාය අට්ඨාරසමපරිච්ඡෙද**
**වණ්ණනා නිට්ඨිතා.**

# එකූනවීසතිමපරිච්ඡෙදවණ්ණනා.

## කඞ්ඛාවිතරණවිසුද්ධිනිද්දෙසො.

අනන්තරං නිද්දිට්ඨාය දිට්ඨිවිසුද්ධියා විසයභාවෙන දස්සිතත්තා (1127.) **එතස්සා**ති වුත්තං, න තදඤ්ඤතො විසෙසනත්ථං, තදඤ්ඤස්ස ච අභාවතො. අජ්ඣත්තංවා හි විපස්සනාභිනිවෙසො හොතු බහිද්ධා වා, අත්ථසිද්ධියං පන ලක්ඛණතො සබ්බම්පි නාමරූපං අනවසෙසතො පරිග්ගහිතමෙව හොතීති. **ජානිත්වා හෙතුපච්චයෙ**ති හෙතුපච්චයෙ පරිග්ගණ්හිත්වා; හෙතුපච්චයෙ පරිග්ගණ්හන-හෙතූති වුත්තං හොති. පච්චයපරිග්ගහණහෙතු හිස්ස අද්ධාත්තයෙ කඞ්ඛාවිතරණං හොතීති. **විතරිත්වා**ති අතික්කමිත්වා, වික්ඛම්භෙත්වාති අත්ථො. තං පන ඤාණං තථාධිගතං[1] වසීභාවප්පත්තං ඨානං විය යොගිනො සන්තානෙ පබන්ධවසෙන පවත්තතීති කත්වා වුත්තං ඨිතන්ති. (1229.) **නාමරූපස්ස =පෙ= ආවජ්ජෙත්වා**ති යථා නාම කුසලො භිසක්කො රොගං දිස්වා තස්ස සමුට්ඨානං පරියෙසති, යථා වා පන අනුකම්පකො පුරිසො කුමාරං උත්තානසෙය්‍යකං රථිකාය නිපන්නං දිස්වා කස්ස නු ඛො අයං පුත්තකොති තස්ස මාතාපිතරො පරියෙසති[2], එවමෙවං නාමරූපස්ස කො හෙතු, කො වා පච්චයො භවෙ; න තාවෙතං අහෙතුකං, සබ්බත්ථ සබ්බදා සබ්බෙසං ච එකසදිසාභාවතො[3], න ඉස්සරාදිහෙතුකං, නාමරූපතො උද්ධං ඉස්සරාදීනං අභාවතො. යෙපි නාමරූපමත්තමෙව ඉස්සරාදයොති වදන්ති, තෙසං ඉස්සරාදිසංඛාත-නාමරූපස්ස අහෙතුකභාවාපත්තිතො. තස්මා භවිතබ්බමස්ස හෙතුප්පච්චයෙහි, කෙ නු ඛො නාමරූපස්ස හෙතුප්පච්චයෙති ආවජ්ජෙත්වාති අත්ථො.

එවං තාව කත්වා ඉමස්ස නාමරූපස්ස හෙතුප්පච්චයෙ පරිග්ගණ්හන්තෙන ඔළාරිකත්තා සුපාකටත්තා ච රූපස්ස පච්චයපරිග්ගහො සුකරොති පඨමං තස්ස පච්චයපරිග්ගහො කාතබ්බොති දස්සෙන්තො ආහ. (1229.) **රූපකායස්සා**ති ආදිං තත්ථ යථා නාමරූපස්ස පච්චයපරිග්ගහො අහෙතු - විසමහෙතු-වාදනිවත්තියා හොති, එවං නිබ්බිදාවිරාගාවහභාවෙන තත්ථ තත්ථ අභිරතිනිවත්තියාපි ඉච්ඡිතබ්බොති තං ද්වත්තිංසාකාරවසෙන දස්සෙතුං (1230) **කෙසා ලොමා**ති ආදි වුත්තං. (1232.) **අවිජ්ජා** =පෙ= **පච්චයො මතො**ති අවිජ්ජා තණ්හා උපදානං කම්මන්ති ඉදං චතුබ්බිධං ධම්මජාතං එතස්ස යථාවුත්තස්ස

---

1. M. තථාවිගතං. 2. M. ආවජ්ජති. 3. M එකසදිසභාවාපත්තිතො.

රූපකායස්ස හෙතු; ආහාරො පච්චයොති අත්ථො. කස්මා පන පුරිමං හෙතු, ඉතරො පච්චයොති චොදනං සන්ධාය (1233.) **ජනකොති** ආදිං වත්වා තං ලොකවසෙන සමත්ථෙතුං **හෙතඞ්කුරස්සාති** ආදි වුත්තං. තත්ථ ජනකොති අනුපාලකොති ච අනෙනාගතහෙතුත්ථමිදං විසෙසනං. ජනකත්තා අනුපාලකත්තාති වුත්තං හොති. තත්ථ ජනකත්තාති නිබ්බත්තකත්තා. ඉමිනා බීජං විය අංකුරස්ස අවිජ්ජාදයො රූපකායස්ස අසාධාරණකාරණතාය හෙතූති දස්සිතං. අනුපාලකත්තාති උපත්ථම්භකත්තා. ඉමිනා පන අංකුරස්ස පඨවීසලිලාදයො විය ආහාරො සාධාරණකාරණතාය පච්චයොති දස්සිතන්ති වෙදිතබ්බං.

(1234.) **ඉතිමෙ පඤ්ච** =පෙ= **ගතාති** එවමෙතෙ අවිජ්ජාදයො පඤ්චධම්මා යථාරහං හෙතුභාවං පච්චයභාවං ච ගතා; **මාතාව උපනිස්සයාති** අවිජ්ජා භවෙසු විජ්ජමාන-දොසපටිච්ඡාදකභාවෙන තණ්හා පත්ථනාභාවෙන උපාදානං දළ්හගාහභාවෙනාති එවං සංඛාරභවානං හෙතුභූතා ජනකසභාවතාය, භවනිකන්ති තංසහජාත-ආසන්නකාරණත්තා අභිසංඛාරිකා අපස්සයභූතා චාති මාතා විය උපනිස්සයා හොන්ති. යථා පිතුජනිතසුක්කො[1] පුත්තස්ස උප්පත්තීති පිතා ජනකො, එවං කම්මං සත්තස්ස උප්පාදකත්තා ජනකන්ති ආහ. (1235.) යථා ධාතී ජාතස්ස කුමාරස්ස වඩ්ඪිකා සන්ධාරිකා[2], එවං ආහාරො උප්පන්නස්ස කායස්ස උපබ්‍රූහෙතා සන්ධාරකො චාති වුත්තං **ධාතී විය** =පෙ= **ධාරකො** භවෙති. කාමං චෙත්ථ අවිජ්ජාදයො නාමකායස්සපි පච්චයො; පකාරන්තරෙන පන තස්ස පාකටං පච්චයපරිග්ගහවිධිං දස්සෙතුං (1236.) **චක්ඛුං චාති** ආදි වුත්තං. තත්ථ **චක්ඛුඤ්චාති** චසද්දො සමුච්චයත්ථො. තෙන චක්ඛුවිඤ්ඤාණස්ස ආවජ්ජනාදිං අජ්ඣත්තං සබ්බං පච්චයජාතං සංගණ්හාති. **රූපමාලොකමෙව චාති** පුන චසද්දෙන යථා බාහිරරූපං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයො, යථා ච ආලොකො උපනිස්සයපච්චයො, එවං අඤ්ඤම්පි බාහිරං පච්චයජාතං සංගණ්හාති. **පටිච්චාති** පච්චයභූතං ලද්ධාති අත්ථො. තෙන චක්ඛුස්ස නිස්සය-පුරෙජාත-ඉන්ද්‍රිය-විප්පයුත්ත-අත්ථි-අවිගතවසෙන, රූපාලොකානං ච යථාසම්භවං ආරම්මණ-උපනිස්සය-පුරෙජාත-අත්ථි-අවිගතවසෙන, ඉතරසද්ද-සංගහිතානං[3] අනන්තරාදි-සහජාතාදිවසෙන පච්චයභාවං දස්සෙති. ආදිසද්දෙන

1. M.—ජනිතසුක්කෙන. 2. M. වඩ්ඪිකා සන්ධාරිකා. 3. M. ඉතරසං ච සද්දසංගහිතානං

ඵස්සාදීනං විය සහ පච්චයෙහි සොතවිඤ්ඤාණාදීනං සංගහො වෙදිතබ්බො. එවං සම්මසනූපගං සබ්බං නාමං සහ පච්චයෙන සංගහිතං හොති. තෙනාහ "නාමකායස්ස පච්චයං පරිග්ගණ්හාතී"ති

(1238.) **වුත්තිං දිස්වානා**ති එතරහි පවත්තිං දිස්වා. **තථෙවිදං**ති ඉමිනා න කෙවලං සප්පච්චයනාමත්තමෙව පච්චාමට්ඨං, අථ ඛො යාදිසෙහි එතරහි පවත්තති තාදිසෙහි අවිජ්ජාදිප්පච්චයෙහෙව අතීතෙපි පවත්තිත්ථාති පච්චයසදිසතාදි[1] පරාමට්ඨන්ති[2] දට්ඨබ්බං. (1240.) **පුබ්බන්තෙනා**ති අතීතක්ඛන්ධ-කොට්ඨාසෙ[3]. **පඤ්චධාගතා**ති "අහොසිං නු ඛො අහං අතීතමද්ධානං, න නු ඛො අහොසිං අතීතමද්ධානං, කින්නු ඛො අහොසිං අතීතමද්ධානං, කථන්නු ඛො අහොසිං අතීතමද්ධානං, කිං හුත්වා කිං අහොසිං නු ඛො අතීතමද්ධාන"න්ති එවං පඤ්චහි ආකාරෙහි ආගතා පවත්තා වා. **අපරන්තෙනා**ති අනාගතෙ ඛන්ධකොට්ඨාසෙ. **පඤ්චධා සමුදීරිතා**ති "භවිස්සාමි නු ඛො අහමනාගතමද්ධානං, නනු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අනාගතමද්ධාන"න්ති එවං පඤ්චධා කථිතා. (1241.) **පච්චුප්පන්නෙනාපි අද්ධානෙනා**ති එතරහි පටිසන්ධිමාදිං කත්වා චුතිපරියන්තෙන අද්ධානෙපි. අද්ධානග්ගහණෙන වෙත්ථ පච්චුප්පන්නං ඛන්ධකොට්ඨාසමෙව වදති. න හි තබ්බිනිම්මුත්තො[4] අඤ්ඤො කොචි කාලො නාම අත්ථීති. **ඡබ්බිධා පරිකිත්තිතා**ති "අහං නු ඛොස්මි, නො නු ඛොස්මි, කින්නු ඛොස්මි, කථං නු ඛොස්මි, අයං නු ඛො සත්තො කුතො ආගතො සො කුහිංගාමී භවිස්සතී"ති එවං පච්චුප්පන්නං[4] ආරබ්භ[4] ඡබ්බිධා වුත්තා. (1241.) "සබ්බෙ තසන්ති දණ්ඩස්සා"ති ආදීසු විය පදෙසෙපි සබ්බසද්දස්ස පවත්තනතො **සබ්බථා**ති වත්වාපි **අනවසෙසා**ති වුත්තං. නත්ථි එතිස්සා අවසෙසො අවසිට්ඨොති අනවසෙසා; සොළසවිධාපි චෙසා කංඛා[4] එකකංඛාවසෙනපි අනවසිට්ඨා හුත්වාති වුත්තං හොති. **පහීයතී**ති වික්ඛම්භනවසෙන පහීයති.

කාමං නාමරූපමත්තං විනා සත්තස්ස අදස්සනෙන දිට්ඨිවිසුද්ධියාව පච්චුප්පන්නෙ කංඛා පහීණා, අතීතානාගතකං-ඛානං පහාණෙන පච්චුප්පන්නෙ කංඛාය අතිසයප්පහාණං දස්සෙතුං ඉධෙව සා වුත්තා. අථ වා පච්චුප්පන්නෙ නිස්සත්ත-නාමරූපස්ස පච්චයෙසු පවත්තකංඛාය ඉධෙව තීරණතො සා

1. M. පච්චයසහිතතාපි 2. M. පච්චාමට්ඨාති. 3. M. අතීතක්ඛන්ධප්ප ඛන්ධකොට්ඨාසෙ, 4. M. පොත්ථකෙ නත්ථි.

ඉධ වුත්තා. **වණ්ණභණනං** වා එතං ඉධ පච්චුප්පන්නක්ඛන්ධාන පහාණවචනං, යථා තං සෝතාපත්තිමග්ගාදිසු පහීණානමපි "පඤ්චන්නං ඕරම්භාගියානං සංයෝජනානං පහාණා"ති ආදිනා අනාගාමිමග්ගාදිසු වචනං ති.

(1242.) **කම්මවිපාකානං වසෙන** පී ති පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා, අයූහනං සංඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉති ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්ම-භවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා. ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනාති ඉමෙ පඤ්ච ධම්මා ඉධූපපත්තිභවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා. ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා =පෙ= චෙතනා භවො, ඉති ඉමෙ පඤ්ච ධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයාති එවා වුත්තානං කම්මවට්ට-විපාකවට්ටානං වසෙන. කිලෙසවට්ටො පි චෙත්ථ කම්මසභාගත්තා කම්මවට්ටෙනෙව සංගහිතොති දට්ඨබ්බං. **දිට්ඨ-ධම්මවෙදනීයං** ති එත්ථ දිට්ඨධම්මො වුච්චති පච්චක්ඛභූතො පච්චුප්පන්නො අත්තභාවො, තත්ථ වෙදිතබ්බඵලං කම්මං දිට්ඨධම්මවෙදනීයං. **උපපජ්ජාපරපරියාහොසිකම්මවසා පනා** ති උපපජ්ජවෙදනීය - අපරාපරියවෙදනීය - අහොසිකම්මවසෙන. උත්තරපදලොපවසෙන උපපජ්ජාපරපරියංති වුත්තං.

තත්ථ පච්චුප්පන්නභවතො අනන්තරං උපපජ්ජිත්වා වෙදි-තබ්බඵලං කම්මං **උපපජ්ජවෙදනීයං** අපරෙ අපරෙ දිට්ඨධම්මතො අඤ්ඤස්මිං අඤ්ඤස්මිං යත්ථ කත්ථචි අත්තභාවෙ වෙදිතබ්බඵලං කම්මං **අපරාපරියවෙදනීයං**. අහොසි එව කම්මං, න තස්ස විපාකො අහොසි, අත්ථි, භවිස්සති චාති එවං වත්තබ්බං කම්මං **අහොසිකම්මං** [117.] පටිපක්ඛෙහි අනභිභූතතාය පච්චයවිසෙසෙන පටිලද්ධවිසෙසතාය ච බලප්පත්තා[1] තාදිසස්ස පුබ්බාභිසංඛාරස්ස වසෙන සාතිසයා හුත්වා පවත්තා **පඨමජවනචෙතනා** තස්මිං යෙව අත්තභාවෙ ඵලදායිනී **දිට්ඨධම්මවෙදනීයා** නාම. සා හි වුත්තාකාරෙන බලවති ජවනසන්තානෙ ගුණවිසෙසයුත්තෙසු උපකාරානුපකාරවසප්පවත්තියා ආසෙවනාලාභෙන අප්පවිපාක-තාය[2] ච ඉතරද්වයං විය පවත්ත - සන්තානුපරමාපෙක්ඛං ඔකා-සලාභාපෙක්ඛං ච කම්මං න හොතීති ඉධෙව පුප්ඵමත්තං විය පවත්තිවිපාකමත්තං අහෙතුකඵලං දෙති, සහෙතුක - ඵලදානෙ පන පටිසන්ධිආකඩ්ඪනමපි ආපජ්ජෙය්‍ය. **තථා අසමත්ථානං** ති කම්මස්ස විපාකදානං නාම උපධි - පයොගාදි - පච්චයන්තර

1. M. බලවභූවප්පත්තා. 2. B. අප්පවිහිතවිපාකතාය.

සමවායවසෙනෙව හොතීති තදභාවතො තස්මිං යෙව අත්තභාවෙ විපාකං දාතුං **අසක්කොන්තං; අහොසි කම්මං =පෙ= කම්මවිපාකො** ති එත්ථ අහොසි කම්මං ති පදං විසුං විසුං යොජෙතබ්බං. අහොසි කම්මං, නාහොසි කම්මවිපාකො; අහොසි කම්මං, න භවිස්සති කම්මවිපාකො; අහොසි කම්මං, නත්ථි කම්මවිපාකොති. තත්ථ සකසකකාලාතික්කන්තස්ස උපපජ්ජවෙදනීයස්ස දිට්ඨධම්මවෙදනීයස්ස ච වසෙන පුරිමං වුත්තං. තං හි කම්මස්ස විපාකකාලස්ස ච අතීතත්තා තථා වත්තබ්බතං ලභති. දුතියං අනාගතෙ අරහත්තං පාපුණන්තස්ස පුරිමභවෙසු කතං අදින්නවිපාකං අපරාපරියවෙදනීයං සන්ධාය වුත්තං. තතියං පන අනන්තරභවෙ කතං උපපජ්ජවෙදනීයං, අරහතො අතීතභවෙසු කතං අපරාපරියවෙදනීයං ච සන්ධාය වුත්තං.

අපරෙ පන එකමෙව අතීතං කම්මං අද්ධාත්තයෙ විපාකාභාවං සන්ධාය තිධා විභජිත්වා වුත්තං ති වදන්ති. **අත්ථසාධිකා පනා** ති පාණාතිපාතාදි - අත්ථස්ස නිප්ඵාදිකා. කා පන සාති ආහ **සත්තමජවනචෙතනා** ති. සා හි සන්නිට්ඨාපකචෙතනා වුත්තනයෙන පටිලද්ධවිසෙසා පටිසන්ධියා අනන්තරපච්චයභාවිතො විපාකසන්තානස්ස අනන්තරපච්චයභාවෙන වා තථා අභිසඞ්ඛතා සමානා අනන්තරඅත්තභාවෙ විපාකදායිනී උපපජ්ජවෙදනීයං නාම. යෙභුය්‍යවුත්තියා චෙත්ථ සත්තමජවනචෙතනා ති වුත්තා. පච්චවෙක්ඛණ - වසිතාදිප්පවත්තියං පන පඤ්චමාදිකාපි හොති.

**විපාකං දෙතී** ති පටිසන්ධිං දත්වා පවත්තිවිපාකං දෙති; අදින්නපටිසන්ධිකං පන පවත්තිවිපාකං දෙතීති නත්ථි; චුති-අනන්තරං හි උපපජ්ජවෙදනීයස්ස ඔකාසොති ආචරියා. පටිසන්ධියා පන දින්නාය ජාතිසතෙපි පවත්තිවිපාකං දෙති. තෙනාහ භගවා: "තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා[1] පාටිකඞ්ඛිතබ්බා"ති. **උභින්නං =පෙ= දෙතී** ති යථාවුත්තකාරණවිරහතො දිට්ඨධම්මුපපජ්ජවෙදනීයභාවං අසම්පත්තා පඤ්චචෙතනා විපාකදානසභාවස්ස අනුපච්ඡින්නත්තා යදා ඔකාසං ලභති තදා පටිසන්ධිවිපාකං පවත්තිවිපාකං වා දෙති. **සති සංසාරප්පවත්තියා =පෙ= දෙතී** ති ඉමිනා අසති සංසාරප්පවත්තියං අහොසිකම්මපක්ඛෙ තිට්ඨති, විපච්චනොකාසස්ස අභාවතො ති දීපෙති.

(1244.) එවං තාව විපාකදානකාලවසෙන චතුබ්බිධතං දස්සෙත්වා ඉදානි විපාකදානපරියායතො කිච්චතො පි චතුබ්බිධතං දස්සෙතුං **ගරුකං** ති ආදි වුත්තං. තත්ථ **ගරුකං** ති මහාසා-

1. M පොත්ථකෙ නත්ථි

වජ්ජං, මහානුභාවං ච, අඤ්ඤෙන පන කම්මෙන පටිබාහිතුං අසක්කුණෙය්‍යං.[1] **බහුලං** ති අභිණ්හසො කතං, එකවාරං කත්වාපි අභිණ්හසමාසෙවිතං. **ආසන්නං** ති මරණාසන්නකාලෙ අනුස්සරිතං, තදා කතං වා. **කටත්තාකම්මං** ති ගරුකාදිභාවං අසම්පත්තං කතමත්තතො යෙව කම්මංති වත්තබ්බං කම්මං. තත්‍ථ කුසලං වා හොතු අකුසලං වා, ගරුකාගරුකෙසු යං ගරුකං මාතුඝාතකාදි කම්මං වා මහග්ගතකම්මං වා, තදෙව පඨමං විපච්චති. තථා බහුලාබහුලෙසු යං බහුලං සුසීල්‍යං වා දුස්සීල්‍යං වා තදෙව පඨමං විපච්චති. දූරාසන්නෙසු යං ආසන්නං, මරණකාලෙ අනුස්සරිතං, තෙනෙව උප්පජ්ජති. ආසන්නකාලෙ කතෙ වත්තබ්බමෙව නත්‍ථි ති වුත්තං. කටත්තාපන කම්මං පුනප්පුනං ලද්ධාසෙවනං පුරිමානං අභාවෙ පටිසන්ධිං ආකඩ්ඪති. ඉති ගරුකං සබ්බපඨමං විපච්චති, තථා හි තං ගරුකංති වුත්තං. ගරුකෙ අසති බහුලීකතං, තස්මිංපි අසති කටත්තාකම්මං ති වුත්තං **පුරිමජාතිසු කතකම්මං විපච්චතී** ති.

පටිසන්ධිදානාදිවසෙන විපාකසන්තානස්ස නිබ්බත්තකං **ජනකං**. සුඛදුක්ඛසන්තානස්ස නාමරූපප්පබන්ධස්ස චිරතරප්පවත්ති-හෙතුභූතං **උපත්ථම්භකං**. තෙනාහ [117.] "සුඛදුක්ඛං උපත්ථම්භෙති, අද්ධානං පවත්තෙතී"ති. සුඛදුක්ඛෙ පවත්තමානෙ බව්හාබාධතාදි පච්චයූපනයනෙන[2] සණිකං සණිකං තස්ස විබාධකං **උපපීළකං**. තෙනාහ "සුඛදුක්ඛං පීළෙති බාධෙති, අද්ධානං පවත්තිතුං න දෙතී"ති. තථා පටිපක්ඛ-කම්මවිපාකස්ස අප්පවත්තිකරණවසෙන උපච්ඡෙදකං පටිබාහකං **උපඝාතකං**. තෙනාහ: "තස්ස විපාකං පටිබාහිත්වා"ති.

**117. රූපාරූපවිපාකක්ඛන්ධෙ**ති කම්මජරූපස්ස පි විපාක-පරියායො අත්‍ථීති රූපාරූපවිපාකක්ඛන්ධෙති වුත්තං. **අඤ්ඤෙන කම්මනා**ති, කුසලෙන වා අකුසලෙන වා අඤ්ඤෙන කම්මෙන කතත්තුභූතෙන දින්නාය පටිසන්ධියා විපාකෙ ජනිතෙ. තෙනාහ: **ජනිතෙ විපාකෙ**ති පවත්තිවිපාකං සන්ධාය **ජනිතෙ විපාකෙ**ති වුත්තංති[3] වදන්ති. අඤ්ඤෙන[3] කම්මෙන[3] උප්පජ්ජනකසුඛදුක්ඛං උපත්ථම්භෙතීති **උපත්ථම්භකකම්මං**. කුසලං සමානං අඤ්ඤෙන කුසලකම්මෙන උප්පජ්ජමානකං සුඛං තස්ස පටිපක්ඛවිබාධනවසෙන උපත්ථම්භෙති; අකුසලං අඤ්ඤෙන අකුසලකම්මෙන උප්පජ්ජමානං දුක්ඛං තථෙව උපත්ථම්භෙති. එවං ච උපත්ථම්භෙන්තං තං දීඝකාලං පවත්තෙතීති නාමාති ආහ **අද්ධානං පවත්තෙතී**ති.

1. M. අසක්කුණෙය්‍යකම්මං 2. M. - පච්චයූපනිපාතනෙන.
3. M. පොත්ථකෙ නත්‍ථි.

උප්පජ්ජමානකං සුඛදුක්ඛං පීළෙතීති උපපීළකං; අකුසලං සමානං සුඛිතස්ස රොගාදිවිමුත්තස්ස[1] රොගාදිඅන්තරායකාරණසම්පාදකභාවෙන සුඛසන්තානං උපච්ඡින්දිත්වා[2] පීළෙති. කුසලං ච රොගාදිනා දුක්ඛිතස්ස භෙසජ්ජාදිසුඛකාරණ - සම්පාදකභාවෙන දුක්ඛසන්තානං විච්ඡින්දන්තං පීළෙති. කෙචි පන සුඛදුක්ඛස්ස කාරණං අසම්පාදෙන්තම්පි පටිසන්ධිදායකකම්මස්ස පවත්තිවිපාකං පටිබාහිත්වා සයං විපාකදායකකම්මං උපපීළකකම්මන්ති වදන්ති. එවං සන්තෙ පන පටිසන්ධිදායකමෙව ජනකකම්මන්ති වුත්තං සියා. අපි ච උපඝාතකෙන සහ ඉමස්ස විසෙසාභාවො ආපජ්ජති, තං පටිසන්ධිවිපාකස්ස පටිබාහකන්ති චෙ? තං න; අවිසෙසෙන වුත්තත්තාති. [118.] **දුබ්බලං කම්මං ඝාතෙත්වා**ති වුත්තෙන තනුතස්ස පුබ්බෙ යෙව සිද්ධත්තා නිරුද්ධත්තා ච කථමිදං තදුපඝාතකං හොතීති ආපන්නං චොදනං සන්ධාය කම්මස්ස ඝාතනං නාම තස්ස විපාකපටිබාහනමෙවාති දස්සෙන්තො ආහ **තස්ස විපාකං පටිබාහෙත්වා**ති. තප්පටිබාහනං ච අත්තනො විපාකුප්පත්තියා ඔකාසකරණන්ති වුත්තං: **අත්තනො විපාකස්ස ඔකාසං කරොති**ති. විපච්චනාය කතොකාසං කම්මං විපක්කමෙව නාම හොතීති ආහ: **එවං පන කම්මෙන ඔකාසෙ කතෙ විපාකං උප්පන්නං** නාම හොතීති. උපපීළකං අඤ්ඤස්ස විපාකං උපච්ඡින්දති, න සයං අත්තනො විපාකං දෙති; උපඝාතකං පන දුබ්බලකම්මං උපච්ඡින්දිත්වා අත්තනො විපාකං උප්පාදෙතීති අයමෙතෙසං විසෙසො.

කෙචි පන ආචරියා අපරෙන පි නයෙන ජනකාදිකම්මෙ ඉච්ඡන්ති කථං? යස්මිං කම්මෙ කතෙ පටිසන්ධියං පවත්තෙ ච විපාකකටත්තාරූපානං උප්පත්ති හොති, තං **ජනකං**. යස්මිං පන කතෙ අඤ්ඤෙන ජනිතස්ස ඉට්ඨස්ස වා අනිට්ඨස්ස වා ඵලස්ස විබාධකවිච්ඡෙදකපච්චයානුප්පත්තියා උපබ්‍රූහකපච්චයුප්පත්තියා ච ජනකානුභාවානුරූපං පරිපොසකචිරතරප්පබන්ධා හොන්ති, තං **උපත්ථම්භකං**. ජනකෙන නිබ්බත්තිතං කුසලඵලං අකුසලඵලං වා යෙන පච්චත්ථිකභූතෙන රොග - ධාතුවිසමතාදිනිමිත්තතාය බාධියති, තං **උපපීළකං**. යෙන පන කම්මුනා ජනකසාමත්ථියවසෙන චිරප්පබන්ධාරහම්පි සමානං ඵලං විච්ඡෙදකපච්චයුප්පත්තියා උපහඤ්ඤති, විච්ඡිජ්ජති, තං **උපඝාතකන්ති**. එත්ථ ච කෙචි අප්පාබාධ - දීඝායුකතාසංවත්තනවසෙන දුතියස්ස කුසලභාවං, බව්හාබාධ-අප්පායුකතා-සංවත්තනවසෙන පච්ඡිමානං ද්වින්නං අකුසලභාවං ච වණ්ණයන්ති. භූරිදත්තාදීනං පන

1. M. පොත්ථකෙ නත්ථි. 2. M. **උපච්ඡින්දන්තං**.

නාගාදීනං, ඉතො අනුප්පදින්නායාපතක - පෙතානඤ්ච අපායෙසු අකුසලවිපාකස්ස උපත්ථම්භක - උපපීළක - උපඝාතකානි අකුසලකම්මානි සන්තීති චතුන්නම්පි කුසලාකුසලවොහාරො[1] න විරුජ්ඣති. කිඤ්චාපි කම්මානං කම්මන්තරං චෙව විපාකන්තරං ච බුද්ධානං කම්මවිපාකඤාණස්සෙව යථාවසරසතො පාකටං හොති; බුද්ධාවෙණිකං හෙතං අසාධාරණං සාවකෙහි. විපස්සකෙන පන එකදෙසතො ජානිතබ්බං. න හි සබ්බෙන සබ්බං අජානන්තස්ස පච්චයපරිග්ගහො පරිපූරති. තස්මා'ස්ස තාදිසං පච්චයපරිග්ගහං සන්ධාය [**118.**] **ඉති ඉ**මංති ආදි වුත්තං.

යාදිසෙහි පච්චයෙහි පච්චුප්පන්නෙ අද්ධානෙ නාමරූපස්ස පවත්ති, තාදිසෙහෙව ඉතරස්මිම්පි අද්ධයෙති එවං යථා අතීතානාගතෙ නයං නෙති, තං දස්සෙතුං **යථා ඉදං**ති ආදි වුත්තං. අද්ධත්තයෙපි කිරියාකිරිය - ඵලමත්තතා - දස්සනපරත්තාවොදනාය. **ඉති කම්මං චෙවා**ති ආදි වුත්තස්සෙවත්ථස්ස නිගමනවසෙන වුත්තං. **තස්සෙවං සමනුපස්සතො =පෙ= පහියතී**ති තස්සෙවං සමනුපස්සතො යා සා පුබ්බන්තාදයො ආරබ්භ "අහොසිං නු ඛො අහං"ති ආදිනා නයෙන පවත්තා විචිකිච්ඡා, සා[2] සබ්බා[2] පහියති, පහීණාය පන තාය සබ්බභව - යොනි - ගති - ඨිති - සත්තාවාසෙසු හෙතුඵලසම්බන්ධවසෙන පවත්තමානං නාමරූපමත්තමෙව ඛායති. තෙනෙවාහ: **හෙතුඵලසම්බන්ධවසෙන පවත්තමානං නාමරූපමත්තමෙව ඛායතී**ති, කාරණසාමග්ගියං දන්තාදීහි සාධිත-කිරියාය වත්තමානාය කරණමත්තෙ[3] කත්තු-වොහාරොති ආහ: **කරණතො උද්ධං කාරකං න පස්සතී**ති.

(1246.) **පාකපවත්තිතො උද්ධං =පෙ= පටිවෙදකං න පස්සතී**ති සම්බන්ධො. **පාකපටිවෙදක**ංති විපාකස්ස[4] විඳකං[4] එව අපස්සන්තො පන කරණෙ[5] සති කාරකොති විපාකප්පවත්තියා සති පටිසංවෙදකොති සමඤ්ඤාමත්තෙනෙව පණ්ඩිතා වොහරන්තීති යෙවාති[6] සම්මප්පඤ්ඤාය පස්සති. (1247.) **සුද්ධධම්මා**ති කෙනචි සත්තෙන වා පුග්ගලෙන වා අමිස්සධම්මා. **එවෙතං**ති එවංවිධං එතං දස්සනං. **සම්මදස්සනං**[2] අවිපරීතදස්සනංති අත්ථො. (1248.) **බීජරුක්ඛාදිකානං වා**ති බීජතො රුක්ඛො, රුක්ඛතො බීජංති එවං කාරණපරම්පරාගවෙසනෙ **අනාදිකාලිකත්තා**[7] බීජරුක්ඛසන්තානස්ස පුබ්බා කොටි නත්ථි. එවං කම්මප්පච්චයා විපාකො,

1. M. කුසලාකුසලභාවො. 2. M පොත්ථකෙ නත්ථි. 3. M. කාරණමත්තෙ. 4. M. විපාකවින්දනකං 5. M. කාරණෙ 6. M. ඉච්චෙවං-- 7. B. අනාදිගාමිකත්තා

විපාකපච්චයා කම්මංති ආදිපරියායෙන අනාදිකාලිකත්තා කම්මවිපාකසන්තානස්ස පුබ්බා කොටි න පඤ්ඤායති. ආදිසද්දෙන කුක්කුටියා අණ්ඩං, අණ්ඩතො කුක්කුටී, පුනපි කුක්කුටියා අණ්ඩංති එවමාදි සංවණ්ණනං[1] සංගණ්හාති.

(1242.) **අනාගතෙපි සංසාරෙති** යථා අතීතෙ එවං අනාගතෙපි අද්ධානෙ "ඛන්ධානං පටිපාටී"ති ආදිනා වුත්තසංසාරෙ සති. **අප්පවත්තිං න දිස්සතීති** කම්මතො විපාකො භවිස්සති, විපාකතො කම්මංති අනාගතෙ කාරියපරම්පරාය ගවෙසියමානාය අපරික්ඛීණසංයොජනස්ස **කම්මවිපාකානං** අප්පවත්තනං න දිස්සති; පවත්තන්ති එවාති අත්ථො. හෙතුඵලසම්බන්ධවසෙන පවත්තමානෙ සංසාරෙ පුබ්බා කොටි න පඤ්ඤායතීති වචනෙන කාරණෙ ආදිස්ස අභාවො පවුත්තො. **අප්පවත්තිං න දිස්සතීති** වචනෙන ඵලස්ස අවසානාභාවො වුත්තොති. (1249) **එතමත්ථංති** **කම්මස්ස කාරකො නත්ථීති** ආදිනා වුත්තමත්ථං. **අසයංවසී** න සයංවසිනො, මිච්ඡාභිනිවෙසපරවසාති අත්ථො. **අඤ්ඤමඤ්ඤවිරොධිනොති** ඉතරීතරවිරුද්ධා දිට්ඨියො. තිත්ථියා අඤ්ඤමඤ්ඤෙන සහ විරොධිනො. (1252,) ගම්භීරඤාණගොචරතාය ගම්භීරං තථා නිපුණං. සන්තසුඤ්ඤතාය අඤ්ඤමඤ්ඤසභාවසුඤ්ඤතාය ච සුඤ්ඤං. **පච්චයංති** නාමරූපස්ස පච්චයං. තප්පච්චයපටිවෙධෙනෙව සබ්බං පටිවිද්ධං හොතීති.

(1253.) **කම්මං නත්ථි විපාකම්හීති** කුඩ්ඩාදිසු රජාදයො විය විපාකෙ සන්නිධිමත්තං කම්මං නත්ථි. **පාකො කම්මෙ න විජ්ජතීති** තථා කම්මෙ සන්නිධිමත්තොපි විපාකො නත්ථි; පච්චයසුඤ්ඤං[2] ඵලංති.[2] යථාවුත්තමෙවත්ථං උපමාය විභාවෙතුං (1254.) **යථා න සූරියෙ අග්ගීති** ආදි වුත්තං. **මණිම්හීති** සූරියකන්තමණිම්හි. **න තෙසං බහිසො අත්ථීති** තෙ මුඤ්චිත්වා තෙසං[3] බහිසො අග්ගි නත්ථි. **සමාහාරෙහීති** සමංගීභූතෙහි[4] ආතපාදීහි තීහි කාරණෙහි. **න අඤ්ඤො කම්මස්සාති** ආදි අත්ථතො හෙට්ඨා වුත්තම්පි උපමානිගමනත්ථාය පුනපි වුත්තංති දට්ඨබ්බං. යදි හෙතු ච ඵලං ච අඤ්ඤමඤ්ඤරහිතං, කථං හෙතුතො ඵලනිබ්බත්තීති ආහ (1256.) **කම්මං ච ඛො උපාදායාති**. න කෙවලං කම්මඵලමෙව සුඤ්ඤං කත්තුරහිතං, සබ්බම්පි ධම්මජාතං කාරකරහිතංති දස්සෙතුං (1257) **න හෙත්ථ දෙවොති** ආදි ගාථා වුත්තා.

1. M. එවමාදිං. 2. M. පොත්ථකෙ නත්ථි. 3. M. තෙසු. 4. B. සාමග්ගිභූතෙහි.

**හෙතුසමහාරපච්චයා** ති එකෙන හෙතුනා එකස්ස අනෙකස්ස වා ඵලස්ස අනභිනිබ්බත්තිතො හෙතුසමූහනිමිත්තං. **සමහාරොති** වා පච්චයාධිවචනන්ති **හෙතුපච්චයනිමිත්තන්ති** අත්ථො (1258.) **අද්ධාසු තරිත්වා කඞ්ඛන්ති** තීසු අද්ධාසු සොළසවිධං කඞ්ඛං විතරිත්වා; න කෙවලමෙතං සොළසවිධමෙව කඞ්ඛං විතරති, අථ ඛො සත්ථරි කඞ්ඛතීති ආදිනයප්පවත්තං අට්ඨවිධකඞ්ඛම්පි පජහති. තථා හෙත්ථ බුද්ධො ධම්මො සඞ්ඝො සික්ඛාති කඞ්ඛාය ගොචරභූතා ලොකිකා ධම්මා අධිප්පෙතා. න හි ලොකුත්තරධම්මෙ ආරබ්භ කිලෙසා පවත්තිතුං සක්කොන්ති. **පුබ්බන්තෙනාති** අතීතඛන්ධායතනධාතුයො; **අපරන්තෙනාති** අනාගතඛන්ධායතනධාතුයො; **පුබ්බන්තාපරන්තෙනාති** තදුභයං. අද්ධාපච්චුප්පන්නං වා තදුභයභාවයුත්තත්තා පටිච්චසමුප්පන්නධම්මගහණෙන ගහිතො අට්ඨමො කඞ්ඛාවිසයො, නාමරූපමත්තං. ඉදප්පච්චයතාගහණෙන පන'ස්ස[2] පච්චයො ගහිතො තස්මා සොළසවත්ථුකාය පහීනාය අට්ඨවත්ථුකා කඞ්ඛා අප්පතිට්ඨාව හොතීති. එතාසං ච පහාණෙන ද්වාසට්ඨිදිට්ඨිගතානිපි වික්ඛම්භන්ති, දිට්ඨෙකට්ඨත්තා විචිකිච්ඡාය. යථා හි දිට්ඨි සමුච්ඡිජ්ජමානා විචිකිච්ඡාය සද්ධිං යෙව සමුච්ඡිජ්ජති. එවං විචිකිච්ඡා වික්ඛම්භියමානා දිට්ඨියා සද්ධිං යෙව වික්ඛම්භියති. අත්තාභිනිවෙසූපනිස්සයා හි "අහොසිං නු ඛො අහන්ති"ති ආදිනයප්පවත්තා සොළසවත්ථුකා කඞ්ඛා. සා එව පුබ්බන්තාදිවත්ථුකභාවෙන වුත්තා අත්තාභිනිවෙසවත්ථුකාති ච ද්වාසට්ඨිදිට්ඨිගතානි බුද්ධාදිවත්ථුකා කඞ්ඛා[3] ච තදෙකට්ඨාති. **උට්ඨිතන්ති** උප්පජ්ජිත්වා ඨිතං.

(1259.) **කඞ්ඛාවිතරණං නාමාති** යථාවුත්තකඞ්ඛාවිතරණතො කඞ්ඛාවිතරණං නාම; න කෙවලං කඞ්ඛාවිතරණං **ධම්මට්ඨිතිඤාණන්ති පි යථාභූතන්ති පි සම්මාදස්සනන්ති පි** ඉදං සමුදීරිතං. එවං ච ධරීයන්ති අත්තනො පච්චයෙහීති ධම්මා, තිට්ඨන්ති එත්ථ ඵලං තදායත්තවුත්තිතායාති ඨිති; ධම්මානං ඨිති **ධම්මට්ඨිති.** පච්චයාති[4] ධම්මා.[4] අථවා "ධම්මොති[5] ධම්මපටිසම්භිදා"ති ආදීසු විය ධම්මස්සභාවො[6], ධම්මතො ච අඤ්ඤො සභාවො නත්ථීති පච්චයධම්මානං පච්චයභාවො ධම්මට්ඨිතියං ඤාණං ධම්මට්ඨිතිඤාණං. සඞ්ඛාරානං යං[7] යං[7] භූතං අනිච්චතාදි තං යථාභූතං, තත්ථ ඤාණං යථාභූතඤාණං. සම්මා පස්සතීති සම්මාදස්සනං.

---

1. M. අනාගතා. 2. M. පන තස්ස. 3. M. පොත්ථකෙ නත්ථි. 4. M. පච්චයධම්මා. 5. M. ධම්මොති කාරණං. 6. M. ධම්මස්ස ඨිතිසභාවො.. 7. M. යථා

(1260) **ලද්ධප්පතිට්ඨෝ**ති සාසනෙ පතිට්ඨා නාම අරියමග්ගො. අයං පන තං අනධිගතොපි තදධිගමූපායපටිපත්තියා ඨිතත්තා ලද්ධප්පතිට්ඨො විය හොතීති ලද්ධප්පතිට්ඨොති වුත්තො. තතොයෙව චූළකො සොතාපන්නො ලොකියාහි සීලසමාධිපඤ්ඤාහි සමන්නාගතත්තා උත්තරිං අප්පටිවිජ්ඣන්තො සොතාපන්නො විය නියතො සුගතිපරායණො ච හොතීති [චූළ] සොතා-පන්නො හි ඛීණඅපායදුග්ගතිවිනිපාතොති. අථ ච ලද්ධප්පතිට්ඨො කංඛාවිතරණවිසුද්ධිසමධිගමෙන; සප්පච්චයනාමරූපදස්සනෙන ච පමද්දිතදිට්ඨිකණ්ටකො, විනිද්ධුතඅහෙතු-විසමහෙතුවාදො, යථාසකං පච්චයෙහෙව ධම්මප්පවත්තිං ඤත්වා සාසනෙ පතිට්ඨිතසද්ධො ලද්ධප්පතිට්ඨො නාම හොතීති. නාමරූපවවත්ථානෙන දුක්ඛසච්චං, ධම්මට්ඨිතිඤාණෙන සමුදයසච්චං, තස්සෙව අපරභාගෙ අනිච්චතොමනසිකාරාදිවිධිනා මග්ගසච්චං ච අභිඤ්ඤාය පවත්තියා දුක්ඛභාවං දිස්වා, තස්සා අප්පවත්තෙන නිරොධෙ එකංසෙනෙව නින්නජ්ඣා-සයතාය ලොකියෙනෙව ඤාණෙන චතුන්නං අරියසච්චානං අධිගතත්තා අපායෙසු අභබ්බුප්පත්තිකො, සොතාපන්නභූමියං ච භබ්බුප්පත්තිකො හොතීති චූළසොතාපන්නො නාමාති වුත්තං **සොතාපන්නො හි චූළකො**ති.

(.1261) **තස්මා**ති යස්මා එවං මහානිසංසං එතං ඤාණං, තස්මා. **සපඤ්ඤො** අත්තනො හිතානුපෙක්ඛනපඤ්ඤාය සමන්නාගතො, තෙනාහ **අත්ථකාමො**ති.

ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම
අභිධම්මාවතාරසංවණ්ණනාය එකූනවීසතිමපරිච්ඡේද
වණ්ණනා නිට්ඨිතා.

# වීසතිම පරිච්ඡෙදවණ්ණනා

## මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිකථා.

ඉදානි කඞ්ඛාවිතරණවිසුද්ධියා අනන්තරං උද්දිට්ඨමග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධියා නිද්දෙසක්කමො අනුප්පත්තො, සා පන යස්මා ඔභාසාදිඋපක්කිලෙසසම්භවෙ සති හොති; ඔභාසාදයො ච උදයබ්බයඤාණෙ සම්භවන්ති, උදයබ්බයඤාණං ච තිලක්ඛණවිපස්සනාය සති උප්පජ්ජති; තස්සා ච කලාපසම්මසනං ආදි. තං හි අතීතාදිභෙදභින්නානං ධම්මානං සම්පිණ්ඩෙත්වා[1] වවත්ථානවසෙන පවත්තත්තා ආදිකම්මිකස්ස සුකරසම්මසනං; තස්මා පඨමං තත්ථෙව අභියොගං කරොන්තෙන කමතො තං සම්පාදෙතබ්බන්ති දස්සෙතුං (1262.) **කලාපසම්මසනෙනෙවාති** ආදි ආරද්ධං. අථවා ද්වින්නං විසුද්ධීනමනන්තරෙ කලාපසම්මසනං හොති. තං ච ඛො ද්විසු එකාය විසුද්ධියා සංගහිතබ්බං. මග්ගාමග්ගඤාණස්ස ච ආදිභූතත්තා තත්ථෙවස්ස සංගහො යුත්තොති එත්ථෙව තං සංගහිතුකාමතාය වුත්තං **කලාපසම්මසනෙනෙවාති** ආදිං, කෙචි පන කලාපසම්මසනං නාම එකවිසුද්ධියම්පි න අනොතාගධන්ති තං අනාමසිත්වා විපස්සනාචාරං[2] වණ්ණෙන්ති. **කලාපසම්මසනෙනෙවාති** අතීතාදිභෙදභින්නානං ධම්මානං සංඛිපිත්වා වවත්ථානවසෙන කලාපතො, කලාපානං වා සම්මසනෙන මග්ගාමග්ගඤාණදස්සනෙන[3] විපස්සනාය යොගො කරණීයො. අථ වා භුම්මත්ථෙ කරණනිද්දෙසවසෙන කලාපසම්මසනෙ යොගො කරණීයොති අත්ථො. කලාපසම්මසනෙනෙව යොගො කරණීයොති වත්වාපි තං පන **විසුද්ධිමග්ගතො** ගහෙතබ්බන්ති ගන්ථවිත්ථාරපරිහාරත්ථං ඉධ න දස්සිතං.

(1263.) **පච්චුප්පන්නස්ස ධම්මස්සාති** සන්තතිපච්චුප්පන්නස්ස ඛණපච්චුප්පන්නස්ස ච, ආදිතො පන ඛණපච්චුප්පන්නස්ස උදයබ්බයං දුප්පරිග්ගහං, තස්මා සන්තතිපච්චුප්පන්නවසෙන පඨමං උදයබ්බයානුපස්සනං කාතබ්බං. **නිබ්බත්තීති** ද්වින්නං පච්චුප්පන්නානං වසෙන පඨමාභිනිබ්බත්ති ච ඛණනිබ්බත්ති ච. **පරිණාමොති** විනාසො.

(1264.) **අනුපස්සනංපි ඤාණන්ති** යා උදයස්ස වයස්ස ච අනුපස්සනා සා ඤාණන්ති වරඤාණෙන සම්මාසම්බුද්ධෙන **දෙසිතා**. තත්‍රායං පාළි: "කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානු

---

1. M. සංඛිපිත්වා. 2. M. විපස්සනාචාරං. 3. M. ඤාණදස්සන.
4. M. කතෙනෙක.

පස්සතො පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං? ජාතං රූපං පච්චුප්පන්නං; තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං; ජාතා වෙදනා -පෙ- සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං, ජාතං චක්ඛු -පෙ- ජාතො භවො පච්චුප්පන්නො; තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිනාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණන්ති. එත්ථ පන උදයදස්සනං යාවදෙව වයදස්සනත්ථන්ති[1] වයදස්සනස්ස පධානතං දස්සෙතුං "විපරිණාමානුපස්සනෙ පඤ්ඤා"ති වත්වා තම්පන වයදස්සනං උදයදස්සනපුබ්බකන්ති වුත්තං උදයබ්බයානුපස්සනෙ ඤාණන්ති.

(1265) පුබ්බෙ **උප්පත්තිතො**ති ජනනතො පුබ්බෙ, අනුප්පන්නස්සාති වුත්තං හොති. **නිචයො වා රාසි වා නත්ථි** යතො ආගච්ඡෙය්‍ය උප්පජ්ජමානං. අලද්ධත්තභාවස්ස සබ්බෙන සබ්බං අවිජ්ජමානත්තා. තෙනාහ **තථා උප්පජ්ජතො**ති ආදිං. යථා අනාගතෙ අඩ්ඪි[2] ඉමෙ ධම්මා සබ්බෙන සබ්බං නත්ථි, එවං අතීතෙපි අඩ්ඪී[3]ති දස්සෙන්තො (1266.) **තථා නිරුජ්ඣමානස්සා**ති ආදිං වත්වා අවිජ්ජමානානං යෙව රූපාරූපධම්මානං හෙතුපච්චයසමවායෙ උප්පාදෙ, උප්පජ්ජිත්වා සබ්බසො අභාවූපගමො වයොති[4] ඉමමත්ථං සමුදායගතං තදෙකදෙසභූතාය උපමාය විභාවෙතුං ඉමස්මිං ඨානෙ අට්ඨකථාය විණූපමා ආගතා; සා ඉධා පි ආහරිත්වා වත්තබ්බාති අධිප්පායෙන (1267.) **එසා විණූපමා**ති ආදිමාහ. **එතස්සත්ථස්සා**ති අවිජ්ජමානානං යෙව උප්පාදෙ, උප්පන්නානං ච පරතො අභාවොති ඉමස්ස අත්ථස්ස පකාසනෙ **වීණූපමා** වීණාවසෙන ආගතා උපමා. සා පනෙවං දට්ඨබ්බා: යථා වීණාය වාදියමානාය උප්පන්නස්ස සද්දස්ස නෙව උප්පත්තිතො පුබ්බෙ සන්නිචයො අත්ථි, න උප්පජ්ජමානො සන්නිචයතො ආගතො; න නිරුජ්ඣමානස්ස දිසාවිදිසාගමනං අත්ථි, න නිරුද්ධො කත්ථචි සන්නිචිතො තිට්ඨති; අථ ඛො වීණං ච වීණාදණ්ඩං ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච අහුත්වා සම්භොති, හුත්වා පතිවෙති; එවං සබ්බෙපි රූපාරූපධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පතිවෙන්තී ති.

එවං සංඛෙපතො උදයබ්බයමනසිකාරවිධිං දස්සෙත්වා පුන යාති එතස්සෙව උදයබ්බයඤාණස්ස විභංගෙ "අවිජ්ජාසමුදයා රූපසමුදයො"ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, තණ්හාසමුදයා =පෙ= කම්මසමුදයා =පෙ= ආහාරසමුදයා

1. වයදස්සනත්ථන්ති. 2. M. අඩ්ඩානෙ. 3. M. අඩ්ඩානං. 4. පොත්ථකෙ නත්ථි.

රූපසමුදයොති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස උදයං පස්සති; රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති. "අවිජ්ජානිරොධා රූපනිරොධො"ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. "තණ්හානිරොධා =පෙ= කම්මනිරොධා =පෙ= ආහාරනිරොධා රූපනිරොධො"ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. විපරිණාමලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස වයං පස්සති. රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති. තථා අවිජ්ජාසමුදයා වෙදනාසමුදයොති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති. තණ්හාසමුදයා =පෙ= කම්මසමුදයා =පෙ= ඵස්සසමුදයා වෙදනාසමුදයොති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති. නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති. අවිජ්ජානිරොධා =පෙ= තණ්හානිරොධා =පෙ= කම්මනිරොධා =පෙ= ඵස්සනිරොධා වෙදනානිරොධොති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති. විපරිණාමලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති. වෙදනාක්ඛන්ධස්ස විය ච සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණක්ඛන්ධානං. අයං පන විසෙසො: විඤ්ඤාණක්ඛන්ධස්ස ඵස්සට්ඨානෙ නාමරූපසමුදයො නාමරූපනිරොධොති.

එවං එකෙකස්ස ඛන්ධස්ස උදයබ්බයදස්සනෙ දස දස කත්වා සම්පඤ්ඤාස ලක්ඛණානි වුත්තානි; තෙසං වසෙනපි "එවම්පි රූපසමුදයො, එවම්පි රූපවයො, එවම්පි උදෙති වෙතී"ති පච්චයතො ඛණතො ච විත්ථාරෙන මනසිකාරවිධිං දස්සෙතුං (1268.) **තස්සෙව ඤාණස්සා**ති ආදි ආරද්ධං. තත්ථ **අවිජ්ජාසමුදයා**ති අවිජ්ජාය උප්පාදා, අත්ථිභාවාති අත්ථො. නිරොධවිරුද්ධො හි උප්පාදො අත්ථිභාවො හොති. තස්මා පුරිමභවසිද්ධාය අවිජ්ජාය සති ඉමස්මිං භවෙ **රූපසමුදයො** රූපස්ස උප්පාදො හොතීති අත්ථො. ආදි සද්දෙන සංගහිතෙසු "තණ්හාසමුදයා රූපසමුදයො, කම්මසමුදයා රූපසමුදයො, ආහාරපච්චයා රූපසමුදයො, තථා වයදස්සනෙ "අවිජ්ජානිරොධා රූපනිරොධො තණ්හානිරොධා, ආහාරනිරොධා රූපනිරොධො"ති ආදිසු අවිජ්ජාදීහි තීහි අතීතකාලිකානි තෙසං සහකාරී-කාරණභූතානි උපාදානාදීනිපි ගහිතානෙවාති වෙදිතබ්බානි. පවත්තිප්පච්චයෙසු කබලිංකාරාහාරස්ස බලවතාය සො එව ගහිතො ආහාරසමුදයාති. තස්මිං පන ගහිතෙ පවත්තිප්පච්චයතා-

සාමඤ්ඤෙන උතුචිත්තානිපි ගහිතානෙව හොන්තීති චතුසමුට්ඨානකරූපස්ස පච්චයතො උදයදස්සනං විභාවිතමෙවාති දට්ඨබ්බං. අවිජ්ජාතණ්හුපනිස්සයසහිතෙනෙව කම්මුනා රූපකායස්ස නිබ්බත්ති. අසති ච අවිජ්ජුපනිස්සයෙ[1] භවනිකන්තියා ජාතියා අසම්භවො යෙවාති. යථා රූපස්ස අවිජ්ජාතණ්හුපනිස්සයතා, එවං වෙදනාදීනම්පි දට්ඨබ්බා. ආහාරො පන උප්පන්නස්ස රූපස්ස පොසකො, කබළිංකාරාහාරස්ස අධිප්පෙතත්තා. කාමං යථාධිට්ඨානත්තා වා[2] දෙසනාය[2] උක්කංසනිද්දෙසෙන වා ආහාරග්ගහණං.

**අවිජ්ජානිරොධා රූපනිරොධොති** අග්ගමග්ගඤාණෙන අවිජ්ජාය අනුප්පාදනිරොධතො අනාගතස්ස රූපස්ස අනුප්පාදනිරොධො හොති, පච්චයාභාවතො. **තණ්හානිරොධා කම්මනිරොධොති** එත්ථාපි එසෙව නයො. **ආහාරනිරොධාති** පවත්තිපච්චයස්ස කබළිංකාරාහාරස්ස අභාවෙ රූපනිරොධොති තංසමුට්ඨානරූපස්ස අභාවො හොතීති. සෙසං හෙට්ඨා වුත්තනයානුසාරෙන වෙදිතබ්බං. අයම්පන විසෙසො: "ඵුට්ඨො වෙදෙති. ඵුට්ඨො සංජානාති, ඵුට්ඨො චෙතෙතීති ඵස්සපච්චයා වෙදනා, චක්ඛුසම්ඵස්සජා වෙදනා, සඤ්ඤා, චෙතනා"ති වචනතො ඵස්සො වෙදනාසඤ්ඤාසංඛාරක්ඛන්ධානං පවත්තිපච්චයො. තංනිරොධා ච තෙසං නිරොධො. **මහාපදාන-මහානිදානසුත්තෙසු** අභිධම්මෙ ච අඤ්ඤමඤ්ඤපච්චයවාරෙ "නාමරූපපච්චයා පි විඤ්ඤාණං"ති වචනතො නාමරූපං විඤ්ඤාණස්ස පවත්තිපච්චයො තංනිරොධා ච තස්ස නිරොධොති වුත්තං "ඵස්සසමුදයා වෙදනාසමුදයො"ති ආදිං.

(1270.) **දස දසාති** රූපක්ඛන්ධස්ස උදයදස්සනෙ අවිජ්ජා තණ්හා කම්මං ආහාරොති ඉමෙසං පච්චයානං අත්ථිතා, සංඛතලක්ඛණානි චෙව රූපස්ස නිබ්බත්තිලක්ඛණං චාති ඉමානි පඤ්චලක්ඛණානි, වයදස්සනෙ අවිජ්ජාදීනං චතුන්නං පච්චයානං අනුප්පාදනිරොධො රූපස්ස ඛණනිරොධො චාති ඉමානි පඤ්චලක්ඛණානීති රූපක්ඛන්ධස්ස දසලක්ඛණානි. තථා වෙදනාක්ඛන්ධාදීනං චතුන්නං චත්තාළීසලක්ඛණානීති එවං සමපඤ්ඤාසලක්ඛණානි හොන්ති, තෙනාහ **පඤ්ඤාස ලක්ඛණානී**ති. ලක්ඛණත්ථො පන තෙසං චතුන්නං පච්චයානං අත්ථිතා අනුප්පාදනිරොධො චාති අඪ. ලක්ඛීයති එතෙහි රූපාදීනං උදයො ච වයො චාති ලක්ඛණානි. චතුන්නං හි පච්චයානං අත්ථිතාය[3] රූපාදිඋදයො ලක්ඛීයති.

1. M. අවිජ්ජුපනිස්සයාය. 2. M. කාමතණ්හාධිට්ඨානත්තා වා වෙදනාය. 3. M. අත්ථිතාපි.

අනුප්පාදනිරොධ-අච්චන්තනිරොධෙහි වයො. නිබ්බත්ති - විපරි-ණාමාති පන සංඛතලක්ඛණානෙවාති. **ධම්මෙ සමනුපස්සතීති** රූපාදිකෙ ධම්මෙ උදයබ්බයවනෙන සමනුපස්සති. එත්ථ ච කෙචි තාව ආහු: අරූපක්ඛන්ධානං උදයබ්බයදස්සනං අද්ධා-සන්තතිවසෙන; න ඛණවසෙනාති. තෙසං මතෙන ඛණසො උදයබ්බයදස්සනමෙව න සියා. අපරෙ පනාහු: පච්චයතො උදයබ්බයදස්සනෙන අතීතාදිවිභාගං අනාමසිත්වා සබ්බසාඛා-රණතො අවිජ්ජාදිපච්චයා වෙදනාය සම්භවං ලබ්භමානතං පස්සති, න උප්පාදං. අවිජ්ජාදිඅභාවෙ ච තස්සා අසම්භවං අලබ්භමානතං පස්සති, න භංගක්ඛණතො. උදයබ්බයදස්සනෙ පච්චුප්පන්නානං උප්පාදං භංගං ච පස්සතීති. තං අයුත්තං. සන්තතිවසෙන හි රූපාරූපධම්මෙ උදයව්‍යයතො මනසික-රොන්තස්ස අනුක්කමෙන භාවනාය බලප්පත්තකාලෙ ඤාණස්ස තික්ඛවිසදභාවප්පත්තියා ඛණතො උදයබ්බයා උපට්ඨහන්තීති. අයං හි පඨමං පච්චයතො උදයබ්බයං මනසිකරොන්තො පච්ඡා අවිජ්ජාදිකෙ පච්චයධම්මෙ විස්සජ්ජෙත්වා උදයබ්බයවනෙන ඛන්ධෙ ගහෙත්වා තෙසං පච්චයතො උදයබ්බදස්සනමුඛෙන ඛණතොපි උදයබ්බයං මනසිකරොති. තස්ස යදා ඤාණං තික්ඛං විසදං හුත්වා පවත්තති, තදා රූපාරූපධම්මා ඛණෙ ඛණෙ උප්පජ්ජන්තා භිජ්ජන්තා ච හුත්වා උපට්ඨහන්ති. තෙන වුත්තං **එවං රූපුදයො හොතීති** ආදිං.

(1271) තත්ථ **එවං රූපුදයොති** එවං වුත්තනයෙන අවිජ්ජාසමුදයා, තණ්හාසමුදයා, කම්මසමුදයා, ආහාරසමුදයා පි රූපස්ස සම්භවො. **එවං රූපං වයෙති** වාති එවං වුත්තනයෙනෙව අවිජ්ජානිරොධා, ආහාරනිරොධා රූපස්ස වයො අනුප්පාදෙති අයං පච්චයතො විත්ථාරෙන මනසිකාරො. **උදෙති එවං රූපංති** එවං සමුදයතො කම්මසමුට්ඨානරූපම්පි උදෙති උප්පජ්ජතීති. **එවං රූපං තු වෙතීති** කම්මසමුට්ඨානරූපංපි ආහාරඋතුචිත්ත සමුට්ඨානරූපම්පි එවං වෙති නිරුජ්ඣතීති අයං ඛණතො විත්ථාරෙන මනසිකාරො. තෙන වුත්තං (1272.) **එවං පච්චයතො පෙත්ථ ඛණතො උදයබ්බයං**"ති. **සබ්බ ධම්මා පාකටා හොන්තීති** ඉති ඉමෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පතිවෙන්ති; යථා පච්චුප්පන්නා එවං අතීතානාගතෙපීති නයවසෙන අතීතාදිධම්මානං ද්වෙධා උදයබ්බයං පස්සතො සච්ච[1] - පටිච්චසමුප්පාදනයලක්ඛණ-භෙදා පාකටා හොන්ති. තසෙසවං පාකටීභූතා - සබ්බධම්ම - සභාවස්ස එවං කිර නාමිමෙ ධම්මා අනුප්පන්නපුබ්බා උප්පජ්ජන්ති,

1. M. පොත්ථකෙ නත්ථි.

උප්පන්නා නිරුජ්ඣන්තීති නිච්චනවාව හුත්වා සංඛාරා උපට්ඨහන්ති. න කෙවලං නිච්චනවාව, උදකෙ දණ්ඩකෙන කතරෙඛා විය, ආරග්ගෙ ඨපිතසාසපො විය විජ්ජුසඤ්චාරො විය ච පරිත්තකාලට්ඨායිනො උපට්ඨහන්ති. තෙනාහ:

(1273.) **උදකෙ දණ්ඩරාජිවාති** ආදිං. උදකෙ දණ්ඩරාජිආදයොපි ච කිඤ්චාපි උත්තරුත්තරි අතිපරිත්තට්ඨායිභාවනිදස්සනත්ථං දස්සිතා, තතොපි ලහුතරනිරොධත්තා සංඛාරානං. තථා හි ගමනස්සාදනං දෙවපුත්තානං හෙට්ඨුපරියෙන පරිමුඛං ධාවන්තානං සිරසි පාදෙ ච බද්ධඛුරධාරාසන්නිපාතතො පි සීඝතරො රූපධම්මානං[1] නිරොධො[1] වුත්තො, පගෙව අරූපධම්මානං. න කෙවලං පරිත්තතරකාලට්ඨායිනොව උපට්ඨහන්ති, අථ ඛො අසාරාපි ඛායන්තීති ආහ: (1274.) **කදලීති** ආදිං. තත්ථ මණ්ඩලාකාරෙන ආවිජ්ඣියමානං අලාතමෙව **අලාතචක්කං**. මන්තොසධප්පභාවිතා ඉන්දජාලාදිකා **මායා**. (1275.) **එත්තාවතාති** ය්වායං කලාපසම්මසනනියොජනතො පට්ඨාය යාව උදයබ්බයපටිවෙධාය භාවනාවිධි ආරද්ධො, එත්තාවතා භාවනාවිධානෙන කලාපසම්මසනම්පි උදයබ්බයඤාණුප්පාදනස්සෙව පරිකම්මන්ති. **උදයබ්බයදස්සනං ඤාණන්ති** සම්බන්ධො. **ලක්ඛණානි ච = පෙ = ඨිතන්ති** වයධම්මමෙව උප්පජ්ජති, උප්පන්නං ච වයං උපෙතීති ඉමිනා ආකාරෙන සම්පඤ්ඤසලක්ඛණානි පටිවිජ්ඣිත්වා ඨිතං. අධුනා උප්පන්නං න තාව බලප්පත්තන්ති ආහ (1276.) **තරුණන්ති**. කලාපසම්මසනාදිවසෙන පවත්තං සම්මසනං න නිප්පරියායෙන විපස්සනාසාමඤ්ඤං ලභති, උදයබ්බයානුපස්සනාදිවසෙන පවත්තමෙව ලභතීති ආහ **යස්ස චාධිගමා**ති ආදිං. අථස්ස ඉමාය තරුණවිපස්සනාය විපස්සන්තස්ස විපස්සනූපක්කිලෙසා උප්පජ්ජන්තීති දස්සෙන්තො ආහ (1277.) **විපස්සනායාති** ආදිං.

**එතායාති** ඉමාය උදයබ්බයානුපස්සනාසංඛාතාය තරුණවිපස්සනාය, න භංගානුපස්සනාදි සංඛාතාය තරුණවිපස්සනාය, නාපි නිබ්බිදානුපස්සනාදිසංඛාතාය බලවවිපස්සනායාති අත්ථො. න හි තදා විපස්සනූපක්කිලෙසා උප්පජ්ජන්තීති. **විපස්සකස්සාති** ච **විපස්සකස්සෙවාති** එව කාරො ලුත්තනිද්දිට්ඨො. තෙනෙව වක්ඛති **සම්පත්තපටිවෙධස්සාති** ආදිං. දිට්ඨිගාහාදිවත්ථුභාවෙන විපස්සනං උපක්කිලෙසෙන්තීති උපක්කිලෙසා. (1279.) සම්පත්තො චතුසච්චථලපටිවෙධො යෙන සො **සම්පත්තපටිවෙධො**. සො ච සොතාපන්නාදීනං අඤ්ඤතරො හොතීති ආහ **සොතාපන්නාදිනොති අපි චා**ති අයං වක්කමාතසමුච්චයත්ථො. ඉදං ච උක්කට්ඨ

1. M. රූපනිරොධො'

**නිස්සරණවසෙන** වුත්තං, බලවවිපස්සනාපත්තස්සාපි අනුප්පජ්ජනතො. **සම්පත්තපටිවෙධස්සා**ති වා බලවවිපස්සනාවත්ථං[1] සන්ධාය වුත්තං. සාපි හි පටිවෙධප්පත්තියා ආසන්නතරදෙසෙ[2] ඨිතත්තා සම්පත්තපටිවෙධො නාම හොති. එවං ච සති අපි වාති වුත්තසමුච්චයත්ථො හොති අථ වා අපිසද්දො වුත්තසමුච්චයත්ථො. ච සද්දො අවුත්තසමුච්චයත්ථො. තෙන නික්ඛිත්තකම්මට්ඨානං සඞ්ගණ්හාති, විපස්සනං ආරභිත්වා අන්තරා වොසානං ආපන්නස්සාපි විපස්සනුපක්කිලෙසා නුප්පජ්ජන්ති. **විප්පටිපන්නස්සා**ති සීලවිපත්ති ආදිවසෙන යථා තථා විප්පටිපන්නකස්ස, ගරහිතබ්බපටිපත්තිකස්සාති අත්ථො. අථ වා විප්පටිපන්නස්සාති විපස්සනාභාවනාසඞ්ඛාතාය සම්මාපටිපත්තියා අභාවෙන විරහිතපටිපත්තිකස්ස. විපස්සනාපටිපත්ති යෙව හි සසම්භාරා පුබ්බභාගෙ සම්මාපටිපත්ති, තදඤ්ඤා විප්පටිපත්ති තෙනෙවස්සා විසුද්ධිපක්ඛො[3] **සම්මා පටිපන්නස්සා**ති වුත්තං. සා ච නික්ඛිත්තධුරස්සාපි හොතීති ඉමස්මිං පක්ඛෙ නික්ඛිත්තකම්මට්ඨානොපි ඉමිනාව සඞ්ගහිතො හොතීති

(1280.) **සම්මා ච පටිපන්නස්සා**ති හෙට්ඨා වුත්තවිධානෙන සම්මා එව පටිපන්නස්ස, න විප්පටිපන්නස්ස නික්ඛිත්තධුරස්ස වා. **යුත්තයොගස්සා**ති යුත්තෙන යොගෙන[4] ඤාණෙන භාවනමනුයුඤ්ජනසීලස්ස. සා පන යුත්තයොගිතා සමථවිපස්සනාවසෙනාපි හොතීති තන්නිවත්තනත්ථං ආහ: **ඉධ විපස්සකස්සෙවා**ති උප්පජ්ජන්තීති එත්ථාපි එවකාරො සම්බන්ධිතබ්බො, තෙන තනු උප්පජ්ජන්තීති අත්ථො. අඤ්ඤත්ථ මග්ගාමග්ගඤාණස්සෙව අසම්භවතො. **කිරා**ති අනුස්සුතියං. සා පනෙසා අනුස්සුති පාළිවසෙනෙව ආගතාති දට්ඨබ්බං. යථාහ: "කථං ධම්මුද්ධච්චවිග්ගහිතං[5] මානසං[5] හොති? අනිච්චතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති, ඔභාසො ධම්මොති ඔභාසං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං. උද්ධච්චෙන[6] විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. දුක්ඛතො =පෙ= අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. තථා අනිච්චතො මනසිකරොතො ඔභාසො[7] උප්පජ්ජති, පීති, පස්සද්ධි, සුඛං, අධිමොක්ඛො, පග්ගහො, උපට්ඨානං, උපෙක්ඛා, නිකන්ති උප්පජ්ජති. නිකන්ති ධම්මොති නිකන්තිං ආවජ්ජති, තතො වික්ඛෙපො උද්ධච්චං;

---

1. M. බලවවිපස්සනාප්පත්තං. 2. M. ආසන්නාරම්භදෙසෙ 3. B. විරුද්ධපක්ඛො. 4. M. යුගෙන. 5. M. විග්ගහිතමානසො. 6. M. තෙන. 7. M. ඤාණං.

තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. දුක්ඛතො =පෙ= අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාතී ති.

ඉදානි තෙසං ඔභාසාදීනං සරූපවිභාවනත්ථං තෙසු උප්පන්නෙසු විපස්සනාය උපක්කිලිස්සනාකාරං ච දස්සෙතුං (1281.) **විපස්සනාය** ති ආදි වුත්තං. **විපස්සනාය ඔභාසො** ති විපස්සනාචිත්තසමුට්ඨිතං සසන්තතිපතිත - උතුසමුට්ඨානං භාසුරරූපං. තත්ථ විපස්සනාචිත්තසමුට්ඨානං යොගිනො සරීරට්ඨමෙව පභස්සරං හුත්වා තිට්ඨති ඉතරං සරීරං මුඤ්චිත්වා ඤාණානුභාවානුරූපං සමන්තතො ඵරති, තං තස්සෙව පඤ්ඤායති, තෙන ඵුට්ඨොකාසෙ රූපගතම්පි පස්සති. පස්සන්තො චක්ඛුවිඤ්ඤාණෙන පස්සති, උදාහු මනොවිඤ්ඤාණෙනාති වීමංසිතබ්බමෙතන්ති වදන්ති. **ආචරියධම්මපාලත්ථෙරෙන** පන දිබ්බචක්ඛුලාභිනො විය තං මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යමෙවාති යුත්තතරං විය දිස්සතීති වුත්තං. "**මග්ගප්පත්තො** (1282.) **ඵලප්පත්තොස්මී ති ගණ්හාතී** ති "න වත මෙ ඉතො පුබ්බෙ එවරූපො ඔභාසො උප්පන්නපුබ්බො, අද්ධා අරියමග්ගං පත්තොස්මි, ඵලං සච්ඡිකාසිං" ති අමග්ගං යෙව මග්ගොති ගණ්හාතී ති. **තස්සෙවං ගණ්හතො** ති[2] තස්ස අමග්ගං යෙව මග්ගොති ගණ්හන්තස්ස **විපස්සනාවීථි** ති පටිපාටියා පවත්තමානා ච විපස්සනා, **උක්කන්තා නාම හොති** යොගිනො "මග්ගං පත්තොස්මී" ති අධිමානෙන විස්සට්ඨත්තා. **විපස්සනාවීථිං** ති පි පාඨො. තස්සෙවං ගණ්හතො විපස්සනා තතො යෙව වීථියා උක්කන්තා නාම හොතීති අත්ථො.

(1283.) **ඔභාසමෙව සො භික්ඛු අස්සාදෙන්තො නිසීදතී** ති සො භික්ඛු අත්තනා ආරද්ධං විපස්සනං විස්සජ්ජෙත්වා ඔභාසමෙව ලොභවසෙන වා දිට්ඨිවසෙන වා අස්සාදෙන්තො නිසීදති. සො ඛො පනායං ඔභාසො **කස්සචි** භික්ඛුනො පල්ලඞ්කට්ඨානමත්තමෙව ඔභාසෙන්තො උප්පජ්ජති; **කස්සචි** අන්තොගබ්භං; **කස්සචි** බහිගබ්භම්පි; **කස්සචි** සකලවිහාරං, ගාවුතං, අඩ්ඪයොජනං, යොජනං, ද්වියොජනං, තියොජනං; කස්සචි පථවිතලතො පට්ඨාය යාව අකනිට්ඨබ්‍රහ්මලොකා එකාලොකං කුරුමානො, යථා සමුද්දම්පි යොජනමත්තෙන මච්ඡකච්ඡපා පඤ්ඤායන්ති, එවං උප්පජ්ජති. භගවතො පන දසසහස්සිලොකධාතුං ඔභාසෙන්තො උදපාදි.

(1284.) **විපස්සනා පීති** ති විපස්සනාචිත්තසම්පයුත්තා පීති, ඛුද්දකාදිකා හෙට්ඨා වණ්ණිතා යෙව. අයං ච පඤ්චවිධා පීති උදයබ්බයානුපස්සනාය වීථිපටිපන්නාය අනුක්කමෙන උප්පජ්ජති.

1. B. භාසුරං රූපං 2. B. පහා-

මත්ථකප්පත්තෙන උදයඤාණෙන සද්ධිං ඵරණා පීති යෙව හොති. උපචාරප්පණාක්ඛණතො අඤ්ඤදාපි හි ඵරණා පීති හොති යෙවාති. තෙන වුත්තං අට්ඨකථායං "සකලසරීරං ඛොභයමානා උප්පජ්ජතී"ති. (1285.) **යොගිනො** =පෙ= **හොන්ති** ති. යස්සායං පස්සද්ධි උප්පන්නා තස්ස යොගිනො රත්තිඨානෙ දිවාඨානෙ වා නිසින්නස්ස කායචිත්තානි පස්සද්ධානෙව හොන්ති, නෙව දරථො හොතී ති අත්ථො. පස්සද්ධිආදීනි ඡයුගලානි අඤ්ඤමඤ්ඤ-වියොගීනීති පස්සද්ධියා උප්පන්නාය ඉතරානි උප්පන්නානෙව හොන්තී ති කිච්චද්දස්සනමුඛෙන තා සබ්බාපි දස්සෙන්තො (1286.) **ලහුනි චාති** ආදිමාහ. එත්ථ කායගහණෙන රූපකායස්සාපි ගහණං වෙදිතබ්බං. න වෙදනාදිඛන්ධත්තයස්සෙව කායපස්සද්ධි ආදයො, රූපකායස්සාපි දරථාදිනිම්මද්දකාති. **කම්මඤ්ඤානෙව හොන්ති** ති න කෙවලං කම්මඤ්ඤානෙව සුවිසදානි උජුකානි යෙව හොන්තී ති, අවිනාභාවිතාය පන තදුභයං විසුං න වුත්තං. කායචිත්තානං පස්සද්ධාදිභාවො ච තෙසං අපස්සද්ධාදිභාවස්ස හෙතුභූතානං උද්ධච්චාදි - ථිනමිද්ධාදි - නීවරණාදි - අස්සද්ධියාදි - මායාසාඨෙය්‍යාදි - සංකිලෙසධම්මානං විධමනවසෙනෙව[1], තදු-විපස්සනාචිත්තප්පසාදස්ස පවත්තනතො.

(1287.) මනුස්සානං අයන්ති මානුසී මනුස්සයොග්ගකාමසුඛ-රති, තාදිසෙහි මනුස්සවිසෙසෙහි අනුභවිතබ්බතානතිවත්තනතො දිබ්බරති පි සංගහිතා. මානුසීසදිසතාය කාමසුඛභාවෙන දිබ්බරති වා මානුසී. තස්සා අතික්කන්තතාය න මානුසීති **අමානුසී**, තං. **සුඤ්ඤාගාරං** ති යං කිඤ්චි විවිත්තං සෙනාසනං, විපස්සනං එව වා. සාපි හි නිච්චභාවාදිසුඤ්ඤතාය යොගිනො සුඛසන්නිස්සිත-තාය ච සුඤ්ඤාගාරන්ති වත්තබ්බතං ලභති. චිත්තස්ස අවූප-සමිතං කිලෙසානං විගමනෙන[2] **සන්තචිත්තස්ස**. සංසාරභයස්ස ඉක්ඛණෙන **භික්ඛුනො** සම්මා ඤායෙන රූපධම්මානං උදයබ්බ-යානුපස්සනාදි - වසෙන තෙ විපස්සතො සම්මසතො අනාරද්ධ-විපස්සනානං[3] මනුස්සානං අවිසයතාය[4] අමානුසී, විපස්සනා-පීති - සුඛසඤ්ඤිතා රති ච හොතී ති අයමෙත්ථ ගාථාය සංඛෙපත්ථො.

(1289.) දුතියගාථා පන උදයබ්බයඤාණමෙව සන්ධාය වුත්තා. තත්ථ **යතො යතො** ති රූපතො අරූපතො වා (1290.) **ඤාණාදයො** ති ඤාණසද්ධාදයො සත්ත. **වුත්තනයෙනා** ති "ඤාණං ති විපස්සනාඤාණං; සද්ධාති විපස්සනාචිත්තසම්පයුත්තං සද්ධා"ති

1. M. විද්ධංසනවසෙනෙව. 2. M. විගමෙන 3. M. සමාරද්ධවිපස්ස-නානං. 4. M විසයතාය.

අදිනා වුත්තනයානුසාරෙන විපස්සනාවසෙනෙව ඤෙය්‍යා. තත්‍ථ ඤාණං රූපාරූපධම්මෙ උදයබ්බයානුපස්සනාවසෙන තුලයන්තස්ස තීරෙන්තස්ස විස්සට්ඨඉන්දවජිරම්ව අවිගතවෙගං[1] තිඛිණං සූරමති-විසදං උප්පජ්ජති. තථා හි තෙන යොගී "මග්ගප්පත්තොස්මී"ති මඤ්ඤති. සද්ධාති කාලුසියාපගමෙන චිත්තචෙතසිකානං අතිසය-සම්පසාදභූතා[2] බලවතී **සද්ධා**, න පන කම්මඵලං රතනත්තයං වා සද්දහනවසෙන පවත්තා. සතිපි සූපට්ඨිතා[3] අචලා පබ්බතරාජ-සදිසා[4] උප්පජ්ජති. ඉමිස්සා ච උප්පන්නාය සො යං යං ඨානං පච්චවෙක්ඛති, තං තං ඨානමස්ස ඔක්ඛන්දිත්වා[5] පක්ඛන්දිත්වා[6] දිබ්බචක්ඛුනො පරලොකො විය සතියා උපට්ඨාති.

**සුඛං** පන සකලසරීරං අභිසන්දමානං අතිපණීතං උප්පජ්ජති. තස්මිං හි උප්පන්නෙ තංසමුට්ඨිතෙහි අතිපණීතෙහි රූපකලාපෙහි[7] සබ්බො කායො පරිප්ඵුටො පරිබ්‍රූහිතොව හොති. **උපෙක්ඛා** පන විපස්සනුපෙක්ඛා චෙව ආවජ්ජනුපෙක්ඛා ච. තත්‍ථ විචිණිතවිචයන්තා සංඛාරානං විචිණනෙ මජ්ඣත්තභාවෙන ඨිතා විපස්සනුපෙක්ඛා, සා පන අත්‍ථතො තථා පවත්තා තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව, මනොද්වාරාවජ්ජනචිත්තසම්පයුත්තා වෙදනා ආවජ්ජනෙ[8] අජ්ඣු-පෙක්ඛනවසෙන පවත්තියා ආවජ්ජනුපෙක්ඛාති වුච්චති. දුවිධාපි පනෙසා තදා උප්පජ්ජති. තථා හිස්ස තස්මිං සමයෙ සබ්බසංඛාරානං උදයබ්බයෙ මජ්ඣත්තා විපස්සනුපෙක්ඛා බලවතී උප්පජ්ජති. මනොද්වාරෙ ආවජ්ජනුපෙක්ඛාපි. සා හිස්ස තං තං ඨානං ආවජ්ජෙන්තස්ස විස්සට්ඨඉන්දවජිරම්ව පත්තපුටෙ තික්ඛිත්ත-තත්ත-නාරාචො[9] විය ච සූරා තිඛිණා හුත්වා පවත්තති.

**විරියම්පි** අසිථිලමච්චාරද්ධං සම්පයුත්තධම්මෙ සංකිලෙස-පක්ඛතො කොසජ්ජපක්ඛතො පග්ගණ්හන්තං සුපග්ගහිත-මුප්පජ්ජති. **නිකන්ති** ච ඔභාසාදිපතිමණ්ඩිතාය විපස්සනාය ආලයං කුරුමානා භාවනාය සාතිසයප්පවත්තියා සුඛුමා සන්තා-කාරා උප්පජ්ජති, යා කිලෙසොති පරිග්ගහෙතුම්පි න සක්කොති[10].

යථා ච ඔභාසො එවං එතෙසුපි අඤ්ඤතරස්මිං උප්පන්නෙ යොගාවචරො "න වත මෙ ඉතො පුබ්බෙ එවරූපා පීති උප්පන්න පුබ්බා, එවරූපා පස්සද්ධි, ඤාණං, සද්ධා, සති, සුඛං, උපෙක්ඛා, විරියං, නිකන්ති උප්පන්නා, අද්ධා මග්ගඵලප්පත්තොස්මී"ති

1. M. අධිගතවෙගං. 2. M. අතිසයපසාදභූතා. 3. M. සුප්පතිට්ඨිතා. 4. M. පබ්බතරාජසදිසා. 5 M ඔක්කන්තිත්වා 6. M. පක්ඛන්දිත්වා පරිභණ්ඩභූතස්ස යථාකම්මූපගඤාණස්ස උපට්ඨහන්තො පරලොකවිසයත්තා වණ්ණා-යතනවිසයමතීතං ති. 7. M. රූපෙහි 8 M. ආවජ්ජන්තෙ. 9. M. පක්ඛන්ද-තත්ත- 10. M. ඤත්තා.

ගණහාති. තසෙසවං ගණහතො විපසසනා වීථිඋකකනතා නාම හොති. සො තෙ යෙව අසසාදෙනෙතා නිසීදති. ඉමෙ පන විපසසනුපකකිලෙසා යෙභුයෙයන සමථවිපසසනාලාභිනො උපපජජනති. සො සමාපතතිවිකඛමහිතානං කිලෙසානං අසමුදාචාරතො අරහා අහං ති චිතතං උපපාදෙතීති. (1291.) **උපක්කිලෙසසස වතථුතො** ති නිපපරියායතො දිඨි-මාන-තණහා ඉධ උපක්කිලෙසා. තෙසං වතථුතො උපපතතිඨානතාය, න සභාවතො අකුසලතතා. යථා පන ඔභාසාදයො, එවං නිකනතිපි දිඨිගාහාදීනං ඨානං හොතීති වතථුභාවො පි'සසා යුජජතෙව.

(1292) **තං තමාවජජමානසස භාවනා පරිහායතී** ති තං තං ඔභාසාදිකං ආවජජමානසස තණහාවසෙන මම ඔභාසොති ආදිනා[1] පවතෙතනතසස භාවනාවීථිං ඔකකමිතවා පරිවටටති. අපපං සුතමෙතසසා ති **අපපසසුතො**. බහුසසුතො පන ඔභාසාදීසු උපපනෙනසු "අයං ඛො මෙ ඔභාසො උපපනෙනා, සො ඛො පනායං අනිචෙචා සංඛතො පටිචචසමුපපනෙනා ඛයධමෙමා වයධමෙමා විරාගධමෙමා නිරොධධමෙමා"ති වා "සචෙ ඔභාසො අතතා භවෙයය අතතාති ගහෙතුං වටෙටයය, අනතතාව පනායං අතතා ති ගහිතො, තසමා සො අවසවතතනතෙඨන අනතතා, හුතවා අභාවටෙඨන අනිචෙචා, උදයබබයපටිපීළනටෙඨන දුකෙඛා"ති ආදිනා සමනුපසසති. සො එවං සමනුපසසනෙතා උපක්කිලෙසජටං විජටෙතවා "ඔභාසාදයො ධමමා න මගෙගා, උපක්කිලෙසවිනිමුතතං පන වීථිපටිපනනං විපසසනාඤාණං මගෙගා"ති මගගං ච අමගගං ච වවතථපෙති. තෙන වුතතං (1293.) **සබොභාසාදයො** ති ආදිං. **මගගාමගෙගසු ඤාණං** ති මගගාමගගඤාණං. මගගාමගගඤාණදසසන විසුදධීති වුතතං හොති. මගගාමගගඤාණදසසනවිසුදධිපපතතියා ච තෙන යොගිනා තිණණං සචචානං වවතථානං කතං හොති, කථං? දිඨිවිසුදධියා තාව නාමරූපවවතථානෙන දුකඛසචචවවතථානං කතං හොති; කංඛාවිතරණවිසුදධියා පචචයපරිගගහෙන සමුදයසචචසස වවතථානං; අභිධමමනයසමිං හි සබබකිලෙසා කමමං ච සමුදයසචචං. ඉමිසසං මගගාමගගඤාණදසසනවිසුදධියං සමමා මගගසස අවධාරණෙන මගගසචචං. තදුපායභූතසස හි මගගසස අවධාරණෙන තං අවධාරිතමෙවාති එවං ලොකියෙනෙව තාව ඤාණෙන තිණණං සචචානං වවතථානං කතං හොති.

**ඉති අභිධමමතථවිකාසිනියා නාම**
**අභිධමමාවතාරසංවණණනාය වීසතිමපරිචෙඡද**
**වණණනා නිඨිතා.**

---

1. M. ආදිගගාහං. 2. M විජහෙතවා

# එකවීසතිමපරිච්ඡෙදවණ්ණනා.

## පටිපදාඤාණදස්සනවිසුද්ධිනිද්දෙසො.

(1297.) **අට්ඨඤාණවසෙනෙවා** ති උදයබ්බයඤාණාදීනං අට්ඨන්නං ඤාණානං වසෙන. විපස්සනාචාරස්ස මත්ථකප්පත්තියා සංඛාරුපෙක්ඛාඤාණං සිඛාප්පත්තවිපස්සනා. සිඛාප්පත්ති පනස්සා උදයබ්බයඤාණාදීනං අට්ඨඤාණානං[1] වසෙනාති ආහ **අට්ඨඤාණවසෙනා** ති. **නවමං** ති නවමං සච්චානුලොමිකඤාණං. ඉති උදයබ්බයාදීනි අට්ඨ, ඉදං ච නවමඤාණං පටිපදාඤාණදස්සනන්ති වුච්චති. පටිපජ්ජති එතාය අරියමග්ගොති පටිපදා, උදයබ්බයාදීනං ජානනට්ඨෙන පච්චක්ඛතො දස්සනට්ඨෙන ඤාණදස්සනං චාති කත්වා. තානි පන ඤාණානි සරූපතො දස්සෙතුං **අට්ඨඤාණානී** ති ආදි වුත්තං.

(1298.) තත්ථ උදයබ්බයානුපස්සනාඤාණං කිඤ්චාපි තීරණපරිඤ්ඤාය පවිට්ඨං[2]. තථාපි යථාවුත්තට්ඨෙන පටිපදාඤාණදස්සනම්පි හොතෙවාති තම්පි ඉධ වුත්තං. ඉතරත්ථ පන උප්පන්නමත්තං අප්පගුණං සන්ධාය වුත්තං. පගුණං හි නිච්චසඤ්ඤාදිපහානසිද්ධියා පහානපරිඤ්ඤාය අධිට්ඨානභූතං. යතො තදධිගමෙන අට්ඨාරසසු මහාවිපස්සනාසු එකච්චා අධිගතාව හොන්ති. න හි උදයබ්බයානං පච්චක්ඛතො පටිවෙධෙන විනා සාමඤ්ඤාකාරානං තීරණමත්තෙන සාතිසයං පටිපක්ඛප්පහානං සම්භවති. අසති ච පටිපක්ඛප්පහානෙ කුතො ඤාණාදීනං වජිරමිව අවිහතවෙගතා[3] තික්ඛවිසදාදිභාවා? තස්මා පගුණභාවප්පත්තං උදයබ්බයඤාණං පහානපරිඤ්ඤාපක්ඛිකමෙව දට්ඨබ්බං.

(1299.) භඞ්ගෙති සංඛාරානං භඞ්ගෙ. යථාභූතදස්සාවී භායති එතස්මාති භයං, තෙභූමකධම්මා. තෙසු භයතො උපට්ඨිතෙසු භායිතබ්බාකාරගාහීඤාණං භයඤාණං.[4] තථාහෙතං "භයතුපට්ඨානඤාණං"ති වුච්චති. මුඤ්චිතුං ඉච්ඡතීති මුඤ්චිතුකම්මං. චිත්තං, පුග්ගලො වා, තස්ස භාවො මුඤ්චිතුකම්යතා. තං පන ඤාණමෙවාති ආහ **ඤාණං මුඤ්චිතුකම්යතා**ති. පුන පටිසංඛානාකාරෙන පවත්තං ඤාණං **පටිසංඛාඤාණං**.[5] නිරපෙක්ඛතාය සංඛාරානං උපෙක්ඛනවසෙන පවත්තං ඤාණං සංඛාරුපෙක්ඛාඤාණං. ගාථාබන්ධත්ථං පන විසන්ධිනිද්දෙසො.

---

1. M. අත්තට්ඨමානං. 2 M. පතිට්ඨං. 3. M. අධිගතනවෙගතා. 4 M. භයෙ ඤාණං. 5. M. පටිසංඛානුපස්සනාඤාණං.

ඔළාරිකොළාරිකස්ස සච්චපටිච්ඡාදකතමස්ස විගමෙන සච්චපටිවෙධානුකූලත්තා සච්චානුලොමිකං. තම්පන ඉදංති ආහ **සච්චානුලොමඤාණං තු අනුලොමං පවුච්චතීති**. නනු ච උදයබ්බයඤාණස්ස පගෙව සිද්ධත්තා කිමත්ථං පුන තත්ථාපි අභියොගොති චෙ? අනිච්චාදි - ලක්ඛණසල්ලක්ඛණත්ථං. උදයබ්බයඤාණංහි හෙට්ඨා දසහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං හුත්වා යථාව සරසතො තිලක්ඛණං සල්ලක්ඛෙතුං නාසක්ඛි. උපක්කිලෙස-විනිමුත්තං පන සක්කොති. තස්මා ලක්ඛණසල්ලක්ඛණත්ථං පුන තත්ථෙව යොගො කාතබ්බො. ලක්ඛණානි චස්ස උදයබ්බයාදීනං අමනසිකාරා, සන්තති - ඉරියාපථ - ඝනපටිච්ඡන්නත්තාය ච නො-පට්ඨහන්ති. තස්මා උදයබ්බයං මනසිකත්වා සන්තතිං උග්ඝාටෙත්වා අනිච්චලක්ඛණං අභිණ්හපීළනං පරිග්ගහෙත්වා ඉරියාපථං උග්ඝාටෙත්වා දුක්ඛලක්ඛණං ධාතුසො විනිබ්භුජිත්වා ඝන-විනිබ්භොගං කත්වා අනත්තලක්ඛණං ච සල්ලක්ඛෙත්වා අනිච්චා දුක්ඛා අනත්තාති සංඛාරා පුනප්පුන සම්මසිතබ්බා.

තස්සෙවං තුලයතො තීරයතො යදා සංඛාරගතං අන්තතො ලහුඋපට්ඨානෙන ඤාණස්ස ච තික්ඛතාය තිරොහිතුප්පාදාදිභෙදං භිජ්ජමානමෙව උපට්ඨාති, භඞ්ගෙ යෙව තස්ස ඤාණං සන්තිට්ඨති, තදා භඞ්ගානුපස්සනං නාම විපස්සනාඤාණං අධිගතං හොති. තස්ස තදෙව සංඛාරනිරොධාරම්මණං[1] භඞ්ගානුපස්සනං ආසෙවන්තස්ස යදා සබ්බභව - යොනි - ගති - ඨිති - නිවාසෙසු සංඛාරා භිජ්ජනසභාවත්තාය යක්ඛරක්ඛසාදයො විය මහාභයං හුත්වා උපට්ඨහන්ති, තද'ස්ස භයතුපට්ඨානඤාණං අධිගතං හොති. කිං පනිදං ඤාණං භායතීති? න භායති. තං හි "අතීතා සංඛාරා නිරුද්ධා, පච්චුප්පන්නා නිරුජ්ඣන්ති, අනාගතා නිරුජ්ඣිස්සන්තීති තීරණමත්තමෙව හොති. ව්‍යසනාපන්නානං පන සබ්බසංඛාරානං භයතො උපට්ඨිතතාගහණෙන භයතුපට්ඨානඤාණන්ති වුච්චතීති.

තස්ස තං භයතුපට්ඨානඤාණං ආසෙවන්තස්ස යදා සබ්බ-භවගතෙසු සංඛාරෙසු තාණං වා ලෙණං වා පරායණං වා න පඤ්ඤායති, උක්ඛිත්තාසිකො විය පච්චාමිත්තො සාදීනවා එව සංඛාරා උපට්ඨහන්ති, තස්ස සංඛාරානං ආදීනවමෙව පස්සන්තස්ස ආදීනවඤාණං නාම උප්පන්නං හොති. තස්සෙවං සංඛාරෙ[2] සාදීනවතො පස්සන්තස්ස යදා තිභවපරියාපන්නෙසු නිබ්බෙදෙ උප්පජ්ජති, උක්කණ්ඨා සණ්ඨාති, සබ්බසංඛාරවිසංයුත්තෙ සන්තිපදෙ අභිරතිං පටිලභති, තදස්ස නිබ්බිදානු-පස්සනං නාම ඤාණං උප්පන්නං හොති. තස්ස යදා ඉමිනා නිබ්බිදා.

1. M. සංඛාරාරම්මණං. 2 M. සබ්බසංඛාරෙ

ඤාණෙන සබ්බසංඛාරෙසු නිබ්බින්දන්තස්ස එකසංඛාරෙපි චිත්තං න සජ්ජති, සබ්බස්මා සංඛාරගතා සප්පමුඛගතස්ස විය මණ්ඩූකස්ස මුඤ්චිතුකාමතා උප්පජ්ජති, තදා මුඤ්චිතුකම්‍යතාඤාණං නාම උප්පන්නං හොති

තස්සෙවං සබ්බසංඛාරෙහි මුඤ්චිතුකාමස්ස නිච්ච - සුභ - සුඛ - අත්තාකාරෙන උපඨිතුං අසමත්ථං පාපෙත්වා මුඤ්චනස්ස උපායසම්පාදනත්ථං අනිච්චන්තිකතාදීහි අනිච්චලක්ඛණං, අභිණ්හපතිපීළනතාදීහි දුක්ඛලක්ඛණං, අජඤ්ඤකතාදීහි පටික්කූලතං, තුච්ඡතාදීහි අනත්තලක්ඛණං ච ආරොපෙත්වා සබ්බසංඛාරගතං පරිග්ගණ්හන්තස්ස පටිසංඛානුපස්සනාඤාණං උප්පන්නං හොති. තෙන පනෙවං පරිග්ගහිතසංඛාරෙන යා සා "සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා"ති ආදිනා ද්විකොටි- කාදිභෙදා සුඤ්ඤතා වුත්තා, සා පරිග්ගහෙතබ්බා. තස්සෙවං සුඤ්ඤතො දිස්වා තිලක්ඛණං ආරොපෙත්වා සම්මසන්තස්ස යදා භයං ච නන්දිං ච විප්පහාය විසඤ්ඤභරියාය විය සංඛාරගතෙසු උපෙක්ඛා සනතිඨති, තීසු භවෙසු චිත්තං න සම්පසාරීයති, තදස්ස සංඛාරුපෙක්ඛාඤාණං නාම උප්පන්නං හොති. තං පනෙතං යාව නිබ්බානං න පස්සති, තාව දිසාකාකො විය කූපකයඨිං පුනප්පුනං සංඛාරමෙව අනභිමතම්පි[1] නිස්සාය සංඛාරගතෙසු[2] උපෙක්ඛාය[2] විචිනන්තෙපි[2] මජ්ඣත්තමෙව හුත්වා තිට්ඨති. තෙන වුත්තං (1302.) එතෙසු පන ඤාණෙසූති ආදිං.

(1305.) **විපස්සනා** =පෙ= **වුට්ඨානගාමිනී**ති සිඛං උත්තමභාවං පත්තත්තා සිඛාප්පත්තා. වුට්ඨානං ගච්ඡතීති වුට්ඨානගාමිනී. වුට්ඨානන්ති හි බහිද්ධානිමිත්තභූතා අභිනිවිට්ඨවත්ථුතො චෙව අජ්ඣත්තප්පවත්තිතො[3] ච වුට්ඨහනතො මග්ගො වුච්චති. තං ගච්ඡතීති **වුට්ඨානගාමිනී**, මග්ගෙන සද්ධිං ඝටීයතීති අත්ථො. තන්ති යා සිඛාප්පත්තා විපස්සනා, වුට්ඨානගාමිනී විපස්සනා සච්චානුලොමඤාණන්ති ච වුච්චති, තං සංඛාරුපෙක්ඛාඤාණං **ආසෙවනන්තස්සා**ති පුනප්පුන සම්මසනවසෙන සෙවන්තස්ස භාවෙන්තස්ස බහුලීකරොන්තස්ස. තස්ස හි අධිමොක්ඛසද්ධා භාවනාවසෙන බලවතරා නිබ්බත්තිස්සති, විරියං සුපග්ගහිතං පටිපක්ඛවිධමනසමත්ථං හොති; ආරම්මණාභිමුඛභාවෙන සති සූපට්ඨිතා[4] හොති; පස්සද්ධිසුඛානං සාතිසයතාය චිත්තං සුසමාහිතං, තතො ච අනුලොමඤාණුප්පත්තියා පච්චයො භවිතුං සමත්ථා තික්ඛතමා සංඛාරුපෙක්ඛා උප්පජ්ජති.

---

1. M. අනභිරමන්තම්පි. 2. M. සංඛාරවිචිනනෙපි. 3. M.- පවත්තනතො. 4. M. සුපතිඨිතා.

(1307.) **අනිච්චා =පෙ= ඛන්ධතෙව සා**ති අනිච්චාදිසු එකෙන ආකාරෙන සම්මසන්තී සත්තක්ඛත්තුං පවත්තිත්වා භිජ්ජන්තී භවංගං ඔතිණ්ණා නාම හොන්ති. තතො පරං භවංගවාරොති කත්වා **සංඛාරුපෙක්ඛාසන්තතයෙන තු** සංඛාරුපෙක්ඛාය සන්තත-යෙන, න සම්මසිතත්තයෙන; තෙනාහ (1308.) **අනිච්චාදිවසෙනෙව =පෙ= කුරුමානං** ති. (1309.) **භවංගාවට්ටනං කත්වා**ති භවංගස්ස නිවත්තනං කත්වා; චිත්තස්ස භවංගවසෙන පවත්තිතුං අදත්වා. (1310) **පරිකම්මං**ති වුච්චති[1] මග්ගස්ස පරිකම්මත්තා, පටිසංඛාරකත්තා; **උපචාරං**ති **මතං** මග්ගස්ස ආසන්නත්තා සමීපචාරිත්තා වා. **අනුලොමන්තං** සයමෙව වදති. (1313.) **පුරිමානං**ති ආදිනා. ඉදං හි අනිච්චලක්ඛණාදිවසෙන සංඛාරෙ ආරබ්භ පවත්තන්තා උදයබ්බයවන්තානං යෙව ධම්මානං උදයබ්බයඤාණං උප්පාදෙ වගෙ අද්දසාති ච, භංගවන්තානං යෙව වත භංගානුපස්සනා භංගමද්දසාති ච, සභයං යෙව වත භයතුපට්ඨානස්ස භයතො උපට්ඨිතංති ච, සාදීනවානං යෙව වත ආදීනවානුපස්සනං ආදීනවමද්දසාති ච, නිබ්බින්දිතබ්බෙ යෙව නිබ්බිදාඤාණං නිබ්බින්නංති ච, මුඤ්චිතබ්බෙ යෙව වත මුඤ්චිතු-කම්‍යතාඤාණං මුඤ්චිතුකාමං ජාතංති ච, පටිසංඛාතබ්බමෙව වත පටිසංඛාඤාණෙන පටිසංඛාතංති ච, උපෙක්ඛිතබ්බං යෙව වත සංඛාරුපෙක්ඛාය උපෙක්ඛිතංති ච අත්ථතො වදමානං විය ඉමෙසං ච අට්ඨන්නං ඤාණානං කතකිච්චත්තා අනුලොමෙති, සබ්බාසං යෙව විපස්සනානං ලක්ඛණත්තයසම්මසනකිච්චත්තා; තථා උපරි ච අරියමග්ගෙ සත්තතිංසාය බොධිපක්ඛියධම්මානං තාය පටිපදය පත්තබ්බතාය. න හි අනුලොමඤාණෙ ථූලථූලසච්චපටිච්ඡාදක-සංකිලෙසවික්ඛම්භනවසෙන අප්පවත්තන්තෙන ගොත්‍රභුඤාණං උප්පජ්ජති. ගොත්‍රභුඤාණෙ ච අනුප්පන්නෙ මග්ගඤාණං න උප්පජ්ජති. තස්මා පුරිමපච්ඡිමානං භාගානං අනුලොමත්තා අනුලොමංති සඤ්ඤිතංති.

(1314.) **තෙනෙවා**ති හෙට්ඨිමඤාණානං අනුලොමත්තමුඛෙන-උපරි බොධිපක්ඛියානං අනුලොමතො ච සච්චානුලොමඤාණංති පවුච්චති, මග්ගසච්චස්ස අනුලොමිකත්තා. **වුට්ඨානගාමිනියා**ති සංඛාරාරම්මණාය වුට්ඨානගාමිනියා විපස්සනාය. **පරියොසානං**ති. පරමා කොටි. සංඛාරාරම්මණවිපස්සනාසු හි අයං විසෙසතො වුට්ඨානගාමිනී විපස්සනාති. අසංඛතාරම්මණං පන සබ්බෙන-සබ්බං අරියමග්ගසංඛාතං වුට්ඨානං ගච්ඡති උපෙතීති, තතො පි

---

1. M. පොත්ථකෙ නත්ථි.

විසෙසතො වුට්ඨානගාමිනී විපස්සනාති වත්තබ්බතං ලභතීති ආහ (1315) **ඡෙදයං** **සබ්බසඞ්ඛාරෙ**නාති ආදිං, **කිත්තිතා**ති ථොමිතා. අරියමග්ගාධිට්ඨානතාය, මහන්තානං සීලක්ඛන්ධාදීනං එසනතො ගවෙසනතො **මහෙසිනා** සම්මාසම්බුද්ධෙන. සන්ත-කිලෙසතාය **සන්තං**. **යොගං**ති භාවනං, භාවනාභියොගං වා.

ඉති අභිධම්මත්ථවිකාසිනියා නාම
අභිධම්මාවතාරසංවණ්ණනාය එකවීසතිමපරිච්ඡෙද
වණ්ණනා නිට්ඨිතා.

# බාවීසතිමපරිච්ඡෙදවණ්ණනා.

## ඤාණදස්සනවිසුද්ධිනිද්දෙසවණ්ණනා.

ඉදානි ඤාණදස්සනවිසුද්ධියා නිද්දෙසො අනුප්පත්තො. තං යස්ස ඤාණස්ස අනන්තරං උප්පජ්ජති, තං තාව දස්සෙන්තො **ඉතො පරං**ති ආදිමාහ. (1318. **ඉතො පරං**ති ඉතො අනුලොමඤාණතො උපරි. **ආවජ්ජනියට්ඨානත්තා**ති ආවජ්ජනට්ඨානෙ ඨිතත්තා අබ්බොහාරිකමෙව; උභයවිසුද්ධිලක්ඛණාභාවතො කිඤ්චාපි එවං, තථාපි වුට්ඨානගාමිනීවිපස්සනාය පරියොසානත්තා විපස්සනාපක්ඛියමෙවාති ආහ: (1320.) **විපස්සනාය සොතස්මිං පතිතත්තා විපස්සනා**ති. එතෙනස්ස පටිපදාඤාණදස්සනවිසුද්ධිභජනං දස්සෙති.

(1321.) පුථුජ්ජනෙසු භවං පොථුජ්ජනිකං; තදෙව ගොත්තං, අරියෙහි අසම්මිස්සා පුථුජ්ජනසමඤ්ඤාති **පොථුජ්ජනිකගොත්තං**. එකවංසජාතං හි සමානතාය[1] සාමඤ්ඤං[1] ගොත්තන්ති වුච්චති, ගං තායති, බුද්ධිං අභිධානං ච එකංසිකවිසයතාය රක්ඛතීති කත්වා. වාසද්දො වක්ඛමානත්ථවිකප්පනෙ. **අභිභුය්‍ය පවත්තිතො ගොත්‍රභූ**ති සම්බන්ධො. **ගොත්තං වුච්චති නිබ්බානං**, අරියොති බුද්ධියා අභිධානස්ස ච තායනතො[2] පවත්තනතොති අධිප්පායො. **තතො භවතී**ති තතො ගොත්තතො ආරම්මණපච්චයතො භවති. ඉතිසද්දො චෙත්ථ හෙත්වත්ථො දට්ඨබ්බො. තෙන යස්මා තතො භවති, තස්මා **ගොත්‍රභූ**ති අත්ථො.

(1322.) ඤාණදස්සනවිසුද්ධි එව ඤාණදස්සනසුද්ධිකං තං **සම්පාදෙතුං පනිච්ඡතා** තෙන භික්ඛුනා **අඤ්ඤං කිඤ්චි පි කාතබ්බං** තං නත්ථීති චෙති ආහ (1323.) **යං හී**ති ආදිං. **කතමෙවා**ති වුත්තෙන කථං ති අනුයොගස්ස උපට්ඨිතත්තා (1324.) **අනුලොමාවසානං හී**ති ආදිනා තං සමත්ථෙති. එවං උප්පන්නඅනුලොමිකඤාණස්ස පනස්ස එතෙහි තීහිපි අනුලොමඤාණෙහි අත්තනො බලානුරූපං ථූලථූලෙ සච්චපටිච්ඡාදකතමම්හි අන්තරධාපිතෙ සබ්බසංඛාරගතෙ චිත්තං න පක්ඛන්දති, න ලග්ගති, පදුමපලාසතො උදකං විය පතිකුටති, පතිවත්තති; සබ්බං නිමිත්තාරම්මණම්පි සබ්බං පවත්තාරම්මණම්පි පළිබොධතො උපට්ඨාති. අථස්ස සබ්බස්මිං නිමිත්ත - පවත්තාරම්මණෙ පළිබොධතො උපට්ඨිතෙ දුතියස්ස වා තතියස්ස වා අනුලොමඤාණස්ස අනන්තරං ගොත්‍රභුඤාණං උප්පජ්ජති, තෙනාහ (1325.) **තස්සා**ති

1. M. සමානා සාමඤ්ඤා. 2. M. පොත්ථකෙ නත්ථි.

ආදිං. (1326.) **පඨමාවජ්ජනං චෙව පඨමාභොගතාපි** චාති පඨමාවජ්ජන - පඨමාභොගභූතං, සකත්ථෙ හි අයං තාපච්චයොති. තත්ථ අවජ්ජනාතං[1] චිත්තසන්තානස්ස පරිණාමනවසෙන ආභොගො අනන්තනො ආභුඤ්ජනවසෙන දට්ඨබ්බා.

(1327.) **අනන්තරාදීහීති** අනන්තර - සමනන්තර - ආසෙවන - උපනිස්සය - නත්ථි - විගතවසෙන ඡහි පච්චයෙහි. (1328.) **මුඛං** ති මුඛභූතං. එකන්තිකතාය එකවාරමෙව ච උප්පජ්ජනතො පුනරාවත්තිඅභාවෙන[2] **අනාවට්ටං,** **අනාවජ්ජනං** චාති අනාවජ්ජනම්පි සමානං. **සඤ්ඤං දත්වා වියා**ති "එවං උප්පජ්ජාහී"ති සඤ්ඤං දත්වා විය. (1332.) **අනිබ්බිද්ධපුබ්බං** ති අප්පදාලිතපුබ්බං. **විද්ධංසෙන්තාවා** ති විනාසෙන්තා එව. **ජායතී**ති නිබ්බත්තති. එත්ථ ච ඉමං උපමං ආහරන්ති: එකො කිර ඉස්සාසො අට්ඨඋසභමත්තෙ පදෙසෙ ඵලකසතං ඨපාපෙත්වා වත්ථෙන මුඛං වෙඨෙත්වා සරං සන්නය්හිත්වා චක්කයන්තෙ අට්ඨාසි. අඤ්ඤො පුරිසො චක්කයන්තං ආවිජ්ඣිත්වා[3] යදා ඉස්සාසස්ස ඵලකං අභිමුඛං හොති, තදා තත්ථ **දණ්ඩකොටිසඤ්ඤං** දෙති. ඉස්සාසො **දණ්ඩකසඤ්ඤං** අමුඤ්චිත්වා ව සරං ඛිපිත්වා ඵලකසතං නිබ්බිජ්ඣති. තත්ථ **දණ්ඩකසඤ්ඤං** දෙන්තො විය මග්ගඤාණං; ඉස්සාසස්ස **දණ්ඩකසඤ්ඤං අමුඤ්චිත්වා** ඵලකසත-නිබ්බිජ්ඣනං විය මග්ගඤාණස්ස ගොත්‍රභුඤාණෙන දින්නසඤ්ඤං අමුඤ්චිත්වා ව නිබ්බාණං ආරම්මණං කත්වා අනිබ්බිද්ධපුබ්බානං අප්පදාලිතපුබ්බානං ලොභදොසමොහක්ඛන්ධානං නිබ්බිජ්ඣනන්ති.

(1334.) **අනමතග්ග =පෙ= මහොදධිං** ති අට්ඨමභවතො පට්ඨාය නිබ්බත්තනකං අපරිඤ්ඤාතකොටිකං සංසාරවට්ටදුක්ඛමහාසමුද්දං. පාණාතිපාතාදි - පඤ්චවෙරානි චෙව පඤ්චවීසති මහාභයානි චාති **සබ්බවෙරභයානි.** (1336.) **අනෙකෙ ආනිසංසෙ**ති රතනත්තයෙ නිවිට්ඨසද්ධාදිකෙ අනෙකෙ ආනිසංසෙ. **ආදිමග්ගෙනා**ති **සොතාපත්ති** - මග්ගසංඛාතෙන පඨමමග්ගෙන.

### පඨමමග්ගඤාණං.

(1338.) **තස්සෙවානන්තරං** ති තස්ස අනන්තරං යෙව. **ද්වෙ තීණි වා** ති නාතිතික්ඛපඤ්ඤස්ස ද්වෙ, තික්ඛපඤ්ඤස්ස තීණි ඵලචිත්තානීති. (1339.) **අජානිත්වා වදන්ති තෙ** ති වත්වා තත්ථ කාරණං දස්සෙතුං (1340.) **එකස්සා** ති ආදි වුත්තං. **පඤ්චමං මග්ගචිත්තං** ති ඉමිනාව ඡට්ඨස්ස අභාවදීපනෙන එකං

1. M B. ආවජ්ජනං. 2. M. පුනරාවට්ටාභාවෙන. 3. M. ආවජ්ජිත්වා.

ඵලචිත්තන්ති වදතො **ගොදත්තත්ථෙරස්ස** වාදෙපි පටික්ඛිත්තො. (1343). **එත්තාවතාති** පඨමමග්ගස්ස උප්පත්තිඅනන්තරං ඵලස්ස උප්පත්තිමත්තෙන **සොතාපන්නොති වුච්චති** ති සොතාපන්නො නාම දුතියො අරියපුග්ගලොති වුච්චති. සො දෙවරජ්ජ – චක්කවත්තිරජ්ජාදි – පමාදට්ඨානං ආගම්ම භුසං පමත්තොපි හුත්වා කාමසුගතියං සත්තක්ඛත්තුමෙව සන්ධාවිත්වා සංසරිත්වා **දුක්ඛස්සන්තකරණසමත්ථො** හොති. යථාහ: "කිඤ්චාපි තෙ හොන්ති භුසං පමත්තා, න තෙ භවං අට්ඨමං ආදියන්තී"ති. රූපාරූපලොකෙසු පන න තථා නියමොති ආචරියා.

(1346.) **ඵලාදීනං** ති ආදිසද්දෙන පහීණකිලෙසාදිකෙ සංගණ්හාති. තථා හි "ඉමිනා වතාහං මග්ගෙන ආගතො"ති පඨමං මග්ගං පච්චවෙක්ඛති. තතො "අයං මෙ ආනිසංසො ලද්ධොති ඵලං පච්චවෙක්ඛති; තතො "ඉමෙ නාම මෙ කිලෙසා පහීනාති පහීනකිලෙසෙ පච්චවෙක්ඛති. තතො ඉමෙ නාම මෙ කිලෙසා අවසිට්ඨාති උපරිමග්ගත්තයවජ්ඣෙ කිලෙසෙ පච්චවෙක්ඛති. අවසානෙ "අයං මෙ ධම්මො ආරම්මණතො පටිවිද්ධොති අමතං නිබ්බානං පච්චවෙක්ඛති. ඉති සොතාපන්නස්ස පඤ්ච පච්චවෙක්ඛණඤාණානි හොන්ති. යථා ච සොතාපන්නස්ස එවං සකදාගාමි – අනාගාමීනම්පි; අරහතො පන අවසිට්ඨකිලෙස පච්චවෙක්ඛණා නාම නත්ථි. එවං සබ්බානිපි එකූනවීසති පච්චවෙක්ඛණඤාණානි. තෙනාහ: **පච්චවෙක්ඛණඤාණානි භවන්ති එකූනවීසති**ති. යාසං පච්චවෙක්ඛණවසෙන ඉමානි ඤාණානි පවත්තන්ති තා දස්සෙතුං (1347.) **මග්ගං ඵලං චාති** ආදි මාහ. උක්කට්ඨපරිච්ඡෙදො යෙව චෙසො. පහීණාවසිට්ඨකිලෙසපච්චවෙක්ඛණං සෙඛානං හොති වා නවා. න හි සබ්බෙව තත්ථ සමත්ථා හොන්ති. තෙනෙව හි **මහානාමො** භගවන්තං පුච්ඡි. "කො නාම ධම්මො අජ්ඣත්තං අප්පහීනො යෙන මෙ එකදා ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්තී"ති ආදිං.

(1348.) **යොගමාරභතෙති** තස්මිං යෙව වා ආසනෙ නිසින්නො අපරෙන වා සමයෙන කාමරාගබ්‍යාපාදානං තනුභාවකරාය සකදාගාමිමග්ගසංඛාතාය දුතියාය භූමියා අධිගමත්ථාය විපස්සනාය යොගං කරොති. දුතියභාවො චස්ස දෙසනාවසෙන උප්පත්තිවසෙන වා ති වෙදිතබ්බො. සම්පයුත්තානං පන නිස්සය භාවෙන තෙ ධම්මා භවන්ති එත්ථාති භූමි. යස්මා වා සමානෙපි ලොකුත්තරභාවෙ සයම්පි භවති, න නිබ්බානං විය අපාතුභූතං, තස්මාපි භූමීති වුච්චති; (1349) **ඤාණෙන පරිමජ්ජතීති** තෙන

තෙන ආකාරෙන ඉන්ද්‍රියානං තික්ඛතරතං සම්පාදෙත්වා බලබොජ්ඣඞ්ගානං ච පටුතරභාවං සාධෙත්වා ලක්ඛණත්තයං තීරණවසෙන පරිමජ්ජති. තත්‍ථ අපරාපරං ඤාණං චාරෙන්තො පරිවත්තෙති. තෙනාහ (1350) **විපස්සනාවීථිං ඔගාහතී**ති. **ඉතො වුත්තනයෙනා**ති උදයබ්බයඤාණාදීනං උප්පාදනෙ වුත්තනයෙනෙව (1351.) **ගොත්‍රභුස්ස අනන්තර**න්ති එත්‍ථ ගොත්‍රභුවියාති ගොත්‍රභු. පඨමමග්ගපුරෙචාරිකඤාණං හි පුථුජ්ජනගොත්තාභිභවනතො අරියගොත්තං භාවනතො ච නිප්පරියායතො ගොත්‍රභූති වුච්චති ඉදම්පන තංසදිසතාය පරියායතො ගොත්‍රභු. එකච්චසංකිලෙසවිසුද්ධියා පන අච්චන්තවිසුද්ධියා ආරම්මණකරණතො ච **වොදාන**න්ති වුච්චති. තෙනාහ **පට්ඨානෙ:** "අනුලොමං වොදානස්ස අනන්තරපච්චයෙන පච්චයො"ති. යස්මා පන **පටිසම්භිදාමග්ගෙ** "උප්පාදාදිඅභිභවනත්ථෙන උප්පාදය අට්ඨ ගොත්‍රභූ ධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්තී"ති ආදීසු ගොත්‍රභූනාමෙනෙව ආගතං, තස්මා ඉධාපි **ගොත්‍රභුස්ස අනන්තර**න්ති වුත්තං, ගොත්තසංඛාතනිබ්බානතො භූතන්ති කත්වා.

### දුතියමග්ගඤාණං.

(1354.) **සකිදෙවා**ති එකවාරමෙව **ඉමං ලොකං ආගන්ත්වා**ති ඉමිනා පඤ්චසු සකදාගාමීසු චත්තාරො වජ්ජෙත්වා එකොව ගහිතො. එකච්චො හි ඉධ සකදාගාමිඵලං පත්වා ඉධෙව පරිනිබ්බායති; එකච්චො ඉධ පත්වා දෙවලොකෙ පපරිනිබ්බායති; එකච්චො දෙවලොකෙ පත්වා තත්‍ථෙව පරිනිබ්බායති; එකච්චො දෙවලොකෙ පත්වා ඉධූපපජ්ජිත්වා පරිනිබ්බායති. ඉමෙ චත්තාරොපි ඉධ න ගහිතා යො පන ඉධ පත්වා දෙවලොකෙ යාවතායුකං වසිත්වා ඉධූපපජ්ජිත්වා පරිනිබ්බායති, අයමෙකොව ඉධ ගහිතොති. **අන්තකරො භවෙ**ති දුක්ඛස්සන්තකරො භවෙය්‍ය. භවෙ වා අන්තකරො, භවස්ස අන්තකරොති අත්‍ථො.

(1356.) **තතියාය භූමියා** පත්තියාති සම්බන්ධො. **ව්‍යාපාදකාමරාගානං පහානායා**ති තෙසං යෙව සකදාගාමිමග්ගෙන තනුකතානං සංයොජනානං නිරවසෙසප්පහානාය.

### තතියමග්ගඤාණං

පටිසන්ධිවසෙන කාමභවස්ස අනාගමනතො අනාගාමී. තෙනාහ (1362.) **තත්‍ථෙව පරිනිබ්බායතී**ති. **තත්‍ථ වා**ති සුද්ධාවාසෙ වා අඤ්ඤත්‍ථ වා යත්‍ථ උප්පන්නො තත්‍ථෙව පරිනිබ්බායී. **අනාවත්තිසභාවකො**ති තස්මා ලොකා ඉධ පටිසන්ධිගහණවසෙන ඉමං

ලොකං පුනරාගමනාභාවතො න ආවත්තනසභාවො. බුද්ධදස්සන – ථෙරදස්සන – ධම්මසවණානං පන අත්ථාය ආගමනං හොති යෙව. (1364.) **රූපරාගාදිප්පහානායාති** රූපරාග – අරූපරාග – මාන – උද්ධච්ච – අවිජ්ජාසංඛාතානං පඤ්චන්නං උද්ධම්භාගියසංයොජනානං නිස්සෙසප්පහානාය. **විලයස්සාති** විනාසස්ස.

## චතුත්ථමග්ගඤාණං

**මහාඛීණාසවොති** මහානුභාවතාතිබද්ධතං[1] පූජාවචනමෙතං, න උපාදායවචනං, යථා මහාමොග්ගල්ලානොති. න හි චූළඛීණාසවො නාම අත්ථි. අනුප්පත්තො **සදත්ථො** සකත්ථො පුජ්ජත්ථො වා එතෙනාති **අනුප්පත්තසදත්ථො**. සදත්ථොති ච අරහත්තං වෙදිතබ්බං. තං හි අත්තූපනිබද්ධට්ඨෙන[2] අත්තානං අවිජහනට්ඨෙන අත්තනො අත්ථත්තා සකත්ථොති වුච්චති. පරික්ඛීණානි දසපි සංයොජනානි එතස්සාති **ඛීණසංයොජනො**. දක්ඛිණං අරහතීති **දක්ඛිණෙය්‍යො**.

